සිළුමිණ

සිළුමින The Silumina

■ ආරම්භය - 1930 මාර්තු 30 ■ ප්‍රවෘත්ති පත්‍රයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී ■ 91 වැනි කාණ්ඩය 41 වැනි පත්‍රය ★
■ ශ්‍රී බුධ වර්ෂ 2564ක් වූ කන්‍යා රවි 25 භාග අධි වප් අව අටවක ඉරිදා ■ වර්ෂ 2020ක් වූ ඔක්තෝබර් මස 11 වැනි ඉරිදා මිල රු 80.00

තාක්ෂණික ඩිප්ලෝමා සඳහා සිසුන් බඳවා ගැනීමේ අයදුම්පත් ඇතුළත් ගැසට් පත්‍රය මෙවර සිළුමිණ සමඟ

රට කැලඹූ 'බ්‍රැන්ඩික්ස් පොකුර' මෙන්න
2-4 පිටු

අභියෝග මැඩලමින් 5 ශිෂ්‍යත්වය අද A/L විභාගය හෙට

පිටුව 5

ශ්‍රී ලාංකේය ශ්‍රමිකයන් 67ක් එතෙරදී කොරෝනාවෙන් මරුට

කෝටි ගණන් මුදල් කාබාසිනියා කළ FCID කෙරුවාව

පිටුව 12

ප්‍රංශයම තිගැස්සූ පස් මිනී මැරුම

කොරෝනා පොකුර මඩින්න 60,000ක විශේෂ මෙහෙයුමක්

(තාරක වික්‍රමසේකර)

කොරෝනා රෝගය පැතිර යාම වැළැක්වීම පිණිස, මිනුවන්ගොඩ ඇඟලුම් කම්හලේ සේවකයන්ගේ ආශ්‍රිතයන් හා ඔවුන්ගේ සමීපතමයන් සොයා 60,000කට අධික ආරක්ෂක අංශ හා සෞඛ්‍ය අංශ පිරිස් මේ වන විට දිවයිනේම විශේෂ මෙහෙයුමක් ක්‍රියාත්මක කර තිබේ.

මෙවර හිස ඔසවන ලද කොරෝනා වයිරසයේ ප්‍රබලත්වය වැඩි බවට සෞඛ්‍ය අංශ විසින් අනාවරණය කර ඇති නිසා ආරක්ෂක අමාත්‍යාංශය හා සෞඛ්‍ය අමාත්‍යාංශය මේ මෙහෙයුම් ක්‍රියාත්මක කර තිබේ. හමුදා මාධ්‍ය අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් චන්දන වික්‍රමසිංහ සිළුමිණට පැවසුවේ හමුදා බුද්ධි අංශ සෙසු අංශ හා එක්ව පැය 24 පුරාම මේ මෙහෙයුම් ක්‍රියාත්මක කර ඇති බවයි. ජනාධිපතිතුමාගේ සහ අගමැතිතුමාගේ උපදෙස් පරිදි යුද හමුදාපති ලුතිනන් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා පවසා ඇත්තේ උපරිම ශක්තිය යොදා කොරෝනා ආසාදිතයන්ගේ සමීපතමයන් සොයා ගැනීමට කටයුතු කළ යුතු බව යැයිද ඔහු කීවේය. ඒ අනුව දිවයිනේ ආරක්ෂක හමුදා ආඥා බල ප්‍රදේශ 7ම ආවරණය වන පරිදි සේනාංක මූලස්ථාන හා සියලු බලසේනාංකාධිපතිවරුන්ගේ මෙහෙයුම යටතේ මේ කටයුතු සිදු වන බවත් විශේෂයෙන්ම යුද හමුදාවේ බුද්ධි අංශ මේ වන විට කොරෝනා ආසාදිතයන් ඇසුරු කළ අය හා ඔවුන්ගේ සමීපතමයන් සොයා ගැනීමට කටයුතු කරන බවද පෙන්වා දුන්නේය. නියෝජ්‍ය පොලිස්පති අජිත් රෝහණ හා ගුවන් හමුදා මාධ්‍ය ප්‍රකාශක ගෘප් කපිතාන් දුෂාන් විජේසිංහ මහත්වරුන්ද සිළුමිණට පැවසුවේ ගුවන් හමුදා සහ පොලිස් බුද්ධි අංශ සෙසු ආරක්ෂක අංශ හා එක්ව මිනුවන්ගොඩ කොරෝනා පොකුරේ සමීපතමයන් සොයා ගැන්මට කටයුතු කරන බවයි. 7 වැනි පිටුවට

නිරෝධායන නීති මැද ශිෂ්‍යත්වය - උසස් පෙළ විභාග ඇරැඹේ

(සුභාෂිණී ජයරත්න)

අද පැවැත්වෙන 5 වසර ශිෂ්‍යත්ව විභාගයේත් හෙට සිට ආරම්භ වන උසස් පෙළ විභාගයේත් විභාග මධ්‍යස්ථාන සුරක්ෂිත කර ඇති හෙයින් කිසිදු බියකින් තොරව සාර්ථකව විභාගයට මුහුණ දෙන්නැයි අධ්‍යාපන ලේකම් ජ්‍යෙෂ්ඨ මහාචාර්ය කපිල.සී. පෙරේරා මහතා සියලු අපේක්ෂකයින්ගෙන් ඉල්ලා සිටියි. අධ්‍යාපන ලේකම්වරයා වැඩිදුරටත් පැවැසූවේ නිරෝධායනය වන ශිෂ්‍යත්ව දරුවන් 14ක් හා උසස් පෙළ දරුවන් 12 දෙනෙක් සිටින අතර එම ප්‍රමාණය වැඩිවීමට ඉඩ ඇතත්, ඔවුන්ට නිරෝධායනය වූ ස්ථානයේම විභාගයට පෙනී සිටීමට අවශ්‍ය විධි විධාන සැලැසූ බවයි. එසේම ගම්පහ සිට කොළඹ පාසල්වලට පැමිණෙන සිසුන් පිළිබඳව අධ්‍යාපන අමාත්‍යාංශය මේ වන විට සම්පූර්ණ වාර්තාවක් ලබා ගෙන ඇති අතර, ඒ අනුව ගම්පහ පළාත තුළ උසස් පෙළ හා ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටීමට විශේෂිත විභාග මධ්‍යස්ථාන 9ක් ආරම්භ කර ඇති බවත්, ඇඳිරි නීතිය පවත්නා ප්‍රදේශවල දරුවන් විභාගය සඳහා කොළඹට පැමිණීම අවශ්‍ය නොවන බවයි. 7 වැනි පිටුවට

බුදු දහම වර්ධනයට ඉන්දියාවෙන් ඩොලර් මිලියන 15ක්

(තාරක වික්‍රමසේකර)

7 වැනි පිටුවට

වෙළෙඳ කලාපයේ සේවකයින් 50,000ක් අනතුරක

(භක්ති ධර්ප්‍රිය මෙන්ඩිස්)

7 වැනි පිටුවට



කොරෝනා මඩින්න අපේ සහාය

සමගි ජන බලවේගය

(භක්ති ධර්ප්‍රිය මෙන්ඩිස්)

කොවිඩ් 19 වසංගතය මර්දනය කිරීම සඳහා රජය ගෙන යන ඕනෑම වැඩපිළිවෙළකට විපක්ෂය පූර්ණ සහයෝගය ලබා දෙන බව සමගි ජන බලවේගයේ ප්‍රධාන ලේකම් පාර්ලිමේන්තු මන්ත්‍රී රංජිත් මද්දුම බණ්ඩාර මහතා 'සිළුමිණ' ට පැවසීය.

7 වැනි පිටුවට

මිනුවන්ගොඩින් හිස එසවූ කොරෝනා දෙවැනි රැල්ලට ගම්පහ දිස්ත්‍රික්කයේ ඇඟලුම් කම්හලක දහසකට අධික පිරිසක් ගොදුරු වූහ. මේ වන විට දිවයිනේ දිස්ත්‍රික්ක 16කට සුළු වශයෙන් හෝ රෝගය පැතිර ගොස් ඇත. රෝගීන් හඳුනා ගැනීමට පවත්වනු ලබන පීසීආර් පරීක්ෂණ 321,089ක් මේ වන විට පවත්වා ඇති අතර කොළඹ නගරසභා සේවකයකු රෝගයට ගොදුරු වූ නිසා ආසාදිතයා සැරි සැරෑ සහ ඇසුරු කළ අය සිටින කොළඹ සැකසහිත ප්‍රදේශවල ජනතාව පසුගිය 9 වැනිදා සිකුරාදා කොළඹ ස්ථාන කිහිපයකදී පීසීආර් පරීක්ෂණයන්ට යොමු කළ අතර සිළුමිණ කැමරා ශිල්පී දුෂ්මන්ත මායාදුන්නගේ කැමරාවේ පීසීආර් පරීක්ෂණයක් සටහන් වූයේ මෙසේය.

" මැලේරියා, ඩෙංගු කොරෝනා, කොවිවර ලෙඩ රෝග, වසංගත ආවත් අපිට නවතින්න බෑ. රට ඉදිරියට යන්න ඕන."

නිවාස අධිකාරියේ කෝටි 574ක් ගසා කාලා

(නිහාල් පී. අබේසිංහ)

පසුගිය 'යහපාලන' සමයේ ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ මුදල් රුපියල් කෝටි 574කට ආසන්න ප්‍රමාණයක් එජාප පාක්ෂිකයන්ගේ ප්‍රයෝජනය සඳහා අවභාවිත කර ඇතැයි ජාතික නිවාස සංවර්ධන අධිකාරිය කළ විගණනයකින් හෙළිවෙයි. 7 වැනි පිටුවට

මිනුවන්ගොඩ වැසියන් රෝහල පරිශ්‍රයේ පී.සී.ආර්. පරීක්ෂණයට සහභාගී වන අයුරු

කොළඹ ජාතික අක්ෂි රෝහලට, රිජ්වේ ආර්යා ළමා රෝහලට හදිසි ප්‍රතිකාර සහ සායනික ප්‍රතිකාර සඳහා පමණක් පැමිණෙන ලෙස දැනුම් දී තිබේ. ශිෂ්‍යත්ව විභාගය සහ අ.පො.ස උසස් පෙළ විභාගය සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුව පැවැත්වීමට නියමිතය...

රට ම කැලැඹූ කොරෝනාවේ අලුත්ම තත්ත්වය

තහවුරු කළ රෝගීන්	දැනට රෝහල්ගත කර සිටින රෝගීන්	කරන ලද PCR පරීක්ෂණ සංඛ්‍යාව	පසුගිය පැය 24 තුළ තහවුරු වූ රෝගීන්	සුවපත් වූ කොරෝනා රෝගීන්	මරණ සංඛ්‍යාව
4,488	1,179	3,21,089	29	3,296	13

● **හර්ෂා සුගතදාස**

කොරෝනා වසංගතය සාර්ථකව මැඩපැවැත්වූ රටවල් අතරින් ශ්‍රී ලංකාව 2 වැනි ස්ථානයේ සිටින බව ලෝක සෞඛ්‍ය සංවිධානය ප්‍රකාශයට පත් කර වැඩි කාලයක් ගත වූයේ නැත. නැවත වතාවක් කොරෝනා රැල්ලක් මතු වූයේ ජයග්‍රහණයේ සතුට සෝදාපාළුවට ලක් කරමිනි. මේ කොරෝනා රැල්ල මතු වූයේ ඔක්තෝබර් 05 වැනිදාය. ඔක්තෝබර් 05 වැනිදා මිනුවන්ගොඩ බ්‍රැන්ඩික්ස් ඇඟලුම් කර්මාන්තශාලාවේ සේවක සේවිකාවන්ගේ පී.සී. ආර්. පරීක්ෂණ සිදු කිරීමේදී 69 දෙනකුට කොවිඩ් 19 වයිරසය ආසාදනය වී ඇති බව තහවුරු වීමත් සමග කොවිඩ් රැල්ලක් ලෙස මෙය හඳුනාගනු ලැබීය. බ්‍රැන්ඩික්ස් ආයතනයේ සේවක සේවිකාවන්ට පී.සී.ආර්. පරීක්ෂණ කිරීමට සිදු වූයේ ඔක්තෝබර් 03 වැනිදා රාත්‍රියේ එම ආයතනයේ සේවිකාවකට කොරෝනා හෙවත් කොවිඩ් 19 වයිරසය ආසාදනය වී ඇති බව සනාථ වීමත් සමඟිනි.

දිවුලපිටිය බෝමුගම්මන ප්‍රදේශයේ පදිංචි 39 වියැති කාන්තාවක් ගම්පහ රෝහලට ඇතුළත් කර තිබුණේ මිනුවන්ගොඩ යකහටුවේ පිහිටි බ්‍රැන්ඩික්ස් ඇඟලුම් කර්මාන්තශාලාවේදී රෝගාතුර වීමෙනි. ඊට පෙර ද ඈ කැස්ස, උණ සෙම්ප්‍රතිශ්‍යාවට බෙහෙත් ගෙන සේවයට වාර්තා කර තිබුණේ නිවාඩු ලබා නිවසේ රැඳී සිටියහොත් රාජකාරි කටයුතුවලට බාධා වන නිසාය. එහෙත් ඊට දින 4කට පසුව කම්හලේදී හුස්ම ගැනීමේ අපහසුවක් ඇති වූ බැවින් ගම්පහ රෝහලේ 14 වැනි වාට්ටුවට ඇයව ඇතුළත් කෙරිණි. සාමාන්‍ය තත්ත්වයට පත් වූ ඇයව ටිකට් කපා රෝහලෙන් පිටත් කිරීමට සූදානම් වී තිබියදී ඇයට පී.සී.ආර්. පරීක්ෂණය සිදු කරනු ලැබුවේ අහඹු ලෙසිනි. ඔක්තෝබර් 03 වැනිදා රාත්‍රියේ තහවුරු වූයේ ඇයට කොවිඩ් 19 වයිරසය ආසාදනය වී ඇති බවයි. වහාම ඇයව අංගොඩ අයි.ඩී.එච්. රෝහලට ඇතුළත් කළ අතර ඇගේ පවුලේ සාමාජිකයන්ව හබරාදූව නිරෝධායන මධ්‍යස්ථානයට යොමු කෙරිණි. එහිදී ඔවුන්ට ද පී.සී.ආර්. පරීක්ෂණ සිදු කළ අතර 05 වැනි දින ඇගේ දියණියට ද කොවිඩ් වයිරසය ශරීරගත වී ඇති බව තහවුරු විය. 16 හැවිරිදි දියණියව ද අයි.ඩී.එච්. රෝහලට ඇතුළත් කරනු ලැබීය. ඇගේ සැමියාටත් පුතුන් දෙදෙනාටත් කොවිඩ් වයිරසය ආසාදනය වී තිබුණේ නැත.

ඔක්තෝබර් 03 වැනිදා මෙරට සමාජයේ කොරෝනා රෝගි කාන්තාව හඳුනා ගැනුණේ අප්‍රේල් 30 වැනිදායින් පසුවය. අප්‍රේල් 30 වැනිදායින් පසුව මෙරටින් කොරෝනා ආසාදිතයන් වාර්තා වූයේ විදේශයන් නී සිට මෙරටට පැමිණෙන අය සහ කන්දකාඩු පුනරුත්ථාපන මධ්‍යස්ථානය, වැලිසර නාවික හමුදා කඳවුර වැනි සංවෘත පරිසරයෙනි. එහෙත් ඔක්තෝබර් 03 වැනිදා විවෘත සමාජයෙන් කොරෝනා රෝගියකු හමුවීමත් සමග රෝගි කාන්තාව ආ ගිය තැන්, ඇසුරු කළ අය, ඈ සමඟ සේවය කරන අය, ඈ ගමන් කළ බස් රථයේ රියදුරු පවා සොයමින් නිරෝධායනය කිරීමට පියවර ගනු ලැබුවේ කොරෝනා ව්‍යාප්තිය පාලනය කර ගැනීමටය.

ඔක්තෝබර් 04 වැනි දින උදෑසන මිනුවන්ගොඩ, දිවුලපිටිය සහ වේයන්ගොඩ පොලිස් බල ප්‍රදේශයට වහා ක්‍රියාත්මක වන පරිදි පොලිස් ඇඳිරි නීතිය පැනවීමෙන් කඩසාප්පු වසා දැමිණි. උපකාරක පන්ති, ඉරිදා පොළට, දහම් පාසල්වලට යෑමට පිටත් වූ අය කඩිමුඩියේ නිවෙස් කරා පැමිණීමෙන් ජනතාව සමාජයට යෑම වළක්වා නිවෙස් තුළ හුදෙකලා කෙරිණි. ගම්පහ රෝහලේ කාර්යය මණ්ඩලයේ 15 දෙනකුත් බ්‍රැන්ඩික්ස් ආයතනයේ හෙදියන් 5 දෙනකුත් කොරෝනා ආසාදිත කාන්තාව ගමන් කළ බස් රථයේ රියදුරු සහ 40 දෙනකුත් නිරෝධායනයට යොමු කෙරිණි. මීට අමතරව මිනුවන්ගොඩ, දිවුලපිටිය සහ වේයන්ගොඩ ප්‍රදේශවල බස් නැවතුම්පොළ, කඩසාප්පු, දුම්රිය ස්ථානය වැනි පොදු ස්ථාන විෂබීජහරණය කෙරිණි. දිවයින පුරා පිහිටි රජයේ සහ පෞද්ගලික පාසල්වල දෙවැනි පාසල් නිවාඩුව ඔක්තෝබර් 05 වැනිදා සිට ක්‍රියාත්මක වූයේ එය ඔක්තෝබර් 09 වැනිදා ලබා දීමට නියමිතව තිබියදීය. කටුනායක ගුවන් තොටුපළට පැමිණෙන අයට තනිවම පැමිණෙන ලෙස නිවේදනය කළ අතර පිටත්වීමේ සහ පැමිණීමේ පර්යන්ත තුළ ඇති තීරුබදු රහිත සාප්පු සංකීර්ණය වෙත පිවිසීම තාවකාලිකව අත්හිටුවනු ලැබිණි. මීගමුව සහ මහර බන්ධනාගාරවල අය බැලීම තාවකාලිකව තහනම් කෙරිණි. කැලණිය විශ්වවිද්‍යාලය සහ නයිවල උසස් තාක්ෂණික අධ්‍යාපන ආයතනය, යක්කල ආයුර්වේද විද්‍යායතනය වසා දැමිණි.

මිනුවන්ගොඩ, වේයන්ගොඩ සහ දිවුලපිටිය ප්‍රදේශවල යුද - ගුවන් - සිවිල් බළකා සාමාජිකයන්ට නැවත දැනුම් දෙන තුරු රාජකාරියට වාර්තා නොකරන ලෙස නිවේදනය කරනු ලැබුවේ කොරෝනා පොකුරු ව්‍යාප්තිය පාලනය කර ගැනීමේ අරමුණෙනි. රජයේ කාර්යාලවල සඳුදා දින ක්‍රියාත්මක වූ මහජන දිනය ඔක්: 05 දින නොපැවැත්වෙන බවට ප්‍රකාශයට පත් විය. බස්රථ සහ දුම්රියවල ආසන ගණනට මගීන් ප්‍රවාහනය කරන ලෙසත් රජයෙන් නියම කෙරිණි. මුඛ ආවරණ නිසි අයුරින් පැලඳ දෑත් සෝදා සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරන ලෙස මහජනතාවට දැනුම් දෙනු ලැබිණි.

මේ අතරවාරයේදී කොරෝනා වැලඳුණු කාන්තාවගේ දියණිය ඉගෙනුම ලබන දිවුලපිටිය ඥානවාස විද්‍යාලයේ 11 වසරේ සිසු සිසුවියන් සියලුදෙනාවත් ගුරුවරුන් සහ අනධ්‍යයන කාර්යය මණ්ඩලයේ සාමාජිකයනුත් පී.සී.ආර්. පරීක්ෂණවලට යොමු කිරීමෙන් අනතුරුව මීගමුවේ හෝටලයක රඳවනු ලැබුවේ නිරෝධායනය සඳහාය. ඒ හැර එම පාසලේ අනෙකුත් දරුවන් සහ ගුරුවරුන් ඇතුළු 1371කට අධික පිරිසක් ස්වයං නිරෝධායනය කෙරිණි. දිවුලපිටියේ කාන්තාව සහ ඇගේ දියණියගෙන් කොරෝනා වයිරසය සමාජයේ ව්‍යාප්ත වීම පාලනය කිරීම සඳහා රජය විසින් සියලු ක්‍රියාමාර්ග ගනු ලැබූවද ඔක්තෝබර් 05 වැනිදා උදෑසන 10.00 වන විට මිනුවන්ගොඩ බ්‍රැන්ඩික්ස් කර්මාන්තශාලාවේ සේවක සේවිකාවන් 69 දෙනකු කොරෝනා ආසාදිතයන් ලෙස තහවුරු විය. කොරෝනා රැල්ලක් හෙවත් කොරෝනා පොකුරක් ලෙස මෙය හඳුන්වනු ලැබුවේ ඉන්පසුවය.

මිනුවන්ගොඩ බ්‍රැන්ඩික්ස් කර්මාන්ත ශාලාවේ කොරෝනා ආසාදිතයන් 69 දෙනා අතර කටාන, සීදූව, ජා-ඇල, ගම්පහ, වේයන්ගොඩ, මිනුවන්ගොඩ, මීරිගම, දිවුලපිටිය වැනි ප්‍රදේශවල අය පමණක් නොව මොනරාගල, යාපනය යන ප්‍රදේශවල පදිංචිකරුවන් ද සිටීමෙන් ලංකාව පුරා කොරෝනා පැතිර යාමේ අවදානම වැඩි වූ බව රහසක් නොවේ. මොනරාගල මැදගම බකිණිගහවෙල පදිංචි 41 හැවිරිදි කාන්තාව මිනුවන්ගොඩ බ්‍රැන්ඩික්ස් ආයතනයෙන් නිවාඩු ලබා නිවසට පැමිණ ඉරිදා පොළට සහ රාජ්‍ය බැංකුවකට ගොස් ඇති අතර මොනරාගල කච්චේරිය මංසන්ධිය හා බස් නැවතුම්පොළ ආශ්‍රිත ප්‍රදේශවල සැරිසරා තිබේ. මෙම කම්හලේ සේවය කර නිවාඩු ලබා යාපනය පුත්කුඩතිව් ගමට ගිය කාන්තාවන් දෙදෙනාටත් ඔවුන්ගේ පවුල්වල ඥාතින්ටත් පී.සී.ආර්. පරීක්ෂණ කළ විට තහවුරු වූයේ 31 හැවිරිදි එක් කාන්තාව පමණක් කොරෝනා වයිරසයට ගොදුරු වී ඇති බවයි.

මීට අමතරව කටුපොත අලහිටියාව, තෙලහැර සහ කොටදෙණියාව යන ගම්මාන තුනේ නිවාස 05ක පුද්ගලයන් 23 දෙනකු නිවෙස් තුළම නිරෝධායනයට ලක් කෙරුණේ ඔවුන්ගේ පවුල්වල අය බ්‍රැන්ඩික්ස් කොරෝනා පොකුරට හසු වී ඇති බැවිනි. තවද දිවුලපිටිය, මිනුවන්ගොඩ, ගම්පහ යන ප්‍රදේශවල සිට සබරගමු විශ්වවිද්‍යාලයට පැමිණි සිසුන් 75 දෙනෙකුට පී.සී.ආර්. පරීක්ෂණ සිදු කර වෙනම රඳවා තැබුවේ කොරෝනා අවදානම නිසාය. එහෙත් පසුගිය 08 වැනිදා ඔවුන්ට කොවිඩ් 19 වයිරසය ආසාදනය වී නොමැති බව තහවුරු විය. දිවුලපිටියේ සිට රුවන්පුර විද්‍යා පීඨයට පැමිණි ගුරු සිසුවියක් එහි ඇතුළත් කර නොගත් පුවතක් ද මේ අතරවාරයේ දී අසන්නට ලැබිණි.

ඔක්තෝබර් 06 වැනි අඟහරුවාදා උදෑසන 10.00 වන විට ගතවූ පැය 24ක් තුළ බ්‍රැන්ඩික්ස් ඇඟලුම් කම්හලේ කොරෝනා ආසාදිතයන් 252ක් තහවුරු වී තිබූ අතර බ්‍රැන්ඩික්ස් කොරෝනා රෝගීන් සංඛ්‍යාව 322 දක්වා වර්ධනය විය. එය ලංකාවේ සමස්ත කොරෝනා රෝගීන් ගණන 3733 දක්වා ඉහළ නැංවීමට හේතු විය. සැක කටයුතු රෝගීන් 140 දෙනෙක් වෛද්‍ය අධීක්ෂණය යටතේ පසු වූහ. ඊළඟ පැය 24 ඇතුළත බ්‍රැන්ඩික්ස් ආයනයේ රෝගීන් 509ක් හඳුනා ගැනුණේ බ්‍රැන්ඩික්ස් කොරෝනා පොකුර 831ක් ලෙස ඉහළ දමමිනි. 08 වැනිදා උදෑසන 10.00 වන විට බ්‍රැන්ඩික්ස් කොරෝනා පොකුර 1033ක් ලෙස සටහන් වූයේ නව ආසාදිතයන් 202ක් වාර්තා වීමත් සමඟය.

මිනුවන්ගොඩ බ්‍රැන්ඩික්ස් ආයනයේ සේවක සේවිකාවන් සිය දහස් ගණනින් කොරෝනා රෝගයට ගොදුරු වෙද්දී ඒ ආයතනයට වයිරසය පැමිණි ආකාරය අදටත් අබිරහසකි.

මේ වන විට කොල්ලුපිටියේ පිහිටි බ්‍රැන්ඩික්ස් ආයතනයේ සේවක සේවිකාවන්ටත් පී.සී. ආර්. පරීක්ෂණ සිදු කරන්නේ ඔවුන් යකහටුව බ්‍රැන්ඩික්ස් ආයතනය සමග සෘජු සම්බන්ධතා පවත්වා ඇති බැවිනි. මීට පෙර වාර්තා වූ කොරෝනා රෝගීන්ගේ වයිරසයට වඩා බ්‍රැන්ඩික්ස් ආයතනයෙන් මතු වූ කොරෝනා වයිරසය සාන්ද්‍රණයෙන් ඉහළ අගයක් ගෙන ඇති බව විශේෂඥ වෛද්‍ය සුදත් සමරවීර ප්‍රකාශ කර සිටියි. අනුරාධපුර, පොලොන්නරුව, බදුල්ල,ගාල්ල, පුත්තලම, රත්නපුර, දඹුල්ල ඇතුළු දිවයින පුරා දසදෙසින් කොරෝනා ආසාදිතයන් වාර්තා වන්නේ යකහටුව බ්‍රැන්ඩික්ස් ආයතනයේ සේවක සේවිකාවන් ඔක්: 01 වැනි දින යෙදුණු පෝය නිවාඩුවත් සමග එළඹුණු දීර්ඝ සති අන්තයේ ගම රටවල් බලා ගොස් තිබූ බැවිනි. අලුත්නුවර දේවාලයට ගිය යකහටුව බ්‍රැන්ඩික්ස් කම්හලේ සේවක පිරිසක් කොරෝනා ආසාදිතයන් බවට තහවුරු වීමත් සමඟ අලුත්නුවර දැඩිමුණ්ඩ දේවාලය තාවකාලිකව වසා දැමීය. මිනුවන්ගොඩ පොලිසිය වසා දමා එහි සේවය කළ 85 දෙනකුගෙන් යුතු කාර්යය මණ්ඩලය නිරෝධායනය කර සිටින්නේ එහි ආපනශාලාවේ සේවයේ යෙදී සිටින සේවකයකු කොරෝනා ආසාදිතයකු බවට තහවුරු වීමත් සමඟිනි. එම සේවකයාගේ පුතා යකහටුව බ්‍රැන්ඩික්ස් ආයතනයේ සේවයේ යෙදෙන කොරෝනා ආසාදිතයෙකි. මේ වන විට ගම්පහ පොලිස් නිලධාරීන් පිරිසක් මිනුවන්ගොඩ පොලිසියට අනුයුක්ත කර තිබේ.

මීට අමතරව බම්බලපිටියේ පිහිටි ICBT සරසවියද වසා දමා තිබෙන්නේ එහි සිසුවකු කොවිඩ් 19 ආසාදිතයකු ලෙස හඳුනා ගැනීමත් සමඟය. එම සිසුවාගේ මව යකහටුව බ්‍රැන්ඩික්ස් ආයතනයේ සේවය කරන කාන්තාවකි. මිනුවන්ගොඩ පිහිටි මූල්‍ය සමාගමක මුදල් අයකැමි තරුණයකුට ද කොරෝනා ආසාදනය වීමෙන් අංගොඩ අයි. ඩී.එච්. රෝහලට ඇතුළත් කර ඇත. මීරිගම පදිංචි කොළඹ කාසල් රෝහලේ ගැබිනි මවකට කොරෝනා ආසාදනය වී ඇති බවට තහවුරු වීමෙන් ඇයව මුලේරියාව රෝහලට ඇතුළත් කර ඇත. ඇය සේවය කර තිබෙන්නේ යකහටුව බ්‍රැන්ඩික්ස් ආයතනයට සැපයුම් සිදු කරන කර්මාන්තශාලාවකය. මිනුවන්ගොඩ බ්‍රැන්ඩික්ස් ආයතනයේ සේවිකාවන් සමග බෝඩිමක සිටින කටුනායක ගුවන් තොටුපොළේ පිරිසිදු කරන කාන්තාවක් ද කොරෝනා රෝගයට ගොදුරු වී සිටියි. ඇගේ පවුලේ අය, ගුවන්තොටුපළේ සේවකයන් පී.සී. ආර්. පරීක්ෂණයට යොමු කළේ එබැවිනි.

මේ වන විට සමාගම් රෙජිස්ට්‍රාර් කාර්යලය, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව, විදේශ කටයුතු අමාත්‍යාංශයේ කොන්සියුලර් කටයුතු අංශය ඇතුළු රජයේ ආයතන ගණනාවක් මහජනතාවට විවෘත නොකිරීමට පියවර ගෙන තිබේ. ඉස්ලාම් ආගමික බැතිමතුන්ගේ සිකුරාදා දේව මෙහෙය සඳහා සහභාගි වන පිරිස 50 කට සීමා කර ඇත.

කොරෝනා වසංගතය හේතුවෙන් ලංකාවේ රඟහල්, සිනමාශාලා, කැසිනෝ, රාත්‍රී සමාජශාලා, දිවා සුරැකුම් මධ්‍යස්ථාන, පාසල්, විශ්වවිද්‍යාල, උපකාරක පන්ති, දහම් පාසල් සියල්ල වසා දමා ඇති අතර ප්‍රිය සම්භාෂණ, ඇතුළත පැවැත්වෙන සියලු උත්සව, එළිමහනේ පැවැත්වෙන සියලු උත්සව, මහජන රැස්වීම් සහ සැණකෙලි, සංගීත ප්‍රසංග, වෙරළ ආශ්‍රිත උත්සව තහනම් කර ඇත.

ගම්පහ පොලිස් කොට්ඨාසයට අයත් පොලිස් බල ප්‍රදේශ 14 කටත් කැලණිය පොලිස් කොට්ඨාසයට අයත් ජා-ඇල හා කඳාන පොලිස් බල ප්‍රදේශවලටත් මීගමුව පොලිස් කොට්ඨාසයේ සීදූව පොලිස් බල ප්‍රදේශයටත් පැනවූ ඇඳිරි නීතිය අඛණ්ඩව ක්‍රියාත්මක වේ.

කොළඹ ජාතික අක්ෂි රෝහල, රිජ්වේ ආර්යා ළමා රෝහල හදිසි ප්‍රතිකාර සහ සායනික ප්‍රතිකාර සඳහා පමණක් පැමිණෙන ලෙස දැනුම් දී තිබේ. ශිෂ්‍යත්ව විභාගය සහ අ.පො.ස උසස් පෙළ විභාගය සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුව පැවැත්වීමට නියමිතය. බැංකු, පෞද්ගලික සහ රජයේ කාර්යාල, කඩ සාප්පු සෑම ආයතනයක්ම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් කටයුතු කරන්නේ ලංකාව පුරා බ්‍රැන්ඩික්ස් කොවිඩ් පොකුර විහිදී සිටීමෙන් ඇති විය හැකි භයංකාර තත්ත්වය ගැන අවබෝධයෙන් යුතුවය.

කොරෝනා රැල්ලෙන් හමුවන රෝගීන්ට ප්‍රතිකාර කිරීම සඳහා රෝහල් 14ක් වෙන් කර තිබේ. අංගොඩ අයි. ඩී.එච්., මුල්ලේරියාව රෝහල, වැලිකන්ද රෝහල, ඉරණවිල රෝහල, මිනුවන්ගොඩ රෝහල, කඹුරුගමුව රෝහල, කාත්තන්කුඩි රෝහල, තෙල්දෙණිය රෝහල ඒ අතර වේ. රෝහල්වලට අමතරව මාලබේ නෙවිල් ප්‍රනාන්දු පෞද්ගලික රෝහල ද කොරෝනා රෝගීන් වෙනුවෙන් වෙන් කර ඇත්තේ එහි ඇඳන් 400ක් ඇති බැවිනි.

කොරෝනා රෝගීන් ප්‍රමාණය ඉහළ යන විට ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් ඇතුළු ආශ්‍රිතයන් නිරෝධායන මධ්‍යස්ථානවලට යොමු කරන ප්‍රමාණය ද ඉහළ යනු ඇත. වැලිකන්ද ගල්කන්ද නිරෝධායන මධ්‍යස්ථානයට රැගෙන ගිය යක්කල ප්‍රදේශයේ 64 වියැති කාන්තාවක් හෘදයාබාදයක් නිසා මිය යෑමේ ශෝචනීය පුවතක් වාර්තා වූයේ 07 වැනි බදාදා පස්වරුවේය.

ඇගේ අවසන් කටයුතු නිරෝධායන රෙගුලාසි අනුව සිදු කෙරිණි. මීට අමතරව ගම්පහ රෝහලේ වෛද්‍යවරයකුටත් කොරෝනා ආසාදනය වීමෙන් අංගොඩ අයි.ඩී.එච්. රෝහලට යවා තිබේ. ඔහුගේ පෞද්ගලික බෙහෙත් ශාලාවෙන් මිනුවන්ගොඩ බ්‍රැන්ඩික්ස් ආයතනයේ සේවක සේවිකාවන් බෙහෙත් ගෙන ඇති අතර ඔවුන්ගෙන් වෛද්‍යවරයාට ආසාදනය වූ බවට සැක කෙරේ.

දිවුලපිටිය ප්‍රදේශයේ කාන්තාවක් අහංගම එළිකැටිය ප්‍රදේශයේ විහාරස්ථානයක හිමිනමකගේ සුවදුක් බැලීමට ගොස් ඇති අතර මෙම කාන්තාව කොරෝනා ආසාදිතයකු බවට තහවුරු වීමත් සමග අහංගම එළිකැටිය විහාරයේ භික්ෂූන්වහන්සේලා 16 නමක් ස්වයං නිරෝධායනයට ලක් කර ඇත. මීට අමතරව හොරණ කඳන්හේන ප්‍රදේශයේ පදිංචි බ්‍රැන්ඩික්ස් ආයතනයේ සේවකයකුට කොරෝනා ආසාදනය වීමෙන් ඔහු ආ ගිය හොරණ කඳන්හේන ශ්‍රී නන්දාරාමයේ භික්ෂූහු ස්වයං නිරෝධායනය වී සිටිති.

මිනුවන්ගොඩ බ්‍රැන්ඩික්ස් කම්හලේ සේවිකාවක් පොල්පිතිගම පදිංචි සිය මවුපියන් දිවුලපිටියට ගෙන්වාගෙන වන්දනා ගමනක යෙදී ඇති අතර ඇගේ මව කොරෝනා ආසාදිතයකු වීමෙන් ඔවුන් වන්දනා කළ ස්ථාන හා එම ප්‍රදේශ දැඩි අවදානමට ලක් වී තිබේ. බ්‍රැන්ඩික්ස් ආයතනයේ තරුණියක් ගම්පහ මිරිස්වත්ත ප්‍රදේශයේ අවමංගල්‍ය උත්සවයකට සහභාගි වූයේ ඇගේ මවුපියන් සමඟය. එහෙත් ඈ නවාතැන්ගෙන සිටින ස්ථානයේ තරුණියන් කොරෝනා ආසාදිතයන් බවට තහවුරු වීමත් සමග මේ අවමංගල්‍ය උලෙළට සහභාගි වූ පදවිය ඇලිකිඹුලාගල ප්‍රදේශයේ පදිංචි පවුල් 10ක් නිවස් තුළම නිරෝධායනය කළේ ඔවුන්ට කොරෝනා වැලඳීමේ අවදානම ඇති නිසාය.

ගම්පහ ප්‍රදේශයේ හෝටලයක සේවයකළ සිව් දෙනකු සමග පවුල්වල සාමාජිකයන් 28 දෙනකු අලුත්ගම වැලිපිටිය ප්‍රදේශයේ පිහිටි ඔවුන්ගේ නිවෙස් තුළම නිරෝධායනය කර තිබේ.

මිනුවන්ගොඩ යකහටුව බ්‍රැන්ඩික්ස් ආයතනයේ සේවය කරන කාන්තාවක් නිවාඩුවට මහඔය ඉද්දපොළ ගමට ගොස් සිටියදී ඇයට කොරෝනා වැලඳී ඇති බවට තහවුරු වී ඇත. ඇගේ මවුපියන් ප්‍රදේශයේ අවමංගල්‍ය උත්සවයකට සහභාගි වීමත් නිවසේ දරු දෙදෙනකු පෞද්ගලික පන්තිවලට සහභාගි වී සිටීමත් හේතුවෙන් මහඔය ඉද්දපොළ සහ කැකිරිහේන ග්‍රාම නිලධාරි වසම් 2 හුදකලා කර තිබේ.රෝගි කාන්තාව මඩකලපුව නිරෝධායන මධ්‍යස්ථානයේ ප්‍රතිකාර ලබයි. ඈ මහියංගණය සිට නිවසට පැමිණි බස් රථයේ රියදුරු හා කොන්දොස්තර ද ස්වයං නිරෝධායනයට ලක් කර තිබේ.

ඔක්: 03 වැනිදා රාත්‍රියේ කොළඹ සිට යාපනය බලා ගමන් කළ රන්සිළු නමැති අංක WP ND 6503 දරන බස් රථයේත් 04 වැනිදා අලුයම යාපනය සිට පුත්කුඩතිව් දක්වා ගමන් ගත් NP ND 8790 අංක දරන බස් රථයෙන් ගමන් ගත් පිරිස් සොයා ළඟම පිහිටි රෝහලට ගොස් පී.සී.ආර්. පරීක්ෂණ සිදු කර ගන්නා ලෙස මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් දන්වා සිටින්නේ පුත්කුඩතිව් පදිංචි කොරෝනා වැලඳුණු කාන්තාව එම බස්රථවල ගමන් කර ඇති නිසාය.

මේ අතරවාරයේදී බ්‍රැන්ඩික්ස් ආයතනයේ සේවය කරන හඟුරන්කෙත පදිංචි කොරෝනා ආසාදිත තරුණයෙකු හලාවත මුන්නේශ්වරම කෝවිලට ගොස් තිබීමෙන් මෙම කෝවිල ද කොරෝනා අවදානමකට ලක් වී තිබේ. මේ වන විට හලාවත අඹකඳවිල ප්‍රදේශයෙන් සහ ආණමඩුව ප්‍රදේශයෙන් ද කොරෝනා ආසාදිතයන් හමු වී තිබේ.

කොළඹ මහ නගර සභාවේ සේවිකාවකගේ මව බ්‍රැන්ඩික්ස් ආයතනයේ සේවය කරන අතරවාරයේදී කොරෝනා රෝගයට ගොදුරු වීමෙන් කොළඹ මහ නගර සභාවේ කාර්යය මණ්ඩලයේ 402 කට පී.සී.ආර්. පරීක්ෂණ සිදු කර ඇත. පී.සී.ආර්. පරීක්ෂණ සිදු කළ දිවුලපිටිය ඥානවාස විදුහලේ සිසු සිසුවියන්, ගුරු මණ්ඩලය සහ අනධ්‍යන කාර්යය මණ්ඩලයේ කිසිවකුට කොවිඩ් 19 ආසාදනය වී නොමැති බවට තහවුරු වී තිබීම සතුටට කරුණකි. එමෙන්ම දිවුලපිටියේ කාන්තාවට ප්‍රතිකාර කළ ගම්පහ රෝහලේ වෛද්‍යවරුන් ඇතුළු කාර්යය මණ්ඩලයේ කිසිවකුට කොවිඩ් 19 වයිරසය ආසාදනය වී නොමැති බව තහවුරු වී තිබේ.

එහෙත් වැලිසර බ්‍රැන්ඩික්ස් ආයතනයේ සේවකයකුට කොරෝනා ආසාදනය වී ඇති බව තහවුරු විය. රිජ්වේ ආර්යා ළමා රෝහලේ මාස 10ක දරුවකුටත් කොරෝනා ආසාදනය වී ඇති බවට වාර්තා වේ.

කෙසේ වුවද මේ ලිපිය ලියන මොහොත වන විට මිනුවන්ගොඩ බ්‍රැන්ඩික්ස් ආයතනයෙන් හඳුනා ගත් කොරෝනා ආසාදිතයන් ගණන 1053 දක්වා ඉහළ ගොස් තිබේ. ගතවූ පැය 24 ඇතුළත මෙරටින් වාර්තා වූ කොරෝනා ආසාදිතයන් ගණන 29 ක් වන අතර එයින් 19 දෙනකුම අයත් වන්නේ බ්‍රැන්ඩික්ස් කොරෝනා පොකුරටය. එයින් එක් අයෙකු බ්‍රැන්ඩික්ස් ආයතනයට අයත් වන අතර 18 දෙනකු හඳුනාගෙන තිබෙන්නේ බ්‍රැන්ඩික්ස් ආයතනයේ සේවකයන්ගේ ආශ්‍රිතයන් වශයෙනි. මෙරටින් වාර්තා වන සමස්ත කොරෝනා ආසාදිතයන් සංඛ්‍යාව 4488 කි. දැනට 3278 දෙනකු සුවය ලබා රෝහල්වලින් පිට වී ගොස් තිබේ. දැනට රෝහල්වල ප්‍රතිකාර ලබන කොරෝනා ආසාදිතයන්ගේ ගණන 1197 කි.

රථවාහන පරීක්ෂා කරන අයුරු

මගීන් පරීක්ෂා කරන අයුරු

ආසාදිතයකු මුන්නේශ්වරම කෝවිලට ගිහින්

දිවුලපිටිය ඥානාවාස විදුහලේ කිසිවකුට කොරෝනා නැහැ

හොරණ සහ අහංගම භික්ෂූන් වහන්සේලාත් නිරෝධායනයේ

ගම්පහ රෝහලේ වෛද්‍යවරයකුටත් කොරෝනා

ඉකුත් සතියේ දෙමළ මාධ්‍ය කී දේ...

● ටී චන්ද්‍රසේකර ගෙන්

යාපනය විශ්වවිද්‍යාලයේ අතර සිසුන්ට ප්‍රහාරයක්

යාපනය විශ්ව විද්‍යාලයේ 2 හා 3 වසරවල සිසුන් අතර 8 වන බ්‍රහස්පතින්දා සවස ඇතිවූ ගැටුමට මැදිහත්වී සාමකාමී ලෙස විසඳන්න උත්සාහ කළ අවස්ථාවේ උපකුලපතිවරයා, කතිකාචාර්යවරුන් හා මුරකරු එක්ව පහර දුන් බවට සිසුන් චෝදනා කරති.

පහරදීමෙන් පසු පොලිසිය හා හමුදාව ගෙන්වන බවට තර්ජනය කළ බවත් එහි වීඩියෝ දර්ශන පවා තමන් සතුව ඇති බවත් ඔවුහු පවසති.

ටැමිල් වින්

යාපනය විශ්වවිද්‍යාලයේ රාත්‍රයේ සිදුවූයේ කුමක්ද උපකුලපති පැහැදිළි කරයි

දෙවන වසර හා තෙවන වසර සිසුන් අතර ගැටුම තෙවන වසරේ සිසුන් දෙවන වසරේ සිසුන්ට හිංසා කිරීමෙන් ඇතිවූවක්. එය වළක්වාලීමට ගිය අවස්ථාවේ එහි පැවතුනේ භයානක තත්ත්වයක් එය පාලනය කරන්නට යම් ක්‍රියාමාර්ග ගන්න සිදුවුණා.

ඒ අය කියන්නා සේ වැරදි දේවල් සිදුවුණේ නෑ.

ටැමිල් වින්

13 වන සංශෝධනය ගැන ආණ්ඩුවේ ස්ථාවරය කුමක්ද? සුමන්දිරන් විමසයි.

13 වන සංශෝධනය ගැන ආණ්ඩුවේ ස්ථාවරය කුමක්ද ඉන්දියාවට කියන්නේ මොනවාදැයි දෙමළ ජාතික සන්ධානයේ මන්ත්‍රී එම්.ඒ.සුමන්දිරන් පාර්ලිමේන්තුවේ දී විමසයි.

වීරකේසරි

ඝාතකයා කවුද ඩග්ලස් ගජේන්ද්‍රකුමාර් අතර තදබල විවාදයක්

ඝාතකයන් පාවාදෙන්නන් කවුද කියා ප්‍රශ්න කරමින් ඇමති ඩග්ලස් දේවානන්ද හා පාර්ලිමේන්තු මන්ත්‍රී ගජේන්ද්‍රකුමාර් පොන්නම්බලම් අතර පාර්ලිමේන්තු විවාදයක් ඇතිවූයේ පසුගියදා යාපනයේ දී පොලිස් නිලධාරියෙකුගේ ගෙල කපා මරාදැමීමේ සිද්ධිය පිළිබඳ ඇති වූ කතා බහකදීය.

වීරකේසරි

ඉන්දියාව හා එ.ජා.සංවිධානය සමඟ ක්‍රියාකිරීමට දෙමළ පක්ෂවල කමිටුවක් අවශ්‍යයි එවැන්නක් ප්‍රයෝජනවත් වන බව සුරේෂ් ද කියයි.

සියලු දෙමළ පක්ෂ එක්ව ජාත්‍යන්තර කටයුතු මෙහෙයවීම සඳහා කමිටුවක් ගොඩනැගිය යුතුයි. විශේෂයෙන් ඉන්දියාව හා එක්සත් ජාතීන්ගේ සංවිධානය මෙහෙයවීම සඳහා මෙවැනි කමිටුවක් පත්කිරීම අතිශයින්ම ප්‍රෙයාජනවත් වන බව ඊ.පී.ආර්.එල්.එෆ්. නායක හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී සුරේෂ් ප්‍රේමචන්ද්‍රන් පවසයි.

වීරකේසරි

අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය, සිවිල් සමාජ නිදහස ශ්‍රී ලංකාව සහතික කර තිබෙනවා එ.ජා.මහ ලේකම්ට ශ්‍රී ලංකාව ජිනීවා හි දී පිළිතුරු දෙයි..!

අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය මෙන්ම සිවිල් සමාජ ආරක්ෂා කරමින් එහි බලය ශක්තිමත් කිරීමට ශ්‍රී ලංකාව පියවර ගෙන ඇත. තව මාධ්‍යවේදීන්, මානව හිමිකම් ක්‍රියාකාරීන් මෙන්ම සිවිල් සමාජ ක්‍රියාකාරීන්ට එරෙහිව ක්‍රියාකාරකම් පිළිබඳව ලද පැමිණිළි විභාග කර නීතිය ක්‍රියාත්මක කිරීමට සහතික වී ඇති බව ජිනීවා මානව හිමිකම් සමුළුවේ ශ්‍රී ලංකා නිත්‍ය නියෝජිත දයානි මෙන්ඩිස් ප්‍රකාශ කළාය.

වීරකේසරි

රිසාඩ් ගේ සහෝදරයාගේ නිදහස රහසිගත දේශපාලන විසඳුමක් ද ?

කාදිනල් මැල්කම් රංජිත් හිමිපාණන්ගෙන් චෝදනා

පාස්කු ඉරිදා ප්‍රහාරය සම්බන්ධයෙන් චෝදනා රැසක් සමඟ අත් අඩංගුවට ගත් පුද්ගලයෙක් හිටිහැටියේම නිදහස් කිරීම සම්බන්ධයෙන් දැඩි විරෝධය පළකරන බව පවසන කාදිනල් මැල්කම් රංජිත් හිමිපාණන් මෙහි පසුබිමේ රහසිගත දේශපාලන ගිවිසුමක් ඇති බවට සැකකරන බවද කියයි.

සති අන්ත වීරකේසරි

සහෝදරයාගේ නිදහස හා දේශපාලනය අතර කිසිදු සබඳතාවක් නෑ

අප දේශපාලන තීන්දු තීරණ ගන්නේ රටේ හා ජනතාවගේ යහපත සලකා බැලීමෙන් මිස ජාතිවාදීන්ට බියවී කිසිදු තීරණයක් නොගන්නා බවත් ඒ අනුව තම සහෝදරයාගේ නිදහස හා දේශපාලනය අතර කිසිදු සබඳතාවක් නොමැති බවත් පාර්ලිමේන්තු මන්ත්‍රී රිසාඩ් බදියුදීන් පැවසීය.

සති අන්ත වීරකේසරි

රිසාඩ්ව ආණ්ඩුවට ගන්නේ නෑ ඇමති රෝහිත.....

පාර්ලිමේන්තු මන්ත්‍රී රිසාඩ් බදියුදීන් ආණ්ඩුවට ගන්න කිසිදු අවශ්‍යතාවක් නැ. ප්‍රධාන මැතිවරණ දෙකක දී පොදුජන පෙරමුණට ඡන්දය දුන් ජනතාව ද එය පිළි ගන්නේ නැ. එනිසා ජනතා මතයට පටහැනිව ආණ්ඩුව ක්‍රියා නොකරනු ඇතැයි වරාය හා නාවික අමාත්‍ය රෝහිත අබේගුණවර්ධන පැවසීය.

තිනක්කුරල්

සුරාබදු දෙපාර්තමේන්තුව ප්‍රතිසංස්කරණය කළ යුතුයි අගමැති නිලධාරීන්ට දන්වයි.

ශ්‍රී ලංකාවේ සුරාබදු දෙපාර්තමේන්තුව ප්‍රතිසංස්කරණය කිරීම සඳහා කමිටුවක් පත්කරන ලෙස අගමැති මහින්ද රාජපක්ෂයන් නිලධාරීන්ට නියම කර තිබේ.

තමිල් මිරර්

පාස්කු ඉරිදා ප්‍රහාරයට එ.ජා.ප.ය වගකිව යුතුයි

පාස්කු ඉරිදා ප්‍රහාරයට තමන් ඇතුළු එ. ජා. පක්ෂයේ නායකත්වයෙන් යුත් ආණ්ඩුව මුළුමනින්ම වගකිව යුතුයි යැයි හිටපු ආරක්ෂක ලේකම් හේමසිරි ප්‍රනාන්දු පැවසීය.

පාස්කු ඉරිදා ප්‍රහාරය පිළිබඳ ජනාධිපති කොමිසම හමුවේ සාක්ෂි ලබාදෙමින් ඔහු ඒ බැව් කීය.

තිනක්කුරල්

ජාත්‍යන්තර සහය මත පෙඩරල් පාලනයක් නියත වශයෙන්ම හිමිකර ගන්නවා

එම්.කේ.සිවාජිලිංගම්

ජාත්‍යන්තර සහය මත එක්සත් ශ්‍රී ලංකාවක් තුළ පෙඩරල් පාලනයක් ලබා ගැනීමට උත්සහ කරන බව හිටපු උතුරු පළාත් සභා මන්ත්‍රී එම්. කේ. සිවාජිලිංගම් පැවසීය.

තිනක්කුරල්

අත්‍යාවශ්‍ය භාණ්ඩ ඇතිතරම් තිබෙන බව වෙළෙඳ සංගමය කියයි.

යාපනයේ ඇතිතරම් අත්‍යාවශ්‍ය භාණ්ඩ වෙළෙඳායතන සතුව තිබෙන හෙයින් අනවශ්‍ය ලෙස භාණ්ඩ රැස්කරමින් ආහාර හිඟයක් ඇතිනොකරන්නැයි යාපනය වෙළෙඳ සංගමය පාරිභෝගික ජනතාවගෙන් ඉල්ලා සිටියි.

උදයන්

උතුරු මුහුදේ වෙරළට ගොඩගැසූ ඉන්දීය ධීවරයාගේ සිරුර එරට නාවික හමුදාවට බාර දෙයි

තමිල්නාඩු ධීවරයෙකුගේ සිරුරක් පසුගිය බදාදා යාපනය අල්ලෛපිට්ටි වෙන්පුරවිනගර් මුහුදු වෙරළට ගොඩගසා තිබිණි.එම සිරුර හඳුනාගැනීමෙන් පසු නාවික හමුදාව විසින් ඉන්දීය නාවික හමුදාව වෙත බාර දී තිබේ.

උදයන්

යාපනය විශ්වවිද්‍යාලයේ සිසුන් 9 දෙනෙකු නිරෝධායනයට

ගම්පහ දිස්ත්‍රික්කයෙන් පැමිණ යාපනය විශ්ව විද්‍යාලයේ අධ්‍යාපනය ලබන සිසුන් 9 දෙනෙකු නිරෝධායනයට ලක්කර තිබේ.

වාලම්පුරි

යාපනය අර්ධද්වීපයේ වෙරළාරක්ෂාව තරවේ. ජනතාවට අවධානයෙන් සිටින්නැයි ආඥාපති ඉල්ලයි

රටපුරා ඇති වී තිබෙන කොරෝනා අවධානම හමුවේ යාපනය අර්ධද්වීපය අවට මුහුදු තීරයේ වෙසෙන ජනතාවට දැඩි අවධානයෙන් පසුවන්නැයි යාපනය ආඥාපති මේජර් ජෙනරාල් සෙනරත් බණ්ඩාර ඉල්ලා සිටියි.

තිනක්කුරල්

නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සිසුන් 16 ක් නිරෝදායනයට

නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සිටින ගම්පහ දිස්ත්‍රික්කයේ පදිංචි සිසුන් 16 දෙනෙකු මඩකලපුවේ පිහිටි විශ්වවිද්‍යාලයට අයත් නේවාසිකාගාරයේ ස්වයං නිරෝධායනයට ලක්කර පීසීආර් පරීක්ෂණ සිදුකිරීමට නියමිත බවත් නැගෙනහිර පළාත් සෞඛ්‍ය අධ්‍යක්ෂ වෛද්‍ය ඒ ලතාගරන් පැවසීය.

තිනක්කුරල්

13 මුළුමනින්ම ක්‍රියාත්මක කරවන්න ඉන්දියාව පියවර ගතයුතුයි. විග්නේෂ්වරන්

ශ්‍රී ලංකාවේ දෙමළ ජනතාවගේ ගැටලුවට විසඳුමක් ලෙස පෙඩරල් පාලනයක් ඉන්දියාවේ සහය මත ලබාගැනීමට ඉන්දු ලංකා ගිවිසුම අවියක් ලෙස භාවිතා කළ හැකි නිසා 13 වන සංශෝධනය මුළුමනින්ම ක්‍රියාත්මක කරන්න ඉන්දියාව පියවර ගතයුතු බව පාර්ලිමේන්තු මන්ත්‍රී සී. වී. විග්නේෂ්වරන් පැවසීය.

තිනක්කුරල්

හීය

● මුරුත්තෙට්ටුවේ ආනන්ද හිමි

කොරහත් බිඳගෙන පැනගිය කොරෝනා

ලෝකයේ මහ බලවතා වූ ඇමෙරිකානු ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් මේ දක්වාම සිතාගෙන සිටින්නට ඇත්තේ තමන්ට වඩා කෙරුමෙක් මිහිපිට නොමැති බවය. එලෙස තමන් ගැන අධි තක්සේරුවක් ඇතිකරගෙන සිටි ඔහු කෝවිඩ් - 19 හෙවත් කොරෝනාව විසින් මුළු ඇමෙරිකාවම වෙළා ගනිද්දි පවා ඊට අවඥාවෙන් සිනාසුණේය.

එහෙත් පසුගියදා ඔහුගේ ගණන්කාරකම බින්දුවටම බැස ගියේය. ඒ ට්‍රම්ප් ට පමණක් නොව ඔහුගේ බිරිය වූ මෙලානියා ට්‍රම්ප් මහත්මියට ද කොරෝනාව ආසාදනය වීමෙනි. එසේම මේ වනවිට ලෝකයේ මහ බලවතාවූ ට්‍රම්ප්ට විසඳුම් ලබාදීමට සිදුවී ඇත්තේ තවත් බරපතළ අභියෝගයකටය. එනම් කොරෝනා ආසාදිතයන් වැඩිම ගණනක් වෙසෙන රට බවට ඇමරිකාව පත්ව තිබීමයි.

එමෙන්ම ඇමරිකාවේ කොරෝනාවෙන් සිදුවන මරණ සංඛ්‍යාව ද ඉහළම අගයක් ගෙන ඇත. ඒ අනුව ඉකුත් මාසය අවසන් වනවිට ඇමෙරිකානුවන් 7,494, 600 ට අධික සංඛ්‍යාවකට කොරෝනා ආසාදනය වී ඇතැයි හෙළිවී ඇත.

කෙසේ වෙතත් ඇමෙරිකාව මෙවැනි ඉරණමකට මුහුණ පා ඇත්තේ කොරෝනා රෝග මර්දන කටයුතු කෙරෙහි ට්‍රම්ප් විසින් දක්වන ලද උද්ධච්ඡ ප්‍රතිචාරය නිසා යැයි ලෝකයේ බොහෝ දෙනෙකුගේ විශ්වාසය වී ඇත.

ලෝක නායකයන් අතර එවැනි විශ්වාසයක් ඇතිවීමට මුල්වූ සාධාරණ හේතු සාධක කීපයක්ම තිබුණු බව ද සත්‍යයකි. ඒ අතරින් එක් හේතුවක් වන්නේ ඇමෙරිකාව කොරෝනාවෙන් දරුණු ලෙස බැට කමින් සිටියදී පවා ට්‍රම්ප් මුව ආවරණ පැළඳීමෙන් වැළකී සිටීමය. නැතහොත් ජනතාව ඒ සඳහා දිරිමත් නොකිරීමය.

එසේම ඇමෙරිකාව ලෝක සෞඛ්‍ය සංවිධානයෙන් ඉවත්වීමට තීරණය කිරීම ද ට්‍රම්ප්ගේ තවත් උද්ධච්ඡ කමකි. කොරෝනා වයිරසය ආසාදනය වීමෙන් පසු තම රටේ දී ලබාගත හැකි ඉහළම ප්‍රතිකාර ලබා එම මාරක වයිරසයෙන් මිදුණු ඇමෙරිකානු ජනාධිපතිවරයාත් ඔහුගේ ආර්යාවත් සුව සේ ගෙදර ගොස් තිබුණහ.

එහෙත් එවැනි සැලකිල්ලක් නොලැබූ ඇමෙරිකානුවන් ලක්ෂයට ආසන්න පිරිසක් දැනටමත් සිටින්නේ මළවුන් අතරය. ඇතැම් විට ට්‍රම්ප් ඒ ගැන සිතනවා ඇත්තේ ඒ ඔවුන්ගේ කරුමය විය හැකි බවය. කෙසේ වෙතත් මේ හුටටප්පරයක් නිසාම ට්‍රම්ප්ගේ ජනප්‍රියත්වය ද බරපතළ ලෙස පහළ වැටී ඇති බව නොරහසකි.

ඇමෙරිකාවේ ජනාධිපතිවරයාට සිදුවී ඇති ඉහත සඳහන් ඇබැද්දිය අපේ රටේ උදවියට කදිම පාඩමකි. මන්ද අපේ අයත් පසුගිය කාලයේ කටයුතු කළේ කොරෝනාවෙන් අපට කිසිම දිනෙක තර්ජනයක් ඇති නොවූ ගාණට වන බැවිනි.

කෝවිඩ් - 19 හෙවත් කොරෝනාවෙන් මෙරටට තර්ජනයක් එල්ලවූ මුල් අවස්ථාවේ අපේ බලධාරීන් මෙන්ම රටේ ජනතාව ද දැඩි කැපවීමකින් යුතුව ඊට මුහුණ දුන් බව සත්‍යයකි. ඒ නිසාම කොරෝනාවෙන් සිදුවූ මරණ සංඛ්‍යාව ද ඉතාමත් පහළ මට්ටමක රඳවා ගැනීමට අපට හැකිවිය. එහෙත් ලෝක බලවතා වූ ඇමෙරිකාවත් , කලාපීය බලවතා වූ අපේ අසල්වැසි ඉන්දියාවත් ඒ වන විට පසුවූයේ කොරෝනා මඩ ගොහොරුවේ කරවටක් ගිලීගෙනය.

කෙසේ වෙතත් රටක් වශයෙන් එවැනි අවදානමකට මුහුණපෑමට අපට සිදු නොවූයේ අපේ ජනාධිපතිතුමා, අගමැතිතුමා සහ හමුදාපතිතුමා ඇතුළු සෞඛ්‍ය බලධාරීන් විසින් උද්ගතවී තිබුණු තත්ත්වයට අදාළව නිසි පියවර ගත් බැවිනි.

එහිදී රටේ ජනතාව ද සෞඛ්‍ය ආරක්ෂක විධිවිධාන වලට දැඩි ලෙස අනුගත වෙමින් කොරෝනා වයිරසය පිටු දැකීම සඳහා අගනා සහයෝගයක් දී තිබුණේය. ඉකුත් මාර්තුවේ දී ශ්‍රී ලංකාව ගිල ගැනීමට පැමිණි කොරෝනා මාරයා පළමු රැල්ලේදීම පරාජය කිරීමට මෙරට දේශපාලන සහ හමුදා බලධාරීන්ට හැකිවූයේ ඒ අනුවය.

කෙසේ වෙතත් තවත් මාස දෙකක් හෝ තුනක පමණ කාලයක් ගතවන විට රටේ බහුතර ජනතාවට ද කොරෝනා වයිරසයේ ඇති බරපතළකම ගැන අමතක වී ගොස් තිබුණේ නිරායාසයෙනි.

එම උදාසීනත්වය නිසාම රටේ සාමාන්‍ය ජනතාව අතර ද එවැනිම අකර්මණ්‍ය බවක් සහ නොසැලකිල්ලක් පැතිරෙමින් තිබුණේය. මුඛ ආවරණ තියා දෙදෙනෙකු අතර තිබිය යුතු දුරස්ථභාවයට පවා කණකොකා හඩමින් තිබුණේ ජනතාව තුළ ඒ පිළිබඳව නොසැලකිලිමත් බවක් ඇති කරවමිනි. ඒ අනුව මෙරට බහුතර ජනතාවගේ අනුමානය වූයේ කොරෝනා මාරයා කොරහත් බිඳගෙන පලා ගොස් ඇති බවය.

එම අනුමානය පිළිබඳව ජනතාව තුළ පැවති විශ්වාසය නිසාම අපට පෙනෙනුයේ කොරෝනා වසංගතයට යළි ඉඩ දීමට තරම් අමාරුවක් කිසිවකුට හෝ නැති ලෙසිනි.

එහෙත් සත්‍යය ඊට වඩා වේගවත් සහ කටුක විය. ඒ අනුව අන්තිමේ දී සිදුවූයේ මාස තුනක් තිස්සේ යටපත් වී තිබූ කොරෝනා වසංගතය යළි හිස එසවීමට මෙරට ඉඩ හසර විවෘත වීමය. නැතහොත් කොරහත් බිඳගෙන පැන ගිය කොරෝනා මාරයාට අත වනා ළඟට කැඳවා ගැනීමය.

ඒ අනුව දැන් අප සතු සියලු ශක්තිය එක්තැන් කර කොරෝනා සතුරා මෙරටින් සහ මුලින්ම පලවා හැරිය යුතුය. එසේ නොමැති වුවහොත් සිදුවන්නේ ඇමෙරිකාවේ මහ බලවතාට සිදුවූ ඇබැද්දියම අපටත් මුහුණ දීමට සිදු වීමය. එය කිසිසේත්ම සුළු කොට තැකිය හැකි කරුණක් නොවන බව ද අවධාරණය කළ යුතුය.

බ්‍රැන්ඩික්ස් ඇඟළුම් කම්හල් සංකීර්ණය

බ්‍රැන්ඩික්ස් සමාගමේ සේවක සේවිකාවන් නිරෝධායන මධ්‍යස්ථානවලට යෑම සඳහා පෙළගැසී සිටි අයුරු

‘බ්‍රැන්ඩික්ස් පොකුර’ මෙන්න!

● සුරේකා නිල්මිණි ඉලංගකෝන්

ලෝකයේ අනෙකුත් රටවලට සාපේක්ෂව ශ්‍රී ලංකාව කොවිඩ 19 ගෝලීයව වසංගතය සාර්ථක ලෙස පාලනය කරමින් නිදහසේ හුස්ම ගැනීමට සැරසුණා පමණි. මාස දෙකකට වැඩි කාලයක් තුළ රට තුළින් ආසාදිතයකු හමු නොවීම බොහෝ හිත්වලට සැනසීමක්ම විය. එහෙත් පසුගිය 4වැනිදා බ්‍රැන්ඩික්ස් ඇපරල් සමාගමේ මිනුවන්ගොඩ ශාඛාවේ සුපවයිසර්වරියක ලෙස සේවය කරමින් සිටි 39 හැවිරිදි කාන්තාවක් කොවිඩ් 19 ආසාදිතයකු බව සනාථ වූයේ නැවතත් වසංගත බිය රට පුරාම පැතිර යමිනි.

උණ රෝගයක් හේතුවෙන් ගම්පහ මූලික රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටි දිවුලපිටිය ප්‍රදේශයේ පදිංචිව සිටි එම කාන්තාව කොවිඩ් ආසාදිතයකු බවට හඳුනා ගත්තේ රෝහලෙන් පිටවී යෑමට පෙර සිදු කළ පී.සී.ආර් පරීක්ෂණයෙනි. වහාම ඇය කොළඹ අයි. ඩී. එච් රෝහල කරා යැවුණු අතර ඇයගේ සැමියා, දරු දෙදෙනා ඇතුළු මිනුවන්ගොඩ බ්‍රැන්ඩික්ස් ඇපරල් හි සේවය කළ 45 දෙනකු වහාම නිරෝධායනය සඳහා යොමු කළ අතර එම කර් මාන්තශාලාවේ සේවකයන් සහ ඔවුන්ගේ ආශ්‍රිතයන් ආසාදිත බවට පත්ව ඇති බව වාර්තා වන්නට විය.

පුද්ගලයන් 100දෙනකු ගැන තාමත් තොරතුරු නෑ

මේ ලිපිය ලියන සිකුරාදා උදෑසන 10 වන විට බ්‍රැන්ඩික්ස් කොවිඩ් පොකුරෙන් වාර්තා වී ඇති සමස්ත ආසාදිතයන් සංඛ්‍යාව 1053කි. මිනුවන්ගොඩ බ්‍රැන්ඩික්ස් කර්මාන්තශාලාවේ සේවයේ නියුතු කාර්ය මණ්ඩලය 1402ක් බවත් පිරිසුදු කිරීම් ඇතුළු වෙනත් කාර්යයන් වෙනුවෙන් එහි සේවය නිරතව සිටි පිරිසද ඇතුළුව 1500කට ආසන්න සංඛ්‍යාවක් එම කර්මාන්තශාලවේ සේවය කළ බවද වාර්තා වී ඇත. බ්‍රැන්ඩික්ස් ආසාදිතයන්ගෙන් 506ක් ආගිය අතක් නොමැති බව 8වැනිදා මාධ්‍ය විසින් වාර්තා කළ අතර 9 වැනිදා උදෑසන යුද හමුදාපති ලුතිනන් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වාගේ ප්‍රකාශයක් උපුටා දක්වමින් මාධ්‍ය වාර්තා කළේ එම බ්‍රැන්ඩික්ස් ආසාදිත පොකුරට අයත් පුද්ගලයන් 100දෙනකු ගැන තාමත් තොරතුරු නොමැති බවයි. ඔවුන් රෝහල්වල හෝ නිරෝධායන මධ්‍යස්ථානවල සිටිය යුතු වුවත් ඔවුන් සමාජයෙන් ඉවතට ගැනීම සඳහා අඛණ්ඩ මෙහෙයුම් ක්‍රියාත්මක වන බවත් යුද හමුදාපතිවරයා වැඩිදුරටත් ප්‍රකාශ කළේය. මේ වන විට වාර්තා වී ඇති තොරතුරු අනුව මිනුවන්ගොඩ බ්‍රැන්ඩික්ස් ආයතනයේ සෙවය කළ පුද්ගලයන්ගෙන් 850ක් රෝහල්ගතව සිටින අතර 600ක් නිරෝධායන මධ්‍යස්ථානවල රැඳී සිටී. බ්‍රැන්ඩික්ස් සේවකයන්ට ළඟම ඇති පොලිස් ස්ථානයට වාර්තා කරන ලෙස පොලිසිය කළ ඉල්ලීමට අනුව පසුගිය 7 සහ 8 වැනිදා පිළිවෙළින් 275 සහ 125 බැගින් පුද්ගලයන් 400 දෙනකු පොලිසිය හමුවට පැමිණ තිබේ. ඒ අනුව තවදුරටත් සමාජය තුළ සැඟවී සිටින බ්‍රැන්ඩික්ස් සේවකයන් සංඛ්‍යාව ඉතා අඩු අගයක් ගනු ඇති බව පැවසූ පොලිස් මාධ්‍ය ප්‍රකාශක, නියෝජ්‍ය පොලිස්පති අජිත් රෝහණ මහතා තවදුරටත් සැඟවී සිටින බ්‍රැන්ඩික්ස් ආයතන සාමාජිකයන් නිරෝධායන සහ රෝග වැළැක්වීමේ ආඥා පනතේ ප්‍රතිපාදන අනුව 9 වැනිදා සිට අත්අඩංගුවට ගන්නා බව ප්‍රකාශ කළේය.

දිවයින පුරා විවිධ ප්‍රදේශවලින් ආසාදිතයන් හමුවීමත් සමඟ බ්‍රැන්ඩික්ස් ආයතන පිළිබඳ මේ වන විට රටේම අවධානය යොමුවී තිබේ. බ්‍රැන්ඩික්ස් යනු මෙරට විශාලතම ඇඟලුම් අපනයනකරුවකු වන අතර සමාගමේ වාර්ෂික පිරිවැටුම ඩොලර් මිලියන 600 ඉක්මවයි. මෙරට අපනයන අංශයේ තනි විශාලතම සේවායෝජකයා මෙන්ම අපනයන ක්ෂේත්‍රයේ වැඩිම රැකියා උත්පාදක, වැඩිම ශුද්ධ විදේශය විනිමය උත්පාදක, විශිෂ්ටතම අපනයනකරු (ඇඟලුම් අංශය) ආදී සම්මානවලට පාත්‍ර වී ඇති බ්‍රැන්ඩික්ස් සමාගම දස වැනි වරටත් මෙරට පෞද්ගලික අංශයේ විශාලතම රුධිර දායකයා ලෙස සම්මානයට පාත්‍ර වීමද විශේෂත්වයකි. කොවිඩ් 19 වසංගතයට එරෙහි සටනේදී එක්සත් ජනපදයට සහාය දැක්වීම සඳහා මුහුණු ආවරණ මිලියන 200ක් නිෂ්පාදනය කර නැව්ගත කිරීමටද බ්‍රැන්ඩික්ස් සමාගම විසින් කටයුතු කරනු ලැබිණ. ඊට අමතරව එම සමාගම විසින් සිදුකරනු ලබන සමාජ සත්කාර සහ සේවක සුබසාධක වැඩසටහන්ද රාශියකි.

1969දී ශ්‍රී ලංකාවේ ආරම්භ කරන

බ්‍රැන්ඩික්ස් ආයතනයේ මුලින් හඳුනාගත් කොරෝනා ආසාදිත කාන්තාවගේ දියණිය ඉගෙනුම ලැබූ දිවුලපිටිය ඥානාවාස විදුහල විෂබීජ හරණයට ලක් කරන අයුරු. (ජායාරූපය - සමන්ත විරසිරි)

- **සිකුරාදා වන විට බ්‍රැන්ඩික්ස් කොවිඩ් පොකුර 1053 දක්වා ඉහළට**
- **බ්‍රැන්ඩික්ස් සේවකයන් 850ක් රෝහල්වල 600ක් නිරෝධායනයට**
- **දිවුලපිටියේ කාන්තාව බ්‍රැන්ඩික්ස් පොකුරේ පළමු ආසාදිතයා නොවේ**
- **සැප්තැම්බර් 20 හෝ ඊට සති දෙකකට පෙර සිට වයිරසය කම්හල ඇතුළත ව්‍යාප්ත වූ බවට සැකයක්**
- **බ්‍රැන්ඩික්ස් සෞඛ්‍ය නීති කඩ කළාදැයි සොයන්න කම්කරු ඇමතිගෙන් විමර්ශනයක්**

බ්‍රැන්ඩික්ස් ආයතනය 1972 වසරේදී සිය මෙහෙයුම් ආරම්භ කර ඇත්තේ පකිස්ථානයේ ඕමාර් සමූහයට අයත් ව්‍යාපාරයක් ලෙසටය. 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ 2002 දී මෙම ව්‍යාපාරය පෞද්ගලික සමාගමක් ලෙස සංස්ථාගත කර තිබේ. මේ වන විට සීදුව, මීරිගම, මඩකලපුව, පන්නල, බියගම, කටුනායක, ජා ඇල, වැලිසර, රත්මලාන, කොළඹ, දෙහිවල, අවිස්සාවේල්ල, වතුපිටිවල, නිවිතිගල, රිදීගම, මිනුවන්ගොඩ, කොග්ගල, මඩකලපුව, රඹුක්කන, පොල්ගහවෙල, පොළොන්නරුව, කහවත්ත, මොරටුව, ගිරිතලේ ආදී කර්මාන්තශාලා සහ ආයතන 28ක 41,000කට ආසන්න කාර්ය මණ්ඩලයක් සේවය කරයි.

ඉන්දියාව, බංග්ලාදේශය, එක්සත් ජනපදය ,හයිටි, සිංගප්පූරුව, කාම්බෝජය, ඕස්ට්‍රේලියාව සහ එක්සත් රාජධානියේ පිහිටා ඇති ශාඛාවලට අයත් කර්මාන්තශාලා සහ ආයතන 38ක 60,000කට අධික පිරිසක් සේවය කරති. වික්ටෝරියා සීක්‍රට්, ගැප්, නෙක්ස්ක් සහ මාර්ක්ස් ඇන්ඩ් ස්පෙන්සර් වැනි ප්‍රකට සමාගම් වෙනුවෙන් සිය නිෂ්පාදන සිදු කරන බ්‍රැන්ඩික්ස් සමාගමට අයත් අක්කර 1000ක් පුරා විහිදුණු දැවැන්ත ඇඟළුම් නගරය පිහිටා ඇත්තේ ඉන්දියාවේ ආන්ද්‍රා ප්‍රදේශ් ප්‍රාන්තයේ වරාය නගරය වන විශාකාපටනම් හිය. ඉන්දියාව ඇතුළු අනෙකුත් අතුරු ශාඛා සමඟ මෙරට පිහිටි බ්‍රැන්ඩික්ස් ආයතනයේ මවු ශාඛාව නිරන්තර ගනුදෙනු පවත්වයි.

මිනුවන්ගොඩ බ්‍රැන්ඩික්ස් කර්මාන්තශාලාව ආශ්‍රිතව ඇතිවී රට පුරා ව්‍යාප්ත වෙමින් තිබෙන කොරෝනා පොකුරේ මූලාශ්‍ර සොයා ගැනීමට සෞඛ්‍ය සහ ආරක්ෂක අංශ අපොහොසත් වී ඇති වාතාවරණයක් තුළ එම තත්ත්වය ඇතිවීමට ආසන්නතම හේතුව ඉන්දියාවේ සිට මිනුවන්ගොඩ කර්මාන්තශාලාවට පැමිණි සේවකයන් පිරිසක් බවට සමාජ මාධ්‍ය තුළ දැඩි ආන්දෝලනයක් ඇති විය. බ්‍රැන්ඩික්ස් ආයතනය මගින් විශේෂිත ගුවන් යානයකින් මත්තල ගුවන්තොටුපළ හරහා ඉන්දියාවේ විශාකාපටනම් සිට 60 දෙනකුගෙන් සමන්විත පිරිසක් මෙරටට ගෙන්වා ගත් බවට සඳහන් ලියවිල්ලක්ද සමාජ මාධ්‍ය හරහා සංසරණය වන්නට වූයේ එම ආන්දෝලාත්මක බව තවත් වැඩි කරමිනි. එම ලියවිල්ලට අනුව පසුගිය 22දා පස්වරුවේ UL 1159 දරන ගුවන් යානයෙන් අදාළ සේවකයන් මත්තලට පැමිණ ඇත. බ්‍රැන්ඩික්ස් ආයතනය නිවේදනයක් නිකුත් කරමින් ඒ පිළිබඳ කරුණු පැහැදිලි කළේ ඉන්පසුවය.

ඒ අනුව එහි දක්වා ඇත්තේ ගුවන් යානා 3ක් මගින් ඉන්දියාවේ විශාකාපටනම් කර්මාන්තශාලාවේ සිට එහි සේවය කළ ශ්‍රී ලංකා කාර්ය මණ්ඩලයට සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකන් මෙරටට ගෙන්වා ගැනීමට කටයුතු කළ බවත් අදාළ පිරිස රජයේ අනුමත නිරෝධායන මධ්‍යස්ථානවල සෞඛ්‍ය බලධාරීන්ගේ අධීක්ෂණය යටතේ දින 28ක් නිරෝධායනයට ලක් කළ බවයි. එමෙන්ම ඉන්දියාවෙන් කිසිදු ඇනවුමක් බාර නොගත් බවත් ඉන්දියාවෙන් ගෙන්වූ රෙදිපිළි නිෂ්පාදන කටයුතු සඳහා භාවිත නොකළ බවත් එම සමාගම නිවේදනය මගින් පවසා තිබිණ, මීට අමතරව ඉන්දියාවේ සිට පැමිණි ශ්‍රී ලාංකියන්, ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් හෝ කිසිදු විදේශිකයකු මිනුවන්ගොඩ කර්මාන්ත ශාලාවට නොපැමිණි බවද එහි දැක්වේ.

මිනුවන්ගොඩ කර්මාන්තශාලවෙන් පළමු වැනි කොවිඩ් 19 ආසාදිත කාන්තාව හඳුනා ගැනීමෙන් පසුවද සේවයට පැමිණෙන ලෙස දැන්වූ බව පවසමින් චෝදනා කරන කාන්තාවක් හා සම්බන්ධ වීඩියෝව පිළිබඳ අදහස් දක්වමින් සමාගම සිය නිවේදනයේ දක්වා ඇත්තේ ඇය කාන්තා නේවාසිකාගාරයක් පවත්වාගෙන යන තැනැත්තියක බවත් ඇගේ නේවාසිකාගාරයේ නවාතැන් ගෙන සිටි සේවිකාවන් සහ අධීක්ෂණ නිලධාරිනිය කොන්ත්‍රාත් පදනම මත ලබාගත් තුන්වැනි පාර්ශ්වයේ පිරිසුදු කිරීමේ සේවා සම්පාදනය කරන ආයතනකට අනුබද්ධිත සේවිකාවන් මිස බ්‍රැන්ඩික්ස් සමාගමේ කාර්යමණ්ඩල සාමාජිකයන් නොවන බවයි.

මේ පිළිබඳ අදහස් දක්වමින් යුද හමුදාපති ලුතිනන් ජෙනරාල් ශවීන්ද්‍ර සිල්වා සඳහන් කළේ මිනුවන්ගොඩ කර්මාන්තශාලාවේ තාක්ෂණික කටයුත්තක් සඳහා පැමිණි ඉන්දියානු ජාතිකයන් පිරිසක් නිරෝධායන ක්‍රියාවලියකින් තොරව ගුවන්තොටුපළේ සිට කම්හලට පැමිණ ඇති බවට පළවන මාධ්‍ය වාර්තා අසත්‍ය බවයි. ඉන්දියාවේ සිට පැමිණි සේවයකයන් කොස්ගොඩ හෙරටන් හෝටලයේ නිරෝධායනය වන බවත් ඔහු සඳහන් කළේය. නමුත් ඔවුන්ගේ පී.සී.ආර් පරීක්ෂණ සිදුකර ඇත්තේ පෞද්ගලික

කොරෝනා මඩින්න මුහුණු ආවරණ මිලියන 200ක් නැව්ගත කළ බ්‍රැන්ඩික්ස් එකට මොකද වුණේ?

අංශයේ මැදිහත් වීමෙන් බව දකුණු පළාත් සෞඛ්‍ය බලධාරීන් පවසා තිබේ. සැප්තැම්බර් 22 දා පැමිණි පිරිස පසුගිය 6 වැනිදා දින 14ක නිරෝධායන කාල සීමාව නිම කිරීමට තිබුණද ඔවුන් නිරෝධායනය නිම කරන අවස්ථාවේදී හෝ දෙවැනි වර පී.සී.ආර් පරීක්ෂණ සඳහා මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන්ගේ මැදිහත් වීමක් සිදු නොවූ බවත් අදාළ සේවකයන් මෙරටට ගෙන්වීමට අදාළ ක්‍රියාපටිපාටිය පෞද්ගලික ආයතනයක මැදිහත් වීමෙන් සිදුකර ඇති බවද අනාවරණය වී තිබේ.

කෙසේ වෙතත් බ්‍රැන්ඩික්ස් පොකුරින් හමුවූ පළමු ආසාදිතයා වන දිවුලපිටියේ කාන්තාව රෝහලේ සිටම පසුගියදා මාධ්‍යයට ප්‍රකාශයක් කළේ ඒ වන විටත් ඇය සම්බන්ධයෙන් සමාජ මාධ්‍ය ජාලා තුළ සංසරණය වෙමින් පැවැති මඩ ප්‍රචාරවලින් කම්පාවට පත්වය.

"ගම්පහ හොස්පිට්ල් එකට යනවා ඇරෙන්න මම කොහේවත් ගියේ නැහැ. අඩුම තරමේ අහල පහළ කඩේකටවත් යන්න මට වෙලාව තිබුණේ නැහැ. ඩිලිවරි ටයිට් වෙලා තිබුණ නිසා නිවාඩුවක්වත් ගත්තෙ නැහැ. ගේ ගාවින් උදේ 6.50ට ට්‍රාන්ස්පෝට් එකට නැග්ගහම හැමදාම ගෙදර එනකොට රෑ 8.10-8.15 වෙනවා. ඒ ඇරෙන්න මම කිසිම තැනකට ගියේ නැහැ. ඒක මට සීයට සීයක් විශ්වාසයි. ෆැක්ටරිය ඇතුළින් මිසක් පිටින් කිසිම දෙයක් ආවේ නැහැ. අපි ගමේ කාටවත් කරදරයක් නැතිව ජීවත් වුණේ. එහෙම තියෙද්දි මට කරපු අපහාසය ගැන ගොඩක් දුක් වෙනවා."

කර්මාන්තශාලාවේ සේවක සේවිකාවන් අතර ස්වසන ආබාධ

කොරෝනා ආසාදිත බව හඳුනාගත් ඇයගේ 16 හැවිරිදි දියණියද මේ වන විට රෝහල්ගතව ප්‍රතිකාර ගන්නා අතර ඇය ඉගෙනගන්නා පාසලේ දරුවන් සහ ගුරුවරුන්ට කරන ලද පී.සී.ආර් පරීක්ෂණවලින් අනාවරණය වී ඇත්තේ ඔවුන් කිසිවකු ආසාදිතයකු නොවන බවයි. වසංගත රෝග විද්‍යා ඒකකයේ ප්‍රධානි විශේෂඥ වෛද්‍ය සුදත් සමරවීර පසුගිය 7 වැනිදා පැවති මාධ්‍ය හමුවේදී අනාවරණය කළේ පසුගිය සැප්තැම්බර් 20 වැනිදා සිට කර්මාන්තශාලාවේ සේවක සේවිකාවන් අතර ශ්වසන ආබාධ පැවති බවට තොරතුරු වාර්තා වී ඇති බවයි. එබැවින් බ්‍රැන්ඩික්ස් පොකුරෙන් පළමු වරට හඳුනාගත් දිවුලපිටියේ කාන්තාව එම පොකුරේ පළමු ආසාදිතයා නොවන බව හඳුනා ගෙන ඇති බවත් ඉකුත් සැප්තැම්බර් 20 වැනිදා හෝ ඊට සති දෙකකට පමණ පෙර සිට වයිරසය කම්හල ආශ්‍රිතව ව්‍යාප්ත වන්නට ඇති බවත් ඔහු වැඩිදුරටත් සඳහන් කළේය.

මේ අතර පෞද්ගලික අංශයේ වෘත්තිය සමිති, හාම්පුතුන් හා කම්කරු අමාත්‍යාංශයෙේ නිලධාරීන්ගේ සහාගිත්වයෙන් කම්කරු අමාත්‍යාංශයේ පැවති හමුවකදී නිදහස් වෙළෙඳ කලාප සහ පොදු සේවක සංගමයේ ලේකම් ඇන්ටන් මාර්කස් පැවසුවේ බ්‍රැන්ඩික්ස් කර්මාන්තශාලාව සෞඛ්‍ය මාර්ගෝදේශ අනුව පවත්වාගෙන ගියේ නම් මෙම ගැටලුව ඇති නොවන බවයි. ඒ අනුව කම්කරු ඇමති නිමල් සිරිපාල ද සිල්වා කම්කරු කොමසාරිස් ජෙනරාල්වරයාට නියෝග කර ඇත්තේ අදාළ කර්මාන්තශාලාවට එල්ල වන චෝදනා සම්බන්ධයෙන් පැමිණිල්ලක් ඇත්නම් ඒ පිළිබඳ විමර්ශනයක් පවත්වන ලෙසයි. ආයෝජන මණ්ඩලයට අයත් කම්හල් 1600ක සේවය කරන සේවක සේවිකාවන් සඳහා පී.සී.ආර් පරීක්ෂණ අනිවාර්ය කිරීමට සෞඛ්‍ය අංශ නියෝග කර තිබීමද මේ අවස්ථාවේ කාලෝචිත පියවරකි.

ශිෂ්‍යත්වය අද උසස් පෙළ හෙට

● සුභාෂිණි ජයරත්න

කොවිඩ් වසංගතය හේතුවෙන් අවස්ථා කිහිපයකදීම කල්ගිය ශිෂ්‍යත්ව විභාගය හා උසස් පෙළ විභාගය අද හා හෙට සිට ආරම්භ වෙයි. අනපේක්ෂිත ලෙස දිවුලපිටියේ බ්‍රැන්ඩික්ස් ආයතනයෙන් තෙවැනි කොවිඩ් පොකුර ආරම්භ වූයේ හරියටම විභාගයට සතියකට කලිනි. ඒ වන විට විභාග දෙපාර්තමේන්තුව ප්‍රශ්න පත්‍ර සකස් කර දරුවන්ගේ ප්‍රවේශ පත්‍ර ලබා දී ට්‍යුෂන් පංති පවා තහනම් කර විභාගය පැවැත්වීමට සියල්ල සූදානම් සිටියේය.

පසුගිය කාලයේ පැවැති කොවිඩ් වසංගතයෙන් දරුණුවට බැට කෑ එක් පිරිසක් වූයේ මේ දරුවන්ය. ඔවුන්ට පාසල් පමණක් නොව උපකාරක පංතිවලින් කිසිදු සුදානමක් නොමැතිව උසස් පෙළ හා ශිෂ්‍යත්ව විභාගය නැවතත් මාස ගණනකින් ආපස්සට ගියේය. සාමාන්‍යයෙන් මේ විභාග දෙක අගෝස්තු මස පවත්වා අහවර කළ යුතු වන්නේ මෙම විභාග දෙක අධ්‍යාපන පද්ධතියත් සමග ජාලගතව පැවැතීමත් දරුවන්ට බාහිර උසස් අධ්‍යාපන අවස්ථා ලබා ගැනීමට නම් නියමිත කාලයේ උසස් පෙළ අනිවාර්යයෙන්ම පැවැත්විය යුතු නිසාත්ය. නමුත් මුලින් සැප්තැම්බර් මසටත් ඉන් අනතුරුව මෙම විභාග දෙක ඔක්තෝම්බර් මසටත් කල්ගිය අතර දරුවන් පමණක් නොව ගුරුදෙමවුපියන්ගේත් දැඩි ඉල්ලීම වූයේ කෙසේ හෝ කල් නොදමා මේ විභාග දෙක යොදා ගත් දිනයේම පවැත්විය යුතු බවය. තෙවැනි කොරෝනා රැල්ල මේ වන විටත් භයානක අන්දමින් රට පුරා ව්‍යාප්ත වෙද්දි දරුවන්ගේ මේ අපේක්ෂා කිසිසේත් බොඳ වන්නට නොදී මේ අසීරු සහගත අවස්ථාවේ දරුවන් වෙනුවෙන් ගත් අඩිය ආපස්සට නොගැනීමට රජය ඇතුළු අධ්‍යාපන හා විභාග බලධාරීන් ගත් මේ පියවර ඓතිහාසික ජයග්‍රහනයකි.

"මේ විභාග දෙවතාවක් කල් දැම්මා. නමුත් වත්මන් තත්වය අනුව අපි තීරණයක් ගත්තේ දරුවන්ගේ මානසික තත්ත්වය හා උනන්දුව සැලකිල්ලට ගනිමින් දරුවන්ගේ විභාගය කෙසේ හෝ පැවැත්වීමට. වෛරසයේ හැසිරීම අවිනිශ්චිත වුවත් අපි මේ සියලු කටයුතු යාවත්කාලීන කරමින් දරුවන්ගේ විභාගය සඳහා සෞඛ්‍යාරක්ෂිත පරිසරයක් ඇති කරනවා. විෂබීජහරණ, සමාජ දුරස්තබව ඇති කරමින් මේ කටයුතු කරන්න සෞඛ්‍ය අංශ හා අනිකුත් ආරක්ෂක අංශ අපිට පූර්ණ සහය ලබා දී තියෙනවා..." ඒ මේ කර්තව්‍යයේ නියමුවා වන අධ්‍යාපන ඇමැති මහාචාර්ය ජී.එල් පීරිස් මහතාය.

මේ වන විට විභාග මධ්‍යස්ථාන 2936 කදී අද පැවැත්වෙන ශිෂ්‍යත්ව විභාගයට හා හෙට (12 දා) සිට නොවැම්බර් 6 දින දක්වා විභාග මධ්‍යස්ථාන 2648 කදි පැවැත්වෙන උසස් පෙළ විභාගයට මේ වන විට සියල්ල සූදානම්ය. මෙවර ශිෂ්‍යත්ව විභාගයට අපේක්ෂකයින් 331,694ක්ද, උසස් පෙළ විභාගයට අපේක්ෂකයින් 362,824 දෙනෙක්ද මුහුණ දෙන අතර ගම්පහ අධ්‍යාපන කලාපයේ සිසුන් 7000 කට ආසන්න ප්‍රමානයක් උසස් පෙළ විභාගයටත් සිසුන් 6000 කට ආසන්න ප්‍රමානයක් ශිෂ්‍යත්ව විභාගයටත් මුහුණ දෙති. කොරෝනා දැඩි ලෙස ව්‍යාප්ත මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපයේ ශිෂ්‍යත්ව විභාග මධ්‍යස්ථාන 50 ක් හා උසස් පෙළ විභාග මධ්‍යස්ථාන 37 ක් ඇති අතර එහි කලාප අධ්‍යාපන අධ්‍යක්ෂක වජිර පෙරේරා සඳහන් කළේ ඉතාම ආරක්ෂිත ක්‍රමවේදයකට මෙම පරිසර සකස් කළ බවයි.

"අපිට මෙවැනි ආපදා තත්ත්ව වලට මුහුණ දීලා පුරුදුයි. මේ වන විට දරුවන් සිටින මානසික තත්ත්වය අපිට හොඳින්ම තේරෙනවා. යම් හෙයකින් ගම්පහ දරුවන්ගේ විභාග මධ්‍යස්ථාන වෙනස් කළොත් ඒ දරුවන් තුළ පොඩි කැළඹීමක් ඇති වෙන්න පුළුවන්. ඒ නිසා දරුවන්ට කිසිදු මානසික කැළඹීමක් ඇති නොවන පරිදි අපි ඒ දරුවන්ට ඒ මධ්‍යස්ථාන තුළම විභාගය කිරීමට සලස්වනවා. අපි සියලු දෙනා මේ මෙහෙයුමට නාභිගත වුණේ දරුවන් වෙනුවෙන්මයි..." ඒ අධ්‍යාපන ලේකම් මහාචාර්ය කපිල .සි පෙරේරාය.

මේ වන විට මෙම ප්‍රසිද්ධ විභාග දෙක පැවැත්වෙන්නේ දැඩි ආපදා තත්ත්වයක් මතය. එසේ හෙයින් විභාගය පැවැත්වීමේ සූදානම පැයෙන් පැය යාවත්කාලීන වන්නේය. මෙම විභාග කටයුතු වෙනුවෙන් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් 350 ක පිරිසක් සේවය සඳහා යොදවා ඇත. ඒ ඒ කොට්ඨාශ කලාප මට්ටමින් ගම්පහ මිනුවන්ගොඩ අධ්‍යාපන කලාප ඇතුළුව සියලු කලාප විෂබීජහරණ කටයුතු අවසන් මොහොත වන විටත් සිදු කරමින් පැවැත්වෙන්නේ දරුවන්ට කිසිදු ආකාරයකින් අනියත බියත් ඇති නොවන පරිදිය. එසේම සෑම පාසලකම ඒ විදුහල්පතිවරයාට විශේෂ වගකීමක් පැවැරෙන අතර ඔහු තම පාසලේ අතිරේක ශාලාධිපතිවරයෙකු වෙයි. සෑම විභාග මධ්‍යස්ථානයකම රෝගී කාමරයක් සකස් කර ඇති අතර ආපදා කලමනාකරණ මධ්‍යස්ථානය විසින් පළාත් හා කලාප මට්ටමින් මේ කටයුතු දැඩිව අධීක්ෂණය කෙරෙයි. ගම්පහ අධ්‍යාපන කලාපයෙන් කොළඹට එන දරුවන්ට පමණක් නොව අනිකුත් අධ්‍යාපන කලාපවලින් ගම්පහ අධ්‍යාපන කලාපයට යන දරුවන්ට කිසිදු වෙනසක් නොකර සෞඛ්‍ය ක්‍රමවේදයන්ට පමණක් මුල්තැන දෙමින් විභාගය පැවැත්වෙන්නේ එමගින් දරුවන්ට වන මානසික පීඩනය අවම කිරීමටය.

කෙසේ වෙතත් ගම්පහ දිස්ත්‍රික්කයේ කැළණිය, ගම්පහ, වේයංගොඩ හා මීගමුව අධ්‍යාපන කලාපයේ විභාග මධ්‍යස්ථාන අවදානම අවම වන අයුරින් පෙර සූදානම් සකස් වන්නේ අංග සම්පූර්ණ වැඩ පිළිවෙළක් යටතේය. ගම්පහ පළාතට අතිරේක පරීක්ෂකවරයෙකු පත්කර ඇත. එසේම මේ වන විටත් නියෝධායනයට ලක් වූ දරුවන් වෙනුවෙන් ඒ ඒ නිරෝධායනය වූ ස්ථානවලදීම විභාගයට මුහුණ දෙන අතර ගම්පහ සිට කොළඹට පැමිණෙන කොවිඩ් කලාපවල දරුවන්ට විභාගයට මුහුණ දීම සඳහා විශේෂිත මධ්‍යස්ථාන 9 ක් ගම්පහ පළාත තුළ ආරම්භ කර ඇත. මීට අමතරව අයි.ඩී.එච් උණ රෝහලේද විශේෂිත මධ්‍යස්ථානයක් ආරම්භ කිරීමට කටයුතු යොදා ඇත.

මෙවර දැඩි සෞඛ්‍ය ක්‍රමවේද අනුගමනය කරමින් විභාග පැවැත්වෙන් අතර ඒ කටයුතු පහසුවීමට දරුවන් විභාග ශාලාවට පැයකට පමණ පෙර ඇතුළු විය යුතු බව විභාග කොමසාරිස් ජනරාල්වරයා දැඩිව අවධාරණය කරයි. මේ හේතුවෙන් දරුවන්ගේ ගමනාගමන ප්‍රශ්නයට පැනනගින බාධක අවම කිරීමට ලංකා ගමනාගමන මණ්ඩලය හා දුම්රිය දෙපාර්තමේන්තුව එක්ව විශේෂ වැඩ පිළිවෙලක් සකස් කිරීමට උපදෙස් දී ඇත.

මේ අනුව ඇඳිරි නීති පළාත්වල දරුවන්ට විභාග මධ්‍යස්ථාන කරා යාමට මෙන්ම පිට පළාත්වලට විභාග සඳහා යන අපේක්ෂකයින්ට විශේෂ බස් හා දුම්රිය සේවාවක් විභාග පැවැත්වෙන කාලය පුරාවටම ක්‍රියාත්මක කෙරෙයි. විභාග කොමසාරිස් ජනරාල්වරායා සඳහන් කරන්නේ දරුවන්ගේ විභාග ප්‍රවේශ පත්‍රය ඇඳිරි නීති බලපත්‍රය ලෙස යොදා ගත යුතු බවයි. මෙහිදී සෞඛ්‍ය ලේකම්වරයා හා විභාග කොමසාරිස් ජනරාල්වරයා දෙමවුපියන්ගෙන් ඉල්ලා සිටින්නේ තම දරුවන්ව වඩාත් ආරක්ෂිත ක්‍රමයකින් විභාගයට පෙර හා පසු රැගෙන යන ලෙසය.

විභාග අපේක්ෂකයින් විභාග ශාලාවට පැමිණීමේදි හා ඉන් පිටත් වීමේදි මුළු ආවරණ පළැඳීම අනිවාර්ය කර ඇත. එසේම විෂබීජහරණ කටයුතු කිරීමෙන් අනතුරුව සෑම සිසුවෙකුම විභාග ශාලාවට ඇතුළත් කර ගැනීමට අවශ්‍ය පියවර සෞඛ්‍ය බලධාරීන් විසින් ගනු ඇත. කොවිඩ් වසංගතයෙන් අනතුරුව ප්‍රථම වරට ප්‍රධාන මැතිවරණයක් පවත්වීමේ අත්දැකීම්ද අප සතුව ඇත. මේ ක්‍රියාන්විතයේදි මැතිවරණ කොමසාරිස් කාර්යාලයද සිය අත්දැකීම් පමණක් නොව සම්පත් දායකත්වයක් ලබා දීමට මෙහිදි එකඟ වී ඇත්තේ දැයේ දරුවන් වෙනුවෙන්ය. මේ වන විට අධ්‍යාපන අමාත්‍යාංශය විසින් දරුවන්ගේ තොරතුරු ඇතුළත් පත්‍රිකාවක් අධ්‍යාපන අමාත්‍යාංශ වෙඩ් අඩවියට නිකුත් කර ඇති අතර එය දරුවන්ගේ දෙමවුපියන් විසින් මාර්ගත ක්‍රමයට පිරිවිය යුතු අතර විභාග පැවැත්වෙන දින දරුවන්ගේ සෞඛ්‍ය තත්ත්වය පිරික්සීමට එය යොදා ගැනීමට නියමිතය.

"මෙවර අපි අනුගමනය කරන්නේ සාමාන්‍ය තත්ත්වයෙන් බැහැර වූ ක්‍රියාමාර්ගයක්. සියල්ල දරුවන්ගේ ආරක්ෂාව වෙනුවෙන් ක්‍රියාත්මකයි. රජය හා අපි අවදානම අවම කිරීමට සියලු කටයුතු සූදානම් කරනවා. නමුත් දරුවෝ මතක තබා ගත යුතු කරුණක් වන්නේ මෙවන් අවදානම් තත්ත්වයකදි වුවත් විභාග වංචා අවම කිරීමටත් දැඩි ක්‍රියාමාර්ග අපි ගෙන තියෙන බව. සෑම විභාග මධ්‍යස්ථානයකටම කොවිඩ් ජංගම මුර සේවයක් ක්‍රියාත්මකයි. යම් අයෙකුට ප්‍රශ්නයක් පවතීනම් 1911 ට හා 1988 කතා කර විසඳුම් ගත හැකියි. " ඒ විභාග කොමසාරිස් ජනරාල් සනත් පූජිත ය.

කොවිඩ් වසංගතය දැඩිව ව්‍යාප්ත වෙද්දි ඊට අභියෝග කරමින් මෙවන් ප්‍රසිද්ධ විභාග දෙකක් ලොව කිසිදු රටක මුල්වරට පැවැත්වූයේනම් එය ලංකාවේ පමණි. මේ වන විට දරුවන් වෙනුවෙන් රටම සූදානම්ය. දරුවන් කිසිදු චකිතයකින් තොරව විභාගයට මුහුණ දීම සැමගේ එකම අපේක්ෂාව වන්නේය.

කොරෝනා මැද ඉතිහාසගත අභියෝගයක්

සෑම විභාග මධ්‍යස්ථානයකටම කොවිඩ් ජංගම මුර සේවයක්

පැයකට පෙර විභාග ශාලාවට පැමිණෙන්න

ගම්පහ විශේෂිත විභාග මධ්‍යස්ථාන 9ක්

උණ රෝහලටත් විභාග මධ්‍යස්ථානයක්

විභාග වංචා ඇති වෙන්න ඉඩ දෙන්නේ නැහැ

විභාග ප්‍රවේශ පත්‍රය ඇඳිරි නිති බලපත්‍රයක් ලෙස යොදා ගන්න

මිනුවන්ගොඩ මධ්‍යස්ථාන. ශිෂ්‍යත්ව- 50, උසස් පෙළ 37

අධ්‍යාපන ඇමැති මහාචාර්ය ජී.එල් පීරිස්

අධ්‍යාපන ලේකම් මහාචාර්ය කපිල .සි පෙරේරා

විභාග කොමසාරිස් ජනරාල් සනත් පූජිත

මැද පෙරදිගට ගිය ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් 2600කට කොරෝනා 67ක් මිය ගිහින්

● තාරක වික්‍රමසේකර

කොවිඩ් - 19 හෙවත් කොරෝනා රෝගය යළිත් ශ්‍රී ලංකාවේ වසංගතයක් ලෙස ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රදේශ කිහිපයක් කේන්ද්‍ර කරගෙන ඇරැඹුණේ අපගේම නොසැලකිල්ල නිසාය. සෞඛ්‍ය අංශ විසින් ලබා දුන් උපදෙස් නොපිළිපැදීම නිසා මේ වසංගතය රැල්ලක් සේ දින කිහිපයක් තුළ දිස්ත්‍රික්කයේ බොහෝ ප්‍රදේශ අකර්මන්‍ය කරන්නට සමත් විය.

ශ්‍රී ලංකාවේ මේ ලෙසින් කොවිඩ් - 19 රෝගය යළිත් පැතිරෙද්දී ලොව පුරාද කොවිඩ් - 19 රෝගය නිසා මිය ගිය සංඛ්‍යාව ලක්ෂ 11කට ආසන්නය. ශ්‍රී ලංකාවේ කොවිඩ් - 19 නිසා මිය ගිය සංඛ්‍යාව 13 දෙනකු වන නමුත් එතෙර රැකියා පිණිස ගොස් මෙරටට විදේශ විනිමය රැගෙන ඒමට කටයුතු කළ ශ්‍රී ලාංකිකයන් 67 දෙනකු මේ වන විට කොවිඩ් - 19 රෝගය නිසා මිය ගොස් ඇත. එය අප රටට කිසිසේත්ම සුබදායක පණිවිඩයක් නොවේ. මෙහි පළමු මරණය වාර්තා වූයේ සවුදි අරාබියෙනි. ආසන්න දිනකදීම මිය ගිය පුද්ගලයා වාර්තා වන්නේ ජෝර්දානයෙන් බව විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි මංගල රන්දෙණිය සිළුමිණට කීවේය. ඔහු පැවසුවේ එසේ මියගොස් ඇත්තේ ජෝර්දානයේ ඇඟලුම් කම්හලක සේවය කරන අයකු බවත් එම පුද්ගලයා පසුගිය 03 වැනිදා සෙනසුරාදා මිය ගොස් ඇති බවයි. විදේශ රැකියා කරමින් සිටියදී කොවිඩ් - 19 නිසා මිය ගිය 67 වැන්නා ඔහු බවද රන්දෙණිය කීවේය.

අද වන විට විදෙස් ගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්ගෙන් කොවිඩ් - 19 නිසා වැඩිම පිරිසක් මියගොස් ඇත්තේ සවුදි අරාබියෙනි. එම පිරිස 30ක් බව රන්දෙණිය පෙන්වා දුන්නේය. සවුදි අරාබියට අමතරව ක්වේට් රාජ්‍යයෙන් 17 දෙනකු මියගොස් ඇති අතර ඩුබායි හා අඩුඩාබි රාජ්‍යන්හි 8 දෙනකු මියගොස් ඇති බවත් කටාර් රාජ්‍යයේ 6 දෙනකු මියගොස් ඇති බවද ඔහු පෙන්වා දුන්නේය. ඊට අමතරව බහරේන් හා ජෝර්දානයෙන් එක් පුද්ගලයෙක් ලෙස පුද්ගලයින් 63 දෙනකු හා තවත් පුද්ගලයින් 4 දෙනකුද මැද පෙරදිග රටවලදී මියගොස් ඇත. ඔවුන් සිවු දෙනා මිය ගිය රටවල් පිළිබඳ මේ වන විට වාර්තා සකස් කරමින් සිටී. මැද පෙරදිග රටවල් ආසන්නයේ පිහිටි නිසා ඔවුන් මියගියේ කුමන රටක සේවය කරමින් සිටිද්දීද යන්න ගැන මේ වන විට කරුණු විමර්ශනය කරමින් සිටී.

ජෝර්දානයේ මරණයට පත්වූ ශ්‍රී ලාංකික ශ්‍රමිකයා සේවය කළ ඇඟලුම් කම්හලේ සේවයේ නියුතු 350කට අධික ශ්‍රී ලාංකික සේවකයින් පිරිසකටද කොවිඩ්-19 වයිරසය ආසාදනය වී ඇති බව තහවුරු වී ඇති අතර ඔවුන් මේ වන විට මළ මුහුද ආශ්‍රිත මධ්‍යස්ථානයක රඳවා ඇති බවද තොරතුරු ලැබී ඇති බව රන්දෙණිය අනාවරණය කෙළේය.

දැනට වාර්තා වී ඇති තොරතුරු අනුව මිය ගිය අතර ඇත්තේ එක් කාන්තාවක් පමණි සෙසු සියලු දෙනාම පිරිමි පුද්ගලයන් බවත් ඔවුන් බහුතරයක් වයස අවුරුදු 50ට අඩු පුද්ගලයින් බවත් වාර්තා වී තිබේ.

මේ වන විට කොවිඩ් - 19 වයිරසය ආසාදනය වී ඇති විදෙස්ගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් සංඛ්‍යාව 2,600කට අධිකය. මෙම ආසාදිතයන් සම්බන්ධයෙන් එම රටවල තානාපති කාර්යාලවල කාර්ය මණ්ඩල විශේෂ අවධානය යොමු කරමින් සිටින බවද විදේශ සේවා නියුක්ති කාර්යාංශය පෙන්වා දෙයි.

රන්දෙණිය පෙන්වා දුන්නේ අදාළ ශ්‍රමිකයන් මිය ගිය බව තහවුරු වීමෙන් පසු පවුලේ අයට දැනුම් දුන් බවත් සමීප ඥාතීන්ට අවමංගල චාරිත්‍ර සිදු කිරීම පිණිස රුපියල් 40,000ක මුදලක් ලබා දීමට කටයුතු කර ඇති බවයි. ''අන්තර්ජාතික නීති රීති අනුව කොවිඩ් - 19 රෝගයෙන් මිය ගිය අය වෙනත් රටකට ගෙනියන්න බැහැ. ආසන්නතම ස්ථානයේ අවසන් කටයුතු කිරීමයි කළ යුත්තේ. එම නිසා අදාළ පවුල්වල අයට අපේ කණගාටුව පළ කරන ගමන් අපි ඔවුන්ගේ ආගමික කටයුතු සිදු කිරීම පිණිස කාර්යාංශයෙන් රුපියල් 40,000ක මුදලක් ලබා දෙනවා, මිය ගිය අය වෙනුවෙන් වන්දි ලෙස රුපියල් ලක්ෂ 4ක මුදලක් ලබා දීමට පසුව කටයුතු කරනවා. මේ වන විටත් විදේශ කටයුතු අමාත්‍යාංශය හා එක්ව එම කටයුතු නිම කරමින් තිබෙන්නේ. කාර්යාංශයේ ලියාපදිංචි ආයතන හරහා විදේශ ගත වූ සියලු දෙනාටම මේ වන්දි මුදල ගෙවීමට අප කටයුතු කරනවා'' රන්දෙණිය අදහස් දක්වමින් පැවසුවේය.

මෙහිදී මතුවන එකම ගැටලුව වන්නේ අදාළ පුද්ගලයින් මෙරට ලියාපදිංචි කාර්යාංශයේ අනුමත විදේශ රැකියා ආයතන මඟින් විදේශ ගත වූයේද යන්නය. ඔවුන් නීත්‍යානුකූල නොවන අයුරින් විදේශ ගතව ඇත්නම් එහිදී ගැටලුවක් මතු වනු ඇත. වීසා ඉක්මවීම මෙහිදී බලවත්ම සාධකයක් නොවනු ඇති නමුත් රැකියා සඳහා විගමනය නිසි ආකාරයෙන් සිදුවිය යුතුවම ඇත. විදේශ සේවා නියුක්ති කාර්යාංශය පෙන්වා දෙන්නේ මිය ගිය ඇතැම් පවුල්වල අය කොවිඩ් - 19 රෝගය වැළඳීමෙන් තම ඥාතියා මිය ගිය බවට සමාජයට හෙළි නොකරන ලෙස ඥාතීන් ඉල්ලා සිටි බවයි. එම නිසා ඔවුන්ගේ තොරතුරු මාධ්‍ය මඟින් හෙළි කිරීම අපහසු බව කාර්යාංශය පෙන්වා දෙයි. කෙසේ වුවත් තම ඥාතියා මිය ගිය බව නොදන්නා පවුල්ද මේ අතර සිටින බව වාර්තා වේ.

විදේශ කටයුතු අමාත්‍යාංශයේ කොන්සියුලර් අංශයට වාර්තා වන සියලුම විගමණික ශ්‍රමිකයන් සම්බන්ධයෙන් කාර්යාංශය තොරතුරු ලබා ගෙන අදාළ ඥාතීන්ට දැන්වීමට කටයුතු යොදා ඇත.

එහෙත් මියගිය අයගේ මරණ සහතික ලබා දීමට කටයුතු කළ හැකි වන්නේ කොවිඩ් - 19 වසංගතය ගෝලීය තත්ත්වය පහව යාමෙන් පසුව වන අතර අවශ්‍ය නම් අදාළ ඥාතියා මිය ගිය බවට ඔවුන්ට තාවකාලිකව ලිපියක් පමණක් ලබා දීමට ඇති හැකියාව සම්බන්ධයෙන් මේ වන විට කටයුතු කරමින් සිටී.

කොවිඩ් - 19 මරණ සම්බන්ධයෙන් විදේශ සේවා අමාත්‍යාංශය හා කම්කරු අමාත්‍යාංශයත් විදේශ සේවා නියුක්ති කාර්යාංශයත් එක්ව ඉදිරි වැඩපිළිවෙළ සකස් කරගෙන යන බව විදේශ කටයුතු අමාත්‍යාංශයේ කොන්සියුලර් අංශයේ අධ්‍යක්ෂ ජනරාල්වරයෙක් සිළුමිණට කීය. අදාළ පුද්ගලයින්ගේ පෞද්ගලිකත්වය ආරක්ෂා කිරීම පිණිස කටයුතු කරන ලෙස උපදෙස් ලැබී තිබෙන අතර ඥාතීන්ගේ පවුල්වලට මරණ සම්බන්ධයෙන් දැන්වූ විට ඇතැම් පවුල්වල අය ඉල්ලා ඇත්තේද තම ඥාතියා කොවිඩ් -19 රෝගය වැළඳීමෙන් මිය ගිය බව ප්‍රසිද්ධ නොකරන ලෙස බවද එම අධ්‍යක්ෂ ජනරාල්වරයා පෙන්වා දුන්නේය. මිය ගිය ඥාතියාගේ සිරුර මිහිදන් කර හෝ භූමදානය කර ඇති පසුබිමක සමාජයේ ඇති දුර්මත නිසා ඥාතීන්ගේ ඉල්ලීම් වෙනුවෙන් කටයුතු කරන බවද මෙහිදී අධ්‍යක්ෂ ජනරාල්වරයා අපට පැවසුවේය. කෙසේ වෙතත් ඉදිරියේදී සියලු කරුණු මාධ්‍යයට හෙළි කිරීමට සිදුවනු ඇති බවද ඔහු පැවසුවේය. විශේෂයෙන්ම කාර්යාංශය හරහා වන්දි මුදල් ප්‍රදානය කිරීම රහසිගතව කළ නොහැක්කක් බවත් එය විදේශයන්හිදී මිය යන සෙසු පුද්ගලයින්ට මෙන්ම සිදු කරනු ඇතැයිද ඔහු පෙන්වා දුන්නේය.

මියගිය තම ඥාතියාගේ සිරුරවත් දැක ගැන්මට නොහැකිව අවසන් කටයුතු විදේශ රටකදී සිදු කළ ඒ ඥාතීන්ට ඇති සිත් රිදවීමට සහනයක් ලබා දෙනවා විනා සමාජයේ ඇති අන්ධ විශ්වාසයන් ඔස්සේ අප කටයුතු නොකළ යුතුය. ඒ සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කිරීමටද අදාළ අංශ විසින් පියවර ගත යුතුය.

මේ අතර කුවේට් ශ්‍රී ලංකා එකමුතු සංවිධානයේ කැඳවුම්කරු නිශාන්ත සංජීව පැවසුවේ වීසා රහිතව නීති විරෝධීව කුවේට් රටේ රැඳී සිටිමින් එරට රැකියාවල නිරත ශ්‍රී ලාංකිකයන් විශාල පිරිසකට මේ වනවිට කොවිඩ් - 19 වයිරසය ආසාදනය වී ඇති බවයි. වයිරසයට ගොදුරුව ඇති මේ පිරිසෙන් වැඩි සංඛ්‍යාවක් එරට ෆර්වානියා, අහමදි, හවාලි, ජහරා ප්‍රදේශවල රැඳී සිටින බවත් ඔවුන්ගෙන් බහුතරයකට ඖෂධ පමණක් නොව ආහාර පාන පවා නොලැබෙන තත්ත්වයක් ඇති බවත් ඔහු පෙන්වා දුන්නේය. සති කිහිපයකට පෙර කොවිඩ් - 19 ආසාදනය වී ක්වේට්හිදී මිය ගිය ශ්‍රී ලාංකික කාන්තාවගේ සැමියාට හා දරුවන්ට වයිරසය ආසාදනය වී ඇතැයි සැකකර ඔවුන් පරීක්ෂාවකට පවා ලක් නොකර නිවසට වී සිටින ලෙස දන්වා ඇතැයිද නිශාන්ත සංජීව පවසයි.

ක්වේටය තුළ ලාංකිකයන් 110,000ක් පමණ සිටින අතර එයින් 17,000 කට ආසන්න පිරිසක් වලංගු වීසා බලපත් නොමැතිව සිටින බවට වාර්තා වේ. වීසා නොමැතිව සිටින අයට රටින් පිටවීමට පසුගිය අප්‍රේල් මස 1 වන දින සිට 30 වන දින දක්වා පොදු සමා කාලයක් ලබාදුන්නද කොවිඩ් - 19 වසංගතය නිසා එම පිරිසට පැමිණීමට හැකියාවක් ලැබුණේ නැත. වීසා නොමැතිව සිටින අයට ක්වේට් රාජ්‍ය යේ කිසිදු හිමිකමක් නොලැබෙන අතර විදේශ ඇමැති දිනේෂ් ගුණවර්ධන හා අමාත්‍යාංශයේ හිටපු ලේකම් රවිනාථ ආරියසිංහ මෙරට ක්වේට් තානාපතිවරයා සමග සාකච්ඡා කර ඒ සඳහා සහනයක් ඉල්ලා ඇති අතර ඒ සම්බන්ධව සහනයක් ලබා දීමට තානාපතිවරයා එකඟ වී ඇත.

මිය ගිය අයකුගේ දේහයක් මැදපෙරදිගදී මිහිදන් කරන අයුරු. ඔහුගේ මිතුරන් දෙදෙනකු එදෙස බලා සිටී.

දියෙස්පෝරාව
DIASPORA

නීතිවේදී හසක රත්නමලල
කැනඩාවේ සිට ලියයි

තවත් මිනිස් ජාවාරමක අබියස

කැනේඩියානු සංක්‍රමණ නීතියට අනුව විදේශයකදී කරන ලද අපරාධ වැරදි සහිත පුද්ගලයකුට මෙන්ම ත්‍රස්තවාදී කණ්ඩායමක් සමඟ සම්බන්ධකම් පැවැත්වීම යන කාරණා මත පුද්ගලයකුට කැනඩාවේ ස්ථිර පදිංචිය ලබාගත නොහැකි වනවා පමණක් නොව එවැන්නකුට අමුත්තකු, ශිෂ්‍යයකු, සරණාගතයකු හෝ සේවකයකු ලෙසවත් නිත්‍යානු කූලව රටට ඇතුළුවීම කළ නොහැකිය.

යම් ආකාරයෙන් නිත්‍යානුකූල නොවන ලෙස රටට ඇතුළු වී ඇති පුද්ගලයකුට වුවද ත්‍රස්තවාදයේ යෙදී සිටින බවට චෝදනා ලබන කණ්ඩායමක් සමග සම්බන්ධකම් පැවැත්වීම යන කාරණා මත සරණාගත භාවය, ස්ථිර පදිංචිය හෝ පුරවැසිභාවය ප්‍රධානය නොකිරීමට කැනේඩියානු බලධාරීන් ක්‍රියා කරනු ලබයි.

එවැනි අවස්ථාවලදී ඔවුනට එරෙහිව අධිකරණය මගින් පිටුවහල් කිරීමේ තීන්දුවක් ලබා දෙන අතර මෙම පුද්ගලයන් පැමිණි රට යථා තත්ත්වයට පත්වනතෙක් තාවකාලිකව එම පිටුවල් තීන්දු අත් හිටුවනු ලබයි. ආරක්ෂිත නැතැයි විශ්වාස කරන ඇතැම් රටවලට කැනඩාව විසින් මිනිසුන් පිටුවහල් නොකරයි. මෙලෙස අනාරක්ෂිත ලෙස හඳුන්වන රටවල් ලැයිස්තුව කැනඩා රජය විසින් නිරන්තරයෙන් යාවත්කාලීන කරයි. යමකුගේ සරණාගත ඉල්ලීම ප්‍රතික්ෂේප වී ඇති වුවද එම පුද්ගලයා මෙම රටවලින් එකක පුරවැසියකු වුවහොත් ඔවුන් පිටුවහල් කරනු නොලැබේ. මේ ආකාරයෙන් අත්හිටවූ පිටුවහල් තීන්දු ලැබූ ශ්‍රී ලංකික ද්‍රවිඩයන් විශාල සංඛ්‍යාවක් කැනඩාවේ වාසය කරති.

යුද්ධය අවසන් වී වසර එකොළහක් ගත වුවද අදත් ශ්‍රී ලංකාවට එරෙහිව නොනවත්වා අභූතචෝදනා එල්ල වන්නට වූ ප්‍රධාන හේතුව වන්නේ මෙයයි. අත්හිටවූ පිටුවහල් තීන්දු ක්‍රියාත්මකවන්නට නම් ශ්‍රී ලංකාව නීතියේ ආධිපත්‍ය ක්‍රියාත්මක වන සාමකාමී රටක් විය යුතුය. ඒ නිසා ශ්‍රී ලංකාව කොතරම් යහපත් සාමකාමී රටක් බවට පත් වුවද ශ්‍රී ලංකාවට එරෙහි දියෙස්පෝරා ඝෝෂාවල් දිගින් දිගටම ඇසෙනු ඇත.

මෙලෙස දියෙස්පෝරා ඝෝෂාවල් දිගින් දිගටම ඇසෙන්නට තවත් හේතුවක් වන්නේ යුද්ධය අවසානයේ ශ්‍රීලංකාවෙන් පැනගොස් තවමත් විවිධ රටවල ජීවත්වන එල්ටීටීඊ සාමාජිකයින් එක් බටහිර රටකට ගොනුකර ගැනීම සඳහා එල්ටීටීඊ දියෙස්පොරාව විසින් දියත් කර ඇති ක්‍රියාන්විත හේතුවෙනි. ඔවුන් කෙසේහෝ නිත්‍යානුකූල නොවන ආකාරයෙන් කැනඩාව ඇතුළු බටහිර ලෝකයේ සරණාගත පහසුකම් සපයන රටකට ගෙන්වා ගැනීමෙන් අනතුරුව ඔවුන් එල්ටීටීඊ සංවිධානය සමග වූ සම්බන්ධතා හේතුවෙන් පිටුවහල් වීම වැළැක්වීම සඳහා තවදුරටත් ශ්‍රී ලංකාව සාමකාමී නොවන රටක් බවට ප්‍රකාශයට පත් කරමින් අත්හිටවූ පිටුවල් නියෝග මත මෙම රටවල ජීවත්වීමට අවස්ථාව සකසා ගැනීම මොවුන්ගේ අරමුණයි.

මෙම අරමුණ වෙනුවෙන් කටයුතු කරන්නේදැයි සැක සිතිය හැකි එක සංවිධානයක් වන්නේ "අයි-ට්‍රාන්" (International Tamil Refugee Assistance Network) නම්වූ සංවිධානයයි. මෙම සංවිධානය ලෝකය පුරා සංචාරය කරමින් එල්ටීටීඊය සමග කටයුතු කර දැනට විදෙස් රටවල ජීවත්වන එල්ටීටීඊ සාමාජිකයන් හමුවෙමින් ඔවුන් අතර මැදි රටක් ලෙස බ්‍රසීලය වෙත යොමු කිරීමේ අදහසක් ඉදිරිපත් කරයි. බ්‍රසීලයේ කරනලද සංචාරයකින් පසුව ඔවුන් විසින් ඉදිරිපත් කරන ලද වාර්තාවක මෙසේ දිස්වෙයි." සිවිල් යුද්ධයෙන් පළා ගිය ශ්‍රී ලාංකික ද්‍රවිඩයන්ගෙන් බොහෝ දෙනෙක් හුදෙක් යුද්ධයෙන් ගැලවීමට පැන ආ අයවලුන්ය. කෙසේ වෙතත්, සැබෑ සරණාගතයින් නම් ශ්‍රී ලංකා රජය විසින් විරුද්ධවාදීන් ලෙස වටහා ගෙන ඇති එල්ටීටීඊයේ ආධාරකරුවන්ය. ඔවුන්ට ශ්‍රී ලංකාවේ මෙන් ඉන්දියාවේ ද බොහෝ කරදර ඇති විය. ඉන්දියානු ආරක්ෂක "Q ශාඛාව" අත්තනෝමතික ලෙස මෙම ජනගහනය රඳවා තබාගෙන, ඔවුන්ගෙන් ප්‍රශ්න කර වධහිංසා පමුණුවයි. රැඳවුම් භාරයෙන් පිටත සිටින අය ඇඳිරි නීතිය ඇතුළු විවිධ වාර්තාකරණ අවශ්‍යතාවයන්ට යටත් කොට තිබේ."

මේ අනුව පැහැදිලි වන්නේ පුනරුත්ථාපනයට ලක් නොවූ එල්ටීටීඊ සාමාජිකයින් විශාල ප්‍රමාණයක් රටින් පිටතට පැනගොස් ඇති බවත්, මෙම අයි-ට්‍රාන් සංවිධානය ඍජුවම පෙනී සිටින්නේ රටින් පැනගොස් සිටින එල්ටීටීඊ සාමාජිකයින්ගේ සරණාගත පහසුකම් සැලසීම සඳහා බවයි. මෙහි නිත්‍යානුකූල කටයුතු කැනඩාවේ විනිපෙග්හි පදිංචි සරණාගත නීතිඥයකු වන David Matas විසින් සපයන අතර ඔහුට මූල්‍ය පහසුකම් සපයන්නේ Sam M. Ratna නමැති පුද්ගලයකු විසිනි. සෑම් රත්නා ශ්‍රී ලංකික ද්‍රවිඩ සම්භවයක් සහිත පුද්ගලයකු වන අතර මීටපෙර ඔහු ටිජිටීඊ හෙවත් ඇමරිකාවේ මූලස්ථානය පිහිටුවාගෙන සිටින රුද්‍රකුමාරන්ගේ නායකත්වයෙන් යුත් "තමිල් ඊලම් හි අන්තර්ජාතික රජය" නම් වූ එල්ටීටීඊ ඉදිරි සංවිධානයේ සරණාගත කටයුතු භාරව කටයුතු කළ "මුතුකුමාරස්වාමි රත්නා" නමින් හැඳින්වෙන පද්ගලයාය. "ශාන්තන් " නම් අනවරත නාමයෙන්ද හඳුන්වන ඔහු දැනට කැනඩාවේ විනිපෙග් නුවර පදිංචිව සිටිති.

මේ අනුව සියලු කාරණා එක්ව ගත් කල සැක කළ හැකි දෙයක් වන්නේ මෙම එල්ටීටීඊ සාමාජිකයින් බ්‍රසීලයේ තාවකාලිකව රඳවා පසුව ගොඩබිම් මාර්ගයකින් කැනඩාව, ඇමරිකාව වැනි රටවලට නීතිවිරෝධී ලෙස රැගෙනයාමේ සැලැස්මක් ක්‍රියාත්මක වන බවයි.

මීටපෙර කිහිපවතාවක්ම එක්සත් ජනපද එෆ්.බී.අයි. නිලධාරීන්ගේ අත්අඩංගුවට පත් ශ්‍රීලාංකික සම්භවයක් සහිත කැනේඩියානු ශ්‍රීකජමුහන් චෙල්ලයියා නමැති කුප්‍රකට මිනිස් ජාවාරම්කරු භාවිත කරන්නේද මේ හා සමාන මාර්ගයකි. බ්‍රසීලය වෙනුවට ඔහු පාවිච්චි කරන්නේ කැරිබියන් රටවල්ය. මෑතකදී ඇමරිකාවට තවත් පිරිසක් ජාවාරම් කිරීමට සූදානම්ව සිටියදී ටර්ක්ස් සහ කයිකෝස් දූපතේ බලධාරීන්ගේ අත් අඩංගුවට පත් චෙල්ලයියා ටොරොන්ටෝ හි පදිංචිකරුවෙකි. ඔක්තෝම්බර් මාසයේදී ටර්ක්ස් සහ කයිකෝස් වෙරළට ඔබ්බෙන් වූ නැවක හසු වූ ශ්‍රී ලාංකිකයන් පිරිසකගෙන් ඩොලර් 28,000 ත් 65,000 ත් අතර ගාස්තු අය කළ බවට එෆ්බීඅයි ආයතනය ඔහුට එරෙහිව චෝදනා කරයි. එක්සත් ජනපද බලධාරීන් පවසන්නේ එම නෞකාව තුල මගීන් 158 දෙනෙකු සිටි අතර ඔවුන්ගේ ප්‍රථම ගමනාන්තය වූයේ ඇමරිකාව බවත්ය. එහි ශ්‍රී ලාංකිකයන් 28 දෙනෙකු වූ අතර ඇමරිකාවේ සිට ගොඩබිමින් ගොස් කැනඩාවේ සරණාගත භාවය ඉල්ලුම් කිරීම ඔවුන්ගේ අරමුණ බව එෆ්බීඅයි විමර්ශන වලදී පෙනී ගොස් ඇත. දැන් අවශ්‍යව ඇත්තේ චෙල්ලයියා සහ එල්ටීටීඊය අතර සම්බන්ධතාව හෙළිදරව් කිරීමයි. එවිට වෙස්මුහුණු දමාගෙන සිටින බොහෝ කැනේඩියානු මහත්වරුන්ගේ වෙස් මුහුණු ගලවා දැමීමට අපට හැකිවනු ඇත.

ඔබේ අදහස් යොමුකරන්න : *sldiasporatalks@gmail.com*

ගෙවල් නැත්නම් මෙන්න ගෙවල්

● නිහාල් පී. අබේසිංහ

"මගේ තාත්තාත් ඔබලාට ඇති තරම් ගෙවල් හැදුවා. මාත් ඔබ සැමට ගෙවල් සමඟ උදාගම් හදනවා" යැයි කෑමොර ගැසූ යහපාලන රජයේ නිවාස ඇමැති සජිත් ප්‍රේමදාස සිදුකර ඇත්තේ නිවාස සෑදීමකට වඩා ප්‍රචාරාත්මක ව්‍යාපෘතියක් බව නිවාස සංවර්ධන අධිකාරිය කළ විශේෂ ගවේෂණයකදී පැහැදිලිව හෙළිවී තිබේ.

තට්ටු 40ක නව නිවාස සංකීර්ණයක් මාලිගාවත්තේ

අලුත් තට්ටු නිවාස සංකීර්ණ 335ක් හදන්න සූදානම්

අද හෙට විවෘතවන වනාතමුල්ලේ ඔවල් විව් රෙසිඩන්ට් මහල් නිවාස සංකීර්ණය

"ගමට ගෙයක් - රටට හෙටක්" වැඩසටහන යටතේ ගිරිබාවේදී විවෘත වූ පළමු නිවස එහි හිමිකරුවන්ට භාරදුන් අවස්ථාව, ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සභාපති රේණුක පෙරේරා මෙහි සිටී

"ගමට ගෙයක් - රටට හෙටක්" ජාතික නිවාස සංවර්ධන වැඩසටහනේ සමාරම්භය අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂයන්ගේ ප්‍රධානත්වයෙන් කුරුණෑගල ගිරිබාවේදී සිදුවූ අවස්ථාව

මගේ තාත්තාත් ඔබලාට ඇති තරම් ගෙවල් හැදුවා. මාත් ඔබ සැමට ගෙවල් සමඟ උදාගම් හදනවා" යැයි කෑමොර ගැසූ යහපාලන රජයේ නිවාස ඇමැති සජිත් ප්‍රේමදාස සිදුකර ඇත්තේ නිවාස සෑදීමකට වඩා ප්‍රචාරාත්මක ව්‍යාපෘතියක් බව නිවාස සංවර්ධන අධිකාරිය කළ විශේෂ ගවේෂණයකදී පැහැදිලිව හෙළිවී තිබේ.

නිවාස මහ ගොඩක් හැදූ බවට හිටපු නිවාස ඇමැති කෑ ගැසුවත් අපේ රටේ ජනතාවගෙන් සියයට 75කම නිවාස ගැටලු පිළිබඳ යහපාලන රජය බලා නැත. ඒ වගේම එදා ඉදිකළ උදාගම් හා නව නිවාස පිළිබඳව දැන් ගැටලු රැසකි. ඊට ප්‍රධාන හේතුව දුර්වල ඉදිකිරීම් මට්ටමයි.

උදාගම්වල ඉදිකළ බොහෝ නිවාසවලට ඔප්පු ලබාදී නැත. එයට හේතුවක් වන්නේ ඒ උදාගම් ඉදිකළ ඉඩම් ඒවායේ මුල් අයිතිකරුගෙන් නිවාස සංවර්ධන අධිකාරියට ඒ ඉඩම් නිසි ලෙස පවරාගෙන නොතිබීමයි. ඒ සමහර ඉඩම් තවමත් අයිතිව පවතින්නේ වනජීවී, වන සංරක්ෂණ, පුරාවිද්‍යා හා මහවැලි ඉඩම් අමාත්‍යාංශවලටයි.

මෙලෙස පසුගිය යහපාලන රජයේ අසාර්ථක ප්‍රචාරාත්මක නිවාස ව්‍යාපෘති වෙනුවට, නිවාසයක් අවශ්‍ය හා දැනටම පැල්පත්වල හා කටුමැටි ගැසූ වරිච්චි ගෙවල්වල සිටින සියලු දෙනාට නිවාස ලක්ෂ 1.5කට අධික ප්‍රමාණයක් ලබාදීමට වත්මන් රජය කටයුතු කරගෙන යයි.

ඒ සඳහා ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ උපදෙස් පරිදි හා නිවාස ඇමති ලෙස කටයුතු කරන අගමැති මහින්ද රාජපක්ෂ මහතාගේ මෙහෙයවීමෙන් හා නිවාස රාජ්‍ය ඇමැති ඉන්දික අනුරුද්ධගේ සහාය ඇතිව විධිමත් නිවාස ඉදිකිරීමේ වැඩපිළිවෙළක් ක්‍රියාවට නැංවීමට වත්මන් රජය කටයුතු යොදා ඇත.

නිවාස සංවර්ධනය පිළිබඳව ජනාධිපතිතුමා පවසන්නේ ඉදිරි මාස 3 ඇතුළත පැල්පත් හා වරිච්චි බිත්ති සහිත නිවාස වෙනුවට නව නිවාස ලබාදිය යුතු බවයි.

ඒ සමගම අගමැති මහින්ද රාජපක්ෂ මහතා පවසන්නේ ශ්‍රී ලංකාවේ සෑම මැතිවරණ කොට්ඨාසයකටම නිවාස ඒකක 100 කින් යුත් මහල් නිවාස සංකීර්ණය බැගින් කඩිනමින් ඉදිකරන බවයි. මෙම නිවාස සංකීර්ණවලින් නිවාස ලබා දීමේදී නිවාස නොමැති මධ්‍යම පාන්තික පවුල්වලටත් අඩු ආදායම් ලාභී පවුල්වලටත් වැඩි අවධානයක් යොමු කරන බවත් අගමැතිවරයා පවසා තිබේ. ඒ අනුව ව්‍යාපෘතිය මගින් රට පුරා නව මහල් නිවාස සංකීර්ණ 300 කට අධික සංඛ්‍යාවක් ඉදිවන බව නිවාස හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය පවසයි.

නාගරික සංවර්ධන අධිකාරිය, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සහ නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය යන ආයතන ත්‍රිත්වයම මගින් රටේ නිවාස ගැටලුව විසඳීමට කටයුතු කරයි. මෙම ආයතනවලින් වත්මන් ජනාධිපතිවරයාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනය යටතේ අඩු ආදායම් ලාභී ජනයා සඳහා නිවාස පහළොස්දහසක් ඉදිකිරීමට සැලසුම් කර ඇත. මෙම වැඩසටහන සඳහා නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය ඉහළ දායකත්වයක් ලබා දෙයි.

මෙහිදී කොළඹ සහ තදාසන්න ප්‍රදේශවල මේ වන විට ජීවත්වන පැල්පත්වාසීන් සිය නිවාස ව්‍යාපෘති සඳහා යොමු කර ඔවුන් ජීවත් වූ ඉඩම්වලද නව මහල් නිවාස ව්‍යාපෘති ආරම්භ කිරීමට මෙම අධිකාරිය බලාපොරොත්තු වෙයි. මෙහිදී 'සැමට නිවසක් යහපත් දිවියක්' යන තේමාව අනුව නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් හුදෙක්ම නිවාසවලට ජනතාව පදිංචි කිරීමට එහා ගිය විශාල සමාජ කාර්යභාරයක් ඉටු කරයි.

මොරටුව, අඟුලාන යන ප්‍රදේශවල මුහුදු බාදනය හේතුවෙන් වාසස්ථාන අහිමි වුණු ධීවර ජනතාව සහ ඒ අවට ජීවත් වූ අඩු ආදායම්ලාභී ජනතාව වෙනුවෙන් අඟුලාන ප්‍රදේශයේ නිවාස 288කින් යුතු සයුරුපුර මහල් නිවාස සංකීර්ණය, 'සහස්පුර' මහල් නිවාස සංකීර්ණය සහ මේ වන විට අවසන් අදියරෙහි පවතින නිවාස 358කින් සමන්විත ලුණාව මහල් නිවාස සංකීර්ණය නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් සිදු කළ නිවාස ව්‍යාපෘතීන්ය.

අඩු ආදායම්ලාභී සහ මධ්‍යම ආදායම්ලාභී පවුල් වෙනුවෙන් කාණ්ඩ දෙකකට නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය නිවාස ව්‍යාපෘති සිදු කරයි. මේ වන විට කොළඹ. වත්තල, ජාඇල, ගම්පහ, කඩුවෙල, හෝකන්දර, කැස්බෑව, කහතුඩුව, පානදුර, රත්මලාන යන කොළඹට තදාසන්න ප්‍රදේශවල කවයක් ආකාරයට නව නිවාස ව්‍යාපෘති ආරම්භ කිරීමට අවශ්‍ය කටයුතු යොදා තිබේ. මධ්‍යම ආදායම්ලාභීන් සඳහා මිලියන 4.1 සිට ඉහළට මෙම නිවාස ව්‍යාපෘතිවල මිල ගණන් නිර්මාණය වී ඇත.

අපේ රටේ ගම්වල සිටින දුප්පත්ම පවුල්වලට නිවාස ඉදිකිරීම වත්මන් රජයේ ප්‍රමුඛතම නිවාස වැඩපිළිවෙළ බවට පත්ව තිබේ. ඒ අනුව රජය ගමට ගෙයක් රටට හෙටක් වැඩපිළිවෙළ පසුගියදා ආරම්භ කෙරිණි. ඒ අනුව සෑම ගමකම දුප්පත් පවුලට නිවසක් ලැබේ. ඒ සඳහා නැවත අය කර නොගන්නා රුපියල් ලක්ෂ 6ක ආධාරයක් ද සහන ණය මුදලක් ද අත්‍යවශ්‍ය ආයතනවල පූර්ණ සහාය ද ලබාදෙන බව ග්‍රාමීය නිවාස රාජ්‍ය ඇමැති ඉන්දික අනුරුද්ධ මහතා පවසයි. වර්ග අඩි 550 ක විශාලත්වයක් ඇති මේ නිවාස ඉදිකර ගැනීමට නිවාස සංවර්ධන අධිකාරිය හා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය තාක්ෂණික උපදෙස් දෙයි.

අඩු ආදායම්ලාභී පවුල් වෙනුවෙන් නිවාස 14,022 ක් ඉදිකිරීම් "ගමට ගෙයක් - රටට හෙටක්" ජාතික නිවාස සංවර්ධන වැඩසටහනේ සමාරම්භක ජාතික උත්සවය අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂයන්ගේ ප්‍රධානත්වයෙන් හා ග්‍රාමීය නිවාස පහසුකම් රාජ්‍ය අමාත්‍ය ඉන්දික අනුරුද්ධ මහතාගේ සහභාගීත්වයෙන් කුරුණෑගල, හිරිබාව, වරාවැව දී පැවැත්විණි.

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ "රට හදන සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළ ඵලදායි පුරවැසියෙක් සහ සතුටින් ජීවත්වන පවුලක් නිර්මාණය කිරීම සඳහා සෑම පවුලකටම සුව පහසු ස්ථිර නිවසක් අත්කර දීම තුළින් සාර්ව ආර්ථික ඉලක්ක සපුරා ගැනීම සහතික කර ඇත. එම අරමුණ වෙත ළඟා වීමේ පළමු පියවර ලෙස අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂයන්ගේ සංකල්පය සහ මාර්ගෝපදේශකත්වය මත 2020 වසර තුළ දිවයිනේ අඩු ආදායම්ලාභී පවුල්වල නිවාස ගැටලුව සම්පූර්ණයෙන්ම විසඳීමේ අරමුණින් "ගමට ගෙයක් - රටට හෙටක්" නිවාස 14022 ක් ඉදිකිරීමේ වැඩසටහන ආරම්භ කිරීමට පියවර ගෙන ඇත. මේ යටතේ සෑම ග්‍රාම නිලධාරි වසමක් නියෝජනය කරමින් තෝරාගනු ලැබෙන අඩු ආදායම් ලාභී පවුලක් සඳහා එක් නිවසක් බැගින් ඉදිකෙරෙන අතර එම නිවාස ඉදිකිරීමේ කටයුතු දැන් අවසන් වෙමින් පවතින බව රාජ්‍ය ඇමැති ඉන්දික අනුරුද්ධ පවසයි.

ඉදිරියේ දී නිවාස ලක්ෂ 1.5කට වඩා හදනවා

- ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සභාපති රේණුක පෙරේරා

මෙම ව්‍යාපෘතිය සඳහා මහා භාණ්ඩාගාරයෙන් රුපියල් බිලියන 8313.2 ප්‍රතිපාදන නිවාස අමාත්‍යාංශය සඳහා වෙන්කර ඇත. ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබයි. ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2011 වසරේ සිදුකරන ලද ජන හා නිවාස සංගණනයට අනුව දළ වශයෙන් ශ්‍රී ලංකාව තුළ නිවාස අවශ්‍යතාවය 455,000 වන අතර වැඩි දියුණු කළ යුතු නිවාස සංඛ්‍යාව 534,000 කි. එම පවුල්වලින් බහුතරයක් දිළිඳු හෝ අඩු ආදායම්ලාභී පවුල් වෙති. පොල් අතු සහ තල් අතු සෙවිලි කළ තාවකාලික නිවාස 2020 දී මෙරටින් ඉවත් කිරීම සඳහා ඉලක්කගත වැඩසටහනක් ලෙස නිවාස සංවර්ධන වැඩසටහන අදියර වශයෙන් ක්‍රියාත්මක කෙරිණි.

හිසට සෙවණක් නොමැතිව මෙරට ජීවත් වන දුගී දුප්පත් පවුල් එම දුගී භාවයෙන් මුදවා ගැනීමේ ප්‍රමුඛ පියවරක් ලෙස "ගමට ගෙයක් රටට හෙටක්" නිවාස වැඩසටහන ක්‍රියාත්මක වෙයි.

පසුගිය රජය තම දේශපාලන වුවමනාවන් ඉටු කරගැනීම සඳහා ජනතාවට නොමිලේ නිවාස ලබා දෙන බව පෙන්වමින් මෙරට දුගී දුප්පත් ජනතාව තව තවත් ගැටලු රැසකට මැදිකොට මේ වන විට ඔවුන් අන්ත අසරණ තත්වයට පත්කොට ඇත.

එම තත්වය පිළිබඳ වත්මන් රජයේ විශේෂ අවධානය යොමු කර ජනාධිපතිතුමන්ගේ මෙහෙයවීමෙන් අඩු ආදායම් ලාභී ජනතාවගේ නිවාස ගැටලුවට සැබෑ ලෙසම ස්ථිර විසඳුම ලබාදීම සඳහා මෙම වැඩසටහන නිර්මාණය කර ක්‍රියාවට නංවනු ඇත.

"ගමට ගෙයක් රටට හෙටක්" නිවාස සංවර්ධන වැඩසටහනේ ප්‍රතිලාභීන් තෝරා ගැනීම නිර්ණායක කීපයක් යටතේ සිදුවන අතර ඒ සඳහා සුදුස්සන් තෝරා ගැනීමේදී දේශපාලන හෝ වෙනත් හේතුන් කිසිදු සුදුසුකමක් ලෙස නොසැලකේ.

නාගරික සංවර්ධන අධිකාරිය ද රටේ විශේෂයෙන් නාගරික ජනතාවගේ නිවාස ගැටලුව විසඳීමට සුවිශේෂ ක්‍රියාදාමයක් අනුගමනය කරයි.

'ගමට ගෙයක් - රටට හෙටක්' මගින් දුප්පත් අයට වසරකදී නව නිවාස 14,022ක්

- ග්‍රාමීය නිවාස රාජ්‍ය ඇමැති ඉන්දික අනුරුද්ධ

ඒ පිළිබඳව අපට අදහස් දැක්වූ නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් ප්‍රසාද් කේ. රණවීර පවසන්නේ නාගරික සංවර්ධන අධිකාරිය මගින් අඩු ආදායම් හා මැදි ආදායම් ලාභීන් සඳහා නව නිවාස 36,000ක් ඉදිකිරීමට සූදානම් බවයි. ඉන් 30,000ක් අඩු ආදායම් ලාභී නාගරික පැල්පත් වාසීන්ට වන අතර ඉතිරි 6000 මැදි ආදායම්ලාභීන්ට වේ.

මේ නිවාස ඉදිකිරීම් මගින් මෙරට නාගරික ප්‍රදේශවල සහ පැල්පත් වාසීන්ට නව තට්ටු නිවාස සංකීර්ණවල ජීවත්වීමට සියලු පහසුකම් ලැබේ. ඒ සමගම මධ්‍ය ආදායම් ඇති අයට සහන පොලියක් ඇතිව අලුත් නිවසක් මිලදී ගැනීමට ඉඩකඩ සැලසේ.

මේ අනුව මේ වසරේ දැනටම අඩු ආදායම් ලාභීන්ට නිවාස 1400 ක් ඉදිකර අවසන් බවත් මේ වසරේ මේ අය සඳහා තවත් මහල් නිවාස ඒකක 6800ක් ඉදිකිරීම් අරඹන බවත් අධ්‍යක්ෂ ජනරාල්වරයා පවසයි.

මෙම අඩු ආදායම් අය සඳහා නිවාස ඉදිකරනු ලබන්නේ නාගරික පුනර්ජීවන වැඩසටහන යටතේය. නාගරික සංවර්ධන අධිකාරිය කළ සමීක්ෂණ අනුව කොළඹ නගරය ආශ්‍රිතව අඩු ආදායම් ප්‍රජා පොකුරු 1499ක් සිටිති. එහි සිටින අඩු ආදායම් පවුල් ගණන 68812කි. ඒ සියලු දෙනා සඳහා ඉදිරියේදි නිවාස ඒකක ලබාදීමට රජය කටයුතු කරමින් සිටී.

මධ්‍යම පාන්තික නිවාස යටතේ මේ වසරේ නව නිවාස 3000ක් ඉදිකිරීමට කටයුතු යොදා ඇත. ඒ අතරින් වනාතමුල්ල 'ඔවල් විව් රෙසිඩන්ට්' මධ්‍යම පාන්තික නිවාස යෝජනා ක්‍රම අද හෙටම විවෘත වීමට නියමිතය. එහි නිවාස ඒකක 608ක් තිබේ. රාජ්‍ය සේවයේ වසර 15 - 20 සේවා කාලයක් ඇති අයට මේ නිවාස ලැබෙන අතර එය තට්ටු 25 කින් යුත් සියලු පහසුකම් ඇති නවීන නිවාස සංකීර්ණයකි.

එමෙන්ම ඉහළ ආදායම් ඇති අයටත් මේ වසර ඇතුළත නිවාස ඒකක 400 ක් ඉදිකිරීම ආරම්භ කරන බවත් අධ්‍යක්ෂ ජනරාල් රණවීර පවසයි.

වත්මන් රජයේ නිවාස සංවර්ධන වැඩපිළිවෙළ පිළිබඳව අදහස් දක්වන ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සභාපති රේණුක දුෂ්මන්ත පෙරේරා මහතා පැවසුවේ ජනපතිගේ හා අගමැතිගේ උපදෙස් අනුව කටුමැටි ගෙවල්වල ඉන්න සියලු පවුල්වලට මේ වසර අවසානයට පෙර නව නිවාස 14022 ක් ලැබෙන බවයි.

ගමට ගෙයක් රටට හෙටක් වැඩසටහන පිළිවෙළ යටතේ මේ නිවාස 14022 ඉදිවෙනවා. මේ වන විට මේ වැඩපිළිවෙළ යටතේ ගෙවල් 7000ක් හැදිලා තිබෙනවා. තවත් නිවාස 6000ක කටයුතු අරඹා තිබෙනවා.

ජනපතිගේ උපදෙස් අනුව අගමැතිතුමාගේ අධීක්ෂණයෙන් යුතුව 'ගමට ගෙයක් - රටට හෙටක්' වැඩසටහන 2021 - 2024 දක්වා වසරවල දිගටම ක්‍රියාත්මක කරනවා. ඒ එක්කම වාර්ෂිකව අඛණ්ඩව මේ ව්‍යාපෘතිය දිගටම ක්‍රියාත්මක කිරීමට අපට ජනාධිපතිතුමා උපදෙස් දී තිබෙනවා. ඉන් ඉදිවෙන නිවාස ගණන 70,000කට අධිකයි.

නාගරික නිවාස වැඩසටහන යටතේ මේ වසරේදි ගම්පහ වැරැල්ලවත්ත නිවාස ඒකක 575ක්, අනුරපුරයේ දහයියාගම නව නිවාස 178ක්, සොයිසාපුර ගෙවල් 30ක්, බේරුවල ගාල්ල හම්බන්තොට ප්‍රදේශවල මහල් නිවාස ඉදිකිරීමට සැලසුම් කර තිබෙනවා. අගමැතිතුමාගේ උපදෙස් පරිදි සිරස් අතට නිවාස 100ක මහල් සංකීර්ණයක් සෑම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයකම ඉදිකිරීමට කටයුතු යොදා ඇති බවත් ඒ අනුව රටපුරා නව මහල් නිවාස 300කට වඩා ඉදිවන බවත් රේණුක පෙරේරා පවසයි. පසුගිය රජයේ ක්‍රියාත්මක වූයේ ප්‍රචාරාත්මක නිවාස ව්‍යාපෘති පමණක් බවත් මේ රජය අපේක්ෂා කරන්නේ සැබැවින්ම නිවාස නැති අයට නව නිවාස ලබාදීම බවත් ඔහු කීය.

පසුගිය රජය නාරාහේන්පිට මිහිදු පුර ව්‍යාපෘතිය හා නාවල කිරිමණ්ඩල මාවතේ පරංගියා කුඹුර නිවාස ව්‍යාපෘති අතහැර දමා තිබුණි. අපි දැන් ඒ ව්‍යාපෘති දෙක යළි ආරම්භ කළා. නිවාස ඒකක 1000ක් නිවාස නැති මධ්‍යම පාන්තික ජනතාවට දෙන්න පුළුවන් විදියට නව සැලසුම් අනුව මෙය අරම්භ කරනවා.

ජනාධිපතිතුමාගේ උපදෙස් අනුව කොළඹ නගරයේ පැල්පත් වාසින්ට නව නිවාස ඒකක 37500 ක් ලබාදීමට කටයුතු කරනවා. ඉදිරි වසර හතර තුළ ඒවා ඉදිකිරීමට ජාතික නිවාස සංවර්ධන අධිකාරිය ද නාගරික සංවර්ධන අධිකාරිය ද කටයුතු කරනවා.

ඒ සමගම තරුණයන් සඳහා වසර 30කින් ගෙවන ණය යෝජනා ක්‍රමයක් අනුව නව නිවසක හිමිකම දෙන්න අපි කටයුතු කරනවා. ඒ අනුව සියයට 6.25ක පොලියකට ඔවුන්ට ඒ නිවාස ලබාදෙන්න ඇමැති මණ්ඩලත් අනුමත කර තිබෙනවා. මේ සඳහා මහල් නිවාස සංකීර්ණ ඉදිවෙන බවද රේණුක දුෂ්මන්ත පෙරේරා පවසයි. ඒ සමගම ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මගින් මාලිගාවත්ත ප්‍රදේශයේ තට්ටු 40ක සියලු පහසුකම් සහිත නව නිවාස සංකීර්ණයක් ද ඉදිකිරීමට සැලසුම් කර ඇත. ඊට අමතරව මත්තේගොඩ වික්‍රමසිංහපුර මාවතගම කුණ්ඩසාලේ වැනි ප්‍රදේශවල ද සිරස් මහල් නිවාස සංකීර්ණ ඉදිකිරීමට ඉඩම් හඳුනාගෙන ඇති ඇති බවද ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සභාපති රේණුක පෙරේරා පවසයි.

කැස්බෑ මරණවලට හේතුව නිව් ඩයමන්ඩ්ද?

චාර්තා වුණේ කිහිපයයි. ගල්කිස්ස 3, වැල්ලවත්ත 3, ගෝල්ෆේස් -5ක්

● සුභාෂිණී ජයරත්න

නැගෙනහිර මුහුදු තීරයේදි ගිනි ගැනීමට පත් නිව් ඩයමන්ඩ් නෞකාව අනතුරකට පත්ව මේ වන විට මසකට අධික කාලයක් ගතවී ඇත්තේය. මේ ගිනි ගැනීම හේතුවෙන් බොහෝ පරිසර විද්‍යාඥයින් භයානක අනතුරු ඇඟවීම් කළේ මෙයින් කාන්දු වූ හා ගිනිගත් එංජිමේ වූ බොර තෙල් හේතුවෙන් සාගර ජීවීන්ට භයානක අතුරු විපත්වලට මුහුණ දෙන්නට සිදුවන බව පවසමිණි. කෙසේ වෙතත් පසුගිය 4 දා එනම් ජාත්‍යන්තර ලෝක සත්ත්ව දිනය යෙදී තිබුණ දා වඩාත් කණගාටුදායක සිදුවීමක් අසන්නට ලැබුණේ ගල්කිස්ස, වැල්ලවත්ත හා ගෝල්ෆේස් අවට මුහුදු තීරයෙනි. ඒ මින් පෙර කිසිදාක අසන්නට නොලැබුණු ප්‍රමාණයේ මියගිය කැස්බෑ සිරුරු විශාල සංඛ්‍යාවක් විටින් විට වෙරළට ගොඩ ගැසීම නිසාවෙනි. සාගර විද්‍යාඥයන් අනාවැකි පැවැසූ පරිදි මෙවන් ව්‍යසනයක් සිදුවූයේ නිව් ඩයමන්ඩ් තෙල් නෞකාව නිසාද?

නිව් ඩයමන්ඩ් නෞකාවෙන් සාගරයට සිදුවූ හානිය කොතෙක්දැයි පැවැසිය නොහැකි අතරම ඉදිරියේදි නැව් සමාගමට ඒ වෙනුවෙන් සිදුවූ අලාභය ගෙවන්නට සිදුවන බව වාර්තා විය. කෙසේ වෙතත් මේ වනතෙක් අදාළ නැව් සමාගම විසින් ලංකා රජයට ගෙවා ඇත්තේ රුපියල් මිලියන 442 කි. ඒ ගිනි නිවීමට වැය වූ මුදල පමණි. නමුත් සාගරයට සිදුවූ හානිය මුදලට ඇස්තමේන්තු කළ නොහැකි බරක් බව පසක් වන්නේ මෙවන් සිදුවීම් ඒ සම්බන්ධ කොතරම් අදාළ ද නැද්ද යන්න විමසන විටදීය. මෙරට මුහුදු සීමාවේදී ගිනි ගැනීමට ලක්වූ නිව් ඩයමන්ඩ් නෞකාව පසුගියදා මැදපෙරදිග මුහුදු කලාපයට රැගෙන යමින් පවතින බව ශ්‍රී ලංකා නාවික හමුදාව පැවසුවේය. මුදල් සහ අදාළ වන්දි ලබාදීමේ පදනම මත එහි අයිතිකරුවන්ට නෞකාව ඉවත් කර ගැනීමට පසුගියදා අවසර ලබා දුණි.

මෙහි කාන්දු වූ තෙල් මීටර 2 ක ඝණකමින් හා මීටර් 400 ක පළලින් යුතු බවද අධිකරණයේදී අවධාරණය විය. මේ වන විට නෞකාවේ කපිතාන්ට එරෙහිව කොළඹ මහාධිකරණයේ අධි චෝදනා ගොනු කිරීමට නීතිපති දෙපාර්තමේන්තුව කටයුතු කර තිබේ. ග්‍රීක ජාතික කපිතාන් තිරෝස් හිලියාස්ට නෞකාව තුළ ගින්න හටගත් අවස්ථාවේ දී එය මැඩ පැවැත්වීම සඳහා ගතයුතු පියවරයන් අනුගමනය කිරීම පැහැරහැර ඇති බවට ද චෝදනා එල්ල කර ඇත. ඒ හේතුවෙන් එම කපිතාන්වරයාගේ විදේශ ගමන් තහනම් කිරීමට හා පදිංචිව සිටින ස්ථානය වෙනස් කරන්නේ නම් ඒ බව අධිකරණය වෙත දැනුම් දෙන ලෙසද නියෝග විය

"මේ වන විට නැව් සමාගම රජයට ලබා දුන්නේ ගිනි නිවීමට වැය වූ මුදල පමණයි. ඒ වගේම මේ දඩ මුදල් හා වන්දි අය කර ගැනීම තවත් අදියර 2 ක් යටතේ ඉදිරියේදි සිදු වෙනවා. 35/2008 දරණ සමුද්‍රීය දූෂණ වැළැක්වීමේ පනත යටතේ ඔවුන් මෙහි වරද පිළිගතහොත් නීතියෙන් මේ අයට දඩයක් ගෙවීමට සිදු වෙනවා. එය රුපියල් මිලියන 15-30 ත් අතර දඩයක් විය හැකියි. එය ලබා ගැනීමෙන් අනතුරුව නීතිමය ක්‍රියාමාර්ග හරහා සමුද්‍ර දූෂණයට වන්දි ලබා ගැනීම සිදු කළ යුතුයි. රුහුණු විශ්වවිද්‍යාලය, මොරටුව විශ්වවිද්‍යාලය මෙන්ම නාරා ආයතනය එක්ව ඒ සඳහා අවශ්‍ය වාර්තාව සැකසීම කෙරෙනවා. " ඒ සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ සාමාන්‍යාධිකාරී ආචාර්ය ටර්නි ප්‍රදිප් කුමාරය.

මීට පෙර එකවර කැස්බෑ මරණ සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ හම්බන්තොට ප්‍රදේශයෙනි. නමුත් එදා හම්බන්තොට වෙරළ තීරයට ගොඩ ගසා තිබුණේ කැස්බෑ සිරුරු දෙක තුනක් පමණි. නමුත් පසුගිය 3 වැනිදා වන විට නිල වශයෙන් කැස්බෑ මරණ 10 කට වැඩි ප්‍රමාණයක් වාර්තා වී ඇති අතර නිල නොලත් වශයෙන් තවත් කොපමණ ප්‍රමාණයක් ඇත්දැයි පැවැසිය නොහැකිය. පසුගිය 3 වැනිදා මුල්ම මියගිය කැස්බෑ සිරුර දැක ඇත්තේ ගල්කිස්ස වෙරළ තීරයේ සැරි සරන පොලිස් ජීවිතාරක්ෂක නිලධාරින් කිහිප දෙනෙකි. ඉන් අනතරුව ගල්කිස්ස මහ හෝටලය පිටුපසින් තවත් කැස්බෑ සිරුරු දෙකක් හමුවී ඇති අතර ඔවුන් තිදෙනාම අඩි දෙකහාමාරක් පමණ දිගැති බටු කැස්බෑවන්ය. මේ පිළිබඳ බෙල්ලන්විල අත්තිඩිය වන ජීවි සංරක්ෂණ නිලධාරීන් විසින් අදාළ පරීක්ෂණ සිදු කරමින් යද්දි ඊට පසුදින වැල්ලවත්ත මුහුදු තීරයෙන්ද තවත් එවැනිම කැස්බෑ සිරුරු 3 ක්ද, ගෝල්ෆේස් මුහුදු තීරයෙන් තවත් එවැනිම සිරුරු 5 ක් වාර්තා විය. ඉන් දිනකට පමණ පසු එනම් 5 වැනිදා හා 6 වැනිදා තවත් කැස්බෑ සිරුරක් හා පණ ඇති කැස්බෑවකු සොයා ගත්තේ වැල්ලවත්ත දුම්රිය පොළ අසලින් හා මොරටුව වෙරළ තීරයෙනි. මේ වන විට මෙම සිරුරද බෙහෙවින් නරක්ව තිබූ නමුත් වන ජීවි නිලධාරීන් විසින් මෙම සිරුරු අධ්‍යයනය කිරීම හා මරණයට හේතුව සොයා ගැනීමට සත්ත්ව උද්‍යාන දෙපාර්තමේන්තුවට බාර දි තිබුණි. මේ වන විට මේ සම්බන්ධයෙන් අදාළ පරීක්ෂණ කටයුතු සිදු වන්නේ මොවුන් විශාල පිරිසක් මරණයට පත්වීමට අසාමාන්‍ය සිදුවීමක් වන නිසාය. කෙසේ වෙතත් ඉදිරි දින කිහිපයේ මේ සතුන්ගේ මරණයට හේතුව ප්‍රකාශ කෙරෙන අතර මේ සිදුවීම නිව් ඩයමන්ඩ් නෞකාවට යම් සම්බන්ධයක් පවතිද යන්න ඉන් මතුවනු ඇත.

ආචාර්ය
ටර්නි ප්‍රදිප් කුමාර

කැස්බෑ පර්යේෂක
උත්පල අදාරංග

පශු වෛද්‍ය
වෛද්‍ය ප්‍රමුදිත දේවසුරේන්ද්‍ර

මේ පිළිබඳව සිඑමිණට අදහස් දැක්වූ වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ කොළඹ දිස්ත්‍රික්කය භාර ජ්‍යෙෂ්ඨ වන සත්ත්ව අඩවි ආරක්ෂක සමන් ලියනගම මෙම කැස්බෑ මරණ සම්බන්ධයෙන් දැක්වූයේ මෙවන් අදහසකි.

"කැස්බෑවන් ලෙහෙසියෙන් මැරෙන සත්ත්ව විශේෂයක් නොවෙයි. ඔවුන් අවුරුදු 150 කට වඩාත් ජීවත් වෙනවා. මේ සිදුවීම් මුලින්ම වාර්තා වුණේ අපිට. මෙලෙස විශාල පිරිසක් එකවර මැරීම සම්බන්ධයෙන් දැඩිව අවධානය යොමු කළ යුතු වෙනවා. නිව් ඩයමන්ඩ් නෞකාවේ බලපෑමෙන් මේ දේ වුණා කියලා සෘජුවම කියන්න බැහැ. නමුත් විය හැකි සම්භාවිතාවක්ද තියෙනවා. දියවැල් හරහා මෙහි බලපෑම මුහුදු සතුන්ට දැනිය හැකියි. නෞකාවෙන් එවන් බලපෑමක් වුණා නම් අනිකුත් සාගර ජීවීන්ටත් මෙය බලපෑ යුතුයි. කෙසේ වෙතත් කැස්බෑ මරණ සියල්ල හුදෙකලා සිදුවීමක් නොවෙයි. රටක් ලෙස අපි විදේශ රටවලට යවා හෝ මේ පිළිබඳ අධ්‍යයනය කළ යුතුයි. අපි මේ වන විට කැස්බෑ මරණ සංඛ්‍යාත්මකව අගය කළත් මෙලෙස තවත් මැරුණු කැස්බෑ මරණ රාශියක් වාර්තා නොවී තිබිය හැකියි. වෙරළට මෙවන් සිරුරක් ගොඩ ගැසූවිට මිනිසුන් එයින් නික්මෙන ගඳ නිසා මේ සිරුර වළ දානවා. මේ පිළිබඳ බරපතලකම තේරුම් ගත් අය පමණයි සිරුරු වළ නොදා අපිට වාර්තා කරන්නේ.

පරීක්ෂණ කළ නොහැකි තරමට කැස්බෑ සිරුරු විනාශ වෙලා

"ඒ සමන් ලියනගම ගේ මහතාගේ අදහසයි.

වනජීවි නිලධාරීන් සඳහන් කරන්නේ මෙසේ එකවර විශාල පිරිසක් කැස්බෑවුන් මරණයට පත්වීම දැඩි අවධානයට යොමු කළ යුතු කරුණක් බවයි. සාමාන්‍යයෙන් කැස්බෑවුන් ගල්පර වල හැපී හෝ ටෝලර් යාත්‍රාවල හැපි හෝ මුහුදු කරන්ට් වැදීම නිසා හෝ වෙනයම් කරුණක් මත මරණයට පත්විය හැකි වුවත් මෙලෙස විශාල පිරිසක් වෙරළට ගොඩ ගසා තිබුණු අවස්ථාවක් මීට පෙර උදාවී නැත. ලොව කැස්බෑ විශේෂ 8 ක් ලංකාවේ ඇති අතර එයින් ලංකාව නිජබිම කරගත් විශේෂ ඇත්තේ 5 ක් පමණි. ඒ දාර කැස්බෑවා, ඔළු ගෙඩි කැස්බෑවා, කොළ(ගල්) කැස්බෑවා, බටු කැස්බෑවා හා පොතු කැස්බෑවය. ලංකා මුහුදු තීරයට ඔවුන් පැමිණෙන්නේ ප්‍රජනන කාර්යය නිසාය. මොවුන්ගේ ආයු කාලය අවුරුදු 150 ක් පමණ වන අතර මොවුන් ලංකා මුහුදු තීරයට පැමිණෙන්නේ බිත්තර දැමීම සඳහාය.

මේ කාලය වන විට කැස්බෑවුන් බිත්තර දැමීම සඳහා නොගැඹුරු මුහුදු තීරයට පැමිණෙන අතර අප්‍රේල් මාසය එයින් උච්චතම අවධියයි.

"පොකිරිස්සන්, ඉස්සන් සඳහා මුහුදේ දැල් එලීමේදි කැස්බෑවුන් මේ දැල්වලට පැටලෙනවා. ඔවුන්ට එතැනදී හුස්ම ගැනීමට නොහැකි වූ විට ඔවුන් මිය යනවා. සමහර අවස්ථාවල මාළු බාන්නන් විසින් පැටළුණු දැල් ඉවත් කරන්නට නොහැකිව ඔවුන්ගේ අත් පා කපා මුහුදට දානවා. එවැනි අවස්ථාවලදීත් මේ සතුන් මිය යන්න පුළුවන්. නමුත් නෞකාවේ තෙල් කාන්දුවකින් මේ දේ සිදුවුණා කියලා අපිට නිශ්චිතවම පැවැසිය නොහැකියි. නැවේ තෙල් මතුපිට පෙණ වශයෙන් පාවිය හැකියි. එහිදි තෙල් තට්ටුව නිසා හුස්ම ගැනීමට නොහැකිව මිය ගියා කියලා හිතන්න අපහසුයි. මේ තෙල් තට්ටුව තිබුණේ ගැඹුරු මුහුදේයි. නමුත් කැස්බෑවා ගැඹුරු මුහුදේ උඩට මතු වෙන්නේ නැහැ. මොවුන් බිත්තර දාන්නත්, ඒ සඳහා ප්‍රජනන කාර්ය කරන්නත් සමූහ වශයෙන් එන්නේ නොගැඹුරු මුහුදු තීරයට. තෙල් තට්ටුව නිසා අවශ්‍ය ඔක්සිජන් නොලැබී යා හැකියි කියා සමහරු තර්ක කරනවා. තෙල් වතුර සමඟ මිශ්‍ර නොවන නිසා යම් විෂ වීමක් සිදු වන්නේ නැහැ. ඒ වගේම තෙල් තට්ටුවක් වැනි අපහැදිලි පසුබිමකින් මේ සතුන් උඩට මතුවේයැයි අපිට විස්වාස කරන්න අමාරුයි. තවත් අතකින් ඩයිනමයිට් වැනි දෙයක් පිපිරීමෙන් මේ සතුන් මිය යා හැකි බවට විස්වාස කළත් එතැනදී අනිකුත් මුහුදු ජීවීන්ද මිය යාහැකියි. නමුත් එවැන්නක් අපි මෙතැනදි දුටුවේ නැහැ. තෙල් වැනි දෙයකින් මේ සතුන් මිය ගියේ නම් ඔවුන්ගේ සිරුරු තුළින් එවැන්නක් හමුවිය යුතුයි. එසේම මේ සතුනුත් රෝගි වී තිබිය යුතුයි. මේ නිසා මේ තත්ත්වය හිතනවාට වඩා පුළුල්...." ඒ කැස්බෑවුන් පිළිබඳව පර්යේෂණය කරන හික්කඩුව උද්‍යාන බාරකරු උත්පල අදාරංගය.

කැස්බෑවුන්ගේ මෙම මරණ හා තෙල් නැව අතර සම්බන්ධයක් පවතිද යන්න මේ සම්බන්ධයෙන් පරීක්ෂණය කරන බෙල්ලන්විල වන ජීවි පර්යේෂණ දෙපාර්තමේන්තුවේ පශු වෛද්‍ය ප්‍රමුදිත දේවසුරේන්ද්‍ර සඳහන් කරන්නේ මෙසේය.

"මේ මැරිලා ඉන්නේ බටු කැස්බෑවන්. මොවුන් රංචු වශයෙන් ඉන්නේ. මම හිතන්නේ ටෝලර් යාත්‍රාවල හැපි මෙවන් දෙයක් සිදුවුණා කියලා. නැතිනම් බෝ වන අසනීපයකින් මෙසේ වූවා විය හැකියි. තෙල් නැව ඊට ආදාළ නැති බව මගේ හැඟීමයි. ඒ තෙල් දියවැල් හරහා ත්‍රිකුණාමලය ප්‍රදේශයට යා හැකියි. නමුත් වංගු ගසා මේ තෙල් කොළඹ පැත්තට ඒමට නොහැකියි. "

කෙසේ වෙතත් මෙම සතුන්ගේ මරණ පරීක්ෂණ කටයුතු සිදුවන්නේ හෝමාගම පශු විමර්ෂණ අංශයෙනි. මේ වන විට එහි විමර්ෂණ කටයුතු භාර පශු වෛද්‍ය එස් ජයවර්ධන සඳහන් කළේ මෙම සතුන්ගේ බොහෝ ශරීර කොටස් නරක් වී ඇති බවය.

මෙම සතුන්ගේ සිරුරු හමුවන විටත් දින තුනක් ගත වී ඇති බවත් මොරටුවෙන් හමු වී ඇති කැස්බෑවා පණ ඇති අයකු බවත් ඔහු හා මැරුණු සතුන් අතර කිසිදු සම්බන්ධයක් නැති බවත්ය. කෙසේ වෙතත් මෙවැනි පරිසර විනාශ පිළිබඳ අපේ අවධානය දැඩිව යොමු කළ යුතු වන්නේ ඉදිරියටත් මෙවැනි දේ සිදුවීම් වළක්වා ගන්නටය.

සේයාරු - ජානක ගෝමස්

කන්තලේ ජයපුර විදුහල්පතිගේ 36 වසරක විශිෂ්ට සේවාවට උපහාර

වසර 36ක සේවා කාලයකින් පසු කන්තලේ ජයපුර විද්‍යාලයේ විදුහල්පති සාමවිනිසුරු කේ. ඩී. විජේපාල පසුගියදා විශ්‍රාම ලැබූ අතර පාසලේ ආචාර්වරියක විසින් ඔහුගේ සේවය අගයමින් සමරු තිළිණයක් ලබා දුන් අයුරු. 1984 වර්ෂයේ දී වාන්ඇළ මහ විද්‍යාලයෙන් උප ගුරුවරයකු ලෙස ඔහු සේවයට එක්වී ඇත. රජඇළ විද්‍යාලය, වෙන්ඩ්‍රාසන්පුර විද්‍යාලය, හාතියගම විද්‍යාලය, ගන්තලාව මහ විද්‍යාලය, ත්‍රී/ කන් මධ්‍ය මහා විද්‍යාලය යන විද්‍යාලවල සේවය කර ඇති ඒ මහතා විදුහල්පති සංගමයේ සභාපතිවරයා ලෙස හා කන්තලේ අපි ගුරු සුබ සාධක සංගමයේ ලේකම්වරයා ලෙස විශ්‍රාම ලබන අවස්ථාව දක්වාම කටයුතු කරනලදී.

යෞවන සම්මාන සඳහා කෘති භාර ගැනේ

2020 යෞවන සම්මාන උලෙළේදී සිංහල දෙමළ ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් ප්‍රකාශිත නවකතා, කෙටි කතා සහ කාව්‍ය සංග්‍රහ අතරින් විශිෂ්ටතම කෘතියට සම්මාන පිරිනැමීමට ජාතික තරුණ සේවා සභාව කටයුතු කර ඇත. වයස අවුරුදු 15ත් 29ත් අතර ලේඛක ලේඛිකාවන්ට 2019 වසරේ ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා ප්‍රකාශිත කෘතින්වල පිටපත් 3ක් තම ඉල්ලුම්පත සමඟ යොමු කිරීමෙන් මීට සහභාගි විය හැක. වැඩි විස්තර තරුණසේවා වෙබ් අඩවියෙන් හෝ 0112-746601 සංස්කෘතික අංශය ඇමතීමෙන් ලබා ගත හැකිය.

ශා. මරියා දේවස්ථානයේ 125 වැනි ජුබිලිය අද

වසර 125 පැරණි යටියන්තොට ශාන්ත මරියා දේවස්ථානයේ 125 වැනි ජුබිලිය අද (11) පැවැත්වේ. අගරදගුරු මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වන මෙම උත්සවයේදී නවීකරණය කරන ලද දේවස්ථාන ගොඩනැගිල්ල ආශිර්වාද කිරීමද සිදු කෙරේ. මීසම් පාලක ඩේමියන් ප්‍රනාන්දු හිමිපානන්ගේ මඟ පෙන්වීම හා මූලිකත්වයෙන් සිදු කරන ලද මෙම කාර්යය ඉතාමත් චාම් අන්දමින් මීසමේ ජනතාව පමණක් සහභාගි කරගනිමින් සෞඛ්‍යාරක්ෂිත නීතිවලට අනුව පවත්වනු ලැබේ. එදින උදෑසන 8.00 ට දිව්‍ය පූජාව පවත්වා දේවස්ථානය ආශිර්වාද ගැන්වීම සිදු කරන අතර ප්‍රදේශයේ සියලු ආගමික නායකයන්ගේ සහභාගිත්වයෙන් විශේෂ සර්ව ආගමික වැඩසටහනක්ද පැවැත්වේ.

කොවිඩ්-19ට දේශීය ඖෂධයක්!

දේශීය වෛද්‍ය අමාත්‍යාංශය විසින් කොවිඩ් - 19 වෛරසය ආසාදිතයන්ට සහ එම වයිරසය ආසාදනය වීමට ඉඩ ඇති පුද්ගලයන් වෙනුවෙන් ඖෂධ වර්ග කිහිපයක් නිපදවා ඇති බව දේශීය වෛද්‍ය, ග්‍රාමීය ආයුර්වේද රෝහල් සංවර්ධන සහ ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍ය සිසිර ජයකොඩි මහතා පවසයි. ඖෂධ හඳුන්වා දීම හෙට (12 වැනිදා සඳුදා) සිදු කෙරෙන අතර එම ඖෂධ පසුගිය සිකුරාදා පාර්ලිමේන්තුවේදී කතානායක මහින්ද යාපා අබේවර්ධන මහතාට පිළිගන්වන ලදී.

ආයුර්වේද දෙපාර්තමේන්තුව සහා ආයුර්වේද ඖෂධ සංස්ථාව ඒකාබද්ධව ප්‍රතිශක්තිකරණ පානයක් සහ ආසාදිතයන් වෙනුවෙන් චූර්ණයක් හඳුන්වාදී තිබෙන බවද අමාත්‍යවරයා පවසයි.

මෙම ඖෂධ සියල්ල 100% ම දේශීය ශාකසාර යොදා ගනිමින් නිෂ්පාදන කර ඇති බව පවසන අමාත්‍යවරයා සදංග පානය සහ සුවධරණි ප්‍රතිශක්තිකරණ පානය නමින් එම ඖෂධ නම් කර තිබෙන බවද සඳහන් කළේය.

දෙමවුපිය රැකවරණය අහිමිව සහ විවිධ හේතූන් මත පීඩාවට පත්ව සිටින කොල්ලුපිටිය ශාන්ත මයිකල් විද්‍යාලයේ දූ දරුවන් හට, ශ්‍රී ලංකා යුද හමුදා සේවා වනිතා ඒකකයේ ප්‍රධානත්වයෙන් තිළිණ ප්‍රදානයක් පසුගියදා එම පාසලේ දී පැවැත්විණි. ශ්‍රී ලංකා යුද හමුදා පොදු සේවා බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් පී. කේ. හඳුන්මුල්ලගේ උපදේශකත්වය යටතේ, ශ්‍රී ලංකා යුද හමුදා සේවා බලකා සේවා වනිතා ඒකකයේ සභාපතිනී, දීපා හඳුන්මුල්ලගේ ප්‍රධානත්වයෙන් පැවැති මෙම වැඩසටහන් මාලාව, කොළඹ සෙන්ටේනියල් සිංහ සමාජයේ පූර්ව දායකත්වයෙන් යුතුව 1 වන ශ්‍රී ලංකා යුද හමුදා පොදු සේවා බලකායේ අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් ජී.එස්. දේමුනිගේ අධීක්ෂණය යටතේ, එම ඒකකයේ සියලු නිලයන් විසින් සංවිධානය කරන ලද අතර, එම දරුවන්ගේ සහ මවුපියන් ගේ ජීවිත නඟා සිටුවන වැඩසටහන් මාලාවක් එහිදී ක්‍රියාත්මක කෙරුණු අතර තිළිණ ප්‍රදානයේ එක් අවස්ථාවකි මේ.

---

1 වැනි පිටුවෙන්

නිරෝධායන...

ඔවුන්ට තම ප්‍රවේශ පත්‍රය පෙන්වා විශේෂිත විභාග මධ්‍යස්ථාන තුළ විභාගයට පෙනී සිටිය හැකි බව ඔහු වැඩි දුරටත් අවධාරණය කරයි. එසේම අයි.ඩී.එච් උණ රෝහලේද විශේෂිත විභාග මධ්‍යස්ථානයක් පැවැත්වීමට කටයුතු යොදා ඇත.

අද හා හෙට සිට ආරම්භ වන මේ විභාගයන් දෙක පිළිබඳව අදහස් දැක්වූ විභාග කොමසාරිස් ජනරාල් සනත් පූජිත මහතා සඳහන් කරන්නේ ප්‍රවාහනයේදී ඇඳිරි නීති බලපත්‍රය ලෙස හා විභාග මධ්‍යස්ථාන තුළට ප්‍රවේශ වීමේ බලපත්‍රය ලෙස විභාග ප්‍රවේශ පත්‍රය යොදා ගත හැකි බවයි. විභාග අපේක්ෂකයින් විභාගයට පැයකට පමණ පෙර විභාග මධ්‍යස්ථානවලට පැමිණිය යුතු අතර, විභාග ශාලාධිපතිවරු විසින් දරුවන් පැය භාගයකට පෙර විභාග ශාලාවේ අසුන් ගැන්විය යුතුය.

නිවාස අධිකාරියේ...

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සතුව තිබූ ඩාලි පාරේ ශ්‍රීලනිප මූලස්ථානය අසල අක්කර 1.5ක ඉඩමක් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව රුපියල් ලක්ෂ 6500 කට විකුණා එම මුදල් හම්බන්තොට ප්‍රදේශයේ එජාප පාක්ෂිකයන් දහස් ගණනකට බෙදාදී ඇතැයි ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සභාපති රේණුක පෙරේරා පවසයි. මේ සම්බන්ධයෙන් දැනටමත් හතරදෙනෙක් බන්ධනාගාරගත කර ඇති බවත් ඒ මහතා පැවසීය. එම මුදල් එක්සත් ජාතික පක්ෂයේ හිතවතුන්ට රුපියල් 50,000 - රුපියල් 25,000 - රුපියල් 20,000 වශයෙන් නිවාස ණයක් ලෙස ලබාදී ඇති බවත් නීත්‍යානුකූල නොවන ආකාරයෙන් සිදුවූ ඒ ලබාදුන් මුදල් යළි අයකර ගැනීමට කිසිදු ක්‍රමයක් නැති බවත් සභාපතිවරයා පවසයි. එමෙන්ම අධිකාරියේ රු ලක්ෂ 870ක් යොදා ගනිමින් දේශපාලන පෝස්ටර් හා උදාගම් පිළිබඳ පෝස්ටර් මුද්‍රණය කර රට පුරා බෙදා හැර ඇතැයි ද ඊට අමතරව සිහිවටන එලකවලට ලක්ෂ ගණන් මුදල් නිරපරාදේ වැය කර ඇතැයිද සභාපතිවරයා පවසයි.

කොරෝනා පොකුර..

විශේෂයෙන්ම සෙසු පළාත්වල සිටින ආසාදිතයන්ගේ ආශ්‍රිතයන් සොයා බුද්ධි අංශ මෙහෙයුම් ක්‍රියාත්මක කර ඇති බවයි. මීට අමතරව මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ද සිය කාර්ය මණ්ඩලයේ 2686ම මේ වන විට කොරෝනා මර්දන කටයුතු සඳහා පැය 24ම පුරාම සිදු කරන බව මහජන පරීක්ෂකවරුන්ගේ සංගමයේ ලේකම් මහේන්ද්‍ර බාලසූරිය සිඑමිණට කීවේය.

අනුර අතුරුදන්

රාගම ඇලපිටිවල පදිංචිව සිටි ඩබ්ලිව්. ඩී. අනුර නැමැත්තා අතුරුදන් බවට ඔහුගේ භාර්යාව වන චන්ද්‍රකාන්ති විසින් මහබාගෙ පොලිසියට පැමිණිකර ඇත. ඔහු ගැන තොරතුරක් වෙතොත් දුරකථන අංක 0771114081 හෝ 0719112036 හෝ ළඟම ඇති පොලිසියට දැනුම් දෙන්නැයි ඉල්ලීමක් කෙරේ.

වෙළෙඳ කලාපයේ...

(භක්ති ධර්මප්‍රිය මෙන්ඩිස්)

ගම්පහ ප්‍රදේශ රැසක ඇඳිරි නීතිය පැනවීම නිසා කටුනායක ආයෝජන කලාපයේ සේවක සේවිකාවන් 50,000කට අධික පිරිසක් මේ වන විට අනාරක්ෂිත තත්ත්වයට පත්ව ඇතැයි නිදහස් වෙළෙඳ කලාප සහ පොදු සේවක සංගමයේ සම ලේකම් ඇන්ටන් මාර්ක්ස් සිඑමිණට පැවසීය. කොරෝනා ආසාදිතයන් හමුවීම නිසා ආයෝජන කලාපවල වසා දමා ඇත්තේ ආයතන දෙකක් පමණක් බවත් එසේ වුවත් සේවක සේවිකාවන් 270,000කට ආසන්න පිරිසක් දැඩි නොසන්සුන්තාවකට හා අර්බුදයකට පත්ව ඇති බවද ඔහු කීවේය. ආයතනවල සේවකයන්ට අමතරව 'මෑන් පවර්' සේවක සේවිකාවන් සේවයට යොදා ගන්නා අතර ඔවුන් පිළිබඳ පැහැදිලි විස්තර ආයතන සතුව නොමැති බවත් මිනුවන්ගොඩ ඇඟළුම් කර්මාන්තශාලාවේ ඇසුරුකළ අය සොයා ගැන්මට පමා වූයේ ඒ නිසා බවද ඔහු පෙන්වා දුන්නේය.

බුදු දහම වර්ධනයට...

(තාරක වික්‍රමසේකර)

ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර බෞද්ධ සබඳතා වර්ධනය කිරීමට ඇමරිකානු ඩොලර් මිලියන 15ක් ලබාදීමට කටයුතු කරන බව ඉන්දීය නියෝජ්‍ය මහ කොමසාරිස් විනෝද් කේ. ජේකබ් පවසයි.

ඒ සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම පිණිස නියෝජ්‍ය මහ කොමසාරිස් පසුගිය සිකුරාදා බුද්ධ ශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් මහාචාර්ය කපිල ගුණවර්ධන හමු වී සාකච්ඡා කරන ලදී. බුදු දහමේ උන්නතිය වෙනුවෙන් ඉන්දියාව මෙවන් ප්‍රදානයක් ලබා දෙන ප්‍රථම අවස්ථාව මෙය බව නියෝජ්‍ය මහ කොමසාරිස්වරයා පවසයි. එම ප්‍රදානය බෞද්ධ ආරාම ඉදි කිරීමට හෝ වැඩිදියුණු කිරීමට, සංස්කෘතික හුවමාරු, පුරාවිද්‍යා ක්ෂේත්‍රයේ සහයෝගීතාවය, බෞද්ධ විද්වතුන් සහ සංඝයා වහන්සේ අතර සබඳතා ශක්තිමත් කිරීම ඇතුළු කාර්යන් සඳහා යොදාගන්නා අතර ඊට අමතරව මහනුවර, පල්ලේකැලේ ශ්‍රී ලංකා ජාත්‍යන්තර බෞද්ධ ඇකඩමියේ ඉදිවන උඩරට නර්තන පාසල සහ යාපනය සංස්කෘතික මධ්‍යස්ථානයට යොදා ගැනෙනු ඇත.

කොරෝනා මඬින්න...

පාර්ලිමේන්තුවේදී පැවති පක්ෂ කණ්ඩායම් රැස්වීමේදී මේ සම්බන්ධව සාකච්ඡා කළ බවත් ජනතාවගේ යහපත වෙනුවෙන් තම පක්ෂය ඕනෑම විටෙක පෙනී සිටින බවත් මන්ත්‍රීවරයා අවධාරණය කළේය. සමගි ජන බලවේගය දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක කළ පක්ෂ සංවිධාන කටයුතුවලට අදාළ ජන හමුවීම් තාවකාලිකව නතර කිරීමටත් පොදු රැස්වීම් ඇතුළු ජනතාව එක්වන තැන්වලට අදාළ වැඩසටන් නවත්වාලීමටත් පක්ෂයේ උත්සව අවස්ථා තාවකාලිකව නතර කිරීමටත් පියවර ගත් බවද ඔහු කිය.

සිළුමිණ

35, ඩී. ආර්. විජයවර්ධන මාවත, ලේක්හවුස්, කොළඹ 10.
දුරකථන පොදු: 011-2429429, 011-2421181, 011-2331181
කර්තෘ: 011-2429261 ජ්‍යෙෂ්ඨ සම කර්තෘ: 011-2429263
කර්තෘ මණ්ඩලය: 011-2429262-3-4-5
ෆැක්ස්: 011-2429260 (සිළුමිණ)
ඊ-මේල්: edmediaunit@gmail.com
දැන්වීම් කළමනාකරු: 011-2429351
ලුහුඬු දැන්වීම් කළමනාකරු: 011-2429341-2
වෂී 2020ක් වූ ඔක්තෝබර් මස 11 වැනිදා ඉරිදා

සීරුවෙන් සිටීන්!
(තියරියෙන් ඔබ්බට)

පුංචි වයිරසයක් විසින් ලෝකය වෙනස් කළ පළමු වතාව මෙය නොවේ. එහෙත් මේ තරම් ශීඝ්‍රයෙන් ලෝකය බියෙන් තැති ගැන්වූ වයිරසයක් මෙතෙක් තිබුණේ නැත. ලෝක ඉතිහාසය විමසන විට පෙනී යන්නේ වර්න්වර මීටත් වඩා බරපතළ වසංගතවලට මිනිස් සමාජය ගොදුරුවී ඇති බව ය. දෙවන ලෝක යුද්ධයෙන් පසු ලෝක වසංගත කිහිපයක් පැතිර ගියේය. ලක්ෂ ගණන් ජනතාව මරණයට පත්වූ අවස්ථා ද තිබිණි. එහෙත් වසංගත මුළුමනින් ම පරාජය කොට යළිත් නැඟී සිටින්නට ලෝක ප්‍රජාව සමත් වූහ.

දකුණේ මිනිසුන් සතියකින් සියල්ල අමතක කරන බව කියා සිටියේ වේළුපිල්ලේ ප්‍රභාකරන් ය. ප්‍රභාකරන් එදා අපේ මිනිසුන්ගේ දුර්වලතාවෙන් හොඳ හැටි ප්‍රයෝජන ගත්තේ ය. කොරෝනා අමතක වීමට ද අපට වැඩි දවසක් ගත වූයේ නැත. කොරෝනා ලෝක අර්බුදයකි. එහි අවදානම තවත් වසර දෙක තුනක් යනතුරු පහව නොයන බව ලෝක සෞඛ්‍ය සංවිධානය පවා අනතුරු හැඟවීම් කර තිබේ.

කොරෝනා වසංගතය ශ්‍රී ලංකාවට කඩාවැදුණු මුල් අවස්ථාවේ අපේ ජනතාවගේ හැසිරීම ඉතා බුද්ධිමත් විය. කිසිවකු මුඛ ආවරණ නැතිව ගෙයින් එළියට ගියේ නැත. සංචාර නැවතිණි; උත්සව නැවැතිණි; වෛද්‍ය උපදේශන අකුරට ම පිළිපැදීමට සියල්ලෝ ම එකඟ වී සිටියහ. සියල්ලෝ සීරුවෙන් සිටියහ. මේ වන විට ලෝකයේ සෑම 10 දෙනකුගෙන් එක් අයකු කොරෝනා රෝගියකු බවට පත් වීමේ සම්භාවිතාවක් තිබෙන බව ලෝක සෞඛ්‍ය සංවිධානය අනතුරු අඟවයි. මේ තරම් අවධානමක් අබියස තවමත් පොලිසියට බයේ හෙල්මට් පළඳින යතුරුපැදි රියැදුරන් සේ අප ද මුඛ ආවරණය පළඳින්නේ පොලිසිය සිටින විට පමණි; නැත්නම් එය නීතියක් වූ නිසා පමණි. මුඛ ආවරණ ඇත්තේ සාක්කුවල ය. නැතහොත් බෑග්වල ය. කාර්යාල ඉදිරිපිට ඇති වතුර බේසම් හා විෂබීජ නාශක මේ ආසන්න දින කිහිපයේ හැරෙන්නට ඊට පෙර පාවිච්චි කරනු පෙනුණේ නැත. මේ සියල්ල නිරීක්ෂණය කරන කල මේ ඇතිවූ තත්ත්වය පුදුම සහගත නැත.

ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය ක්ෂේත්‍රය, ආරක්ෂක අංශ හා රජය බලවත් කැපවීමකින් යුතුව අර්බුදය ජය ගැනීමේ ක්‍රියාවලියේ නිරතවී සිටිති. ඉතිහාසයේ අත්දැකීම් අපට ලබා දෙන උත්තේජනය වන්නේ කොරෝනා අර්බුදය මුළුමනින් ම පරාජය කළ හැකිය යන්න ය. ඒ සඳහා විශ්වාසයෙන් ක්‍රියා කිරීම අතිශය වැදගත් ය. අපට අවශ්‍ය වන්නේ පරාජිතව මුළුගැන්වුණු ජීවිත නොව, ප්‍රබෝධයෙන් අර්බුදයට මුහුණ දෙන ජීවිත ය. කොයි මොහොතේ නැති වී යා දැයි විශ්වාස නැති ජීවිතයකට අවධානම දරා ගනිමින් තෙරපෙමින් බඩු ගොඩ ගසා ගන්නා සමාජයක් වෙනුවට අවශ්‍ය වන්නේ සබුද්ධික ජනතාවකි.

කොවිඩ් 19 වයිරසය ලොව පුරා ව්‍යාප්ත වෙමින් පැවැති මුල් අවදියේ ම රට ඊට සූදානම් කිරීමට ජනාධිපතිවරයා සමත් විය. රෝග ව්‍යාප්තිය වැළකිණි. මහජනයා ඉතා හොඳ සෞඛ්‍ය පිළිවෙත් ගණනාවක් පවත්වා ගෙන ගියේය. ජනජීවිතය යථා පරිදි ගෙන යෑමට ද, මැතිවරණ පැවැත්වීමට ද අවස්ථාව එළැඹිණි. කොරෝනා වසංගතය හමුවේ ශ්‍රී ලංකාව පරාජිත වූයේ නැතැයි කිව හැකිය. මේ තුන්වැනි පොකුර නිර්මාණය වූ අවස්ථාවේ ද අප අබියස විසල් අභියෝගයක් තිබේ. ඒ උසස් පෙළ හා ශිෂ්‍යත්ව විභාගය සැලසුම් කළ පරිදි ම නැවත පැවැත්වීම ය. මේ තීරණය ගැනීමට පෙර රජය දෙවතාවක් මේ විභාග කල් දමා තිබිණි. මේ නිසා නැවත වාරයක් කල් නොදමා විභාගය පැවැත්වීමට රජය ගත් තීරණය පැසසුම් කටයුතු ය.

මෙවර පහ ශ්‍රේණිය ශිෂ්‍යත්වය සඳහා තුන්ලක්ෂ තිස් එක් දහස් හයසිය අසූහතරක් දරුවන් පෙනී සිටීමට නියමිත ය. ඔවුන් වෙනුවෙන් විභාග මධ්‍යස්ථාන 2,936ක් සැලසුම් කර තිබේ. අද ඒ දරුවන් ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටින දවසයි. උසස්පෙළ විභාගය සඳහා තුන් ලක්ෂ හැට දෙදහස් අටසිය විසිහතර දෙනෙක් පෙනී සිටීමට නියමිත ය. ඒ වෙනුවෙන් විභාග මධ්‍යස්ථාන 2,648ක් සූදානම් කර තිබේ. එක මධ්‍යස්ථානයකට අවම වශයෙන් සිසුන් 160ත් 165ත් අතර ප්‍රමාණයක් එක්රැස් වෙති. උසස්පෙළ හෙට සිට නොවැම්බර් 02 දක්වා පැවැත්වීමට නියමිත ය. මේ දීර්ඝ විභාග කාලය සැලසුම් කර ගැනීම පහසු කාර්යයක් නොවේ. එහෙත් අසීරුතා ජයගැනීමේ විශේෂ හැකියාවක් තමන් සතු බව පසුගිය කාලය පුරා රජය ක්‍රියාවෙන් පෙන්නුම් කළේ ය.

එකිනෙක ආණ්ඩු විවිධ හේතු නිසා ජාතික විභාග කල් තබා ඇත. විශ්වවිද්‍යාල ආරම්භ කිරීම පමා කර ඇත. පළමු ශ්‍රේණියට ළමයින් ඇතුළත් කිරීම පවා කල් තැබූ අවස්ථා තිබේ. මේ සෑම අවස්ථාවකදී ම සිදු වී ඇත්තේ අපේ ඉදිරි ගමන වැළැක්වීම ය. අධ්‍යාපනයේ ගැටලුවක් ඇති වූ විට එය ජීවිතයේ පසුබෑමක් බවට පොදුවේ සමාජයේ පසුගාමී බවට ද රූපාන්තරණය වෙයි. විශ්වවිද්‍යාලවලට සිසුන් ඇතුළත් කිරීම පමා වන විට ඇතිවන බුද්ධි ගලනය ගැන දැන් බොහෝ කතා වෙති. විශ්වවිද්‍යාල වරින් - වර වසා දැමීම නිසා වයස්ගත උපාධිධාරීන් බිහි වන තත්ත්වයක් ද ශ්‍රී ලංකාවේ පැවැතිණි. කුමන තත්ත්වයක් යටතේ වුව අධ්‍යාපන ක්‍රියාවලිය සක්‍රිය නම්, එය රටක සාධනීය ලක්ෂණයකි. වත්මන් ආණ්ඩුව අධ්‍යාපනය යාවත්කාලීන කිරීම සඳහා බොහෝ දේවල් කරයි. දහසක් බාධක මැද්දේ වුව මේ විභාගය පැවැත්වීමට අප සැම සහාය දිය යුතු බැව් අපගේ අදහස වන්නේ ඒ නිසා ය.

වසංගතයෙන් පසු අප මුහුණ දෙන බරපතළ අභියෝගය වන්නේ ආර්ථිකය යථාවත් කිරීමය. පවතින තත්ත්වය යටතේ ලෝක ආර්ථික ගනුදෙනු සීමා වී ඇත. ණය හා ආධාර වැඩසටහන් ඇනහිට ඇත. මේ අනුව ස්ව - ශක්තිය කෙරෙහි විශ්වාසය තබමින් ආර්ථිකය ගොඩනැඟීමට සිදු වී ඇත. ජනාධිපතිවරයා ප්‍රමුඛ රජය ඒ සඳහා බලවත් පරිශ්‍රමයක යෙදී සිටිති. මේ අභියෝගය ජය ගත හැක්කේ ජනතාවගේ පාර්ශ්වයෙන් ද උපරිම සහයෝගයක් හා කැපවීමක් ලැබුණ හොත් පමණි. එම කැප වීම සිදු කිරීමට නම් පොදු ජනයා නීරෝගි විය යුතුය.

කොවිඩ් 19 සමඟ ජීවත් වන්න; ආරක්ෂාව හා පරිස්සම තබා ගන්න! විශේෂඥයන්ගේ උපදේශනය එය වී තිබේ. කොරෝනා වසංගත රෝගයක් මිස අනාචාරයක් නිසා වැළඳෙන්නක් නොවේ. යම් හෙයකින් ඔබට රෝගී ලක්ෂණ ඇත්නම් අන් අය ගැන මානව දයාවෙන් ඒ ගැන දැනුම් දීම විනා පැන යෑම හෝ වහන් වීම අනුචිත ය. අප සැම අපගේ වගකීම හා යුතුකම නිසියාකාරයෙන් ඉටු කරන්නේ නම් කොරෝනාවෙන් ගැලවීම අපහසු කරුණක් නොවේ.

‘අපි සැවොම එකාවන්ව එකතු විය යුතු මොහොතක්’

විවෘත විශ්වවිද්‍යාලයේ අලෙවි කළමනාකරණ අංශාධිපති මහාචාර්ය නලීන් අබේසේකර

● **සුභද්‍රා දේශප්‍රිය**

මේ වනවිට ශ්‍රී ලංකාව ඇතුළු ලෝකයේ බොහෝ රටවල් කොවිඩ් 19 ගෝලීයවසංගතයට මුහුණ දෙමින් පවතී. මේ වන විටත් මේ වෛරසය පාලනය කිරීම සඳහා විවිධ රටවල් විවිධ ක්‍රමෝපායන් අනුගමනය කරමින් සිටියි. එහෙත් ලෝකයේ බොහෝ රටවල් ආර්ථිකමය සමාජමය දේශපාලනික අංශ ගනනාවක විශාල වෙනස් කරමින් කරමින් ලෝකයේ බලගතු රටවල් බිමට ඇඳ දමමින් පවතී. මේ තත්ත්වය හමුවේ අපේ රට පළමු කොරෝනා රැල්ලට සාර්ථකව මුහුණ දෙන ලදී. මේ වන විට මෙරට කොරෝනා සම්බන්ධයෙන් යළිත් වරක් රට තුළ රතු එළියක් දැල්වෙමින් පවතී. මේ උද්ගත වී ඇති තත්ත්වයත් සමඟ ජනතාව පාර්ලිමෙන්තුවේ මන්ත්‍රීවරුන් දෙසට පාලක පන්තිය දෙසට ඇඟිල්ල දිඟු කිරීමට ආරම්භ කර ඇතත් මේ දෙවැනි රැල්ලේ වගකීම භාරගත යුතුවන්නේ ද මේ රටේ පුරවැසියන්මය. එයට හේතුව කෝවිඩ් 19 සම්බන්ධයෙන් පසුගිය කාලය පුරා කිසිදු වගකීමකින් තොරව ජනතාව ක්‍රියා කිරීමයි. සෑම පුරවැසියෙකුම තමන්ගේ වගකිම් තේරුම් ගෙන කටයුතු කිරීමට හුරුවන්නේ නම් මිට වඩා හොඳ ජනතා බලවේගයන් එක් රැස් කරන පාර්ලිමේන්තුක් නිර්මාණය කරගැනිමට ජනතාවට හැකියාව තිබිණි.



මේ අවස්ථාවේ විශ්වවිද්‍යාලවල උගතුන්ටත් යම් කාර්යය භාරයක් පැවැරී තිබෙනවා

ගමයි පන්සලයි වැවයි දාගැබයි යන සංකල්පය අපි නැවත ගොඩනැඟිය යුතුයි.

මේ උද්ගත වී ඇති තත්ත්වයත් සමඟ පුරවැසියන් වගකිම් සහගතව ක්‍රියා කළ යුතු බව සිහිපත් කරන කාලයක් උදාවී ඇත. අපි කෝවිඩ් 19 සම්බන්ධයෙන් පමණක් නොව අනෙක් සියලු ක්ෂේත්‍රයන් හිදි වගකීම් සහගතව ජාතියක් ලෙස ක්‍රියා කළ යුතුයි. එය අපි ආරම්භ කළ යුතු වන්නේ කොතැනින්ද? යන පැනය මතු වෙයි. එහි සරල කාරණාව පවතින අධ්‍යාපන ක්‍රමවේදයන් වෙනස් කරන තැනින් එය අපි ආරම්භ කළ යුතුයි. ප්‍රායෝගික අධ්‍යාපනයක් අපි ලබා ඇත්තේ නම් පවතින තත්ත්වයන්ට යථාර්ථවාදී ලෙස මුහුණ දීමේ හැකියාව උදාවනු ඇත. මේ ආකාරයට අධ්‍යාපනය ලබා දීමේදී 'ධාපනය ' වැඩි කිරීමට එනම් හදවත් සමඟ ගනුදෙනු කිරීමට හුරු කිරීමේ අධ්‍යාපන ක්‍රමවේදයක් සකස් කළ යුතුය. පවතින අධ්‍යාපන ක්‍රමවේදයේ රැකියාවන්ට සුදුසු ක්‍රමවේදයන් හෝ හදවත් සමඟ ගනුදෙනු කළ හැකි මනස් ඇත්තන් බිහිකිරීමේ ක්‍රමවේද කිසිවක් නොවේ.

බොහෝ පිරිස්වලට අපේ ඉතිහාසය සම්බන්ධයෙන් අවබෝධයක් නැති නිසා රට ජාතිය ගැන ඔවුන්ට හැඟීමක් නැත.

පසුගිය වසර තිහක් පුරා මේ රටේ පැවැති ත්‍රස්තවාදය අවසන් කළ අවස්ථාවේද ඉන් අනතුරුව පැමිණි පාසකු ප්‍රහාරයෙන්ද, ඉන් පසුව පැමිණි කොරෝනා අර්බුදයෙන් මේ රටේ ආර්ථික අර්බුදයන් නිර්මාණය විය. මේ අවස්ථාවලින් අනතුරුව රට පත් වී ඇති තත්ත්වයන් පිළිබඳව සවිඥානික මනැස් ඇත්තවුන් ඉතා අල්ප විය. ඔවුහු සඳහටම පාලක පන්තියට දොස් නැගුහ. මේ වත්මන් කොරෝනා අර්බුදය අවස්ථාවේදීද එය ඉතා පැහැදිලියි වෙයි. සමාජයේ සංකීර්ණත්වය නිසා ඉතිහාසයේ සිවිල් සමාජයට වඩා අද සිවිල් සමාජයේ වෙනස්වූ සංකීර්ණ වගකීම් ඇත. රටේ තරුණ තරුණියන්ගේ ආකල්පයන් අද වන විට වෙනස් වී ඇති බව රට වසා දමා තිබූ කාලවකවානුවෙන් පසුව අපි දුටුවෙමු. ඒ අයගේ ආකාල්ප සම්ප්‍රදායික මතවාදයන්ගෙන් වෙනස් වන හෙයින් රටක් ලෙස ගොඩනැගීමට තරුණයන්ට සහය ලබා ගත හැකිය. රජයක් ලෙස ඒ අයට නිසි මාර්ගෝපදේශ ලබා දිය කළ යුතුය. එවැනි අවස්ථාවලදි උගත් බුද්ධිමත් පිරිස්වලට මේ රටේ ඉදිරි සංවර්ධන මාවත් කරා යොමු කළ හැකිය. සහනාධාර නොව මග පෙන්වීම කළ යුතුය. ඉදිරි පරපුර අපි යැපුම් මානසිකත්වයෙන් ගොඩගත යුතුය. පසුගිය මාස කිහිපය තුළ කොරෝනා වසංගයෙන් අනතුරුව තරුණයන්ගේ පිබිදීමක් ඇතිවිය. රට

දේශිය කර්මාන්තය නගාසිටුවීමට ජනතාව පෙළගැස්විය යුතුයි

ගොඩනැඟීමේ මූලික පියවර තැබීමේදී ඔවුන්ගේ පිබිදීමක් සහ යම් ආකල්පමය වෙනසක් ඇති වී ඇති බව අපි දුටුවෙමු. තරුණයන් රටේ සංවර්ධනයට එකතු වීමට කැමැති වුවත් අවාසනාවන්ත ලෙස නිසි බලධාරීන් එම අවස්ථාව ප්‍රයෝජනයට ගන්නවා ද නැද්ද කියන ගැටලුව මතු වී ඇත.

රාජ්‍ය අංශයේ සේවකයන්ගේ වගකීම ඒ අය මනාව හඳුනාගත යුතුයි. රාජ්‍ය යාන්ත්‍රණය නිසියාකාරයෙන් කළමනාකරණය කළ යුතුයි. මේ රටේ රාජ්‍ය සංස්ථා ආයතන බැංකු සහ පුද්ගලික අංශයේ ක්‍රියාකාරීත්වයේ යම් සේවා අංශවල ගැටලුව මතුවී ඇත. රාජ්‍ය සහ පුද්ගලික සේවා විධිමත් විය යුතුයි. රටකට ආණ්ඩුවකට කළ හැකි සියලු දේ කළත් රාජ්‍ය යාන්ත්‍රණය කරකවන්නේ රාජ්‍ය සේවකයන්ය. පුද්ගලික අංශයේ ද විධිමත් භාවයක් තිබිය යුතුය.

තමන්ගේ ඉල්ලීම් අයිතින් ගැන කෑගහන රාජ්‍ය සේවකයන් තමන්ගේ වගකීම තමන් අතින් සිදුවන්නේද යන කාරණාව පිළිබඳ සිතිය යුතුය. ජොන් එස්. කෙනඩි මහතා වරක් සඳහන් කළ ආකාරයට අපි කළයුතු වන්නේ ‘රටට යමක් කිරිම මිස රටෙන් යමක් ලබා ගැනිම නොවෙයි'. රටක් ලෙස අගාධයට යනවාද නැඟී සිටිනවාද යන කාරණාව සිහි තබා ගත යුතුය.

විශේෂයෙන් මෙවැනි අවස්ථාවක විපක්ෂය විපක්ෂයේ කාර්යය භාරය වටහා ගත යුතුයි. වගකීම් විරහිතව ක්‍රියා නොකළ යුතුයි. මේ අවස්ථාවේදි විපක්ෂය ඉතා දරුණු විදිහට මේ යථාර්ථය වසන් කරමින් දේශපාලන වාසි ලබා ගැනීමට කටයුතු කිරීම සම්බන්ධයෙන් ජනතාවගේ අප්‍රසාදයක් මතුවී ඇත. කෝවිඩ්-19 වසංගත, පාසකු ප්‍රහාරයෙ, මහබැංකු මංකොල්ලය වැනි කරුණු නිසා පසුගිය වසර වල ගතවූ කාර්තු කිහිපයක් තුළ රටේ ආර්ථිකය සෘන අගයක් ගනු ලැබිය. ලෝකයේම ආර්ථික අර්බුදයක් ඇති වී ඇත. එමෙන්ම ආර්ථිකය ඊළඟ කාර්තුවේ සෘන අගයක් ගත්විට ජනතාව ඇඟිල්ල දිගු කරනු ලබන්නේද ආණ්ඩුවටයි. මේ කෝවිඩ් වසංගතය අවසන් වී රජයෙන් ජනතාවට ලැබිය යුතු සියල්ල ලැබිය යුතු බව ජනතාවගේ අදහසයි. නමුත් මේ මතු වී ඇති කෝවිඩ් අර්බුදය හමුවේ රට විශාල ආර්ථික ප්‍රශ්නයකට සහ වෙනත් සමාජ ප්‍රශ්න රැසකට මුහුණ දී ඇත.

සංචාරක ව්‍යාපාරය විදෙස් ව්‍යවසායකයන් හරහා ලැබෙන මුදල් සියල්ල මේ වන විට ඇහිරී ඇත. ඒ සඳහා අපි කළ යුතු වන්නේ කුමක්ද? පුරවැසියන්ගෙන්ගේ පාර්ශ්
කළයුතුද? යන කාරණාව මතු වී ඇත. විදෙස් විනිමය සංචාරක ව්‍යාපාරය හරහා ලැබෙන මුදල් අහිමි වීම තුළ අපි දේශීය කර්මාන්තය නගා සිටුවිය යුතුයි. ඒ සඳහා ජනතාව පෙළගැසිය යුතුයි. ඇමරිකාවේ ග්‍රෙගරි ඇබට්ස් නම් 48 වැනි ආණ්ඩුකාරවරයෙක්ද නීතිපතිවරයෙක් ද වෙයි ඔහු සඳහන් කරනු ලබන්නේ ද මේ සරල කාරණාවයි. එනම් සෑමවිටම පුරවැසියෙක් සිදු කළ යුතු වන්නේ මුඛ ආවරණ පැළඳ මේ වසංගතය පාලනය කිරීමයි.පුරවැසියන් ලෙස එම වගකීම පිළිඅරගෙන මුඛ ආවරණ පැළඳීම කළයුතු බවයි.

ඔහු සඳහන් කරන ආකාරයට මේ වසංගතය පාලනයට කළයුතු වන්නේ සරල කාරණාවකි. එනම් මාස්ක් එක පාවිච්චි කළ යුතුයි. එය අපි නිවැරදි ආකාරයට පාවිච්චි කළ යුතුයි. එසේම අනෙක් සෞඛ්‍ය ආරක්ෂණ ක්‍රමවේද අනුගමනය කළේ නම් මේ ජාතික ව්‍යසනයෙන් බේරීමට අපි හැකිවෙයි. පසුගිය මාස දෙකක කාලය පුරා මාධ්‍යයත් හැසිරුණු ආකාරය පිළිබඳ සඳහන් කිරීමේදී මේ සම්බන්ධයෙන් නිසි දැනුම්වත් කිරීමක් සිදු නොවූ බව පැහැදිලි කරුණකි. ජනතාවද කෝවිඩ් 19 සම්බන්ධයෙන් නිසි ක්‍රමවේද අනුගමනය කළ ආකාරයක් දක්නට නැත. එනම් පාර්ලිමේන්තුවේ සිටින අය විවේචනය කිරීමට වඩා තමන්ගේ ආරක්ෂාව මුඛ ආවරණ පැළඳීම මීටරය පරතරය තබා ගැනීම කළ යුතුයි. මේ පිළිබඳව මේ රටේ විශ්වවිද්‍යාලවලින් ඉටුවිය යුතු කාර්ය භාරයක්ද වෙයි. එනම් මේ අවස්ථාවේදි ජනතාව දැනුවත් කිරිමේ ක්‍රමවේද අනුගමනය කළ යුතුයි.

එසේම මේ අවස්ථාවේ විශ්වවිද්‍යාලවල උගතුන්ටත් යම් කාර්යභාරයක් පැවැරී ඇත. උසස් අධ්‍යාපන ආයතනයන්ද එකතුවී දැනුවත් කිරීම අවශ්‍ය යි. මේ දෙවැනි රැල්ලත් සමඟ ජනතාව බලාපොරොත්තු වෙන්නේ මේ රට යළි වසා දැමීමයි. එසේ වී නම් මේ රටේ ලොකු ආර්ථික අර්බුදයක් මතුවීමට ඉඩ ඇත. මේ රටේ විශාල ආර්ථිකමය අර්බුදයක් පැන නැඟී ඇති අතර එය තවත් උග්‍ර අතට හැරී ඇත. ජනතාව ඇත්ත වශයෙන්ම කිසිදු තැකීමක් හො සවිඥානික වීමක් මේ සම්බන්ධයෙන් නැත.

මේ අවස්ථාවේදී රටක් ලෙස විපක්ෂය විසින් රජයට සහය ලබා දිය යුතුයි. එකිනෙකාට ඇඟිල්ල දිගු කිරිමට වඩා මේ අවස්ථාවේ මේ ගැටලුව සම්බන්ධයෙන් ආණ්ඩුවට සහය ලබාදිය යුතුයි. එසේ නොවන්නට මේ රට මේ අවස්ථාවේ දී යළි වසාදැමීම තුළ විශාල අර්බුදයකට ගමන් කිරීම නියත කාරණාවකි. දේශපාලන වාසි තකා ජනතාව නොමග යවා මේ කොරෝනාවලින් වෙනස් මානයකට ගෙන යාමට විපක්ෂය දරන උත්සහය රටකට ඉතාමත් අහිතකරයි.

එවැනි අවස්ථාවක විපක්ෂයක කාර්යය භාරය විය යුත්තේ කුමක්ද? ආණ්ඩුව මඟින් රටේ ප්‍රශ්න යටපත් කිරීමට ගත් උත්සාහයක් බව ජනතාවට හුවා දැක්වීමට උත්සාහ නොකර ඔවුන්ගේ කාර්යය භාරය විය යුතු වන්නේ සමස්ත රට සහ ජාතිය වෙනුවෙන් සහය ලබාදීමයි.

මේ අවස්ථාව සමාජයේ සියලු දෙනාගේම අවංකත්වය කෙසේ ද යන කාරණාව ප්‍රදර්ශනය වන අවස්ථාවකි.

1971 මෙවැනි අර්බුදයක් රට තුළ නිර්මාණය වූ අවස්ථාවේදී විපක්ෂය විසින් සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියට සහය ලබා දී ඇති බවට ඉතිහාසය සාක්ෂි දරයි. මෙය ඊට වඩා විශාල අර්බුදයකි. විපක්ෂය සඳහන් කරනු ලබන්නේ කුමක්ද; මේ නව කොරෝනා ව්‍යාප්තිය ආණ්ඩුව ප්‍රශ්න යට ගැසීමට ගනු ලබන කුමන්ත්‍රණයක් බව හඟවමින් ජනතාව නොමග යැවීමක නිරත වෙයි.

විපක්ෂය පසුගිය මැතිවරණයෙන් අසාර්ථක වීමට මේ හේතු කාරණා බොහෝ සෙයින් බලපානු ලැබීය. විපක්ෂයේ අසාර්ථක වීමට හේතුවද වන්නේද එයයි. මේ අදූරදර්ශී ක්‍රියා මාර්ග නිසා රටේ ඇති ස්ථාවරභාවය සම්බන්ධයෙන් කුමන්ත්‍රණයක් දියත් කර ඇති බව ජනතාව හොඳින් වටහා ගෙන ඇත. ජනතාව ලෙස පවතින යථාර්ථය අපි සියැසින් දකින්නට තරම් සවිඥානික විය යුතුයි. මේ රටේ විපක්ෂයේ කාර්යය භාරය සම්බන්ධයෙන් නැවත කියවීමක් කළ යුතුයි.

ඇත්ත වශයෙන් ම කෝවිඩ් සම්බන්ධයෙන් මේ රජය ක්‍රියා කළ ආකාරයෙන් මේ රටේ ජනතාවගේ ජීවිත බේරා ගැනීමට හැකි විය. ඒ පුණ්‍ය කර්මයට අත ගැසීමටවත් ගියවර විපක්ෂයට නොහැකි විය. එමෙන්ම වසර 30 පැවැති ත්‍රස්තවාදයෙන් මේ රට ගොඩනැගීමේ පුණ්‍යකර්මයට සහභාගි වීමට නොහැකි වූයේ විපක්ෂය එදා සිට හැසිරුණු ආකාරය අනුවයි. එනම් වගකීම් විරහිත ස්වභාවයකින් ඔවුන් ඉතිහාසයේ සිට ක්‍රියා කළ බව පෙනෙයි. කෝවිඩ්-19 හරහා වැටුණු ආර්ථික අගාධයෙන් ගොඩ ඒමට නම් ආණ්ඩුවේ ඇමැතිවරුන්ට පමණක් වගකීම පැවැරිය නොහැකිය. අපි එකිනෙකාට වෙන් වූ සමාජ කාරණාවක් ඇත.

මේ කොවිඩ්-19 අර්බුදය 2023 දක්වා පවතින අර්බුදයකි. මේ සම්බන්ධයෙන් ලෝකයේ සෑම රටකම ජනතාව දැනුම්වත්වී ඇත. සහනාධාර ලබා දෙනවාට වඩා ජනතාව ස්වයං නගා සිටුවීමට රාජ්‍ය යාන්ත්‍රණය විධිමත් කළ යුතුයි. රජයක් ලෙස මේ අවස්ථාවේදී ජනතාවට සහනාධාර දීම ඉතාමත් අසිරු කාර්යයකි. ඒ නිසා ජනතාවට ස්වයංව නැගී සිටිය යුතුයි යැපුම් මානසිකත්වයෙන් ඈත් විය යුතුයි.

ගමයි පන්සලයි වැවයි දාගැබයි යන සංකල්පය අපි නැවත ගොඩනැගිය යුතුයි. පසුගිය කොරෝනා වසංගතය පැතිර යාමත් සමඟ අපි අපේ සාම්ප්‍රදායික ගමට සාම්ප්‍රදායික සංස්කෘතියට ගියෙමු. යළිත් අපි මේ මාස දෙකක කාලය තුළදි පෙර තැනටම පත්විය. කෝවිඩ් උණුසුම පහවූ විගස ජනතාවට යළි මේ සියල්ල අමතක විය. නැවත කෝවිඩ් සම්බන්ධයෙන් යළි භීතියක් පැතිරෙමින් පවති. ස්වාමීන් වහන්සේ, ආගමික පූජකවරුන්, ප්‍රගතිශීලී ජනතා නියෝජිතයන් මේ අවස්ථාවේ ජනතාව සමඟ පෙළගැසි රට ගොඩනැගීමට ගම පන්සල වැව දාගැබ මත ගොඩනැගුණු අපේ සංස්කෘතිය ගොඩ නැගිය යුතුයි. නැවත ඒ සංස්කෘතිය ගොඩනැගිම සම්බන්ධයෙන් කතිකාවක් සමාජය තුළ ගොඩනැගිම අපි සියල්ලටම පැවැරී ඇති සමාජ වගකීමකි.



20 ගැන අවුලක් හදන්නේ

කෘෂිකර්ම අමාත්‍ය මහින්දානන්ද අලුත්ගමගේ

● භක්ති ධර්ප්‍රිය මෙන්ඩිස්

■ විසිවෙනි සංශෝධනය රජයට ගැටලුවක් බව දේශපාලන පක්ෂ කිහිපයක්ම සඳහන් කරනවා. ඇත්තද මේ කතාව?

විසිවෙනි සංශෝධනය පිළිබඳව කිසිදු ගැටලුවක් රජයට නොමැති බව අපි අවධාරණයෙන් යුතුව කියා සිටිනවා. අපි අපගේ ගමන යන්න ආරම්භ කළේ යහපාලන රජය ගෙදර යවලා. ඔවුන් හැමදාම මේ රටට විනාශයක් තමයි සිදු කළේ. ජනතාව අපිට ඉතිහාසයේ නොවූවිරු තරමට බලයක් ලබා දීලා තිබෙනවා. ඒක ඔවුන්ගේ කැමැත්ත. විස්ස ගේන්න ඕන කියලා අපි ජනතාවට ප්‍රකාශ කළේ ආණ්ඩු බලය අරගෙන නොවෙයි. ඊට පෙර අපි මේ පිළිබඳව කීවා. විශේෂයෙන් ම 19 වැනි සංශෝධනයෙන් මේ රට ඉදිරියට ගෙන යන්න බෑ කියන එක ජනතාවට තේරුම් ගියා.

විශේෂයෙන්ම ජනතාව මේ රටට ආදරය කරන ජනාධිපතිවරයෙක් අපට ලබා දුන් ලක්ෂ 65 කට වැඩි පිරිසක් අපිට ඡන්දය ලබා දුන්නා. ඉන්පසුව මහමැතිවරණයේදී ආසන 145ක් ලබා දෙමින් ජනතාව අපිට මේ රට ලෝකයේ අංක එකේ රටක් බවට පත් කරන්න අවශ්‍ය කටයුතු කිරීම සඳහා බලය ලබා දුන්නා.

එක එක පිරිස් කණ්ඩායම් අපගේ ගමනට නොයෙක් බාධක එල්ල කරාවි. අපි ඒවා ගණන් ගන්නේ නැහැ. විස්ස නිසා අවුලක් හදන්න යන්නේ මේ රටට කිසිම දෙයක් කරන්න බැරි වුණු දේශපාලනඥයන් පිරිසක් තමයි. ජනතාවගෙන් අපි ජනවරමක් ඉල්ලුවා 19 අහෝසි කරන්න ඕන කියලා. ජනතාව ඒ සඳහා අපට ජනවරම ලබා දුන්නා. දැන් අපි එය සිදු කරමින් පවසනවා. මේ වන විට 18 බලාත්මක වෙලා තිබෙනවා.

ඒ වගේම 19 වැනි සංශෝධනයේ තිබූ හොඳ කාරණා අපි 20 වැනි සංශෝධනයට ගෙන එනවා. එකතු කරනවා. විශේෂයෙන්ම 19 වැනි සංශෝධනයේ තිබූ හොඳ කාරණා තුනක් පිළිබඳව මම කියන්නම්. අපි ඒවා විස්සට ගෙන යනවා. විශේෂයෙන්ම පාර්ලිමේන්තුව විසුරවන කාලය, ජනාධිපතිවරයා දෙවරක් ඉල්ලන අවස්ථාව සහ තොරතුරු දැන ගැනීමේ පනත කියන මේ කාරණා තුන කියන මේ කාරණා අපි ඉතුරු කරලා තමයි සංශෝධනය ගෙන එන්නේ.

නමුත් 20 වැනි සංශෝධනයෙන් තමයි මේ කටයුතු සියල්ල නිවැරැදි කරලා අපි ක්‍රියාත්මක කරනු ලබන්නේ. අපි තාම මේ පිළිබඳව දීර්ඝ වශයෙන් සාකච්ඡා කරගෙන යනවා. දේශපාලන පක්ෂවල මතය දේශපාලන විද්වතුන් මේ පිළිබඳව දරන මතය ජනතා අදහස් මේ සියල්ල සමගයි ඉදිරියට යන්නේ. අපි සියලු දෙනා එකට එකතු වී තමයි මෙම තීරණය ගනු ලබන්නේ. කිසිසේත්ම තනි අදහසකට පුද්ගල අදහසකට මේක සිදු කරන්නේ නැහැ.

රටට කිසි දෙයක් නොකරපු අයයි

■ 20 වැනි සංශෝධනය අවශ්‍යමද රට ගොඩනඟන්න?

පැහැදිලිවම ඔව්. ව්‍යවස්ථා සංශෝධනයක් නැතිව මේ රටේ සෑම පද්ධතියකම කඩා වැටුණු තැන් ගොඩනගන්න බැහැ. යහපාලන රජය ගෙන ආපු 19 වැනි සංශෝධනය නිසා රටට වෙච්ච හානිය ජනතාව හොඳටම දන්නවා. අගමැතිවරයා ජනාධිපතිවරයා පාර්ශ්ව දෙකක් බවට පත්වුණා. මැති ඇමතිවරුන්ට කර කියා ගන්න දෙයක් නැති වුණා. යහපාලනය තියා මේ අයට රට පාලනයවත් කරගන්නත් බැරි වුණා.

රට ආර්ථිකව කඩාගෙන වැටුණා. දේශපාලනිකව කඩාගෙන වැටුණා. සංස්කෘතිකව කඩාගෙන වැටුණා. ජනතාව අතරමං වුණා. මේ සියල්ලටම බලපෑමේ ජනාධිපති සහ අගමැතිවරයාගේ ගැටුම්කාරී අස්ථාවර තත්ත්වය. රටේ ආරක්ෂාව නැතිවෙලා ගියා. මෙන්න මේ කරුණු නිසාම 19 ඉවත් කරලා 20 ගේන්නම සිද්ධ වෙනවා.

■ රටේ සංවර්ධනය, රට ගොඩනැඟීම මේ කියන කිසිවක් 19 වැනි සංශෝධනයෙන් සිද්ධ වුණේ නැද්ද?

ඇත්තටම නැහැ. අපි අහනවා 19 යෙන් රටට මොකක්ද වුණු සේවය කියලා. යහපාලන ආණ්ඩුවට උත්තර නැහැ මේ ප්‍රශ්නවලට. හොරු අල්ලනවා කීවා. එක හොරෙක් ඇල්ලුවාද නැහැ. අල්ලස් දූෂණ කොමිසමක් තිබුණා. මොනවද ඒකෙන් කළේ. කිසිම දෙයක් නැහැ. ඔවුන් කෙළ් දේශපාලනඥයන්ව දඩයම් කරපු එක විතරයි. පොලිස් කොමිසමක් පත්කළා. ඒ කොමිසම මොනවද කළේ. විගණන කොමිසමක මොනවාද ඇල්ලුවේ. අන්න ඒ නිසා අපි අහනවා 19 යෙන් මේ රටට මොනවාද වුණේ. කිසිම දෙයක් සිද්ධ වුණේ නැහැ.

■ 20 වැනි සංශෝධනය තුනෙන් දෙකකින් සම්මත කර ගන්න බැහැ කියලා සමාජය තුළ මතයක් ගොඩ නැඟෙමින් පවතිනවා. එහෙම වේවිද?

කිසිම ලෙසකින් එසේ වන්නේ නැහැ. මා එය නොබියව පැකිළීමකින් තොරව ප්‍රකාශ කරනවා.

පක්ෂවලට නොයෙක් මතයන් තිබෙනවා. ඒ වගේම ඔවුන්ට අනන්‍ය වූ කරුණු කාරණාත් තිබෙනවා. හැබැයි අවසානයේ 20 සංශෝධනය කරන්න අපි එකාවගේ සියලු දෙනාම එකට එකතු වෙනවා. අපි එක්ක හිටියා කියලා ගැටලුවක් නැහැ. ඕනෑම පක්ෂයකට එම පක්ෂයේ මතය දරන්න පුළුවන්. මේ මොන මතවාද තිබුණත් අපි රට වෙනුවෙන් ක්‍රියාත්මක වන අවස්ථාවක සියලු දෙනාම එක මතයකට පැමිණෙනවා. අවසානයේ විස්ස සම්මත වෙනකොට අපි සියලු දෙනා එක තැනක සිටිනවා.

■ තුනෙන් දෙක පෙන්නනකොට ආණ්ඩුව තුළ අර්බුදයක් නැහැ කියලාද ඔබ කියන්නේ?

ඔව්. මේක පැහැදිලිවම ගැටලුවක් වෙන්නේ නැහැ. ආණ්ඩුව තුළ දේශපාලන පක්ෂ කිහිපයක්ම තිබෙනවා. ඒ පක්ෂවලට තමන්ගේ අනන්‍යතාවය තිබෙනවා. මෙන්න මේ කාරණයේදී ඔවුන් තමන්ගේ මතවල සිටිනවා. ඒක ඔවුන්ගේ අයිතිය හැටියට අපි දකිනවා. හැබැයි මේ සියල්ල අවසානයේදී මේ සියලු දෙනා එක තැනකට එනවා.

■ පිල් මාරු කරන මන්ත්‍රීවරු මෙවරත් සිටින බව ප්‍රවෘත්ති වලින් පැවසෙනවා. ඔබ පාර්ලිමේන්තුවේදි ප්‍රකාශ කළා සමගි ජන බලවේගය ඇතුළු විපක්ෂයේ තිස්දෙනකු 20 ට සහය පල කරන බව. එහෙම වෙයිද?

ඇත්තටම ගණන් ප්‍රමාණයෙන් කෙසේ වෙතත් ජාතික සමගි ජන බලවේගයේ පිරිසක් අපි සමග සම්බන්ධ වීමට බලන් ඉන්නවා. මොකද ඔවුන් සමගි ජන බලවේගය පිළිබඳව දැඩි කම්පනයකින් සහ අවුල් සහගත තත්වයකින් සිටින නිසා. ඔවුන් කොන්දේසි විරහිතව අපිට සහය පල

සමගි ජන බලවේගයේ පිරිසක් 20ට පක්ෂව ඡන්දය දෙනවා

කරමින් අපි පිළිබඳව විශ්වාස තබමින් අපට එකතු වේවි. ඊට අමතරව විපක්ෂයේ සිටින කණ්ඩායම් කිහිපයක්ම අප සමග එක්වීමට කැමැත්තෙන් සිටිනවා කියන කාරණය පිළිබඳව අප දන්නවා. අපි ඔවුන්ටත් ආරාධනා කර සිටිනවා. එපමණක් නොවෙයි. මේ රටට ආදරය කරන මේ රට සංවර්ධනය කර ලෝකයේ ප්‍රබල රටක් හැටියට පත්වනවාට කැමති සියලු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට අප සමග එක්වන්න කියලා අපි විවෘත ආරාධනාවක් කරන්නට කැමැතියි. රටට ආදරය නම් 225 එන්න කියලා අපි ඉල්ලීමක් ද කර සිටින්නට කැමතියි.

අපිට අවශ්‍ය වේලාවට අවශ්‍ය කාලය අරගෙන අපි කරන්න ඕන දේ කරනවා. ඒකේ කිසිම ගැටලුවක් නැහැ. කෙටුම්පත ඉදිරිපත් කරලා ඡන්ද විමසුම සිදුකරන අවස්ථාවේදී රටට පෙනෙයි අපි සමග කොතරම් පිරිසක් සිටිනවාද කියන එක වගේම 19 යට අකමැති කී දෙනෙක් පාර්ලිමේන්තුව තුළ ඉන්නවාද කියන එක.

■ වැටුණු ආර්ථිකයක් සමග ආපස්සට ගිය රටක් ඔබලාට භාර ගැනීමට සිදු වන්නේ. කොහොමද මේ රට යළි ගොඩ නඟන්නේ?

කඩාගෙන වැටුණු ආර්ථිකය නොවෙයි ඇත්තටම විනාශ කරපු ආර්ථිකයක් සමග තමයි අප මේ රට භාර ගන්නේ. ඊටත් එහා ගිය තවත් ගැටලුවකට අපි මුහුණ දුන්නා. ඒ තමයි කොවිඩ් වසංගතය. මෙන්න මේ කාරණාවත් විශාල ලෙස බලපෑවා. මුළු ලෝකයටම බලපාපු මේ වසංගතයට අපට මුහුණ දෙන්නට සිදුවුණා. මා හිතන්නේ ශ්‍රී ලංකාව කියන රට ලෝකයේ අංක එකේ රටක් බවට යළි ලෝකයට පිළිගන්නට සිදුවුණා.

ජනාධිපතිතුමාගේ අගමැතිතුමාගේ උපදෙස් පරිදි ආරක්ෂක අංශ සාමාජිකයින්, පොලිසිය, වෛද්‍ය අංශ, සමාජ සේවා අංශ මෙන්ම විශේෂයෙන් ජනතාව එක්ව අපි කටයුතු කළා. මාස හයකට ආසන්න කාලයක් රට අක්‍රිය වෙලා තිබුණේ. නමුත් මෙය පැතිරෙන්න නොදී මිනිස් ජීවිත බිලිගන්න නොදී අපි මෙය පාලනය කළා. එය පහසු කටයුත්තක් නොවෙයි.

■ ශ්‍රී ලාංකිකයන් හැටියට අපි කොවිඩ් 19 ට ඉතා හොඳින් මුහුණ දුන්නා. රට තුළ නැවත එවැනි තත්වයක් උද්ගත වී තිබෙනවා. මේ අවස්ථාවේ ඔබට ජනතාවට කියන් යමක් තිබේද?

අපි ප්‍රථම අවස්ථාවේදී නියම වේලාවට නියම තීන්දු තීරණ ගත්තා. අන්න ඒ සඳහා ජනතාව ද අපිට සහය ලබා දුන්නා. වර්තමානයේ ගම්පහ දිස්ත්‍රික්කයේ, මිනුවන්ගොඩින් ඇරඹුණු අලුත් රැල්ල පාලනයට ජනපති, අගමැති, ආරක්ෂක අංශ කටයුතු කරනවා.

අපි මේ අලුත් රැල්ල රටපුරා යන්න නොදී පාලනය කරන ආරක්ෂක අං සමග කටයුතු කරනවා. ශිෂ්‍යත්වය හා උසස්පෙළත් තියන්නයි සූදානම. ඇති වී තිබෙන මේ තත්වයට අප මුහුණ දිය යුතුයි. රජයක් හැටියට අප අදාළ ප්‍රදේශයට ඇඳිරි නීතිය පනවනවා. යුද හමුදාව සෞඛ්‍ය අංශ එක්ව අදාළ පිළියම් යොදමින් සිටිනවා. ජනතාව අප සමග එක්ව සෞඛ්‍ය උපදෙස් පිළිපදිමින් මේ සඳහා සහය ලබා දෙන්න කියන ඉල්ලීම මා කරනවා. අපිට මෙය ජයගත හැකියි.

■ රටට මේ ගැටලුව තිබුණත් රට සංවර්ධනයට රජය ක්‍රියාත්මක කරන වැඩපිළිවෙළ?

අපි රට ශක්තිමත් කිරීම සඳහා දැවැන්ත වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරමින් තමයි සිටින්නේ. සෑම අමාත්‍යාංශයක්ම තමන්ට කළ හැකි දේ උපරිමයෙන් කිරීම සඳහා දැනටමත් ක්‍රියාත්මකයි. ජනාධිපතිවරයාගේ උපදෙස් පරිදි මේ සඳහා කටයුතු කරමින් සිටිනවා. මෙවර අයවැයෙන් මේ සඳහා අපි ගත යුතු පියවරවල් යෝජනා වශයෙන් ඉදිරිපත් කරනවා. රාජ්‍ය ආදායම් වැඩි කරගන්නේ කෙසේද යන්න අපි සොයමින් මේ සඳහා කටයුතු කරනවා.

නම 'යහපාලනය' වුණත් රටේම පාලනය අවුල් කළා...

අපිට දැන් හොඳ අවස්ථාවක් තිබෙනවා විදේශ වෙළඳපොළ කරා ගමන් කරන්නට. අපි එය ටිකෙන් ටික ව්‍යාප්ත කරන්නට ඕන. කෘෂි කර්මාන්තය දියුණු කරමින් අපගේ අපනයන වැඩි කරන්න බලාපොරොත්තු වෙනවා.

■ මෝටර් රථ ගෙන්වීම ඇතුළු ආහාර පාන මෙන්ම භාණ්ඩ රැසක් ගෙන්වීම එකවර නතර කළා. මේ නිසා ජනතාවට අද බඩගින්නේ ඉන්න වෙලා තිබෙනවා. ජනතාවගේ අවශ්‍යතාවන් ඉටුකර ගැනීමට නොහැකිව සිටින බවට විපක්ෂය චෝදනා කරනවා. එම චෝදනාවට ඔබ මොකද කියන්නේ?

අපට ඕන දේ අපට අපට අවශ්‍ය දේ අපේ රටේ නිෂ්පාදනය කරනවාට අකමැති කෙනෙක් ඉන්නවා නම් ඒක පුදුම සහගත කාරණයක්. විශේෂයෙන්ම ජනාධිපති ගෝඨාභය රාජපක්ෂයන්ගේ සංකල්පයට අනුව දේශීය ආර්ථිකය මගින් ලෝකය දිනා ගැනීමටයි අප කටයුතු කරන්නේ.

අපිට හොඳ කෘෂි ආර්ථිකයක් තිබෙන රටක්. අපි මොකටද හාල්, ලූනු, කහ වැනි දේවල් පිටරටින් ගෙන එන්නේ. අපිට පුළුවන් මේවා මෙරට තුළදීම නිෂ්පාදනය කරන්න. ඇයි අපි ඒක නොකරන්නේ. කොරෝනා වසංගතය නිසා මුළු ලෝකයම නතර වුණා. මේ කාලය ඇතුළත ජනතාව තමන්ගේ අවශ්‍යතාවයන් තමන්ගේ නිවසේදී ගමේදී සොයා ගත්තා. නිෂ්පාදනය කළා.

විශේෂයෙන්ම කොරෝනා වංසගතය ආරම්භ වූ කාලය තුළ ජනතාව මාස ගණනක් නිවෙස්වල සිටියේ. ඔවුන් වවන්න පුරුදු වුණා. එහෙනම් අපිට ඇයි බැරි අපිට අවශ්‍ය එළවළු පලතුරු ලංකාවේම නිෂ්පාදනය කරන්න. කහ මාෆියාවක් තිබුණේ. වැඩි මිල ගණන් වලට කහ අලෙවි කළා. දැන් අපිට ඒ තත්වය පාලනය කරන්න පුළුවන් වෙලා තිබෙනවා. දැන් අලුතෙන් කහ වගාව ආරම්භ කර තිබෙනවා. ඉදිරියේදි එහි ප්‍රතිඵල අපි සියලු දෙනාට භුක්ති විඳින්න පුළුවන්.

අනෙක් කාරණය තමයි අපි මුළු ලෝකයටම රෙදිපිළි යවන රටක්. එහෙනම් අපිට ඇයි බැරි අපිට අවශ්‍ය ඇඳුම් දේශීය වෙළෙඳපොළෙන් ගන්න. ඒක පුරුදු වෙන්න ඕන. කාර්මිකවත් අපිට දියුණු වෙන්න පුළුවන්. ඉතා හොඳ නිර්මාණකරුවන් අප සතුව සිටිනවා. ඔවුන්ට අතහිත ලබා දෙන්න කවුරුත් හිටියේ නැහැ. අපගේ රජය ඉදිරියේදි ඔවුන්ට අවශ්‍ය පහසුකම් සලස්වා දෙනවා. එවිට අපට හැකි වෙනවා එම නිෂ්පාදන ලෝකයට යවන්න.

■ විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස අවස්ථා ගණනාවකදි ප්‍රකාශ කර සිටිනවා නැවත රාජපක්ෂ යුගයක් සඳහා මේ රජය කටයුතු කරන බව?

සජිත් ප්‍රේමදාස මහතා විපක්ෂ නායක ලෙස කටයුතු කළාට වැඩක් නැහැ. ඔහුගේ කණ්ඩායම නියෝජනය කරන බොහෝ දෙනකු සජිත් ප්‍රේමදාස කියන කිසිම දෙයක් ගණනකටවත් ගන්නේ නැහැ. සජිත් ප්‍රේමදාස දේශපාලනික වශයෙන් පමණක් නොවෙයි කාලයක් තිස්සේම රාජපක්ෂවරුන්ට බොරු

අලුත් කෝවිඩ් රැල්ල මර්දනයට අපි සියලු කටයුතු කරනවා

චෝදනා එල්ල කරමින් දිගින් දිගටම විවේචනය කරනවා. දැන් ඒක කිසිම කෙනෙක් ගණන් ගන්නේ නැහැ. අනික ඔහුගේ කතා අපි වැදගත් කතාවක් හැටියට සලකන්නෙත් නැහැ. කතා කළොත් මොනවා හරි අනවශ්‍ය දෙයක් කියනවා තමයි.

■ දේශපාලන පක්ෂ කිහිපයක්ම සඳහන් කරන්නේ 20 වැනි සංශෝධනය මගින් ගෝඨාභය රාජපක්ෂයන්ට වැඩි බලතල ලබා දීමට රජය කටයුතු කරන බවයි. එහෙම වෙයිද?

එහෙම දෙයක් වෙන්නේ නැහැ. ගෝඨාභය රාජපක්ෂයන් ජනාධිපති වශයෙන් තේරී පත් වී දැනට මාස එකොළහකට ආසන්නයි. ඔහු ඉතා ප්‍රජාතන්ත්‍රවාදීව මේ රට පාලනය කරනවා. ජනතාවට දැන් පාතාල බියක් නැහැ. ත්‍රස්තවාදී බියක් නැහැ. ජනතාව ඉතා හොඳින් ප්‍රජාතන්ත්‍රවාදය විඳිනවා. මීට පෙර පැවැති රජයන් උද්ඝෝෂණ කරුවන්ට, විරෝධතා කරුවන්ට කඳුළු ගෑස් ප්‍රහාර වතුර ප්‍රහාර බැටන් පොලු ප්‍රහාර එල්ල කළේ. නමුත් ගෝඨාභය රාජපක්ෂ මහතා ඔවුන්ට නිදහසේ එම උද්ඝෝෂණ සිදු කිරීමට ඉඩලබා දී තිබෙනවා. එපමණක් නොවෙයි උද්ඝෝෂණ කරුවන්ට තේ පැන් සංග්‍රහයක් ද ලබා දුන් අවස්ථා තිබෙනවා.

තවත් පැත්තකින් ජනාධිපතිවරයා උද්ඝෝෂකයන් ළඟට ගොස් ඔවුන්ගේ ඉල්ලීම පිළිබඳව සාකච්ඡා කරනවා. මේ තරම් ප්‍රජාතන්ත්‍රවාදී ජනාධිපතිවරයකු මේ රටේ හිටියාද කියලා ඔහුට චෝදනා නඟන දේශපාලන පක්ෂවලින් අපි දැනගන්නට කැමතියි.

සජිත් කියන දේවල් ඔහුගේ අයවත් ගණන් ගන්නෙ නැහැ

■ මහ බැංකු කොල්ලය. එසේත් නැත්නම් බැදුම්කර වංචාව ඇතුළු හොරු අල්ලනවා කියන සටන් පාඨ කියූ වර්තමාන රජය ඒ ගැන ක්‍රියා නොකරන බවට ජනතාව චෝදනා කරනවා. කවදාද හොරු අල්ලන්නේ?

ඇත්තටම වංචනිකයන් දූෂිතයන් මෙන්ම රටේ මුදල් නාස්ති කරපු ඕනෑම අයෙකුට තරාතිරම නොබලා දඬුවම් ලබා දිය යුතුයි. ඒ සඳහා අප රජය බලයට පැමිණි දින සිට අපි ක්‍රියාත්මකයි. මෙම පරීක්ෂණ සිදු කරන පොලිසිය ඇතුළු අදාළ ආයතන දිහා අපි විමසිල්ලෙන් යුතුව බලාගෙන ඉන්නවා. දැනටමත් මෙම වංචාවන්ට සම්බන්ධ පුද්ගලයින් අත්අඩංගුවට ගෙන පරීක්ෂන සිදු කෙරෙමින් පවතිනවා. රනිල් වික්‍රමසිංහ අගමැතිව සිටියදී විශේෂ පොලිස් කණ්ඩායම් රාජකාරි සිදු කළේ අරලියගහ මන්දිරයේ බව අපිට අමතක නැහැ. එදා නීතිය හැදුවේ නීති කැඩුවේ අරලියගහ මන්දිරයෙන්. අද එවැනි තත්ත්වයක් නැහැ. අදාළ පාර්ශ්වයන් නිදහස්ව ඔවුන්ගේ රාජකාරිය සිදු කරමින් පවතිනවා. මම හිතන්නේ මේකට තමා ප්‍රජාතන්ත්‍රවාදය කියලා කියන්නේ.

■ මෙවර පාර්ලිමේන්තුවට නව මුහුණු 81 ක් එක්වෙනවා. මේ පිළිබඳව ඔබගේ අදහස?

ඇත්තටම හොඳ අදහසක්. අලුත් මුහුණු අලුත් අදහස් අලුත් යෝජනා එන්න ඕන. එය තමයි සිදුවිය යුත්තේ.

‘පාස්කු ප්‍රහාරයේ වගකීම මෛත්‍රී සහ රනිල් බාර ගත යුතුයි’

සමගි ජන බලවේගයේ ගම්පහ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී | ෆීල්ඩ්මාර්ෂල් සරත් ෆොන්සේකා

● **භක්ති ධර්මප්‍රිය මෙන්ඩිස්**

■ විසිවෙනි සංශෝධනය එපා කියන්නේ ඇයි?

අපි පැහැදිලිවම කියනවා විස්ස එපා කියලා. ඒකට හේතු රාශියක් තිබෙනවා. විස්සෙන් ජනාධිපති කියන පුද්ගලයාට අසීමිත බලයක් පැවරෙනවා. ස්වාධීන කොමිසන් සභා දුර්වල කළාම, පොලිසිය දුර්වල වෙනවා. අධිකරණ කොමිසම හසුරුවන්න රාජ්‍ය සේවා කොමිසන් සභා හසුරුවන්න. මේ සියල්ල හසුරුවන්න ජනාධිපතිට පුළුවන් වෙනවා.

මොකද ඒ සෑම ආයතනයකම ප්‍රධානීන් පත් කිරීම සඳහා විස්සෙන් බලය එනවා. අනිවාර්යෙන්ම එතන ඉන්න කට්ටියට සිද්ධ වෙනවා මේ කට්ටිය සතුටු කරන්න ඔහුට ඕන විදියට වැඩ කරන්න. අතීතයෙත් එහෙම වුණා. 18 වැනි ව්‍යවස්ථා සංශෝධනය මේ රටට කළ විනාශය සහ එය ක්‍රියාත්මක වූ ආකාරය අපට හොඳට මතකයි. මේ හරහා ස්වාධීනව වැඩ කළ හැකි සේවය කළ නොහැකි තත්වයක් උදා වෙනවා.

තව පැත්තකින් විගණන කොමිසම අහෝසි කිරීම හරහා ජනාධිපතිවරයා අගමැතිවරයා යටතේ තිබෙන ආයතන ඒවා විගණනය කරන්නේ නැහැ. එතකොට මොනතරතම් වංචනික ක්‍රියා කළත් ඒවා හොයා ගන්න බැරි වෙනවා. ඉතිහාසය පුරාවටම මේ රට පාලනය කරපු පාලකයන්ට එවැනි චෝදනා එල්ල වෙලා තිබෙනවා.

සියයට පනහකට වැඩිය කොටස් රජයට තිබෙන ආයතන ඒ කියන්නේ ශ්‍රී ලංකා ගුවන් සේවය වැනි ආයතන, ටෙලිකොම් ආයතනය මේ වගේ ආයතන විගණනය කිරීමට නොහැකි වෙනවා. මේ ආයතනවල ප්‍රධානීන්ට මිලියන ගණනින් මාසික වැටුප් ලැබෙන ආයතන.

■ ආණ්ඩුවට ඉදිරි ගමන යන්න විසිවෙනි සංශෝධනය ඕනමයි කියලා ප්‍රකාශ කරනවා. එය සිදු කළ යුතුද?

අපි නැවත නැවතත් කියන්නේ ආණ්ඩුවට රට ඉදිරියට ගෙන යන්න විසිවැනි සංශෝධනය අවශ්‍ය නැහැ. මොකද 19 වැනි සංශෝධනය හොඳටම ඇති.

මොකද යහපාලන රජය සමයේදී සිදු වූයේ 19 අවුලක් නොවෙයි. අගමැති සහ ජනාධිපති ඉතා දුර්වල නිසා ඔවුන්ගේ ගැටලුව තුළ රට අස්ථාවර වුණු එක. විය යුතු දේවල් කිසිම ආකාරයකින් මේ දෙපාර්ශ්වයම සිදු කළේ නැහැ.

මොන ව්‍යවස්ථාවක් තිබ්බත් අන්තිමට ක්‍රියාත්මක කරන්න ඉන්න මැති ඇමතිවරු දුර්වල නම් ඒකෙන් වැඩක් වෙන්නේ නැහැ. දැන් ඒ ව්‍යවස්ථාවේ වරදක් නොවෙයි. ඒක ක්‍රියාත්මක කරන අයගේ වරද.

■ වර්තමාන රජය ප්‍රකාශ කරන්නේ 19 වැනි ව්‍යවස්ථා සංශෝධනයෙන් රටට සේවයක් සිදු වුණේ නැති බවයි?

දහනවයෙන් සේවයක් වුණා. සේවයක් නොවුණා කියනවා නම් ඒක පිළිගන්න බැහැ. නායකයන් දෙදෙනාගෙන් සේවයක් වුණේ නැහැ කියලා අපිත් පිළිගන්නවා. 2015 වෙනකම් සිදුවෙලා තිබුණු බොහෝ වැරදි අපි නිවැරැදි කළා. සෞඛ්‍ය, අධ්‍යාපන, කෘෂිකර්ම වැනි අංශවල ප්‍රගතියක් තිබුණා. හොඳම උදාහරණයක් තමයි “ළගම පාසල හොඳම පාසල“ කියන සංකල්පය ඉතා සාර්ථකව ඉදිරියට ගියා. ප්‍රවාහන, මහාමාර්ග සංවර්ධනය වුණා. ගම්පෙරළිය වැඩසටහන මගින් ජනතාවගේ ප්‍රශ්න ගැටලුවලට විසඳුම් ලැබුණා. ආණ්ඩුවෙන් වැඩක් වුණේ නැහැ කියන්න බෑ. අගමැති ජනාධිපති ඇතුළු ඇමතිවරු කිහිපදෙනෙකු නිසා තමයි ආණ්ඩුව අසමත් වුණේ.

■ ජනාධිපතිවරයා බලයට පැමිණිලා දැනට මාස දහයක් ගතවෙලා තිබෙනවා. ඔබ කියන විදියට ඔහු රටට සේවයක් කරලාම නැද්ද?

නැහැ. මගේ දැක්මට අනුව එහෙම කිසිම දෙයක් කරලා නැහැ. මැතිවරණයට පෙර ජනතාවට දුන් පොරොන්දු කිසිවක් වර්තමාන රජය ඉටු කරලා නැහැ. අද ජනතාවට ජීවත් වෙන්න බැරි තත්වයක් උදාවෙලා තිබෙන්නේ. භාණ්ඩ මිල සියල්ල ඉහළ ගිහිල්ලා. හරියාකාරව කුසට ආහාර වේලක් ගන්න අද ජනතාවට නොහැකිව ඉන්නවා. අපනයනය කිරීම නවත්වලා. වාහනවල ටයර් ගන්න බැහැ. ඇඳුම් පැලඳුම් ගන්න විදියක් නැහැ. ඒවා වෙළඳපොළ අඩුවෙලා. මෙය රටේ ආර්ථිකයට කෙලින්ම බලපානවා.

■ ජනාධිපතිවරයාගේ දැක්ම අනුව පිටරටින් ගෙන්වන බඩු භාණ්ඩ ආහාරපාන නවත්වලා ඒවා මෙරටදී නිෂ්පාදනය කරනවා කියන එකයි. ඒක වැරදිද?

ඔය කතාව සිදු කරන්න නම් මුලින්ම අපේ ආර්ථිකය ශක්තිමත් කර ගත යුතුයි. ඊට පස්සේ නැවැත්තුවාට කමක් නැහැ. පිටරටින් ගෙන එන උපකරණයක්, කෑමක් බීමක් එක සැරයට නතර කරලා පුළුවන්ද අපිට මුහුණ දෙන්න බැහැ. අපේ නිෂ්පාදනය වර්ධනය කරලා ඊට පස්සේ පිටරටින් ගෙන එන එක නැවැත්විය යුතුයි.

මොන ව්‍යවස්ථාවක් තිබ්බත් අන්තිමට ක්‍රියාත්මක කරන්න ඉන්න මැති ඇමතිවරු දුර්වල නම් ඒකෙන් වැඩක් වෙන්නේ නැහැ

හොඳම උදාහරණය කහ. දැන් මිනිස්සුනට කහ නැහැ. එක සැරයට කහ ගෙන්වන එක නැවැත්වුවා.

කහ මේ රට තුළ වගා කර රටට සෑහෙන ප්‍රමාණය නිෂ්පාදනය කිරීමෙන් පසු කහ ගෙන්වන එක නවත්වන්නට තිබුණා. අද කහ නැතිව ජනතාවගේ මුළුතැන්ගෙයි විශාල ගැටලුවක්. රජයට මේ පිළිබඳව විකල්පයක් නැහැ. ක්‍රමානුකූලවයි එය සිදු කළ යුත්තේ. දැනට නවත්වලා තිබෙන කිසිම දෙයක් මේ රටේ නිෂ්පාදනය වෙන්නේ නැහැ නේද? එකපාරටම කරන්නත් බැහැ. ටික කලක් යන්න වෙනවා.

■ මැති ඇමතිවරුන් නිරන්තරයෙන් ප්‍රකාශ කරනවා 20 වැනි සංශෝධනය තුනෙන් දෙකකින් සම්මත කර ගන්නවා කියලා. පුළුවන් වේවිද?

ඒක පිළිබඳව ඔවුන්ට ගැටලුවක් තිබෙනවා. මොකද ඔළුගෙඩි ගණන පිළිබඳව. නමුත් මේ දේශපාලනය පිළිබඳව අපිට නිශ්චිතව කියන්න බැහැ.

අපි දන්නවා පාර්ලිමේන්තු මන්ත්‍රීවරු මුදල්වලට අලෙවි වූ හැටි. අපට මතකයි. දින 51 ආණ්ඩුව පිහිටවන්න ගිය අවස්ථාවේ සල්ලි මලුවලට ඒ මේ අතට පැන්න මැති ඇමතිවරු ගැන රටේ ජනතාවට මතකයි. මේ රටේ දේශපාලනයේ දුර්වල අය ඉන්නවා. රජය සල්ලි දීලා හරි මන්ත්‍රීවරු ගනීවි කියලා හිතෙනවා. රජය එහෙම කරනවා කියන්නේ රට ගැන හිතලා නොවෙයි. ඔවුන් ගැන හිතලා කියන එක ජනතාව තේරුම් ගනීවි.

■ ඇමති මහින්දානන්ද අලුත්ගමගේ පාර්ලිමේන්තුවේදී ප්‍රකාශයක් කරනවා, සමගි ජන බලවේගය ඇතුළු විපක්ෂයේ මන්ත්‍රීවරු තිහක් තුනෙන් දෙක සඳහා සහයෝගය ලබා දෙනවා කියලා. ඇත්තක්ද මේ කියන්නේ?

මහින්දානන්ද අලුත්ගමගේ කියන්නේ කටට එන ඕන දෙයක් ප්‍රකාශ කරන කෙනෙක්. අපි ඔහුගේ කතා වැඩිය ගණන් ගත්තේ නැහැ. ඒක ඔහුගේ දවල් හීනයක් පමණක් බව මම පැහැදිලිව ප්‍රකාශ කරනවා.

පුද්ගලිකව එක් අයෙක් දෙදෙනෙක් ගනිද කියන එක පිළිබඳව අපට සැකයක් තිබෙනවා. මන්ත්‍රීවරු ඔය ආකාරයට පිල්මාරු කිරීම මේ රටේ දේශපාලනය තුළ සාමාන්‍ය දෙයක්. නමුත් සමගි ජන බලවේගයේ අපේ මන්ත්‍රීවරුන් කණ්ඩායම ඉතා දක්ෂ කැපවීමෙන් වැඩ කරන හොඳ අධිෂ්ඨානයකින් යුතුව අපි එක්ක ඉන්න අය. මේ නිසා ඔවුන් පිළිබඳව අපට දැඩි විශ්වාසයක් තිබෙනවා.

■ වර්තමාන රජය පිළිබඳව ඔබගේ හැඳින්වීම?

වර්තමාන රජය කියන්නේ මෑත ඉතිහාසය තුළ අසාර්ථකම රජයක් බව පැහැදිලිව කිව යුතුයි. අද ජනතාවගේ ජීවන වියදම ඉතා ඉහළ ගිහිල්ලා තිබෙනවා. ජනතාව විශාල පීඩනයකට අනුවෙලා තිබෙනවා. ආණ්ඩුව සංවර්ධනයක් කරා කිසිසේත්ම ගමන් කරන්නෑ කියන එක අද ජනතාවත් පිළිගන්න කාරණයක්.

නමුත් මේ අය ලෝකයාට ණය වෙනවා. නොයෙක් චක්‍රලේඛ ගෙන එමින් නීති විරෝධී කටයුතු වලට මහජනතාවට දොර අරිනවා. උදාහරණයක් ලෙස කිවහොත් වැලි ගෙන යෑම සඳහා අවසර පත්‍ර නිකුත් කිරීම. රටේ ලඳු කැලෑවල වවන්න අවසර දීලා. මේ තුළින් සිද්ධ වෙන්නේ රටේ සම්පත් විනාශ වීමක්. රට සංවර්ධනය කිරීමක් අප දකින්නේ නැහැ.

■ මහ බැංකු කොල්ලය; එසේත් නැත්නම් බැදුම්කර වංචාව ඇතුළු හොරු අල්ලනවා කියලා රජය ප්‍රකාශ කළත් එය එසේ සිදු වෙන්නේ නැති බවට ඔබලා චෝදනා කරනවා නේද?

ඔව්. අපි විතරක් නොවෙයි. අද ජනතාවත් මේ පිළිබඳව රජයට චෝදනා එල්ල කරනවා; මේ අය අල්ලන හොරු නැහැ කියලා. මහමැතිවරණය, ජනාධිපතිවරණය මේ දෙකේදීම වර්තමාන රජය, ජනාධිපතිවරයා දිගින් දිගට ම වේදිකාවල ප්‍රකාශයට පත් කළා. බලයට පැමිණි විගසම සිදු කරන්නේ මහ බැංකු කොල්ලයට සම්බන්ධ අය, වංචා දූෂණ තිබෙන අය නීතියට ගෙන එනවා කියලා. අපි රජයෙන් අහන්න ඕන කෝ හොරු කියලා.

කාලයක් තිස්සේම මෙවැනි වංචා සිදුවෙලා තිබෙනවා. මොවුන් මේ ක්‍රියාදාමය සිදු කරන්නේ නැහැ. එය නවත්වා දානවා.

මේ අයගේ ලොකු ඩීල් තිබෙනවා. කවදාවත්ම අත්අඩංගුවට ගන්නේ නැහැ. ජනතාව රැවැට්ටීමක් තමයි සිදු කරන්නේ. මේවා වේදිකාවල කියපු බොරු.

රිෂාඩ් බදුර්දීන් මන්ත්‍රීවරයාට දිගින් දිගටම පහර ගැහුවා. ඔහුව අත්අඩංගුවට ගන්න අපේ රජය කටයුතු කළේ නැහැ කියලා. ඔහුගේ මල්ලී අත්අඩංගුවට අරගෙන දිගට ම ඔහුට චෝදනා එල්ල කළා. දැන් මේ අය වෙන කතාවක් කියනවා. මේ දෙදෙනාටම එරෙහිව චෝදනා නැහැ කියලා. චමල් රාජපක්ෂ ඇමැතිවරයා පාර්ලිමේන්තුවේදී මේ බැව් ප්‍රකාශ කළා.

■ ඔබ හිටපු යුද හමුදාපතිවරයෙක්. ඔබට දැනෙන විදියට පාස්කු ප්‍රහාරය සහ එහි පරීක්ෂණ පිළිබඳව අදහස?

පාස්කු ප්‍රහාරය වළක්වාලන්නට තිබුණා. අපි මීට වඩා දරුණු ත්‍රස්තවාදීන් සමග සටන් කරලා මේ රට බේරා ගත්තේ. ජනාධිපති මෛත්‍රීපාල, අගමැති රනිල් මේ අය හරියට ක්‍රියා කළා නම් පාස්කු ප්‍රහාරයක් සිද්ධ වෙන්නේ නැහැ.

ඇත්තටම 2014 වසරේදී මේජර් ජනරාල් ලාල් පෙරේරා සහරාන් ගැන කරුණු සොයාගෙන ඔහුට අවවාද කරලා තිබෙනවා. මේ සම්බන්ධව ඒ ආණ්ඩුව කාලයෙත් මීට වඩා හොයන්න තිබ්බා.

යහපාලන ආණ්ඩුව කාලේ මේ සම්බන්ධව ක්‍රියා කරලාම නැහැ. සහරාන්ලා පිළිබඳව අපගේ බුද්ධි අංශ ආරක්ෂක අංශ තොරතුරු සොයාගෙන ඒ සම්බන්ධව අදාළ අංශ වෙත රාජ්‍ය නායකයන් වෙත කරුණු දක්වා තිබෙනවා. නමුත් ඒ සම්බන්ධව කිසිම ක්‍රියාමාර්ගයක් අරගෙන නැහැ කියන එක පැහැදිලියි.

නීති අංශ වෙත පොලිසියේ අදාළ අංශ වෙත මේ බැව් පෙන්වා දී තිබුණා. එම ආයතන ක්‍රියාත්මක වෙලා නැහැ. එවකට පොලීසිය භාරව සිටි ඇමතිවරයා සාගල රත්නායක, පසුව ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මේ කිසිම ඇමතිවරයෙක් මේ ප්‍රහාරය සහ ත්‍රස්තවාදීන් සම්බන්ධව කිසිම පියවරක් අරගෙන නැහැ.

පසුව සහරාන්ගේ ප්‍රහාරය පිළිබඳව තොරතුරු ආවමත් ආරක්ෂක කවුන්සලයේදී වචනයක්වත් මේ ගැන කතා කරලා තිබුණේ නැහැ. මෛත්‍රීපාල ජනාධිපතිවරයා අගමැති රනිල් වික්‍රමසිංහට මේ කවුන්සිලයට එන්න දුන්නේ නැහැ කියා ඔහු නිකන් හිටියා. රාජ්‍ය ආරක්ෂක ඇමති, පොලිස්පති මේ අයත් කවුන්සිලයට එන්න දෙන්නේ නැති බව කියමින් නිකං හිටියා.

අනෙක් කාරණය තමයි මේ ප්‍රහාරය පිළිබඳව දිනය, වේලාව, තැන සියල්ල කලින් දැන දැනත් මොවුන් නිකං හිටියා කියන එක ඉතාම පැහැදිලියි. සහරාන්ට මේ ආකාරයට සූදානම් වෙන්න සහය ලබා දුන් පිරිසක් වෙනම ඉන්නවා. මේ ප්‍රහාරය සිදු වන බව දැන දැනත් ඒ සම්බන්ධව ක්‍රියා නොකළ පුද්ගලයන් පිරිසක් වෙනම ඉන්නවා. මේ කණ්ඩායම් දෙකම මෙහි වගකීම බාර ගත යුතුයි. ඒ වගේම මේ කණ්ඩායම් දෙකම මේ සඳහා සෘජු ව වගකීම බාර ගත යුතුයි. ඒ වගේම මොවුන්ට නිසි දඬුවම් ලබා දිය යුතුයි.

■ මේ ප්‍රහාරය එල්ල වන විට ඔබ පැවැති රජයේ ඇමතිවරයෙක් ඔබට මේ සම්බන්ධව ක්‍රියාත්මක වීමට නොහැකි වූයේ ඇයි? ඔබ මේ පිළිබඳව දැන සිටියාද?

ක්‍රියාත්මක වෙන්න විදියක් නැහැ. අපිට ලබාදී තිබූ අමාත්‍යාංශ අනුව, ඇත්තටම මේ පිළිබඳව පෙර තොරතුරු මා හට ලැබුණේ නැහැ. අප දැන සිටියෙත් නැහැ. මොකද මේ පිළිබඳව දැන සිටි අය වචනයක්වත් එළියට දාලා තිබුණේ නැහැ.

අපේ නිෂ්පාදනය වර්ධනය කරලයි පිටරටින් භාණ්ඩ ගෙන එන එක නැවැත්විය යුත්තේ

විශේෂයෙන් ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන ඒ රජය පැවති සමයේ ආරක්ෂක කටයුතු, නීතිය සහ සාමය පිළිබඳව කටයුතු වලට මාව කිසිසේත් සම්බන්ධ කර ගන්නේ නැහැ. එහෙම සම්බන්ධ වෙලා තිබුණා නම් මේ ප්‍රහාරය වෙන්න ඉඩ තියන්නෙත් නැහැ.

ඔහු ජනාධිපති වශයෙන් තේරී පත්වන විට මම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් නොවෙයි; පක්ෂයක නායකයෙක් විතරයි. මගෙන් ඇහැව්වා තානාපතිකමක් හරි වෙන මොනවා හරි තනතුරක් ඕනද කියලා. මම කීවා මට තනතුරු එපා. මාව ආරක්ෂක උපදේශකවරයකු වශයෙන් පත් කරන්න කියලා. ඔහු එය සිදු කළේ නැහැ. මම දෙවතාවක් මතක් කළා. ඔහු එය මඟ හැරියා. ඒ පත්වීම වුණා නම් මම මේ ප්‍රහාරයට ඉඩ තියන්නේ නැහැ.

■ සමගි ජන බලවේගය අසමගි වෙලා කියනවා. ඇත්තක්ද මේ කතාව?

නැහැ. සම්පූර්ණ බොරුවක්. අපගේ කණ්ඩායමේ එවැනි කිසිම ගැටලුවක් නැහැ. සමගි ජන බලවේගය හැටියට ඉතා ශක්තිමත්ව වැඩ කරනවා. වර්තමානයේ විපක්ෂයේ තිබෙන ප්‍රබලම බලවේගය තමයි අපි. අපි ඉතා ඉක්මණින් විකල්ප රජය පිහිටුවනවා. 2023 - 2024 වන විට අපට අපගේ රජයක් පිහිටුවිය හැකි බව විශ්වාසයි. ඒ පිළිබඳව කිසිම ගැටලුවක්, කිසිම ප්‍රශ්නයක් නැහැ. අසමගි වෙන්න කිසිම හේතුවක් නැහැ.

තවත් කාරණයක් තමයි. එක්සත් ජාතික පක්ෂයේ අප සිටින අවස්ථාවේ අවුල් සහගත චරිත, දූෂිත දේශපාලන චරිත අපගෙන් ඉවත් කරලා; ඉවත් වෙලා තිබෙනවා. අපිට කිසිම ගැටලුවක් දැන් නැහැ. පිරිසිදු නායකයෙක් සහ පිරිසිදු පිරිසක් අපිට ඉන්නවා. මේ නිසා අපිට ජනතාවගේ සිත් දිනා ගනිමින් පියවරෙන් පියවර ඉදිරියට යා හැකියි. අපි ඒ ගමන අද ආරම්භ කරලා තිබෙනවා.

■ නමුත් ඔබලා සමඟ සිටින පක්ෂ කිහිපයක්ම සන්ධානයක් පිළිබඳව කතා කරනවා නේද?

ජාතික පක්ෂ මැතිවරණයේදී අප සමග එක්ව තරග කළා. ඔවුන් මැතිවරණයට පැමිණියේ සමගි ජන බලවේගය පක්ෂයෙන්. ඉදිරියේදී ඔවුන් අප සමග එක්වන්නේ සමගි ජන බල පෙරමුණ හැටියට. මේක විශේෂත්වයක් නොවෙයි.

■ සමගි ජන බලවේගයේ සංවිධාන කටයුතු කෙසේද?

අපි දැනට සංවිධාන කටයුතු වෙනුවෙන් දැවැන්ත වැඩසටහනක් ක්‍රියාත්මක කර තිබෙනවා. එය දිස්ත්‍රික්ක මට්ටමින් ඉකුත් සති තුනේ සිද්ධ වුණා. අපි සති අන්ත තුන දිස්ත්‍රික් හයක් ආවරණය වන විදියට කමිටු සංවිධානය කරා. එය ඉදිරි සතිවලත් ශ්‍රී ලංකාවම ආවරණය වන පරිදි සිදු කරනවා. ඡන්ද පෙට්ටි මට්ටමින් මෙය සිදු කරනවා. මෙම ක්‍රියාවලියේ නිලතල දරන්නන් හත්දෙනෙක් සිටිනවා. කමිටු සාමාජිකයන් විසි පස්දෙනකු සිටිනවා. ඉතා ශක්තිමත්ව මෙම ක්‍රියාවලිය සිදු කරනවා. ශාඛා සමිති සෑදීමත් ඉදිරියේදී සිදු කරනවා. ග්‍රාම සේවා මට්ටම් ප්‍රාදේශීය සභා මෙන්ම පළාත් මට්ටමින් මේවා ක්‍රියාත්මකයි.

■ පළාත් සභා මැතිවරණය පැවැත්විය යුතුද? නැද්ද?

අනිවාර්යෙන්ම පැවැත්විය යුතුයි. මොකද මේ තුළින් දෙවන දේශපාලන පෙළක් මේ රටේ බිහි වෙනවා. එය ඉතා වැදගත් දෙයක්. පාර්ලිමේන්තුව පැමිණිය නොහැකි වුණත් බුද්ධිමත් තවත් තරුණ පරම්පරාවක් සිටිනවා. ඔවුන්ට පළාත් සභාව නියෝජනය කරමින් දේශපාලන අත්දැකීම් ලබා පසුව පාර්ලිමේන්තුවට පැමිණිය හැකියි. නමුත් පළාත් සභා ක්‍රමය තුළ අහිතකර කරුණු දෙකක් අපි හැමදාම පෙන්වා දෙනවා. ඉඩම් සහ පොලිස් බලතල පළාත් සභාවලට ලබා දිය යුතු නැහැ. එය අනිවාර්යෙන්ම ලබා නොදිය යුතුයි. පළාත් සභා වලට රජයෙන් අමතර වියදමක් දැරීමට සිදු වුණත් බලය විමධ්‍යගත කිරීමක් මෙහිදී සිදු වෙනවා.

■ එක්සත් ජාතික පක්ෂය නව මගකට ගමන් කරමින් තිබෙනවා. එම පක්ෂය සමගි ජන බලවේගය සමඟ සම්බන්ධ වීමට කැමැත්ත ප්‍රකාශ කර තිබෙනවා. ඔබ එකඟද?

ඒ පක්ෂය අවශ්‍ය නැති නිසා තමයි අපි කණ්ඩායමක් අද වෙනම එකතු වෙලා සමගි ජන බලවේගය නමින් මැතිවරණය ජයග්‍රහණය කළේ. එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරපු මන්ත්‍රීවරුන් ඇමතිවරුන් පහළොස් දෙනෙකුට වැඩි පිරිසක් එම පක්ෂයෙන් මැතිවරණටය ඉදිරිපත් වෙලා පරාජය ලැබුවා. ඒ අතර තමයි වංචනිකයන් හොරුන් සිටින්නේ. ජනතාව ඔවුන් ප්‍රතික්ෂේප කරලා තිබෙනවා.

ජනපති කැඳවූ හදිසි රැස්වීමේදී මොකද වුණේ?

"කොවිඩ් - 19" උවදුර ලෝකයම වෙළාගත් මොහොතක ශ්‍රී ලාංකික ජාතියේ ශක්තිමත් බව විදාහලමින් අපි එය මර්දනය කරමු." "අද වන විට කොවිඩ් 19 නැවත අප රට තුළ හිස ඔසවා ඇත. පෙර සේම අපගේ සෞඛ්‍ය ආරක්ෂක සහ අනෙකුත් සේවා අංශ මෙම උවදුරෙන් අප බේරා ගැනීම සඳහා සියලු කටයුතු සිදු කරනු ලබයි."

"මේ අභියෝගාත්මක අවස්ථාවේදී සෞඛ්‍ය බලධාරීන් විසින් ලබාදී ඇති උපදෙස් පිළිපදින ලෙසත් ඇතැම් පාර්ශවයන් විසින් බෙදා හරිනු ලබන අසත්‍ය ප්‍රචාරවලට නොරැවටී පිළිගත හැකි රාජ්‍ය තොරතුරු ලබාගන්නා ලෙසත් ඉල්ලමි."

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂයන් මෙම සටහන ඉකුත් බ්‍රහස්පතින්දා (08) සිය ෆේස්බුක් සමාජ පිටුවට එක්කර තිබුණි.

ජනාධිපතිවරයා මෙම ඉල්ලීම කිරීමට හේතු වූයේ ගම්පහ දිස්ත්‍රික්කය මූලික කර ගනිමින් ඇතිවූ කොවිඩ් 19 වසංගතය යළි පැතිරයාමේ අවදානම් තත්වය හා ඒ පිළිබඳව සමාජ මාධ්‍ය ඔස්සේ අසත්‍ය ප්‍රචාර රැසක් සංසරණය වීමයි.

කොරෝනා මර්දනයට ජනපති පෙරමුණ ගනී

'බැරන්ඩෙක්ස්' ආයතනයේ මිනුවන්ගොඩ පිහිටි කර්මාන්ත ශාලාවක සේවක සේවිකාවන් කොරෝනා රෝගයට ගොදුරු වී ඇති බව තහවුරු වීමත් සමඟ ඉකුත් සඳුදා (05) ජනාධිපතිවරයා මෙය මර්දනය කිරීම සඳහා කටයුතු කිරීමේ මෙහෙයුම පිළිබඳව හදිසි සාකච්ඡාවක් කැඳවා තිබුණි.

ඒ අනුව යුද හමුදාපති ලුතිනන් ජනරාල් ශවේන්ද්‍ර සිල්වා, සෞඛ්‍ය ඇමතිනි පවිත්‍රා වන්නිආරච්චි, හමුදා ප්‍රධානීහු සහ සෞඛ්‍ය ක්ෂේත්‍රයට සම්බන්ධ අනෙකුත් නිලධාරීහු මෙම සාකච්ඡාවට එක්වූහ. ඔවුන් සාකච්ඡාවට පැමිණෙන විටත් ජනාධිපතිවරයා ඊට අදාළ සියලු වාර්තා අධ්‍යයනය කර තිබුණි.

කොවිඩ් මර්දන ජනාධිපති කාර්ය සාධක බළකායේ සාමාජිකයින් සහ සෞඛ්‍ය බලධාරීන් සමඟ සාකච්ඡාව ආරම්භ කරමින් ජනාධිපතිවරයා යුද හමුදාපති ශවේන්ද්‍ර සිල්වා දෙස බලා.

"ඔබට ලැබී තිබෙන තොරතුරු කොහොමද? බුද්ධි අංශ තවත් වැඩි කරන්න. මෙය පැතිරෙන ක්‍රමවේදයන් ටික අපි වහාම නතර කළ යුතුයි."

"ජනාධිපතිතුමනි මේ වන විට අපි අදාළ ස්ථානවලට ඔවුන්ව යොදවා තිබෙනවා. දැනට හඳුනා ගෙන සිටින රෝගීන් විසින් ඇසුරු කළ හා ඔවුන් ගමන් බිමන් ගිය ස්ථාන මේ සියල්ල පිළිබඳව තොරතුරු රැස් කරමිනුයි සිටින්නේ." හමුදාපතිවරයා පිළිතුරු ලබා දුන්නේය.

"කොවිඩ් මර්දනයට රජය දී තිබූ උපදෙස් පිළිපැදීම ජනතාව කාලයත් සමඟ අමතක කර තිබූ නිසා රෝගය මෙලෙස ව්‍යාප්ත වුණා." යැයි මෙහිදී සෞඛ්‍ය ඇමතිනි පවිත්‍රා දේවි වන්නිආරච්චි සඳහන් කළාය. මේ සඳහා එක්ව සිටි වෛද්‍යවරු ඇතුළු සෞඛ්‍ය බලධාරීහු රෝග ව්‍යාප්තිය පිළිබඳව කරුණු රැසක් පෙන්වා දුන්හ.

කොරෝනා වයිරසයේ නව ව්‍යාප්තිය පාලනය කිරීම සඳහා රැස්වීමේදී තීරණ රැසක් ගනු ලැබීය.

පී.සී.ආර්. පරීක්ෂණ සංඛ්‍යාව වැඩි කිරීම, ආසාදිතයන් ඇසුරු කළ සහ ඔවුන් ගැවසුණු තැන්වල පුද්ගලයන් නිරෝධායනය කිරීම මෙන් ස්වයං නිරෝධායනයට යොමු කිරීම මෙහිදී ගත් තීරණ කිහිපයකි.

කලින් අවස්ථාවේ කොවිඩ් මර්දනය සඳහා විශාල කාර්යභාරයක් ඉටු කළ ආරක්ෂක හමුදා, පොලිසිය, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් සහ සෙසු සෞඛ්‍ය සේවකයන් ගැන මෙහිදී ජනාධිපතිවරයා මහත් ප්‍රසාදයෙන් කතා කළේය. එමෙන්ම උද්ගතව ඇති වර්තමාන තත්වය තේරුම් ගෙන වසංගත තත්වය මර්දනය කිරීම සඳහා සහය වීම ජනතාවගේ මෙන්ම ජනමාධ්‍යයන්ගේ වගකීමක් බවද හෙතෙම අවධාරණය කළේය.

ජනාධිපති මාධ්‍ය ඒකකයේ ලිපි ශීර්ෂයන් යොදා ගනිමින් දිවයින පුරා ඇඳිරි නීතිය ක්‍රියාත්මක බවට ව්‍යාජ ප්‍රවෘත්තියක් නිර්මාණය කර සමාජ මාධ්‍ය වෙත මුදා හැර තිබුණි. ඒ සම්බන්ධයෙන් දහඅට හැවිරිදි තරුණයෙක් මීටියාගොඩ ප්‍රදේශයේදී අපරාධ පරීක්ෂන දෙපාර්තමේන්තුව ඉකුත් (08) වැනිදා අත්අඩංගුවට ගනු ලැබිණි.

ඉකුත් 05 වැනිදා ජනාධිපති මාධ්‍ය අංශයේ ලිපි ශීර්ෂය යොදාගෙන විදෘත් මාධ්‍ය ආයතනයක ලාංඡනය උපයෝගී කර ගනිමින් මෙම ව්‍යාජ ලිපිය සකස් කර එය සමාජ මාධ්‍ය වෙත හැර තිබුණි.

යුරෝපා සංගම් තානාපති හකීම් හමුවූයේ ඇයි?

මේ සම්බන්ධව වහාම ක්‍රියාත්මක වූ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සැකකරු අත්අඩංගුවට ගනු ලැබීය.

20 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ගැන විජයදාස රාජපක්ෂ මන්ත්‍රීවරයා අමුතු ප්‍රකාශයක් කර සිටියේය.

එය රජය වෙත දැඩි බලපෑමක් එල්ල කරමින් දේශපාලන කරළිය තුළ පැතිරී ගියේය.

මේ සම්බන්ධව රජයේ මැති ඇමතිවරු මෙන්ම ඉහළම නායකයෝද දැඩි කලබලයකට ද පත්වූහ. මේ සම්බන්ධව ආණ්ඩුවට ගැටලුවක් නොමැති බව විදහා පෙන්වීමට රජයේ ඇමතිවරු ද අදහස් ප්‍රකාශ කිරීමට වගබලා ගත්හ.

යුරෝපා සංගමයේ කොළඹ තානාපතිවරයා මුස්ලිම් කොංග්‍රසයේ ප්‍රධාන කාර්යාලයට ගියේය. කොළඹ කොම්පඤ්ඤවීදියේ පිහිටි දරුසලාම් ප්‍රධාන කාර්යාලයේදී හකීම් සහ යුරෝපා සංගමයේ තානාපතිවරයා පැය එකහමාරක පමණ විශේෂ සාකච්ඡාවක නිරත වූහ.

රවුෆ් හකීම් මන්ත්‍රීවරයා කොළඹ පිහිටි කුවේට් මහකොමසාරිස්වරයාගේ නිල නිවසට ගියේය. එහිදී ඔහු සිය ශෝකය ප්‍රකාශ කරනු ලැබුවේ කුවෙට්හි රජතුමාගේ මරණය සම්බන්ධයෙනි.

20 වෙනුවෙන් ජවිපෙ එළියට යයි

20 වැනි ආණ්ඩුක්‍රම සංශෝධනය සම්බන්ධයෙන් ජනතා විමුක්ති පෙරමුණ අලුත්ම මතයක් දරනු ලබයි. මෙහිදී එම පක්ෂයේ මතය වී ඇත්තේ නීතිමය ක්‍රියාමාර්ගවලට එහා ගිය වෙනත් ක්‍රමවේදයකි.

මේ සඳහා ඔවුහු ජනතාව අතරට ගොස් මෙය එළිමහනේදී විසඳීමට කටයුතු කරමින් සිටිති. ජනතා විමුක්ති පෙරමුණ ඉකුත් සතිය පුරාවටම 20ට

සජිත් පාර්ලිමේන්තු කණ්ඩායම් රැස්වීමේදී කොරෝනා ගැන විශේෂ කරුණු හෙළි කරයි



එරෙහිව ජනතාව දැනුම්වත් කිරීමට සම්මන්ත්‍රණ මාලාවක් ක්‍රියාවට නැංවීය. නමුත් කොරෝනා අවදානම හේතුවෙන් සමහර සම්මන්ත්‍රණ පැවැත්වීමට නොහැකි විය.

මේ අතර පාර්ලිමේන්තුවේදී සෞඛ්‍ය ඇමතිවරිය සම්බන්ධව දැඩි කතාබහක් ඇතිවෙමින් උණුසුම්කාරී තත්වයක් ඇතිවුණි. ගම්පහ දිස්ත්‍රික්කයම කොරෝනා වසංගතයෙන් වෙළී යන මොහොතක සෞඛ්‍ය ඇමතිනිය පාර්ලිමේන්තුවේ නොසිටීම එයට හේතු විය.

විපක්ෂයේ මන්ත්‍රීවරු කෑකෝ ගසමින් ඉකුත් බදාදා ඇමතිනි පවිත්‍රා වන්නිආරච්චි පාර්ලිමේන්තුවට නොපැමිණෙන්නේ මන්දැයි විමසා සිටියේය.

"මගේ පියාගේ දානමය පිංකමක් තිබුණා. ඒ නිසා මට පාර්ලිමේන්තුවට එන්න බැරි වුණා. ඒ සම්බන්ධව මම සියලු දෙනානේ සමාව ඉල්ලනවා."

හැබැයි මා සැඟව සිටියේ නැහැ. අනික අපිට කිසිම දෙයක් හංගන්න අවශ්‍යත් නැහැ. අවශ්‍ය දේ අවශ්‍ය වෙලාවට අපි සිදු කරනවා. කොරෝනා සම්බන්ධව අපි සත්‍ය තොරතුරු ඉදිරිපත් කරනවා පමණක් නොවෙයි. දැනට උද්ගත වී තිබෙන වසංගත තත්වය ඉක්මණින්ම පාලනය කරන්න කටයුතු කරනවා යැයිද ඇය කීවාය.

"ඉකුත් සතිය පුරාවටම අංශ ගණනාවක් සමඟ සෞඛ්‍ය ඇමතිනිය සාකච්ඡා පැවැත්වූවාය. ඇය ඉතා කාර්යබහුල වී සිටින අතර සමහර දිනයන්හී පැය දෙක තුනකට වඩා කාලයක් ඇයට නිදා ගැනීමට නොහැකි වී ඇත. ඒ ඇය කොරෝනා වසංගතය ඉක්මණින් අවසන් කිරීමේ භාරදූර්ය කාර්යේ ප්‍රධාන කොටස් කාරියක්ව ඇති නිසාවෙනි.

ගම්පහ අඩුපාඩු ගැන ජනපති-අගමැති විමසයි

මේ අතර ප්‍රසන්න රණතුංග ඇමතිවරයාගේ ජංගම දුරකථනයට දිගින් දිගටම ඇමතුම් ලැබෙන අතර එම ඇමතුම් ලබා දෙන්නන් අතර ජනාධිපති ගෝඨාභය රාජපක්ෂයන්, අගමැති මහින්ද රාජපක්ෂයන් මෙන්ම ආරක්ෂක ලේකම්, යුද හමුදාපති ඇතුළු රාජ්‍ය නිලධාරිහු රැසක්ම වෙයි.

"ප්‍රසන්න ඇඳිරි නීතිය ක්‍රියාත්මක වන ප්‍රදේශවල ජනතාවට අත්‍යවශ්‍ය භාණ්ඩ ලබාදීම ක්‍රමවත් වැඩපිළිවෙළක් යටතේ අඛණ්ඩව සිදු කළ යුතුයි. නිතර ඒ පිළිබඳව සොයා බලන්න." යැයි ජනාධිපති ගෝඨාභය රාජපක්ෂයන් කීය.

"සර් ඒකට මම දැනටමත් වැඩපිළිවෙළක් ලෑස්ති කරලයි තියෙන්නෙ. අපි ඒ හැමදෙනාටම අවශ්‍ය දේ ලබා දෙන්න කණ්ඩායම් යොදවලා තිබෙන්නේ." ඇමති ප්‍රසන්න ජනාධිපතිවරයාගේ දුරකථන ඇමතුමට පිළිතුරු ලබා දෙමින් කියා සිටියේය.

ප්‍රසන්න දැන් ලෙඩ්ඩු ප්‍රමාණය වැඩි වෙනවා නේද? මේ නිසා ඒ ගෙවල්වල අය නිරෝධායනයට ලක්කරනවා. ඒ නිසා අපි ඒ අයගේ අත්‍යවශ්‍ය සේවා ලබා දෙන්න ඕන. පරිස්සමින් කරන්නත් ඕන. ඔයාට ඕක කරන්න පුළුවන්. අවශ්‍ය ඕනම දෙයක් කියන්න යැයි අගමැතිවරයා දුරකථන ඇමතුමක් දෙමින් ප්‍රසන්න ඇමතිවරයාට පැවසීය.

"සර් කිසි ගැටලුවක් නොවෙන්න දැනට වැඩ ටික කරගෙන යනවා. හමුදාවේ කොල්ලො ටික වැඩේ අකුරටම කරනවා" යැයි ප්‍රසන්න ඇමතිවරයා පිළිතුරු දෙමින් පැවසීය.

අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතාට ද උත්සව කිහිපයක් තිබූ අතර එම උත්සව මෙන්ම සාකච්ඡා අඩු කර ඒ වෙනුවට කොවිඩ් වසංගතය සම්බන්ධව සිදු කළ සාකච්ඡා රැසකට සහභාගි වීමට අගමැතිවරයා පියවර කටයුතු කළේය.

රුවන්ගේ රැස්වීම් ඉදිරියට

එක්සත් ජාතික පක්ෂය ඉකුත් සතියේ ඔවුන් සංවිධානය කර තිබූ වැඩසටහන් රාශියක් අවලංගු කිරීමට පියවර ගනු ලැබීය.

නියෝජ්‍ය නායක රුවන් විජේවර්ධන දිවයිනට ආවරණය වන පරිදි ජන හමුවීම් රැසකට සහභාගි වීමට තිබුණත් ඒ සඳහා ද වෙනත් දින යොදා ගැනීමට කටයුතු කරනු ලැබීය. ඒ කොරෝනා වසංගතය හේතුවෙනි.

සමගි ජන බලවේගයේ පාර්ලිමේන්තු කණ්ඩායම් රැස්වීම මේ සතියේත් පැවැත්වුණේ පාර්ලිමේන්තු කමිටු ශාලාවකදීය. එහිදී ආණ්ඩුවේ ක්‍රියා කලාපය පිළිබඳ මෙන්ම කොරෝනා යළි මතුවීම පිළිබඳ දීර්ඝ ලෙස අදහස් හුවමාරු විය.

"දැන් රට යළිත් අවදානමකට ලක්වෙලා තියෙන්නේ. මේ ගැන අවධානය යොමු කළ යුතුයි" විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස කරුණු දැක්විය.

"ඔබතුමා කොරෝනා පළමු රැල්ල ඇති වෙන්න කලින්ම පාර්ලිමේන්තුවේදී මේ ගැන අවධානය යොමු කළා. ඒත් ආණ්ඩුව ඒ ගැන ප්‍රමාණවත් අවධානයක් යොමු කළේ නෑ. ඒ නිසා රට මාස ගණනාවක් වසා දැමීමට සිදුවුණා. දැන් දෙවැනි රැල්ලත් එන්න පටන් අරගෙන තියෙනවා. මෙවරත් ආණ්ඩුව මේ ගැන අවධානයක් යොමු කරන්නේ නෑ" ජේ.සී. අලවතුවල මන්ත්‍රීවරයා කීවේය.

හරින් ප්‍රනාන්දු මන්ත්‍රීවරයා මෙහි පැමිණියේ පාර්ලිමේන්තු කණ්ඩායම් රැස්වීම පැවැත්වෙමින් තිබෙන අතරවාරයේදීය. ඔහු පැමිණීමත් සමඟ 'දිනමු' රැස්වීම් මාලාව ගැන අවධානය යොමු කරන්න විය. සති අන්ත තුනකදී දිස්ත්‍රික්ක හයක් ආවරණය කරමන් දිනමු කමිටු රැස්වීම් පවත්වා තිබුණි. මෙය ඉදිරියට ගෙන යන ආකාරය ගැන ඔවුන්ගේ අවධානය යොමු විය.

"මන්ත්‍රීවරු සති අන්ත තුනකදී රැස්වීම සිය ගණනක් කරලා තරමක් තෙහෙට්ටුවෙන් ඉන්නේ. ඒත් මේක සාර්ථක නිසා හැමෝගෙම මහන්සිය නැතිවෙලා තියෙන්නේ." හරින් කීවේය.

"අපි මුලින්ම මිනිස්සුන්ගේ ජීවිත ගැන අවධානය යොමු කරන්න ඕන. ඒ නිසා 'දිනමු' කමිටු රැස්වීම් කල් දාලා මීට වඩා වැඩි ජවයකින් ඉදිරියට යමු" සජිත් කීවේය. මේ හා සමගාමීව විපක්ෂ නායකවරයා විහාරස්ථාන කේන්ද්‍ර කරගෙන පවත්වන රැස්වීම් මාලාවද සති කිහිපයකට කල් දැමීමට තීරණය විය.

කොරෝනා අවදානම අතරවාරයේදී 20 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ඉදිරියට ගෙන යාමට ආණ්ඩුව ගන්නා උත්සාහය ගැනත් සියලු දෙනාගේම අවධානය යොමුවී තිබුණි. 20 වැනි සංශෝධනය නිසා විගණනයට කිසිදු බලපෑමක් නොවන බ වට අගමැතිවරයා ඉදිරිපත් කර තිබූ නිවේදනය ගැනත් මන්ත්‍රීවරුන්ගේ අවධානය යොමුව තිබුණේය.

"විමල් වීරවංශ මන්ත්‍රීවරයා විගණනය අවශ්‍යයි. විගණන කොමිසම අවශ්‍යයි කියලා කියනවා. ඒක කියලා ලියුමකුත් දාලා තියෙනවා. හැබැයි ඒ ලියුමට හැරෙන තැපෑලෙන් අගමැතිවරයා නිවේදනයක් නිකුත් කරලා විගණන කොමිසම අවශ්‍ය නැති බව කියලා තියෙනවා. ආණ්ඩුවේ බෙදීමක් තියෙන බව මේවාගෙන් හොඳටම පැහැදිලි වෙනවා. ඒවගේම ආණ්ඩුවේ ඉන්න ව්‍යවස්ථා විශාරදයෙක් වන විජයදාස රාජපක්ෂයන් ජනාධිපතිවරයාට ලිපියක් යොමු කරමින් 20 වැනි සංශෝධනයට විරෝධය දක්වලා. ඒ විතරක් නෙමෙයි. මේක මහා භයානක සංශෝධනයක් බවත් කියලා තියෙනවා." මනුෂ නානායක්කාර මන්ත්‍රීවරයා කීවේය.

"සත්‍ය වසන් කරමින් මහජනතාව නොමඟ යැවීමට ව්‍යාජ තොරතුරු ඉදිරිපත් කරමින් මාධ්‍ය නිවේදනයක් නිකුත් කර තිබෙනවා. රාජ්‍ය විගණනය සම්බන්ධයෙන් කරුණු ඇතුළත් ව්‍යවස්ථා සංශෝධනය නොකරන ලෙසට අගමැතිවරයාටත්, රජයටත් අවධාරණය කරනවා. සැබෑ අනතුර නිවේදනයක් තුළින් වසන් කිරීමට ආණ්ඩුව ගන්නා උත්සාහය ගැන කනගාටු වෙනවා. රාජ්‍ය විගණනය දුර්වල කිරීම මගින් පාර්ලිමේන්තු මූල්‍ය පාලනය අඩපණ කිරීමට ආණ්ඩුවේ කුමන්ත්‍රණය පරාජය කිරීමට සියලුම බලවේගවලට ආරාධනා කරනවා"

විපක්ෂ නායකවරයා සිය නිවේදනය මගින් සඳහන් කළේය.

කොරෝනා පොකුර හිස එසවීමත් සමඟ සෞඛ්‍ය ක්ෂේත්‍රය තුළ ඇඳන්, වෛද්‍ය උපකරණ, ඖෂධ හිඟය මෙන්ම මානව සම්බන්ධ සම්බන්ධයෙන් සහ කළමනාකරණය සම්බන්ධයෙන් ද ගැටලු රැසක් පවතින බව සජිත්ට වාර්තා විය. විශේෂයෙන්ම ඔහු පාර්ලිමේන්තුවේ දී (07) මේ ගැන අවධානය යොමු කළේය.

කොරෝනා පොකුර ගැන සජිත්ගෙන් විමසිලි

"විශේෂයෙන්ම මිනුවන්ගොඩ, දිවුලපිටිය ප්‍රදේශයේ කෝවිඩ් පොකුර අද පෙරවරුවේ වෙනකොට 1000 පැනලා තිබෙනවා. එය එන්න එන්නම වැඩි වෙනවා. අපේ බලාපොරොත්තුව මේක එක පොකුරකින් සමාජ ව්‍යාප්තියකට යෑම නතර කිරීම. ඒ නිසා මම විශේෂයෙන්ම මතක් කරන්නට කැමතියි මේ වෙනකොට බරපතළ ප්‍රශ්න ගණනාවක් උද්ගත වෙලා තිබෙනවා.

සජිත් සිය අවධානය යොමු කළේ එසේය.

ඒ එක්කම ඔහු කිසිවෙකුගේ අවධානයට ලක් නොවූ විශේෂ කාරණාවක් සිහිපත් කළේය.

"මේ පළවෙනි රෝගියාව හඳුනාගන්නේ බෝධික සමරසේකර කියන ශ්වසන රෝග විශේෂඥ වෛද්‍යවරයා ඇතුළු කණ්ඩායමක්. දැන් ඒ සෞඛ්‍ය අංශයේ සියලු දෙනාම හඳුන්වන්නේ සුව විරුවන් හැටියට. දැන් මේ සුව විරුවන්වත් නිරෝධායනය කරනකොට ඒ අයට වෙනමම වැඩපිළිවෙළක් ක්‍රියාත්මක වෙලානෑ. ඒ අයවත් මේ ඔක්කොම එකට දාලා තමයි නිරෝධායනය කරන්නෙ. ඒ සුව විරුවන්ගෙන් ඉල්ලීමක් තියෙනවා එහෙම කරන්න එපා. ඒ අයගේ නිරෝධායනය වෙනමම ක්‍රියාත්මක කරන්න කටයුතු කරන්නය කියලා. ඒ වගේම මේ සුව විරුවන්ට ලබා දෙනවි කියපු දීමනා ටික ලබා නොදීම තුළ ඒ අය මානසික වශයෙන් යම් පසුබෑමකට ලක්වෙලා තිබෙනවා.

අපි උපරිම ශක්තිය ලබා දෙන්නම්. (ආණ්ඩු පක්ෂයේ ඇමතිවරුන්ගෙන් බාධා) මම කනගාටු වෙනවා මේ වගකිවයුතු ඇමතිවරුන් මේ කොරෝනාව විහිළුවකට අරගෙන තිබීම ගැන. මෙච්චර අටසිය ගාණක් කොරෝනා වැලඳිලා තිබෙනවා. ඔක්කොම 1600ක් පමණ පරීක්ෂා කරනවා. මේ පළමු ස්පර්ශකයින් විතරයි. දෙවැනි තෙවැනි ස්පර්ශකයින් තවම පරීක්ෂා කරලත් නැහැ. ඒත් මේ ආණ්ඩුවට මේක විහිළුවක් බවට පත්වෙලා. එහෙම හොඳ නෑ. මේ වැදගත් ප්‍රශ්නයක් ඉදිරිපත් කරන්නෙ. ඒ නිසා මම ඉල්ලීමක් කරනවා ගරු සෞඛ්‍ය ඇමති තුමියගෙන් කරුණාකරලා මේක පිළිබඳව පැහැදිලි කිරීමක් කරන්න."

සජිත් මේ කතාව පැවසීමත් සමඟ ආණ්ඩුවට කර හැර යන්නට නොහැකි විය. පසුදාම ආණ්ඩුව ඒ සුව විරුවන්ට වෙනම නිරෝධායනය ස්ථානයක් වෙන් කළේය.

රාජකීය හැළිය

සාක්ෂි බෙන්ඩිස් කියයි... ejournalists@gmail.com

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පළකරනු ලබන නිවේදනයයි

2020 අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ ප්‍රථිපල අනුව 2020/2021 අධ්‍යයන වර්ෂයේ විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම් කිරීමට බලාපොරොත්තු වන අයදුම්කරුවන්ට කෙරෙන නිවේදනයයි

2011 වර්ෂයේ අ.පො.ස. (උසස් පෙළ) විභාගය සඳහා නව සහ පැරණි විෂය නිර්දේශයන් යටතේ පෙනී සිටි සිසුන්ට අදාළව SC(FR) 29/2012 නඩුවේදී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබා දුන් තීන්දුව අනුව යමින්, 2020 වර්ෂයේ අ.පො.ස. (උසස් පෙළ) විභාගය සඳහා නව නිර්දේශය සහ පැරණි නිර්දේශය යටතේ පෙනී සිටින සිසුන්ද වෙනම කාණ්ඩ දෙකක් (two distinct populations) වශයෙන් සැලකීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව තීරණය කරන ලද බව මෙයින් දන්වා සිටිනු ලැබේ. ඒ අනුව, 2020 වර්ෂයේ අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී සිසුන් විසින් ලබා ගන්නා Z-අගය පදනම් කරගෙන 2020/2021 අධ්‍යයන වර්ෂයේ විශ්වවිද්‍යාල සඳහා සිසුන් තෝරා ගැනීමට භාවිත කළ යුතු උපමාන මොනවාද යන්න යෝජනා කිරීම සඳහා නිපුණතා කමිටුවක් (Committee of Experts) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත් කරන ලදී.

එම නිපුණතා කමිටුවෙහි නිර්දේශ පදනම් කර ගෙන, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ (වරින් වර සංශෝධිත)15 (vii) වගන්තියට අනුව විශ්වවිද්‍යාල ප්‍රවේශ කමිටුවේ නිර්දේශ පරිදි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පහත සඳහන් තීරනවලට එළඹුණි.

- 2020 වර්ෂයේ අ.පො.ස. (උසස් පෙළ) විභාගය සඳහා නව නිර්දේශය යටතේ පෙනී සිටින සිසුන් විශ්වවිද්‍යාලවල එක් එක් උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා දිස්ත්‍රික් කුසලතා පදනම මත සෑම දිස්ත්‍රික්කයකින්ම සහ දීපව්‍යාප්ත කුසලතා පදනම මත තෝරා ගනු ලබන ප්‍රතිශතය, 2014 වසරේ සිට 2018 වසර දක්වා වූ පස් අවුරුදු කාලය තුළ දී පළමු සහ දෙවන වරට අ.පො.ස. (උසස් පෙළ) විභාගය සඳහා පෙනී සිටි, පිළිවෙළින් දිස්ත්‍රික් කුසලතා පදනම මත සෑම දිස්ත්‍රික්කයකින්ම සහ දීපව්‍යාප්ත කුසලතා පදනම මත එම එක් එක් උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා විශ්වවිද්‍යාලවලට ඇතුළත් කරන ලද සිසුන්ගේ සංයුත මධ්‍යකයේ (Composite Average) ප්‍රතිශතය වේ.
- 2020 වර්ෂයේ අ.පො.ස. (උසස් පෙළ) විභාගය සඳහා පැරණි නිර්දේශය යටතේ පෙනී සිටින සිසුන් විශ්වවිද්‍යාලවල එක් එක් උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා දිස්ත්‍රික් කුසලතා පදනම මත සෑම දිස්ත්‍රික්කයකින්ම සහ දීපව්‍යාප්ත කුසලතා පදනම මත තෝරා ගනු ලබන ප්‍රතිශතය, 2014 වසරේ සිට 2018 වසර දක්වා වූ පස් අවුරුදු කාලය තුළ දී තුන්වන වරට අ.පො.ස. (උසස් පෙළ) විභාගය සඳහා පෙනී සිටි, පිළිවෙළින් දිස්ත්‍රික් කුසලතා පදනම මත සෑම දිස්ත්‍රික්කයකින්ම සහ දීපව්‍යාප්ත කුසලතා පදනම මත එම එක් එක් උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා විශ්වවිද්‍යාලවලට ඇතුළත් කරන ලද සිසුන්ගේ සංයුත මධ්‍යකයේ Composite Average) ප්‍රතිශතය වේ.

ඒ අනුව, 2020 වර්ෂයේ අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී සිසුන් විසින් ලබා ගන්නා Z-අගය පදනම් කරගෙන 2020/2021 අධ්‍යයන වර්ෂයේ විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සිසුන් තෝරා ගැනීම ඉහතින් සඳහන් කරන ලද තීරණවලට අනුව සහ 2020/2021 අධ්‍යයන වර්ෂය සඳහා නිකුත් කිරීමට නියමිත **"ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රථම උපාධි පාඨමාලා සඳහා ප්‍රවේශය"** යන අත්පොතෙහි ඇතුළත් නීතිරීතිවලට යටත්ව සිදු කෙරෙනු ඇත.

සභාපති,
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව,
අංක 20, වෝඩ් පෙදෙස, කොළඹ 07.
2020.10.11

කෝටි ගණන් මුදල් ගිල්ල යහ පාලනයේ වැඩ-කිඩ!

දූෂණ විරෝධී කමිටුවේ දීමනා වැටුප් හා පහසුකම් සඳහා රු.ලක්ෂ 406ක් වැය කරලා

- අගමැති මහින්ද රාජපක්ෂ

දූෂණ විරෝධී කමිටුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කරලා

- පාර්ලිමේන්තු මන්ත්‍රී ජනාධිපති නීතිඥ විජයදාස රාජපක්ෂ

මම ඕකේ සාමාජිකයෙක් බව දන්නේ කැබිනට් පත්‍රිකාව දුටු විටයි

- හිටපු ඇමැති මංගල සමරවීර

දූෂණ විරෝධී කමිටුවේ ඇතැම් ක්‍රියා නීති විරෝධියි

- හිටපු අගමැති රනිල් වික්‍රමසිංහ

ජාතික විධායක සභාවෙන් දූෂණ විරෝධී කමිටුවකට අනුමැතිය දුන්නේ නැහැ

- ජවිපෙ නායක අනුර කුමාර දිසානායක

● **නිහාල් පී. අබේසිංහ**

පසුගිය යහපාලන රජය මඟින් ප්‍රධාන ලෙසම දේශපාලන පළිගැනීම් සඳහා සකස් කරන ලද දූෂණ විරෝධී කමිටු ලේකම් කාර්යාලය හා මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය (FCLD) වැනි ආයතන ඒවා ඇරැඹීමට පෙරමුණ ගත් යහපාලන රජයේ හිටපු මැති ඇමතිවරුන්ටම දැන් පාරාවළල්ලක් බවට පත්වී ඇතැයි පෙනෙන්නට තිබේ.

ඊට හේතුව එම දූෂණ විරෝධී කමිටු ලේකම් කාර්යාලය හා මූල්‍ය අපරාධ කොට්ඨාසය සඳහා සේවකයන් බඳවා ගැනීම හා ඔවුන්ට හාවෙනත් කටයුතුවලට හා විදේශ ගමන්වලට කිසිම පාලනයකින් තොරව මුදල් වැය කිරීම පිළිබඳව තොරතුරු සෙවීමට අලුත් මූල්‍ය දූෂණ මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයක් ස්ථාපිත කළ යුතු මට්ටමට තත්ත්වය උග්‍රවී ඇති බැවිනි.

මේ බව තව තවත් කරුණු හෙළි වූයේ පසුගියදා පාර්ලිමේන්තු මන්ත්‍රී වසන්න යාපා බණ්ඩාර මහතා විසින් පාර්ලිමේන්තුවේදි ඇසූ ප්‍රශ්නයට අගමැති මහින්ද රාජපක්ෂ මහතා පාර්ලිමේන්තුවේ සභාගත කළ සුවිශේෂි පිළිතුර නිසාය. ඒ පිළිතුර අනුව දූෂණ විරෝධී කමිටු ලේකම් කාර්යාලය 2017දි බඳවා ගෙන ඇති කාර්ය මණ්ඩලය 44 කි.

පසුගිය 2015 පෙබරවාරි සිට 2017 ජුනි දක්වා කාලයේදී දූෂණ වැළැක්වීමේ කමිටුවේ නිලධාරින් 44 දෙනාට දීමනා වැටුප් හා අනෙකුත් දීමනා සඳහා එවක යහපාලන රජය රුපියල් ලක්ෂ 406ක් වැය කර තිබෙන බව අගමැතිවරයා පාර්ලිමේන්තුවේදී පැවසීය. ඉන් එක් නිලධාරියෙක් නීතිපති දෙපාර්තමේන්තුවෙන් මෙන්ම අගමැති කාර්යාලයෙන් ද වැටුප් ලබා ඇති බවත් එම නිලධාරියා සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට අදාළ ලියකියවිලි අගවිනිසුරුවරයා හා නීතිපතිවරයා වෙත යොමු කර ඇති බව අගමැතිවරයා කියයි.

ඊට අමතරව මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයේ නිලධාරින් 2015 සිට 2019 දක්වා කාලයේදි විමර්ශන කටයුතු සඳහා යැයි කියමින් විදේශ සංචාර 19කට එක්වී ඇති බවද ඒ සඳහා යහපාලන රජය රුපියල් ලක්ෂ 141ක් වැයකර ඇති බවද අගමැතිවරයා පාර්ලිමේන්තුවේදි පැවසීය. අගමැතිවරයා පාර්ලිමේන්තුවේදි මෙසේද පැවසීය.

"වංචා හා දූෂණ විමර්ශනය සඳහා ඒකකයක් ස්ථාපිත කිරීම" යනුවෙන් එවකට සිටි අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ හා "පසුගිය කාලයේ සිදු වී ඇති මහා පරිමාණ දූෂණ සොයා බැලීම" යනුවෙන් එවකට සිටි විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා වූ ගරු පාඨලී චම්පික රණවක විසින් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයන්ට අදාළව 2015 ජනවාරි මස 21 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී ගනු ලැබූ තීරණයන්ට අනුව "දූෂණ විරෝධී කමිටුව" ස්ථාපිත කොට තිබෙනවා.

එහි සාමාජිකයන්ලෙස,

හිටපු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ (සභාපති), හිටපු අමාත්‍ය මංගල සමරවීර, හිටපු අමාත්‍ය පාඨලී චම්පික රණවක, හිටපු අමාත්‍ය ආචාර්ය විජේදාස රාජපක්ෂ, හිටපු අමාත්‍ය රවුෆ් හකීම්, ප්‍රජාතන්ත්‍රවාදී ජාතික සන්ධානය නායක,සරත් ෆොන්සේකා, දෙමළ ජාතික සන්ධානය (TNA) නායක, ආර්. සම්බන්ධන්, පාර්ලිමේන්තු මන්ත්‍රී එම්.ඒ. සුමන්තිරන්, ජනතා විමුක්ති පෙරමුණේ නායක, අනුර කුමාර දිසානායක, නීතිඥ ජේ.සී. වැලිඅමුණ, ආචාර්ය ජයම්පති වික්‍රමරත්න, මලික් සමරවික්‍රම, කමිටු ලේකම්වරයෙක් කටයුතු කරනු ලැබුවා.

එමෙන්ම, 2015 ජනවාරි 21 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ඉදිරි කටයුතු කිරීම සඳහා එවකට සිටි අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා විසින් ඉදිරිපත් කරන ලද 2015 පෙබරවාරි 06 දිනැති "දූෂණ වැළැක්වීමේ කමිටුව සඳහා ලේකම් කාර්යාලයක් ස්ථාපිත කිරීම හා සුදුසු කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීම" යන මැයෙන් වූ අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුව 2015 පෙබරවාරි 11 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි එම කමිටු ලේකම් කාර්යාලය ස්ථාපිත කිරීමටත්, අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවා ගැනීමටත් අනුමැතිය ලබා දී ඇත.

ඒ අනුව, නිලධාරීන් 44 දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයක් ඇති කර ඔවුන් සඳහා අග්‍රාමාත්‍ය කාර්යාලය විසින් වැටුප් හා දීමනා ද ගෙවා ඇත. උදාහරණ වශයෙන් එහි අධ්‍යක්ෂ, ආනන්ද විජේපාල මහතාට රු.1,285,167.33ක් වසර තුන සඳහා ද, උපදේශක, ඒ.පී.ඒ. ගුණසේකර මහතාට රු. 93,750.00ක් මාස දෙකක් සඳහා ද, උපදේශක, ටී. කේ. වර්ණසූරිය මහතාට රු. 660,000.00ක් 2015 වර්ෂය සඳහා ද, උපදේශක, එම්.ඒ. සතාර් මහතාට රු.243,750.00ක් මාස හතරක් සඳහා ද, උපදේශක, එස්. මැදවැව මහතාට රු. 2,068,125.00ක් වසර තුන සඳහා ද, උපදේශක, එම්. බී. එච්. එම්. දයාරත්න මහතාට රු.1,970,000.00ක් වසර තුන සඳහා ද හා උපදේශක, තුසිත් මුදලිගේ මහතාට රු.6,26,080.00ක් වසර තුන සඳහා ද වශයෙන් ගෙවා ඇත. මෙහි සම්පූර්ණ එකතුව රුපියල් 69,46,892 කි.

එමෙන්ම, 2015 පෙබරවාරි මස සිට 2017 ජුනි මස දක්වා කාර්ය මණ්ඩලයේ වැටුප්, දීමනා හා අනෙකුත් වියදම් සඳහා රු.33,714,807.59ක් අග්‍රාමාත්‍ය කාර්යාලය විසින් ගෙවා ඇත. ඒ අනුව දූෂණ විරෝධී ලේකම් කාර්යාලයේ සියලු දීමනා වැටුප් අනෙකුත් වියදම් සඳහා ගෙවා ඇති සම්පූර්ණ මුදල රුපියල් ලක්ෂ 406.5 ක ආසන්නය.

මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයේ (FCID) නිලධාරීන් 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා විමර්ශන කටයුතු සඳහා විදේශ සංචාරවලට සහභාගි වී ඇත. එම මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයේ නිලධාරීන් 20 දෙනෙකු පමණ වරින් වර විදෙස් සංචාර 19කට සහභාගි වී ඇති අතර, ඔවුන් සඳහා එම සංචාරවලට අදාළ ගුවන් ගමන් ගාස්තු හා විදෙස් ගමන් වියදම් දීමනා ලෙස රුපියල් ලක්ෂ එකසිය හතළිස් එකක පමණ මුදලක් වියදම් වී ඇතැයි ද අගමැතිවරයා පැවසීය.

කෙසේ වුවත් දූෂණ විරෝධී කමිටුව හා මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය පිළිබඳව, දේශපාලන පළිගැනීම් පිළිබඳ ජනාධිපති කොමිසමේදී සාක්ෂි දුන් ඒවා ක්‍රියාත්මක කළ යහපාලනයේ අය පවසන්නේ එකිනෙකට වෙනස් පරස්පර ප්‍රකාශ වීමද හාස්‍යයට කරුණකි.

මේ අතර යහපාලන ආණ්ඩු සමයේදී ජාතික විධායක සභාවේ අනුමැතියට යටත්ව පිහිටවූ දූෂණ විරෝධී ලේකම් කාර්යාලය සිදුකළ ඇතැම් ක්‍රියා නීති විරෝධීව සිදුව ඇති බව හිටපු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා පසුගිය රජයේ දේශපාලන පළිගැනීම් පරීක්ෂා කිරීමේ ජනාධිපති කොමිසමේ දී පිළිගෙන තිබේ.

දේශපාලන පළිගැනීම් පිළිබඳ සොයා බල ජනාධිපති පරීක්ෂන කොමිසන් සභාව හමුවේ සාක්ෂි ලබාදෙමින් හිටපු අගමැතිවරයා මේ බව පිළිගත්තේය.

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ හිටපු ලේකම් වෛද්‍ය නිහාල් ජයතිලක මහතා කළ පැමිණිල්ලකට අදාළව රනිල් වික්‍රමසිංහ මහතා පසුගියදා කොමිසම හමුවේ පෙනී සිටියේය. ජාතික විධායක සභාව කුමන නීතියක් යටතේ ස්ථාපනය කළ ආයතනයක්ද යන්න කොමිසම විසින් හිටපු අගමැති රනිල් වික්‍රමසිංහ මහතාගෙන් විමසා සිටියේය.

ඒ සඳහා පිළිතුරු දෙමින් වික්‍රමසිංහ මහතා සඳහන් කළේ එය නීතියක් යටතේ ස්ථාපනය නොකළ ආයතනයක් බවයි.

2015 ජනාධිපතිවරණයේදී මෛත්‍රීපාල සිරිසේන මහතාට ආධාර උපකාර කළ විවිධ දේශපාලන පක්ෂ සිවිල් සංවිධාන සහ වෘත්තීය නියෝජිතයින්ගෙන් සමන්විත කමිටුවක් සාදා තිබූ බවත් එය ජාතික විධායක සභාව ලෙස හැඳින්වූ බවත් වික්‍රමසිංහ මහතා කොමිසම හමුවේ අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු ලෙස කියා සිටියේය.

රනිල් වික්‍රමසිංහ මහතා සඳහන් කළේ විධායක සභාවට කැබිනට් මණ්ඩලයට ඉහළින් විශේෂ බලයක් ලබා නොදුන් බවයි.

"අන්තිමට මම හොරු ඇල්ලුවෙත් නැහැ. අල්ලන්න කියපු අයයි අනිත් අයයි ඔක්කොම මාව දාලා ගිහින්. මම දැන් තනිවෙලා ඉන්නේ යැයිද ඊට පිළිතුරු ලබා දෙමින් රනිල් වික්‍රමසිංහ මහතා එහිදී පවසා ඇත.

මේ පිළිබඳව අදහස් දක්වන හිටපු ඇමැති පාර්ලිමේන්තු මන්ත්‍රී විජයදාස රාජපක්ෂ මහතා පවසන්නේ දූෂණ විරෝධී කමිටුව පිහිටුවීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීමක් බවයි. කොමිසම හමුවේ සාක්ෂි දෙමින් විජයදාස රාජපක්ෂ මහතා කියා සිටියේ දූෂණ විරෝධී කමිටුව ජාතික විධායක සභාව නමින් හඳුන්වන නෛතික නොවන ආයතනයකට අනුගතව දේශපාලන වශයෙන් රාජපක්ෂවරුන්ගෙන් පළිගැනීමට ඇරඹුමක් බවයි.

මේ අතර පසුගිය රජයේ දූෂණ විරෝධී කමිටුව පිහිටුවීමට අදාළව හිටපු අගමැති රනිල් වික්‍රමසිංහ විසින් ඉදිරිපත් කර ඇති කැබිනට් පත්‍රිකාව සම්බන්ධයෙන් තමාට වගකීමක් ගත නොහැකි බව හිටපු විදේශ ඇමැති සහ මුදල් ඇමැති මංගල සමරවීර මහතා පසුගිය රජයේ දේශපාලන පළිගැනීම් පරීක්ෂා කිරීමේ කොමිසම හමුවේ සාක්ෂි දෙමින් ප්‍රකාශ කර ඇත.

මේ කියන දූෂණ විරෝධී කමිටුවේ තමා සාමාජිකයෙක් බව දැනගත්තේ එම කැබිනට් පත්‍රිකාව දුටු අවස්ථාවේදී බවද මංගල සමරවීර මහතා පවසා ඇත. පසුගිය රජය යටතේ දූෂණ විරෝධී කමිටුව පිහිටුවන්නේ ජාතික විධායක සභාවේ අනුමැතියට යටත්ව බවට හිටපු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ ඉදිරිපත් කළ කැබිනට් සංදේශයේ ඇති සඳහන සම්පූර්ණ අසත්‍යයක් බව ජනතා විමුක්ති පෙරමුණේ නායක හා ජාතික ජන බලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රී අනුර කුමාර දිසානායක පසුගිය රජයේ දේශපාලන පළිගැනීම් පරීක්ෂා කිරීමේ ජනාධිපති කොමිසම හමුවේ සාක්ෂි දෙමින් පැවසීය.

එසේම අනුර කුමාර දිසානායක මහතා කොමිසම හමුවේ සාක්ෂි දෙමින් කීවේ හිටපු අගමැති රනිල් ඉදිරිපත් කළ කැබිනට් පත්‍රිකාවේ එම දූෂණ විරෝධී කමිටුව යටතේ පිහිටුවා තිබෙන ක්ෂණික ප්‍රතිචාර අනුකමිටුවේ සම්බන්ධීකාරක ලෙස තම නම සඳහන්ව තිබුණත් තමා එවැනි කමිටුවක් තිබෙන බවක් නොදැන සිටි බවය.

ශ්‍රී ලාංකේය සම්භවයක් ඇති ඝාතකයෙක් කළ ප්‍රංශයම තිගැස්වූ පස් මිනී මැරුම

● **ජාලිය වීරක්කොඩි**

සතියක් ගත වී ගොස් තිබේ. ඒ බිහිසුණු බේදවාචකයේ තිගැස්ම තවමත් ප්‍රංශයේ මිනිසුන් අතරින් පහව ගොස් නැත.

පිහියකින් ඇන, මිටියකින් පහර දී පස් දෙනෙක් මරා දමා තිබිණි. මාර දැමූවන් අතර 4 දෙනෙක් නොදරුවන්ය. මේ මරණ පහට අමතරව තවත් තිදෙනෙක් පිහි පහරින් රෝහල්ගත කර ඇති බව ප්‍රංශයේ BFM TV මාධ්‍ය ජාලය සෙනසුරාදා දහවල් (02) වාර්තා කළේය.

ශ්‍රී ලාංකික ද්‍රවිඩ සම්භවයක් සහිත අපරාධකරු

මේ අපරාධය සිදුවන්නේ ශ්‍රී ලාංකික ද්‍රවිඩ සම්භවයක් සහිත පවුලකය. පැරිසියට නුදුරු ජනාකීර්ණ Noisy-le-sec ප්‍රදේශයේ ඔවුහු ජීවත් වෙමින් සිටියහ. විශ්වාස කරන ආකාරයට සිදුවීමට මුල පවුල් ආරවුලකි. මේ සමූහ ඝාතකයාත් එම පවුලේම සාමාජිකයෙකි.

විදෙස් මාධ්‍යය වාර්තා කළ ආකාරටය සිද්ධිය පෙළ ගැසෙන්නේ මෙසේය.

සිද්ධිය වාර්තා වන්නේ පසුගිය 03 වෙනි දා සෙනසුරාදා ය. දෙමළ සම්භවයක් සහිත ශ්‍රී ලාංකික සහෝදරයෙකු හා සහෝදරියක සිය පවුල් සමග ප්‍රංශයේ Noisy-le-sec ප්‍රදේශයේ එම්මානුවෙල් ආර්ගෝ නමින් හඳුන්වන මාවතේ දෙමහල් නිවසක ජීවත්වූහ.

ඔවුන් ප්‍රංශයේ පදිංචියට පැමිණ ඇත්තේ මීට අවුරුදු 15කට කලිනි. මුල් පදිංචිය යාපනය ප්‍රදේශයේ සංඩිලිපායි හිය. මේ පවුල් දෙක Noisy-le-sec හි එම්මානුවෙල් ආර්ගෝ මාවතේ නිවසට පදිංචියට පැමින ඇත්තේ මීට වසර 3කට පමණ පෙරය.

වාර්තාවන ආකාරයට මේ පවුල් දෙක සිද්ධියට පෙර සාමකාමී ජීවිතයක් ගත කර තිබුණත් මීට සතියකට පෙර යම් ආරවුලක් නිරාකරණය කිරීමට පොලිසිය මේ නිවසට පැමිණි ආකාරය අසල්වැසියන් විසින් නිරීක්ෂණය කර තිබිණි. එහෙත් එය මෙවැනි අපරාධයකින් කෙළවර වනු ඇතැයි කිසිවෙක් අපේක්ෂා කර තිබුණේ නැත.

අපරාධය

පසුගිය 02 දා සෙනසුරාදා දහවල් 11 -12 අතර ලේ පෙරාගෙන දිව ආ පිරිමි ළමයෙක් අසල වූ අවන් හලකට ගොඩ වැදුනේය. බරපතළ කැපුම් තුවාල සහිතව දැඩි ලෙස කම්පනයට පත් වී සිටි ඔහු අවන්හල් හිමිකරුට හඬමින් පවසා තිබුණේ සිය මාමා පිස්සකු සේ වියරුවෙන් නිවසේ අයට පිහියෙන් අනිමින් මිටියකින් පහර දෙන බවය.

අවන්හල හිමිකරු මොහොමඩ් හෙමානී (Mohamed Hemani) නැමැත්තෙකි. ඔහු වහාම සිය අවන්හල තුළම දරුවාට ප්‍රථමාධාර ලබා දෙමින් අපරාධය පිළිබඳ පොලිසියට දැන්වූයේය.

මේ දැනුම් දීමත් සමග සිද්ධිය වූ ස්ථානයට පොලීසිය පැමිණියයේය. NewsWeek වෙබ් අඩවිය වාර්තා කළේ පොලිසිය එම ස්ථානයට යන විට මිය ගිය අයගේ සිරුරු පහට අමතරව බරපතළ තුවාල ලැබූ හෝ සිහි සුන් වූ පුද්ගලයින් පස්දෙනෙක් දුටු අයුරුය. ඔවුන්ගෙන් තිදෙනෙකු අසාධ්‍ය තත්ත්වයේ සිටි අතර දෙදෙනෙකු "සාපේක්ෂ හදිසි" තත්වයක පසු වූ බව පොලිසිය කීවේය. බරපතළ තුවාල ලැබූවන් අතර මේ අපරාධය කළ මිනීමරුවා ද වූයේය.

තැන තැන වැටී මිය ගිය දරුවන් සිව් දෙනෙක් හා කාන්තාවක විය. මිනී මරුවා සිය සිය අවුරුදු පහේ දරුවාත්, අවුරුදු නවයේ දරුවාත්, සිය බිරියත්, සොයුරියගේ මාස 18ක ළදරුවා සහ අවුරුදු පහක දරුවා ද මරා දමා තිබිණි. මේ තැනැත්තා සිය බාල දරුවාව මරා දමා තිබුණේ ගෙල සිර කිරීමෙන් බව පොලිසිය අනුමාන කරන අයුරු විදෙස් මාධ්‍ය වාර්තා කළේය.

ප්‍රහාරයට ලක් වූ අපරාධ කරුගේ සොයුරියත් ඇයගේ සැමියාත් සිටියේ බරපතළ කැපුම් තුවාල සහිතවය. මේ විනාශයෙන් පසු සිය දිවි හානි කරගැනීමට අපාරාධකරු උත්සාහ කර ඇති අයුරු පොලිසිය නිරීක්ෂණය කළේය. අපරාධයට යොදා ගත් පිහිය හා මිටිය ඔහු අසල වැටී තිබිණි.

සියලු දෙනා රෝහල් කරා ගෙන යෑමට කටයුතු සිදු කොට පොලිසිය පරීක්ෂණ ආරම්භ කළේය. අසාධ්‍ය පුද්ගලයන් පැරිසියට නුදුරු බෝජොන් (Hospital Beaujon) රෝහලේ දැඩි සත්කාර ඒකකය වෙත යොමු කෙරිණි.

අසල්වැසියන්ගේ කතා

Noisy-le-sec ප්‍රදේශයේ ද්‍රවිඩ සම්භවක් සහිත ලාංකික පිරිසක් වෙති. ඔවුන් 80 ක් පමණ එකතුව පිහිටුවා ගෙන ඇති ප්‍රංශ දමිළ සංවිධානයේ සභාපති ශසී මහාලින්ගම්ය. ඔහු සිටියේ සිද්ධිය සම්බන්ධව විමතියෙන් පසුවිය.

'ඔහු ඉතා සන්සුන් පියෙක්. දරුවන්ට ඉතාමත් කිට්ටුයි. ඔහු තම 5 හැවිරිදි පුතා සෑම දිනකම පාසැලට රැගෙන ගියා. ඒ ඔහුම තම බිරියත් දරුවන් දෙදෙනාත් ඇතුළු පස් දෙනෙකු ඝාතනය කරලා. ඔහු එසේ කරාවි යැයි සිතා ගැනීමට නොහැකිය. මට මේ සිදුවීම අදහා ගන්න බෑ.''

මිනීමැරුමට සම්බන්ධ වූදිතයා පැරිසියේ ආපනශාලාවක මුළුතැන් ගෙයි සේවකයෙකි. දෙමහල් නිවසේ ජීවත්වූ මොවුන් සමගියෙන් ජීවත්වූ බව අසල්වාසීන්ගේ ප්‍රකාශ වලින් කියැවිණි.

මෙම සිද්ධිය පිළිබඳ සොයා බලමින් theleader වෙබ් අඩවියට වාර්තාවක් සැපයූ ප්‍රංශයේ ජීවත්වන සුනිල් ආනන්ද කියා තිබුණේ සිද්ධියට පෙර දින, එනම් සිකුරාදා සවස මෙම පවුල් දෙකම ඔවුන් නිතරම යන හින්දු කෝවිලේ පූජාවකටද සහභාගීවී පැමිනෙනු ඇසින් දුටුවන් වූ බවය.

ප්‍රංශ මාධ්‍ය

සිද්ධියට පසු දින මුළු ප්‍රංශයේම මාධ්‍යවල ප්‍රධානම සිරස්තලය වූයේ මේ සිද්ධිය ය. ඔවුන් විටින් විට සිද්ධියේ තොරතුරු යාවත්කාලීන කළේය.

මේ විශාල මාධ්‍ය ප්‍රචාරණය හේතුවෙන් මුලු සමාජයේම අවධානය මේ බේදවාචකය වෙත යොමු වී තිබිණි. මේ අතර සිද්ධිය සම්බන්ධව ප්‍රංශයේ ශ්‍රී ලාංකේය ප්‍රජාව අතර විවිධ කට කතා පැතිරී ගියේය.

දැනට දැඩි සත්කාර ඒකකයේ ප්‍රතිකාර ලබන සැකකරු සඳහා බදාදා අවසරයකින් තොරව අනිවාර්ය රෝහල්ගත කිරීමේ නියෝගයක් ලබාගෙන ඇති බවත් පසුව ඔහුව හුදෙකලා සිර කඳවුරක තැබීමට නියමිත බවත් පැමිණිලි පාර්ශවය විදෙස් මාධ්‍ය වෙත කීවේය.

තවමත් වශේෂඥ මනෝ විශ්ලේෂකයන් මේ පුද්ගලයාගේ සාපරාධී ඝාතන පිළිබඳ ප්‍රශ්න කිරීම අරඹා නැත. මිනී මැරුම්වලට හේතුව පැහැදිලි නැත. ප්‍රංශ පොලිසිය තවමත් මේ පරාධයේ සුලමුල මුල සොයමිනි.



අපගේ ජාතියට සහ එහි ජනතාවට සෞභාග්‍යය උදාකරන ගමනක අප නිරත වී සිටින්නෙමු. ඔබත් එහි කොටස්කරුවකු වීමට කැමතිද ?

දිවයින පුරා ශාඛා 276 කින් යුත් ජාලයකින් සහ 3000 කට වැඩි ශ්‍රම බළකායකින් යුත් ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ සංවර්ධන බැංකුවක් වන ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ පුරප්පාඩු ඇති පහත තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම් සහ පළපුරුද්ද ඇති ප්‍රතිඵල අභිමුඛ දක්ෂ කාර්යශූර පුද්ගලයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අයකිරීම්

සාමාන්‍යාධිකාරී / ප්‍රධාන විධායක නිලධාරි වෙත වාර්තා කරන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී අයකිරීම්, අක්‍රිය ණය අනුපාතය අවම මට්ටමක පවත්වා ගැනීම පිණිස ණය තලඹ මෙහෙයවීම හා අයකර ගැනීමේ සැලසුම් සංවර්ධන කිරීම හා ක්‍රියාත්මක කිරීම පළාත් කාර්යාලවලට, දිස්ත්‍රික් කාර්යාලවලට සහ ශාඛාවලට නායකත්වය සහ මඟ පෙන්වීම් ලබාදීම මගින් අවම අක්‍රිය ණය අනුපාතයක් පවත්වාගෙන යාම සඳහා වගකීව යුතුවේ.

ප්‍රධාන වගකීම්

- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද මෙහෙයුම් හා මාර්ගෝපදේශ දැඩිව අනුගමනය කරමින් බැංකුවේ අක්‍රිය වත්කම් කළමනාකරණය කිරීම.
- කලින් කළට සමාලෝචන පැවැත්වීම සහ ණය ආයෝජන අධීක්ෂණය කිරීම සහ බැංකුවෙහි අක්‍රිය ණය අනුපාතය සීමා කිරීම / අඩුකිරීම සඳහා විවිධ ක්‍රම මගින් අයකර ගැනීමේ ක්‍රියාකාරිත්වයන් ආරම්භ කිරීම.
- ණය කලඹේ දිගින් දිගම සිදුවන දුර්වලතා අවම කර ගැනීම සඳහා සක්‍රිය ක්‍රියාකාරිත්වයක් පවත්වාගෙන යාම
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – ණය සමග සහයෝගිතාවයෙන් දුර්වල ව්‍යාපෘති පුනරුත්ථාපනය කිරීම මගින් ණය අයකර ගැනීමට ක්‍රියා කිරීම.
- ප්‍රධාන කාර්යාලයෙහි මධ්‍යගත අයකරගැනීමේ කණ්ඩායමක් ස්ථාපිත කිරීම සහ තීරණාත්මක පළාත්, දිස්ත්‍රික්ක සහ ශාඛාවල අයකර ගැනීම අධීක්ෂණය කිරීම, පසු විපරම් කිරීම.
- මාසික හා කාර්තුමයි පදනමින් අයකර ගැනීමේ ප්‍රගතිය අධීක්ෂණය කිරීම / පසු විපරම් කිරීම සහ පළාත් / දිස්ත්‍රික්ක සහ ශාඛාවල සහය සමග කිසිදු අපගමනයක් සිදු නොවීමට ක්‍රියාකාරී සැලස්මක් පිළියෙල කිරීම.
- ශාඛා මට්ටමේ උකස් බාණ්ඩ භෞතිකවය වශයෙන් සත්‍යාපනය කිරීමෙන් බැංකුවට ලාභදායි ලෙස උකස් ව්‍යාපාරය කළමනාකරණය කිරීම සහ නිසි වේලාවට වෙන්දේසි පැවැත්වීමට පියවර ගැනීම
- බොල් ණය අයකර ගැනීම සඳහා දේපළ විකිණීමට අදාළ නීතිමය ප්‍රතිපාදනවලට අනුකූලව පරාටේ (Parate) ක්‍රියාවලිය සංවිධානය කිරීම.

මූලික අවශ්‍යතා

- පහත සඳහන් සුදුසුකම් අතුරින් අවම වශයෙන් එක් සුදුසුකමක් ලබා තිබීම.
  - a.) පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධියක් සමග අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකම් හෝ පශ්චාත් උපාධි ඩිප්ලෝමා සුදුසුකම්

    හෝ
  - b.) බැංකුකරණයේ පූර්ණ වෘත්තීය සුදුසුකට ලබාතිබීම.
- බැංකුකරණයේ වසර 8 ක ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ පළපුරුද්ද තිබිය යුතුය.
- අයකර ගැනීම් ක්ෂේත්‍රයේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ පළපුරුද්ද අවශ්‍යතාවයකි.

ප්‍රධාන අලෙවිකරණ නිලධාරී

සාමාන්‍යාධිකාරී / ප්‍රධාන විධායක නිලධාරී වෙත වාර්තා කරන ප්‍රධාන අලෙවිකරණ නිලධාරි ප්‍රදේශීය සංවර්ධන බැංකුවෙහි ආයතනික ප්‍රතිරූපය නිර්මාණය කරමින් සහ ඉතා පිරිවැය පළදායි ආකාරයකින් ජනමාධ්‍ය මගින් සන්නිවේදනය කිරීම හා පළාත් හා දිස්ත්‍රික් කාර්යාල සමග සහයෝගිතාවයෙන් ප්‍රචාරක හා ක්ෂේත්‍ර ප්‍රචාරණ කටයුතු සංවිධානය කිරීම මගින් සන්තාම ළැදියාව ගොඩනගමින් එක් එක් ඉලක්කගත සේවාදායක කොටස් සඳහා සුදුසු වන උපායමාර්ග සංවර්ධනය කිරීම හා ක්‍රියාත්මක කිරීම පිළිබඳව වගකිව යුතුය.

ප්‍රධාන වගකීම

- වෙළඳපොළ පර්යේෂණ ක්‍රියාත්මක කිරීම, වෙළඳපොළ විභවතා තක්සේරු කිරීම, නව අලෙවිකරණ අවස්ථා හඳුනාගැනීම සහ සමස්ත අලෙවිකරණ, දැන්වීම්කරණ සහ අලෙවි ප්‍රවර්ධන සැලසුම් පිළියෙල කිරීම සහ එවා ක්‍රියාවට නැගීම.
- බැංකු ණය කලඹ සහ ඉතිරිකිරීම් වර්ධනය කිරීමට අලෙවිකර උපායමාර්ග සකස්කිරීම හා ක්‍රියාත්මක කිරීම.
- අදාළ අංශ සහ සියලු පළාත් සමග සහයෝගිතාවයෙන් අලෙවිකිරණ අයවැය, වාර්ෂික අලෙවිකරණ සැලැස්ම පිළියෙල කිරීම සහ ත්‍යාග අයිතම සහ අනෙකුත් අලෙවිකරණ රාජකාරි තිසිවේලාවට සංවිධානය කිරීම.
- බැංකුවෙහි දැක්ම හා අනුකූල වන නව සේවාවන් සංවර්ධනය කිරීම සහ සේවාවන් ප්‍රවර්ධන කිරීමේ වැඩසටහන්වලට නායකත්වය ලබා දීම.
- දැන්වීම් නියෝජිතායතන සමග සම්බන්ධීකරණය කිරීම සහ රූපවාහිනී / ගුවන්විදුලි / මුද්‍රිත මාධ්‍යය වැනි ජනමාධ්‍ය හා මොබයිල් ඇලර්ට් හා කටවුට් / බැනර් / පෝස්ටර් වැනි බාහිර ප්‍රචර්ධන ඇතුළත් ඵලදායි දැන්වීම්, ප්‍රචාරණ, ප්‍රවර්ධන උපායමාර්ග ක්‍රියාවට නැගීම.
- තරගකරුවන්ගේ ක්‍රියාකාරිත්වයන් නිරීක්ෂණය කිරීම සහ ඵලදායි කෙටිකාලීන ප්‍රති උපායමාර්ග ක්‍රියාවට නැගීම.
- ණය සහ තැන්පතු සේවාවන් නිසි වේලාවට ලබාදීම සහතික කිරීම සඳහා සේවා ලබාදීමේ ක්‍රියාවලිය සම්බන්ධව යෝජනා ඉදිරිපත් කිරීම / වැඩිදියුණු කිරීම සහ අදාළ ක්‍රියාකාරි ප්‍රධානීන් සමග සම්බන්ධීකරණයෙන් සේවාදායකයන්හට උසස් ගණයේ සේවාවක් සහතික කිරීම.
- බැංකු විසින් ක්‍රියාත්මක කරනු ලබන අලෙවිකරණ හා ප්‍රවර්ධන කටයුතු අධීක්ෂණය කිරීම සහ ගැටලු වෙනොත් විසඳුම් සමග කළමනාකාරිත්වයට වාර්තා කිරීම.

ප්‍රධාන අවශ්‍යතා

- පහත සඳහන් සුදුසුකම්වලින් එකක් තිබිය යුතුය.
  - අ.) පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධිය සමග අදාළ ක්ෂේත්‍රයක පශ්චාත් උපාධි සුදුසුකම් හෝ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව.
  - ආ.) බැංකුකරණය පිළිබඳව පූර්ණ වෘත්තීය සුදුසුකම්
- ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර අටක පළපුරුද්ද තිබිය යුතුය. බැංකු හෝ මූල්‍ය ආයතනයක පළපුරුද්ද ලබා තිබීම වඩාත් සුදුසුවේ.
- අලෙවිකරණය පිළිබඳ පූර්ණ වෘත්තීය සුදුසුකම් තිබීම අමතර වාසියක් වනු ඇත.
- ප්‍රධාන සේවාදායකයන් සමග සමීප සහ සවිමත් සම්බන්ධතාවයක් ගොඩනැගීමේ හැකියාව නිරූපණය කළ යුතුය.
- අභිප්‍රේරණාත්මක දක්ෂතාව, බහු කාර්ය හැකියාව සහ විශිෂ්ට සන්නිවේදනය, අන්තර්පුද්ගල සහ පුද්ගල කළමනාකරණ නිපුණතා අත්‍යවශ්‍ය ගුණාංග වේ.

ප්‍රධාන මානව සම්පත් නිලධාරී

තෝරා ගැනීමට අපේක්ෂිත පුද්ගලයා ව්‍යාපාරික අරමුණු අඛණ්ඩව අත්පත් කර ගැනීම සඳහා අවශ්‍ය වන උපායමාර්ගික හා ඒකාබද්ධ ප්‍රවේශයන් යොදා ගනිමින් මානව සම්පත් අත්පත් කර ගැනීම, සංවර්ධනය හා යෙදවීම සම්බන්ධ නිසි ප්‍රතිපත්ති හා ක්‍රියා පටිපාටි යොදා ගනිමින් පහත සඳහන් ප්‍රධාන වගකීම් සම්බන්ධව ආයතනික කළමනාකාරිත්ව සාමාජිකයෙකු ලෙස සාමාන්‍යාධිකාරී / ප්‍රධාන විධායක නිලධාරී වෙත වාර්තා කළ යුතුය.

ප්‍රධාන වගකීම්

මානව සම්පත් සංවර්ධනය

- බැංකුවේ අරමුණු වලට අනුකූලව මානව සම්පත් ක්‍රියාකාරකම් සඳහා උපායමාර්ගික මඟ පෙන්වීමක් ලබා දීම
- බැංකුවේ සමස්ත උපාය මාර්ගික අරමුණු ඉටුකර ගැනීමට සහය වීම සඳහා ශ්‍රම බළකා සැළසුම් සහ වැඩසටහන් සංවර්ධනය කිරීම හා මෙහෙයවීම.
- ශ්‍රම බළකා පිරිවැය සම්බන්ධ අයවැය ඇස්තමේන්තු හා වැඩසටහන් සම්පාදනය සහ සියලු මානව සම්පත් ක්‍රියාකාරකම් පිරිවැය ඵලදායීව පවත්වාගෙන යාම.
- උපාය මාර්ගික පෙළගැස්වීම් සඳහා කාර්ය මණ්ඩල ව්‍යුහයන් ක්‍රියාකාරීත්වයන් හා සංයුතීන් සමාලෝචනය.
- නිපුණතා සංවර්ධනය හා ධාරිතා සැළසුම් කිරීම.
- අරමුණු හා සැළසුම් අත්කර ගැනීම සඳහා ප්‍රධාන කාර්ය සාධන නිර්ණායක ක්‍රමවේදය මගින් අරමුණු හා සැළසුම් අත්කර ගැනීමට කාර්ය මණ්ඩලය පෙළ ගැස්වීම
- බැංකු ක්ෂේත්‍රයේ පවතින ප්‍රමිතීන්ට ගැළපෙන. පරිදි පාරිශ්‍රමික ලබා දීම හා සේවක සුබසාධනය
- බැංකුවේ ප්‍රධාන තනතුරු දැරීමට සුදුසු දක්ෂතා සහිත කාර්ය මණ්ඩලය තෝරා ගැනීමට උපාය මාර්ග සකස් කිරීම.
- මානව සම්පත් කටයුතු පරිගණක යෙදවුම් ආශ්‍රිතව ඉටු කිරීම හා ප්‍රවර්ධනය
- මානව සම්පත් ප්‍රතිපත්ති හා ක්‍රියා පටිපාටි අඛණ්ඩව සමාලෝචනය , සංවර්ධනය කිරීම හා ක්‍රියාත්මක කිරීම.

පරිපාලනය

- බැංකුවේ සියලු ආකාරයේ ප්‍රසම්පාදන කටයුතු මෙහෙය වීම.
- ස්ථාවර වත්කම් , ප්‍රවාහන හා වෙනත් උපයෝගිතා සේවා ඇතුලත්ව පරිපාලන කටයුතු අධීක්ෂණය.
- බැංකුවේ ආරක්ෂක පියවර පිළිබඳව සමස්ත වගකීම.

ප්‍රධාන සුදුසුකම්

- පහත සඳහන් සුදුසුකම් අතුරින් අවම වශයෙන් එක් සුදුසුකමක් ලබා තිබීම.
  - අ.) පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධියක් සමග අදාළ ක්ෂේත්‍රයක පශ්චාත් උපාධි සුදුසුකම් හෝ පශ්චාත් උපාධි ඩිප්ලෝමා සුදුසුකම්

    හෝ
  - ආ.) බැංකුකරණයේ පූර්ණ වෘත්තීය සුදුසුකම ලබා තිබිය යුතුය
- ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 08 ක පළපුරුද්දක් තිබිය යුතු අතර, බැංකුවක හෝ මූල්‍ය ආයතනයක ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ පළපුරුද්ද විශේෂ සුදුසුකමක් වනු ඇත.
- මානව සම්පත පිළිබඳ පූර්ණ වෘත්තීය සුදුසුකම් සම්පූර්ණ කර තිබීම අමතර සුදුසුකමක් වනු ඇත.
- සේවකයින් 500 ට වැඩි සංඛ්‍යාවක් සේවයේ නිරත සේවා සැපයීමේ ආයතනයක මානව සම්පත් කළමනාකරණ ක්ෂේත්‍රයේ සියලු ප්‍රධාන විෂයන් ආවරණය වන පරිදි ක්‍රියාකාරකම් හැසිරවීමේ මනා පළපුරුද්දක් ලබා තිබීම.
- ස්වයංක්‍රිය මානව සම්පත් පද්ධතිය යොදා ගනිමින් මානව සම්පත මෙහෙයවීමේ හැකියාව හා ප්‍රාදේශීය මට්ටමින් කාර්යසාධන සමාලෝචන කටයුතු කිරීමේ හැකියාව
- විශිෂ්ට නායකත්වය, සාකච්ඡා කිරීමේ හැකියාව, විශ්ලේෂණ හැකියාව අන්තර් පුද්ගල හා සන්නිවේදන කුසලතාවලින් යුතු අයෙකු වීම
- ප්‍රසම්පාදන කණ්ඩායමට නායකත්වය දීම සඳහා බැංකුවේ ප්‍රසම්පාදනයේ සියලු අංශවල කටයුතු මෙහෙය වීමේ දැනුම හා ක්‍රියාත්මක කිරීමේ මනා පළපුරුද්දක් තිබීම.

ප්‍රධාන අවදානම් නිලධාරී

බැංකුව මුහුණදෙන ප්‍රධාන අවදානම් වන ණය වෙළඳපොළ හා මෙහෙයුම් අවදානම මනා ලෙස කළමනාකරණය හා ඒ පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වෙත නිරන්තරයෙන් වාර්තා කිරීමට ප්‍රධාන අවදානම් නිලධාරියා වගකිව යුතු වන අතර, අභ්‍යන්තර හා බාහිර නීතීන්, රෙගුලාසි හා ප්‍රමිතීන් වලට යටත්ව, අවදානම් හා ප්‍රතිලාභ මනා ලෙස කළමනාකරණය කරමින් ව්‍යාපාරයේ ප්‍රවර්ධනය සිදුවන බවට තහවුරු කළ යුතුය. බැංකුව විසින් මුහුණ දෙන සියලුම අවදානම් හඳුනා ගැනීම, අධීක්ෂණය, පාලනය, අවම කිරීම හා වාර්තා කිරීම සඳහා වූ සියලුම ප්‍රතිපත්තීන් සැකසීමේ මූලික වගකීම ප්‍රධාන අවතම් නිලධාරි සතුය.

ප්‍රධාන වගකීම්

- ඵලදායී ව්‍යාපාර වර්ධනයට සහය වීම සඳහා අධ්‍යක්ෂක මණ්ඩලයේ හා බැංකුවේ උපාය මාර්ගික සැලැස්මේ අවශ්‍යතා සපුරාලන ප්‍රමාණාත්මක හා ගුණාත්මක අවදානම් රුචි රාමුව සංවර්ධනය කිරීම සහ යාවත්කාලීන කිරීම.
- තිරසාර වර්ධනයක් අත්කර ගත හැකි ඉහල සාධනයක් සහ මනාව පාලනය කළ ආයතනයක් ඇති කිරීම සඳහා ආයතනික කළමනාකාරීත්වය හා අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සමග සමීපව කටයුතු කිරීම.
- ආයතනයෙහි අවදානම් කළමනාකරණය කිරීම සඳහා අවදානම් රාමුව අඛණ්ඩව සංවර්ධනය කිරීම, වැඩිදියුණු කිරීම හා ක්‍රියාවලීන් අරමුණු සඳහා සුදුසු බව සහතික කිරීම.
- ප්‍රමාණාත්මක හා ගුණාත්මක තක්සේරු කිරීමේ උපායමාර්ග තුළින් පවතින, නව හා ඇතිවිය හැකි අවදානම් තක්සේරු කිරීම හා ඒවා සඳහා තිරසාර විසඳුම් හඳුන්වා දීම හා ක්‍රියාත්මක කිරීම.
- ආයෝජන ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සහ තහවුරු කිරීම සඳහා අවශ්‍ය ආයතනික පාලන පද්ධති සහ කමිටු ව්‍යුහයක් ස්ථාපිත කිරීම හා පවත්වාගෙන යාම.
- බැංකුවේ අවදානම් මට්ටම සහ ව්‍යාපාර ක්‍රියාවලීන් බැංකුවේ අවදානම් රුචිය, බැංකුවේ අභ්‍යන්තර අවදානම් ප්‍රතිපත්තිය, අවදානම් කළමනාකරණය සඳහා වන නියාමන අවශ්‍යතාවන්ට අනුකූල බව සහතික කිරීම.
- එකඟ වූ හඳුනාගත් අවදානම් රාමුව පුහුණු කිරීම, සන්නිවේදනය හා ප්‍රවර්ධනය කිරීම තුළින් ආයතනය තුළ විශ්වාසදායක දැනුවත් අවදානම් සහිත ධනාත්මක අවධානම් කළමනාකරණ සංස්කෘතියක් ඇති කිරීම.
- ආයතනික කළමනාකරණයේ සාමාජිකයෙකු ලෙස ආයතනයේ වර්තමාන ගැටලු නිරාකරණය, කළමනාකරණය සඳහා අවශ්‍ය උපායමාර්ගයන් සැපයීම, සංවර්ධනය හා පවත්වාගෙන යාම.

ප්‍රධාන සුදුසුකම්

- පහත සඳහන් සුදුසුකම් අතුරින් අවම වශයෙන් එක් සුදුසුකමක් ලබා තිබීම.
  - අ.) පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධියක් සමඟ අදාළ ක්ෂේත්‍රයක පශ්චාත් උපාධි සුදුසුකම් හෝ පශ්චාත් උපාධි ඩිප්ලෝමා සුදුසුකම්

    හෝ
  - ආ.) බැංකුකරණයේ පූර්ණ වෘත්තීය සුදුසුකම ලබා තිබිය යුතුය
- බැංකුවක හෝ මූල්‍ය ආයතනයක ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ වසර 8 ක පළපුරුද්ද තිබිය යුතුය.
- ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමින් අවදානම් කළමනාකරණ ක්‍රියාකාරිත්වය හැසිරවීමේ පළපුරුද්ද අත්‍යවශ්‍ය වේ.
- ණය ඇගයීම හා අනුමත කිරීමේ ක්‍රියාවලියට පළපුරුද්ද අමතර සුදුසුකමක් වනු ඇත.
- සංකීර්ණ මූල්‍ය මෙහෙයුම් වලදී අවදානම්, අනුකූලතා හා පාලන ක්‍රියාකාරකම් කළමනාකරණය කිරීමේ හැකියාව ඇතුළුව නායකත්ව කුසලතා තිබිය යුතුය.
- අවදානම් කළමනාකරණය, පාලන රාමුව, ක්‍රමවේදයන් හා නව භාවිතයන් පිළිබඳ ඉහළ දැනුමක් තිබිය යුතුය.

ප්‍රධාන අභ්‍යන්තර විගණක

අභ්‍යන්තර විගණනයේ විෂය පථය තුළ බැංකුවේ ක්‍රියාකාරීත්වයේ අභ්‍යන්තර පාලනයන් ශක්තිමත් කිරීම සඳහා බැංකුවේ විගණන අත් පොතට අනුකූලව අඛණ්ඩව විගණනය සඳහා විගණන සැළසුම් මාසික / කාර්තුමය වශයෙන් වැඩසටහන් අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවට වාර්තා කිරීම සඳහා ප්‍රධාන අභ්‍යන්තර විගණක වගකිව යුතුය.

ක්‍රියාකාරී පිරිවැය ඵලදායි පාලනයන් ප්‍රවර්ධනය කිරීම සඳහා පිරිවැය අවම කිරීම, සේවා සැපයුම් ක්‍රියාවලින්හි කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම සඳහා වන යෝජනා ,සොයා ගැනීම්, නිරීක්ෂණ හා නිර්දේශයන් සහිත ස්වාධීන වාර්තා අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ සභාපති වෙත ඉදිරිපත් කළ යුතුය.

ප්‍රධාන වගකීම්

- මූල්‍ය වාර්තාකරණයට අදාළ අභ්‍යන්තර පාලනයක් කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් ක්‍රියාකාරීත්වයේ ඵලදායිතාවය සඳහා කළමනාකරණය විසින් හඳුන්වා දී ඇති අභ්‍යන්තර පාලනයන් සමාලෝචනය කිරීම , බැංකුවේ සියලු අංශ ආවරණය වන පරිදි පූර්ණ අභ්‍යන්තර විගණන සැළසුම් සංවර්ධනය කිරීම හා ක්‍රියාත්මක කිරීම්.
- බැංකුවේ මෙහෙයුම් කටයුතු හා අවදානම් කෙරෙහි සැළකිය යුතු බලපෑමක් ඇතිකළ හැකි නීති , රෙගුලාසි සහ විනය ක්‍රියාපටිපාටිවලට අනුකූල වීම සඳහා බැංකුවේ ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටි සමාලෝචනය කිරීම.
- අභ්‍යන්තර විගණන අංශයේ කාර්ය මණ්ඩලය ඔවුන්ගේ පූර්ණ හැකියාවන් කරා ළඟාවීම සඳහා පුහුණු කිරීම හා සංවර්ධනය කිරීම
- අවශ්‍ය අවස්ථාවන්හිදී පරීක්ෂණ පවත්වා විගණන කමිටුවට වාර්තා කිරීම
- විගණන කටයුතු සම්බන්ධයෙන් බාහිර විගණකවරුන්, රාජ්‍ය ආයතන හා වෙනත් රෙගුලාසි සමඟ සම්බන්ධීකරණය කිරීම
- සම්පත් පිරිමැසුම්දායීව හා කාර්යක්ෂමව යෙදවීම, සමාලෝචනය කිරීම, තක්සේරු කිරීම
- අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු සාකච්ඡා සඳහා සහය වීම

ප්‍රධාන සුදුසුකම්

අවම වශයෙන් පහත සඳහන් එක් වෘත්තීමය ආයතනයක සාමාජිකත්වය ලබා තිබිය යුතුය

- අ.) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය
- ආ.) එංගලන්තයේ සහ වේල්සයේ වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය
- ඇ.) එක්සත් රාජධානියේ සහතිකලත් වරලත් ගණකාධිකාරීන්ගේ සංගමය
- ඇ.) වරලත් කළමනාකරණ ගණකාධිකාරීවරුන් එක්සත් රාජධානිය / ශ්‍රී ලංකාව හෝ වෙනත් සමාන වෘත්තීය සුදුසුකම්

- ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ වසර 08 ක පළපුරුද්ද ලබා තිබිය යුතු අතර, ඉන් වසර 05 ක් බැංකුවක හෝ මූල්‍ය ආයතනයක අභ්‍යන්තර විගණන අංශයට අනුයුක්තව පළපුරුද්ද තිබිය යුතුය.
- තොරතුරු තාක්ෂණය පදනම් කරගත් විගණන ක්‍රමවේද පිළිබඳ දැනුම හා අත්දැකීම් තිබිය යුතුය.
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මගින් නිකුත් කර ඇති විගණන හා ගිණුම්කරණ ප්‍රමිතීන් පිළිබඳව හා අනෙකුත් රාජ්‍ය ආයතන හා ක්ෂේත්‍රයේ විශිෂ්ට භාවිතයන් පිළිබඳ දැනුම තිබිය යුතුය.
- පිරිස් කළමනාකරණය සහ අධ්‍යක්ෂක මණ්ඩල මට්ටමේ අන්තර් ක්‍රියාකාරීත්වයන් පිළිබඳ තහවුරු කළ හැකි වාර්තා ඉදිරිපත් කළ යුතුය.
- බැංකු ක්ෂේත්‍රයේ ආයතනික යහපාලන පිළිවෙත් සහ අනාවරණ අවශ්‍යතා පිළිබඳව දැනුම තිබිය යුතුය
- අන්තර්ජාතික මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් (IFRS) පිළිබඳ දැනුම සහිත වීම අමතර සුදුසුකමක් වනු ඇත.

වැටුප් හා දීමනා

තෝරාගනු ලබන අපේක්ෂකයන් වෙත ආකර්ෂණීය සාකච්ඡා කළහැකි වැටුප් හා දීමනා පැකේජයක් හිමිවනු ඇත.

අයදුම්පත් භාරගන්නා අවසාන දිනය

2020 ඔක්තෝබර් 20

අයදුම් කිරීම

උනන්දුවක් දක්වන සුදුසුකම්ලත් අපේක්ෂකයන් සිය අයදුම්පත්, ජීව විස්තර සහ අධ්‍යාපනික / වෘත්තීය සහතික සහ ඥාතීන් නොවන වෘත්තීයවේදී නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම් ලිපිනයන් සහ දුරකථන අංක සමග එවිය යුතුය. අයදුම්පත් බහාලන ලිපිකවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර සඳහන් කළ යුතුය.

වයස් සීමාව - බාහිර අයදුම්කරුවන්ගේ වයස අවු. 57 ට අඩු විය යුතු අතර, අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා වයස් සීමාව බල නොපවත්වනු ඇත.

සාමාන්‍යාධිකාරී / ප්‍රධාන විධායක නිලධාරී,
ප්‍රාදේශීය සංවර්ධන බැංකුව,
නො. 933, නුවර පාර, වෙදමුල්ල, කැලණිය.

නිපුණතා සංවර්ධන,
වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා
නවෝත්පාදන රාජ්‍ය අමාත්‍යාංශය

NAITA

ජාතික ආධුනිකත්ව හා කාර්මික අභ්‍යාස අධිකාරිය

මෙම අධිකාරියේ පහත දැක්වෙන තනතුරු සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ

01. අධ්‍යක්ෂ (අභ්‍යාස) තනතුර

සුදුසුකම් හා පළපුරුද්ද

බාහිර : (පහත 1 හෝ 2)

01. ඉංජිනේරු විද්‍යාව / තාක්ෂණවේදය / අධ්‍යාපනය / විද්‍යාව / කෘෂිකර්මය / ගණිත විෂයයන් පිළිබඳ, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් ප්‍රථම උපාධිය

සමග

ඉංජිනේරු විද්‍යාව / තාක්ෂණවේදය / අධ්‍යාපනය / විද්‍යාව / කෘෂිකර්මය / ගණිතය විෂයයන් පිළිබඳ, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් පශ්චාත් උපාධි උපාධියක් (මාස්ටර්) හෝ පිළිගත් වෘත්තීය ආයතනයක / IESL ඉහත විෂයයන්ට අදාළ ආශ්‍රිත සාමාජිකත්වය.

සංස්ථාවක. ව්‍යවස්ථාපිත මණ්ඩලයක / පිළිගත් වෙළඳ ආයතනයක තනතුරට අදාළ විෂය අවකාශයෙහි කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 15 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

02. ඉහත විෂයන්ට අදාළ, පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක පූර්ණ සාමාජිකත්වය

සහ

සංස්ථාවක ව්‍යවස්ථාපිත මණ්ඩලයක / පිළිගත් වෙළඳ ආයතනයක තනතුරට අදාළ විෂය අවකාශයෙහි කළමනාකාර මට්ටමේ අවම වශයෙන් වසර 15 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

අභ්‍යන්තර : (පහත 1 හෝ 2)

01. භාහිර අයදුම්කරුවන්ට අවශ්‍ය ඉහත සුදුසුකම් ලබා තිබීම.
02. කළමනාකරු (mm 1-1) ප්‍රභේදය ශ්‍රේණිය 1 තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවාකාලයක් සම්පූර්ණ කර තිබීම හෝ / සමග නයිටා (NAITA) හි(AR-1 ශ්‍රේණිය 1) ප්‍රභේදයේ අධ්‍යන / පර්යේෂණ හෝ තනතුරට අදාළ විෂය අවකාශයෙයි AR-2 ප්‍රභේදයේ අවම වශයෙන් වසර පහක (05) සේවා පළපුරුද්ද.

වැටුප : DMS චක්‍රලේඛ අංක 02/2016(1) - HM1 පරිදි
රු. 80,295 - 15x2,270 - 114,345 (මසකට)
(මීට අමතරව රජයේ අනුමත ජීවන වියදම් දීමනාව සහ වෘත්තීය දීමනාව ගෙවනු ලැබේ)
මහා භාණ්ඩාගාරයේ චක්‍රලේඛවලට අනුකූලව ප්‍රවාහණ පහසුකම් හා දුරකථන දීමනාව හිමිවේ.

02. සහකාර අධ්‍යක්ෂ (නඩත්තු හා සිවිල්)

සුදුසුකම් හා පළපුරුද්ද

බාහිර : (පහත 1 හෝ 2 හෝ 3 හෝ 4 තෝරාගන්න)

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) පිළිගත් සිවිල් ඉංජිනේරු විෂයෙහි ඉංජිනේරු විද්‍යාව / තාක්ෂණවේදය පිළිබඳ ප්‍රථම උපාධිය සමග සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ කනිෂ්ඨ කළමනාකාර මට්ටමේ වසර තුනක (03) පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.
02. පිළිගත් වරලත් ආයතනයකින් ලබාගත් අදාළ ක්ෂේත්‍රයේ අන්තර්මධ්‍යම මට්ටමේ සුදුසුකම්.
03. තෘතීය හා වෘතීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් තාක්ෂණික / වෘත්තීය අභ්‍යාස ආයතනයකින් නිකුත් කළ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) මට්ටම 07 ට වඩා නොඅඩු නිපුණතා සහතිකයක් ලබා තිබීම සමග සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ කනිෂ්ඨ කළමනාකාර මට්ටමේ වසර තුනක (03) පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද
04. ඕනෑම ඉංජිනේරුමය තාක්ෂණවේදයක (NDT/NDES/HNDE/D.Tech) ඩිප්ලෝමාවක් හෝ පිළිගත් විශ්වවිද්‍යාලයකින් / හෝ තාක්ෂණික හා වෘත්තීය අභ්‍යාස ආයතනයකින් මෙහෙයවනු ලබන තාක්ෂණික හා වෘත්තීය විෂයහි ඩිප්ලෝමාවක් සාර්ථකව නිමා කර තිබීම හෝ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් තාක්ෂණික / වෘත්තීය අභ්‍යාස ආයතනයකින් නිකුත් කළ NVQ මට්ටම 6 ට වඩා නොඅඩු නිපුණතා සහතිකයක් ලබා තිබීම සමග කණිෂ්ඨ කළමනාකාර මට්ටමේ වසර හයක (06) ඇතුළුව වසර 12 ක පළපුරුද්ද.

අභ්‍යාන්තර (පහත 1 හෝ 2 තෝරාගන්න)

01. භාහිර අයදුම්කරුවන් අවශ්‍ය ඉහත සුදුසුකම් ලබා තිබීම
02. තනතුරට අදාළ විෂය අවකාශයෙහි කනිෂ්ඨ කළමනාකාර (JM 1-1) ප්‍රභේදයේ තනතුරක සතුටුදායක වසර පහක (05) සේවා පළපුරුද්ද.

වැටුප : DMS චක්‍රලේඛ අංක 02/2016 පරිදි
රු. 53,175 - 10x1,375 - 15x1,910 - 95,575 (MM1-1)
(මීට අමතරව රජයේ අනුමත ජීවන වියදම් දීමනාව සහ වෘත්තීය දීමනාව ගෙවනු ලැබේ)
මහාභාණ්ඩාගාරයේ චක්‍රලේඛ පරිදි ප්‍රවාහන පහසුකම් හා දුරකථන දීමනාව හිමිවේ.

03. සහකාර අධ්‍යක්ෂ (සහතික කිරීම්) තනතුර
04. සහකාර අධ්‍යක්ෂ (විශේෂ කාර්මික අභ්‍යාස) තනතුර
05. සහකාර අධ්‍යක්ෂ (පර්ෂද) තනතුර

සුදුසුකම් හා පළපුරුද්ද

බාහිර : (පහත 1 හෝ 2 හෝ 3 හෝ 4)

01. ඉංජිනේරු විද්‍යාව / තාක්ෂණවේදය / ගණිතය / කෘෂිකර්මය / කළමනාකරණය / සමාජවිද්‍යාව / අධ්‍යාපන විෂයයන් පිළිබඳ UGC මගින් පිළිගත් ප්‍රථම උපාධියක් සමග ප්‍රථම උපාධිය ලබාගැනීමෙන් පසු සංස්ථාවක. ව්‍යවස්තාපිත මණ්ඩලයක / වෙළඳ ආයතනයක වසර තුනක (03) ක කනිෂ්ඨ කළමනාකාර මට්ටමේ පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.
02. ඉංජිනේරු කවුන්සිලයේ පැරණි විෂය නිර්දේශ II කොටස, නව විෂය නිර්දේශ III කොටස, ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ පැරණි විෂය නිර්දේශ II කොටස, නව විෂය නිර්දේශ III කොටස සමග සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / පිළිගත් වෙළඳ ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ කනිෂ්ඨ කළමනාකාර මට්ටමේ වසර තුනක (03) පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.
03. තෘතීය හා වෘතීය අධ්‍යාපන කොමිෂන් සභාව මගින් පිළිගත් කාර්මික / වෘත්තීය අභ්‍යාස ආයතනයකින් නිකුත් කළ NVQ මට්ටම 7 ට නොඅඩු නිපුණතා සහතිකයක් ලබා තිබීම සමග සංස්ථාවක ව්‍යවස්ථාපිත මණ්ඩලයක / පිළිගත් වෙළඳ ආයතනයක, අදාළ ක්ෂේත්‍රයේ කනිෂ්ඨ කළමනාකාර මට්ටමේ වසර තුනක (03) පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.
04. ඕනෑම ඉංජිනේරුමය තාක්ෂණවේද (NDT/NDES/HNDE/D. Tech) ඩිප්ලෝමාවක් හෝ පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ කාර්මික හා වෘතීය අභ්‍යාස ආයතනයකින් මෙහෙයවනු ලබන කාර්මික හා වෘතීය අධ්‍යාපන විෂයයෙහි ඩිප්ලෝමාවක් හෝ සාර්ථකව නිමාකර තිබීම හෝ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මගින් පිළිගත් කාර්මික / වෘත්තීය අභ්‍යාස ආයතනයකින් නිකුත් කළ NVQ මට්ටමට 06 ට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම සමග කනිෂ්ඨ කළමනාකාර මට්ටමේ වසර පහක් (05) ඇතුළුව වසර දෙළහක (12) පළපුරුද්ද.

අභ්‍යන්තර : (පහත 1 හෝ 2 තෝරාගන්න)

01. ඉහත භාහිර අයදුම්කරුවන්ට අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම.
02. තනතුරට අදාළ විෂය පරාසයේ කනිෂ්ඨ කළමනාකාර (JM 1-1) ප්‍රභේදයේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදයක සේවාවක් නිමා කර තිබීම.

වැටුප : DMS චක්‍රලේඛ අංක 02/2016 පරිදි
රු. 53,175 - 10x1,375 - 15x1,910 - 95,575 (MM1-1)
(මීට අමතරව රජයේ අනුමත ජීවන වියදම් දීමනාව සහ වෘත්තීය දීමනාව ගෙවනු ලැබේ)
මහාභාණ්ඩාගාරයේ චක්‍රලේඛ පරිදි ප්‍රවාහන පහසුකම් හා දුරකථන දීමනාව හිමිවේ.

06. අධ්‍යක්ෂ / විදුහල්පති තනතුර - කාර්මික ඉංජිනේරු අභ්‍යාස ආයතනය - කටුබැද්ද

සුදුසුකම් හා පළපුරුද්ද

බාහිර : (පහත 1 හෝ 2 තෝරා ගන්න)

01. UGC මගින් පිළිගත් ඉංජිනේරු විද්‍යාව / තාක්ෂණවේදය / අධ්‍යාපනය / විද්‍යාව / කෘෂිකර්මය / ගණිතය විෂයයන් පිළිබඳව විශේෂ උපාධියක්

සමග

ඉංජිනේරු විද්‍යාව / තාක්ෂණවේදය / අධ්‍යාපනය / විද්‍යාව / කෘෂිකර්මය / ගණිතය ක්ෂේත්‍රයන් පිළිබඳ පශ්චාත් උපාධි උපාධි සුදුසුකම් (මාස්ටර්ස්)

සහ

ප්‍රථම උපාධිය ලබාගැනීමෙන් පසුව පර්යේෂණ / අධ්‍යන පිළිබඳව සංස්ථාවක, මණ්ඩලයක / ව්‍යවස්ථාපිත ආයතනයක අවම වශයෙන් වසර අටක (08) පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

02. UGC මගින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඉංජිනේරු විද්‍යාව / තාක්ෂණ වේදය / තාක්ෂණ හා වෘතීය අධ්‍යාපනය / විද්‍යාව / කෘෂිකර්මය / ගණිතය විෂයයන් පිළිබඳව විශේෂ උපාධියක්

සමග

අදාළ ක්ෂේත්‍රයක PhD (ආචාර්ය) උපාධිය

සහ

ප්‍රථම උපාධිය ලබාගැනීමෙන් පසුව සංස්ථාවක, මණ්ඩලයක / ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් අභ්‍යාස ආයතනයක අවම වශයෙන් වසර පහක (05) පර්යේෂණ / අධ්‍යන පළපුරුද්ද.

අභ්‍යන්තර (පහත 1 හෝ 2 හෝ 3 හෝ 4 හෝ 5 තෝරාගන්න)

01. ඉහත භාහිර අයදුම්කරුවන්ට අවශ්‍යවන සුදුසුකම් ලබාතිබීම
02. UGC මගින් පිළිගත්, ඉංජිනේරු විද්‍යාව / තාක්ෂණවේදය / තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය පිළිබඳ ප්‍රථම උපාධිය හෝ තාක්ෂණ වේදය / අධ්‍යාපනය / විද්‍යාව / ගණිතය විෂයන් පිළිබඳව සාමාන්‍ය උපාධියක්

සමග

ඉංජිනේරු විද්‍යාව / තාක්ෂණවේදය / තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය / විද්‍යාව / කෘෂිකර්මය / ගණිතය විෂයයන් පිළිබඳව පශ්චාත් උපාධි සුදුසුකම්

සහ

අධ්‍යාපන / පර්යේෂණ (AR 1) ප්‍රභේදයේ තනතුරක අවම වශයෙන් වසර අටක (08) සතුටුදයක සේවා පළපුරුද්ද.

03. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින් / තාක්ෂණික / වෘත්තීය අභ්‍යාස ආයතනයකින් නිකුත් කළ NVQ මට්ටම 7 ට වඩා නොඅඩු නිපුණතා සහතිකයක් ලබාතිබීම

සමග

තාක්ෂණවේදය / තාක්ෂණ හා වෘත්තීය අධ්‍යාපනය විෂයයන්හි පශ්චාත් උපාධි සුදුසුකම්

සහ

අධ්‍යයන / පර්යේෂණ (AR-1) ප්‍රභේදයේ තනතුරක අවම වශයෙන් වසර දෙළහක (12) සතුටුදයක සේවා පළපුරුද්ද

04. පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ තාක්ෂණික හෝ වෘත්තීය අභ්‍යාස ආයතනයකින් මෙහෙයවනු ලබන ඉංජිනේරුමය තාක්ෂණවේදය (NDT/NDES/HNDE/D. Jech) ඩිප්ලෝමාවක් සාර්ථකව නිමකර තිබීම, හෝ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මගින් පිළිගත් තාක්ෂණික / වෘත්තීය අභ්‍යාස ආයතනයකින් නිකුත් කළ NVQ මට්ටම 06 ට වඩා නොඅඩු නිපුණතා සහතිකයක් ලබා තිබීම

සමග

ඉංජිනේරු විද්‍යාව / තාක්ෂණ වේදය / අධ්‍යාපනය / විද්‍යාව / කෘෂිකර්මය / ගණිතය විෂයයන් පිළිබඳ වසර දෙකක පශ්චාත් උපාධි සුදුසුකම්

සහ

අධ්‍යන / පර්යේෂණ (AR-1) තනතුරක අවම වශයෙන් වසර දහතරක (14) සතුටුදයක සේවා පළපුරුද්ද.

වැටුප : DMS චක්‍රලේඛ අංක 02/2016(1) පරිදි
(මීට අමතරව රජයේ අනුමත ජීවන වියදම් දීමනාව සහ වෘත්තීය දීමනාව ගෙවනු ලැබේ)
මහාභාණ්ඩාගාර චක්‍රලේඛ පරිදි ප්‍රවාහන පහසුකම් හා දුරකථන දීමනාව හිමිවේ

07. නියෝජ්‍ය විදුහල්පති තනතුර - කාර්මික ඉංජිනේරු අභ්‍යාස ආයතනය - කටුබැද්ද

සුදුසුකම් හා පළපුරුද්ද

බාහිර : (පහත 1 හෝ 2 හෝ 3)

01. UGC මගින් පිළිගත්, ඉංජිනේරු විද්‍යාව / තාක්ෂණවේදය / අධ්‍යාපනය / විද්‍යාව / ගණිතය විෂයයන් පිළිබඳ විශේෂ උපාධියක්.
02. UGC මගින් පිළිගත්, ඉංජිනේරු විද්‍යාව / තාක්ෂණ වේදය / තාක්ෂණික හා වෘතීය අධ්‍යාපනය / විද්‍යාව / ගණිතය විෂයයන් පිළිබඳව සාමාන්‍ය උපාධියක් හෝ අදාළ ක්ෂේත්‍රයන්හි පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සහිත සමාන සුදුසුකම්.
03. ඉංජිනේරු විද්‍යාව / විද්‍යාව / කෘෂිකර්මය / ගණිතය ක්ෂේත්‍රයන්හි, පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය

අභ්‍යන්තර (පහත 1 හෝ 2)

01. ඉහත භාහිර අයදුම්කරුවන්ට අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම.
02. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ MA-4 ප්‍රභේදයේ වසර අටක (08) සතුටුදයක සේවා පළපුරුද්ද

වැටුප : DMS චක්‍රලේඛ අංක 02/2016(1) පරිදි
රු. 53,150 - 10x1,375 - 15x1,910 - 95,560 (AR-1)
(මීට අමතරව රජයේ අනුමත ජීවන වියදම් දීමනාව සහ වෘත්තීය දීමනාව ගෙවනු ලැබේ)
මහාභාණ්ඩාගාර චක්‍රලේඛ පරිදි දුරකථන දීමනාව හිමිවේ

සභාපති,
ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරිය,
අංක 971, ශ්‍රී ජයවර්ධනපුර මාවත, වැලිකඩ, රාජගිරිය.
දුරකථන අංකය : 011-2888782-5

www.naita.gov.lk

නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන,
පර්යේෂණ හා නවෝත්පාදන
රාජ්‍ය අමාත්‍යාංශය

NAITA

ජාතික ආධුනිකත්ව හා කාර්මික අභ්‍යාස අධිකාරිය

මෙම අධිකාරියේ පහත සඳහන් තනතුරු සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

08. කටිකාචාර්ය තනතුර II ශ්‍රේණිය

ඉංජිනේරු තාක්ෂණ අයතනය - කටුනායක
කාර්මික ඉංජිනේරු පුහුණු ආයතනය - කටුබැද්ද
මෝටර් රථ ඉංජිනේරු පුහුණු ආයතනය - ඔරුගොඩවත්ත

සුදුසුකම් හා පළපුරුද්ද

බාහිර : (පහත 1 හෝ 2 හෝ 3)

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ඉංජිනේරු / තාක්ෂණවේදය / අධ්‍යාපන / විද්‍යාව / ගණිතය යන විෂයන්හි විශේෂ උපාධියක් ලබා තිබීම.

02. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ඉංජිනේරු / තාක්ෂණවේදය / කාර්මික හා වෘත්තීය අධ්‍යාපනය / විද්‍යාව / ගණිතය යන විෂයන් හි සාමාන්‍ය උපාධියක් හෝ සාමාන සුදුසුකමක් සමග අදාළ ක්ෂේත්‍රයන්හි පශ්චාත් උපාධියක් ලබා තිබීම.

03. ඉංජිනේරු / විද්‍යාව / කෘෂිකර්ම / ගණිතය විෂයන් පිළිබඳ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම.

අභ්‍යන්තර (පහත 1 හෝ 2)

01. ඉහත බාහිර අපේක්ෂකයන්ට අවශ්‍ය සුදුසුකම් සපුරා තිබීම.

02. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ MA-4 කාණ්ඩයේ වසර අටක (08) සාර්ථක සේවාවක් සම්පූර්ණ කර තිබීම.

වැටුප : අංක 02/2016(i) දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ පරිදි
රු. 53,150- 10x1,375 - 15x1,910 - 95,550 (AR-1)
(එයට අමතරව රජය විසින් අනුමත කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවනු ලැබේ)
මහාභාණ්ඩාගාර චක්‍රලේඛ පරිදි දුරකථන දීමනාවක් ගෙවනු ලැබේ.

අදාළ ක්ෂේත්‍රයන් :

- මෝටර් රථ තාක්ෂණය - විදුලි හා විද්‍යුත් තාක්ෂණය - ICT
- යාන්ත්‍රික තාක්ෂණය - ඉදිකිරීම් තාක්ෂණය

09. අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් සහ නීති නිලධාර් II වන ශ්‍රේණිය

සුදුසුකම් හා පළපුරුද්ද :

ශ්‍රේෂ්ඨාධිකරණ නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් සමග අදාළ ක්ෂේත්‍රයේ සංස්ථාවක ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ පිළිගත් පුද්ගලික ආයතනයක වසරක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

වැටුප : අංක 02/2016(i) දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛය පරිදි
රු. 42,600 - 10x755 - 18x1,135 - 70,580 (JM 1-1)
(එයට අමතරව රජය විසින් අනුමත කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවනු ලැබේ)

10. පරීක්ෂක තනතුර - III වන ශ්‍රේණිය

(ප්‍රධාන කාර්යාලයේ සහ දිස්ත්‍රික් කාර්යාලවල ඇබෑර්තු ඇත)
- අදාළ දිස්ත්‍රික්කවලින් බඳවා ගනු ලැබේ.

සුදුසුකම් හා පළපුරුද්ද :

බාහිර : (පහත 1 හෝ 2 හෝ 3 හෝ 4 හෝ 5)

01. ඉංජිනේරු / විද්‍යාව / තාක්ෂණවේදය / අධ්‍යාපනය / ගණිතය / කෘෂිකර්ම / කළමනාකරණ / වාණිජ / සමාජ විද්‍යාව යන විෂයන් හි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ප්‍රථම උපාධියක් හෝ සමාන සුදුසුකමක්.

02. ඉංජිනේරු සභාවේ පැරණි විෂය නිර්දේශයේ II වන කොටස, නව විෂය නිර්දේශයේ III වන කොටස / ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ පැරණි විෂය නිර්දේශයේ II වන කොටස, නව විෂය නිර්දේශයේ III වන කොටස.

03. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික / වෘත්තීය අධ්‍යාපන පුහුණු ආයතනයක් විසින් පිරිනමනු ලබන ජාතික වෘත්තීය සුදුසුකම් 07 මට්ටමට (NVQ Level 07) නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

04. පිළිගත් විශ්වවිද්‍යාලයක් හෝ කාර්මික සහ වෘත්තීය පුහුණු ආයතනයක් විසින් පවත්වනු ලබන ඉංජිනේරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාව (NDT/NDES/HNDE/D.Tech) සාර්ථකව සම්පූර්ණ කර තිබීම හෝ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයක් හෝ විශ්වවිද්‍යාලයක් විසින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තීය සුදුසුකම් 06 මට්ටමට (NVQ Level 06) නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම සමග සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසර පහක (05) පශ්චාත් සුදුසුකම් පළපුරුද්දක් ලබා තිබීම.

05. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 05 ට (NVQ Level 05) නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම සමග සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් සුදුසුකම් පළපුරුද්දක් ලබා තිබීම.

අභ්‍යන්තර, (පහත 1 හෝ 2)

01. ඉහත බාහිර අපේක්ෂකයන්ට අවශ්‍ය සුදුසුකම් සපුරා තිබීම.

02. අදාළ ක්ෂේත්‍රයේ ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරියේ කළමනාකරණ සහකාර තාක්ෂණික (MA 2-2) තනතුරක වසර අටක (08) සාර්ථක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

වැටුප : අංක 02/2016(i) දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ චක්‍ර ලේඛය පරිදි
රු. 37,970 - 10x755 - 15x930 - 5x1,135 - 65,145 (MA-4)
(එයට අමතරව රජය විසින් අනුමත කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවනු ලැබේ.

වයස් සීමාව :

අධ්‍යක්ෂ (අභ්‍යාස) - වයස අවුරුදු 35 ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 55 ට වැඩි නොවිය යුතුය.
අධ්‍යක්ෂ / විදුහල්පති - වයස අවුරුදු 30 ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 55 ට වැඩි නොවිය යුතුය.
සහකාර අධ්‍යක්ෂ / නියෝජ්‍ය විදුහල්පති / කටිකාචාර්ය II වන ශ්‍රේණිය / අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් හා නීති නිලධාර් II වන ශ්‍රේණිය / පරීක්ෂක III වන ශ්‍රේණිය - වයස අවුරුදු 22 ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 45 ට වැඩි නොවිය යුතුය.
(අභ්‍යන්තර අපේක්ෂකයන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ)

පොදු කොන්දේසි :

රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලය සහ රජයේ දෙපාර්තමේන්තුවල සේවයේ නියුතු සේවකයන් අදාළ ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් තම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. සවිස්තරාත්මක ජීව දත්ත සහ ඥාතීන් නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම, ලිපිනය හා දුරකථන අංක සහිතව විස්තර ඇතුළත් අයදුම්පත් අදාළ සහතිකවල තමන් විසින්ම සහතික කරන ලද පිටපත් සමගින් 2020 ඔක්තෝබර් 26 වෙනි දින හෝ ඊට පෙර ලැබෙන පරිදි **"සභාපති, ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරිය, අංක 971, ශ්‍රී ජයවර්ධනපුර මාවත, වැලිකඩ, රාජගිරිය"** යන ලිපිනයට ලියාපදිංචි තැපැල් මගින් යොමු කළ යුතුය. අයදුම්පත් බහා එවනු ලංකා කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර සඳහන් කළ යුතු අතර, අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. කෙටි ලයිස්තුගත කරන ලද අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

සභාපති,
ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරිය,
අංක 971, ශ්‍රී ජයවර්ධනපුර මාවත, වැලිකඩ,
රාජගිරිය.
දුරකථන අංකය : 011-2888782-5

www.naita.gov.lk

වසර මිලියන හතකට එහා පරිණාමය දක්වන

උකුවෙලගේ රළු අං කටුස්සා

Ceratophora stoddartii[Grey, 1835]
සතරමුව අං කටුස්සා (ග්‍රේ - 1835)

Ceratophora aspera[Gunther, 1835]
රළු අං කටුස්සා (ගන්තර් (1835)

Ceratophora tennentii[Gunther,1861]
දුම්බර අං කටුස්සා (ගන්තර් - 1861)

Ceratophora karu[Pethiyagoda & Manamendra arachhi,1998]
කරුගේ අං කටුස්සා(පෙතියාගොඩ සහ මනමේන්ද්‍ර ආරච්චි-1998)

Ceratophora erdeleni[Pethiyagoda & Manamendra -arachhi,1998]
අර්ඩ්ලන්ගේ අං කටුස්සා(පෙතියගොඩ සහ මනමේන්ද්‍ර ආරච්චි -1998)

Ukuwela's horned lizard(Ceratophora ukuwelai) 2020
උකුවෙල අං කටුස්සා(සුරන්ජිත් කරුණාරත්න-2020)

● **රසික කොටුදුරගේ**

ජෛව විවිධත්වය අතින් ඉතාම පොහොසත් රටක් වන ශ්‍රී ලංකාව, ඉතා ඉහළ උරග විවිධත්වයකට සහ ආවේණිකත්වයකට හිමිකම් කියයි. ශ්‍රී ලංකාවේ හමුවන උරග විශේෂ 238 න් 155(65.1%) ක්ම මෙරටට ආවේණිකය. මේ අතර, කටුසු විශේෂ බොහෝමයක් දෙස් විදෙස් විද්‍යාඥයින් සහ පර්යේෂකයින් විසින් දැනට අධ්‍යයනය කර වාර්තාගත කොට ඇත. මේ අය අතර, කැලුම් මනමේන්ද්‍ර ආරච්චි, ආචාර්ය රොහාන් පෙතියාගොඩ, තසුන් අමරසිංහ, මොහොමඩ් බාහීර්, සුරන්ජන් කරුණාරත්න, මහාචාර්ය අංජන සිල්වා සහ මහාචාර්ය කලණ මාදුවගේ වැනි පර්යේෂකයන් දේශීය පර්යේෂකයන් අතර ඉදිරියෙන් සිටිති.

ඔවුනට අනුව, මේ වනවිට ශ්‍රී ලංකාවෙන් කටුසු විශේෂ 22ක් දැනට හඳුනාගෙන ඇති අතර, 1998න් පසුව ඊට කටුසු විශේෂ හතක් අලුතින් එකතු වී ඇත. එයින් Ceratophora ගණයට අයත් අං කටුස්සන් විශේෂිත වන්නේ මෙම ගණය ශ්‍රී ලංකාවට පමණකත් ආවේණික බැවිනි. මෙම නව අං කටුසු විශේෂය සමඟ එම ගණයට අයත් විශේෂ සංඛ්‍යාව 06 දක්වා ඉහළ යයි. මෙම විශේෂ 06 ම ශ්‍රී ලංකාවට ආවේණික වේ. මෙකී අං කටුසු විශේෂ හය හමු වන්නේ තෙත් කලාපයේ දී වීම ද විශේෂිතය.

මේ වනවිට හඳුනා ගෙන ඇති ශ්‍රී ලංකාවට ආවේණික Ceratophora ගණයේ විශේෂ 6න් කඟමුව අං කටුස්සා Ceratophora stoddartii නම් පළමු විශේෂය විස්තර කරන ලද්දේ ග්‍රේ නමැත්තා විසිනි, ඒ 1835 වසරේදීය. පසුව දුම්බර අං කටුස්සා Ceratophora tennentii සොයාගන්නා ලද්දේ ගන්ත නමැත්තා විසිනි, ඒ 1861 වසරේදීය. තුන්වන විශේෂය වන රළු අං කටුස්සා Ceratophora aspera සොයාගන්නා ලද්දේ වර්ෂ 1835 දී ගන්ත විසින්ම ය.

අවසන් වරට විස්තර කරන ලද්දේ රක්වාන කඳුවැටිය ආශ්‍රිතව ව්‍යාප්තව සිටින අර්ඩ්ලන්ගේ අං කටුස්සා Ceratophora erdeleni හා කරුගේ අං කටුස්සා Ceratophora karu යන විශේෂ දෙකය, ඒ 1998 වසරේදී කැළුම් මනමේන්ද්‍ර ආරච්චි හා රොහාන් පෙතියාගොඩ ගේ මැදිහත් වීමෙනි.

Ceratophora aspera (රළු අං කටුස්සා) ශ්‍රී ලංකාවේ වැඩිම භූගෝලීය ව්‍යාප්තිය දක්වන විශේෂයක් ලෙස හඳුන්වනු ලබන අතර, එම විශේෂය කෞතුකාගාර නිදර්ශක හා පහතරට තෙත් කළාපයේ ඇතැම් ප්‍රදේශවලින් හමුවන සතුන්ගේ ලක්ෂණවලින් වෙනස් විය.

ඒ බව ක්ෂේත්‍ර ජීව විද්‍යාඥ සුරංජන් කරුණාරත්න ඇතුළු පර්යේෂක කණ්ඩායමට හඳුනාගැනීමට හැකි විය. ඒ අනුව සිදු කළ රූප විද්‍යාත්මක හා ජානමය පර්යේෂණ මගින් කෑගල්ල දිස්ත්‍රික්කයේ සල්ගල වනයේ සිටින ගහණය නව විශේෂයක් ලෙස හඳුනාගැනීමට ඔවුන්ට හැකි විය.

මේ නව විශේෂය රජරට විශ්ව විද්‍යාලයේ පරිණාමික ජීවවිද්‍යාඥ හා උරග හා උභයජීවී විද්‍යාඥ ආචාර්ය කණිෂ්ක උකුවෙල විසින් මෙරට සත්ව සංරක්ෂණය හා සතුන් අධ්‍යයනයට ඉටු කළ මෙහෙය වෙනුවෙන් ඔහුට ගෞරව පිණිස "උකුවෙලගේ රළු-අං කටුස්සා" ලෙස නම් කිරීමට ඔවුන් කටයුතු කර ඇත. විද්‍යාත්මකව Ceratophora ukuwelai ලෙසද ඉංග්‍රීසි බසින් Ukuwela's Rough-horn Lizard ලෙසින්ද නව විශේෂය නම් කර ඇත.

නව විශේෂය රළු අං කටුස්සාගෙන් ජානමය වශයෙන් (ND2) 9.6% වෙනස් වන අතර මෙම විශේෂ දෙක වෙන් වෙන්ව පරිණාමය වී ඇත්තේ වසර මිලියන 7.8කට පමණ පෙර මයෝසීන අවධියේ අවසාන කාලයේ පමණ බව විශ්වාස කරයි. තවද නව විශේෂය රළු-අං කටුස්සාගෙන් පහත සඳහන් රූප විද්‍යාත්මක ලක්ෂණ මගින් වෙනස් වේ.

supraciliary කොරල සංඛ්‍යාව, උදරීය කොරල සංඛ්‍යාව හා paravertebral කොරල සංඛ්‍යාව සාපේක්ෂව අඩු අගයක් ගනී. මධ්‍ය දේහ කොරල අගය වැඩි සංඛ්‍යාවක් ගන්නා අතර සාපේක්ෂව දිගින් වැඩි කඳ (trunk) ප්‍රදේශයක් සහිත ය.

මෙම නව විශේෂය රතු දත්ත වාර්තාව හෙවත් දැඩි ලෙස තර්ජනයට ලක් වූ (CR - Critically Endangered) විශේෂයක් ලෙස සලකා ඊට ඇතුළත් කිරීමට නිර්දේශ කර ඇත. මෙම විශේෂයත් සමඟ ශ්‍රී ලංකාවේ අං කටුස්සන් විශේෂ සංඛ්‍යාව 6ක් දක්වා වැඩිවන අතර Ceratophora aspera විශේෂය ශ්‍රී ලංකාවේ දකුණු දෙසට වන්නට ඇති පහතරට තෙත් වනාන්තරවලට සීමා වේ. මොවුන්ගේ හොම්බේ ඉහළ කෙළවරේ පිහිටන අඟක් වැනි උපාංගය නිසා අං කටුස්සන් ලෙස හඳුන්වන අතර එහි හැඩය විශේෂයෙන් විශේෂයට වෙනස් වේ.

පිරිමි සතුන්ගේ මෙය හොඳින් වැඩෙන අතර එහි පරිණාමික වැදගත්කම විරුද්ධ ලිංගිකයින් ආකර්ෂණය කරගැනීම ලෙස උපකල්පනය කළ හැකිය.

Agamidae කුලයට අයත් වෙන සෙරාටෝෆෝරා (Ceratophora) ගණයේ අං කටුසු විශේෂ ශ්‍රී ලංකාවේ කඳුකර වලාකුල් වනාන්තර, උප කඳුකර වනාන්තර සහ පහතරට තෙත් කලාපීය වැසි වනාන්තරවල ව්‍යාප්තව සිටින අතර වියළි කලාපයේ දී හමු නොවෙයි.

මෙසේ දිවයිනේ කඳුකරයට සහ තෙත් කලාපයට පමණක් සීමා වූ ව්‍යාප්ති කලාපය මොවුන්ගේ අවේණිකත්වයට ප්‍රධානතම හේතුව ලෙස සැලකිය හැකිය. අං කටුසු විශේෂ 6ය අතුරින් කඟමුව අං කටුස්සා (Ceratophora stoddartii [Grey,1835]), දුම්බර අං කටුස්සා (Ceratophora tennentii [Gunther,1861]) සහ අර්ඩ්ලන්ගේ අං කටුස්සා (Ceratophora erdeleni [Pethiyagoda & Manamendra-Aarachhi,1998]) පිළිවලින් මධ්‍යම කඳුකරය, නකල්ස් කඳුකරය සහ රක්වාන කඳුවැටියේ මුහුදු මට්ටම සිට මීටර් 900කට වඩා උස වලාකුල් වනාන්තරවලට සීමාවී ඇත. මොවුන් දිවාකාලයේ ගස් කඳන් මත දිවිගේවනු දැකගත හැකිය.

රළු අං කටුස්සා (Ceratophora aspera [Gunther, 1864]) පහතරට තෙත් කලාපය පුරා වැසි වනාන්තරවල දිරායන කොළ රොඩු අතර ජීවත් වේ.

ශ්‍රී ලංකාවේ කුඩාම සහ ඉතාමත් දුර්ලභ අං කටුසු විශේෂයක් වන කරුගේ අංකටුස්සා (Ceratophora karu [Pethiyagoda & Manamendra-Aarachhi,1998]) රක්වාන කඳුවැටියේ ඉතාමත් සීමිත ස්ථාන කිහිපයක වළාකුල් වනාන්තරවල තෙතමනය සහිත දිරායන කොළ රොඩු අතර ජීවත්වේ.

මෙම නව රළු අං කටුසු විශේෂය සොයාගැනීමට සුරංජන් කරුණාරත්න සහ චාමර අමරසිංහ ප්‍රධාන කාර්යයක් සිදු කළ අතර නිකොලොයි පොයර්කොව්, තිළිණ සුරසිංහ, ඇන්ඩ්‍රෙ බුසෙව්, ඇන්ස්ලම් ද සිල්වා, ව්ලැඩිස්ලේව් ගොරින් හා මජින්ත මඩවල යන දෙස් විදේස් පර්යේෂකයන් ඊට මහඟු දායකත්වයක් සපයා ඇත. ජෛව විවිධත්වය රැක ගැනීම මෙරට මානව වංශකතාවේ පූර්වජයන් බව සනාථ කිරීමට මහත් පිටුබලයක් සපයන අතර එක් පසෙකින් අප්‍රිකානු මහද්වීපයටත් අනෙක් පසින් ආසියාවටත් නෑකම් කීමට අපට එකවර හැකි වී තිබේ. එනිසා අප වනාන්තර එළි කිරීමේදී මෙකී වටිනාකම පිළිබඳව අවදියෙන් කටයුතු කළ යුතුය. නැතිනම් මානව පරිණාමයේ ඓතිහාසික භූමිකාව අපෙන් සදහාටම තුරන් වී යනු ඇත.

(ඡායාරූප අන්තර් ජාලයෙනි.)

Ceratophora ukuwelai
උකුවෙල රළු අං කටුස්සා

තරුණයන් පරදා යූ ටියුබයේ කප් ගැසූ රෝහණ වීරසිංහ

● ඉනෝකා සමරවික්‍රම

දශක කිහිපයකට පෙර අප අලුත් ගීතයක්, අලුත් ගායකයකුගේ හඬක් ඇසුවා නම් ඇසුවේ ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවෙන් පමණි. එදා ගුවන් විදුලියෙන් බිහි වූ ගීතවලට යම් ප්‍රමිතියක් තිබුණා යැයි කීමේ වරදක් ද නැත. ඒ එවකට සංගීතය ගැන මනා දැනුමක් ඇති සංගීත ශිල්පීන්, සිංහල සාහිත්‍ය, භාෂාව ගැන දැනුම ඇත්තන් විසින් පද රචනා කළ, මෙන්ම ගායනය ගැන සුවිශේෂී හැකියාවන් ඇති අයගේ සුසංයෝගයෙන් බිහි වූ ගීත රසිකයන්ට අසන්නට ලැබුණ බැවිනි. කාලය ගෙවී යෑමත් සමඟ ඒ තත්ත්වය වෙනස් වී ඇත. දැන් අලුත් ගීතයක් අසන්ට ලැබෙන්නේ අන්තර්ජාලය හරහා ය; යූ ටියුබ්යෙනි. විවිධ නාලිකා ඔස්සේ අලුත් නිර්මාණයක් අසන්නට ලැබුණ ද ඇතැම් නිර්මාණ සාර්ථක නැතැයි සිතේ. කොහොම වුණත් අදත් අපි බොහෝ විට රස විඳින්නේ මීට දශක පහයකට පෙර ඇසූ ගීතය. ඒ ගීත පද ද අදටත් මතකයේ රැඳී ඇත.

දැන් ඒ යුගය නිමා වී ඇත. අද බිහිවෙන ඇතැම් ගීත ඇසුවා පමණි; පද මතක නැත. කොහොම වුණත් විද්‍යුත් නාලිකා ඔස්සේ නොව අන්තර්ජාලයට මුදා හරින ලද ගී අතරිනුත් තවමත් දශක ගණනකට පෙර අසන ලද මෙන්ම, ප්‍රවීණයන් විසින් සංගීත නිර්මාණය කළ, පද රචනා කළ, ගායනා කරන ලද ගීත වලට ඉල්ලුමක් ඇතැයි කියන්නට අපට සිදු වී ඇත. එසේ කියන්නට හේතු සාධක ද ඇත. අලුත්ම හේතු සාධකය නම් ආචාර්ය රෝහණ වීරසිංහයන්ගේ නමින් ඇති යූ ටියුබ් චැනලය පළමු තැන ලැබීමය.

දශක ගණනාවක් තිස්සේ රසික ප්‍රසාදයට ලබල සම්මානනීය සංගීතවේදි ආචාර්ය රෝහණ වීරසිංහයන් ගෙන් මේ සම්බන්ධව විමසීමක් කළෙමු.

"යූ ටියුබ් නාලිකාවක වැදගත්කම මා සමඟ කතා කළේ භාතිය ජයකොඩි, සනුක වික්‍රමසිංහ සංතුෂ් ආදි තරුණ නිර්මාණකරුවන් මා සමඟ අලුත් තාක්ෂණ ගැන කතා කළා. ඒ අයගේ පෙලඹවීමේ ප්‍රතිඵලයක් තමයි මේ යූ ටියුබ් චැනලය. අන්තර්ජාලය පිළිබඳ මගේ උනන්දුව වැඩිවෙන්න අනෙක් හේතුව තමයි මගේ ලොකු පුතා. ඔහු මේ වනවිට ඕස්ට්‍රේලියානු රජයේ පරිගණක තාක්ෂණිකවේදීයෙකු ලෙස කටයුතු කිරීම.

රෝහණ වීරසිංහයන්ගේ යූ ටියුබය සැදූ රනුර පෙරේරා

කොහොම වුණත් තරුණ සංගීතවේදීන්ගේ පෙලඹවීම නිසයි මෙහෙම දෙයක් වුණේ.

පරිගණක තාක්ෂණ ශිල්පියෙකු වන රනුර පෙරේරා තමයි මේ කටයුත්ත අපට කරලා දුන්නේ. මගේ ජනප්‍රිය නිර්මාණ රැසක් තෝරාගෙන මේ සඳහා යොදා ගත්තා. මුලදී යුටියුබ් ආයතනය අපට පරිවාස කාලයක් ලබා දුන්නා. ඒ ආයතනයේ යම් කොන්දේසි ටිකක් තියෙනවා. අපේ නාලිකාවට ප්‍රතිචාර දක්වන්නන් පිළිබඳ ඔවුන් විමසිලිමත්. මේ මූලික කටයුතු වලින් පසුව තමයි ඔවුන් අපේ චැනලය අරඹන්නේ. මුලදි මේ සඳහා යම් මුදලක් වැය කළ යුතුයි. චැනලය ආරම්භ කර මාස හතකට පසු යම් ආදායමක් ලබන්නට අපට පුළුවන් වුණා. යමෙක් ගීතයත් නැරඹූ පමණින් ඇසූ පමණින් අපට මුදල් ලැබෙන්නේ නෑ. කවුරුන් හෝ ගීතය බාගත කළ පසුව තමයි මුදල් ලැබෙන්නේ. මේ යූ ටියුබ් චැනලය මට අනන්‍ය වූ එකක්. මෙයින් සිදුවන වාසි තමයි කාටවත් අපේ නිර්මාණ කොල්ලකන්නට බැහැ. විද්‍යුත් නාලිකාවල අපේ නිර්මාණ සංරක්ෂණය වෙනවා යැයි අපට පූර්ණ වශයෙන් විශ්වාස තබන්නට බැහැ. මට කිසිම විටෙක පද රචකයා ගායන ශිල්පියා අමතක කරන්නට බැහැ. ඒ නිසා නිර්මාණකරුවන්ට කර්තෘ භාගය ගෙවන්නට අප කටයුතු කරනවා. එය විනිවිද භාවයෙන් කෙරෙන්නක්. මේ නාලිකාවෙන් ඕනෑම අයෙකුට අපේ නිර්මාණ රස විඳින්නට පුළුවන්.

"සුදු මුදු රළ පෙළ "ප්‍රසංගයේ වීඩියෝ, ලක්ෂ්මන් විජේසේකර ගයන සඳ කිනිති නැමි, ප්‍රසංගයේ ගීත කිහිපයක් වගේම නන්දා මාලනිය ගයන වලා තීරයෙන් එහා ගීතය යොවුන් දැරියක ලවා ගායනා කර තිබෙනවා. ඒ සියල්ල මේ චැනලයේ තිබෙනවා. පසුගිය කාලය තුළ මේ සඳහා හොඳ ප්‍රතිචාර ලැබී තියෙනවා. වැඩිම ගණනක් නරඹා තිබෙනවා. ඒ අනුව තමයි චැනලය මුල්තැන ලබා තිබෙන්නේ."

ආචාර්ය රෝහණ වීරසංහයන් පවසන්නේය.

අලුත් තාක්ෂණය භාවිතා කරන්නේ යෞවනයෝය. අලුත් පරපුර මේ පිළිබඳ හොඳින් දැනුවත්ය. නව තාක්ෂණය සමඟ කටයුතු කරන, වර්තමානයේ බොහෝ කලාකරුවන්ගේ යූ ටියුබ් චැනල් නිර්මාණය කිරීමේ යෙදි සිටින ඉංජිනේරු ශිල්පියෙකු වන රනුර පෙරේරාගෙන් අප මේ සම්බන්ධයෙන් විමසූවෙමු. " වර්තමානයේ ඩිජිටල් තාක්ෂනය හරහා තම නිර්මාණවලින් මුදල් උපයන්න පුළුවන් බව බොහෝ දෙනෙකු දැනුවත් නැහැ. අද බොහෝ කලාකරුවන්ගේ

නිර්මාණවලින් වෙනත් අය තමයි මුදල් උපයන්නේ. රෝහණ සර් වසර ගණනාවක් තිස්සේ කළ නිර්මාණ 3000 කට වඩා තිබෙනවා.

රෝහණ සර් සමඟ කතාබහ කර පා ඔහුගේ නිර්මාණ ඩිජිටල් මාධ්‍යයට කොපි රයිට් කළා. නන්දා මාලනි, සුනිල් එදිරිසිංහ ගැයූ ගීත එහි ඇතුළත්. පසුගිය මාස කිහිපය තුළ මේ චැනලය පළමු තැන ලබා තිබෙනවා. දවස් 7, අවස් 8, දවස් 28 ආදි වශයෙන් වැඩියෙන් නැරඹූ ගණන ගණණ් බලන්නේ. තවමත් මේ සමාජයේ හොඳ නිර්මාණ වලටයි තැනක් තිබෙන්නේ. මේ චැනලය මුල්තැනට තේරීමෙන් අපට දැනෙන්නේ එයයි."

සාමාජ මාධ්‍ය අඩවි , යූ ටියුබ් චැනල නිර්මාණ කරණයේ යෙදෙන රනුර පෙර්රා පවසන්නේය.

අද වන විට බොහෝ යූ ටියුබ් චැනල ඇත. ඒ චැනලයන් හි වැදගත් දේ මෙන්ම නොවැදගත් දේද , හරසුන් බාල බොළද ගී ද ඇත්තේය .ඒ සියල්ල ගැන කතා කරන අතරේ රනුර පවසන්නේ,

"අද තරුණ පරපුර ගීත අසන්නේ බොහෝ විට අන්තර්ජාලයෙන්. ඔවුන්ට අන්තර්ජාලය මඟින් වැරදි පූර්වාදර්ශ ලැබෙන්නට පුවන්. ප්‍රවීණයන්ගේ නිර්මාණ වෙනත් අය ගයනවා. එහි හිමිකරුවෝ ගැන නිවැරදි තොරතුරක් නැහැ. නමුත් අපේ ප්‍රවීණයන්ගේ දක්ෂයින්ගේ නිර්මාණ මේ චැනලය තුළ තිබීමෙන් අලුත් පරම්පරාව මේ නිර්මාණ ගැන දැන ගන්නවා. සුබාවිත ගීතය හඳුනා ගන්නවා. ඒ නිසා මේ නිර්මාණ යූ ටියුබ් චැනලය තුළ තිබීමේ එක් වාසියක් තමයි ඒ . අනෙක තමයි තමන්ගේ නිර්මාණ කාටවත් කොල්ලකන්න බැහැ. මම විශ්වාස කරනවා නිර්මාණකරුවන්ට තම නිර්මාණ ආරක්ෂා කරගන්න සංරක්ෂණය කර ගන්න තියෙන හොඳම මඟ මෙයයි කියලා.

'තේ කහට' මුසුවූ වතුකරයේ කඳුළු කතාව

ටී. යුවරාජන් - තලවකැලේ

ඒ. අජිත් කුමාර - බදුල්ල

ශ්‍රී සඟිදරන් - බදුල්ල

ධනුෂ්ක - තලවකැලේ

එස්. ශ්‍රීදේවි - බදුල්ල

සී. කෝකිල ප්‍රියා - බදුල්ල

කපිලනාත් - තලවකැලේ

● නිශානී හේරත් බන්නැහැක

පියවි ඇසට ලස්සනට පෙනෙන හුඟාක් දේවල්වල සුන්දරත්වය, රස විඳින්න හැමටම වරම් නැත. ඒත් ඒ හැම සුන්දර දෙයකම රුවගුණ ජීවමාන අයුරින් සිතුවමට නඟන්න කැමරා නෙතට හැකිය. ඒ වගේ කැමරා කාචයේ සටහන් වුණු අවුරුදු 200 පමණ පැරැණි ශ්‍රී ලංකාවේ තේ කලාවේ උපත හා විකාශනය පිළිබඳ කතා පුවත පසුගියදා අපූරු සේයාරූ රැසකින්, සිත්තම් වුණේ කොළඹ ලයනල් වෙන්ඩ්ට් කලාගාරයේදීය. මේ සේයාරූ දැක්ම සංවිධානය කර තිබුණේ ඌව ශක්ති පදනම විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය හා තව අයතන කීපයක් විසිනි.

සින්දුජන් - තලවකැලේ

ටී. යුවරාජන් - තලවකැලේ

බදුල්ල ඇටම්පිටිය වත්ත, ඌව හයිලැන්ඩ් වත්ත, නුවරඑළිය දිස්ත්‍රික්කයේ තලවකැලේ ලෝගී සහ හොලිරූඩ් වතු දෙකේ අය විසින් කැමරා කාචයට හසුකරගත් කඳුකර, වතුකර තේ වතු ආශ්‍රිත ද්‍රවිඩ, සිංහල ජනතාවගේ ජීවන රටාවේ යථාර්ථය තමයි මෙයින් පිළිබිඹු විය.

ප්‍රදර්ශනයේ නම තේ කහට ය. ප්‍රදර්ශනයට මඟ පැදුණේ ඉහත කී ප්‍රදේශවල අය සඳහා ආරම්භ කෙරුණු ශායාරූප පාඨමාලාවක ප්‍රතිඵලයක් ලෙසිනි. මුලින් මේ සඳහා 45 දෙනෙක් පමණ සහභාගි වී අවසානයේ ඉතිරි වූයේ 28 දෙනෙක් පමණි. මේ සියලු දෙනාම වතුකරය සහ ඒ ආශ්‍රිතව ජීවත් වූ අය වෙති. එපමණක් නොව කැමරාවක් පරිහරණය කළ අය නොවෙති. පළවැනි වරට කැමරාවක් පාවිච්චි කරපු අය වසරක් නිමාවෙද්දී බොහොම අපූරුවට නොයෙක් නොයෙක් ආකාරයේ ශායාරූප සිය කැමරා කාචවලට සටහන් කරගෙන තිබිණි. සේයාරූ 40,000 අතරින් හොඳම නිසල රූප 100 තෝරන කටයුත්ත සිදුකළේ ජ්‍යෙෂ්ඨ ශායාරූප ශිල්පීන් වන අජිත් සෙනෙවිරත්න සහ නදිෂ්ක රණසිංහ සමඟින් ළහිරු කිතලගම කවියාය. මුලින්ම මෙම සේයාරූ ප්‍රදර්ශනය පැවැත්වුණේ බදුල්ලේ හා තලවකැලේය. ඒත් වැඩි දෙනෙක්ගේ අවධානය යොමුවුණේ ලයනල් වෙන්ඩ්ට් එකේ ප්‍රදර්ශනයෙන් පසුවය. ප්‍රදර්ශනයේ සේයාරූ ඉදිරිපත් කළ ශායාරූප ශිල්පීන් කිහිප දෙනෙක්ම ලයනල් වෙන්ඩ්ට් එකට පැමිණ සිටි අතර සිළුමිණට මෙසේ පැවැසූහ.

කේ. සුගන්යා - බදුල්ල

සී. කෝකිල ප්‍රියා - බදුල්ල

"අපේ කණ්ඩායමේ සමහර සිංහල අයට දෙමළ බැහැ. දෙමළ අයට සිංහල බැහැ. හැබැයි අවුරුද්දක් අවසානයේ සිංහල අයට දෙමළ ලියන්න කියවන්න පුළුවන් වුණා. දෙමළ අයට සිංහල සීමාවටත් වඩා පුළුවන් වුණා. ශායාරූප ශිල්පය පිළිබඳව තාක්ෂණික කාරණා ප්‍රායෝගිකව ඉගෙනගත්තෙ අපේ ගුරුවරු එක්ක ෆීල්ඩ් එකේ ඇවිදිද්දීමයි.

අපේ කැමරාවල සටහන්වූ සේරම ෆොටෝ ලැප් එකකට දාලා බලලා ඉගෙනගත්තා. හැමදාමත් අපේ ජීවිත අනික් අය දැක්කෙ පිටස්තරයන්ගේ කැමරා කාච තුළින්. ඒක වෙනස් කරපු පළමු පරම්පරාව අපි වීම ගැන අපට ආඩම්බරයි."

ජී. කලෙයිවානි - බදුල්ල

"නුවර, දිගන ප්‍රදේශයේ පැවැත්වූ අපේ සමහර පුහුණුවීම් වැඩසටහන්වලදී අපි 'ගැටුම්ගස' කියලා වතුකර සමාජයේ ප්‍රශ්න ගැන සාකච්ඡා කළා. අපි ශායාරූප ගත්තේ අපිම ජීවත්වන වතුකරයේයි. එතෙක් සාමාන්‍ය දෙයක් වෙලා තිබුණු අපේ ජීවිතය දිහා කලාත්මකව. බලන්න අපේම ජීවිතවල තිබුණු ප්‍රශ්න කලාත්මකව ඉදිරිපත් කරන්න අපි පුරුදු වෙලා හිටියා. අපි ගත්ත ශායාරූපවල අන්තර්ගත දේවල් කියවන්න, ඕනෑම ෆොටෝ එකක කියන කතාව කියවාගන්න විතරක් නෙවෙයි සේයාරූවලට ලියන්නත් අපිට පුළුවන් වුණා. සේයාරූ තුළින් අපේ ප්‍රශ්න කලාත්මකව සමාජයට ඉදිරිපත් කරන්න වගේම තේවල කහට මතු කිරීමට වඩා අපේ ජීවිතවල ඇත්ත ඉස්මතු කිරීම බවයි අපිට හැඟෙන්නෙ."

තේ නෙළන ළඳුන්ගේ අත්වල හැඩතල කැමරා කාචවල සටහන් වී තිබුණේ අපූරු අයුරිනි. තේ නෙළන ළඳුන්, තේ රසට යටවුණු ස්ත්‍රී සෞන්දර්යය, තේ වගාව ආශ්‍රිත ජනතාවගේ දුක, ජීවන රටාව, නැතිබැරිකම, ආගමික චාරිත්‍ර වාරිත්‍ර වැනි දෑ සියල්ලක්ම මෙම ප්‍රදර්ශනයෙන් ඉස්මතු විය.

උතුර දකුණ යා කරන ලේක්හවුස් පාලම 21 පිටුව

රුක්මණී දේවි මහගත්කරු දෙපා මුල වැඳ වැටෙයි 20 පිටුව

මුදල් මත්තේ නැටවෙන ස්වර්ණ පුස්තක සම්මානය 32 පිටුව

ජනාධිපතිවරණය පෙනි පෙනී තුරුම්පු පිට තුරුම්පු ගහන ට්‍රම්ප්

ජනාධිපතිවරයා රෝහල්ගත වූ අවස්ථාව

ඇමරිකානු ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් 2015දී බලයට පැමිණියේ කිසිවකු නොසිතූ සටන් පාඨ ඉදිරියට ගෙන එමිනි. ඇමරිකානු ජාතිකවාදය ඒ අතරින් ප්‍රධාන විය. මැතිවරණය ආසන්නවත්ම කිසිවකු හෝ බලාපොරොත්තු නොවූ තුරුම්පු එළියට අදිමින් ඔහු ස්වකීය ජන්ද සටන මෙහෙයවූයේ ඒ වන විට ඩිමොක්‍රටික් අපේක්ෂිකා හිලරි ක්ලින්ටන්ගේ අතේ තිබූ ජයග්‍රහණය උදුරා ගනිමිනි.

දැන් මෙවරද ජනාධිපතිවරණයට දින ගණනක් තිබියදී ඔහු කොහේවත් නොතිබූ සටන් පාඨ ගෙන ජෝ බයිඩන්ගේ මූණටම දමා ගසමින් සිටින්නේ මෙවර ඇමරිකානු ජනධිපතිවරණය අතිශයින් උණුසුම් ඉසව්වක් කරා ගෙන යමිනි.

එහි ආසන්නතම අවස්ථාව වූයේ තමා කොවිඩ් ආසාදිතයකු බව ට්‍රම්ප් විසින්ම ලොවට පැවසීමෙනි. මෙසේ පවසමින් ඔහු විසින් නිකුත් කළ ට්වීටර් පණිවිඩය ක්ෂණයකින් ලොව පුරා පැතිර ගිය අතර බොහෝ දෙනා, ඇතැම් ඇමරිකානුවන් පවා සැක පහළ කර සිටියේ හැත්තෑ හතර හැවිරිදි ට්‍රම්ප්ගෙ ජීවිතය පවා අනතුරේ බවයි. එහෙත් ට්‍රම්ප් ඒ වෙනුවට කොවිඩ් ආසාදනය දේශපාලන වාසියක් බවට හරවා ගත්තේ ආසාදිත බව ප්‍රකාශ කිරීමෙන් පැය විසිහතරක් ඉක්ම යෑමටද පෙරය.

තමා කොවිඩ් ආසාදිත බව ප්‍රකාශ කිරීමෙන් පසු ලෝකයම ට්‍රම්ප්ට දොස් පවරා සිටියේ ඔහුගේ තීරණවල අසාර්ථකබව හේතුවෙන් මුළුමහත් ඇමරිකාවටම කොවිඩ් පැතිරී ගියා සේම ඔහුද අවසානයේ එහි ගොදුරක් වූ බවයි.

ඒ බව තවදුරටත් සනාථ කරවන ප්‍රකාශ අසන්නට ලැබුණේ ඔහු පසුදින රෝහල් ගතවීමත් සමගය. රෝහල් ගත වූ ට්‍රම්ප් නිකම් නොසිටියේය. ඔහු තමා රෝහල් ගත වුවද තම සේවය අකුරට ඉටු කරන බව පෙන්වන්නට ඡායාරූප සමාජ මාධ්‍ය ගතකර සිටියේය. ට්‍රම්ප් කොවිඩ් පැතිරීම ඇරඹුණු දින සිටි මුවආවරණ දැමීම ප්‍රතික්ෂේප කර සිටියේය. මුව ආවරණ දැමීම හාස්‍යයට ලක් කළේය.

එමෙන්ම රෝහල කරා යෑමේදී පමණක් මුව ආවරණ දමා සිටි ඔහු රෝහලේ සිටිමින් නිකුත් කළ ඡායාරූවලටද පෙනී සිටියේද මුව ආවරණ නොමැතිවය. මේ සියල්ල ජනතාවගේ ආකර්ෂණය ඔහු වෙත යළි කැඳවීමට සමත් විය. ජනතාව පවසන්නට වූයේ 'ඔහුට කොයියම් වාතාවරණයක් මධ්‍යයේ වුවද තම මතය වෙනුවෙන් පෙනී සිටිමේ හැකියාවක් පවතින' බවයි.

ජනාධිපතිවරයා රෝහලේ සිට තම ආධාරකරුවන් හමුවට යමින්

මේ සමගම ඔහු ප්‍රතිකර ගනිමින් සිටි වෝල්ටර් රීඩ් රෝහල ඉදිරිපිට ට්‍රම්ප්ගේ පාක්ෂිකයන් පැමිණ ඔහු දිරිගන්වන්නට වූහ.

මේ දිරිගැන්වීම් බොහෝ දුරට සංවිධානාත්මක වැඩපිළිවෙලක තවත් අංකයක් විය හැකිය.

එහි තවත් පියවරක් ලෙස පසුදා උදයේම ජනාධිපති ට්‍රම්ප් මෝටර් රථයක නැගී තම දිරිගන්වන්නන් අතරට ගියේ ඔහුන්ට ආචාර කරීමට මෙන්ම තම සෞඛ්‍ය තත්ත්වයද ලොවට පෙන්වීමටය. එහිදීද ඔහු මුව ආවරණ පැළඳ සිටියේ නැත.

මෙය ඇතැම් දෙනාගේ පැසසුමට ලක් වූ අතර ඇතැම් දෙනා මෙයට දෝශාරෝපණ එල්ල කර සිටියේ කොවිඩ් ආසාදිතයකු ලෙස මුව ආවරණ නොමැතිව ගමන් කිරීමෙන් ඔහු වයිරසය තවත් අයට බෙදා හැරීමට දායක වූ බවයි.

ඒ වන විට ජනාධිපති ට්‍රම්ප්ගෙ ධවල මන්දිර සේවක පිරිසෙන් සැලකිය යුතු සංඛ්‍යාවක් මෙන්ම රිපබ්ලිකන් පක්ෂයේ ජනාධිපතිවරණ මෙහෙයුම් කමිටුවේ පිරිසෙන් වැඩි හරියක් ද කොවිඩ් ආසාදිතයන් බව සනාථ වී තිබිණි.

එහෙත් මේ චෝදනාවලට පිළිතුරු ලබා දෙමින් ධවල මන්දිරය නිවේදනයක් නිකුත් කරමින් පවසා තිබුණේ ජනාධිපති ට්‍රම්ප් ගමන් කළ මෝරේ රථය වෙඩි නොවදින රථයක් මෙන්ම විශබීජ සහ විෂ වායු ඇතුළට හෝ පිටතට කාන්දු නොවන සේ සකස් කළ ආරක්ෂිත රථයක් බවයි.

එබැවින් ජනාධිපතිවරයාගේ නගර සංචාරය හේතුවෙන් රථයේ රියැදුරු හෝ අන් කිසිවකුට වයිරසය ආසාදනය නොවන බවද එම නිවේදනයේ සඳහන් විය.

කෙසේ වුවද රෝහල් ගතවී පැය හැත්තෑ දෙකක් ඉක්මයෑමට පෙර ජනාධිපති ට්‍රම්ප් ඉමහත් ජයග්‍රාහී ලීලාවෙන් යළි ධවල මන්දිරය කරා පැමිණියේය. එමගින් වූයේ ඔහු කොවිඩ් හේතුවෙන් මිය යනු ඇතැයි බලා සිටි අය වෙනුවට ඇමරිකානු ජනාතාවගේ මානසික ශක්තිය තවත් ඉහළ යෑමය.

තම ජනාධිපතිවරයාටද වයිරසය ආසාදනය වූ නමුත් අවධානම් බාණ්ඩයේ සිටි ඔහු එයින් සුවපත් වූ බැවින් තමන්ටද වයිරසය ආසාදනය වීම එතරම් ගණන් ගත යුතු නොවන බවත්, ඒ වෙනුවට ආර්ථිකය ආරක්ෂා කර ගැනීම වඩා නිවැරදි තීරණය බවත් ඇමරිකානු ජනතාව මේ සමග වඩ වඩාත් විශ්වාස කරන්නට විය. එමගින් කොවිඩ් පැතිරීම හේතුවෙන් ට්‍රම්ප්ට අඩු වුණු ලකුණු යළි ලබා දීමට සමත් වූ බව පැහැදිලිය.

> ‘ට්‍රම්ප් කොවිඩ් පැතිරීම ඇරඹුණු දින සිටි මුව ආවරණ දැමීම ප්‍රතික්ෂේප කර සිටියේය. මුව ආවරණ දැමීම හාස්‍යයට ලක් කළේය. එමෙන්ම රෝහල කරා යෑමේදී පමණක් මුව ආවරණ දමා සිටි ඔහු රෝහලේ සිටිමින් නිකුත් කළ ඡායාරූවලට පෙනී සිටියේද මුව ආවරණ නොමැතිවය. මේ සියල්ල ජනතාවගේ ආකර්ෂණය ඔහු වෙත යළි කැඳවීමට සමත් විය.’

ඒ සමගම ට්‍රම්ප් කල්යල් බලා තවත් තුරුම්පුවක් ගැසුවේය. ඒ පසුගිය 2015 ජනාධිපතිවරණයේදී හිලරි ක්ලින්ටන්ට මොස්කව් සමග තිබූ සබඳතා පිළිබඳව තොරතුරු රැසක් එළියට දැමීමය.

ඔහු 2015 සිට චෝදනා කරමින් සිටියේ ඩිමොක්‍රටික්වරු රුසියාව සමග ගනුදෙනුවක සිටින බවත්, හිලරිගේ ජයග්‍රහණය වෙනුවෙන් මොස්කව් නගරාධිපති යම් මුදලක් වැය කර ඇති බවත්ය. මෙවර යළිත් වසර පහකට පසුව එකී පරණ වාර්තා ජනගත කිරීමට ට්‍රම්ප් කටයුතු කරන්නේ අවසන් මොහොතේ ජනතාවගේ මානසිකත්වය හැරවීමේ අති සූක්ෂ්ම දේශපාලන නූල් සූත්තර තිතතටම යොදා ගනිමිනි.

එහෙත් මේ අතර ඇතැම් දෙනා පෙන්වා දෙන්නේ පසුගියදා ට්‍රම්ප්ට එල්ල වූ ආදායම් බදු නොගෙවීමේ චෝදනාවලට ට්‍රම්ප් මේ දක්වා කිසිදු නිශ්චිත පිළිතුරක් ලබා දී නොමැති බවයි.

එමෙන්ම ට්‍රම්ප් ව්‍යාපාරිකයකු වශයෙන් බංකොලොත් බවත් ඔහු දෙවෙනි වරටත් කෙසේ හෝ ජනාධිපති වීමට දඟලන්නනේ එමගින් තම ව්‍යාපාර යළි ස්ථාවර කර ගැනීමේ අරමුණෙන්ද යුතුව බව ඇතැම් දෙනා පෙන්වා දෙති.

එහෙත් දේශපාලන බලයේ රස වැටුණු කිසිවකු එම රසය විඳ ගැනීමේ අවස්ථාව පහසුවෙන් අත් නොහරින බව දැන් ලොවට රහසක් නොවන්නේය. එකම දෙය නම් ට්‍රම්ප් යොදන නූල් සූත්තර ආසියාවේ අපට නම් අමුතු ඒවා නොවීමය.

එහෙත් ජාතිකවාදය යනාදී සටන් පාඨ ඇමරිකානුවන්ට නම් තවමත් අලුත් බව පෙනී යන්නනේ ඔවුන් ඒවාට ආශක්ත වීම හේතුවෙනි.

ඒ අනුව අමෙරිකානු ජනාධිපතිවරණය යනු ආසියානු දේශපාලනයේ ඇමරිකානු ප්‍රති නිශ්පාදනය බවට අනාගතයේ පත් වුවද පුදුම විය යුතු නැත.

සක්වළගල

● ටිරෝනි වෑවලෙග්

දීපිකා පදුකෝන් පොලීසිය වෙත ගෙන යමින්

රියාගෙ පවුලේ සාමාජිකයන් පොලීසිය වෙත යමින්

අත්අඩංගුවට ගත් රියා චක්‍රබෝර්ති

බොලිවුඩ් තරු බිම වට්ටන මත්ද්‍රව්‍ය චෝදනා

සුශාන්ත්ගේ මරණය සමඟ එළියට එන හින්දි නළු නිළියන්ගේ වැඩ

බොලිවුඩ් නළු සුශාන්ත් සිං රාජ්පුත්ගේ මරණය මේ වන විට කිසිවකුට හෝ පෙර සිතාගත නොහැකි වූ ඉසව්වක් කරා ගමන් කරමින් තිබේ. ඔහුගේ මරණය සිය දිවි නසා ගැනීමක් වූ අතර ඔහුට සිය දිවි නසා ගැනීමට හේතු වූ කරුණු කාරණා සෙවීමට මුම්බායි පොලීසිය විසින් විශේෂ මෙහෙයුමක් දියත් කරන ලද්දේ ජූනි මස අවසානයට පෙරය.

ඒ අනුව ඔහුගේ පෙම්වතිය වූ රියා චක්‍රබෝර්ති අත්අඩංගුවට ගැනීමට මුම්බායි පොලීසිය කටයුතු කර සිටියේ මියගිය නළු සුශාන්ත් සිං රාජ්පුත්ගේ වට්ස්ඇප් ගිණුම පරීක්ෂා කිරීමෙන් අනතුරුවය. එහිදී ඔහුගේ පවුලේ සාමාජිකයන් මේ මරණය සම්බන්ධව විශේෂ පරීක්ෂණයක් කරන මෙන් පොලීසියෙන් කරන ලද ඉල්ලීමද වැදගත් විය. සුශාන්ත්ගේ පවුලේ සාමාජිකයන් පොලීසියට පවසා තිබුණේ ඔහුගේ පෙම්වතිය සහ ඇයගේ පවුලේ සාමාජිකයන් සුශාන්ත්ගේ මරණයට වගකිය යුතු බවයි. ඔවුන් ඔහු මියයෑමට පෙර ඔහුගේ මුදල් වෙනත් ගිණුම්වලට මාරු කරවා ගැනීමට කටයුතු කර තිබූ බවටද සුශාන්ත්ගේ පවුලේ සාමාජිකයෝ චෝදනා එල්ල කළහ.

ඒ අනුව පොලීසිය රියා චක්‍රබෝර්ති ප්‍රථමයෙන්ම අත්අඩංගුවට ගනු ලැබුවේ කළු සල්ලි ජාවාරම් කිරීමේ චෝදනාව මතය. එහෙත් ඇය අත්අඩංගුවට පත්වීමෙන් පසු පරීක්ෂණ වෙනත්ම දිසාවකට යොමුවූයේ බොලිවුඩ් සිනමා කර්මාන්තය සම්බන්ධව මෙතෙක් කතාබහට ලක් නොවූ කරුණු කාරණා රැසක් සමාජය හමුවේ ඇද දමමිනි. බොලිවුඩ් සිනමා ක්ෂේත්‍රයේ වැඩි පිරිසක් මත්ද්‍රව්‍ය භාවිත කරන බව හෙළිදරව් වන්නේද ඒ අනුවය.

දැනට මේ සම්බන්ධව මුම්බායි පොලීසිය විසින් අත්අඩංගුවට ගන ඇති සංඛ්‍යාව විස්සකි. ඔවුන් සියලු දෙනාම බොලිවුඩ් සිනමා ක්ෂේත්‍රයට සම්බන්ධව අය වෙති. ප්‍රශ්න කිරීම්වලට ලක් කර ඇති පිරිස තිස්පහ ඉක්මවයි. ඒ අතරට බොලිවුඩ් සිනමාවේ අති ජනප්‍රිය නිළියක වන දිපිකා පදුකෝන් ද ඇතුළත්ය. ඇය මුම්බායි මත්ද්‍රව්‍ය නාශක අංශයේ ප්‍රශ්න කිරීම්වලට ලක්වන්නේ මත්ද්‍රව්‍ය ජාවාරම් කිරීම සම්බන්ධයෙනි. පසුගිය දින කිහිපයේදී ලොවම කැළඹූ නම් කිහිපයක් මත් ද්‍රව්‍ය ජාවාරම් කිරීම හා සම්බන්ධ වෙමින් සමාජ ගත වන්නේ එසේ කරන ලද ප්‍රශ්න කිරීම්වල ප්‍රතිඵලයක් ලෙසිනි.

රියා චක්‍රබෝර්තිගෙන් සිදුකරන ලද ප්‍රශ්න කිරීම්වල ප්‍රතිඵලයක් ලෙස දිපිකා පදුකෝන් වෙත පොලීසියේ අවධානය යොමු වූ අතර ඇයත් සමග මත්ද්‍රව්‍ය ජාවාරමට සම්බන්ධ බොලිවඩු තරු රැසකගේ නම් ප්‍රකාශ වූ බව ඉන්දීය මාධ්‍ය වාර්තා කර තිබුණි.

ඒ අනුව සෘජුවම නම් ප්‍රකාශ නොකරන ලද අතර ඒ වෙනුවට සුපිරි තරු ලෙස හඳුනා ගත හැකි පුද්ගලයන් කිහිප දෙනෙක්ගේ නම්වල මුල් අකුරු මත්ද්‍රව්‍ය නාශක අංශය ප්‍රකාශ කළ බවට වාර්තා විය. ඒ අනුව එක් පුද්ගලයකුගේ නමක මුල් අකරු තුනක් ප්‍රකාශ කෙරුණු අතර ඒ අකුරු එස්. ආර් කේ නම් විය. එමගින් සෘජුවම සැකය බොලිවුඩ් සිනමාවේ ඉහළම තලයේ වැජඹෙන ශරුක් ඛාන් වෙත යොමු විය. එහෙත් පසුව එම අකුරුවලින් හඳුන්වනු ලැබුවේ ශාරුක් ඛාන් නොව සාරා අලි ඛාන් බවටද රාවයක් පැතිර ගියේය. මේ කිසිවක් ඉන්දීය මත්ද්‍රව්‍ය නාශක අංශය විසින් නිල වශයෙන් මේ දක්වා ප්‍රකාශ කර නැත. කෙසේ වුවද මේ වන විට ඇතැම් මාධ්‍යවල පළවී ඇති පුවත් අනුව ශාරුක් ඛාන් ද බොලිවුඩ් මත්ද්‍රව්‍ය ජාවාරමට සම්බන්ධය. ඔහුගේ නිවසට මත්ද්‍රව්‍ය රැගෙන ඒමේ කටයුත්ත අර්ජුන් රාම්පාල් නම් සිනමා නළුවා විසින් සිදුකර තිබේ. ඒ හැරුණු කොට ශද්ධා කපූර්, රාකුල් ප්‍රීත් සිං යනාදීන්ගේ නම් බොලිවුඩ් මත්ද්‍රව්‍ය ජාවාරම සමග ඇඳී තිබේ. ඒ හැරුණු කොට සිනමාවේ සෙසු ක්ෂේත්‍රවන ඇඳුම් නිර්මාණය, වේශ නිරූපනය යනාදී ක්ෂේත්‍ර රැසක පුද්ගලයන් රැසකට මත්ද්‍රව්‍ය ජාවාරම් කිරීමේ චෝදනා එල්ල වී තිබේ.

මේ සම්බන්ධව අදහස් දක්වමින් මුම්බායි සිනමා ක්ෂේත්‍රයට සම්බන්ධ බොහෝ දෙනා පවසා තිබුණේ මත්ද්‍රව්‍ය ජාවාරම් කිරීම කෙසේ වෙතත් මත්ද්‍රව්‍ය භාවිතය නම් සිනමා ක්ෂේත්‍රයට අමුතු දෙයක් නොවන බවයි. බොලිවුඩ් සිනමා ක්ෂේත්‍රයේ බොහෝ දෙනා මත්ද්‍රව්‍ය භාවිත කරන බවත් එය අමුතු දෙයක් නොවන බවත් වැඩි දෙනාගේ අදහස විය.

ඉන්දියාවේ මත්ද්‍රව්‍ය නීතිය අනුව හෙරොයින්, කොකේන්, ඔපියුම්, මෝෆීන්, එල්එස්ඩී වැනි මත්ද්‍රව්‍ය නීතියෙන් තහනම් වේ. ඒවා ළඟ තබා ගැනීම වරදකි. එහෙත් කංසා ශාකය වැවීම පමණක් වරදක් වන අතර කංසා ඇට හෝ කොළ ළඟ තබා ගැනීම ඉන්දීය නීතියට අනුව වරදක් නොවේ. මේ සම්බන්ධව තම පෞද්ගලික අදහස් දක්වමින් ප්‍රවීන සිනමා අධ්‍යක්ෂ මහේෂ් භාත් පවසා තිබුණේ වරක් තමා සහ නිළියක අතර පැවති පෙම් සබඳතාව බිඳ වැටුණු පසු තමාද මත්ද්‍රව්‍ය පාවිච්චි කළ බවත් පසුව එය නවතා දැමූ බවත්ය. අනූව දශකයේ බොලිවුඩ් සිනමාවේ සක්විති විරුදාවලිය ලත් සන්ජේ දත් සෑම වර්ගයකම මත්ද්‍රව්‍ය භාවිත කළ බවට චෝදනා එල්ල විය. පසුව ත්‍රස්තවාදීන් සමග සබඳතා පැවැත්වීම සම්බන්ධව චෝදනා මත සිරගත වූ සන්ජේ දත් සියලුම දුරාචාරවලින් අත්මිදී මේ වන විට යහපත් දිවියක් ගත කරමින් සිටී. මේ සියලු උදාහරණ දක්වන බොලිවුඩ් සිනමාවට සම්බන්ධ පිරිස් දක්වන්නේ පැරණි සිනමා නිළියක වූ මම්තා කුල්කර්ණි පමණක් පැහැදිලිවම අන්තර්ජාතික මත්ද්‍රව්‍ය ජාවාරමට සම්බන්ධව සිටි බවයි. ඇයගේ සැමියා මේ වන විට ඇමරිකා එක්සත් ජනපදයේ සිරගතව සිටින්නේද මත්ද්‍රව්‍ය ජාවාරමට චෝදනා ලබමිනි. කෙසේ වුවද රියා චක්‍රබෝර්ති සහ ඇයගෙ සොහොයුරාද තවත් පිරිසක්ද මේ වන විටත් සිරගතව සිටින අතර තවත් බොහෝ සිනමා තරු ද මුම්බායි මත්ද්‍රව්‍ය නාශක අංශයේ ප්‍රශ්න කිරීම්වලට ලක්වෙමින් සිටිති. මේ සිදුවෙමින් යන සිදුවීම් ජාලයේ කෙළවර කොතැනදැයි තවමත් අනුමන කළ නොහැකි අතර, එය මත්ද්‍රව්‍ය ජාවාරමට වැට බැඳීමකින් අවසන් වේද නැතහොත් බොහෝවිට සිදුවන පරිදි කිසිදු පැහැදිලි අවසානයකින් තොරව යටපත්ව අමතක වී යාදැයි අවධානයෙන් බලාසිටීම වැදගත්ය.

ලොව වටා

චීනයෙන් කොවිඩ්වලට එන්නතක්

කොවිඩ් - 19 සඳහා එන්නත් සොයා ගැනීම වෙනුවෙන් සිදුකරන ලද සායනික පරීක්ෂණ සියල්ල මේ වන විට සාර්ථක වී ඇති බව චීනය පවසා තිබේ.

කොවිඩ් වයිරසය සඳහා එන්නතක් සොයා ගැනීම වෙනුවෙන් චීන ජීව විද්‍යා ප්‍රතිකාර ආයතනය චීන ප්‍රතිකාර විද්‍යා ඇකඩමිය යටතේ දිගින් දිගටම පර්යේෂණ පවත්වමින් සිටි අතර දැනට සාර්ථක වී ඇතැයි පැවසෙන්නේ ඒ යටතේ ඔවුන් විසින් සොයා ගනු ලැබූ එන්නතයි.

වයස 18 – 59ත් අතර රෝගීන් 191 දෙනෙකු යොදාගෙන ඔවුන් සිදුකරන ලද සායනික පර්යේෂණ සියල්ල සාර්ථක වී ඇති බව චීන ප්‍රතිකර විද්‍යා ඇකඩමිය පවසා තිබේ.

ධීවරයා මරා දැමීම වෙනුවෙන් උතුරු කොරියාවෙන් පරීක්ෂණයක්

පසුගිය සැප්තැම්බර් මාසයේදී ධීවර කටයුතුවල නිතර වෙමින් සිටි දකුණු කොරියානු ජාතික ධීවර නිලධාරියකු උතුරු කොරියානු හමුදා විසින් මරා දැමීම සම්බන්ධව අපක්ෂපාතී පරීක්ෂණයක් පවත්වන ලෙස එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් උතුරු කොරියාවෙන් ඉල්ලා තිබේ.

මේ ධීවරයා තම යාත්‍රාව අක්‍රිය වීමෙන් පැය 36ක් වතුරේ පාවෙමින් සිටියදී උතුරු කොරියානු හමුදා අතට පත් වූ බවට තොරතුරු ලැබී ඇතැයි එම ධීවර නිලධාරියාගේ පවුලේ සාමාජිකයන් පවසා තිබේ. මේ පුද්ගලයාට උතුරු කොරියාවට පලා යෑමේ අවශ්‍යතාවක් පවතින්නට ඇතැයි දකුණු කොරියානු රජය යෝජනා කළද ඔහුගේ පවුලේ සාමාජිකයන් එය තරයේ ප්‍රතික්ෂේප කර තිබේ.

ඇමති නිසා මැලේසියානු අගමැති කොරන්ටයින්

තම කැබිනට් මණ්ඩලයේ ඇමතිවරයකු කොවිඩ් ආසාදිතයකු බව හෙළිවීමෙන් පසු මැලේසියානු අගමැති මුහ්යාදින් යසීන් ස්වයං නිරෝධායනයට යොමු වී තිබේ.

මැලේසියානු කැබිනට් සාමාජික අමාත්‍යවරයකු වන සුල්කිෆ්ලි අල් මොහොමඩ් අල් බක්රිට මෙලෙස කොවිඩ් ආසාදනය වී ඇති බව තහවුරු වී ඇති අතර ඔහු දිගින් දිගටම අමාත්‍ය මණ්ඩල රැස්වීම් සහ කැබිනට් රැස්වීම්වලටද සහභාගී වී තිබේ.

මේ අතර මැලේසියානු සෞඛ්‍ය අමාත්‍යංශය එරට ජනතාවට දැනුම් දී ඇත්තේ මේ වන විට රටතුල නව කොවිඩ් රැල්ලක් ඇතිවෙමින් පවතින බවයි.

ඉරාකයේ ගැටුම්වලින් දහස් ගණනකට තුවාල

ඉරාකයේ රජයේ හමුදා සහ ආණ්ඩු විරෝධී කැරළිකරුවන් අතර ගැටුම්වලින් දහස් ගණනකට තුවාළ සිදුවී ඇතැයි වාර්තා වේ.

මේ ගැටුම් ඇතිවී තිබෙන්නේ දකුණු ඉරානයේ ආර්බීන් නගරයේදීය. ඉරාක මුස්ලිම් ජනතාවගේ පූජනීය නගරයක් ලෙස හැඳින්වෙන කර්බාලා හි වන්දනා කටයුතු සඳහා ගිය පිරිස්ද මේ අතර සිටි බව වාර්තා වේ. ඉරාක රජයට විරෝධය දක්වන කැරලිකරුවන්ගේ අඩුවක් නොමැති අතර මේ දක්වා ඔවුන් මර්දනය කරමින් තම පාලනය ගෙන යෑමටද ඉරාක රජය සමත් වී තිබේ.

ඩෙල්ටා සුළි කුණාටුවෙන් මෙක්සිකෝව කැළඹෙයි

ප්‍රබලත්වය අතින් තුන්වැනි මට්ටමේ පසුවන සුළි කුණාටුවක් ලෙස නම් කර ඇති ඩෙල්ටා සුළි කුණාටුව මේ වන විට මෙක්සිකෝවට කඩා වැදී ඇතැයි වාර්තා වේ. පැයට කිලෝමීටර් 195ක වේගයෙන් එය මෙක්සිකොව්ට කඩා වැදුණේ පසුගිය බදාදා දිනයේදීය. ඒ සමගින් පුද්ගලයන් දහස් ගණනක් ආරක්ෂිත ස්ථාන කරා ගෙන යෑමට කටයුතු කිරීමට මෙක්සිකෝ රජයට සිදුවූ අතර රට තුළට කඩා වැදීමෙන් පසු කුණාටුවේ ප්‍රභලත්වය අඩු වනු ඇතැයි ද ගණනය කර තිබේ.

ඇෆ්ගන් - තලේබාන් සාකච්ඡා දිගටම

ඇෆ්ගනිස්ථාන රජය සහ තලේබාන් සටන්කාමීන් අතර දෝහා නගරයේදී පැවති සාකච්ඡා කිසියම් සාර්ථකත්වයක් අත්පත් කර ගැනීමට සමත්ව ඇති බව වාර්තා වේ.

ඒ අනුව මේ සාකච්ඡා තවත් දිගට පැවැත්වීමට දෙපාර්ශ්වයම එකඟතාව පළ කර තිබේ. මේ සාකච්ඡා පැවැත්වීම සිදු වී ඇත්තේ ඇමරිකානු රාජ්‍ය තාන්ත්‍රිකයන්ගෙ මැදිහත්වීම සහ මගපෙන්වීම යටතේය.

ඔවුන් එහිදී රීති 19ක් ඉදිරිපත් කර ඇති අතර දෙපාර්ශ්වයම එම රීතීන් සඳහා එකඟතාව පළ කිරීමෙන් මෙලෙස සාකච්ඡා දිගටම පවත්වාගෙන යෑමට එකඟතාව හිමිවී තිබේ. විචාරකයන් මේ එකඟතාව ඇෆ්ගනිස්ථානයට සුභ අනාගතයක් උදාවීමේ පෙරමග ළකුණු ලෙස විග්‍රහ කර තිබේ.

ඉමිරාන් බාන්ට ළමයින්ගෙන් ළකුණු

පකිස්ථානයට සාර්ථක නායකත්වයක් ලබා දෙමින් සිටින ඉම්රාන් ඛාන් අගමැතිවරයා එරට ළමුන්ගේ සෞඛ්‍ය තත්ත්වය සහ මානසිකත්වය වර්ධනය කිරීමේ යෝජනාවලියක් ඉදිරිපත් කර තිබේ.

මේ යෝජනාවලිය සහ වැඩපිළිවෙල පිළිබඳ අදහස ප්‍රථමයෙන්ම ජනගත කරමින් තම අදහස් ප්‍රකාශ කළ අගමැතිවරයා පවසා සිටියේ දරුවන්ගේ සම්පූර්ණ කළ යුතු අවශ්‍යතා අතර අංක එක වන්නේ ආහාර බවයි.

අගමැතිවරයාගෙ මේ යෝජනා මාලාවට පකිස්ථානයේ වැඩි දෙනාගේ ප්‍රසාදය හිමි වී තිබේ. කොවිඩ් - 19 වයිරසයෙන් පකිස්ථානය ආරක්ෂා කර ගැනීම සම්බන්ධව ඉම්රාන් ඛාන් ලෝක සෞඛ්‍ය සංවිධානයේද පැසසුමට ලක් විය.

තමන්ගේම පොලීසියේ වැඩ චිලි අගමැති හෙළා දකියි

චිලි කොන්සර්වටිව් පක්ෂයෙන් තේරී පත් වූ අගමැති සෙබස්තියන් පිනේරා එරට පොලීසියේ ක්‍රියාකලාපය පසුගියදා දැඩි ලෙස විවේචනය කර සිටියේය.

ඔහු එසේ කළේ සන්තියාගෝ නුවරට රැස් වූ විරෝධතාකරුවන් අතර සිටි එක් තරුණයකු පොලීසිය විසින් උස්සා අසල වූ පාලමෙන් ගඟට දැමීමේ සිදුවීමෙන් පසුවය.

එම සිදුවීම පැහැදිලිවම මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් බව අගමැතිවරයා පවසා සිටියේය. විරෝධතාකරුවන්ට මැඩ පැවැත්වීමට නියෝග ලබා දුන්නේ කවුදැයි අගමැතිවරයා ප්‍රකාශ කර සිටියේ නැත.

බිමට සමතලා කළ ලිබියාව ගැන කිඹුල් කඳුළු හෙළන නායක හමුව

පසුගිය සඳුදා ලෝකයේ රටවල් පහළොවක නායකයන් අන්තර්ජාලය ඔස්සේ විශේෂ හමුවක් පැවැත්වූහ. තුර්කිය සහ රුසියාව ප්‍රාධන කරගත් මේ රටවල ප්‍රධාන අරමුණ වූයේ ලිබියාවේ අනාගතය සම්බන්ධව කිසියම් එකඟතාවයකට පැමිණීමය.

2011 වසරේ ක්‍රියාත්මක වූ අන්තනෝමතික අරාබි වසන්තයෙන් පසුව මේ වන විටත් ලිබියාව හබල බිඳී ගිය ඔරුවක් වැනිය. එතෙක් එරට පැවති ස්වාධීන ආර්ථිකය සහ ස්වාධිපත්‍ය වෙනුවට මේ වන විට එරට ජනතාවට ඉතිරිව ඇත්තේ ශෙල් වෙඩි වැදීමෙන් සිදුරු වී කඩා වැටුණු, නටඹුන් නගර කිහිපයක් පමණි.

ගඩාෆි ගෙන් පෙරළා දැමුණු ලිබියානු ආණ්ඩුවට මේ වන තෙක් නිශ්චිත පාලකයකු නැත. ගඩාෆි ඒකාධිපතියකු විය හැකිය. ඔහුගේ පවුලට අසීමිත සුරසැප ලබා දුන්නාද විය හැකිය. එහෙත් ගඩාෆිගෙන් හිස් වූ අඩුව පුරාවාලීමට මේ දක්වා කිසිවකුත් සමත් වී නොසිටීමද සුළු කොට තැකිය නොහැකිය. එබැවින් ගඩාෆි ඉවත් කරමින් නේටෝප ප්‍රමුඛ අරාබි වසන්තයේ හිමිකරුවන් ලිබියානු ජනතාවට ලබා දුන්නේ කුමක්ද යන්න විශේෂයෙන් විමසා බැලිය යුතුව පවතින්නේය.

මේ අතර තුර්කිය ලෝක දේශපාලනයේ කැපී පෙනෙන රංගනයක් ඉදිරිපත් කරමින් සිටින්නේය. සිරියාව සම්බන්ධ ගැටලුවේදීද තුර්කිය කිසියම් භූමිකාවකට පණදුන් අතර එහිදී සිරියාවේ මෙන්ම තුර්කියේ සහයට රුසියාව සිටි බව රහසක් නොවන්නේය. රුසියාව මේ වන විට තම අතීත ශ්‍රී විභූතිය යළි අත්පත් කර ගනිමින් සිටින අතර ලෝක දේශපාලනයේ සැමදා සිදුවුණු රූකඩ නැටවීමේ කාර්යයේ නූල් ඇදීමේ වගකීම දක්ෂ ලෙස ඉටු කරමින් සිටින බවද හඳුනාගැනීම පහසු නැත.

> ගඩාෆි ඉවත් කිරීමේ අරගලයේදී රටවල් රාශියක්ම ලිබියානු විරෝධාකල්ප දැරූ ජනතාවට සහය දුන් බව සැබෑය. එහෙත් ගඩාෆිගෙන් හිස්වූ ලිබියාව මේ දක්වා වසර එකොළහක් ඉබාගාතේ ගිය නමුදු කිසිවකුගේ හව්වරණක් ලැබුයේ නැත.

2011 අරාබි වසන්නය යටතේ නේටෝවේ හමුදා මෙහෙයවීම ලෝකයේ ඇමරිකාව ප්‍රමුණ දක්ෂිණ කඳවුරේ ක්‍රියාදාමයක් බව අමුතුවෙන් කිව යුතු නැත. ඇමරිකාව සහ යුරෝපා සංගමයේ රටවල සහය ලැබූ ලිබියානු විමුක්තිකාමීන් මේ සටනේදී ගඩාෆිට එදිරිව සිටි අතර අවසානයේ ගඩාෆි පමණක් නොව ලිබියාවේ ස්ථාවරත්වයද බේදාවචකයකින් අවසන් විය.

මෙලෙස ගඩාෆි ඉවත් කර දැමීමට ඇමරිකාවට අවශ්‍ය වූ හේතුව ඉතා පැහැදිලිය. ගඩාෆි වසර 42ක් ලිබියාව පාලනය කළේය. එය ඒකාධිපති පාලනයක් බව සැබෑය. එහෙත් ගඩාෆි ඒ අතරතුර ලිබියාව කලාපයේ සෙසු රටවලට සාපේක්ෂව ආර්ථික, සාමාජයීය මෙන්ම දේශපාලනිකවද ඉදිරිගාමී තත්ත්වයකට ගෙන ඒමට සමත් වූයේය. එහෙත් ඔහු ගෙන ගිය පාලනය බටහිර හිතවාදී වුවක් නම් නොවීය. ලිබියාව සතු වූ තෙල් සම්පත අනෙක් හෙණගෙඩිය විය. ඉරාකය මෙන්ම ලිබියාවද තමන් සතු කර ගැනීම බටහිර ප්‍රධාන අරමුණ වූ නමුදු මේ දක්වා ලිබියාවේ ස්ථාවර පාලනයක් ඇති කිරීමට බටහිර බලවතුන්ට හැකියාව ලැබුණේ නැත.

දැන් රුසියාව සහ තුර්කිය බැල්ම හෙලන්නේ එකී ලිබියාවටය. පැතිර යන කොවිඩ් වසංගතය හේතුවෙන් රාජ්‍ය නායකයන්ගේ හමුව පැවැත්වීම අන්තර්ජාල වීඩියෝ තාක්ෂණය මගින් සිදුවිය. මේ වන විට මධ්‍යධරණී කලාපයේ මෙන්ම මැදපෙරදිග කළාපයේද කැපී පෙනෙන භූමිකාවක් රඟමින් සිටින තුර්කිය මෙහි ඉදිරියෙන් සිටි අතර රුසියාව තුර්කිය පසුපසින් සිටි බව ද අමුතුවෙන් කිව යුතු නොවීය. තුර්කියේ ජනාධිපති එර්දගොන් අනාගත ලිබියාවේ පාලනය කෙසේ විය යුතුදැයි එකමුතුවක් ඇති කිරීමේ උත්සාහයක් දැරුවේය. මේ වන විට ට්‍රිපොලි අගනුවර පාලනය ජාතික එකමුතු ආණ්ඩුව නමින් පවත්වාගෙන යන අතර එරට සෙසු ප්‍රදේශවල විවිධ සටන්කාමී කණ්ඩායම්වල පාලනය යටතේ පවතී. මේ සියලු කණ්ඩායම් එක මතයකට ගෙන ඒම කිසිසේත් පහසු කාර්යයක් නොවන අතර ඒ දක්වා තුර්කි හමුදා ලිබියාවේ සිටිනු ඇති බවද එර්දොගන් ගේ අදහස විය.

ඒ සියල්ල එසේම පවතින අතර ට්‍රිපොලිහි ජාතික එකමුතු ආණ්ඩුව සහ තුර්කි බලධාරීන් සමග සාකච්ඡා වට කිහිපයක් යෝජනා කළ ජනාධිපති එර්දගොන් පවසා ඇත්තේ ලිබියාවේ ආර්ථිකයට යළි පණ දිය යුතු වන බවයි.

මේ අතර යුරෝපා කළාපයෙන් ග්‍රීසිය මෙන්ම ජර්මනියද ලිබියාවට ඇම දමමින් සිටින බව අමතක කළ යුතු නැත. එක්සත් ජාතීන් සහ සම සත්කාරකත්වය මේ සමුළුවට ලබා දුන් ජර්මනියද ලිබියාවේ තෙල් සම්පත යළි පරිභෝජනයට ගත යුතු අන්දම සාකච්ඡාවට ලක් කළේය. ඒ අතරම තුර්කියට විරුද්ධව අදහස් දක්වමින් ලිබියාවට හමුදා යැවීම සම්බන්ධව තුර්කියට සම්බාධක පැනවිය යුතු බවද පවසා සිටියේය.

මේ අනුව ඉදිරියේදී තවත් සාකච්ඡා වට කිහිපයක්ම ලිබියාව වෙනුවෙන් පැවැත්වීමට නියමිතය. ගඩාෆි ඉවත් කිරීමේ අරගලයේදී රටවල් රාශියක්ම ලිබියානු විරෝධාකල්ප දැරූ ජනතාවට සහය දුන් බව සැබෑය. එහෙත් ගඩාෆිගෙන් හිස්වූ ලිබියාව මේ දක්වා වසර එකොළහක් ඉබාගාතේ ගිය නමුදු කිසිවකුගේ හව්වරණක් ලැබුයේ නැත. තමතමන්ගේ න්‍යායපත්‍ර වෙනුවෙන් මිනිස් ජීවිත දහස් ගණන් වනසා දැමූ, දහස් ගණන් ජීවිත අවාසනාවන්ත ඉරණම් කරා ගෙන ගිය යුගය තවමත් අවසන් නැත. ලිබියාව ද එහි ගොදුරකි. එමෙන්ම ලිබියාව අවසන් ගොදුරද නොවන බව ද කිව යුතුය.

ලොව පුරා නූතන අධිරාජ්‍යවාදය ව්‍යාප්ත කරන ධාරාවේ රටවල් වන ඇමරිකාව, චීනය, රුසියාව ඇතුළු තවත් බලවතුන් නොයෙක් හේතු සහ වාසි මත ඉදිරියටත් ලොව නන් දෙසින් තවත් රටවල් තම ගොදුරු බවට පත් කර ගනු ඇත.

චක්වළගල

● ටිරෝනි වෑවලගේ

වාසයට දුෂ්කර එහෙත් අති සුන්දර අගෝෂිමා ගිනිකන්ද

ලෝකයේ සුන්දරතම ස්ථාන අතරින් අති සුන්දරතම, එහෙත් අති දුෂ්කරම ස්ථානයක වාසය කිරීමට ඔබ කැමතිද? එසේ නම් ඔබ තෝරා ගත යුත්තේ ජපානයේ අගෝෂිමා දූපතයි. සැබවින්ම මෙය දූපතක් යැයි පැවසුවාට මෙය ගිනි කන්දක මතුපිටක්. ගිනි කඳු පිපිරීමක් හේතුවෙන් සාගරයෙන් උඩට මතු වූ ස්ථානයක්. එමෙන්ම අමතක කළ යුතු නොවන දෙය නම් මේ අගෝෂිමා ගිනි කන්ද ඔනෑම මොහොතක සක්‍රිය වීමේ හැකියාව පවතින බව. එහෙත් ලෝකයේ සුන්දරතම ස්ථාන ලයිස්තුවේ මුලින්ම සිටින්නේත් මේ අගෝෂිමාවයි. මේ ඡායාරූප ඒ බවට සාක්ෂි සපයනු ඇති.

අගෝෂිමා දූපත, එහෙමත් නැත්නම් ගිනිකන්ද අයත් වන්නේ ජපානයට. ජපානය අසල පිලිපීන මුහුදේ තමයි මේ ගිනිකන්ද හරියටම ස්ථාන ගතවෙලා තිබෙන්නේ.

මේ සුන්දර දූපතේ පහසුකම් අවම වුණත් එහි මිනිසුන් ජීවත් වෙනවා. ඔවුන් ඉතා කැමැත්තෙන් තමයි එහි වාසය කරන්නේ. දැනට මේ දූපතේ ජනගහනය 170ක්. මේ වැසියන්ගෙ අවශ්‍යතා සියල්ල සපුරාලීමේ වගකීම හිමිවන්නේ ටෝකියෝ නගරයේ බලධාරීන්ට. පිහිටීම අනුව මේ දූපතත් ටෝකියෝ මහනගරයේ කොටසක් ලෙසයි සලකණු ලබන්නේ.

අගෝෂිමා දූපත එතරම් විශාල නැහැ. එහි භූමි ප්‍රමාණය වර්ග කිලෝමීටර් 8.75ක්.

භූමියේ දිග කිලෝමීටර් 3.5ක් සහ පළල කිලෝමීටර් 2.5ක් වෙනවා. අද ජනාවාසයක් සහ මිහිමත අති සුන්දර ස්ථානයක් වන අගෝෂිමා ගිනිකන්ද අවසාන වශයෙන් පුපුරා ගොස් තිබෙන්නේ 1781- 1785ත් අතර කාලයේදී.

ප්‍රධාන නගරය හා සම්බන්ධ වීමට මුහුද හරහා ගමන් කළ යුතු වන බැවින් අගෝෂිමාවේ වැසියන් තම අවශ්‍යතා හැකිතාක් දූපත ඇතුළතදීම සපුරා ගැනීමට උත්සාහ දරනවා. ඒ වගේම මේ අති සුන්දර දූපත නැරඹීමට ලෝකයේ සතර දෙසින් පැමිණෙන සංචාරකයන්ගෙන් ද ඔවුන් ආදායම් ලබනවා.

මෙහි පැමිණෙන සංචාරකයන්ට කඳු නැගීමේ, දියමත ලිස්සා යෑමේ, මසුන් මැරීමේ සහ අති සුන්දර කඳු බෑවුම්වල කඳවුරු බැඳීමේ අවස්ථා හිමිවනවා.

> දැනට මේ දූපතේ ජනගහනය 170ක්. මේ වැසියන්ගෙ අවශ්‍යතා සියල්ල සපුරාලීමේ වගකීම හිමිවන්නේ ටෝකියෝ නගරයේ බලධාරීන්ට. පිහිටීම අනුව මේ දූපතත් ටෝකියෝ මහනගරයේ කොටසක් ලෙසයි සලකනු ලබන්නේ.

එහෙත් දැන් වාර්තා වන්නේ අගෝෂිමා වැසියන්ගේ අලුත් පරම්පරාව දූපතෙන් පිටත්ව වඩා වැඩි පහසුකම් සහිත ස්ථාන වාසය සඳහා තෝරා ගනිමින් සිටින බවයි.

2016 ජූනි මාසයේදී එක්වරම දූපත සෙලවෙන්නටත්, පොළොවේ තැනින් තැන දුම් වළා ඉහළ නගින්නටත් පටන් ගත්තා.

වැසියන් බියපත් වූයේ ගිනි කන්ද යළි සක්‍රිය වන බවටයි. එහෙත් එපමණකින් පමණක් මහ පොළොව සෑහීමකට පත්වුණා. දූපතේ වාසය කරන වැඩිහිටි පරම්පරාව සිතන්නේ මේ සිදුවීමත් තරුණ පිරිස දූපතෙන් ඉවතට යැවීමට හේතු වූ බවයි.

කොහොම වුණත් අගෝෂිමාව කිසිදා ජනශූන්‍ය වන එකක් නම් නැහැ. ඒකට හේතුව මේ පුංචි දූපත අති සුන්දර ස්ථානයක් වීම. ඒ සුන්දරත්වය මැද තමන්ගේ ජීවිතෙන් එකම එක දවසක් හරි ගෙවාගන්න ලැබෙනඑක කොතරම් වාසනාවක්ද?

උතුර දකුණ යා කරන ලේක්හවුස් සන්නිවේදන මෙහෙවර

● **සුමුදු චතුරාණී ජයවර්ධන**

සිය පතපොත සහ නිවස 1933 දී දන් දෙමින් යාපනය පුස්තකාලයට මූලපිරූ කේ. එම්. චෙල්ලප්පා සහ පුස්තකාලය ගිනි ගනු දැක වැළඳුණු හෘදයාබාධයකින් තම ජීවිතය නිමා වූ වාග් විශේෂඥ හයසින්ත් සින්ගරායර් ඩේවිඩ් පියතුමා සිටින ලොවක සිට සැනසුම් සුසුම් හෙළන අපූරු සිදුවීමක් පසුගියදා සිදු විණි. උතුරු දකුණ යා කරන පාලම් ගැන බොහෝවිට කතා කළ ද දැනුම් පාලම සකස් කිරීමේ පියවර ගැන මෙතෙක් කතා නොවුණු තරම් ය. භෞතික දියුණුව ගැන කතා කරන බොහෝ දෙනකු අමතක කළ කාරණය වූයේ මෙකී දියුණුවට සාපේක්ෂව තොරතුරු දියුණුවක් සිදු නොවීමේ අභාග්‍ය සම්පන්න බව ය. මේ තත්ත්වය ගැන මනාව සවිඥානික ලේක්හවුස් ආයතනය උතුරු දකුණ යා කරන තොරතුරු සන්නිවේදනයේ පාලම ඇරඹීමේ මූලික පියවර පසුගියදා තැබුවේ ය. ඒ දෙමළ භාෂාවෙන් නිකුත් කරන තිනකරන් පුවත්පත නවාංග රාශියකින් සංගෘහිතව නිකුත් කිරීමත්, ලෝක ළමා දිනයට සමගාමී ව කුට්ටු චුට්ටි නව ළමා පුවත්පත යාපනය විශ්වවිද්‍යාලයේ කෛලාසපති ශාලාවේදී පාඨකයන් වෙත තිළිණ කිරීමෙනුත් ය.

තිනකරන් පුවත්පතට කාලයක් තිස්සේ පාරම්පරික දමිළ ජනයාගෙන් එල්ල වූයේ සුපැහැදිලි පහන් බවක් නොවේ. එයට ආණ්ඩුවේ දෙමළ පත්තරේ යන හංවඩුව ගැසීම අහේතුක බව සත්‍යයක් වුවත්; ඒ හංවඩුවෙන් ගැලවීම පහසු වූයේ නැත. එනිසා තිනකරන් සියලු ම දමිළ ජනතාවගේ පොදු පත්තරයක් බවට දැනවීමේ අභියෝගයක් තිබිණි. මේ, ඒ අභියෝගයට ලේක්හවුස් ආයතනය මුහුණ දීමට ගත් මූලික ප්‍රයත්නයයි. ඒ අනුව උතුරට පිටු 4ක්, නැගෙනහිරට පිටු 2ක්, මධ්‍යම පළාතට පිටු 2ක් බැගින් තිනකරන් පුවත්පතට ප්‍රාදේශීය පිටු එකතු විණි. සහෝදර දමිළ ජනතාවගේ හද ගැස්ම ඒ පිටු හතරට එක් කිරීම ලේක්හවුස් අභිලාෂය විණි. ඒ යහපත් අභිලාෂය වෙනුවෙන් සහෝදර දෙමළ ජනතාවගෙන් ලැබුණු ආශීර්වාදය බලාපොරොත්තු දල්වන සුලු ය.

ජනමාධ්‍ය අමාත්‍ය කෙහෙළිය රඹුක්වැල්ල, ධීවර අමාත්‍ය ඩග්ලස් දේවානන්දා ඇතුළු මැති අමැතිවරු පිරිසක් සහ ලේක්හවුස් ආයතනයේ සභාපති; ජනාධිපති නීතිඥ; ඩබ්ලිව්. දයාරත්න, කර්තෘ මණ්ඩල අධ්‍යක්ෂ ධර්ම ශ්‍රී කාරියවසම්, නීති අධ්‍යක්ෂ; නීතිඥ රබිත අබේගුණවර්ධන, මුදල් අධ්‍යක්ෂ; නීතිඥ ජනක රණතුංග, මෙහෙයුම් අධ්‍යක්ෂ නීතිඥ කණිෂ්ක විතාරණ ඇතුළු පිරිසක් මේ සඳහා සහභාගී වී සිටියහ.

මේ අවස්ථාවට සහභාගී වූ ජනමාධ්‍ය අමාත්‍ය කෙහෙළිය රඹුක්වැල්ල රටේ සෑම දිස්ත්‍රික්කයකම ජනමාධ්‍ය පාසල් ආරම්භ කිරීමට කටයුතු යොදන බව පැවසීය. ජනමාධ්‍ය හා තාක්ෂණයේ බැඳියාව ප්‍රතික්ෂේප කිරීම වෙනුවට නව තාක්ෂණය ඔස්සේ ඵලදායී මාධ්‍යකරණයක් මඟින්; නව පරම්පරාවට නිසි මාධ්‍ය අධ්‍යාපනයක් ලබා දීමේ වැදගත්කම ද අමාත්‍යවරයා මෙහිදී අවධාරණය කළේ ය.

අභියෝග, අභියෝගයක් කර නොගැනීමේ පත්තර මහගෙදර සම්ප්‍රදාය තොරතුරු සන්නිවේදන ලොව කරන මේ පෙරළිය මනාව ග්‍රහණය කර ගත්තකි. එනිසාම පත්තර මහගෙදර හැමවිටම ජනතාවගේ නිවැරදි දැනුම්වත්කරණය වෙනුවෙන් පෙනී සිටියි. මේ ද එහිම දිගුවකි. කුංකුම තිලකය අමතක ව ගිය දකුණට සහෝදරත්වයේ දැත දිගු කරන මේ සත් ව්‍යායාමය අනාගතයේ රන් අකුරෙන් ලියැවෙන්නේ ඒ නිසාය. තිනකරන් ඇරඹූ ඒ සහෝදරත්වයේ සුහද දැත් සමඟ අප සැම අත්වැල් බැඳ ගන්නේ සහෘදය සිතැති ව ය. යාපනයේ විශ්වවිද්‍යාලයේදී ඇරඹී මේ සන්නිවේදන පෙරගමන්කරණය ගැන යාපනය පුස්තකාලය හදන්නට මුල් වූ කේ. එම් චෙල්ලප්පා මෙන්ම පුස්තකාලය ගිනි ගැනීමෙන් ශෝකයට පත් ව දිවි හැර ගිය වාග් විශේෂඥ හයසින්ත් සින්ගරායර් ඩේවිඩ් පියතුමා සිටින ලොවක සිට සතුටු වෙනු ඇතැයි අප මුලින් ම කියූයේ ඒ නිසා ය. පත්තරයක් ඇරෙනවා යනු විශ්වවිද්‍යාලයක් ඇරඹීමක් වැනි ය. කුට්ටු චුට්ටි ළමා පුවත්පත දිනෙක අනාගත පරම්පරාවේ සන්නිවේදන පෙරගමන්කරුවා වනු ඇත. තිනකරන් දමිළ ජනයාගේ හදවත කියවා ගනු නිසැක ය.

ඡායාරූප - අයි. ශිව සාන්තන්

කොරෝනා පැරදවීමේ ජාතික වගකීම

සංවාදය - සුභද්‍රා දේශප්‍රිය

මිනුවන්ගොඩ ඇඟළුම් කම්හලක සේවිකාවකට කොරෝනා ආසාදනය වී පැය හැත්තෑදෙකක් ගත වීමෙන් අනතුරුව ආසාදිතයන් ගණන දහස ඉක්මවන ලදී. දිනකදී මෙරටින් වාර්තාවූ වැඩිම කොරෝනා රෝගීන් ගණන වාර්තා කරමින් කොරෝනා වසංගතය නැවත මෙරට පැතිර යෑම පිළිබඳව රතු එළියක් එසේ නිකුත් විය. මාස දෙකක් පුරා රටත් ජනතාවත් යළි වැඩ අරඹමින් වැටුණු රට නැවත ගොඩනැඟීමේ ජාතික වගකීමක නිරත වී සිටියා පමණි.

ඇඟළුම් කම්හල් සේවිකාවට රෝගය වැළඳුණු ආකාරය පිළිබඳව නිසි තොරතුරක් සොයා ගැනීමට නොහැකි වීම මෙහි ඇති බරපතළ අවදානම් තත්ත්වයයි. ජන සමාජයට මේ රෝගය පැතිර යෑම සම්බන්ධයෙන් එවන් අවදානම් තත්ත්වයක් මතු විය. ඒ අනුව රෝගය යළි සමාජයට කිනම් කාලයක සමාජ ගත වීද යන පැනය මතු වෙයි. කම්හලේ සේවිකාව සහ ආශ්‍රිතයන්ට රෝගය පැතිර යාමත් සමඟ මෙරට කොරෝනා රෝගීන් ගණන හාරදහස ඉක්ම විය.

වෛද්‍යවරුන් පවසන ආකාරයට මේ වයිරසය ශරීරයට ඇතුළු වී සතියක් දෙකක් පමණ ගත වීමෙන් අනතුරුව රෝග ලක්ෂණ මතු කරන අවස්ථාද වෙයි. එසේ වී නම් ඇයට රෝගය වැළඳී සතියක් දෙකක් ගත වීමටද ඉඩ තිබේ. ඇයට අදාළ ආශ්‍රිතයන් එම කාලවකවානුවේ සමාජයේ ගැවැසීම සහ ඔවුන් පොදු වාහනවල ගමන් කිරීම පවා සිදුවිය හැකිය. මේ තත්ත්වය මත වයිරසය පැතිරීම දාමයක් සිදුවීමටද ඉඩ ඇත. එසේ ම මෙතෙක් මෙරටින් වාර්තා වූ රෝගීන්ගේ වයිරසයට වඩා මෙවර වයිරසයේ ප්‍රබලත්වය වැඩි බව ඒ පිළිබඳව පර්යේෂණ කළ විශේෂඥ වෛද්‍යවරුන්ගේ අදහස වී ඇත. වයිරසයේ ප්‍රබලත්වය වැඩි නිසා එය පැතිර යාමේ ප්‍රවණතාවද වැඩි විය හැකි බවද ඔවුන්ගේ අදහස වී ඇත.

අධික ජනතාවක් සිටින ස්ථානවල ගැවැසුණු වයිරස් ශරීරගත වූ පිරිස් සම්බන්ධයෙන් මේ වන තෙක් නිශ්චිත දත්ත සොයාගැනීමට නොහැකි වී ඇත. මේ අවස්ථාවේදී වඩාත් වැදගත් වන්නේ හඳුනා ගත් ආසාදිතයන්ගේ ආශ්‍රිතයන් සොයා ගැනීමයි.

කෙසේ වෙතත් අවදානමක් ඇති සියලු පිරිස් ස්වයං නිරෝධායනට හෝ සෞඛ්‍ය අංශවලට නිවැරදි තොරතුරු හෙළිදරව් කිරීම ඉතා වැදගත් වෙයි. රටක් ලෙස අපි කොරෝනා ආපදාවෙන් පසු යළි රට ගොඩනැඟීමේ ව්‍යායාමයක නිරතව සිටී.

එසේ නොකර රටේ අනාගතය පිළිබඳව කටයුතු කළ නොහැකිය. බලගතු රටවල් කොරෝනා සමඟ බිමට ඇදවැටෙද්දී අපි රටක් ලෙස නැඟී සිටියෙමු. ජනතාව දැනුවත් කිරීමට රජය නිරන්තරයෙන්ම කටයුතු කරයි. පසුගිය මාර්තු මස කොරෝනා වයිරසය මෙරට ව්‍යාප්තවීම ඇරඹුණු පසුගිය මාර්තු මාසයේ සිට ඒ සම්බන්ධයෙන් යුහුසුළුව සියලු ආරක්ෂක අංශ, රජයේ සියලු අදාළ අංශ කටයුතු කළ ආකාරය ඉතා ප්‍රශංසනීය වෙයි. කොරෝනා රැල්ලකට යළි මුහුණ දීමේ හැකියාව මෙරට සෞඛ්‍ය අංශවලට තිබේ.

ක්ෂණික අවශ්‍යතා සැපැයීමටද හැකියාව තිබේ. මේ වනවිට මෙරට පීසීආර් පරීක්ෂණ ලක්ෂ තුනකට අධික සංඛ්‍යාවක් සිදුකර ඇති බව සෞඛ්‍ය අමාත්‍යංශය සඳහන් කරයි.

එමෙන්ම කොරෝනා සම්බන්ධයෙන් තොරතුරු දැනගැනීම සඳහා 1999 ක්ෂණික දුරකතන අංකය සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශය විසින් පසුගියදා හඳුන්වා දුන්නේය. ජනතාව සෞඛ්‍ය අංශ විසින් නිකුත් කරන ක්‍රමවේදයන් නිසියාකාරයෙන් අනුගමනය කළේ නම් සමාජයෙන් මේ රෝගය තුරන් වී හමාරය.

කෙසේ වෙතත් 'කොරෝනාවෙන් තොර හෙටකට වඩා, කොරෝනා සමඟ යළි අප ගොඩනැඟෙන්නේ කෙසේද?' යන කාරණාව පිළිබඳ අවධානය යොමු කළ යුතුය. එසේ නම් ඒ සඳහා ජනතාව වන අපිට විශාල වගකීමක් පැවැරී ඇත. මේ රටේ අනාගතය වෙනුවෙන් ඒ ජාතික වගකීම අපි ඉටු කළ යුතුය.

එක් රැස්වන ස්ථාන අවම කළ යුතුයි

සෞඛ්‍ය අමාත්‍යංශයේ වසංගත රෝග විද්‍යා අංශයේ ප්‍රධාන වසංගත රෝග විද්‍යාඥ සුදත් සමරවීර

මේ අවස්ථාවේදී පළමුවෙන් ම කළ යුතු කාරණාව වන්නේ මේ ඇඟළුම් ආයතනයේ සිටින අය නිවෙස්වලට ගොස් ඇති නිසා ඒ සම්බන්ධයෙන් සැලකිලිමත් වියයුතුයි. ඇඟැළුම් සේවක සේවිකාවන් සමඟ සේවය කළ හෝ ඔවුන් සමඟ ඇසුරු කළ අය කවුරු හෝ සිටී නම් මේ අවස්ථාවේ නිවෙස් වල සිටීම අවශ්‍යම වෙනවා. න්නට අවශ්‍යයි. ස්වයං නිරෝධායනයක් ඇති කරගත යුතුයි.

මේ රෝගය වැළඳී ඇති අය සමඟ මෑතකදී සමීප ඇසුරක් පැවැත්වූ අය කොහේ හෝ සිටී නම් ඒ අය මේ සම්බන්ධයෙන් සෞඛ්‍ය අංශ දැනුවත් කළ යුතුයි. පීසීආර් පරීක්ෂණය කළ යුතුද, නැද්ද කියන කාරණාව ඒ අනුව සැලසුම් කළ හැකියි. එසේ යම් සිද්ධියක් වාර්තා වන අවස්ථාවලදී අපි ඒ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලබනවා. අනෙක් කාරණාව මේ අවස්ථාවේදී අනවශ්‍ය ලෙස එක් රැස්වන ස්ථාන අවම කළ යුතුයි. සෞඛ්‍ය අංශ ඒ සම්බන්ධයෙන් දැනුම් දී මේ වනවිට මහජන රැස්වීම් ආදිය නතර කර තියෙනවා. ඒ සියල්ල කරන්නේ ජනතාවගේ යහපත වෙනුවෙන්. සෞඛ්‍ය අංශ නිවේදන නිකුත් කරන්නේ නිරෝධායන නීති රෙගුලාසි අනුවයි. අනවශ්‍ය එක් රැස්වීම්වලින් රෝගය ව්‍යාප්ත වීම වැඩි වෙනවා. සංගීත සන්දර්ශන, ජනතාව රැස්වන ආගමික කටයුතු වැනි ජන සහභාගීත්වයෙන් වැළකී සිටීම කළ යුතුමයි. මේ කිසිදු රැස්වීමක් අත්‍යවශ්‍ය ඒවා ලෙස සලකන්නේ නැහැ. බෝවීම වැළැක්වීමට නම් සමාජයේ ගැවසීමට අපි පුළුවන් තරම් අඩු කළ යුතුයි. සමාජයට එනවා නම් ඒ අවස්ථාවලදී මුහුණු ආවරණ නිවැරැදිව මුහුණ හා කට වැසෙන සේ දමා සිටිය යුතුයි. නිතර දෑත් සබන් යොදා සේදීම කළ යුතුයි. පුද්ගල දුරස්ථ භාවය තබා ගත යුතුයි. මීටරයේ පරතරය තිබිය යුතුයි. මේ දේවල් අනිවාර්යෙන් කළ යුතුයි. මේ සෞඛ්‍ය පුරුදු දිගින් දිගටම කරනවා නම් අපිට මෙය පාලනය කළ හැකියි.

පැරැණි ඖෂධවල වටිනාකම දැන් තේරෙනවා ඇති

කොළඹ විශ්වවිද්‍යාලයේ සිංහල අධ්‍යයන අංශ මහාචාර්ය අගලකඩ සිරිසුමන හිමි

මේ අවස්ථාවේදී සමාජයට විශාල වගකීමක් පැවැරී තියෙනවා. මෙය පාරිසරිකව ඇති වන තත්ත්වයක් නිශ්චිත ඖෂධයක් පාවිච්චි කරලා සුව වෙන රෝගයක් නොවෙයි .මෙය වහා පැතිරෙන රෝගයක් බවට පත් වී තියෙනවා. මෙවැනි වයිරසයක් පාලනය කරගැනීමේ වගකීම තියෙන්නේ සමාජයටමයි. සෞඛ්‍ය අංශවලට වඩා වගකීමක් පුද්ගලයන් මත පැවැරී තියනවා.

සැම පුද්ගලයෙකුටම මේ වගකීම පැවැරී තියෙනවා. බුදුදහම අනුව බැලූ විට සෞඛ්‍ය සම්පන්න ජීවිතයකට හුරුවන හැටි සඳහන් කරන සැමවිටකම තමා අවට ඇති පරිසරය පිළිබඳව ඇති වැදගත්කම පිළිබඳව අවධාරණය කර තියෙනවා.

ගිරිමානන්ද සූත්‍රයේ ඒ බව සඳහන් වෙනවා. අපි බුදු දහමින් ශික්ෂණය ලැබූ ජාතියක්. කොරෝනා ප්‍රශ්නයේදී පමණක් නෙමෙයි මිනිසුන්ගේ සෞඛ්‍ය සම්පන්න භාවය ගැන වඩා සැලකිලිමත් විය යුතුයි. පැරැණි සමාජයේ සෞඛ්‍ය සම්පන්න සිරිත්, සමාජ සිරිත් අපිට කියාදුන්නා. ඒ දේවල් හොඳින් ආරක්ෂා වුණු බව පැරණි සමාජයේ බොහෝ දේ තුළින් අපිට දක්කට ලැබෙනවා. කෙම් ක්‍රම, නිමිති, දේශීය ඖෂධ සෞඛ්‍ය සම්පන්නභාවය සඳහා පාවිච්චි කළ දේවල්.

මේ දේවල් කෙතරම් දුරට මේ අවස්ථාවලට ගලපා ගත යුතුයි ද කියා අප කල්පනා කළ යුතුයි. ඒ දේවල් මිනිසුන්ගේ යහපැවැත්මට අදාළ වූ දේ ද කියලා අපි නැවත සිතිය යුතුයි.

ඒ නිසා විශේෂයෙන් අපි අපේ රජය ගත් උත්සාහය සාර්ථක වුණත් සමාජයෙන් එය පිළිපැදීමේ ඇති දුර්වලකම නිසා මේ සිදුවීම වුණාද කියන එක ගැටලුවක්. තමන් ඉන්න තැන, තමන් යන එන තැන ගැන, ඇසුරු කරන අය ගැන තමන්ට විශාල වගකීමක් තියෙනවා. මාර්තු මාසයේ කොරෝනා පළමු රෝගියා වාර්තාවීමේදී මිනිසුන් දේශීය ඖෂධවලට යොමුවුණා. ඉඟුරු, සුදුළූනු කොත්තමල්ලි කහ සොයාගන්න බැරි වුණා.

අපේ පාරම්පරික ගැමි සමාජයේ තිබුණු ඒ ඖෂධ වසංගත රෝග පාලනය කරගැනීමට අපට ඉවහල් වුණා. හැමෝම කොත්තමල්ලි බොන්න පුරුදු වුණා. ඒ යහපත් සෞඛ්‍ය පුරුදුවලට අපි කාලයක් යොමු වුණා. රෝග නිවාරණය සියල්ල අමතක කරලා දාලා නැවත කිරි විදුරුවටම මිනිස්සු හුරුවුණා. ඉඟුරු කොත්තමල්ලි වයිරස නසන්න හැකි දෙයක්.

පසුගිය කාලයේ වගා කරපු දේවල් අපි අතහැරලා දැම්මා. යළිත් අපිට එවැනි දේ ගැන සිහිකරන කාලයක් උදාවෙලා තියනවා. ඒ වගේ දේවල්වලට සමාජයේ ඉඩක් ලබා දිය යුතුයි. මුබවාඩම් එදා ඉදලා අපේ සංස්කෘතිය ඇතුළේ තිබුණා එය අපි නැවත ආරම්භ කළ යුතුයි. කොරෝනා ව්‍යාප්තිය සමඟ මේ අවස්ථාවේ අපි එය නැවත කඩ නොවන පුරුද්දක් ලෙස හැමදාටම ජීවිතයට පුරුදු පුහුණු කරගත යුතුයි.

එකම පිළියම වන්නේ දුරස්ථභාවය රැකගැනීමයි

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ උප කුලපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුදන්ත ලියනගේ

කොරෝනා ඉක්මනින් ව්‍යාප්ත වන වයිරස රෝගයක් නිසා ආසාදිතයෙක් මුණ ගැසුණු වහාම එය දැනුම් දිය යුතුයි. ජන ඝනත්වය වැඩි ස්ථානයක වැඩි වශයෙන් ව්‍යාප්ත වීම අනිවාර්යෙන්ම සිදුවෙනවා . ඒ නිසා එක් රැස් වීම් අවම කළ යුතුමයි. මේ කාලය තුළදී ඉතාමත්ම ප්‍රවේශම් විය යුතුයි.

වෙනත් රෝගී තත්ත්වයන් මෙන් නොව වේගයෙන් ව්‍යාප්ත වන වසංගත රෝගයක්. ඊට කළ යුතු එකම පිළියම වන්නේ දුරස්ථභාවය රැකගැනීමයි. අපි මුහුණ ඇල්ලීම නොකළ යුතුයි. ඒ හරහා ඉක්මනින් බෝවීම සිදුවෙනවා. ඒ නිසා මුඛ ආවරණ පැළඳීම හා සබන් ගා අත නිවැරදි ආකාරයට සේදිය යුතුයි. පුද්ගල දුරස්ථභාවය තබා ගතයුතුමයි. ලෝකයේ මේ රෝගය බින්දුව බවට පත්වෙන්නේ නැහැ. ඒ නිසා අපිට රටක් ලෙස මේ රෝගයත් සමග ඉදිරියේදී ජීවත් වෙන්නට සිදුවෙනවා. ඒ සඳහා අපේ සමාජ වගකීමක් පවත්වා ගත යුතුයි. මේ රෝගයත් සමඟ ජීවත් වෙන්නේ කෙසේ ද කියන කාරණාව තමයි අපි මේ අවස්ථාවේදි සිහි තබා ගත යුතු වන්නේ. අවුරුදු පනහට වඩා වැඩි සහ කුඩා දරුවන් පිළිබඳව අපි විශේෂ අවධානයෙන් කටයුතු කළයුතුයි. ඔවුන්ට මේ රෝගය වැළඳීම හා එයින් ඇතිවන මාරාන්තික තත්ත්වය වැඩියි. එමෙන්ම විවිධ සංකූලතා ඇති අයටත් වැළඳුණොත් අවදානම වැඩියි. අන්‍ය පුද්ගලයන් ඇසුරුකිරීමේදී දුරස්ථභාවය ඇති කර ගත යුතුයි. තනිවම ආහාර පාන වැළඳීම පවා කළ යුතුයි. විශේෂයෙන් පොදු ස්ථානවලදී, කාර්යාලයේදී, සමස්තයක් වශයෙන් ගත්විට මේ කොරෝනා විශාල අර්බුදයක් ඇති කර තියෙනවා. අපේ රටට වුණත් විශාල ආර්ථිකමය බිඳවැටීමක් ඇති කර තියෙනවා.

යම් ප්‍රමාණයකට හිස ඔසවාගෙන එන අවස්ථාවකදී නැවත මේ අර්බුදයට අපිට මුහුණ දෙන්න සිදුවුණා. ශිෂ්‍යත්ව විභාගය මෙන්ම උසස් පෙළ විභාග කල් නොදමා පැවැත්වීම අගය කළ යුතුයි. විභාග මානසිකත්වයකින් දරුවන් සිටින නිසා විභාගය පැවැත්වීම සුදුසු වනවා. ගම්පහ දිස්ත්‍රික්කය දැඩි අවදානමක් පවතින නිසා ඒ පිළිබඳව වඩා සැලකිලිමත් විය යුතුයි. මේ පිළිබඳව තොරතුරු දන්නා අය අදාළ නිළධාරීන්ට ලබා දී නිවැරැදි සෞඛ්‍ය ආරක්ෂණ පුරුදු අනුගමනය කළ යුතුයි. අපි ජනතාවගෙන් ඉල්ලීමක් කරනවා. මෙවැනි පොකුරු වශයෙන් ව්‍යාප්ත වීම නිසා මේ රෝගය ගැන දෙවරක් නොව තුන් හතර වරක් හෝ සිතා බලන මෙන්. අපි කලබල නොවී රටේ ඉදිරි ආර්ථික කටයුතු කළමනාකරණය කළ යුතුයි. එසේ නැති නම් රටක් ලෙස අපිට ලොකු ආර්ථික අර්බුදයක් කරා යෑමට සිදුවෙනවා.

මානසික ආතතියෙන් තොරවීමත් වැදගත්

ජාතික රෝහලේ ජාතික පුහුණු කිරීමේ නිළධාරිනී පුෂ්පා රම්‍යානි සොයිසා

අප යහපත් සෞඛ්‍ය පුරුදු අනිවාර්යෙන් අනුගමනය කළ යුතුමයි. අත්‍යවශ්‍ය ගමන් වලට පමණක් නිවසින් බැහැර විය යුතුයි. ඒ වගේම වැඩිහිටියන් කුඩා දරුවන් රෝගි තත්වයන් පවතින අය ගමන් නොකළ යුතුයි. අනිවාර්යෙන්ම සුදුසු ප්‍රමිතියෙන් යුතු මුහුණු ආවරණයක් පැළඳිය යුතුයි.

එම මුහුණු ආවරණවලින් තමන්ගේ කෙලබිඳිති ඉවතට නොයන ලෙස මෙය පැළඳිය යුතුයි. තමන්ටත් එයින් සියයට 60ක ආවරණයක් එයින් සැලසෙනවා. හැමතැනකදීම අනවශ්‍ය ස්පර්ශයෙන් වැළකී සිටිය යුතුයි. ප්‍රතිශක්තිකරණය වැඩිකර ගැනීමට කටයුතු කළ යුතුයි. විවේකය, මානසික ආතතියෙන් තොරව සිටීම වැනි කරුණුවලින් බොහෝ විට මේ තත්ත්වය පාලනය කරගන්න පුළුවන්. අන් අයද එයින් ආරක්ෂා වනවා. කාර්යාලයේදී ගමනේ බිමනේදී අනෙක් අය සමඟ සමාජ දුරස්ථභාවය මෙන්ම අනෙක් අය සමඟ සමීප සම්බන්ධතා පැවැත්වීම පාවිච්චි කරන භාණ්ඩ කෑම බීම, මුදල් පවා ස්පර්ශය අවම කරගැනීම හුවමාරු කරගැනිම අවම කරගත යුතුයි.

වගකීම ජනතාව අතේ

ක්‍රිකට් ක්‍රීඩක ලසිත් මාලිංග

රජය මොන දේ කිව්වත් වැඩක් නැහැ ජනතාව ඇහුම් කන් නොදෙවානම්. ඒ වගේම ඇහුම් කන් දීලා ඇහුණ දේ ක්‍රියාත්මක කිරීමට හැකියාව තිබිය යුතුයි. එසේ කටයුතු කළ හැකි නම් එය හොඳටම ප්‍රමාණවත්. එසේ කටයුතු කළා නම් මේ විපත වෙන්නේ නැහැ. සරල, ඇත්ත එයයි.

පළමුව අපි දන්නෙම නැතුව රෝගය රටට ආවා. ඒ වෙලාවෙ රෝගය මර්දනය කරපු ආකාරය දැකපු මිනිස්සු දෙවන පාර කොහොමද පාලනය විය යුතු වන්නේ කියලා දැනගෙන සිටිය යුතුයි. ඒ පළමුව පැමිණි වසංගතයට හොඳින් මුහුණ දුන්නා නම් දෙවන වතාවට අපි කෙසේද කියන කාරණාව සම්බන්ධයෙන් ජනතාව දැනුවත් බවක් නැතිවෙන්න විදිහක් නැහැ කියලයි මම හිතන්නේ. මෙහි සම්පූර්ණ වගකීම ජනතාවගේ අතේ.

මේ තත්ත්වයට ලෝකයේ බොහෝ රටවල් මුහුණ දෙනවා. අපි මොන දේ කිව්වත් මිනිස්සුන්ට වැඩක් නැහැ. ඒ අය හිතන්නේ අපි ක්‍රිකට් ගහලා අපිට සල්ලි තියනවා ඒ නිසා මේ අය කියන දේවල් අපිට වැඩක් නැහැ කියලා. ඒ නිසා අපි අදහස් දක්වලා වැඩක් නැහැ . සමහර අය හිතන්නේ රැකියාව නොකර ජීවත් වෙන්නෙ කොහොමද කියන එකයි.

එවන් සමාජ වටපිටාවකයි අපි ඉන්නේ. රජය දෙන උපදෙස් පිළි පැදීම සහ නිවැරදි සෞඛ්‍ය පුරුදු අනුගමනය කිරීම පළමුව කළ යුතුමයි. ඇහුම් කන්දීමේ හැකියාව, තේරුම් ගැනීමේ හැකියාව ඇති නම් එය නිසි ලෙසින් ක්‍රියාත්මක කළ යුතුයි. ජනතාවට ඇහුම් කන් දෙන්න හැකියාව නැති නම් තේරුම් ගන්න හැකියාව නැති නම් මේ දේ සාර්ථකව ක්‍රියාත්මක කරන්න බැරිවෙනවා. දැනුම්වත් කිරීම් ලෙස රජය විසින් හොඳින් දැනුවත් කිරීම් කර තියෙනවා. ර ුපියල් 40 මුහුණු ආවරණයක් රුපියල් 100ට වැඩි කරහම කොහොමද ජනතාව මුහුණු ආවරණ පළඳින්නේ. ඒ දේවල් පිළිබඳවත් අවධානය යොමු කළ යුතුයි. මේ වගේ ප්‍රායෝගික ගැටලුත් එක්ක නිවැරදි සෞඛ්‍ය පුරුදු කළ හැක්කේ කෙසේද යන ප්‍රශ්නයත් මතු වෙනවා. එවන් කටයුතු සම්බන්ධයෙන් රජයේත් ලොකු වගකීමක් තියෙනවා.

ස්වයං පාලනයක් ඇති කරගත යුතුයි

පාරිභෝගික අයිතීන් සුරැකීමේ ජාතික ව්‍යාපාරයේ සභාපති රංජිත් විතානගේ

මේ අවස්ථාවේ අපි ජාතියක් ලෙස නිවැරදි ආකාරයෙන් වගකීමෙන් යුතුව කටයුතු කළ යුතුයි. විවිධ පාර්ශ්වයන්ට චෝදනා එල්ල කරනවාට වඩා ජාතියක් ලෙස අපි මෙයට මුහුණ දිය යුතුයි. ජනතාව ලෙස අපි විනයක් ඇති කරගත යුතුයි.

ස්වයං පාලනයක් ඇති කරගත යුතුයි. පසුගිය මාස දෙක තුළ අපි ඒ නිවැරදි සෞඛ්‍ය පුරුදු දැක්කේ නැහැ. මේ ප්‍රශ්නය ලෝකයටම බලපානවා. ලෝකයේම ආර්ථික අර්බුදයක් ඇති වී තියෙනවා. ජනතාව තමයි තේරුම් ගන්න ඕන මෙය ව්‍යාප්ත කරගන්නවාද නැද්ද කියන දේ. සෞඛ්‍ය අංශ විසින් නිවේදනය කරන දේ පිළිබඳව දැනුවත් විය යුතුයි. පුළුවන් තරම් නිවෙස්වල රැඳි සිටිය යුතුයි. පක්ෂ භේදයකින් තොරව රට මේ වසංගතයෙන් බේරාගැනීමට එකමුතු විය යුතුයි.

නිරෝධායන නීති කැඩුවොත් තදින්ම ක්‍රියා කරනවා

නියෝජ්‍ය පොලිස්පති නීතිඥ අජිත් රෝහණ

කොරෝනා වසංගතය යළි සමාජයේ පැතිර යාමක් මෙවර සිදුවී තියෙනවා. මේ සම්බන්ධයෙන් පෙර තත්ත්වයන්ට වඩා ජනතාව තේරුම් ගෙන කටයුතු කළ යුතුයි. නිරන්තරයෙන් මුඛ ආවරණ පැළඳ යුතුයි රෝග ලක්ෂණයක් මතු වූ වහාම ඒ සම්බන්ධයෙන් අදාළ නිළධාරීන් දැනුවත් කළ යුතුයි. ඇඳිරි නීතිය පවතින ප්‍රදේශවල ජනතාව එයට ගරු කළ යුතුයි. රජයේ නිවේදනයන්ට අනුකූළව කටයුතු කළ යුතුයි. පවතින තත්ත්වයන් හමුවේ ඇඳිරි නීතිය පවතින ප්‍රදේශවල ජනතාව නිවසේ රැඳී සිටිය යුතුයි.

නිරෝධායන ඇඳිරි නීතිය බල පැවැත්වෙන කාලය තුළ දී එම ප්‍රදේශයන්ට ඇතුළු වීම, හා එම ප්‍රදේශයන්ගෙන් පිටවීම නොකළ යුතුයි. පවතින වාතාවරණය මත සියලු ප්‍රිය සම්භාෂණ නවත්වන ලෙස සෞඛ්‍ය අමාත්‍යංශය නිවේදනය කර ඇති අතර මහජනයා එක් රැස්කිරීමේ කටයුතු සිදු නොකරන ලෙස සෞඛ්‍ය අමාත්‍යාංශය නිවේදනය කර තිබෙනවා. ඒ අනුව ප්‍රිය සම්භාෂණ, දේශන, ප්‍රදර්ශන, සම්මන්ත්‍රණ සංගීත සංදර්ශන සැණකෙළි සැමරුම් උත්සව, පෙළපාලි, පෙරහර හා අත්‍යවශ්‍ය නොවන රැස්වීම් ආදිය සමස්ත දිවයිනේම නැවත දැනුම් දෙන තුරු අත්හිටුවීම අගය කළ යුතුයි. යම් කිසි කරුණු නොසඟවා පැවැසිය යුතුයි. නිළධාරීන්ට සහාය ලබා දිය යුතුයි. එමෙන්ම ආයතනවල සිටින පුද්ගලයන් දුරස්ථ භාවය ආරක්ෂා කරගත යුතුයි. පොදු ප්‍රවාහන සේවාවන් භාවිත කිරීමේදී මුඛ ආවරණ පැළඳීම මෙන්ම පුද්ගල දුරස්ථභාවය තබා ගත යුතුයි.

නිරෝධායනයට ලක් කළ පිරිස් එය නියමිත ආකාරයෙන් අවසන් කළ යුතුයි. නිරෝධායන නීති කඩ කරන්නන්ට පොලිසිය විසින් නීතිය තදින්ම ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන අතර ජනතාව අතර මේ වසංගතය පැතිර යාම වළක්වා ගැනීමට ජනතාවගේ වගකීමක් ලෙස සැලකිය යුතුයි. ඒ නිසා වගකීමෙන් කටයුතු කරන්න කියල ජනතාවගෙන් ඉල්ලීමක් කරනවා.

තරංග

ජයපාල මැතිනිය (මිලි කහඳවල)
විෂ්ණබායි (රුක්මණී දේවි)

රුක්මණී දේවි මහගත්කරු දෙපා මුල වැඳ වැටෙයි

● ඒ. ඩී. රන්ජිත් කුමාර

ඔහු සිංහලයේ මහා නවකතාකරු ඩබ්ලියු.ඒ. සිල්වා ය. සම්පූර්ණ නම වැල්ලෙවත්ත ආරච්චිගේ එබ්රහම් සිල්වා ය. 1890 උපන් ඔහු 1957 මිය ගියේය.

ඔහු 1933 වසරේ ලියා පළ කළ 'කැලෑ හඳ' නවකථාවේ කතුවරයා ය. ඔහු ලියූ නවකථා අතරින් වඩාත් ජනප්‍රිය වූ නවකථාව ද 'කැලෑ හඳ' ය. මේ නවකථාව කොතරම් ජනප්‍රිය ද යත් බස්රියක ගමන් කරන විට හෝ මහජනයා බහුල ලෙස රැස්වන තැනක ගැවසෙන විට හෝ මේ නවකථාවෙන් පිටපතක් අතේ ඇතිව සිටීම පවා එක්තරා විලාසිතාවක් සේ සලකන්නටද එකල ඇතැමුන් උනන්දු වූ බව මහාචාර්ය මිණිවන් පී. තිලකරත්න සඳහන් කර තිබුණි.

1952 වසරේ එවකට ලංකාවේ සිටි ප්‍රකට චිත්‍රපට නළුවකු හා චිත්‍රපට කතා රචකයකු වූ බී.ඒ. ඩබ්ලිව්. ජයමාන්න දිනක් මරදානේ ටවර් ශාලාවේ ජේ.ඩී.ඒ. පෙරේරා ගේ "වෙස්සන්තර" නාට්‍ය නැරඹීමට පැමිණ සිටියේය. විවේක කාලයේ දී අමුත්තෙක් ජයමාන්න සිටි තැනට කතාබහට එක් වී "කැලෑ හඳ" වැනි ජනප්‍රිය නවකතාවක් සිනමාවට නගන්න අකමැති දැයි ඇසීය.

"මම හිතන්නෙ නැහැ මිස්ටර් සිල්වා ගෙන් හිතන තරම් ලෙහෙසියෙන් 'කැලෑහඳ" වගෙ පොතක අයිතිය ලබා ගන්න පුළුවනි..."

"මිස්ටර් ජයමාන්න 'කැලෑ හඳ' ට ආදරේ නම් මට පුළුවනි උපකාර කරන්න. සිල්වා මගේ හොඳ මිත්‍රයෙක්."

එසේ කීවේ කොළඹ පෞද්ගලික ඉංග්‍රීසි සමාගමක ලිපිකරුවකු ලෙස සේවය කළ කේ.එච්.ඒ. ධර්මසේකර නම් අයෙකි.

ධර්මසේකර ලුණු ඇඹුල් ඇතුව අපූරුවට කපුකම කළේය. ඒ කාලයේ ඩබ්ලිව්.ඒ. සිල්වා පදිංචිව සිටියේ දියතලාවේ "ද නූක්" නම් දැකුම්කළු නිවෙසක ය. ජයමාන්න හා ධර්මසේකර අතර හුවමාරු වූ ලිපි කෙළවර වූයේ සිල්වා විසින් ජයමාන්න පවුලට කරන ලද ආරාධනයක් සහිත ලිපියකිනි.

"ඔබත්, රුක්මණි දේවියත්, එඩී ජයමාන්නත් සමඟ සිල්වා හමුවීමට දියතලාවට එන්න." ධර්මසේකර ජයමාන්නට ලියා යැවීය.

එය ඉතිහාස ගතවන දවසකි. එදා ජයමාන්න, රුක්මණී, දියතලාවේ 'නූක්' නිවෙසට යන විට සිල්වා මහතාත්, ධර්මසේකර මහතාත් ඔවුන් පිළිගැනීමට සූදානම්ව සිටියහ. උපහාස රසයෙන් පිරි ඒ කතාව සියල්ලෝම සතුටු සයුරේ ගිල් වීමට සමත් වූහ.

"කැලෑහඳ" නවකථාව මට පවරන්නේ නම් මම සිංහල සිනමාවට ආ චිත්‍රපට සියල්ල පරදවන චිත්‍රපටියක් නිෂ්පාදනය කරමි." බී.ඒ. ඩබ්ලිව්. ජයමාන්න සිල්වාට පොරොන්දු විය.

එදා ඩබ්ල්යු.ඒ. සිල්වා මේ පිරිසට අපූරු භෝජන සංග්‍රහයක් පැවැත්විය. ඒ පිළිබඳ ධර්මසේකර ඉන් වසර දහයකට පමණ පසු ඩබ්ල්යු.ඒ. සිල්වා ඒ වන විට මිය ගොස් තිබුණි.1963 වසරේ ලියූ "කතා රජ කතාව" (ඩබ්ල්යු.ඒ. සිල්වා චරිතය) කෘතියේ සඳහන් කර ඇත.

ප්‍රථම වරට සිංහල නවකථාවක් චිත්‍රපටයට නැඟුණේ මේ අයුරිනි. බී.ඒ. ඩබ්ලිව්. ජයමාන්න එතෙක් (1947 සිට 1952) දක්වා ලංකාවේ නිපදවන සිංහල චිත්‍රපටයකට වියදම් නොකළ වියදමක් කොට "කැලෑහඳ" නිෂ්පාදනය කළේය. එය රුපියල් ලක්ෂ 5කි. ගිවිසුම් ප්‍රකාර නවකථාවේ අයිතිය සඳහා රුපියල් 15,000ක්ද චිත්‍රපටය රුපියල් ලක්ෂ 20 ඉක්ම වූ පසු ආදායමෙන් 5%ක්ද සිල්වාට ලැබී ඇති බව පැරණි චිත්‍රපට තොරතුරු ගබඩාවක් වූ පත්‍රකලාවේදී ඩී.වී. සෙනෙවිරත්න 1970 වසරේ "වනිතා විත්ති" පුවත්පතේ සඳහන් කර තිබුණි.

"කැලෑ හඳේ" මාලිනී ගේ චරිතයට රුක්මණී දේවි තරම් සුදුසු නිළියක් නැති බව සිල්වාගේ තීරණය විය. නවකථාවේ මාලිනී මුහුණ දෙන මානසික ගැටුම් සියුම්ව නිරූපණය කරන සැටිත්, ඒ දෙබස් උච්චාරණය කරන ආකාරයත් සිල්වා රුක්මණිට කියා දී ඇත.

රුක්මණී දේවි නිළියක් හා ගායිකාවක් ලෙස කලා ලෝකයේ එදා බැබළුණ ද ඇගේ නිහතමානි, කළ ගුණ දන්නා මහඟු ගුණ ධර්ම ගැන වරක් මහ ගත්කරු සිල්වා මහතා පණ්ඩිත ගුණපාල සේනාධීරට කී කතාවකින් මනාව පැහැදිලි වෙයි. "මා හැඳින ගත් මහ නවකථාකරු" මැයෙන් ගුණපාල සේනාධීරයන් 1957 ලියූ ගත්කරුගේ අනුස්මරණ ලිපියක මේ බව සඳහන් වෙයි.

"චිත්‍රපටයේ මුහුරත් මංගල්‍යයෙන් පසු විවේක නිකේතනයක දී සාදයක් නිෂ්පාදන සමාගම විසින් පවත්වන්නට යෙදින. මේ හමුවේදි රුක්මණී දේවිය තමා ඉදිරියට අවුත් දණින් වැටී තම දෙපා වැඳි බව මහගත්කරු කීයේ දුක්බරව සිතිනි. එහි දී ඩබ්ල්යු.ඒ. මතුකොට කීවේ ඇගේ ගුණවත් බව ය. නළුකම වැනි රැකියාවකට පිවිසුණ ද ඇය යහපත් මව්පියන් ඇසුරෙහි හැදුණු ආචාරශීලී කාන්තාවක් බව තමාට වැටහුණු බව ඩබ්ල්යු.ඒ. රුක්මණී දේවියට දුන් සහතිකයකි."

කැලෑහඳ නවකථාවේ විකට චරිතයක් නොවීම එඩී ජයමාන්න කණස්සල්ලට පත්වී ඇත. සුපුරුදු මිනර්වා චිත්‍රපටවල සිටි විකට ජෝඩුව නොසිටීමෙන් චිත්‍රපටය අසාර්ථක වේ යයි බී.ඒ. ඩබ්ලිව්. ජයමාන්න විසින් ඩබ්ල්යු.ඒ. සිල්වාට කාරුණිකව සැල කොට සිටියේය.

"ඔය කතාවට මම කොහොමත් කැමති නෑ. එහෙම කළොත් කතාවට වන්නේ ලොකු හානියක්." ඩබ්ල්යු.ඒ. සිල්වා නොසතුටු මුහුණකින් කියා ඇත.

"අපි කතාවට හානියක් නොකොට විකට ජෝඩුව යොදා ගැනීමට ඉඩ දෙන්න." ජයමාන්න කී ආයාචනයට රුක්මණී ද අනුබල දීම ගැන සිල්වා ටික වේලාවක් කල්පනා කොට නවකථාවේ එන අන්දාගේ චරිතයට යා වෙන සේ මිසී නමින් චරිතයක් එක්කර චිත්‍රපටයට හාස්‍ය මතු කිරීමට අතුරු ජවනිකා කිහිපයක් ලියා දීමට කැමැත්ත පළ කොට ඇත. නවකථාවේ එන එළිමහන් දර්ශන ලංකාවේම රූගත කළ යුතු යැයි ද විශේෂයෙන් එහි එන සංගිලි පාලම ආශ්‍රිත දර්ශන අරණායකදීම රූප ගත කළ යුතු බව ඩබ්ල්යු.ඒ. සිල්වා උපදෙස් දී ඇත. මේ අනුව මදුරාසියේ සිට ලංකාවට පැමිණි ඉන්දීය කාර්මික පිරිස සමඟ ජයමාන්න කණ්ඩායම මීගමුව, කටාන, ඇත්ගාල ආදි ප්‍රදේශවල දීද අරණායක හා පේරාදෙණියේ සංගිලි පාලම් දෙකේ ද රූපගත කරන ලදි.

රුක්මණීට, එඩීට මහා ගත්කරු ගෙන් අපූරු භෝජන සංග්‍රහයක්

මිලානී (රුක්මණී) ජෝන් ජයපාල (ස්ටැන්ලි පෙරේරා) 'කැලෑහඳ' චිත්‍රපටයේ

සිල්වාගේ උපදෙස් පරිදි කතාවේ එන ජයපාල මැතිනිය නිතරම වාඩිවන කළුවර ලීයෙන් තැනූ නාග පුටුව ඒ ආකාරයෙන් ම තිබිය යුතු යැයි ද කළ කොන්දේසියක් ඉටු කිරීමට ජයමාන්න නිෂ්පාදකයන් ඒ පුටුව හැදීමට රු. 15,000ක් (මෙය 1952 දී ලොකු වියදමකි) ද වැය වී ඇත. නාග පුටුව හැදීමට කලා අධ්‍යක්ෂවරයාට මාස එකහමාරක් ගතවී ඇත. චිත්‍රපටයේ වැඩ කටයුතු නිම කිරීමට මාස 5ක් ගත වූ බව වාර්තාවේ.

චිත්‍රපටයේ මාලිනී ලෙස රඟ පෑ රුක්මණී දේවියට හා අන්දා ලෙස රඟ පෑ එඩී ජයමාන්නට රු. 25,000 බැගින් ගෙවා ඇත. සිංහල චිත්‍රපටයක් එතෙක් (1947 සිට 1953) උපයූ වාර්තාගත ආදායම 'කැලෑ හඳ" චිත්‍රපටය ලැබූ අතර 1953 මැයි 27 වෙනිදා සිට මරදානේ එල්ෆින්ස්ටන් සිනමා ශාලාව ඇතුළු සිනමාහල් අටක තිරගත වී ඇත.

1964 වසරේ ප්‍රථම සරසවිය චිත්‍රපට සම්මාන උලෙළින් පසු ඩයස් ගුණරත්න (පසුව සම්මානිත මහාචාර්ය ඩයස් ගුණරත්න හෙවත් ආර්.ඩී. ගුණරත්න) විසින් බී.ඒ. ඩබ්ලිව්. ජයමාන්න සමඟ පැවැත්වූ සංවාදයෙන් මේ පුවත් හෙළිවී ඇත.

මේ චිත්‍රපටයේ යුග ගීත දෙකක් වර්ණයෙන් රූ ගන්වා ඇති බව පැවසේ. ඒ ගීත දෙක නම් "අන්න සුදෝ අර පාට වළා" හා "මගේය ප්‍රේම මාලිනී" රුක්මණි දේවි හා මොහිදීන් බෙග් ගැයූ හර්බට් එම්. සෙනෙවිරත්න රචනා කළ ගීතය. එස්.එස්. වේදා නම් දකුණු ඉන්දියානු සංගීතඥයා මේ ගීත සංගීත අධ්‍යක්ෂණය කර ඇත. කැලෑහඳ චිත්‍රපටයේ ගීත සියල්ලම ජනප්‍රිය විය. මහාචාර්ය සුනිල් ආරියරත්නයන් (සිංහල චිත්‍රපට ගීතාවලිය (1947 - 1956) කියා ඇති ආකාරයට මේ චිත්‍රපටයේ සියලුම ගීත හින්දි චිත්‍රපටවල ගී තනුවලින් උපුටා ගත් ඒවා ය. ඒවා මෙසේය.

"කැලෑහඳ" චිත්‍රපටය ඇරඹී අත්තේ එකල ඉතාම ජනප්‍රිය වූ පොත් පිටකවර චිත්‍ර ශිල්පී ජී.එස්. ප්‍රනාන්දු විසින් අඳින ලද පිටකවරයේ (මෙහි එය පළවේ) චිත්‍රයෙනි. මහා ගත්කරු සිල්වා පයිප්පයක් කටේ රුවාගෙන කතා කරන දර්ශනයක් නාමාවලියට ඇතුළත් වී ඇති බවත් රුක්මණී, එඩී හා බී.ඒ. ඩබ්ලිව්. ජයමාන්න සජීවී රූප සහිත කෙටි ප්‍රචාරාත්මක චිත්‍රපටයක් තිරගත වූ බව ඩී.වී. සෙනෙවිරත්නයන් සඳහන් කර තිබුණි.

1956 මාර්තු 02 වැනිදා කොළඹ රාජකීය විද්‍යාලයේදී "දිනමිණ" පත්‍රය මගින් ලංකාවේ මුල්වරට පවත්වන ලද රඟමඬල චිත්‍රපට තරගයක තෑගි බෙදා දීමේ උලෙළේදී ප්‍රියතම සිංහල චිත්‍රපටය ලෙස පාඨක ඡන්දයෙන් 'කැලෑහඳ' චිත්‍රපටය සම්මාන ලබා ඇත.

1956 මැයි 18 වෙනිදා කොළඹ රීගල් සිනමාහලේ පැවැත්වූ දීපශිඛා සම්මාන උලෙළේදී (මෙය ප්‍රථම ලාංකික සිනමා සම්මාන උලෙළ) හොඳම නළුවා ලෙස 'කැලෑහඳේ' නන්ද රාල ලෙස රඟ පෑ බී.ඒ.ඩබ්ලිව්. ජයමාන්නට හිමි වී ඇත.

මේ ඓතිහාසික චිත්‍රපටයේ එකදු පිටපතක්වත් අපට දක්නට නැත. රුක්මණි, එඩී, හා බී.ඒ. ඩබ්ලිව්. 1953 ඉන්දියා රජයට ගෙවිය යුතු ආදායම් බදු ප්‍රශ්නයක් නිසා "කැලෑහඳ" නෙගටිව් පටය හා ප්‍රදර්ශන පිටපත් කිහිපයක් මදුරාසියේ පොලීසිය මගින් අත්අඩංගුවට ගත්බව ජයවිලාල් විලේගොඩ ගේ "දිනමිණ" සිනමා පිටුවේ ඔහු ලියා තිබුණි.

රුක්මණී දේවි විසින් 'කැලෑහඳ' ට ගැයූ "මැවිලා පෙනේවි රූපේ හඳේ" ගීතයේ මුල් ගීත රචක හර්බට් එම්. සෙනෙවිරත්න රචනා කර තිබුණේ "මෝරා වැඩේවි ආලේ" නමිනි. ඒ ගීතයේ වචන ගැන නොපැහැදුන (එහි වචන ගණ හොඳ නැති නිසා?) බී.ඒ. ඩබ්ලිව්. විසින් හර්බට් ලවා "මැවිලා පෙනේවි රූපේ" නමින් නැවත ලියා ගීතය වෙනස් කර ඇත. වෙළඳ තැටි නිෂ්පාදනය කළ කාර්ගිල්ස් සාප්පුව මුල් ගීතය අවලංගු කොට cancel නමින් තිබූ ඒ මුල් ගීතය සහිත තැටිය අවලංගු කොට ගබඩාවේ තැන්පත් කර තිබුණි. එය අස්ථානගත වූ අතර මේ සාම්පල් තැටිය ග්‍රැමෆෝන් තැටිය ප්‍රකට රසායන විද්‍යා දේශක ටී.ජී. රන්ජන් ද සිල්වා (ඔහු ග්‍රැමෆෝන් තැටි සංරක්ෂකයෙකි) පානදුරේ පරණ බෝතල් හා පත්තර කඩයකින් මිලදීගෙන ඇත.

'කැලෑහඳ' චිත්‍රපටයේ රුක්මණි එඩී හා මේබල්, බී.ඒ.ඩබ්ලිව් හැරුණු විට ජෝන් ජයපාල ලෙස ස්ටැන්ලි පෙරේරා ද, ඇඩා ජයපාල ලෙස මිලී කහඳවල ද, ඩේසි අත්තනායක ලෙස රීටා රත්නායක ද ජෙරී හැරිස් ලෙස පීටර් පීරිස් ද රඟපෑහ.

'කැලෑහඳ' චිත්‍රපටයේ කතාවම පසුබිම් කොට ඇලජික් ලයනල් ප්‍රනාන්දු විසින් 1993 අධ්‍යක්ෂණය හා නිෂ්පාදනය කළේය. "මැවිලා පෙනේවි රූපේ හඳේ" නම් මේ චිත්‍රපටයේ මාලිනිගේ චරිතය දිල්හානි ඒකනායක ද, ජෝන් ජයපාල ලෙස රන්ජන් රාමනායක ද, ඩේසි ලෙස දමයන්ති ෆොන්සේකා ද, ජයපාල මැතිනිය ලෙස සනෝජා බිබිලේ ද, අන්දා ලෙස ප්‍රෙඩී සිල්වා ද, නන්දරාල ලෙස දයානන්ද ජයවර්ධන ද රඟ පෑ අතර එහි චරිතවල නම් වෙනස් කර තිබුණි.

එකල කැලෑ හඳ නවකතාව අතේ තිබීමත් විලාසිතාවක්ලු

මුල්වරට "කැලෑහඳ" දැන් පුංචි තිරයේ කොටස් වශයෙන් විකාශනය වෙයි. දයාරත්න රටගෙදර අධ්‍යක්ෂණය කළ මේ ටෙලි නාට්‍යයේ නිෂ්පාදනය නිමල් උඳුගොඩ හා සාගරිකා උඳුගොඩ ගෙනි. විධායක නිෂ්පාදකයා ආරියනන්ද දොඹගහවත්තය. මෙහි මාලිනී ලෙස තාරුකා වන්නිආරච්චි ද, ජෝන් ජයපාල ලෙස අරවින්ද දොඹගහවත්ත ද, නන්දරාල ලෙස චන්ද්‍රසෝම බිංදුහේවා ද, ජයපාල මැතිනිය ලෙස වීණා ජයකොඩි ද, ජෙරී හැරිස් ලෙස විජේරත්න වරකාගොඩ ද, ඩේසි අත්තනායක ලෙස උදයංගනී කුලතුංග ද රඟපාති.

'කැලෑහඳ' නවකථාවට මෙන්ම චිත්‍රපටයට ද එදා පැසසුම් මෙන්ම ගල්මුල්, විචාරකයන්ගේ නිර්දය විචාරයට හසු වුවද, තවමත් එම නවකථාව සර්වකාලීනව පාඨක ලෝකයේ උසස් තැනක සිටී.

ඡායාරූප පිටපත් කිරීම - ලාල් සෙනරත්

සුව හමුව

සැකසුම: හර්ෂා සුගතදාස

පිළිතුරු සැපයීම - කායික රෝග විශේෂඥ වෛද්‍ය වරුණ ගුණතිලක

අව්වෙ යන්න බැහැ, හිසේ රුදාව

ප්‍රශ්නය :- මම 33 හැවිරිදි විවාහක කාන්තාවක් වෙමි. කාර්යාලයක රැකියාව කරමි. මට ඇති ගැටලුව වන්නේ කිසිම අවස්ථාවක තද අව්වේ යෑමට නොහැකි වීමයි. තද අව්වේ පොඩි වේලාවක් සිටියදී හිසේ කැක්කුම ඇති වේ. මගේ පුද්ගලික ගමන් බිමන්වලදී තද අව්වේ යෑමෙන් මම වැළකී සිටිමි. එහෙත් විනෝද ගමනකදී, විශේෂ උත්සව අවස්ථාවකදී අව්වේ ගියහොත් මුළු දවසම හිසේ රුදාවෙන් ගත කිරීමට සිදුවේ. මෙය රෝගයක්ද? වෛද්‍ය උපදෙසක් අපේක්ෂා කරමි.

ඉංගිරිය - සඳනි රුවැතිකා වනිගසිංහ

පිළිතුර :- ඔබ සඳහන් කර ඇති විස්තරවලට අනුව ඔබට තිබෙන්නේ ඉරුවාදරය හෙවත් මිග්‍රේන් විය යුතුය. ඔබ පසුවන්නේ එහි ප්‍රාථමික අවස්ථාවේය. දරුණු තත්ත්වයේ නොවේ. එබැවින් වෛද්‍යවරයකු හමු වී නොපමාව ප්‍රතිකාර ලබා ගන්න. එවිට එය 100%කින්ම සුව කර ගැනීමේ හැකියාව ඇත.

පමා වී විවාහ වීමට බියෙන්

ප්‍රශ්නය :- මම 38 හැවිරිදි අවිවාහක කාන්තාවක් වෙමි. වෘත්තියෙන් ගුරුවරියකි. විවිධ හේතූන් නිසා මගේ විවාහය ප්‍රමාද විය. මම විවාහය ගැන අදහස අත් හැරගෙන ඇතත් මගේ මව නොකඩවාම මට විවාහ යෝජනා ගෙනෙයි. සැබැවින්ම මා විවාහ දිවියට ඇතුළත් නොවීමට අදහස් කළේ වයස අවුරුදු 35 ඉක්මවූ කාන්තාවන්ට ගැබ් ගැනීමේදී සංකූලතා සහිත දරුවන් උපදින බව මා අසා තිබෙන බැවිනි. විවාහයක් නිසා සින්ඩ්‍රෝමය සහිත දරුවකු සමඟ මුළු ජීවිත කාලයම වද වේදනා විඳීමට මා කැමති නැත. එහෙත් මගේ මව එය පිළිනොගනියි. ඈ පවසන්නේ 35 ඉක්මවා විවාහ වූ සැමට එසේ නොවන බවයි. සින්ඩ්‍රෝමය සහිත දරුවන් බිහි වීම වළක්වා ගත හැකිද? ඔබගෙන් උපදෙසක් බලාපොරොත්තු වෙමි.

කොළොන්නාව - ගීතිකා ලලන්ති සේනාධීර

පිළිතුර :- වයස අවු: 35 ඉක්මවූ කාන්තාවන්ගේ වර්ණදේහවල විපරිත තත්ත්වයක් ඇති වීමේ සම්භාවිතාවක් තිබේ. එහෙත් එය සියලුම කාන්තාවන්ට සිදු වේ යැයි ඉඳුරා පැවසිය නොහැකිය. ඇතැම් කාන්තාවන්ට වයස අවු: 45 ඉක්මවා ද සිදු විය හැකිය. සමහරවිට වයස අවු: 40 ඉක්මවූ කාන්තාවන්ට නිරෝගි දරුවන් බිහි විය හැකිය. Down Syndrome දරුවන් බිහි වේ යැයි බියෙන් විවාහයකට ඇතුළත් නොවී සිටීමට අවශ්‍ය නැත. අවදානමේ ප්‍රබලතාව අඩු වැඩි වශයෙන් වෙනස් විය හැකිය. එහෙත් අද වෛද්‍ය විද්‍යාවේ දියුණුවත් සමඟ ප්‍රවේණික විද්‍යාව මගින් අවදානම පිළිබඳ තක්සේරුවක් ලබා ගත හැකිය. ප්‍රවේණික විද්‍යාව සම්බන්ධ ඒකක ඇතැම් විශ්වවිද්‍යාලවල ස්ථාපිත කර තිබේ. එමෙන්ම ඊට සම්බන්ධ විශේෂඥ වෛද්‍යවරු ද පුද්ගලික රෝහල්වල සේවය කරති. එබැවින් ඔබේ ප්‍රදේශයේ වෛද්‍යවරයකුගෙන් ප්‍රවේණි වෛද්‍ය විද්‍යාව සම්බන්ධ වෛද්‍යවරුන් ගැන අසා දැනගෙන එකී විශේෂඥ වෛද්‍යවරයකු හමු වන්න. එවිට ඔබේ ගැටලුවට සාධාරණ විසඳුමක් ලැබෙනු ඇත.



බර වැඩියි. අඩු කර ගන්නේ කොහොමද?

ප්‍රශ්නය :- මගේ වයස අවු: 67 කි. බර කිලෝග්‍රෑම් 87 කි. උස සෙන්ටිමීටර් 167 කි. මගේ දණහිසේ වේදනාව තදින් තිබේ. ඇවිදීමට සහ පඩි නැගීමට අපහසුය. ටික දුරක් පයින් ගමන් කරන විට පපුවේ හතිය ඇතිවේ. වෛද්‍යවරයකු මුණගැසුණු විට මට උපදෙස් දුන්නේ සිරුරේ බර අඩු කර ගන්නා ලෙසයි. පිටි කෑම සහ සීනි සහිත ආහාරපාන අඩු කළත් බර අඩු වෙන්නේ නැත. ව්‍යායාම ලෙස ඇවිදීමට උපදෙස් දුන්නත් පපුවේ හතිය නිසා එය අමාරුය. මම අධි රුධිර පීඩනය සහ කොලෙස්ටරෝල් රෝගවලින් පෙළෙමි. ඊට අමතරව පපුවේ හතියට ද ඖෂධ පාවිච්චි කරමි. මා වැනි අයෙක් බර අඩු කර ගන්නේ කෙසේ ද?

ගලේවෙල - ගාමිණී රත්නසිරි බණ්ඩාර

පිළිතුර :- ඔබේ ස්ථූලතාව සමග බැඳුණු රෝග රැසකින් ඔබ පීඩා විඳින බව පෙනේ. සිරුරක බර වැඩි වීමට හේතු කීපයක් බලපානු ලැබේ. ආහාර රටාව, ජීවත් වන පරිසරය, ප්‍රවේණික හේතූන් වැනි සාධක නිසා සිරුරේ බර වැඩි විය හැකිය. මෙම බර අඩු කර ගැනීමේ ක්‍රමවේද කීපයකි. ආහාර පාලනය, ව්‍යායාම, යහපත් ජීවන රටාවක් පවත්වා ගැනීම, ඖෂධීය ප්‍රතිකාර සහ ශල්‍යකර්ම යන ක්‍රමවේද මගින් සිරුරේ බර අඩු කර ගත හැකිය. ඔබේ ස්ථූලතාවට බලපෑ හේතුව ප්‍රථමයෙන් සොයා ගත යුතුය. සමහරවිට ප්‍රවේණි සාධකයක් නිසා ඔබේ සිරුරේ බර වැඩි විය හැකිය. ඉන් අනතුරුව බහුවිධ ක්‍රම ඔස්සේ බර අඩු කළ යුතුය. ආහාර පාලනයෙන් පමණක් ඔබේ බර අඩු නොවන්නේ ඔබේ ජීවන රටාව යහපත් නොවන නිසා වීමට පුළුවන. ව්‍යායාම මගින් ඔබේ බර අඩු කිරීම ද සුදුසු නැත. එබැවින් කායික රෝග විශේෂඥ වෛද්‍යවරයකු හමු වී උපදෙස් ගැනීම සුදුසුය. වෛද්‍යවරයා බහුවිධ ක්‍රමවේද ඔස්සේ ඔබේ බර අඩු කර ගැනීමට උපදෙස් දෙනු ඇත.

ඔබේ වෛද්‍ය ගැටලුව මතු දැක්වෙන ලිපිනයට යොමු කරන්න.

සුව හමුව, සිළුමිණ, ලේක්හවුස් - කොළඹ 10.



සීගිරිය ලෝකයට ගෙන ගිය විශ්වකර්ම මිනිසා

මහාචාර්ය සෙනරත් පරණවිතාන

● **නන්දසේන සූරියආරච්චි**

මහැදුරු සෙනරත් පරණවිතාන මහතා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සිටි කාලයේ පුරාවිද්‍යා ක්ෂේත්‍රයට ඉටු කළේ විශාල සේවයකි. පුරාවිද්‍යා කොමසාරිස්වරයා ලෙස අවුරුදු 16 ම එම ධුරය හෙබවූ පරණවිතාන මහතා 1956 දෙසැම්බර් 26 දින පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙන් විශ්‍රාම ගියේය. වසර 2000 ටත් එපිට කාලයක් තුළ වැසී ගොස් තිබුණු අපේ ජාතික උරුමයන් පාදා මතු කරන්නට එතුමා විසින් කළ මෙහෙවර රටේ තොටේ හැම ගැමියකුගේ පවා මතකයේ රැඳුන නමක් බවට පත්ව තිබිණ.

කිසි දිනක සරසවියකින් මූලික උපාධියක් ලබා නොතිබුණු සෙනරත් පරණවිතානයන් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යා මහාචාර්යවරයා ලෙස 1957 ජනවාරි පළමු වැනි දින වැඩ බාරගත්තේ ය. තම පළමු දේශනය සඳකඩ පහණ ගැන වෙන් කරගෙන තිබූ අතර සිය දේශන පැවැත්වීමේදී වෙනත් දිනවල දේශකයන්ට එල්ලවන කිසිදු බාධාවක් එල්ල නොවීය. දේශන ශාලාව මීයට පිම්බාක් මෙන් විය. දේශනයට සවන් දීගෙන සිටි විද්‍යාර්ථීන් රාශියක් පරණවිතාන සමීපයට පැමිණියහ. පරණවිතානයන් ඔසවාගෙන ගියහ.

පුරාවිද්‍යා විෂයය පිළිබඳ ගෞරව උපාධි, ශාස්ත්‍රපති,(M.A) දර්ශනපති (Phd) උපාධි සඳහා ශිෂ්‍යයන් බඳවා ගැනීම පරණවිතානයන් නිසාම සිදුවූවකි. පුරාවිද්‍යා අධ්‍යයන අංශය ආශ්‍රිතව ඔහු ඇති කළ කෞතුකාගාරය එතුමාට ගරු කිරීමක් ලෙස 'මහාචාර්ය සෙනරත් පරණවිතාන අනුස්මරණ කෞතුකාගාරය' ලෙස නම් කර ඇත.

වයස අවු. 14 දී ගාල්ල බොනවිස්ටා විදුහලේ ඉංග්‍රීසි පාසල් හැරයාමේ විභාගයෙන් උසස් ලෙස සමත්වූවත් ඉන් එහාට පාඨශාලාවකට ගොස් ඉගෙනුමට තරම් ආර්ථික ශක්තියක් පරණවිතාන මහතාගේ දෙමාපියන්ට නොවීය. ඒ රන්වල විද්‍යාහිවර්ධන පිරිවෙනයි. ඔහුගේ ජන්ම පත්‍රය බැලූ කලහේ ගුණරතන නාහිමියෝ තුන්කල් බලා මාපියන්ට කීවේ මේ දරුවා අප රට පමණක් නොව මුළු ලොවම හෙල්ලුම් කවන අති දැවැන්තයකු වන බවයි.

ඒබ්‍රහම් පරණවිතාන පියාණන් ද තම පුත් සෙනරත්ගේ පිරිවෙන් යන ගමනට වැඩි කැමැත්තක් දැක්වූයේ අතමිට හිඟකම නිසා කොළිජිවලට යැවීමට වඩා මොනවා හරි ඉගෙන ගනිවි යන අදහසිනි. විද්‍යාහිවර්ධන පිරිවෙනේ වැලිවිටියේ සෝරත සාමණේරයන් වහන්සේට ඉංග්‍රීසි භාෂා සාහිත්‍යය ඉගැන්වීය. සෝරත හාමුදුරුවෝ පරණවිතානයන්ට සිංහල, පාලි, සංස්කෘත ඉගැන්වූහ.

වයස අවු: 14 දී තමන් උගත් දේ පිරිවෙනේ හාමුදුරුවන්ට උගැන්වීම කොයිතරම් ලොකු පින්කමක් ද යයි සිතා පරණවිතාන පිරිවෙනේ උගැන්වීමට ගියේ එඩිතර කමකිනි. වැඩිහිටි ගුරු හාමුදුරුවෝ එදෙස බලා සිටියහ. එකිනෙකා ඔවුන්ගේ මුහුණු බැලූහ. තමන්ට කිසිදිනක පාඩම් නැති සංස්කෘත ශ්ලෝක, පාලි ගාථා, මේ කොලු ගැටයා එක හුස්මට කියන අයුරු ඔවුහු මවිතයට පත්ව ඇස් අදහා ගත නොහැකිව බලා සිටියහ. අවුරුදු පහක් නොමිලයේ ගුරු සේවයේ යෙදෙමින් ඒ අතරතුර ප්‍රාචීන ප්‍රාරම්භය ඉහළින්ම සමත්වීම නිසා එවකට පරම විඥාණාර්ථ සමාගමට අයත්ව තිබූ මිහිරිපැන්නේ සිංහල පාසලේ මොනිටර් ගුරුවරයකු ලෙස 1916 දී, සිලිං 5 ක පඩියකට රැකියාවකට ගියේය. සිලිං 5 යනු රු. 2.50 කි.

සුදු රෙද්දකින් සහ ඇඟට ගැළපෙන පුංචි පහේ කෝට් එකකින් සැරසී ඔහු උගන්වන්ට ගියේ ය. තනිවම ඉගෙන ඉංග්‍රීසි ගුරු සහතික පත්‍ර පරීක්ෂණයෙන් ද සමත්වීමෙන් මාගාල්ලේ සුධර්මා පාසලට ද, ඉන් පසු උඩුගම්පල රජයේ විදුහලටද ගුරුවරයකු ලෙස ගිය ඔහුට, ඒ වනවිට රුපියල් පහළොවක වැටුපක් ලැබෙමින් තිබිණ.

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙන් පුවත්පතක පළවූ දැන්වීමක් පරණවිතානයන් දැක ගත්තේ මේ අවධියේය. එහෙත් රැකියාව සඳහා කොන්දේසියක් ලෙස, උපාධිධරයකු වීම, ශිලා ලිපි කියවීමේ තනතුරට බඳවා ගැනීමට තිබූ සුදුසුකම් අතර විය. ප්‍රාචීන ප්‍රාරම්භයෙන් ලද ජයග්‍රහණයේ තිළිණයක් ලෙස ලැබුණු පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙන් පළ කළ 'එපික් ග්‍රැපියා සෙයිලනිකා' ග්‍රන්ථය මුල සිට කියවා පුරාවිද්‍යාව කෙරේ නැඹුරුව සිටි පරණවිතානයන් ප්‍රාචීන මාධ්‍ය විභාගයෙන් ද ඉහළින් ම සමත්ව පාළි - සංස්කෘත භාෂා දැනුම තිබූ නිසා එම තනතුර සඳහා ඉල්ලීමට අවශ්‍ය උපාධියක් නොවූව ද ඔහු ඉන්පසුබට නොවීය.

එවකට විභාග දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ඊ.බී. ඩෙන්හැම් වෙත ඔහු ලිපියක් ලියමින් කියා සිටියේ, ලංකාවේ ශිලා ලිපි කියවීමට අවශ්‍යවන්නේ ඉංග්‍රීසි භාෂාව දත් උපාධිධාරීන් නොව පාලි, සංස්කෘත, සිංහල භාෂා ඉගෙන ප්‍රාචීන මධ්‍ය විභාග සමත් වූවන් වන හෙයින් තමාට ද මේ තනතුර සඳහා ඉදිරිපත්වීමට අවසර ලබාදෙන ලෙසය.

පරණවිතාන මහතාට එම අවසරය ලැබිණ. සම්මුඛ පරීක්ෂණය අදියර දෙකකින් පැවැත්විණ. ලිඛිත පරීක්ෂණය සමත්වූ පසු වාචික පරීක්ෂණය එවකට පුරාවිද්‍යා කොමසාරිස් තනතුර දැරූ ඒ.එම්. හෝර්කාට් විසින් පවත්වන ලදී. ඔහු මවිතයට පත් වූයේ විසිතුන් වැනි වියේ පසුවන තරුණයකු සතුව පැවැති පුරාවිද්‍යා අංශයේ වූ විස්මිත දැනුම් සම්භාරය ඇදහීමටත් අපහසු තරම් ඉහළ මට්ටමක වූ හෙයිනි.

රාජකාරිය දේවකාරියක් ලෙස මුල සිටම ඇදහූ පරණවිතාන මහතා තමා වෙත පැවරී ඇත්තේ වසර දෙදහස් පන්සියයකට පෙර සිට පැවැත එන ජන ජීවිතයක් ගැන අපූර්වත්වය හා නිවැරදිභාවය මතු මත්තේ පහළ වන ජනතාවට නිරවුල් කොට දැක්වීමේ වගකීම බව සිතාගත්තේ ය.

කාශ්‍යප රජු සීගිරිය නිර්මාණ කළ ද අද අපට දක්නට ඇති සීගිරි නිර්මාණය හෙළි පෙහෙළි කළේ පරණවිතාන මහතා විසිනි. සීගිරිය අසල ඇති පොල්අතු බංගලාවේ වෙසෙමින් සීගිරි පැරණි දිය අගල, පවුර තුළ ඇති මඟුල් උයන කැණ සාදාගත් පරණවිතානයන් කැටපත් පවුරු ගී හෙළිකොට පෞරාණික ඉතිහාසයේ නොදුටු පැතිකඩක් ලොව හමුවේ තැබීය. සීගිරිය අවට අඹ ගස් සිටු වූ පරණවිතාන මහතා මිහින්තලයේද අඹගස් වගා කළේය.

සීගිරි කැටපත් පුවරු ගී පිටපත්කොට සකස් කිරීමේදී ඔහු ලැබූයේ අසීමිත වින්දනයකි. මෙතෙක් නොදුටු පැරණි අයගේ සිතුවිලි, සමාජ පරිසරය දැක විස්මයට පත්වෙමින් සීගිරියේ පොල්අතු බංගලාව නිවෙස කොටගෙන සිටි පරණවිතානයන්ට නුගේගොඩ තිබූ තම නිවස ද අමතකව තිබිණ

සීගිරි කැටපත් පුවරු ගී පිටපත්කොට සකස් කිරීමේදී ඔහු ලැබූයේ අසීමිත වින්දනයකි. මෙතෙක් නොදුටු පැරණි අයගේ සිතුවිලි, සමාජ පරිසරය දැක විස්මයට පත්වෙමින් සීගිරියේ පොල්අතු බංගලාව නිවස කොටගෙන සිටි පරණවිතානයන්ට නුගේගොඩ තිබූ තම නිවස ද අමතකව තිබිණ. බිරිය රොස්ලින් පරණවිතාන මහත්මිය සීගිරියේ පොල්අතු බංගලාවට පැමිණ පරණවිතානයන්ගේ දුක සැප බලන්නට ටික දිනක් එහි ගත කළාය. දිනක් ඇය "අපි කොළඹ ගිහින් එමුදැ"යි පරණවිතාන මහතාගෙන් ඇසීය. පිටපත් කළ කුරුටු ගී කියවීම මදකට නතර කළ ඔහු රියදුරු කැඳවීය.

"මේ නෝන මහත්තයට කොළඹ යන්න ඕන කියනව. මෙයා ගිහින් ඇරලවන්න" යයි කීය.පරණවිතානයන්ට මහ පුරා වස්තු ගවේෂණය ඔහුගේ රාජකාරිය මෙන් ම, විනෝද කාරිය ද විය.

පුරාවිද්‍යා කොමසාරිස්ට පැවරුණු බලතල අධික විය. එහෙත් පරණවිතාන මහතා තම බලතල පාවිච්චි කළේ රාජකාරිමය කටයුතු සඳහා පමණකි. අඩුම වශයෙන් දෙපාර්තමේන්තුව රාජ්‍ය ආයතනයක් නිසා එමගින් තමන්ට වැටුපක් ලැබෙන හෙයින් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට අයත් කිසිම දේපොළක් තමාගේ පැවැත්ම වෙනුවෙන් ප්‍රයෝජනයට නොගත්තේය.

අනුරාධපුර පුරාවිද්‍යා කොමසාරිස්ට තිබූ නිල නිවාසයක් විය. දිනක් දුර බැහැර ගෙවාගෙන විඩාපත්ව පැමිණි පරණවිතාන මහතාට තරමක් උස වීදුරුවකට තම බිරිය පැණි දොඩම් හදාගෙන පැමිණියාය.

"ඇගේ පතේ මහන්සිය ගියා, කොහෙන්ද මේ පැණි දොඩම් හොයා ගත්තෙ?"

"මේ වත්තෙ පිටියෙන්, ඇයි එහෙම අහන්නෙ?

"ගෙඩි කීයක් විතර කැඩුවද?"

"හයයි. අපි දෙන්නට ඒ ඇති හින්දයි."

අද කඩ පොළේ පැණි දොඩම් ගෙඩියක් සත 5 යි. මෙන්න සත 30 ක් තියනව. ඒක නොවැරදීම කාර්යාලයට යවන්න. රාජ්‍ය දේපොළ පෞද්ගලික මනාපයට පාවිච්චි කිරීම තහනම් කියල සෙල්ලිපියක තියෙනව."

අද මෙන් ජනාකීර්ණ නොවූ එකල සීගිරි පව්ව අද්දර පිහිටි පොල් අතු බංගලාවේ නතරව සිටිමින් රයත්, දවාලත් නොමැතිව එතුමා එහි පර්යේෂණවල නිරතවීය. හරියකට බඩ කට පුරා කන්න ආහාරයක් නැති විය. තැම්බූ වට්ටක්කා කැබලි කීපයක් කා, පැසුණු බඩඉරිඟු කරලට මුසුවූ ලුනු දියරය ඔහු තළු මරමින් අනුභව කළේ, ආහාරය වෙනුවෙන් ආහාරය ජීවත්වීම නොව, ජීවත් වීම සඳහා ආහාරය ලබාගනු පිණිසය යන්න සිහිපත් කරවමිනි. මේ ප්‍රාඥයා එවක ඒ පෙදෙසේ විසූවන් සැලකුයේ ඔහු අසිරිමත් බලවේගයක පෙර නිමිත්තක් ලෙසිනි. වෙනත් රාජකාරි කටයුතු සඳහා සීගිරියෙන් බැහැරව ගොස් මාසයක් දෙකක් ගත වෙද්දී ගම්මුන් තුළ කුතුසක් ඇතිවන්නේ කවදා මේ විස්මිත මිනිසා යළි පැමිණේ ද යන්න ගැනය. ගුවන් ගැබ අඳුරු කළු වලාවකින් වැසී සීගිරිය අවට වැසි වැටෙන විට

"අද නම් අපේ ලොකු මහත්තය එනවා. වැහිපොදක් නැතිව සිටි අපට ඒක ලොකු සහනයක්" ගම්මු කීහ. ගම්මු මග බලාගෙන සිටිද්දී පරණවිතානයන් සුපුරුදු පරණ රථයක නැගී සීගිරියේ පොල්අතු බංගලාවට පිවිසේ. ගම්වැසියෝ පරණවිතානට සැලකුයේ එදා මහරජ කෙනකුට මෙනි. ගෞරව පූර්වක භක්තියකිනි. සීගිරිය අවට ප්‍රදේශවලට වැසි ලැබෙන්නේත් "පරණවිතාන ඒ පෙදෙසට පැමිණෙන වතාවන්වලය" යන්න ඔවුන්ගේ සිත් තුළ රැඳී පැවතිණ.

දෙවයට එරෙහිව සටන් වදිනා කීර්ති දරුවා

● **ඉන්දික ප්‍රියදර්ශන විතාන**

ගිනිගත්හේනේ, පිටවල, පල්ලෙවත්තෙ, ලීලවත්තෙ පදිංචි 16 හැවිරිදි කීර්ති චන්ද්‍රසේන මවු කුසින් බිහි වූයේ නීරෝගී දරුවකු ලෙසිනි. දාගම්පිටිය කැලණිගම විදුහලේ 11 වසරෙහි ඉගෙනුම ලබන කීර්ති මේ වසරෙහි අපොස සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටීමට අපේක්ෂාවෙන් සිටී. පුරා වසර අටක පමණ කාලයක් ඉතා නිරෝගී තත්ත්වයෙන් සිටි දරුවා කල් යත්ම පාදයක හටගත් වේදනාවත් සමගම ඇවිදීමට අපහසු තත්ත්වයකට පත්විය. ඇවිදින විට දරුවාගේ වෙනසක් වූවු දෙමාපියන් ඔහු නාවලපිටිය රෝහලට රැගෙන ගියහ. එතැනින් පේරාදෙණිය රෝහලට යොමුකළ දරුවාගේ එක් පාදයක් අනෙක් පාදයට වඩා කෙටි බව හඳුනාගත්හ. වෛද්‍යවරු ඒ සඳහා කීර්තිගේ පාවහන් වල අඩියට උස් අඩියක් එකතු කළ අතර කාලයත් සමග එම රෝගී තත්ත්වය දුරුවේයැයි පැවැසූහ.

පේරාදෙණිය සිරිමාවෝ බණ්ඩාරනායක ළමා රෝහලේ සායනය සඳහා දරුවා යොමු කරන ලද අතර එහිදී හඳුනාගෙන ඇත්තේ ඔහුට 'මයෝපති' (Myopathy) රෝගය වැලඳී ඇති බව ය. දරුවාගේ පපු ප්‍රදේශය අසාමාන්‍ය ලෙස ඉදිරියට නෙරා ඒමත් සමග ඔහුට එදිනෙදා කටයුතු කරගැනීමට මෙම රෝගී තත්ත්වය මහත් බාධාවක් වී ඇත. වෛද්‍යවරුන් විසින් ඔහුට පැලඳීමට විශේෂ පලඳනාවක් නියමකර තිබුණ ද එයද දරුවාට බාධාවක් වී ඇත. වෛද්‍යවරුන් පවසා ඇත්තෙ කල් යත්ම රෝගී තත්ත්වය සුව වන බවයි. නමුදු එය එසෙ සිදු වී නැත. කීර්තිගේ මව ද මෙම රෝගයෙන් පීඩා විඳින්නීය.

දිනෙක කීර්තිගේ පියාට ගුවන්විදුලියේ වැඩසටහනකින් මෙම රෝග පිළිබඳ තොරතුරු අසන්නට ලැබිණි. ඔහු ඒ පිළිබඳ තොරතුරු සොයන්නට විය. ගුවන් විදුලියෙන් ඇසූ තොරතුරු හා අදාල ලිපිනය ලියාගත් ඔහු තම දරුවා ගැන නව බලාපොරොත්තුවක් ඇති කර ගත්තේය.

ඉවත දැමූ පුවත්පත්පත් පිටුවක තිබී ඔහුට මේ තෙරතුරුම ලැබිණි. මාලබේ, අතුරුගිරිය පාරේ පිහිටි ඔස්ටියෝ ක්ලිනික් වෛද්‍ය මධ්‍යස්ථානයයි.

කොඳු ඇටපෙළ ආශ්‍රිත සියලුම රෝග සහ ස්නායු රෝග, බටහිර ලෝකයේ ප්‍රචලිත ඔස්ටියෝපති වෛද්‍ය ක්‍රම මගින් සුව කරන ලංකාවේ ඇති එකම වෛද්‍ය මධ්‍යස්ථානය එය වූ අතර කීර්තිගේ පියා කීර්තිව එහි රැගෙන ගියේය.

"මම මගේ දරුවා රැගෙන එහි ගියා. එහිදි මට මේ රෝගයට ප්‍රතිකාර කරනු ලබන මහාචාර්ය වෛද්‍යවරයා හමු වීමට ලැබුණා. එතුමා කීවේ මගේ දරුවාට මාංශපේෂි දියවන රෝගයක් සහ පැති කුදය යන රෝගයට ලක්වී ඇති බවයි. මාස හතක් තිස්සේ මගේ දරුවාට ප්‍රතිකාර කරනවා. දැන් දරුවා යම් පමණකින් සුවය ලබමින් සිටින බව අපට දැනෙනවා. අපි බොහෝම දුෂ්කර ජීවිතයක් ගත කරන්නේ. මේ ආයතනයේ වෛද්‍යවරු අපේ ආර්ථික දුෂ්කරතා ගැන දන්නවා. ඒ නිසා ඒ මධ්‍යස්ථානයෙන් මගෙ පුතාට නොමිලේ ප්‍රතිකාර කරන්නේ . එය අපට කියා නිමකරන්න බැරි උදව්වක්." කීර්තිරත්නගේ පියා පවසන්නේ කෘතඥපූර්වකය.

මිතුරු පවුර

● කමල් පෙරේරා

සිංහලට ඊ පාස් ගත් යුවරාජන්

උඩරට වතුකරයේ තරුණ-තරුණියන් කණ්ඩායමකගේ "තේ කහට" නම් ඡායාරූප ප්‍රදර්ශනය සැප්තැම්බර් 26 - 27 දෙදින තුළ කොළඹ ලයනල් වෙන්ඩ් කලාගාරයෙදී පැවැත්විණ. මේ ප්‍රදර්ශනය ආරම්භ කළේ වතු ආශ්‍රිත නගර වන බදුල්ල හා නුවරඑළියෙනි. එතෙර - මෙතෙර සංවිධාන ගණනාවක සහයෝගිතාවෙන් පැවැත්වුණු "තේ කහට" ප්‍රදර්ශනය නරඹා මිතුරු පවුරට යමක් ලියන ලෙස මට ඇරියුම් කළේ සංවිධායක මණ්ඩලයේ සාමාජිකයකු වන විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ අප මිත්‍ර සම්මානනීය කිවියර ළිහිරු කිතලගමය.

වෙනදාට ලයනල් වෙන්ඩ් ශාලාවේ බිත්ති වසා සිටින නානා මාදිලියේ ඡායාරූප හා සිතුවම් වෙනුවට මෙදා දක්නට ලැබුණේ දහදියෙන් හා කඳුළෙන් උඩරට වතුකරය සාරවත් කරන මිනිස් කැලකගේ දුක් සුසුම් හා කම්කටොලු කැටි කරගත් ඡායාරූප සමූහයකි. ප්‍රදර්ශනය නැරඹීමට පැමිණ සිටියේද වෙන්ඩ් රඟහලට නිතිපතා පැමිණෙන රසික ප්‍රජාවට වඩා වෙනස් සමාජ කණ්ඩායමකි.

දුම් බටයකින් පිඹ ලිපක් දල්වන වියපත් කාන්තාවකගේ ඡායාරූපයක් මගේ සිත සසල කළේය. එහි කැමරා ශිල්පියාද ඒ අසලම රැඳී සිටිනු පෙනිණ. ඔහුගේ මවු බසින් කතා කිරීමට නොහැකි වීම ගැන කනගාටුව පළ කළ මම සිංහල කතා කළ හැකිදැයි විමසිමි

"පුළුවන් සර්...මං 2017දි ඕ ලෙවල් ප්‍රයිවේට් කරල සිංහල වලට බී එකකුත් ගත්තා. ". සංග්‍රහශීලි සිනහවකින්ද යුතුව ඔහු දුන් පිළිතුරෙන් දිරිමත් වූ මම තරුණයාගේ වතුකර දිවිය ගැන තතු විමසුවෙමි.

ටී යුවරාජන්

"සර් මගෙ නම ටී යුවරාජන්. යුවාන් කියල තමා යාළුවො කතා කරන්නෙ. ඉපදුණෙ 1996දි තලවකැලේ ලොජ් වත්තෙ. මුලින්ම වත්තෙ ඉස්කෝලෙට ගියා. පහෙන් පස්සෙ ගියේ සරසවි දෙමළ මහා විද්‍යාලෙට. ඒ ලෙවල් පාස් වුණේ 2015දි. ඊට පස්සෙ එක එක කෝස් කළා. එකක්වත් මට ඇල්ලුවෙ නැහැ. මගෙ හිත දිව්වෙ කලාව පැත්තටමයි. ඒ පාර තමා මම සදායි හා විමෙම් කියල ෂෝට් ෆිල්ම්ස් දෙකක් යූ ටියුබ් එකට කළේ. 2019දි විමෙම් ෆිල්ම් එකට ලංකා ෂෝට් ෆිල්ම් කන්ටස්ට් එකෙන් සම්මානයකුත් ලැබුණා."

යුවාන්ගේ ව්‍යක්ත සිංහල කථනය මා ලජ්ජාවට පත් කළේය. හරිහැටි දෙමළ වැකියක් ගළපා ගන්න බැරි අපි සහජීවනය ගැන කරන කතාවල අරුත කුමක්දැයි මම මගෙන්ම ප්‍රශ්න කළෙමි. මේ ඡායාරූප ප්‍රදර්ශනයට ඉදිරිපත් වීමෙන් ලද අත්දැකීම කෙබඳු දැයි යුවාන්ගෙන් විමසිමි.

"අපි කලින් කැමරා පාවිච්චි කළාට හොඳ පින්තූරයක් ගන්නෙ කොහොමද කියල ඉගෙනගත්තෙ අපිට දීපු අවුරුද්දක විතර ටේරනින් එකේදි තමා සර්. ඒ වගේම සර් වතුවල ඉන්න අපේම අයට මොන තරං ප්‍රශ්න තියෙනවද කියල තේරුම් ගත්තෙත් මේ එක්ස්පිබිෂන් එකට ලෑස්ති වෙද්දි තමා. උඩරට පළාතට ටීරජ්ස් එන හුඟ දෙනෙක් දකින්නෙ ටවුන් ළඟ තේ වතුවල තියෙන ලස්සන විතරයි. ටවුම් වලින් ඇතුළෙ තියෙන වතුවල මිනිස්සු ජීවත් වෙන්නෙ කිසිම පහසුකමක් නැතුව. මගේ මේ පින්තූරෙ ඉන්නෙත් එහෙම දුන් විඳින ආච්චි අම්මා කෙනෙක්" ලිපට පිඹින වයස්ගත කාන්තාව සහිත සිය ඡායාරූපය පිළිබඳව යුවාන් පවසන දේ ඉතා නිවරැදි යයි මට සිතිණි.

කලක් නුවරඑළිය රතුකුරුස සංගමයේ සභාපතිවරයාව සිටි යුවාන් සමාජ සේවයට මහත් ලැදියාවක් දක්වන තරුණයෙකි. වතුකරයේ දරුවන්ගේ කියවීමේ රුචිය නංවනු පිණිස පුස්තකාල පෙළක් ආරම්භ කිරීමට ඔහු අපේක්ෂා කරයි. එසේම වතුකරයේ ජනතාවගේ සැබෑ දිවි පවත් නිරූපණය කරන චිත්‍රපටියක් නිෂ්පාදනය කිරීමද ඔහුගේ සිහිනයකි. ලංකා ටැමිල් නම් යූ ටියුබ් වෙබ් නාළිකාවේ හා මිත්‍රන් පුවත් පතේ වාර්තාකරුවකුද වන යුවාන් මේ දිනවල යාපනයේ ඊළාම් ටැමිල් සිනමා කවය මෙහෙයවන අන්තර්ජාල සිනමා පාඨමාලාවක් හදාරයි.

"ඇයි දෙමවුපියෝ වගේ යුවානුත් තේ වත්තෙ රස්සාවකට නොගියෙ.?" සමුගැනීමට පෙර මම ඔහුගෙන් විමසිමි.

"දැන් වතුවල ඉන්න හුඟක් තරුණයො ඉගෙන ගත්ත අය. ඒගොල්ලො වතු රස්සාවට කැමති නැහැ. හැබැයි වතු වලට අලුත් ටෙක්නොලොජි එක ආවොත් උගත් තරුණයොත් ඒවෙය වැඩට එයි." යුවාන් ඒ වචන ටික පෙළ ගැස්සුවේ තරමක ගැඹුරු හඬිනි.

සැමරුම් කිත් රැස

මහාචාර්ය **ජයන්ත අමරසිංහ**

පුරාවිද්‍යාවේ ජීවමාන පුරාවෘත්තය

ජාතියකට ජීවමාන පුරාවෘත්ත උරුම වන්නේ කලාතුරකිනි. මහාචාර්ය සෙනරත් පරණවිතාන ශ්‍රී ලංකාවට හිමි වුණු දුර්ලභ ජීවමාන පුරාවෘත්තයකි. එතුමන්ගේ නාමය මෙසිරිලක ඈත ගම් දනව්වක අකුරු නූගත් ගැමියකුගේ පවා මුවෙන් නික්මෙන තරමට ඒ පුරාවෘත්තය ජීවමානය. දහඅට වන සියවසේ මෙරට දැල්වුණු ප්‍රාචීන ශාස්ත්‍රප්‍රදීපයේ ප්‍රභාව ලොවට නොමඳව විහිදා ලූ සුවිශේෂ චරිතයකි සෙනරත් පරණවිතාන. දක්ෂිණ ලංකාවේ ශාස්ත්‍රඥානයේ වර්ධනය සුවිශේෂ වන්නේ ප්‍රාචීන ප්‍රතීචීන ධාරා එකම කාලයක එකම භූමියක අභිමුඛ වීමෙන් සිදු වූ ආශ්චර්යජනක සම්මිශ්‍රණය නිසාය. ලොව එතෙක් දක්නට ලැබුණේ ප්‍රාචීන භාෂා තම වපසරියෙහිත් ප්‍රතීචීන භාෂා වෙනත් වපසරියකත් අභිමුඛ වීමකි. ඉංග්‍රීසි භාෂාව ඉන්දු උපමහාද්වීපයට ව්‍යාප්ත වූ පසු සිදු වූ ප්‍රාචීන-ප්‍රතීචීන භාෂා සම්පර්කය ශ්‍රානගවේෂණයේ නව කඩඉමක් සලකුණු කළ සන්ධිස්ථානයක් ලෙස සැලකිය හැකිය. ජේම්ස් ප්‍රින්සෙප් බ්‍රාහ්මී අක්ෂර කියවා අර්ථ දැක්වීම මේ සම්පර්කයේ වැදගත් කඩඉමකි.

සෙනරත් පරණවිතාන උපත සිදු වූයේ 1896 දෙසැම්බර් 26 වැනි දින ගාල්ල දිස්ත්‍රික්කයේ මැටරඹ නමැති ග්‍රාමයේදීය. පියා අබරන් පරණවිතානය; මව කෝදාගොඩ හින්නිහාමිය. සෙනරත් පවුලේ බාලයා විය. සෙනරත් කුඩා අවධියේදී අකුරු කියවීමට ගියේ නිවස ආසන්නයේ පිහිටි යටගල පන්සලටය. අන්නාසිහෙට්ටිගොඩ රජයේ සිංහල පාඨශාලාවට මුලින් ඇතුළත් කෙරුණු සෙනරත් පසුව උනවටුණේ බොනවිස්ටා ඉංග්‍රීසි පාඨශාලාවට ඇතුළත් කෙරිණ. බොනවිස්ටාවේ අධ්‍යාපනය ලබන අවධියේම රන්වලගොඩ විද්‍යාභිවර්ධන පිරිවෙනෙන් පාලි හා සංස්කෘත භාෂා ඉගෙන ගැනීමට යොමු කෙරිණ. පසු කලෙක මෙරට පහළ වූ කිර්තිමත් පඬිරුවනක් වූ වැලිවිටියේ සෝරත හිමියන්ද ගිහි ශිෂ්‍යයකු ලෙස සෙනරත් පරණවිතාන සමග ඒ පිරිවෙනේ ශාස්ත්‍ර හදාළ බව පැවසේ. 1915 වර්ෂයේ ප්‍රාචීන භාෂෝපකාර සමිතිය මගින් පවත්වන ලද ප්‍රාරම්භ විභාගයේදී ඉතිහාස විෂයයෙන් ලංකාවේ ප්‍රථමයා ලෙස සෙනරත් පරණවිතාන නමැති එකුන් විසි වියැති තරුණ විද්‍යාර්ථියා සමත් වීම පිරිවෙනෙන් ලද ප්‍රාචීන අධ්‍යාපනයේ මහිමය විදහා පෙන්වන මාපකයක් වැන්න. විභාගය උත්තීරණය වීම වෙනුවෙන් ඔහුට ලැබුණු ත්‍යාගය වූයේ ආචාර්ය ඩී. එම්. ද ඉසෙඩ්. වික්‍රමසිංහ විසින් සංස්කරණය කරන ලදුව 1912දී ප්‍රකාශයට පත් කෙරුණු එපිග්රෆියා සෙලනිකා නම් වූ ලංකාවේ ශිලාලිපි සංග්‍රහයේ පළමු වෙළුමේ පළමු කාණ්ඩයේ පිටපතකි.

බොනවිස්ටාවේ අධ්‍යාපනය නිම කළ සෙනරත් තරුණයා මුලින්ම ප්‍රවිෂ්ට වූයේ ගුරු වෘත්තියටය. 1916 වර්ෂයේ මිහිරිපැන්න සිංහල පාඨශාලාවෙහි ශිෂ්‍ය ගුරු තනතුරකට පත් වූ ඔහු ඉංග්‍රීසි ගුරු විභාගයෙන් සමත්ව 1920 වර්ෂයේ උඩුගම්පොළ රජයේ ද්විභාෂා පාඨශාලාවෙහි ඉංග්‍රීසි ගුරු තනතුරකට පත්ව තෙවසරක් එහි සේවය කළේය. 1923දී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ශිලා ලේඛන සහකාර තනතුර සඳහා වූ තරග විභාගයකට පෙනී සිටි සෙනරත් පරණවිතාන ලිඛිත හා වාචික පරීක්ෂණයෙන් සමත්ව එවක සිටි පුරාවිද්‍යා කොමසාරිස් වූ ඒ. ඇම්. හොකාර්ට් යටතේ ශිලා ලේඛන සහායක තනතුරට පත් විය. පත්වීම ලැබ ඉතා කෙටි කලකින් එනම් 1923 වර්ෂයේදී ඉන්දියානු රජයේ ශිෂ්‍යත්වයක් ලැබ ඉන්දියාවට ගොස් විශිෂ්ට අභිලේඛනඥයකු වූ ශ්‍රී කෘෂ්ණ ශාස්ත්‍රී සහ කීර්තිමත් පුරාවිද්‍යාඥයකු වූ ශ්‍රීමත් ජෝන් මාර්ෂල් යටතේ තෙවසරක පුහුණුවක් ලැබීමට පරණවිතාන තරුණයාට අවස්ථාව උදා විය. වෘත්තීය ජීවිතය ආරම්භයේදීම එවන් පුහුණුවක් ලැබීම ඔහුගේ අනාගත ශාස්ත්‍රීය ජීවිතයට මනා ප්‍රතිෂ්ඨාවක් විය. 1926 වර්ෂයේදී පුහුණුව සාර්ථකව නිම කොට ලංකාවට පැමිණි සෙනරත් පරණවිතාන හට 1929දී වැදගත් ශාස්ත්‍රීය වගකීමක් පැවරිණ. ආචාර්ය ඩී. එම්. ද ඉසෙඩ්. වික්‍රමසිංහ විසින් එතෙක් සංස්කරණය කෙරුණු එපිග්රෆියා සෙලනිකා නමැති ලංකා ශිලාලේඛන සංග්‍රහයේ සංස්කාරක පදවියට පත් කිරීම ඒ වගකීමය. දශක හතරකට ආසන්න කාලයක් සෙනරත් පරණවිතාන ලංකා ශිලා ලිපි සංග්‍රහ විශිෂ්ට අන්දමින් සංස්කරණය කොට පළ කෙළේය. මේ කර්තව්‍යයෙහි ලා පරණවිතාන සතු සිංහල, පාලි, සංස්කෘත සහ දෙමළ භාෂා ඥානය මෙන්ම ඉතිහාසය විෂය සම්බන්ධ අවබෝධයද මහත් ප්‍රතිෂ්ඨාවක් විය.

සෙනරත් පරණවිතානගේ ශාස්ත්‍රීය ඥානය දෙස් විදෙස්හි පතළ වීමට ගත වූයේ කෙටි කාලයකි. 1924 දී සිලෝන් ඇන්ක්වරි ඇන්ඩ් ලිටරරි රෙජිස්ටර් නමැති ශාස්ත්‍රීය සංග්‍රහයට සැපයූ 'චෝළයන් හා ලංකාව' මැයෙන් යුතු ලිපිය ලංකා ඉතිහාස අධ්‍යයනයට කෙරුණු මාහැඟි සම්ප්‍රදානයක් ලෙස පිළිගැනේ. 1940 වර්ෂයේ සෙනරත් පරණවිතාන ප්‍රථම ලාංකික පුරාවිද්‍යා කොමසාරිස් තනතුරට පත් වන විට ඔහු විසින් රචිත ශාස්ත්‍රීය ලිපි සංඛ්‍යාව සියය ඉක්මවා තිබිණ. මේ ලිපි සියල්ල ඉංග්‍රීසි භාෂාවෙන් රචනා වීම නිසා ජගත් ශාස්ත්‍ර පරිමණ්ඩලවල අවධානයට ඒවා බඳුන් විය. ඉංග්‍රීසි භාෂාවෙන් ශාස්ත්‍රීය ලිපි තුන් සියයකට ආසන්න ප්‍රමාණයක් රචනා කළ පරණවිතාන සූරීන්ගේ විශේෂත්වය වන්නේ 1929 වර්ෂයේ සිට සිංහල භාෂක සමාජයටද සිය ඥානය පතුරුවා හැරීම සඳහා සියයකට ආසන්න පර්යේෂණ ලිපි සහ කෘති කිහිපයක්ම සිංහල භාෂාවෙන්ද රචනා කිරීමය. 1946 වර්ෂයේදී ඔහු විසින් ලංකාවේ ස්තූප නමැති ග්‍රන්ථයට ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලයෙන් ආචාර්ය උපාධියක් සමර්පණය කෙරිණ.

පරණවිතාන සූරීන්ගෙන් ඉතිහාසය, පුරාවිද්‍යාව සහ අභිලේඛන විෂයයෙහි ලා කෙරුණු සම්ප්‍රදානය ඇගයුමට ලක් වුවද භාෂා සාහිත්‍යය සහ විශේෂයෙන්ම කාව්‍ය විචාරය විෂයයෙහි ලා සිදුවුණු සම්ප්‍රදානය නිසි ඇගයුමට ලක් වූයේද යන්න නැවතී සිතා බැලීමට සිදු වෙයි. සීගිරියෙහි ඓතිහාසික සහ පුරාවිද්‍යාත්මක වටිනාකම පිළිබඳ විශිෂ්ට මෙහෙයක් පරණවිතාන සූරීන්ගෙන් ඉටු වූ බව අවිවාදිතය. එහෙත් සීගිරි කැටපත් පවුරෙහි සටහන් වී තිබුණු කුරුටු ගී සමුදායයෙන් සත් සියයක් පමණ වන කුරුටු ගී ප්‍රමාණයක් කියවා අර්ථ විවරණ සැපයීමෙන් එතුමන් අතින් සිංහල සාහිත්‍ය ක්ෂේත්‍රයට ඉටු වූ මෙහෙය ලාංකේය සියලු සාහිත්‍ය විමර්ශකයන්ගේ සම්ප්‍රදාන ඉක්මවන්නක් බව අවිවාදයෙන් පිළිගැනීමට සිදු වෙයි. ඒ කර්තව්‍යයෙහි ලා පරණවිතාන ප්‍රාචීන භාෂා සම්බන්ධයෙන් ලද ප්‍රාගුණ්‍යය මෙන්ම පාලි ත්‍රිපිටකය පිළිබඳ ගැඹුරු දැනුමද මහෝපකාරී වූ ආකාරය පෙනී යයි. එමතුද නොව සිංහල කාව්‍ය විෂයයෙහි ලා ඡන්දස් සහ විරිත් පිළිබඳ එතුමන්ට තිබුණු විස්මයාවහ ඥානයද විශේෂයෙන් කැපී පෙනෙන්නකි. එසේම කාව්‍ය විචාරයෙහි ලා අපරදිග සෞන්දර්යවේදීන්ගේ චින්තාවන් අර්ථපූර්ණ ලෙස සීගිරි ගී වල රස විනිශ්චය සඳහා උපයෝගි කර ගැනීමද විශේෂයෙන් සඳහන් කළ යුතු කරුණකි. සීගිරි ගී කෘතියේ ප්‍රස්තාවනාවෙහිදී සිංහල භාෂාවේ විකාසනය අළලා කළ අධ්‍යයනයෙහි ලා සිංහලයේ භාෂා ද්විරූපතාව සම්බන්ධයෙන් දක්වා ඇති කරුණු මෙන්ම සෝරත නාහිමියන්ගේ ශ්‍රී සුමංගල ශබ්දකෝෂය සඳහා සිංහල භාෂා පරිණාමය අළලා ලියූ ලිපියද මෙහි ලා විශේෂයෙන් සඳහන් කළ යුතු වෙයි.

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සේවයෙන් විශ්‍රාම ගත් සැණින් එතුමන්ගේ අද්විතීය ඥානය විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය අභිවෘද්ධිය සඳහා යොදා ගැනීමට දූරදර්ශී වූ පේරාදෙණියේ ලංකා විශ්වවිද්‍යාලය ඒ විශ්වවිද්‍යාලයේ ප්‍රථම පුරාවිද්‍යා මහාචාර්ය ධුරය එතුමන්ට පිරිනැමීම ශාස්ත්‍රඥයකු වෙනුවෙන් කළ උපරිම ගෞරව බහුමානයක ලෙස ප්‍රශංසාවට ලක් විය යුත්තකි. මේ උදාර ලංකා පුත්‍රයා මිනිසුන් සිය දෙනෙකුගෙන් වත් ඉටු කිරීමට නොහැකි තරම් අමිල ජාතික මෙහෙයක් ඉටු කොට 1972 ඔක්තෝබර් 4 වැනි දින දැයෙන් සමු ගත්තේ ජාතියේ ජීවමාන පුරාවෘත්තයක්ද අමරණීය සංස්කෘතික සංකේතයක්ද වෙමිනි.

වැඩියෙන්ම දිවි නසා ගෙන ඇත්තේ වයස 71කට වැඩි අයයි

වැඩියෙන්ම සියදිවි නසාගන්නේ පිරිමි

● **නිශානී හේරත් බන්නැහැක**

මෙම වසරේ (2020) පළමු මාස තුන තුළ මෙරට පුද්ගලයින් 779 ක් දිවි නසාගෙන තිබෙන බව ඔබ දන්නවාද? එයින් 635 ක් පිරිමි වන අතර 144ක් කාන්තාවන්ය. එකී දත්තවලට අනුව වැඩිම පිරිසක් සිය දිවි නසාගෙන ඇත්තේ වයස අවු: 71 වැඩි අයයි. එම පිරිස 84 කි. 2019 වසරේ සියදිවි නසාගෙන ඇති ප්‍රමාණය 3135 කි. එයින් 2489 ක් පිරිමි වන අතර කාන්තාවන් 646 කි. මෙලෙසින් සියදිවි නසා ගැනීම්වලට හේතුවන්නේ දරාගත නොහැකි මානසික අවපීඩනය බව පර්යේෂණවලින් සොයාගෙන ඇත. එවැනි දරාගත නොහැකි දුක් සහගත අවස්ථාවලදී දැඩි සිත්තැවුලකට මැදිව සිටන කෙනෙකුට විශ්වාසනීයව මානසික සහනයක් ලබා දෙමින් අවවාද, විනිශ්චය, අනුශාසනා හා තර්ක විතර්ක වලින් තොරව ඉතාම සැලකිල්ලෙන් සවන් යොමන ආයතනයක් ලෙස සුමිත්‍රයෝ පෙරමුණේ සිටී. මේ කතාව ලියැවෙන්නේ සුමිත්‍රයෝ ගැනයි.

'සුමිත්‍රයෝ' ආයතනය 1974 දී මානසික සෞඛ්‍යය පිළිබඳව සංවේදී සමාජ ක්‍රියාකාරිනියක වූ ජෝන් ද මෙල් මහත්මිය විසින් කොළඹ 10, ඩීන්ස් පාරේ ස්වේච්ඡා ආයතනයක් ලෙස අරඹන ලදි. පසු කලෙක කොළඹ 07, හෝර්ටන් පෙදෙසේ තමාගේ දේපොළ සුමිත්‍රයෝ ආයතනය වෙත පරිත්‍යාග කර ඇති අතර අඩසියවසකට ආසන්න කාලයක් තිස්සේ ලංකාවේ ගම්දනව් පුරා ජනතාව අතරේ රැඳෙමින් සුමිත්‍රයෝ තම සේවාව සපයයි.

මනස සුවපත් කිරීමට උදව් උපකාර සපයන සුමිත්‍රයෝ ආයතනය වඩාත් ප්‍රසිද්ධියට පත්ව ඇත්තේ හා ප්‍රමුඛතාව ලබා දෙනු ලබන්නේ ශ්‍රී ලංකාව තුළ සියදිවි හානිකර ගැනීම වැළැක්වීම වෙනුවෙනි. සියදිවි නසාගන්නා අය, සංඛ්‍යාත්මකව අවම කිරීමට අමතරව බියෙන් සැකෙන් තොරව තම හැඟීම් ප්‍රකාශයට හුරු පුරුදුව ලබාදීම, අන් අයගේ හැඟීම් හඳුනා ගනිමින්, එම හැඟීම්වලට ගරු කිරීමේ පුරුද්ද ඇති කිරීම, සමාජ ගැටලු ගැන මානව හිතවාදී ලෙස සංවේදී වීමද සුමිත්‍රයෝහි විශේෂත්වය වෙයි.

එහි දස වසරක පමණ අත්දැකීම් ඇති ස්වේච්ඡා සේවිකාවක් එම ආයතනයේ තතු ගැන මෙසේ කීවාය.

"මේ ආයතනයේ හිමිකාරිය ජෝන්ද මෙල් මහත්මිය බ්‍රිතාන්‍යයේ සමරිටන්ස්වල සිටි සුදු ජාතික කාන්තාවක්. එංගලන්තේ සේවය නිමා කරමින් ලංකාවට පැමිණි ශ්‍රී ලංකාවෙ බිෂොප්වරයෙක් සමගයි ඈ විවාහ වෙලා තියෙන්නේ. සුමිත්‍රයෝ ලංකාවෙ සේවය ඇරඹුවට පස්සේ, එදා සිට අද දක්වාම සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා තුනෙන්ම සේවය ලබා දෙන්නේ හිත සැහැල්ලු කිරීමේ හිත මිතුරු සේවාවක් ලෙස. මෙල් මහත්මියගේ කාලේ සිට වැඩ කරපු සමහර අයත් ඉන්නවා. අපි මෙහෙට එන අයගෙන් මුදල් අය කරන්නේ නැහැ. හැම දිනකම උදේ 9.00 සිට රාත්‍රි 8.00 වන තුරු අපේ සේවය ලබා දෙනවා. පැමිණිලි උපදෙස් ගන්න අයට අමතරව, දුරකථනයෙන් හා ඊමේල් මගින් උපදෙස් ගන්න අයත් ඉන්නවා. ස්වේච්ඡාවෙන් සේවය කරන අය 100 පමණ ඉන්නවා. සේවය ලබාගන්න එන පිරිස එක එක දවසට වෙනස් වෙනවා. සමහරු දන්වලා එනවා. සමහරු නිකම්ම ගොඩවෙනවා. නමුත් අපි කාටත් එක විදිහට වෙනසක් නැතුව සලකනවා. සුහදව පිළි අරගෙන. කාන්තා, පිරිමි, ලොකු කුඩා ළමයි වයස් භේදයකින් තොරව ලංකාවෙ හා පිටරටින් අප හා සම්බන්ධ වෙනවා. ප්‍රේම සබඳතා, විවාහ ගැටලු, ලිංගික ගැටලු, රැකියා මූල්‍ය හා විවිධාකාර වෙනත් ගැටලු ගැන පවසන්න එනවා.

සමහරු කෙළින්ම කියනවා එයාලට මානසික ගැටලු තියනවා කියලා. අපි එයාලට අවවාද දෙන්නෙ නැහැ. විනිශ්චයෙන් තොරයි. නීති සහන දෙන්න හැකි නම් ඒ තැන්වලට යොමු කරනවා. එයාලගේ ප්‍රශ්න කියාගෙන යද්දි එයාලගේ හිත් සැහැල්ලු වෙනවා. අපි එයාලගේ කාලය සීමා කරන්නෙ නැහැ. මනස ව්‍යාකූල නිසානෙ එන්නේ. ප්‍රශ්නය විසඳීමට වඩා වැදගත් වෙන්නේ සියදිවි නසා ගැනීම වැළැක්වීමයි. එම ප්‍රශ්නය කියන කෙනාටම හැකිවෙනවා තමන්ගේ හිතේ තියෙන ශක්තීන් අවදිකරගෙන ගොඩයන්න. එයාගේම වටිනාකම හඳුනාගන්න.

සමහර කෙනෙක් කාමරේ ඇතුළේ දිවිනසාගන්න උත්සාහ දරනවානම් ගෙදර අය එළියේ අය අපිට කථා කරලා කියනවා. එතකොට අපිට පුළුවන් අවශ්‍ය හැම විදිහටම පිළියම් යොදලා බේරගන්න."

සුමිත්‍රයෝ ආයතනය හරහා බොහෝවිට විවාහය, රැකියාව, පවුල, දරුවන්ගේ අධ්‍යාපනය, ආදර සබඳකම් බිඳවැටීම්, ආර්ථික ගැටලු, ප්‍රචණ්ඩත්වය, තනිකම හෝ මානසික රෝග උද්ගතවූ අවස්ථාවලදී සරණ වෙයි. සුමිත්‍රයෝ ස්වේච්ඡා සේවක සේවිකාවෝ කිසිඳු විනිශ්චයකට ලක් නොකිරීමටත් හා සේවාලාභීන්ගේ පෞද්ගලිකත්වය ආරක්ෂා කිරීමටත් බැඳී සිටිති.

සේවය ලබා ගැනීමට පැමිණෙන්නන්ගේ හැඟීම්වලට සවන්දීමෙන් හා හිතමිතුරුකරණය මගින් මානසික සහනයක් ඔවුන් වෙත ලබාදේ. සේවාලාභීන්ගේ හැඟීම් හඳුනා ගනිමින්, ඔවුන් මානසික පීඩාකාරී බවින් මුදා ගැනීමට සුමිත්‍රයෝ උපකාරී වෙයි. එසේම තම ගැටලුවලට මුහුණදීමට බලගැන්වීම් කරයි. සහාය ඉල්ලා පැමිණෙන ඕනෑම අයකු ඉතාම සුහදශීලීව පිළිගනිමින්, තේ කෝප්පයකින් සංග්‍රහ කිරීමට පවා සුමිත්‍රයෝ ඔබ වෙනුවෙන් කාරුණිකය.

මෙහි ස්වේච්ඡා සේවක මඬුල්ල තම අනන්‍යතාව හෙළි නොකරමින්, සේවාව සපයන අතර සේවාලාභීන්ට ද තම අනන්‍යතාවය හෙළි නොකරමින් සේවය ලබා ගැනීමට හැකියාව ඇත.

පසුගිය කොරෝනා සමයේ පැනනැගුණු ගැටලු හේතුවෙන්, උපදේශන සේවාවලට පැමිණෙන පිරිස විශාල වශයෙන් වැඩිවී ඇති බව පවසන එම සංවිධානය පවුල් ආරවුල් ඇතිවීම ඔවුන් පීඩාවට පත්කර ඇති ප්‍රධාන ගැටලුව බවද පවසයි. රැකියා අහිමි වීම, වැටුප් ඇතුළු ආදායම් කපා හැරීම සහ රැකියාවේ අනාරක්ෂිත බව ජනතාව පීඩාවට පත්කිරීමට සෘජුවම බලපා ඇති බවත්, ඔවුහු සඳහන් කරති.

තම සේවාවන් අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා වාර්ෂිකව විධිමත්, ක්‍රමවේදයකට දැන්වීමක් ප්‍රසිද්ධ කර අයදුම්පත් කැඳවා, ස්වේච්ඡා සේවක කණ්ඩායම බඳවාගැනීමට සුමිත්‍රයෝ කටයුතු කරයි. එසේම ආයතනයේ එදිනෙදා වියදම් පියවා ගැනීමට වාර්ෂිකව සංවිධානයකරන මහජන පොළින් ලැබෙන මුදලින් ආයතනයේ නඩත්තු කටයුතු සිදුකරයි.

සුමිත්‍රයෝ ආයතනයේ දැක්ම වනුයේ සමාජය තුළ සිය දිවි නසාගන්න අය සංඛ්‍යාත්මකව අවම කිරීම, බියෙන් සැකෙන් තොරව තම හැඟීම් ප්‍රකාශයට ඉඩදීම, අන් අයගේ හැඟීම් හඳුනාගනිමින්, එම හැඟීම්වලට ගරු කිරීමේ පුරුද්ද ඇති කිරීම, සමාජ ගැටලුවලට මානව හිතවාදී ලෙස සංවේදී වීම ආදියයි.

මත්ද්‍රව්‍ය, එනම් මද්‍යසාර, දුම්වැටි, හෙරොයින්, ගංජා, බුලත්විට හෝ වෙනත් ඕනෑම ඇබ්බැහිකාරී ද්‍රව්‍යයකින් මිනිසුන් මුදවා ගැනීමට සුමිත්‍රයෝ ආයතනය මැල්මැදුර ඇරඹුවේ 1984 දීය. වසර 29 වඩා මෙම ක්ෂේත්‍රය තුළ වැඩ කිරීම මගින් ද විශේෂඥවරුන් යටතේ පුහුණු වූ සුමිත්‍රයෝ කාර්ය මණ්ඩලයේ සුහද සේවාවන් රැසක් ඕනෑම විටක ලබාගත හැකිය. ප්‍රශ්න ඇති අයට මද්‍යසාර, දුම්වැටි, හෙරොයින්, ගංජා හා බුලත්විට යනාදී ද්‍රව්‍ය භාවිතය අවම කිරීම හෝ නැවැත්වීම සඳහා බලගැන්වීමේ සාකච්ඡා දිනපතා පැවැත්වේ.

සරණක් ඇවැසි නම් ඔබත් අමතන්න, සුමිත්‍රයෝ 60 බී, හෝර්ටන් පෙදෙස, කොළඹ 07. දුරකථන අංක 0112696666, 0112692909

කවුද මේ ජෝන් ද මෙල්

එංගලන්තයේ ලන්ඩන් සමරිටන්වල ජීවත්වූ ජෝන් නමැති සුදු ජාතික කාන්තාව සමාජ ක්‍රියාකාරිනියකි. බ්‍රිතාන්‍ය ජාතික හමුදා නිලධාරියකුගේ වැන්දඹු බිරිඳ වූ ජොඇන් ලංකාවට පැමිණියේ එංගලන්තයේ සේවය කළ ලක්දාස් ද සිල්වා නම් ලාංකික බිෂොප්වරයා සමග දෙවන වරටත් විවාහ වීමෙන් පසුව 1971 දීය.

පුවත්පත් රැසකට හා පල්ලියේ සඟරා රැසකට ලිපි සපයා ඇති ලේඛිකාවක වන ඇය ප්‍රථම පොත ලීවේ ඇගේ සැමියා හා ඔහුගේ කටයුතු සම්බන්ධවයි. ලොව පුරා සිටින ඇයගේ හිතෛෂීන්ගේ ඉල්ලීම මත ඈ පොත් ලීවාය. එම පොත් ද පාඨකයන් අතරේ ඉහළම ජනප්‍රියත්වයක් ලැබීය. ජෝන් ද මෙල් මහත්මිය සැමියා සමග කුරුණෑගල ප්‍රදේශයේ ජීවත් වුවත් සැමියාගේ වියොවින් පසු කොළඹට පැමිණියාය.

විවේකශීලී සැඳෑ සමයක් ගත කළ හැකි වුවද 'සුමිත්‍රයෝ' සමග ඇය බොහෝ කාර්ය බහුල වූවාය. වේදිකා නාට්‍ය නැරඹීමට සංදර්ශන බැලීමට ද මෙල් මහත්මිය ප්‍රිය කළාය. ඇගේ දරුවන් දෙදෙනා වන පෙනී හා නිකී ලංකාවේ ජීවත් වෙති. සුමිත්‍රයෝ ආයතනය සමග රමේෂ් ද මෙල් නමැති ඇගේ ඥාතිවරයකු තවමත් රැඳී සිටී.

වෙල්ලස්සට එරෙහි සටන පිළිබඳ චිත්‍ර ශිල්පියකුගේ ඇඳින්

උඩරට කැරැල්ලට ප්‍රබල ආරම්භයක් දුන් ඌව වෙල්ලස්ස හටන

● අනුර බී. සෙනෙවිරත්න

පහළොස් වන සියවස තරම් ඈත කාලයේ සිට ම ලොව බලවත් ජාතීන් මහ සමුදුර තරණය කරමින් දේශ සංචාරයේ යෙදුණේ ධන ධාන්‍ය රැස්කර ගැනීම සඳහා ය. ඔවුහු කුළුබඩු, ඇත්දළ, මුතු මැණික් ආදී වටිනා දෑට ඉමහත් ඇල්මක් දැක්වූ හ. එසේ ලංකාවට පැමිණි විදේශ ජාතීන් අතර පෘතුගීසීන්, ලන්දේසීන්, ස්පාඤ්ඤ හා ඉංග්‍රීසි ජාතිකයෝ ප්‍රමුඛත්වයක් ගත්තෝ ය.

ඒ අතරින් බ්‍රිතාන්‍ය ජාතිකයන් ලංකාවට පැමිණියේ අනෙකුත් බටහිර ජාතීන් මෙන් ධන ධාන්‍යවලට ඇල්මෙන් ම පමණක් නොව, වෙනත් දේශපාලන අරමුණු ද ඇතිව ය. ඔවුන්ට අවශ්‍ය වූයේ එවකට ඔවුන් ලොව පුරා ගොඩනගමින් සිටි බ්‍රිතාන්‍ය යටත් විජිතයට ලංකාව ද අයිතිකර ගැනීමට ය.

ඒ අනුව යමින් 17 වන සියවස වනවිට බ්‍රිතාන්‍යයන් ඉන්දියාවේ සහ මලක්කාවේ පාලන ඒකක ගොඩනගා ගෙන තිබුණු අතර, 1763 පමණ වනවිට ලංකාව කෙරෙහි ද ඔවුන්ගේ බලපෑම වඩාත් තීව්‍ර ලෙස එල්ල වී ය. ඒ වනවිට ලංකාවේ රාජ්‍යත්වයට හිමිකම් කීවේ කීර්ති ශ්‍රී රාජසිංහ රජු වුව ද, මෙරට මුහුදුබඩ ප්‍රදේශ බොහොමයක් පැවතියේ, ලන්දේසි පාලනය යටතේ ය.

මෙරට පළමු ඉංග්‍රීසි තානාපතිවරයා ලෙස ජෝන් පයිබස්, කීර්ති ශ්‍රී රාජසිංහ රජු මුණගැසී කතාබහ කරන්නට ගත් උත්සාහයට ලන්දේසීහු විරුද්ධ වූ හ. එම වසරේ දී ම ඔවුන් උඩරට රජු සමඟ ඇතිකර ගන්නට ගිය ගිවිසුමක් ද ලන්දේසීන්ගේ මැදිහත්වීමෙන් වැළකිණි. මේ නිසා ලන්දේසීන් සතුව තිබූ ප්‍රදේශ තමන් යටතට ගැනීම ඉංග්‍රීසීන්ගේ පළමු කර්තව්‍යය බවට පත් වී ය. ඒ සඳහා බ්‍රිතාන්‍යය රජය 1782 දී නාවික හමුදාවක් ලංකාවට එවන්නට ද පියවර ගත්තේ ය.

1783 පැරිස් ගිවිසුම මගින් යුද සමාදානය ඇතිවීමත් සමඟ ත්‍රිකුණාමලය වරාය මෙහෙයුම් කටයුතු සඳහා ලන්දේසීන් අතට පත්වන අතර, 1785 දී ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයෙකු වූ හෝබාර්ට් සාමිවරයා විසින් එවන ලද නාවික හමුදාවක් මගින් ඉංග්‍රීසීහු ත්‍රිකුණාමලය අත්පත් කරගත් හ. ඉන්පසු ලන්දේසීන් සතු සියලු දේපළ 1796 පෙබරවාරි 16 දින ගිවිසුමක් මගින් අත්පත් කරගන්නා ඉංග්‍රීසීහු මෙරට මුහුදුබඩ ප්‍රදේශ පාලනය කරන්නට පටන් ගත්තෝ ය.

ඉංග්‍රීසීන් නඩත්තු කිරීම සඳහා බදු ගෙවන්නට සිදු වූයේ මෙරට ජනයාට ය. ජනතාව මීට විරුද්ධවීම නිසා දෙපාර්ශ්වය අතර නිතර-නිතර ගැටුම් ඇති වී ය. මෙම ගැටුම් නිරාකරණය කිරීම සඳහා බ්‍රිතාන්‍යයන් විසින් 1798 දී ලංකාවේ පළමු ආණ්ඩුකාරවරයා ලෙස ශ්‍රීමත් ෆෙඩ්රික් නෝත් පත්කර එවනු ලබන අතර, එතැන් සිට 1948 දක්වා ආණ්ඩුකාරවරුන් 29 දෙනෙකු ලංකාව පාලනය කර තිබේ.

මොවුන් අතරින් ඉතාමත් කෘර පාලකයා වූයේ 1812 දී පත්කර ඒවන ලද රොබට් බ්‍රවුන්රිග් ය. මුහුදුබඩ පරිපාලනයෙන් සෑහීමට පත් නොවූ ඔහු, සිංහලයන්ට දරුණු වධහිංසා දෙමින් උඩරට ආක්‍රමණය කරන්නට පටන් ගත්තේ ය. ඔහුට ගැතිකම් කළ සමහර සිංහලයන්ගේ සහාය ද ඊට ලැබිණි. සිංහලයා අතර වූ එවැනි පාවාදීම් හා අසමගිකම් හේතුවෙන් 1815 මාර්තු 02 වැනි දින අත්සන් කරන ලද උඩරට ගිවිසුමෙන් අපේ රටේ අයිතිය ඉංග්‍රීසීන් වෙත පැවරිණි.

දෙපාර්ශ්වයේ එකඟත්වය මත අත්සන් කරන ලද උඩරට ගිවිසුමේ ප්‍රධාන එකඟත්වයන් රැසක් අන්තර්ගත වී ය. ඒ අතරින් පහත දක්වා ඇති කරුණු ප්‍රධාන වෙයි.

මලබාර් රජෙකු වුණු ශ්‍රී වික්‍රම රාජසිංහට කන්ද උඩරට රාජධානියේ කිරුළ සම්බන්ධයෙන් පැවති හිමිකම් අහෝසි කිරීම, රජතුමාගේ සියලු ම පිරිමි ඥාතීන් රටින් පිටුවහල් කිරීම සහ යළි මෙරටට පැමිණීම තහනම් කිරීම, රජතුමාගේ රාජ්‍ය කාලය සහ කන්ද උඩරට පාරම්පරික හිමිකම ද, සිංහලේ ආණ්ඩුවක් පිහිටුවීමට ද්‍රවිඩ ජාතිකයන්ට පැවති සියලු ම අයිතිවාසිකම් ද අහෝසි කිරීම, බුදු දහම-සංඝයා වහන්සේ-විහාරස්ථාන සහ දේවාල ආරක්ෂා කිරීම සහ නිසි ලෙස නඩත්තු කිරීම, සිංහලේ පරමාධිපත්‍ය බලය බ්‍රිතාන්‍ය කිරීටය යටතට ගත් බව ප්‍රකාශ කිරීම සහ සිංහල නීති රීති දිගට ම පවත්වා ගෙන යාම සඳහා උඩරට අධිකාරම්වරුන්ට, දිසාවේවරුන්ට, මොහොට්ටාලවරුන්ට, විදානේලාට සහ කෝරෙල්වරුන්ට බලය පිරිනැමීම, එතෙක් ලබාදුන් ශාරීරික වධහිංසාවන් සහ අවයව කැපීමේ දඬුවම් අහෝසි කිරීම, මරණ දඬුවම නියම කිරීම සඳහා අවශ්‍ය බලතල ආණ්ඩුකාරවරයා වෙත ලබාදීම සහ මරණ දඬුවම ක්‍රියාවට නැංවීම රාජ්‍ය නිලධාරීන් ඉදිරිපිට දී සිදුකිරීම, කන්ද උඩරට නොවන අනෙකුත් ප්‍රදේශයන් හි ද බ්‍රිතාන්‍ය නීතිය ක්‍රියාත්මක කිරීම, කන්ද උඩරට රාජධානිය තුළ සිදුවන සෑම සිවිල් සහ අපරාධ ක්‍රියාවක් ම සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීමේ දී පවතින උඩරට නීති ක්‍රම යටතේ එය සිදුකිරීම සහ අවශ්‍ය අවස්ථාවල දී පමණක් බ්‍රිතාන්‍ය නීතිය ඒ සඳහා යොදාගැනීම, එවකට තුන් කෝරලය, හතර කෝරලය සහ සබරගමුව සම්බන්ධයෙන් නිකුත් කරන ලද දැන්වීම් පත්‍ර සියල්ලක් ම අහෝසි කර දැමීම, ජනතාවගෙන් අය කරන බදු සහ අනෙකුත් ආදායම් සියල්ල ම බ්‍රිතාන්‍ය කිරීටය වෙනුවෙන් වෙන් කිරීම, වෙළඳාම් කටයුතු සහ අනෙකුත් වාණිජ ගනුදෙනු සඳහා පහසුකම් ලබාදීමට බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයාට බලය පැවරීම ඒ එකඟතාවන් ය.

ශ්‍රී වික්‍රම රාජසිංහ රජු

මොනරවිල කැප්පෙටිපොල නිලමේ

රොබට් බ්‍රවුන්රිග්

එතැන් පටන් බ්‍රිතාන්‍ය හමුදා පාලනයකට යටත් වූ මෙරට සිංහලයෝ රට ජාතිය අධිරාජ්‍යවාදයෙන් මුදාගැනීම සඳහා සටන් මගට පිළිපන් හ. එහි ප්‍රධාන සහ පළමු සටන වන්නේ 1818 ඌව වෙල්ලස්සෙන් ආරම්භ වූ කැරැල්ල යි. ඉංග්‍රීසීන්ගෙන් එල්ල වූ පීඩනය මෙන් ම, තවත් කරුණු ගණනාවක් මෙම ඌව වෙල්ලස්ස කැරැල්ලට බලපෑවේ ය. පෙර සිට පැවති උසස් නිලතල සිංහල පවුල්වලට ලබාදීමේ සම්ප්‍රදායට පටහැනිව ඌව වෙල්ලස්සට 'හජ්ජි මරික්කාර්' නමැති මුස්ලිම් මුහන්දිරම්වරයෙකු පත් කිරීම ද ඊට එක් හේතුවක් වී ය.

මේ අතර, රජ පෙළපතට සම්බන්ධ තමාට රජකමේ උරුමය ඇතැයි විල්බාව ප්‍රදේශයේ දොරේසාමි නම් තැනැත්තෙකු පෙනී සිටියේ ය. 1817 වසරේ මැද භාගයේ දී දොරේසාමි අල්ලා ගැනීම සඳහා හජ්ජි මරික්කාර් කැටුව බදුල්ලේ උප ඒජන්තව සිටි සිල්වෙස්ටර් විල්සන් යවන ලද අතර, කුපිත වූ ජනතාව කළේ ඔවුන් දෙදෙනා ඝාතනය කිරීම යි. බ්‍රිතාන්‍ය රජය ඊට ප්‍රතිචාර දැක්වූයේ ඉතාමත් කුරිරු ආකාරයට ය. වෙල්ලස්සේ ආහාර හිඟයක් ඇතිකිරීම, වැව් අමුණු පුපුරවා හැරීම, කුඹුරු ගිනිතැබීම, පලදරන ගස් කපාදැමීම, ගවයන් මරාදැමීම, අවුරුදු 18ට වැඩි පිරිමින් මරාදැමීම, මළ සිරුරු ජල පහරවලට දමා රෝග පැතිරවීම, ගෙවල් ගිනිතැබීම ඔවුන් එල්ල කළ කුරිරු ප්‍රහාර අතර ප්‍රධාන තැනක් ගත්තේ ය.

ඌව වෙල්ලස්ස සටනට දැවැන්ත දායකත්වයක් දී තිබෙන්නේ ඌව උඩුකිඳ ප්‍රදේශය යි. ඌව උඩුකිඳ ප්‍රදේශය හරහා පුරාතනයේ සිට ම මහනුවර රාජධානියත්, බදුල්ල ප්‍රාදේශීය යුව රාජධානියත් යා කෙරුණු මාවතක් තිබී ඇත. වර්තමානයේ එය රජ මාවත නමින් හඳුන්වනු ලැබේ.

ඌව වෙල්ලස්ස සටනේ දී ජීවිත පරිත්‍යාගයෙන් සටන් වැදුණු ඌවේ උඩුකිඳ වැසියන් ගේ විනාශ වූ කුඹුරු ගණන 8140කි. අමුණු ලෙස එය 694 කි. ඉන් අමුණක් රුපියල් 7.63 ගණනේ විකිණී ඇත.

ඒ හේතුවෙන් පවුල් 2930කට ඔවුන්ගේ සියලු වත්කම් අහිමි වී තිබේ. එම කාලය තුළ 450 දෙනෙකු මිය ගිය බවත්, 20,000 ක පමණ ස්වදේශිකයන් පිරිසක් කුලිකරුවන් බවට පත් වූ බවත්, 127 දෙනෙකු හිඟන්නන් බවට පත් වූ බවත් මේ සම්බන්ධ මූලාශ්‍රවල දැක්වේ. සිංහල රදළ නායක පවුල්වල පිරිමි නිදහස් සටනට ස්වේච්ඡාවෙන් ම ඉදිරිපත් වී ඇති අතර, පුතුන් නොසිටි උඩුකිඳ කැටකෑල වලව්වේ එක ම දියණිය වූ කැටකෑලේ කුමාරිහාමි ද එසේ ස්වේච්ඡාවෙන් ම සටනට සහයෝගය දීමට ඉදිරිපත් වූ තරුණියකි.

ඇය අසකු පිට නැග ඌවේ සේනාව මෙහෙයවා ඇති බව සඳහන් ය.

සටනේ දී ඇය දැක්වූ වීරත්වයට ශ්‍රී වික්‍රම රාජසිංහ රජු විසින් 'කැට කෑලේ බණ්ඩාර තරුව' යන නම්බු නාමය සහිත රන් ආලේපිත නළල් පටයකින් ද ඇය සම්මානයට පාත්‍රකර ඇති බව පුරා විද්‍යාඥ අයි.ජේ.එම්. විජේබණ්ඩාර මහතා සඳහන් කරයි.

වෙල්ලස්ස ප්‍රදේශයේ ආරම්භ වූ කැරැල්ල මැඩ පැවැත්වීම සඳහා යවන ලද සේනාව සිංහලයන්ගේ දැඩි ප්‍රහාරයට ලක්වීමත්, එම ප්‍රහාරය මෙහෙයවන ලද බදුල්ලේ ඒජන්තව සිටි විල්සන්, සිංහලයන් අතින් මරණයට පත් වීමත් නිසා තත්ත්වය පාලනය කිරීම සඳහා මිල්ලෑව, කොබ්බෑකඩුව වැනි දිසාවේවරුන්ට එක්-එක් ප්‍රදේශ භාරදෙන විට කොළඹ සහ සෙංකඩගල අතර සබඳතාවය පවත්වා ගැනීම භාරකළේ මොල්ලිගොඩ අදිකාරමට ය. ඊට අමතරව, සත්කෝරලයේ සේනා සංවිධානය කිරීමේ වගකීම ද ඔහුට පැවරිණි. එම අවධිය වන විට මාතලේ මහ දිසාව ලෙසින් කටයුතු කළේ මොණරවිල කැප්පෙටිපොළ මහ අධිකාරම යි. රණශූරයෙකු ලෙසින් ප්‍රසිද්ධව සිටි කැප්පෙටිපොළ එදා වෙල්ලස්සට යැවීමට ඉංග්‍රීසීන් කටයුතු කළේ කැරැල්ල මර්දනය කිරීමේ අරමුණ ඇතිව ය. එලෙස ඉංග්‍රීසින් ලබාදුන් අණ පිළිපදිමින් කැප්පෙටිපොළ මහ අදිකාරම් වෙල්ලස්ස බලා මහා සේනාවක් සමඟින් පිටත් වූයේ ජාතිද්‍රෝහියෙකු ලෙස ය. එසේ යමින් සිටි කැප්පෙටිපොළ අදිකාරම ප්‍රමුඛ සේනාවට අතරමග දී කොනුකුඹුරේ රටේ රාල මුණගැසී තිබේ. එහි දී කොනුකුඹුරේ රටේ රාල, මොණරවිල කැප්පෙටිපොළ රටට ද්‍රෝහී වන්නට යන ආකාරය පැහැදිලි කර දී ඇති අතර, එම පැහැදිලි කිරීම අසා මොණරවිල කැප්පෙටිපොළට තමා ගැන ම මහත් ලැජ්ජාවක් ඇති වී තිබේ. ඉන්පසු ඔහු ඉංග්‍රීසි සේනාවේ ඉහළ නිලධාරියෙකු ළඟට කැඳවා ඔහු සතුව තිබුණු ආයුධ යළි භාරදෙමින් "උඹලාගේ ආයුධවලින් උඹලාට ම ගහන්න තරම් මම නිවටයෙක් නොවේ. කැප්පෙටිපොළත් සිංහල සේනාවට එකතු වුණු බව උඹලාගේ ආණ්ඩුකාරයාට දැනුම් දීපල්ලා" යනුවෙන් පවසා ඇත. එලෙස කැප්පෙටිපොළ සිංහලයන්ට එකතු වුණු බව ඇසූ සිංහල සේනාව වඩාත් ධෛර්යමත් වෙමින් ඉංග්‍රීසීන් මව්බිමින් එළවා දැමීමේ සටනට කැප්පෙටිපොළ සමඟ එක්ව දිවිහිමියෙන් සටන් කරන බවට ප්‍රතිඥා ලබා දී තිබේ.

ඉංග්‍රීසීන්ගේ යුද උපක්‍රම ගැන පවා අවබෝධයක් තිබුණු කැප්පෙටිපොළ වැනි රණශූරයෙකු බලාපොරොත්තු නොවූ අවස්ථාවක සිංහලයන්ට එකතු වීම ඉංග්‍රීසීන්ට මහත් අභියෝගයක් වී ය. එසේ ම මේ බව දැනගත් ඇතැම් උඩරට රදළයන් ද කැප්පෙටිපොළට සහාය ලබාදුන් හෙයින්, කැරැල්ල දරුණුවට ම ඇවිළී ගියේ ඉංග්‍රීසින්ට ප්‍රබල තර්ජනයක් එල්ල කරමිනි. එහි දී ඉතා සූක්ෂම යුද උපක්‍රම අනුගමනය කළ සිංහල සේනාව භූමියේ වාසිය ද උපයෝගී කරගනිමින් කැප්පෙටිපොළ අදිකාරම සමඟ පෙරට ගියේ, පරසතුරන්ව මව්බිමෙන් එළවා දැමීමේ ස්ථිර අරමුණ සිතේ රඳවා ගනිමිනි.

කැරැල්ල සාර්ථක ලෙසින් ඇවිළී යාම නිසා උද්දාමයට පත් කැප්පෙටිපොළ ප්‍රමුඛ සිංහල රදළයන් විසින් දොරේසාමි ඔවුන්ගේ රජු ලෙස ප්‍රකාශයට පත් කරන ලද අතර, මොණරවිල කැප්පෙටිපොළ මහ අදිකාරම ලෙසින් පත් කරනු ලැබී ය. මෙහි දී මොණරවිල කැප්පෙටිපොළ අනෙකුත් උඩරට රදළයන්ගෙන් ඉල්ලා සිටියේ, නව රජුට පක්ෂපාතී වෙමින් බ්‍රිතාන්‍යයන් ලංකාවෙන් එළවා දැමීමට සහයෝගය ලබාදෙන ලෙස ය.

එවකට උඩරට සිටි බොහෝ රදළයන් කැප්පෙටිපොළ අදිකාරමට සිය සහාය ලබාදුන්නත් මොල්ලිගොඩ සහ එක්නැලිගොඩ යන දිසාවේවරු ඉංග්‍රීසීන්ට පක්ෂපාතී වෙමින් ඔවුන්ට ඔත්තු සැපයූ හ.

මොල්ලිගොඩ දිසාවගේ බලය පැතිරී තිබුණු පහළ සබරගමුව ප්‍රදේශය හරහා ඉංග්‍රීසීන් මහනුවර සිට කොළඹට පණිවුඩ හුවමාරු කිරීම සිංහලයන්ට මහත් අභියෝගයක් වී ය. එසේ ම, එදා සමහර මුස්ලිම්වරු ද සිංහල සටන්කරුවන් පිළිබඳව බ්‍රිතාන්‍යයන්ට ඔත්තු ලබාදුන් හ. එම ඔත්තු වෙනුවෙන් ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයා ඔවුන්ට විවිධ වරප්‍රසාද ලබාදීමට කටයුතු කළේ ය.

උඩරට සිටි එවැනි සමහර ජන කොටස්වල සහාය නොලැබුණ ද, කැරැල්ල ඉදිරියට ම ගෙන යන්නට සිංහල සේනාව සමත් වී ය. ඒ වන විට වෙල්ලස්ස බිමේ සටන් කරමින් සිටි ඉංග්‍රීසි සෙබළු ආහාර පාන හිඟ වීම නිසා මහත් පීඩාවට ලක්ව සිටිය හ. නමුත්, එම තීරණාත්මක මොහොතේ අපේ ම මිනිසුන් රට ජාතිය පාවා දෙමින් කටයුතු කළ නිසා ඉක්මනින් ම වෙල්ලස්ස අරගලය වෙනත් අතකට හැරිණි.

කැප්පෙටිපොළ ප්‍රමුඛ සිංහලයන් කරගෙන ගිය අරගලය තියුණු මුහුණුවරක් ගනිමින් තිබුණු අවස්ථාවක සූක්ෂම ලෙස කටයුතු කළ ඉංග්‍රීසීහු තාන්නමාන්න බලාපොරොත්තුවෙන් සිටි නිවට සිංහල රදළයන් රවටා ගත් අතර, ඔවුන් එදා ඉංග්‍රීසීන්ට ලබාදුන් ඔත්තු නිසා සටනේ ජවය තරමක් හීන වුව ද, එය 1818 උඩරට කැරැල්ලට ප්‍රබල ආරම්භයක් ලබා දුන්නේ ය.

හදවතේ නොකියවෙන කොටස

මා අත 'පොල්කිච්චාගේ කැලැන්ඩරේ' නම් සුන්දර කෘතියක් වෙයි. ලෝකය දකින්නට තතනන කුරුල්ලකුගේ හදවත, සිතිවිලි, බලාපොරොත්තු ගැන ඔබට කිව හැක්කේ කුමක්ද? එය උදෑසන පතිත නවමු පිනි බිඳු සේ හදවත තෙමාලන සුමුදු බවකින් යුතු යැයි මා කිවහොත් ඔබ එකඟ ද? හිරු රැස් පතිත විට වාෂ්ප වී යන පිනි බිඳු සේ ඒ සුමුදු බව ඇතුළාන්තයෙන් ම කුරුලු හදවතේ පවා රැඳෙන්නේ ටික කලක් බව ඔබ දන්නවාද? මිනිස් හදවත් සේම ඒවා ද අවට පරිසරය හා ගනුදෙනුවේදී වෙනස් වන්නට පටන් ගනී.

විතාලි බියන්කි ගේ 'පොල්කිච්චාගේ කැලැන්ඩරේ' රුසියන් බසින් පරිවර්තනය කර ඇත්තේ එච්. ජයරත්න ය. ඒ කුඩා සුන්දර කෘතිය පුරා සොබාදහමේ නියමය නමැති පාඩම දිග හැරෙන්නේ කිසිදු ආයාසයකින් තොරව ය. සින්කා නමැති පුංචි පොල්කිච්චිය අවුරුද්දේ මාස දොළහ පුරා සිය ජීවන තක්සලාවට දැනුම එක්කාසු කරන්නේ ජීවිතයෙන් ම උගත් පාඩම් ඔස්සේයි. ඇයට ජීවිතාවබෝධය ලබාදීමේ ගුරුකම ලැබෙන්නේ ජීවත් වීමෙන් ම පාඩම් උගත් වයසක ගේ කුරුල්ලකුගෙනි. සොබාදහමේ සියලු ම නියමයන්ගෙන් පාඩම් උගනිමින් සින්කා ජීවිතය සොයන්නී ය. ඇගේ සිරුරේ දවටා විතාලි බියන්කි නම් රුසියානු ලේඛකයා සමස්ත ලෝකයට ම සොබාදහමේ ස්වභාවය ගැන අරුත් සපයන්නේ ය. සොබාදහමට ආදරය කරන්නටත්, සොබාදහමේ කොටස්කරුවන් වන්නටත් අප ඉගෙන ගත්තේ කිසිදු ආයාසයකින් තොර ව ය. ජීවිතයේ බොහෝ දේ අප ඉගෙනගන්නේ එපරිද්දෙනි.

අපට අපේ ජීවිතයේ බොහෝ දේ මඟ හැරී ගොස් තිබෙනවා යැයි මා කීවොත් ඔබ එකඟ වේවි. ඔබට මට අප සියල්ලන්ට ම නොදැනුවත් ව බොහෝ සියුම් දේ මඟහැරී තිබේ. සියුම් දේ මඟ හැරීම නිසා ම අපේ ජීවිත වලින්ද සියුම් බව පලා ගොස් ඇත. මඳක් සිතන්න... ඔබේ පයට පෑගෙන තණ පතක වන මුදු මොළොක් බව, එහි ඇති පිනි බිඳු වල තෙතමනය, තණ පතක පිපෙන සුන්දර කුඩා මල්වල සුන්දරත්වය මෙන්ම නෙක පැහැ වර්ණ රටාව ඈ මේ සියල්ල ම නොදැක, නොදැනී අප බොහෝ දුර ගොස් නේද?

එපමණක් නොව, අප කියවන බොහෝ පොත්වල චරිතයන්හි ඇති අභ්‍යන්තර ගුණ සුවඳ අපට දැනී තිබේද? මේ වන විට ඔබ බොහෝ පොත්පත් කියවා ඇති බවට මට සැක නැත. එහෙත් ඒ බොහෝ පොත්පත්වල ඇති සියුම් මනෝභාවල චරිත විශ්ලේෂණ, චරිත අභ්‍යන්තර ස්වභාව ඈ නොයෙක දෑ ඔබ නොදැක, නොදැනී ඒ පොත කියවා ඇතැයි මට සිතේ. මඳක් සිතා බලන්න; ඔබට මාර්ටින් වික්‍රමසිංහයන්ගේ ගම්පෙරළිය, යුගාන්තය, කලියුගය කියවද්දී නන්දා නම් ගැහැනිය ගැන සිතුණේ කුමක්ද කියා. අති සාම්ප්‍රදායික ගරා වැටෙන වලව්වේ ළමාතැනී කලියුගයේදී වෙනස් ම ගැහැනියක බවට පත් වේ. ඔබට සමහරවිට මතක ඇති, ඒ ගැහැනිය සිය මුල් ස්වාමිපුරුෂයාගේ මළගම ගැන කියද්දී පියල් ඇයට කියූ වදන්. අප බහුතරයක් සිතන්නේ ඇය පරිණාමය විසින් වෙනස් ම ගැහැනියක කළ බවයි. එහෙත් මොහොතකට හෝ ඔබට සිතුණා ද ඇය දෙලොවක අතරමං වූ කලියුග ගැහැනියක කියා. ඉදින් අප නන්දා ව හරිහැටි කියවා තිබේද?

ඩී. එච්. ලෝරන්ස් ගේ 'චැටර්ලි ආර්යාවගේ පෙම්වතා' ඔබ නිසැකයෙන් ම කියවා ඇති. චපල බවේ ප්‍රතිමූර්තිය සේ ගැනෙන චැටර්ලි ආර්යාවගේ චිත්ත චෛතසික අභ්‍යන්තරය කියවා ගන්නට ඔබට හැකි වී තිබේද? ජීවිතය නමැති මේ ගමනේ තවත් චැටර්ලි ආර්යාවන් කී දෙනෙක් පසු කොට ඔවුන්ගේ හෘදය අභ්‍යන්තරය නොකියවාම අප ගමන් කොට ඇත්ද? හදවතෙන් අසා බලන්න, ඔබටත් ඇගේ සිතිවිලි කුමන මොහොතක හෝ ඇති වී නැත් ද කියා. මට නම් අනන්ත වාරයක් ඇගේ මනෝභාව ඇති වී ඇති බව කියන්නට මා මැළි වන්නේ නැත.

වී. කරලෙන්කෝ ගේ 'අඳ වාදකයා' නම් සුප්‍රකට නවකතාව ගන්න. පෙත්රෝස් නම් අඳ වාදකයාගේ හෘදය අභ්‍යන්තරය කියවා ගන්නා ඔහුගේ ම අම්මාගේ හදවත ගැන ඔබේ අවධානය යොමු වූවා ද? පෙත්රෝස්ගේ හදවත කියවන අම්මා කොයිතරම් නම් වාරයක් රහසේ හඬා වැටෙන්නට ඇත් ද? පාවුලෝ කොයියෝගේ 'වෙරෝනිකා මැරෙන්න තීරණය කරයි' හි වෙරෝනිකාගේ හෘදය අභ්‍යන්තරය කියවා ගන්නට ඔබ උත්සාහ කර තිබේද? ඇගේ චංචල සිත ඒ තත්ත්වයට පත්වීමට බලපෑ හේතු සාධක ගැන මෙන්ම ඔබටත් එවැනි සිතිවිලි අනන්තවත් ඇති වූ බවට සාක්ෂි කුමටද?

මේ බොහෝ කෘතිවල එන චරිතවල අභ්‍යන්තරය වටහා ගැනීමට හෝ ඒ චරිතවල සංකීර්ණ බව වටහා ගන්නට අප කුඩා හෝ උත්සාහයක් ගෙන නැත. එහෙත් ඒ චරිත සියුම් ව කියැවූවා නම් ඔබට හැඟෙන යමක් කීමට මට අවසර දෙන්න;

ඒ චරිත හැම එකක්ම පාහේ අප දන්නා හඳුනන අයගේ චරිත පමණක් ම නොවෙයි; ඔබේ ම, මගේ ම චරිතවල ලක්ෂණ ද ඊට ඇතුළත් නොවන්නේ ද? එහෙත් අප පුරුදුව සිටින්නේ පිටස්තර ව සිට ඒවා දෙස බැලීමට මිස තමා හා ඒ ලක්ෂණ සංයෝග කරගැනීමට නොවේ. එවිට ඒ චරිතවල වන බොහෝ සූක්ෂ්ම දේ අපෙන් මඟ හැරී යන්නේය. ඒවා තමාගේ ම කියැවීම් බවට, තම අභ්‍යන්තර කියැවීම් බවට පත් නොවන්නේ ය.

බොහෝ පොත් කියවන අය සිටියත් ඒවා සිය ජීවිතය හා බද්ධ කරගන්නන් නැත්තේ එබැවිනි. ඔබට මට බොහෝ දේ මඟ හැරෙන්නේ ද එබැවිනි. ඔබ කියවන දහසකුත් දෑ අතර හෘදය සංවේදී කියැවීමකට යන්නට ඔබට හැකි නම් ලේඛනයේ රන්සුනු ඔබට හමු වෙනු නිසැකය.

sumudu.chathurani@lakehouse.lk

සිළුමිණ වාණිජ මණ්ඩලී මෙම පිටු එකතුව ව්‍යාපාරික ඔබ වෙනුවෙන්ම සැකසෙන විශේෂ අතිරේකයකි. ඔබේ දේශීය-විදේශීය ව්‍යාපාර පුවත්, ප්‍රවෘත්ති නිවේදන, ඡායාරූප සහ නවතම පුවත් අප වෙත යොමු කරන්න. සුළු, මධ්‍ය සහ මහා පරිමාණ ව්‍යාපාරික තොරතුරු සමාජයට විවර කිරීමට ඔබ පවත්වන මාධ්‍ය සාකච්ඡා සහ ගවේෂණ චාරිකාද යොමු කරන්නේ නම් මැනවි. සියලු ලිපි පහත ලිපිනයට පමණක් එවිය යුතු වේ. සිළුමිණ වාණිජ මණ්ඩලී, ලේක්හවුස් - කොළඹ 10.

හෙට ලොවට මඟ කියන ව්‍යාපාරික අත්වැල

දුරකථන : කර්තෘ - 011 2429261

දැන්වීම් කළමණාකරු - 011 2429429 දිගුව 351

විද්‍යුත් ලිපිනය : edmediaunit@gmail.com

වාණිජ මණ්ඩලී

සියැට් වෙතින් රුපියල් කෝටියක් වටිනා උපකරණ පරිත්‍යාගයක්

මෙරට කොවිඩ්-19 වසංගතය පොකුරක් ලෙස පැතිරීම වැළැක්වීමට වෙහෙසෙන ප්‍රධාන රජයේ ආයතන කිහිපයකට අත්‍යවශ්‍ය උපකරණ තොගයක් සියැට් කැළණි සමාගම විසින් පරිත්‍යාග කර ඇත. මෙරට ප්‍රමුඛතම ටයර් නිෂ්පාදකයා විසින් මෙරට ප්‍රධාන ආයතන හයකට මෙම පරිත්‍යාග කළ අතර ඒ වෙනුවෙන් වැය කළ මුදල රුපියල් මිලියන 10 ඉක්මවා යන බව සමාගම සඳහන් කරයි.

මෙම පරිත්‍යාගය සිදුකළ ආයතන හය අතරට ආසාදිත රෝග පිළිබඳ ජාතික ආයතනය, සෞඛ්‍ය අමාත්‍යාංශය, ශ්‍රී ජයවර්ධනපුර රජයේ රෝහල සහ එහි පශ්චාත් වෛද්‍ය පුහුණු මධ්‍යස්ථානය, රිජ්වේ ආර්යා ළමා රෝහල, බදුල්ල රජයේ රෝහල සහ ශ්‍රී ලංකා පොලීසිය අයත් වේ. මෙහි දී, සමාගම විසින් පරිත්‍යාග කළ උපකරණ අතරට ට්‍රාන්ස්පෝර්ට් වෙන්ටිලේටරයක්, ඉන්ෆියුෂන් පොම්ප දෙකක්, කන්ටිනුවස් පොසිටිව් එයාර්වේ ප්‍රෙෂර් (CPAP) යන්ත්‍රයක්, සක්ෂන් ඇපරටස් ඒකක දෙකක්, බෙඩ් පෑන් වොෂර් එකක්, රීයූසබල් සහ ඩිස්පෝසබල් පර්සනල් ප්‍රොටෙක්ෂන් (PPE) කට්ටල, රීයූසබල් පර්සනල් ප්‍රොටෙක්ෂන් ඕවරෝල්ස්, ෆේස් ෂීල්ඩ්ස්, පී.සී.ආර්. ටෙස්ට් කිට්, ආර්.එන්.ඒ. එක්ස්ට්‍රැක්ෂන් කිට් සහ වයිරල් ට්‍රාන්ස්පෝර්ට් මීඩියා ඇතුළත් වේ.

මීට අමතරව, සමාගම විසින් ආසාදිත රෝග ජාතික ආයතනයට සහයෝගය ලබාදෙමින් අලූත් වායු සමීකරණ ඒකකයක් සහ අලූත් සිවිලිමක් පරිත්‍යාග කළ අතර විදුලි පද්ධතියේ අලූත් වැඩියාවන් සිදුකළ අතර ඊට අමතරව පොලීසිය සඳහා වියලි සලාක බෙදාහැරීමක්ද සිදුකරන ලදී. මෙම පරිත්‍යාගයට අමතරව පසුගිය කාලයේ දී සියැට් කැළණි සමාගම විසින් මහනුවර පල්ලෙකැලේ ප්‍රදේශයේ ඇඳන් 106 කින් යුතු යුද හමුදා රෝහලක් ඉදිකිරීම සඳහා රුපියල් මිලියන 02 ක ආධාර මුදලක් ලබා දී තිබේ. පොදු ප්‍රවාහන ක්ෂේත්‍රයට සහයෝගය ලබාදෙමින් කොළඹ දිස්ත්‍රික්කයේ බස්රථ 350 ක් සඳහා එහි ගමන් කරන මගීන්ගේ ප්‍රයෝජනය වෙනුවෙන් අත් සේදුම් කාරක ලබාදීමටද සමාගම කටයුතු කළේය. සියැට් විසින් මාස තුනක කාලයක් සඳහා මෙම බස්රථවලට අත් සේදුම් කාරක දියර පරිත්‍යාග කළ අතර මෙම බස්රථ රියදුරන් සහ කොන්දොස්තරවරුන් සඳහා මාස තුනක කාලයක් පුද්ගලික ආරක්ෂිත කට්ටල ලබාදීමටද සමාගම කටයුතු කර ඇත. මෙම ආරක්ෂිත කට්ටලයක මුහුණු ආවරණ 06 ක්, අත් වැසුම් කට්ටල 06 ක් සහ පුද්ගලික අත් සේදුම්කාරක ඒකකයක් ඇතුළත් වේ.

කොවිඩ්-19 වසංගත තත්ත්වය වලක්වාගැනීම සඳහා සියැට් විසින් රාජ්‍ය ආයතනවලට ලබාදුන් පරිත්‍යාග කිහිපයක්.

LANKAQR ගෙවීම් ප්‍රවර්ධනයට කොමර්ෂල් බැංකුවේ ඉහළම දායකත්වයක්

LANKAQR යටතේ එළිදැක්වූ මෙරට පළමු ක්ෂණික ප්‍රතිචාර (QR) පදනම් කරගත් ඇප් පහසුකම වන ComBank Q+ දියත් කිරීම ඇතුළුව කොමර්ෂල් බැංකුව මෙරට ඩිජිටල් ගෙවීම් ක්‍රියාවලිය සවිබල ගැන්වීමට සිදුකර තිබෙන පුරෝගාමී මෙහෙවර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඇගයීමට ලක්කර තිබේ.

දිවයින පුරා මුදල් නොවන ගෙවීම් ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දියත් කළ වැඩසටහන ආරම්භක වැඩසටහන වූ 'මාතලේට LANKAQR' වැඩසටහනේ දී කොමර්ෂල් බැංකුවට මෙම ඇගයීම ප්‍රදානය කරන ලදී.

මහජනතාවට සහ ආර්ථිකයට ප්‍රතිලාභ ගෙන දෙන ඩිජිටල් ගෙවීම් පදනම් කරගත් LANKAQR QR කේතයන් ප්‍රවර්ධනය කිරීම සඳහා දියත් කර තිබෙන මෙම ප්‍රවර්ධන වැඩසටහන සඳහා කොමර්ෂල් බැංකුව සක්‍රිය සහයෝගයක් දක්වයි.

LANKAQR විසින් සහතික කළ ක්ෂණික ප්‍රතිචාර කේත පදනම් කරගත් මෙරට පළමු ඇප් පහසුකම වන කොමර්ෂල් බැංකුවේ Q+ විසින් වෙළෙඳුන්ට මෙන්ම පාරිභෝගිකයින්ට විකල්ප මාලාවක් ඉදිරිපත් කරයි. බැංකුව විසින් මෑතක දී එළිදැක්වූ සියලුම පොයින්ට් ඔෆ් සේල් (POS) යන්ත්‍රද ක්ෂණික ප්‍රතිචාර කේතයන්ට අනුකූල වන ලෙස නිර්මාණය කර ඇතැයි බැංකුව සඳහන් කරයි.

කොමර්ෂල් බැංකුවේ කාඩ්පත් මධ්‍යස්ථානයේ ප්‍රධානී, තුසිත සුරවීර මහතා බැංකුව වෙනුවෙන් පිරිනැමුණු ඇගයීමේ සම්මානය ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති, දේශමාන්‍ය මහාචාර්ය ඩබ්ලිව්.ඩී. ලක්ෂ්මන් මහතාගෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතලේ කළාපීය කාර්යාලයේ පැවැති උත්සවයේ දී ලබාගත් ආකාරයයි.

අයිඩියල් විදුලි උත්පාදක යන්ත්‍ර සඳහා අලෙවියෙන් පසු විශිෂ්ට සේවාවක්

අයිඩියල් සමූහ ව්‍යාපාරයේ අනුබද්ධ සමාගමක් මෙන්ම, මහින්ද්‍රා මෝටර් රථ, යතුරු පැදි හා බල මෙවලම් නිෂ්පාදන සඳහා ශ්‍රී ලංකාවේ එකම බෙදා හරින්නා වන අයිඩියල් මෝටර්ස්, අලෙවියෙන් පසු පාරිභෝගිකයන් හට සලසන විශිෂ්ට සේවාව හේතුවෙන් ඉතා කෙටි කලකින් වෙළෙඳ පොළ ආධිපත්‍යය නතු කර ගැනීමට සමත් වී තිබේ. 2017 වසරේදී අයිඩියල් මෝටර්ස් සමාගම, Mahindra Powerol ඩීසල් ජෙනරේටර් යන්ත්‍ර සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ බලයලත් එකම බෙදා හරින්නා බවට පත් විණි. එතැන් පටන් ශ්‍රී ලංකාවේ කුඩා හා මහා පරිමාණ සමාගම්වල බලශක්ති අවශ්‍යතා සපුරාලමින් Mahindra Powerol ශ්‍රී ලංකාවේ බලමෙවලම් වෙළෙඳ පොළ තුළ ප්‍රධාන තැනක් උසුලමින් සිටියි.

Mahindra Powerol ජෙනරේටරයක් යනු මහින්ද්‍රා එන්ජිමක් සමග ක්‍රියා කරන ප්‍රබල විදුලි උත්පාදක යන්ත්‍රයක් වන අතර එය අවම ඉන්ධන පරිභෝජනයක් සහිත, කල්පැවැත්ම අතින් ඉහළ මෙන්ම, ඝෝෂාකාරී ශබ්දයෙන්ද අවම ඉතාමත් කාර්යක්ෂම විදුලි උත්පාදන යන්ත්‍රයකි. දිවයින පුරා පිහිටා ඇති අයිඩියල් ෆස්ට් චොයිස් සේවා ස්ථාන 15 මගින්, දිවයිනේ සෑම අස්සක් මුල්ලක් නැරම පාරිභෝගිකයන් හට අලෙවියෙන් පසු කාර්යක්ෂම සේවා සපයයි. පාරිභෝගිකයින් මිලදී ගන්නා Mahindra Powerol ජෙනරේටර් යන්ත්‍රයක් සම්බන්ධයෙන්ම අලුත්වැඩියා සේවා ගැන හෝ අමතර කොටස් ගැන කරදර වීමට හෝ කාලය හා මුදල් නාස්ති කිරීමට අවශ්‍ය නොවන බව අයිඩියල් මෝටර්ස් සහතික කරයි.

ෆින්ටෙක් බලගන්වනය ආරම්භක ව්‍යාපාර (STARTUPS) 7ක් බිහි කරයි

HatchX යනු දකුණු ආසියාවේ ප්‍රථම සහ එකම fintech ආරම්භක බලගන්වන වැඩසටහන (startup accelerator programme) වන අතර, එය හැච් ආයතනය මූලිකත්වය ගෙන, ලංකන් ඒන්ජල් නෙට්වර්ක් හා එක්ව ෆෝර්ඩ් පදනමෙහි මූල්‍ය දායකත්වය යටතේ ක්‍රියාත්මක කරන වැඩසටහනකි. HatchX හි ප්‍රධාන අරමුණ වන්නේ ශ්‍රී ලංකාව තුළ fintech ආරම්භකයන් සඳහා ජාත්‍යන්තර වශයෙන් වර්ධනය වීමට අවශ්‍ය සම්පත් සහ සහයෝගය ලබා දීමයි. පසුගියදා මෙම වැඩසටහනේ පළමු අදියර සාර්ථක ලෙස නිමා වූයේ වැඩසටහනෙහි ප්‍රතිලාභ ලැබූ ප්‍රථම දේශීය ෆින්ටෙක් ආරම්භකයින් 7 දෙනෙකු කර්මාන්ත පාර්ශ්වකරුවන් සමඟ සම්බන්ධ වීමත් සමඟය. එම ආරම්භකයන් වනුයේ DirectPay, Smart Insure, Fipbox.com, HeliosP2P, iLoan, Algoredge, සහ OGO Pay යි.

මාස හතරක වැඩසටහනක් වන මෙහි විෂය මාලාව ව්‍යාපාර සහය, අධ්‍යාපනය සහ ආයෝජකයන්ගේ සූදානම යන ප්‍රාථමික අංශ ත්‍රිත්වයක් යටතේ ක්‍රියාත්මක වේ.

මෙම වැඩසටහනට සමගාමීව බැංකු, මූල්‍ය ආයතන සහ අනෙකුත් අත්‍යවශ්‍ය ජාලයන් සඳහා ප්‍රවේශ ද අදාළ පාර්ශ්වයන් වෙත ලබා දෙන ලදී. මේ හරහා ආරම්භක ව්‍යාපාරයන්ට කෙටි කාලයක් තුළදී නව ව්‍යාපාර අවස්ථා වෙත යොමු වෙමින් තම ව්‍යාපාර වර්ධනය කරගැනීමට විශාල සහයක් ලැබෙනු ඇත. මෙහිදී ඔවුන් සාම්ප්‍රදායික ක්‍රම අනුගමනය කළේ නම් එම ව්‍යාපාර සාර්ථකත්වයන් අත්පත් කර ගැනීම සඳහා යම් කිසි කාලයක් ගතවනු ඇත.

IIT රැකියා දිනය මෙවර අන්තර්ජාලය ඔස්සේ

තොරතුරු තාක්ෂණ ආයතනය (IIT) ඉතිහාසයේ ප්‍රථම වතාවට IIT Careers Day 2020 නමින් තොරතුරු තාක්ෂණ රැකියා දිනයක් අන්තර්ජාලය හරහා සාර්ථකව පැවැත්වීය. COVID-19 වසංගතය පැතිර යෑම නිසා ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරන ලද සෞඛ්‍ය හා ආරක්ෂක රෙගුලාසිවලට අනුකූලව මෙම උත්සවය අන්තර්ජාලය හරහා පැවැත්වීමට කටයුතු කෙරිණි. IIT Careers Day මගින් සෑම වසරක් පාසාම ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම සමාගම් සහ බහුජාතික සමාගම් ඇතුළු මෙරට ප්‍රමුඛතම තොරතුරු සන්නිවේදන ආයතන සහ තොරතුරු සන්නිවේදන නොවන සංවිධාන වලට මෙරට IIT උපාධි අපේක්ෂකයන් හමුවීමට අවස්ථාව උදාකර දෙයි. මෙම උත්සවය සංවිධානය කෙරෙනුයේ ඉහළ පෙළේ සමාගම් සමඟ IIT සිසුන්ට එකට එක්ව එම සමාගම් සමඟ කටයුතු කිරීමට, ඒවායේ සම්මුඛ පරීක්ෂණ සඳහා ඉදිරිපත් වීමට සහ IIT උපාධි වැඩසටහනේ කොටසක් වන වසරක සීමාවාසික පුහුණුව ලබා ගැනීමට වේදිකාවක් නිර්මාණය කිරීමේ අරමුණෙනි. මේ සඳහා සහභාගීවන සමාගම්වල පුළුල් විෂය ක්ෂේත්‍රයන් මැනවින් හඳුනාගෙන සිසුන්ට තම වෘත්තීය ආරම්භ කිරීම සඳහා තමන්ට සරිලන අකාරයේ කැමති සමාගමක් තෝරා ගැනීමේ අවස්ථාව හිමිවේ. එමගින් අදාළ සමාගම් වලට මෙරට හොඳම තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ හා ව්‍යාපාරික උපාධිධාරීන් සමඟ සම්මුඛ සාකච්ඡා පැවැත්වීමටත් සමාගම්වල විවිධ රැකියා අවශ්‍යතා සඳහා ගැළපෙන අපේක්ෂකයින් තෝරාගෙන ඔවුන් නියමාකාරයෙන් හසුරවා ගැනීමටත් මෙමගින් ඉඩ සැලසේ.

vivo V20, විශේෂාංග සමඟින් ළඟදීම වෙළඳපොලට

vivo V20 ස්මාර්ට් ජංගම දුරකථනය එදිනෙදා ජීවිතයේ ඡායාරූපකරණයට හුරුවී සිටින ඡායා රූප ලෝලීන් අමන්දානන්දයට පත් කරමින් ස්මාර්ට් ජංගම දුරකථන ක්ෂේත්‍රයේ ප්‍රමුඛතම camera විශේෂාංග සහ top-notch ultra-sleek AG Glass technology සමගින් හඳුන්වා දීමට නියමිතය. රටපුරා සිටින සෙල්ෆි ලෝලීන් සහ ඡායාරූප ලෝලීන් විශාල වශයෙන් ආකර්ෂණය කර ගනිමින් vivo V20, නවෝත්පාදනය කරන ලද camera සහ ස්මාර්ට් ජංගම දුරකථන නිර්මාණාත්මක සැලසුම් කෙරෙහි නව මානයක් විදහා දැක්වීමට අපේක්ෂා කෙරේ.නව්‍යතම camera විශේෂාංග වලින් සමන්විතව වෙළඳ පොළට පැමිණීමට නියමිත vivo V20 ස්මාර්ට් ජංගම දුරකථනය ඔබට Eye Autofocus විශේෂාංගය හඳුන්වා දෙයි. මේ පිළිබඳව වැඩි දුර අවධානය යොමු කිරීමේදී V20 ස්මාර්ට් ජංගම දුරකථනය smart photography ක්ෂේත්‍රයේ නව හැරවුම් ලක්ෂයක් සනිටුහන් කරනු ඇති බවට විශ්වාසය තැබිය හැකිය.

Different Discovery ක්‍රිකට් ඇකඩමිය උත්සවාකාරයෙන් විවෘත කෙරේ

කටුනායක අන්තර්ජාතික ගුවන්තොටුපොළට ආසන්නව පිහිටි Different Discovery ගෘහස්ථ ක්‍රිකට් ඇකඩමිය ප්‍රවීණ ක්‍රිකට් ක්‍රීඩකයන් වන අර්ජුන රණතුංග සහ චමින්ද වාස් යන අයගේ ප්‍රධානත්වයෙන් පසුගියදා උත්සවාකාරයෙන් විවෘත විය. සියලුම නවීන උපකරණ සහ පහසුකම්වලින් සමන්විත Different Discovery ක්‍රිකට් ඇකඩමියේ ප්‍රධාන අරමුණ ඉහළ කාර්ය සාධනයක් සහිත අති දක්ෂ ක්‍රිකට් ක්‍රීඩකයන් නිර්මාණය කිරීමය.

එහි ගෘහස්ථ ඇකඩමියේ ප්‍රධාන උපදේශක සහ පුහුණුකරු ලෙස ප්‍රවීණ ක්‍රිකට් ක්‍රීඩක, පන්දු යැවීමේ පුහුණුකරු අනූෂ සමරනායක මහතා කටයුතු කරයි.

එක් එක් වයස් කාණ්ඩ සඳහා හොඳම පුහුණු වැඩසටහන් නිර්මාණය කර ඇති මෙම ක්‍රිකට් ඇකඩමියේ පුහුණුකරුවන් අන්තර්ජාතික ක්‍රිකට් කවුන්සිලය පිළිගත් මට්ටමේ පුහුණුව ලැබූවන්ය. මෙරට හිටපු ප්‍රවීණ ක්‍රීඩකයෝ ආරාධිත පුහුණුකරුවන් ලෙස නිතිපතා ඇකඩමියට පැමිණෙති. ඔවුන්ගේ සාර්ථකත්වයේ රහස්, පිටියේදී ගන්නා ක්ෂණික තීන්දු, තීරණාත්මක අවස්ථා කළමණාකරණය ආදී පිටියේදී ප්‍රායෝගිකව අනුගමනය කළ යුතු සියලු උපක්‍රම මෙහිදී ඉගැන්වේ.

Different Discovery ක්‍රිකට් ඇකඩමිය සතුව ඉඩකඩ සහිත උද්‍යානයක්, වාහන නැවැත්වීමේ පහසුකම්, පුහුණු කාමරයක්, දෙමාපියන්ගේ විවේක කාමරයක්, නැරඹුම් බැල්කනියක් සහ අංග සම්පූර්ණ ශරීර සුවතා මධ්‍යස්ථානයක් ඇත.

ප්‍රවීණ පුහුණුකරුවන්ගේ උපදේශකත්වයෙන් පාපැදි සවාරි, විනෝද චාරිකා, මානසික ඒකාග්‍රතා භාවනා හා යෝග පුහුණුවද ලබා ගත හැකිය.

60 රස මිනිරුවන්

Uswatte

සිළුමිණ

උස්වත්ත කන්ෆෙක්ෂනරි වර්ක්ස් සමාගම අනුග්‍රහයෙනි

මොටාගෙදරගේ ගුරු ගෝල වෙනස - 75

ගුරු චිත්‍රය

ගෝල චිත්‍රය

චිත්‍ර ශිල්පී මොටාගෙදර වනිගරත්න මෙහි වම් පසින් ඇති චිත්‍රය නිර්මාණය කළේ ය. ඉන්පසු එබඳුම චිත්‍රයක් නිර්මාණය කරන්නැයි සිය ගෝලයකුට උපදෙස් දුන්නේය. එහෙත් ගෝලයා නිර්මාණය කළ චිත්‍රය ගුරුවරයාගේ චිත්‍රය හා සමාන යැයි බැලූ බැල්මට පෙනුණ ද එහි වෙනස්කම් දහයක් ඇත. ඔබ කළ යුත්තේ එම වෙනස්කම් දහය මොනවාදැයි අංක මගින් සලකුණු කිරීමයි. වෙනස්කම් සලකුණු කළ 'සිළුමිණ' පත්‍රයෙන් කපා ගත් ගෝලයාගේ චිත්‍ර සටහන තැපැල්පත්වල පමණක් අලවා උස්වත්ත ටිපිටිප් හෝ බිස්කට් ලාංඡන 2 ක් සමඟ පහත දැක්වෙන ලිපිනයට යොමු කරන්න. එක් පුද්ගලයකුට චිත්‍ර සටහන් එකකට වැඩි ගණනක් එවිය හැකි අතර ඒවා මුල් පිටපත් පමණක් විය යුතු ය. ජයග්‍රාහකයන්ට වටිනා මුදල් ත්‍යාග පිරිනැමේ. තැපැල්පත් නොවැම්බර් මස 03 වැනිදාට පෙර පහත ලිපිනයට එවිය යුතු ය. ගුරුගෝල වෙනස, 'සිළුමිණ', ලේක්හවුස්, කොළඹ 10 මෙතෙක් පැවැති ත්‍යාග රටාව වෙනුවට ජයග්‍රාහකයන්ට රුපියල් 2500 බැගින් ත්‍යාග 09 ක් පිරිනැමේ. උස්වත්ත කන්ෆෙක්ෂනරි වර්ක්ස් ලිමිටඩ් අනුග්‍රහයෙනි.

රුපියල් විසිපන්දහසක තෑගි

සම්බන්ධීකරණය - ගාමිණී රූපානන්ද (අනුරූ මාධ්‍ය සේවා)

පිළිතුරු එවීමේදී නම, නිවැරැදි ලිපිනය සහ දුරකතන අංකය සඳහන් කරන්න.

වරාය නගරයට ලැබුණු විශිෂ්ටතම ගෝලීය ව්‍යාපෘති සම්මානය

අගමැති මහින්ද රාජපක්ෂයන් කොළඹ වරාය නගර ව්‍යාපෘතිය නිරීක්ෂණය කළ අවස්ථාවේ එහි සකස් කළ ඇක්වා ගොල්ෆ් පිටියේදී ගොල්ෆ් ක්‍රීඩා කළ අවස්ථාව

වාණිජ මණ්ඩලී

කොළඹ වරාය නගර ව්‍යාපෘතියට ලොව විශිෂ්ටතම සම්මානයක්

● නිහාල් පී. අබේසිංහ

අපේ රටේ දැනට ක්‍රියාත්මක ලොකුම බහු කාර්ය ව්‍යාපෘතියක් වන වරාය නගර ව්‍යාපෘතියට පසුගියදා ලොව ගෝලීය විශිෂ්ටතම ව්‍යාපෘතියට හිමි සම්මානය හිමි විය. වරාය නගර ව්‍යාපෘතියට හරියටම වසර 6ක් පිරෙන දින මෙන්ම වරාය නගරය අගමැති මහින්ද රාජපක්ෂ මහතා නිරීක්ෂණය කළ දින ලැබුණු මේ සුවිශේෂි සම්මානය පිළිබඳව වරාය නගරය ඉදිකරන චයිනා හාබර් ඉංජිනේරු සමාගමේ මහ-ජන සම්බන්ධතා ප්‍රධානි කස්සප සෙනරත් මහතා සමඟ කළ සම්මුඛ සාකච්ඡාවකි මේ.

■ මේ කොළඹ වරාය නගරය කියන්නේ මොකක්ද?

කොළඹ වරාය නගරය යනු කොළඹ මධ්‍යම ව්‍යාපාරික දිස්ත්‍රික්කය පුළුල් කරන පරිදි ඉදි-කරනු ලබන නවතම නාගරික සංවර්ධන ව්‍යාපෘතියයි. ඇමරිකානු ඩොලර් බිලියන 1.4ක මූලික ආයෝජනයකින් යුතුව ඉදිකරනු ලබන මෙය සම්පූර්ණ වීමේදී ඇමරිකානු ඩොලර් බිලියන 15ක ආයෝජන රැගෙන එනු ඇතැයි අපේක්ෂා කරනවා. හෙක්ටයාර 269 ක ප්‍රදේ-ශයක් මුහුද ගොඩකර නිර්මාණය කරනු ලබන මෙය මූල්‍ය කලාපය, ජාත්‍යන්තර දිවයින, දූපත් දිවිය, මධ්‍යම උද්‍යාන වාසය සහ සැහැල්ලු යාත්‍රාංගණය වශයෙන් කලාප 5කින් සමන්විතයි. සම්පූර්ණ වූ පසුව කොළඹ වරාය නගරයේ ඉදි-කිරීම් වපසරිය වර්ග මීටර මිලියන 5.7 ක් පමණ වනු ඇතැයි අපේක්ෂා කරනවා. නවීන කාර්යාල, රෝහල්, අධ්‍යාපන ආයතන, හෝටල්, වරාය, සාප්පු සංකීර්ණ සහ ජීවන විලාසිතා ස්ථාන රැසකින් මෙය සමන්විතයි. නවීනතම තිරසාර නාගරික සැලසුම් සහ සංකල්ප භාවිතයෙන් ඉදි-වන මෙය දකුණු ආසියානු කලාපයේ වාණිජ කේන්ද්‍රස්ථානයක් බවට පත්වනු නිසැකයි.

■ මේ වරාය නගරයෙන් ශ්‍රී ලාංකිකයන්ට ලැබෙන ප්‍රධාන ප්‍රතිලාභ මොනවාද?

මෙහි විවිධ ව්‍යාපාර රැසක්, කාර්යාල රැසක් හා නිවාස යෝජනා ක්‍රම ආදිය බිහි වෙනවා. ගොඩ-නැගිලි 6000 ක් විතර ඉදිවෙනවා. නිවාස 40,000 ක් ඉදිවෙනවා. මේ සඳහා මුළු වියදම රුපියල් කෝටි 30,000 යි. ඒ මුදල වියදම් කරන්නේ චීන රජයෙන්. ප්‍රතිලාභ චීනයටත් අපිටත් ලැබෙනවා.

මේ වරාය නගරයේ මූල්‍ය කටයුතු, ව්‍යාපාර කටයුතු, පාරිසරික සංචාරක කටයුතු මගින් වස-රකට ශ්‍රී ලංකාවට රුපියල් කෝටි 236,000 ක් ඉපයීමට සැලසුම් කර තිබෙනවා. ඉන් රැකියා අවස්ථා 83,000 ක් පමණ ඇති වෙනවා.

ඊට අමතරව ගාලු මුවදොර පිටිය මෙන් තුන් ගුණයක් විශාල අක්කර 35 කින් යුතු හරිත මහ-ජන උද්‍යානයේ වැඩ අවසන් වෙමින් පවතිනවා. ඒ සමඟ මීටර් 1500 ක් දිග මීටර් 200 ක් පළල වෙරළ තීරයක් හදනවා. මේ වරාය නගරය නිසා ගෝල්ෆේස් පිටිය මුහුද පැත්තට මීටර් 50 ක් ලොකු වෙනවා. ඒ සියල්ල ලබන වසරෙදි මහජ-නතාවට විවෘත කරනවා.

■ සමහරු කියනවා මේක අපේ රටට අයිති නැති චීන කොලනියක් වේවි කියලා. ඒක ඇත්තද?

ඒක සම්පූර්ණ අසත්‍යයක්. මේක සම්පූර්ණ-යෙන් අයිති අපේ රටට. අපි තමයි මේ ඉඩමේ පරම අයිතිකරු. මේ ව්‍යාපෘතියට මුදල් වියදම් කරන්නේ චයිනා කොමියුනිකේෂන් කන්ස්ට්‍ර-ක්ෂන් සමාගම හරහා චීන වරාය ඉංජිනේරු සමාගමයි. ඒ වෙනුවෙන් මේ වරාය නගරයේ හෙක්ටයාර 116 ක ප්‍රමාණයක් 99 අවුරුදු බද්ද-කට ඒ සමාගමට ලබාදී තිබෙනවා. ඒ අනුව ඒ චීන සමාගමට හිමි ඉඩම් ඒ කාලය සඳහා වෙනත් සමාගමකට ආයෝජනය කිරීමේ ඉඩකඩ තිබෙනවා. වරාය නගරය් තවත් හෙක්ටයාර 62ක් අපේ රටට අයතියි. ඒවා බදු දීමට අයිතිය අපට තිබෙනවා. ඉදිරියේදි මුළු වරාය නගරයේ පාල-නය ශ්‍රී ලංකාවේ නාගරික සංවර්ධන අධිකාරියට ලැබෙනවා.

■ වරාය නගර ව්‍යාපෘතිය ලොව විවිධ ඇගැයුම්වලට ලක්වුණා. ලෝකයේ ලොකුම සම්මානයක් ඔබ ආයතනයට ලැබුණා. ඒ පිළිබ-ඳව විස්තර කළොත්.

ඔව්. අපේ වරාය නගර ව්‍යාපෘතියට විවිධ සම්මාන අගැයීම් රාශියක් ලැබී තිබෙනවා, එතෙර මෙතෙර ආයතනවලින්.

ඉන් ප්‍රධානතම හා ප්‍රමුඛතම සම්මානය වන්නේ 8 වැනි වාර්ෂික ENR ඉංජිනේරු සම්මාන උලෙ-ළේදි කොළඹ වරාය නගර ව්‍යාපෘතියට විශිෂ්ටතම ගෝලීය ව්‍යාපෘති සම්මා-නය ලැබීමයි.

ඒ අනුව අපේ රටට සමස්ත ලෝකයේම අවධානය අපේ රට වෙත යොමු කරවීමට ඉඩ ලැබුණා. ඉඩ ලැබුනා. ජාත්‍යන්තර මට්ටමේ ඉංජිනේරු හා ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සුවිශේෂ සගරාවක් වන ENR මගින් පැවැත්වූ ENR සම්මාන උලෙළදි අන්ත-ර්ජාලය මගින් මේ සම්මා-නය වරාය නගරයට පිරිනැ-මුවා. මෙය අපේ රටට ගෞරවයක් ලැබෙන අවස්ථාවක්.

ඇමෙරිකාවේ පළවන ජාත්‍යන්තර ඉංජි-නේරු සහ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සගරාවක් වන Engineering news Record (ENR) මගින් වසරින් වසර මේ ලෝකයේ සිදුවන ඉංජිනේරු හා ඉදිකිරීම් ව්‍යාපෘතිවලින් හොඳම ව්‍යාපෘති තෝරා සම්මාන ලබාදෙනවා. මෙවර 8 වැනි වරටයි මෙමසම්මාන උලෙළ පැවැත්වුණේ. මේ මාධ්‍ය සමූහය මගින් ලොව ඉදිකිරීම් ව්‍යාපෘති වරින් වර ශ්‍රේණිගත කිරීම් කරනවා.

■ මේ සම්මානය ලැබීම පිළිබඳ අපේ රටට තිබෙන සුවිශේෂ වැදගත්කම කුමක්ද?

මේ සම්මානය වැනි ජගත් මට්ටමේ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සම්මානයක් මෑත අතීතයේදී අපේ රටට ලැබී නැහැ.

මේ සම්මාන උලෙළ අවසන් තරගයට මහා-ද්වීප 6 ක රටවල් 21ක ව්‍යාපෘති 30ක් එක්වුණා. ඉන් ඒ ව්‍යාපෘති 29ක් පරදා එහි ප්‍රථම ස්ථාන-යට අපේ රටේ වරාය නගර ව්‍යාපෘතියට ලැබීමයි මෙහි අපේ රටට ඇති සුවිශේෂි වැදගත්කම.

විශිෂ්ටතම ගෝලීය ව්‍යාපෘති සම්මානය අපට ලැබුණේ ඉහළම සැලසුම් හා ඉදිකිරීම් ශිල්ප ක්‍රම නිසයි

2017 හා 2018 දීත් පිටරටවලින් අපට රන් හා රිදී සම්මාන ලැබුණා

වරාය නගර ව්‍යාපෘති සමාගමේ (CHEC) මහජන සම්බන්ධතා ප්‍රධානි කස්සප සෙනරත්

■ මේ සම්මානය අපට ලැබුණේ කවදාද? එහි සුවි-ශේෂි වටිනාකමක් තිබෙනවාද?

ඒ සම්මානය ලැබුණු දිනයත් ඉතා වැදගත්. මෙය අපට ලැබුණේ හිටපු ජනපති වත්මන් අගමැති මහින්ද රාජ-පක්ෂ මහතා මේ වරාය නගරය ව්‍යාපෘතිය ආරම්භ කර වසර 6ක් සපිරිණු දිනයේදීමයි. එනම් සැප්තැම්බර් 17 වීම විශේෂයි.

ඒ වගේම එදිනම තවත් විශේෂ සිදුවීමක් ද සිදුවුණා. ඒ අගමැති මහින්ද රාජපක්ෂයන් වරාය නගර ව්‍යාපෘතිය නැරඹීමට ආවේත් පසුගිය සැප්තැම්බර් 17 වැනිදා.

මෑත කාලීනව ඉංජිනේරු හා ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ශ්‍රී ලාංකීය ව්‍යාපෘතියක් ලබාගත් ඉහළම ගෝලීය ඇගැයීම මෙයයි. ඒ සියල්ල ලැබුණේ මේ කොළඹ වරාය නගර ව්‍යාපෘතිය මෙහෙයවන චීන හාබර් ඉංජිනේරු සමාගමේ (CHEC) හා චීන සන්නිවේදන ඉදිකිරීම් සමා-ගමේ සුවිශේෂි සැලසුම් හා ඉහළම ප්‍රමිතිගත ඉදිකිරීම් කාර්යක්ෂමතාව නිසයි.

■ එම සම්මානය ලබාදීමේදි සලකා බැලූ සුවි-ශේෂ දක්ෂතා මොනවාද?

මෙම වරාය නගර ව්‍යාපෘතිය මෙම තරග-යට ඉදිරිපත් කරනු ලැබුවේ සීමාසහිත චයිනා හාබර් ඉංජිනේරු සමාගම (CHEC) විසින්. 2019 ජනවාරි සිට 2020 අප්‍රේල් කාලය තුළ ඉදිකිරීම් අවසන් කළ ව්‍යාපෘති තමයි මේකට ඉදිරිපත් කරන්න පුළුවන් වූයේ. ඒ අනුව අපි මෙහිදී ඉදිරිපත් කළේ වරාය නගරයේ පළ-වෙනි අදියරේ ඉදිකිරීම් පිළිබඳව පමණයි.

මෙම සම්මානය ලබාදීමේදී ගෝලීය හොඳම ව්‍යාපෘති හඳුනා ගැනීම් හා පසුගිය වසර තුළ සැලසුම් සහගත ඉදිකිරීම් කාර්ය-යට පිටුපස සිටින කණ්ඩායම් හඳුනා ගනිමින් ඒ අනුව ඔවුන් අගැයීම කාර්යයට ලක්කරනු ලබනවා.

මේ සම්මානය මෙරට ඉංජිනේරු හා ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ව්‍යාපෘතියක් වෙනුවෙන් ලැබුණු ඉහළම ගෝලීය අගැයීමයි

එම අදාළ තරගවල රීතියක් වූයේ අදාළ ව්‍යාපෘතියේ අවම වශ-යෙන් එක් සමාගමක් මෙහි මව් සමාගමෙන් පිටත රටක් නියෝ-ජනය විය යුතුය යන්නයි. ඒ අනුව තමයි (CHEC) සමාගම මෙම තරග-යට වරාය නගර ව්‍යාපෘති ඉදිරිපත් කළේ.

■ කවුද මේ සුවිශේෂි තරගය විනිශ්චය කළේ?

මෙම තරගය සංවිධාන කළ *Engineering News - Record (ENR)* සගරාව ඇමරිකා එක්සත් ජනපදය කේන්ද්‍ර කරගත් ප්‍රමුඛ මාධ්‍ය ජාලයක් වන අතර තරගය ලෝකයේ පිළිගත් ජාත්‍යන්තර සංවිධානවල නියෝජිත විනිශ්චය මණ්ඩලයකගේ ස්වාධීන අධීක්ෂණයට ලක්වුණා. *Hatfield* සමූහයේ *Erleen Hatfield, Magnusson klemencic Associates* හි *Jon Magnusson, Miyamoto International* හි *kit Miyamoto, PAE* හී *Allan Montpellier, Mott MacDonald* හි *Patrick Natale, Strategic Program Management LLC* හි *Bob Prieto, Yan Winkle Consulting* හි *Hans Van Winkle* සහ *Metrolinx* ආයතනයේ *peter Zuk* යන විශේෂඥයන් පිරිස-කගේ මූලිකත්වයෙන් මෙම සම්මාන තරගාවලිය විනිශ්චය කළා. මෙම අධීක්ෂණ කාර්යයේදී ආර-ක්ෂිත කාර්ය සාධනය, නවෝත්පාදන, අභියෝග සහ සැලසුම් ඉදිකිරීම් කාර්යයේ ගුණාත්මක බව මෙන්ම ගෝලීය ව්‍යාපෘති කණ්ඩායම්වල විවිධ-ත්වය සහ ඔවුනගේ සහයෝගීතාවය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරනු ලැබුවා. මෙම ව්‍යාපාතිය මගින් දේශීය ප්‍රජාවට සහ / හෝ දේශීය ඉදිකිරීම් කර්මාන්තයට ලබාදෙන ප්‍රති-ලාභ සම්බන්ධයෙන්ද විනිසුරුවරුන්ගේ අවධා-නය මෙහිදී යොමුවුණා.

■ වරාය නගර ව්‍යාපෘතියට මීට පෙරත් සම්මාන ලැබී තිබෙනවාද?

ඔව් අපට පෙර අපට සිංගප්පූරුවෙන් රිදී සම්මානයත් ලැබුණා. 2018 දි චීනයේදි රන් සම්මානයක් ලැබුනා. මේ සේරම අපිට ලැබුණේ අප චයිනා හාබර් ඉංජිනේරු සමාගමේ (CHEC) හි ප්‍රමිතිගත ඉදිකිරීම් හා කාර්යක්ෂම සේවක පරිපාලනය නිසා බවයි මගේ හැඟීම.

2017 වසරේදී *Singapore Landscape Architecture* සම්මාන උලෙළේදී වරාය නගර ව්‍යාපෘතියේ ප්‍රධාන සැලැස්ම *Master Planning* සඳහා වූ රිදී සම්මානය අපට ලැබුණා. 2018 වසර තුළදී චීනයේ පැවැත්වුණු *Yuan Ye Urban Design* සම්මාන උලෙළේ රන් සම්මානයක් ලැබුණා.

International Federation of Landscape Architects මගින් ක්‍රියාත්මක කරනු ලබන *AAPME* සම්මාන උලෙළේදී ද විශ්ලේෂණ සහ ප්‍රධාන සැලසුම්ක-රණය සම්බන්ධයෙන් ද කොළම වරාය නගර ව්‍යාපෘතිය ගෞරව ඇගැයීමට ලක්වුණා.

මෙම සම්මාන ලැබුණු ව්‍යාපෘතිය මෙහෙය වන්නේ චයිනා හාබර් ඉංජිනේරු සමාගමයි. එය චීන සන්නිවේදන ඉදිකිරීම් සමාගමේ *(CCCC)* පූර්ණ හිමිකාරිත්වය දරන සමගම වන අතර, එය 2020 වසරේ *ENR* හි ඉහළම ජාත්‍යන්තර කොන්ත්‍රාත් කරුවන්ගේ ලැයිස්තුවේ 04 වන ස්ථානය දිනා-ගනු ලැබූ සමාගම වෙයි.

ඉස්සර මේ ව්‍යාපෘතිය පිළිබඳව සමහරුන් බොරු දුර්මත ප්‍රචාරය කළා. නමුත් මේ ආකාර-යෙන් ලෝක පූජිත සුවිශේෂී ආයතනවලින් අපේ ව්‍යාපෘතියට දිගින් දිගටම සම්මාන හා ඇගයීම් ලැබීම නිසා මේ ව්‍යාපෘතියේ වටිනාකම, වැද-ගත්කම හා රටේ ආර්ථිකයට වන ඵලදායීතාව රටේ ජනතාවට බෙහෙවින් අවබෝධ වේවි. මේ නිසා මේ ව්‍යාපාතියේ ඉදිරි වැඩකටයුතුව-ලට රටේ සියලු දෙනාගේ සහයෝගය නොඅඩුව ලැබෙනු ඇතැයි අපි අපේක්ෂා කරනවා.

තොරතුරු සන්නිවේදනයේ ප්‍රමුඛයා ශ්‍රී ලංකා ටෙලිකොම්

● චන්දිමා එදිරිමාන්න

දකුණු ආසියාවේ සන්නිවේදන සේවා දියු-ණුව අතින් ඉහළින්ම සිටින රටක් ලෙස ශ්‍රී ලංකාව හැඳින්විය හැකියි. දුරකථන සහ සන්නිවේදන ජාලාවල වේගය අතිනුත්, ව්‍යාප්තිය අතිනුත් දකුණු ආසියාවේ අනෙක් රටවල් සියල්ලම සිටින්නේ මෙරටට බොහෝ පිටුපසින් වන අතර දශක ගණනාවක් පුරා සන්නිවේදන තාක්ෂණය අතින් දකුණු ආසියා කලාපයේ ඉදිරියෙන්ම සිටින රට ලෙස එම ජයග්‍රහණය තහවුරු කර ගැනීමට කටයුතු කරත්දී ඒ සඳහා දායක වූ ප්‍රධානතම පාර්ශවකරුවෙකු වන්නේ ශ්‍රී ලංකාවේ ජාතික තොරතුරු හා සන්නිවේදන ප්‍රමුඛයා ලෙස පිළිගැ-නෙන ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමයි.

මේ වන විට ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම ඩිජිටල් සේවා සැපයුම්කරු වන්නේද ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයයි

වසර 160ට වැඩි කාලයක් මෙරට ජනතාවට අවශ්‍ය දුරකථන හා සන්නිවේදන පහසුකම් සැලසුවා

වසර 160ට වැඩි කාලයක් මෙරට ජනතා-වට අවශ්‍ය දුරකථන හා සන්නිවේදන පහසු-කම් සලසමින් ගෘහස්ථ පාරිභෝගිකයාගේ සිට රාජ්‍ය ආයතන, පෞද්ගලික ව්‍යාපාර හා සමාගම්, රාජ්‍ය නොවන හා සමාජ සුබ සාධන සංවිධාන, බහු ජාතික සමාගම් ඇතුළුව මෙරට සමාජයේ සෑම ක්ෂේත්‍රයකම මෙන්ම සෑම තරාතිරමකම නිවාස, ආයතන, ව්‍යාපාර හා සංවිධාන වෙත නවීන සන්නිවේදන පහසුකම් ලබාදෙමින් මිලි-යන 1.6කට වැඩි පාරිභෝගික ප්‍රජාවකට විශිෂ්ට හා කාර්යක්ෂම සන්නිවේදන සේවාවක් සැප-යීමට ශ්‍රී ලංකා ටෙලිකොම් සමත්ව ඇති අතර දශක ගණනාවක් පුරා මෙරට ජන සමාජයේ ස්ථාවර දුරකථන අවශ්‍යතා සපුරාලීමට ඉතා උනන්දුවෙන් මෙන්ම කැපවීමෙන්ද කටයුතු කළ එම සමාගම මේ වන විට ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම ඩිජිටල් සේවා සැපයුම්කරු බවටද පත්ව ඇත. ඒ අනුව පාරිභෝගික අවශ්‍යතා හඳුනාගත් ඩිජිටල් සේවා සැපයුම්කරුවකු බවට පත් වූ ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම විදුලි සන්දේශ සේවා වලින් ඔබ්බට ගොස් ඩිජිටල් ජීවන රටාවකට සරිලන විවිධාකාර සේවාවන් සහ විසඳුම් ලබා දීමට කටයුතු යොදා තිබීම ප්‍රශංසනීය වේ. මේ වන විට සිය ජයග්‍රාහී ගමන් මගේ සුවිශේෂ සංධි-ස්ථානයක් වෙත ලගා වී ඇති ටෙලිකොම් ආය-තනය රැහැන් රහිතව 5G බ්‍රෝඩ්බෑන්ඩ් පහසුකම ශ්‍රී ලාංකික ජනතාව වෙත හඳුන්වා දීමටද සමත් වී ඇත.

වේගවත්, සුපැහැදිලි හා අඛණ්ඩ වීඩියෝ සේවා ලබා ගැනීමට ගෘහස්ථ පාරිභෝගික-යන් පවා උනන්දු වන අතර ඔවුන්ගේ දුරක-ථන, ලැප්ටොප්, ටැබ්ලට් සහ වෙනත් ස්මාර්ට් උපාංග සඳහා වේගවත් අන්තර්ජාල පහසුකම් ඉතා විශිෂ්ට ලෙස සපුරාලීමට 5G සේවාවත් සමග අවස්ථාව උදා වේ. රැහැන් රහිත 1.7Gbps වේගයකින් සමන්විත අධිවේගී 5G බ්‍රෝඩ්බෑන්ඩ් සේවාව නිවාසවලට මෙන්ම ව්‍යාපාර වලටද ඉතාමත් ආකර්ෂණීය සේවාවක් වනු ඇත.

ස්ථාවර හා ජංගම දුරකථන සේවා, බ්‍රෝඩ්බෑන්ඩ් , දත්ත (Data)සේවා, PEO TV, Cloud සේවා සහ විවිධාකාර පාරිභෝගිකයින්ට ජාලකරණ විසඳුම් ආවරණය වන තොරතුරු සන්නිවේදන තාක්ෂණ විසඳුම් රාශියක් සිය ගනුදෙනුකරුවන් වෙත විධිමත්ව හා අඛණ්ඩව සපයන ශ්‍රී ලංකා ටෙලිකොම් සමූහයේ ප්‍රධාන උපායමාර්ගික අර-මුණු වලින් එකක් වන්නේ බ්‍රෝඩ්බෑන්ඩ් පාදක කරගත් පාරිභෝගික හා ව්‍යවසාය සේවාවන් ඊළඟ පරම්පරාවේ ජාලය (එන්ජීඑන්) සහ ජාතික පසුබිම් ජාලය (එන්බීඑන්) හරහා පුළුල් කිරී-මයි. මෙම ප්‍රයත්නයන් සඳහා ඔප්ටිකල් ෆයිබර්, ADSL 2 +, VDSL 2, වාහක-ශ්‍රේණියේ වයි-ෆයි සහ ස්ථාවර හා ජංගම 4G, LTE තාක්ෂණයන් ඇතුළු තාක්ෂණයන් රාශියක් ඇතුළත් වේ. අති නවීන ගෝලීය සේවාවන් සැපයීම සඳහා සමා-ගම සිය අන්තර්ජාතික සබ්මැරීන් කේබල් ජාල භාවිතා කරමින් ටෙලිකොම් ක්ෂේත්‍රයේ ප්‍රධාන ගෝලීය ක්‍රීඩකයකු ලෙසද සිය ස්ථානය තහවුරු කර ගැනීමට සමත්කම් දක්වා තිබීමද විශේෂ-යෙන් ඇගයිය යුතුම කාරණාවකි.

එපමණක් නොව සාම්ප්‍රදායික රූපවාහිනී අත්දැකීම විප්ලවීය වෙනසකට බඳුන් කරමින් ඩිජිටල් තත්ත්වයේ රූප, Time Shifted TV, Rewind TV to play, pause live TV සහ Video on Demand වැනි පහසුකම් රැසකින් පොහොසත් 'පියෝ ටීවී" මෙරට ජනතාව වෙත හඳුන්වා දෙනු ලැබුවේද ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම වන අතර මේ වන විට ඉතා ජනප්‍රිය එකී පියෝ ටීවී සේවාව මගින් දෙස්, විදෙස් රූපවාහිනී සේවාවන් රැසක් සම්බන්ධ කර ගනිමින් ජනප්‍රිය, නිර්මාණාත්මක මෙන්ම හොඳම රූපවාහිනී වැඩසටහන් රැසක්ම මෙරට ප්‍රේක්ෂක ජනතාව වෙනුවෙන් විකාශය කිරීමටද කටයුතු යොදා තිබේ. රූපවාහිනී නාලිකා 20 ක් විකාශය කරමින් 2008 වසරේදී ආරම්භ වූ මෙම පියෝ ටීවී සේවාවට මේ වනවිට නාලිකා 200කටත් වැඩි ප්‍රමාණයක් සම්බන්ධ වී සිටියි. මීට අමතරව SLT Services,SLT Campus, digitel Services යනුවෙන් තවත් සමාගම් කීපයක්ම ටෙලිකොම් සමාගමට අනුබද්ධව කට-යුතු කරන අතර මෙරට අධ්‍යාපන ක්ෂේත්‍රයේ විප්ලවීය වෙනසක් සිදු කිරීමට ශ්‍රී ලංකා ටෙලි-කොම් පූර්ණ අනුබද්ධ SLT Campus වෙත හැකියාව ලැබී ඇත.

ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයේ සභාපති රොහාන් ප්‍රනාන්දු

5G බ්‍රෝඩ්බෑන්ඩ් පහසුකම ශ්‍රී ලාංකේය ජනතාව වෙත හඳුන්වා දුන්නා

"පියෝ ටීවී" මෙරට ජනතාව වෙත හඳුන්වා දෙනු ලැබුවේද ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමයි

ස්ථාවර දුරකථන ක්ෂේත්‍රයේ ප්‍රමුඛයා ලෙස ශ්‍රී ලංකා ටෙලිකොම් කටයුතු කරත්දී ජංගම දුරක-ථන සන්නිවේදන ක්ෂේත්‍රයේද විප්ලවීය වෙන-සක් සිදු කිරීමට එහි අනුබද්ධ මොබිටෙල් ආයතන-යටද හැකියාව ලැබී ඇත. ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමේ පූර්ණ අනුබද්ධිත සමාගමක් වන මොබිටෙල් (පුද්) සමාගම ජංගම දුරකථන සේවා, අධිවේගී බ්‍රෝඩ්බෑන්ඩ් සහ අගය එකතු කළ සේවා රැසකින් පොහොසත් ජංගම දුරකථන සන්නිවේදන සමාගමක් ලෙස එම ජංගම දුරක-ථන සේවා පහසුකම් අත්විඳින ජනතාවගේ ආද-රය හා ගෞරවයද හිමි කර ගෙන තිබේ.

මොබිටෙල් ශ්‍රී ලංකාවේ ජාතික ජංගම දුරක-ථන ජාලයයි. ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය විසින් 2002දී මොබිටෙල් හී පරිපාලන කටයුතු බාර ගැනීමත් සමගම ශීඝ්‍රයෙන් වර්ධනය වූ මොබිටෙල් මේ වන විට ශ්‍රී ලංකාවේ සන්නි-වේදන ඉතිහාසය තුළ විප්ලවීය වෙනසක් සිදු කරනු ලැබ තිබේ. එමෙන්ම දකුණු ආසියානු කලාපය තුල ප්‍රථම වරට 3.5G HSPA තාක්ෂණය එළිදැක්වීමේ ගෞරවය හිමි වන්නේ ද මොබිටෙල් ජාලයටයි.

මේ වන විට ශ්‍රී ලංකාවේ ඇති එකම 4.5G / 4G + ජංගම දුරකථන ජාලය ලෙස මොබිටෙල් 300 Mbps දක්වා වේගවත් වේගයක් ලබා දෙන අස-මසම බ්‍රෝඩ්බෑන්ඩ් ජාල අත්දැකීමක් ලබා දෙන අතර එය ශ්‍රී ලංකාවේ වේගවත්ම ජංගම දුරකථන ජාලය ලෙස ඔක්ලා ස්පීඩ්ටෙස්ට් සම්මාන මගින් පිළිගෙන තිබීමද ඔවුන් ලබා ගත් සුවිශේෂ ඇග-යුමක් ලෙස සඳහන් කර සිටීම වටී.

මේ වන විට ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයේ සභාපතිවරයා ලෙස කටයුතු කරනුයේ ප්‍රකට ව්‍යාපාරිකයෙකු වන රොහාන් ප්‍රනාන්දු යි. විධා-යක අධ්‍යක්ෂ හා ප්‍රධාන විධායක නිලධාරී ලෙස ලලිත් සෙනෙවිරත්නත්, සෙසු අධ්‍යක්ෂවරුන් ලෙස ජනාධිපති නීතිඥ මොහාන් වීරකෝන්, ඉංජිනේරු රංජිත් රුබසිංහ, මහා භාණ්ඩාගාරය නියෝජනය කරමින් ආනන්ද සෙනෙවිරත්න යන අයත්, වැඩිම කොටස් අයිතිය හිමි මැලේසි-යානු මැක්සීස් ටෙලිකොම් සමාගම නියෝජනය කරමින් අධ්‍යක්ෂවරු තිදෙනෙකුත් ටෙලිකොම් ආයතනය නව දිසාවකට ගෙන යෑම සඳහා ඇප කැප වෙමින් ඒ සඳහා යෝධ ශක්තියක් හා ධෛර්යයක් ලබා දෙමින් කටයුතු කරන බවද විශේෂයෙන් සඳහන් කළ යුතු වේ.

ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය නිරතුරු-වම වර්ධනය වන ආයතනයක් බව ටෙලිකොම් සභාපති රොහාන් ප්‍රනාන්දු සඳහන් කළේය අවුරුදු 168 ක ඉතිහාසයක් ඇති ශ්‍රී ලංකා ටෙලි-කොම් ආයතනය ආරම්භ වී ඇත්තේ මුලින්ම පටන් ගත්තෙ තැපැල් හා විදුලි සන්දේශ දෙපා-ර්තමේන්තුව හැටියටයි. කාලයාගේ ඇවෑමෙන් 1990 දශකයේ අග භාගය වන විට එහි 40% ක කොටස් ජපන් නිපොන් ටෙලිකොම් ආයතනය විසින් මිලදී අර ගෙන ශ්‍රී ලංකා ටෙලිකොම් නව යුගය ආරම්භ වුණා. මේ වන විට 40% කොටස් මැලේසියාවේ මැක්සීස් ටෙලිකොම් ආයතනය විසින් මිලදී ගෙන තිබෙනවා. තවත් 5% පමණ කොටස් කොළඹ කොටස් වෙළඳපොළ සතුව පවතිනවා.

ලෝකයේ වෙනස්වීම් සමඟ වෙනස් රටක් ලෙස අප ඉදිරියට යා යුතුයි. ලෝකයේ සිදු වන වෙනස් වීම් වලට පරිවර්තනය වන විදියට අපි අනුගත වුණේ නැතිනම් අපිට රටක් ලෙස මෙන්ම ජාතියක් හැටියටත් එක තැන පල් වීමට සිදු වෙනවා. ඒ නිසා සෑම විටම නව වෙනස් කම් වලින් හැඩවී අති නවීන තාක්ෂණය නිර-තුරුවම සිය මෙහෙයුම් කටයුතු සඳහා යොදා ගත් ආයතනයක් ලෙස අප අපේ රට හා ජාතිය වෙනුවෙන් සුවිශේෂී සේවාවක් සිදු කර ඇති බව ඉතාම ආඩම්බරයෙන් යුතුව සඳහන් කළ හැකියි.

දුරකථන සේවා සඳහා අවශ්‍ය රැහැන් සඳහා අතීතයේදී තඹ කම්බි භාවිත කළත් මේ වන විට ෆයිබර් ඔප්ටික් තාක්ෂණය හරහා කටයුතු කරන්නට ටෙලිකොම් ආයතනය පියවර ගෙන තිබෙනවා. රුපියල් බිලියන 30ක පමණ අති විශාල මුදලක් එම කටයුත්ත වෙනුවෙන් ටෙලි-කොම් ආයතනය මේ වන විටත් නිර්ලෝභීව ආයෝජනය කර හමාරයි.

ඇත්ත වශයෙන්ම ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතන-නය නිරතුරුවම වර්ධනය වන ආයතනයක්. මේ වන විට දිවයින පුරාම මිලියන 1.5 SLT ග්‍රාහක-යින් පිරිසක් ටෙලිකොම් සමඟ එක්ව සිටින අතර බ්‍රෝඩ්බෑන්ඩ් ග්‍රාහකයින් හාරලක්ෂ අනූ දහසක් වෙනවා. මොබිටෙල් ජංගම දුරකථන සන්නි-වේදන පහසුකම් අත් විඳින ග්‍රාහකයන් පිරිස මිලියන 7.5 ක්. මීට අමතරව SLT Services, SLT Campus, digitel Services යනුවෙන් තවත් සමාගම් කීපයක්ම ටෙලිකොම් සමාගමට අනුබද්ධව කටයුතු කරන අතර මෙරට අධ්‍යාපන ක්ෂේත්‍රයේ විප්ලවීය වෙනසක් සිදු කිරීමට SLT Campus වෙත හැකියාව ලැබෙනු ඇති.

ලිට්රෝ ගෑස් ගෘහස්ථ වායු දූෂණය වැළැක්වීමට දායක වෙයි

සෑම වසරකම මිලියන 4 ක ජනතාවක් ගෘහස්ථ වායු දූෂණයයන් මිය යන බව ලෝක LPG සංගමයේ (WLPGA) දත්තයන් පෙන්වා දෙයි.

ශ්‍රී ලංකායේ LPG බලශක්ති කයිත්‍රයේ ප්‍රමුඛයා වන ලියරෝ ගෑස් ආහාර පිසීම සඳහා පිරිසිදු බලශක්තිය භාවිත කිරීමේ වැදගත්කම පිළිබඳව වැදගත් මෙහෙවරක් ඉටු කිරීමට කවදත් බැඳී සිටියි. වතුකරයේ සහ ග්‍රාමීය ප්‍රදේශවල ජනතාවට LPG මිලදී ගැනීයේ අවස්ථාව වැඩි කරමින් ගෘහස්ත වායු දූෂණය වළක්වාලීම හා ඒ ආශ්‍රිතව හට ගන්නා නොයෙකුත් සංකූලතා ඇතිවීයේ අවදානම අවම කිරීමට ලිට්රෝ ගෑස් සමාගම අවධානය යයාමු කර ඇත.

එක්සත් ජාතීන්යේ සංගමය නියම කළ පිරිසිදු වාතය සහ ඕසෝන් සථරය සුරැකීමේ ජාත්‍යන්තර දිනය සැප්තැම්බර් මස සැමරු අතර පිරිසිදු බලශක්තිය භාවිත කිරීමට වැඩි වශයෙන් යොමුවීම අප සියලු දෙනාගේම වගකීමයි.

පාරිසරික තිරසාරභාවය සඳහා ගෝලීය වශයයන් පිළිගත් මූලධර්ම අනුගමනය කරන ලිට්රෝ ගෑස් පාරිසරික කළමනාකරණ පේධිය සඳහා පරිසරයට සිදුවන බලපෑම අවම කරන ආයතනවලට ජාත්‍යන්තර වශයෙන් ලබා දෙන කීර්තිමත් ISO 14001: 2015 සහතිකයද හිමි කර ගෙන ඇත.

Huawei Online ක්‍රමයට

Huawei සමාගම විසින් online වැඩසටහනක් හරහා දේශීය වෙළඳ පොළ ඉලක්ක කරගනිමින් නිෂ්පාදන පෙළක් හඳුන්වා දීම පසුගියදා සිදු කරන ලදී. විශාල ප්‍රේක්ෂක පිරිසකගේ සහභාගීත්වයකින් අවසන් වුණු මෙම නිෂ්පාදන දියත් කිරීමේ online වැඩසටහන වෙනස්ම ක්‍රම වේදයකට අනුව සිදු කිරීමට Huawei සමාගම සමත් විය.

මෙහිදී වෙළඳ පොළට විශිෂ්ට තාක්ෂණික විශේෂාංග රැසකින් සමන්විත wearables මාදිලි කිහිපයක් වන Huawei Watch FIT, Huawei Freebuds 3i සහ Huawei Watch GT2e හඳුන්වා දීම සිදු කරන ලදී. මෙම උපාංග හඳුන්වා දීම සඳහා Huawei සමාගම විසින් ශ්‍රී ලංකාවේ විශාලතම සහ නවීනතම තාක්ෂණික පහසුකම් රැසකින් සමන්විත ශරීර සුවතා හා යෝග්‍යතා මධ්‍යස්ථානයක් වන Body Doc සහ අන්තර්ජාලය හරහා යෝග්‍යතා මධ්‍යස්ථාන පිළිබඳ විස්තර සපයන ප්‍රසිද්ධ Application වන Fitzky හා අත්වැල් බැඳ ගෙන ඇත.

INSEE නව ප්‍රධාන විධායක නිලධාරී තනතුරට ගුස්ටාවෝ නවාරෝ

INSEE සිමෙන්ති සමාගමේ මෙරට නව ප්‍රධාන විධායක නිලධාරී තනතුරට ගුස්ටාවෝ නවාරෝ පත් කර තිබේ. ඔහුට පෙර INSEE සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී තනතුරට වශයෙන් වසර 3 1/2ක් කටයුතු කළ නන්දන ඒකනායක එම කාලය තුළ අනපේක්ෂිත වෙළෙඳපොළ තත්ත්වයන් හා විවිධ සමාජ, ආර්ථික අභියෝග හමුවේ ඉතාමත් සාර්ථකව සමාගම මෙහෙයවීමට සමත් වූ අතර, ඉදිරියටත් අධ්‍යක්ෂ මණ්ඩල සභාපතිවරයා ලෙස ඔහු තම සේවය සමාගමට ලබාදෙනු ඇත.

මීට පෙර සර්බියාවේ සහ රුසියාවේ හොල්සිම් සමාගම්හි ප්‍රධාන විධායක නිලධාරී තනතුර මෙන්ම රුමේනියාවේ CRH සිමෙන්ති අනුබද්ධ සමාගමේ ද ප්‍රධාන විධායක නිලධාරී තනතුර හෙබවූ නවාරෝ, ඉදිකිරීම් හා ගොඩනැගිලි අමුද්‍රව්‍ය ක්ෂේත්‍රයේ දීර්ඝ කාලීන අත්දැකීම් සම්භාරයකට හිමිකම් කියයි. ආජන්ටිනියානු සම්භවයක් ඇති ඉතාලි ජාතිකයෙක් වන ඔහු දශක දෙකක් මුළුල්ලේ ප්‍රධාන පෙළේ සමාගම්හි නායකත්ව තනතුරු දරා ඇත.

ද්වාරකා අවන්හල ගල්කිස්සට එයි

උතුරු සහ දකුණු ඉන්දියානු රස සපිරි ද්වාරකා අවන්හල් ජාලයේ දෙවැනි ශාඛාව පසුගියදා අංක 10, ඔල්ඩ් ක්වෙරි රෝඩ්, ගල්කිස්ස ලිපිනයේදී විවෘත විය. අමුත්තන් 100කට එකවර ආහාර ගත හැකිවන පරිදි වායු සමනය කර සියලු පහසුකම්වලින් පරිපූර්ණව ඉදිකර ඇති ගල්කිස්ස ද්වාරකා අවන්හලේ දකුණු ඉන්දියානු සහ උතුරු ඉන්දියානු ආහාර පිසීම සඳහා දකුණු ඉන්දියාවෙන් සහ උතුරු ඉන්දියායෙන් පැමිණි සුවිශේෂ දක්ෂතාවලින් සපිරි කෝකිවරු රැසක් සිටිති. උතුරු හා දකුණු ඉන්දියානු රස එලෙසම පාරිභෝගිකයන්ට තිළිණ කිරීමේ අරමුණෙන් මෙලෙස ඉන්දියානු කෝකිවරුන් සේවයේ යොදවා සිටින අතර උදෑසන 10 සිට රාත්‍රී 11 දක්වා අවන්හල විවෘතව පවතී. ද්වාරකා ප්‍රධාන ශාඛාව අංක 37, ජායා පාර, කොළඹ 04 ලිපිනයේ පිහිටා ඇති අතර උදෑසන 7 සිට රාත්‍රී 10.30 දක්වා විවෘතය. පෞද්ගලිකව කණ්ඩායමක් ලෙස ආහාර රස විඳිය හැකි පරිදි එකක අමුත්තන් 25කට ඉඩ පහසුකම් සහිත විශේෂ කාමර දෙකකින්ද සමන්විත ද්වාරකා අවන්හලෙන් ඔබට විවිධ රසවලින් යුත් නාන්, කුල්චා, පරාටා, රොටී, මසාලා, චෙට්ටින, පනීර්, දෝස, ඉඳිආප්ප, බත්, නූඩ්ල්ස්, ෆ්‍රයිඩ් රයිස්, කොත්තු, වඩේ, සුප්, බිරියානි, ෂෝට් ඊට්ස්, ස්ටාටර්ස්, සැලඩ්, රයිටා, පළතුරු යුෂ, ලැසී, සිසිල් බීම, කිරි, තේ, කෝපි ආදී මෙකී නොකී රසවත් ආහාර පාන වර්ග රැසක් සාධාරණ මිලකට ලබා ගත හැකිය.

බිටුමික්ස් වෙතින් රබර් අංශයට වැහි ආවරණ ආලේපන

බිටුමික්ස් පුද්ගලික සමාගම රබර් වැවිලි ක්ෂේත්‍රය ඉලක්ක කර ගනිමින් තම නිෂ්පාදන පෙළ තවත් පුරෝගාමී නිෂ්පාදනයකින් සවි බල ගැන්වීමට කටයුතු යොදා ඇත. ඒ අනුව එම සමාගම රබර් ගස්වල කිරි කට්ටයට ඉහළින් වැසි ජලයෙන් ආරක්ෂා කෙරෙන වැසි ආවරණ ඇලවීම සඳහා ඉහළ ගුණාත්මක බවින් යුතු තාරමය සංයෝගයක් නිෂ්පාදනය කිරීම සඳහා නවීන තාක්ෂණයෙන් යුතු නිෂ්පාදන කර්මාන්තශාලාවක් ඇරැඹීය. ශ්‍රී ලංකා රබර් පර්යේෂණ ආයතනය නිර්දේශ කරන පරිදි වැසි ජලයෙන් රබර් කට්ටය ආරක්ෂා කිරීම සඳහා වැසි ආවරණ යෙදීම ඉතාම ප්‍රතිඵලදායක වන අතර එමගින් වැසි කාලයේදී පවා අඛණ්ඩව කිරි කැපිය හැකිය.

මහාචාර්ය ජයසිංහ වයඹ උපකුලපති ධුරයට

ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලයෙහි කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨයේ පීඨාධිපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය උදිත් කේ. ජයසිංහ මුදලිගේ එම විශ්වවිද්‍යාලයේ නව උපකුලපති ධූරයෙන් පිදුම් ලැබීය. සණස ලයිෆ් ඉන්ෂුවරන්ස් හා සණස ජෙනරල් ඉන්ෂුවරන්ස් ආයතනයන්හි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකු වන එතුමා පරිපාලන ක්ෂේත්‍රයේ විශිෂ්ටයකු ලෙස 2013 දී සණස නායක විශ්ව ප්‍රසාදිනී ආචාර්ය පී. ඒ. කිරිවන්දෙණියගේ ආරාධනාවකට අනුව අධ්‍යක්ෂ මණ්ඩලයට එක් විය.

වාණිජ මණ්ඩලී

රන් කුසලාන ජයග්‍රාහකයන්ට ඩයලොග් දිරිය

පසුගියදා පැවති ජනාධිපති රන් කුසලාන වොලිබෝල් ශූරතා අවසන් තරගයේදී හිමි කර ගැනීමට දිරිය දියණියන් පිරිසකට හැකියාව ලැබිණි. ඔවුනගේ අනාගත ජයග්‍රහණ සඳහා දිරිය දීමක් වශයෙන් ඩයලොග් ආයතනය සිය මනුසත්කාර මෙහෙයුම ඔස්සේ ඔවුනට දිරිය සැපයීමට පසුගියදා යොමු විය.

ජනාධිපති රන් කුසලාන අවසන් මහා තරගය නරඹමින් සිටි ඩයලොග් ආයතනයේ සාමාජිකයකුගේ සිතට නැගුණු අදහසකට අනුව දියත් කිරීමට යොමුවූ මෙම ඩයලොග් මනුසත්කාර මෙහෙයුම, ආණමඩුව මහඋස්වැව රතනපාල විද්‍යාලයෙන් ආරම්භ කිරීමට යොමු වීමට ද ඉතා වැදගත් කාර්යයකි. ඩයලොග් ආයතනයේ සාමාජිකයන්ගේ මැදිහත් වීම් කාර්යයෙන් සිදුවූ මෙම සත්කාර්යය, එම විද්‍යාලීය වොලිබෝල් කණ්ඩායමේ ධෛර්යය වර්ධනය කිරීමට පමණක් නොව, ඔවුන් තුළ නව අපේක්ෂා වඩවාලීමටත් අවස්ථාවක් නිර්මාණය කර දුන්නේ ය. අනේක වූ දුෂ්කරතා විඳිමින් ඔවුන් ආගමන් මග මේ ආකාරයෙන් ඇගයීමට ලක් කිරීමට ඔවුන් කෙරෙහි නව දැක්මක් සමාජය තුළ ඇති කිරීමටද මෙම මනුසත්කාර මෙහෙයුම බෙහෙවින් ඉවහල් වනු ඇත.

මෙම පාසලේ පොදු අවශ්‍යතා සහ ක්‍රීඩා අවශ්‍යතා පිළිබඳව සොයා බලා ඔබට කළ හැකි දෙයක් වේ නම් ක්‍රීඩා බාර ආචාර්ය අනිල් චන්ද්‍රකුමාර ඇමතිය හැකිය (077-8 857 039).

"OPPO F17 Pro" ශ්‍රී ලංකාවට හඳුන්වා දෙයි

Oppo F Series දුරකථන මාලාවේ නවතම දුරකථනය Oppo F 17 Pro' ශ්‍රී ලංකාවට හඳුන්වාදීමට oppo සමාගම මේ වන විට කටයුතු යොදා තිබේ. AI තාක්ෂණය සහිත කැමරා 6 ක පද්ධතියකින් සමන්විත Oppo F 17 Pro දුරකථනය ඡායාරූපකරණ හැකියාව, නිමාව සහ බලශක්තිය කාර්යක්ෂම ලෙස භාවිතාකිරීම වැනි අංශවලින් කැපීපෙනෙන ලෙස ඉදිරියෙන් සිටිනු ඇත.

අඟල් 6.43 Full HD+ තිරයක් සමගින් එන OPPO F17 Pro දුරකථනයෙ හි යොදා ඇති 'Mini-Dual Punch Hole'' සඳහා තිරයෙන් සුළු ඉඩක් පමණක් වෙන්වන නිසා තිරයට බාධාවීම අවමය. මිලිමීටර් 7.48 ක් තරම් සිහින් නිමාවකින් සහ ග්‍රෑම් 164 තරම් කුඩා බර ප්‍රමාණයකින් යුත් මෙම දුරකථන'Magic Blue'' සහ 'Matte Blue' යන වර්ණ දෙකෙන් මිලදී ගැනීමට පාරිභෝගිකයන්ට අවස්ථාව ලැබේ.

'Quad rear camera setup' සහිත මෙම නව දුරකථන මාදිලියේ පසුපස 48MP කැමරා මූලික කැමරාවක්, 8MP Wide-angle කැමරා දෙකක් සහ 2MP කැමරා දෙකක් යොදා ඇත. මේ සියල්ල නිසා වඩාත් විශිෂ්ට තත්ත්වයේ ඡායාරූප හා වීඩියෝ දර්ශන ලබාගැනීමට අවස්ථාව ලැබෙන අතරම,'Colour Portrait' වැනි විශේෂාංග මගින් ඡායාරූපයක ඉලක්කය වර්ණවත්ව හා පසුබිම කළු සහ සුදු ලෙස හා, 'BROKEN EFFECT' සහිතව ඉලක්කය වඩාත් පැහැදිලිව හා පසුබිම බොඳවී වර්ණවත්ව ඡායාරූප ලබාගත හැකිවේ. රාත්‍රී කාලවල අඩුලෝක තත්ත්වයන් යටතේ පවා පැහැදිලි සෙල්ෆි ඡායාරූප ගැනීමට අවස්ථාව ලැබෙන නිසා කෙනෙකුට තම සංචාරයන් අතරතුර විශිෂ්ට මට්ටමේ ඡායාරූප ගැනීමට මෙය බෙහෙවින් ප්‍රයෝජනවත් වනු ඇත.

"People's Elegance" බැංකු ඒකකයක් රත්නපුරයට

මහජන බැංකුව රත්නපුර ප්‍රමුඛතම ව්‍යාපාරිකයින් වෙනුවෙන් සුවිශේෂී බැංකු සේවා ලබාදීම සඳහා සිය පීපල්ස් එලිගන්ස් බැංකු ඒකකයක් :(People's Elegance) රත්නපුර නව නගරයේදි පසුගියදා සුබ මොහොතින් විවෘත කරන ලදි.

මේ නව බැංකු ඒකකය රත්නපුර නව නගරයේ පිහිටා ඇති මහජන බැංකුවේ ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය තුළ ස්ථාපිත කර තිබේ. මෙය විවෘත කිරීමේ උළෙලේ ප්‍රධාන ආරාධිතයා ලෙස සබරගමු පළාත් ආණ්ඩුකාරවර ගරු ටිකිරි කොබ්බෑකඩුව සහභාගී වූ අතර, මහජන බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී රංජිත් කොඩිතුවක්කු, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ශාඛා කළමනාකරණ) ලයනල් ගලගෙදර, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිනි (ව්‍යවසායකත්ව බැංකු කටයුතු) ක්‍රිෂානි නාරංගොඩ, රත්නපුර ප්‍රාදේශීය කළමනාකරු නලින් පෙරේරා මහතා ඇතුළු ප්‍රදේශයේ ප්‍රසිද්ධ මැණික් ව්‍යාපාරිකයන්, සම්භාවනීය අමුත්තන් රැසක් මේ සුබ මොහොතට එක්ව සිටියහ.

පළාතේ ඉහළ ආදායම් ලබන ගනුදෙනුකරුවන්ගේ සහ "ජාත්‍යන්තර මැණික් නගරය" මෙගා ව්‍යාපෘතියේ ආයෝජකයන්ගේ සුවිශේෂී මූල්‍ය අවශ්‍යතාවන් මනාව සපුරාදීමට හැකි අයුරින් ඔවුන් වෙනුවෙන් සකස් කළ පුළුල් පරාසයක විහිදුණු බැංකු සේවාවන් රැසක් "People's Elegance" තුළින් පිරිනමයි. ඉදිරි වසර හතර පහ තුළ සම්පූර්ණවීමට නියමිත එකාබද්ධිත මහ නගර සංවර්ධන ව්‍යාපෘතියේ නිල ආයෝජක බැංකුව ලෙස කටයුතු කරන්නේ ද මහජන බැංකුවයි.

මහජනතාවගේ බැංකුව ලෙස මහජන බැංකුව ලෙස කවදත් රටේ ජනතාවගේ අභිවෘද්ධිය වෙනුවෙන් ඇපකැපවී සිය මූල්‍ය විශේෂඥතාවය ලබාදුන් මහජන බැංකුව අනාගතවාදී මූල්‍ය සේවා සංස්කෘතියක් ලංකාවට හඳුන්වාදුන් හෙට ලොව දකින මූල්‍යකරණයේ පෙරගමන්කරුවා වේ.

දිවමිණ Daintee X-TRA ප්‍රහේලිකා අංක 116 — රුපියල් පනස්දහසක තෑගි

කොන්දේසි

(1) ප්‍රහේලිකාව සඳහා මසකට රුපියල් 50,000ක මුදලක් ජයග්‍රාහකයන් 10 දෙනකු අතර බෙදී යයි.

(2) පළමුවෙන්ම තෝරාගන්නා නිවැරැදි පිළිතුරු 10ට රුපියල් 5000 බැගින් මුදල් තෑගි පිරිනැමේ.

(3) සිළුමිණ පුවත්පතේ පළවන ප්‍රහේලිකාව විසඳා කූපනය පුරවා ලියුම් කවරයක බහා, එහි වම්පස ඉහළ කෙළවරේ ප්‍රහේලිකා අංක 115 යනුවෙන් සඳහන් කර ඩේන්ටි මයිලේඩ් වොෆ් දවටන 10ක් සමඟ සිළුමිණ ප්‍රහේලිකාව, ලේක්හවුස්, කොළඹ 10. යන ලිපිනයට ඔක්තෝබර් 21 දිනට පෙර එවිය යුතුය. නිවැරදි ලිපිනය සහ දුරකතන අංකය ලියා එවන්න.

(4) ජයග්‍රාහකයන් තෝරා ගනු ලබන්නේ කුසපත් ඇදීමෙනි. ජයග්‍රාහකයන්ගේ නම් සහ ප්‍රහේලිකාවේ නිවැරැදි විසඳුම ඔක්තෝබර් 25දා සිළුමිණ පත්‍රයේ පළ වේ. ජයග්‍රාහකයන්ගේ ප්‍රතිඵල පුවත්පතේ පළ වී තෙමසක් ඇතුළත තෑග මුදල් පිරිනැමේ. ඔබේ තෑග මුදල නොලැබුණහොත් පමණක් සිළුමිණ කර්තෘ මණ්ඩලය අමතන්න. (දුරකතන අංකය - 011-2429265)

(5) ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ සහ ඩේන්ටි ආයතනයේ, සේවකයන්ට හෝ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ට තරගය සඳහා ඉදිරිපත් විය නොහැකිය.

උපකාරක පද

හරහට

1 ගිය වසරේ(2019) රාජ්‍ය සම්මාන දිනූ හොඳම නවකතාව
6 වනය/ වනයට අයත්
7 ශාලාව
8 සුමිත්‍රා පීරිස්ගේ සිනමා නිර්මාණයෙකි
9 වී ආදියෙහි සිහින් සුණු
10 කාන්තාව
12 නරක/පහත්/ අල්ප යන අරුතෙන් යෙදේ
13 වාපී ගුණැති ඔසු පානයෙකි
14 කඳදෙව්
15 මහවැලි ගඟබඩ පිහිටි සුන්දර සරසවිය
17 ශරීරය
18 මධ්‍යම පළාතේ තෙදිසාවෙන් එකකි

පහළට

1 මැටි භාජනය/පිඟාන
2 කාව්‍යකාර මණ්ඩප
3 මධ්‍යම ඉන්දියාවේ ප්‍රකට ගංගාවකි
4 චන්ද්‍ර මාස ක්‍රමයේ දහවැනි දිනය
5 දෙකන්නයෙන් එකකි
6 ආසව/ මත්පැන්
11 ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනය පිහිටියේ මෙහිය
12 විශාල මදයක් සහිත රස පලතුරෙකි
13 නැබ / බුරිය
16 එකකට පසු සංඛ්‍යාව

■	1	2		3		4	5
6			■		■	7	
8							■
■	9		■		■	10	11
12		■	13			■	
	■	■	14				
15		16			■	■	
	■	17		■	18		

දිවමිණ Daintee X-TRA ප්‍රහේලිකා අංක 115

නම: .....

ලිපිනය: .....

අත්සන: .....

සම්බන්ධීකරණය - ගාමිණී රූපානන්ද අනුරූ මාධ්‍ය සේවා

මේෂ - ධන වාසනාවක්

මේෂ ලග්න හිමි ඔබගේ කේන්ද්‍රයට අනුව චන්ද්‍රයා මෙම සතියේ 04 - 05 - 06 - 07 යන ස්ථානවල ගමන් කරමින් සතිය ආරම්භයේම ධන වාසනාවකට හිමිකම් කියයි. දරු-ඵල අපේක්ෂා කරන අයට දරු සම්පත් ද විවාහ අපේක්ෂා කරන අයට විවාහ ඇති කරමින් සතිය ඉතා සැහැල්ලු-වෙන් ගත කිරීමට ඔබට හැකි වෙයි. රාත්‍රියේ ස්නානය සුදුසු නොවන අතර නිදි වැරීම නිසා සතිය මැද භාගයේ වෙහෙසකාරී තත්ත්වයට මුහුණ දීමෙන් කටයුතු රැසක් අඩාල කරවීමට ද හේතු වනු ඇත.

වෘෂභ - නඩු කටයුතු නිදහස් වෙයි

වෘෂභ ලග්නය හිමි ඔබගේ කේන්ද්‍රයට අනුව චන්ද්‍රයා මෙම සතියේ 03 - 04 - 05 - 06 යන ස්ථානවල ගමන් කරමින් ඔබට මුහුණ දීමට සිදුවූ නඩු හබයකින් නිදහස් වීමට හැකිවනු ඇත. තවද ඒ වෙනුවෙන් ලැබෙන වන්දි මුදලක හිමිකාරත්වය දැරීමට ද ඔබට වාසනාව උදාවේ. උරහිසට ඇතිවිය හැකි ආපදාවක් නිසා පීඩා විඳීමට සිදුවිය හැකි වෙතත් සුපරික්ෂාකාරී වීම නිසා එයින් වැළ-කීමට ඔබට හැකි වෙයි.

මිථුන - ව්‍යාපාර ලාභ

මිථුන ලග්නය හිමි ඔබගේ කේන්ද්‍රයට අනුව චන්ද්‍රයා මෙම සතියේ 02 - 03 - 04 - 05 යන ස්ථානවල ගමන් කරමින් ඔබගේ ධනය වැඩි දියුණුවන කරුණකට හේතු වෙයි. ඔබ කිරීමට අදහස් කර සිටින ව්‍යාපාරයක් වෙත් නම් එය ඇර-ඹීමට සුදුසුම සතියකි. කෙසේ හෝ ඔබගේ මවු පාර්ශවයේ කෙනෙකුගෙන් ඇප උපකාර ලැබේ. ඔබ කිසියම් ලියවි-ල්ලකට අස්සන් කිරීමේදි සිදුවිය හැකි අත්වැරැද්දක් නිසා එය නිවැරැදි කර ගැනීමට මහත් පරිශ්‍රමයක් දැරීමට සිදුවේ. කල්පනාකාරී වන්න.

කටක - නිර්මාණශීලී කටයුතුවල නියැළේ

කටක ලග්නය හිමි ඔබගේ කේන්ද්‍රයට අනුව චන්ද්‍රයා මෙම සතියේ 01 - 02 - 03 - 04 යන ස්ථානවල ගමන් කිරීම සතිය පුරාම සුබ කටයුතු රැසක් නිසා සතුට අත්වි-ඳීමට හැකිවෙයි. නිර්මාණශීලි කටයුතු රැසක නියැළී-මට ඔබට හැකි වෙයි. ආගමික උත්සවයකට ද සහභාගී වීමට ද ඔබට හැකිවෙයි. බොහෝ දෙනෙකුගේ ප්‍රසාදයට බඳුන්වේ. නමුත් හිසට සිදුවිය හැකි ආපදාවක් නිසා පීඩා විඳීමට බොහෝ දුරට ඉඩ ඇති නිසා කල්පනාකාරී වන්න.

සිංහ - විදේස් ඥාතියෙකුගෙන් ආධාර

සිංහ ලග්නය හිමි ඔබගේ කේන්ද්‍රයට අනුව චන්ද්‍රයා මෙම සතියේ 12 - 01 - 02 - 03 යන ස්ථානවල ගමන් කරමින් සතිය ආරම්භය කිසියම් සිත් තැවුලකට හේතුවන කරු-ණකට මුහුණ දීමට සිදුවෙයි. ඇස් රෝග නැතිනම් සෙම අමාරු නිසාද මානසික අසහනයට තුඩුදෙනු ඇත. සීතල ආහාර පාන අවම කරන්න. ඔබ ලංකාවේදීම ව්‍යාපාරයකට අත ගැසීම සුබ වෙයි. පිටරට සිටින ඥාතියකුගෙන් මූල්‍ය-මය ආධාරයක් හිමි වනු ඇත.

කන්‍යා - හදිසි ධන ලාභ

කන්‍යා ලග්නය හිමි ඔබගේ කේන්ද්‍රයට අනුව චන්ද්‍රයා මේ සතියේ 11 - 12 - 01 - 02 යන ස්ථානවල ගමන් කර-මින් කිසියම් ලැබීමකට හේතුවන කරුණක් යෙදේ. තමා වෙන අයකුට දුන් මුදලක් යළි ලැබීම, ලොතරැයි දිනුමක් හෝ වෙන යම් ඔබට හිමි වන්නට තිබි අතපසුවූ ධන-යක් ලැබීමේ වාසනාව සහිත සතියකි. තවද කලක් තිස්සේ පීඩාවක්ම තිබූ ණය මුදලකින් නිදහස් වීමට ද ඔබට හැකි වෙයි. වාසනාවන්ත දරු ඵලයකට ද ඔබට හිමිකම් ලැබෙන සතියකි.

තුලා - රැකියා ලාභ

තුලා ලග්නය හිමි ඔබගේ කේන්ද්‍රයට අනුව චන්ද්‍රයා මෙම සතියේ 10 - 11 - 12 - 01 යන ස්ථානවල ගමන් කිරීමෙන් යහපත් රැකියා පලයකට හේතු වෙයි. ඒ තුළින්ම ආර්ථික ප්‍රතිලාභයක් ද හිමිවන ලකුණු පළ වේ. ඔබට ව්‍යාපාරයකට අත ගැසීමට හැකි නම් එය යහපත් ප්‍රතිලාභ හිමි කර දෙන එකක් වනු ඇත. නුනුරු නුපුරුදු ස්ථානවල වැඩ අමුණු ජලය ආශ්‍රිත කටයුතු කෙරෙන් ප්‍රවේශම් වන්න.

වෘශ්චික - පෙර පින් මහිම මතුවේ

වෘශ්චික ලග්නය හිමි ඔබගේ කේන්ද්‍රයට අනුව චන්ද්‍රයා මෙම සතියේ 09 - 10 - 11 - 12 යන ස්ථානවල ගමන් කිරීම නිසා ජීවිතයේ පෙර පින් මහිමය මතු කෙරේ. රැකියාව ආර්ථිකය යහපත් කෙරෙනු ඇත. තමා විසින් ආරම්භ කර තිබූ එහෙත් අතරමඟ නතර වූ ව්‍යාපාරයක යළි ආරම්භ-යක් දක්නට ලැබේ. හිත මිතුරන්ගේ ඇප උපකාර හිමිවීම ජනතා ප්‍රසාදයට පත් වීම යන කරුණු නිසා සිත සැහැ-ල්ලුව හා සතුටට පත්වේ.

ධනු - සිත් තැවුල්

ධනු ලග්නය හිමි ඔබගේ කේන්ද්‍රයට අනුව චන්ද්‍රයා 08 - 09 - 10 - 11 යන ස්ථානවල ගමන් කරමින් සතිය ආර-ම්භයේ දැඩි සිත් තැවුලකට හේතු වන ආර්ථික පාඩුවක් සිදුවේ. සකසුරුවම් ලෙස කටයුතු නොකළහොත් එම පීඩාව දැඩි වන අතර හොඳ සිහි කල්පනාව වෙතොත් පාඩුව අවම කර ගත හැකිය. උගුරේ ආපදා තෙරො-යිඩ් ආපදා දෙගුණ තෙගුණ කරන සතියකි. සැර උෂ්ණ ආහාර වලින් වැළකිය යුතු සතියකි. තමා වාසය කරන ප්‍රදේශයෙන් ඈත්ව දුරබැහැර පදිංචියකට යෑමට සිදු වේ.

මකර - මංගල සීනු හැඬවේ

මකර ලග්නය හිමි ඔබගේ කේන්ද්‍රයට අනුව චන්ද්‍රයා මෙම සතියේ 07 - 08 - 09 - 10 යන ස්ථානවල ගමන් කිරීමෙන් අවිවාහක අයට මංගල සීනු හැඬවෙන සති-යකි. විවාහ වී ගැටලු රැසකට මුහුණ දී සිටි අයට සහනය සහජීවනය උදාවන සතියක් ද වේ. රැවටිලිකරුවන්ට හසුවන සතියකි. ඔබගේ මවට අයත් ඉඩමක්, නිවසක් ඔබට හිමිවන ලකුණු පෙන්වන අතර විවාහ සහකරු හෝ සහකාරිය වෙතින්ද කිසියම් ධනයකට වස්තුවකට උරුමය ඔබට ගෙන එයි.

කුම්භ - ඉවසීම අගය කරමු

කුම්භ ලග්නය හිමි ඔබගේ කේන්ද්‍රයට අනුව චන්ද්‍රයා මෙම සතියේ 06 - 07 - 08 - 09 යන ස්ථානවල ගමන් කරමින් සතිය ආරම්භය යටි බඩ ආශ්‍රිත ශල්‍යකර්මයකට පවා හේතු ඇති කෙරේ. සිතේ දිරිය අඩාළවන කරුණු කාරණා ඇතිවේ. දුර්වල වුවහොත් පරාජය අත්වන අතර එඩිතරව තම අභියෝග වලට මුහුණ දුනහොත් සතිය මැද සිට යහපත උදාවේ.

මීන - සතුට ලැබෙන සතියක්

මීන ලග්නය හිමි ඔබගේ කේන්ද්‍රයට අනුව මෙම සතියේ චන්ද්‍රයා 05 - 06 - 07 - 08 යන ස්ථානවල ගමන් කර-මින් යහපත් ආර්ථික ලාභ ගෙනදෙනු ඇත. දරුවකු පිළිබඳ වෙහෙසී කටයුතු කරන ඔබට ඒ නිසාම ප්‍රසාදය හිමිවේ. තවද තම ජීවිතයට තදින් බලපාන සුබවාදි කරුණක් නිසා සතුට ඇති කෙරේ. රාත්‍රි ගමන් වලදි ප්‍රවේශම් වන්න.

කුච්චවේලි වන මැද සැඟවුණු බෞද්ධ උරුම

● රුක්ෂිලා වෙත්තමුණි

නැගෙනහිර පළාතට අම්පාර, මඩ-කලපුව හා ත්‍රිකුණාමලය යනාදි වශයෙන් දිස්ත්‍රික්ක තුනක් අයත් වන අතර මේ පළාතේ අගනගරය වූයේ ත්‍රිකුණාමලය යි. ත්‍රිසිංහල සංකල්පයට අනුව පැරණි රෝහණයේ (රුහුණ) වැඩි ප්‍රමාණ-යක් මහවැලි ගඟෙන් දකුණු පෙදෙසෙහි නැගෙනහිර පළාතට අයත්ව පැවතිණි.

කුච්චවේලි වන පෙතින් වැසුණු පුදබිම නැගෙනහිරින් බඹරගල ආරණ්‍ය සේනා-සනය ද උතුරින් දෙබරගල සේනාසනය ද බටහිරින් මසන්වැව ස්තූපය ද ඊසාන දෙසින් රංගිරි උළුපත පුදබිම ද පිහිටා ඇත.

ආර්යයන්ගේ නියෝජිතයකු වූ රාමගෝණ විසින් පිහිටුවන ලද ගෝණාගම නුවර ඉපැ-රණි ජනපදයකි. එය බුදු දහම ව්‍යාප්ත වූ පෙදෙසක් වූ අතර පසු කලෙක තිරිකුණා-මලය ලෙසින් හැඳින්විය. විවිධ කාලවක-වානුවලට අයත් බෞද්ධ ආරාමික නටබුන් මෙම පෙදෙස පුරාම ව්‍යාප්තව පැවතිය ද වර්තමානය වන විට ඇතැම් ආරාම පාලුවට ගොස් වනගතව ඇත. එම ස්ථාන භික්ෂූන් වහන්සේලා අත්හැර ගොස්ය.

උතුරට විහිදෙන වෙරළට සමාන්ත-රව ත්‍රිකුණාමලයේ සිට ගමන් කරන විට ශේෂව පවතින බෞද්ධ ආරාමයන් හි නට-බුන් දැක ගැනීමට හැකිය. එසේ නට-බුන්ව ගිය ආරාමයක් ලෙස කුච්ච-වේලි විහාරය දැක්විය හැකි අතර අටුවා ග්‍රන්ථ වල හඳුන්වා ඇත්තේ කණිකාර වෙල්ලික සමුද්ද විහාරය ලෙසිනි. මුහුදු වෙරළ ආශ්‍රිතව ගොඩ නගන ලද විහාර සමුද්‍ර විහාර නමින් හඳුන්වා ඇති අතර වැඩි වශයෙන් දකුණු, ගිනිකොණ, නැගෙනහිර, ඊසාන හා උතුරු මුහුදු තීර-යන්හි දක්නට ඇත. එවැනි පැරණි සමුද්‍ර විහාර ලෙසට වත්මනේ ශේෂව ඇති බුන්දල, ශාස්ත්‍රවෙල, පොතුවිල මූදු විහාරය, සංගමන් කන්ද, ලංකා පටුන, ගෝකණ්ණ හා දඹකොල පටුන ආදි ස්ථාන දැක්විය හැකිය. විවිධ සතුරු ආක්‍රමණ හේතුවෙන් මෙම විහාර බහුල වශයෙන් විනාශ වී ඇති අතර මුහුදු බාදනය ද විහාර විනාශයට සාධකයක් විය.

කුච්චවේලියෙ සමුද්‍රගිරි පිච්චමල් විහාරය

ත්‍රිකුණාමලයේ සිට වෙරළට සමාන්ත-රව මුලතිව් දක්වා ඇති මාර්ගයේ කිලෝ-මීටර් 30 ක් පමණ ගමන් කිරීමෙන් පසුව කුච්චවේලි විහාරයට පිවිසිය හැකිය. පිච්ච-මල් විහාරය නමින් ද හැඳින්වෙන මෙම වෙහෙර සමුද්‍රාසන්නව වනයෙන් වැසුණු පර්වතයක පිහිටි බැවින් නිරන්තරයෙන් නිධන් හොරුන්ගේ ග්‍රහණයට හසුව ඇති අතර මුහුදු බාදනයට ලක්ව දැඩි ලෙස විනාශයට පත්ව ඇත. ධීවර කර්මාන්තයේ නිරතව සිටින සුළු පිරිසක් ජීවත් වන කුඩා ගම්මානයක් ලෙස කුච්චවේලි හැඳින්වේ. කඩ්ඩුකුලම් යනු එහි ප්‍රධාන ගමයි. 1870 දි කඩ්ඩුකුලම් ප්‍රදේශය උඩරටට අයත් කොට-සක් ලෙස සලකා ඇත. ඒ බැව් ලියවිලි අනුව පැහැදිලිය. මින් ගම්‍ය වන කරුණ වූයේ විහාරය හා යාබද්ධ භූමිභාගය ඉංග්‍රීසි පාලනයට නතුවන තුරුම සිංහල රාජ්‍ය-ත්වය යටතේ පාලනය වූ බවය.

මුහුදු සීමාවට ආසන්නව පිහිටි ගල්ත-ලාවක සියුම් ලෙස ඔප මට්ටම් කළ අඩි 4 ක් දිග හා අඩි 4 ක් පළල සම සතරැස් කොටුවක, කොටස් 16 කට බෙදා ඒ කොටු තුළ කුඩා ස්තූප කැට-යම් කොට ඇත. එම ස්තූප සහිත පර්වත කොටස මුහුදට කඩා වැටී ඇති බැවින් නිරතුරුවම මුහුද රළ වැදීම හේතුවෙන් එම ස්තූප කැටයම් විනාශ වෙමින් පවතී. මේධානන්ද හිමිගේ අදහස වන්නේ මෙවැනි කැටයම් මහායාන සම්ප්‍රදායට අනු-රූප බවය. 1966 වන විට ඉතා ආර-ක්ෂිතව පැවති මෙම කැටයම් 1978 පමණ වන විට ඇතැම් ස්තූප මුදුන් විනාශ කොට තිබේ.

ස්තූප කැටයම් වලට දකුණු පසින් ඉතා කුඩාවට සෙල් ලිපියක් දක්නට ලැබේ. මහාචාර්ය සෙනරත් පරණවිතානයන් විසින් 1933 දී සංස්කරණය කොට ප්‍රකාශයට පත් කළ Epigraphia Zelanica කෘතියේ III වෙළුමේ (පිටු 158-161) මෙම සෙල්ලිපිය ගැන සඳ-හන්ව ඇත. එය ක්‍රි.ව. 7 වන සියවසට අයත් යැයි පරණවිතානගෙ අදහසයි. සෙල්ලිපියෙ අන්තර්ගත වන්නේ මෙම ස්තූප කැටයම් කිරීමෙන් ලැබෙන පින හා ඒ සම්බන්ධව සිදුකළ ප්‍රාර්ථනයයි. අඟල් 11 ක් දිග හා 8.5 ක් පළල වූ ලිපිය ජේළි 8 කින් සමන්විත වූ අතර අක්ෂර ඉතා කුඩා විය. එහි රචකයා කවුරුන් ද යන්න සටහන් නොවේ. මෙම අක්ෂර දකුණු ඉන්දියානු පල්ලව අක්ෂර වලට සමාන ව සංස්කෘත බසින් ලියා ඇත. විද්වතුන්ගේ මතය වන්නේ මෙහි කාලය, ලිපිය ලියා ඇති බස, පිහිටි ස්ථානය, අන්ත-ර්ගතය හා අක්ෂර හැඩය අනුව මහායාන බුදු දහම සමඟ මෙම ලිපිය බැඳුණු බවය. සෙල්ලිපිය 6 වන සියවසට අයත් යැයි සැලකේ. එමෙන්ම මෙම යුගයට අයත් තවත් සෙල්ලිපියක කුච්චවේලි විහාරයේ ඓතිහාසික නාමය අට්ඨකතාවල සඳහන් කණිකාරවෙල්ලි විහාරය ලෙස හඳුනා ගනී.

ලිපියේ සරල අර්ථය

මා මේ කළ පිනින් හැම ආත්මයකදීම ලෝක සත්ත්වයා දුකින් මුදාලීමට හැකි වෙම්වා! ලෝකයාට පූර්ණ සුවය ලබා දීමට හැකි වෙම්වා! ඉවසීම හා කරුණාව මා තුළ පිරී තිබේවා. මේ පිනින් මරුවා නම් නොයෙක් සතුරන් පරාජය කර බුදු බව ලැබේවා! මහා කරුණාව නම් අතින් සසර නම් මඩින් විපතට පත් වූ ලෝකයා එයින් මුදවා ගනිමි! (කථිකාචාර්ය චන්දිම අඹ-න්වල හා ශාන්ත කුමාර)

එල්ලාවල මේධානන්ද හිමි සඳහන් කරන්නේ උන් වහන්සේ මෙම ස්ථානයේ ගවේෂණය සඳහා පැමිණෙන විටත් ගණ-දෙවි රූපයක් තබා බෞද්ධ නටබුන් මත කෝවිලක් ඉදිකර තිබුණු බවය. 1981 වන විට ඉහත සඳහන් කරන ලද ලිපිය තාර ගා විනාශ කරන්නට උත්සාහයක් දරා ඇති බව ද උන්වහන්සේ සඳහන් කර ඇත.

විටින් විට මෙම භූමියේ සිදු කරන ලද කැණීම් වලදී විවිධ පුරාවිද්‍යාත්මක අව-ශේෂ මතුකර ගැනීමට හැකිවිය. ඒ අනුව බුදු මැඳුරක් යැයි අනුමාන කරන ගොඩනැ-ගිල්ලක අත්තිවාරම් හා ගොඩනැගිලි කිහි-පයක නෂ්ටාවශේෂ හමු වූ අතර එහි බිමේ ගඩොල්, ගල්පලු කැලි තිබී ඇත. මෙහි බැම්ම නිමවා තිබෙන්නෙ ගඩොල් භාවිත-යෙනි. බුදු මැදුර යැයි මත දරන ගොඩනැ-ගිල්ල පාදා ගැනීමේ දී හිටි බුද්ධ ප්‍රතිමාවක් හා ප්‍රතිමා ශීර්ෂ දෙකක් සොයා ගනු ලැබීය. මේධානන්ද හිමි සඳහන් කරන්නේ පළමු-වැනි පිළිමයේ දකුණු අතේ කොටසක් නැති මුත් සිවුරු රැල්ල මනාව නිරූපිත බවය. මෙම ප්‍රතිමාවන්හි කලාව අනුව 2 වන සිය-වසට අයත් යැයි අදහසයි. ප්‍රතිමා කැබලි අසල තිබී 4 වන සියවසට අයත් රෝම කාසි කිහිපයක් මෙහිදි හමුවීම විශේෂිතය. 2013 අගෝස්තු 13 දින අංක 1823/73 දරන ගැසට් නිවේදනය මගින් පුරාවිද්‍යා ස්මාර-කයක් වශයෙන් මෙම ස්ථානය ප්‍රකාශයට පත් කෙරිණි.



කුච්චවේලිය

කුච්චවේලියෙන් හමු වූ ප්‍රතිමා ශීර්ෂ

සෙම්බුමලේ ස්වභාවික පොකුණක්

සෙම්බුමලේ ඇති ශෛලමය සිරිපතුල් ගලක්

සෙම්බුමලේ බෞද්ධ විහාර නටබුන්

කුච්චවේලි විහාර ආරාම පරිශ්‍රයට අයත් භූමියක් ලෙස සෙම්බුමලේ පවතින්නට ඇතැයි යන්න සඳහන්ය. වනයෙන් වැසී ගිය කඳු ගැටයක පිහිටි මෙම ස්ථානයට ළඟා වීම සඳහා කුච්චවේලි හන්දියෙන් හැරී තිරියාය මාර්ගයේ යම් දුරක් ගමන් කොට වම් අතට හැරී පසුව නැවතත් දකුණට හැරී සැතපුම් එකහමාරක් පමණ ගමන් ගත යුතුය.

සෙම්බුමලේ ඉතිරිව ඇති නට-බුන් අනුව පැහැදිලි වන්නේ අතීතයේ දී සංවිධානාත්මක වූ ආරාම සංකීර්ණයක් ලෙස පවතින්නට ඇති බවය. මේධානන්ද හිමි මෙම ස්ථානයට පිවිසෙන අවස්ථාව වන විට විශාල මළුවක මැද පිහිටි ගොඩැ-ල්ලක් දක්නට ලැබුණු බවත් එහි ශේෂව ඇති ගඩොල් අනුව ස්තූපයක ගරා වැටුණු කොටස් බව ද සඳහන් කරයි. එමෙන්ම නිධන් හොරු විසින් අඩි 15 ක් පමණ ගැඹු-රට හාරා මෙම ස්තූපය විනාශ කර ඇති අතර චෛත්‍ය වටා පිහිටි මලසුන් ගෙවල් වලට අයත් යැයි සැලකෙන ගල් කණු කොටස් හා පියගැටවලට අයත් කළු ගල් කැබලි තැනින් තැන විසිර පැවති බවත් ඒවා රළු හා චාම් බවින් යුතු වූ බවත්ය.

ආසන ගල් තුනක් දක්නට ඇති අතර ඉන් එකක් දෙකට වෙන්කොට විනාශ කර ඇත. එසේම ස්තූපයට නුදුරු තැනක ගොඩනැ-ගිල්ලක ශේෂ ද පොකුණු දෙකක් ද පිහිටා ඇත. පිහිටි ගලේම නෙළන ලද පියගැට 35 කි. ස්තූපයට පිවිසීමේ මාර්ගය පිහිටා ඇත්තේ බටහිර දෙසිනි. ස්තූපයට ඊසාන දෙසින් තවත් ගොඩනැගිල්ලක ශේෂ දක්නට ලැබෙන අතර එහි කණු පාදම්ගල් 6 ක් හා ගල් කණු 6 කි. ඇතැම් විට මෙය ප්‍රතිමා ගෘහය වන්නට ඇතැයි යන්න අදහ-සයි. එයට මඳක් දුරින් විශාල ගොඩනැගි-ල්ලක ශේෂ විසිර පවතින අතර එහි මළුව අඟල් 54x40 යුක්තය. අඩි අටක් පමණ උස ගල් කණු නවයක් එහි තුළ දක්නට ඇත. ස්තූපයට නැගෙනහිරින් හුණුගලින් නිර්මා-ණය කරන ලද පාද ලාංඡන ශිලා ඵලක-යක් ඇති බවත් එහි පතුලේ කැටයම් මැකී යමින් පැවති බවත් මේධානන්ද හිමි සඳහන් කරයි.

එසේම හුණු ගලින් නිම වූ පිළිමයක් දක්නට ලැබුණු බවද එහි ශීර්ෂය නොතිබූ බවද ප්‍රතිමාවේ එක් අතක් සම්පූර්ණයෙන්ම විනාශ වී තිබුණු බවද සඳහන්ය. ප්‍රති-මාවේ බඳ කොටස අඩි හයකින් යුක්ත වූ අතර උරසිහ අඩි දෙකක් පමණ පුළුල් විය. සිවුරේ රැළි මනා ලෙස නිමවා ඇත. 1978 දී මෙම ප්‍රතිමාව කන්දෙන් පහළට පෙරලා ගස් දෙබලක හිර වී තිබී පසුව එතනින් ද ඇදගෙන ගොස් ඇතැම් අන්තවාදි පරිසක් විසින් විනාශ කළ බව පුවත්පත් වල සඳ-හන් වූ බව මේධානන්ද හිමි සඳහන් කර ඇත. 1979 වසරේ සිට 1994 දක්වා කාල වකවානුවේදී මෙහි පුරාවිද්‍යා දෙපා-ර්තමේන්තුවට අයත් වැඩ බිමක් පැවති අතර එමගින් විටින් විට කැණීම් හා ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කොට ඇත.

මෙහි නටබුන් මත ශිව දේවාලයක් ඉදි කර ඇති අතර එම ස්ථානය සෙම්බිහ්වර දේවාලය නමින් හඳුන්වා ඇත. 2015 වසරේ සිට කුච්චවේලි සමුද්‍රගිරි පිච්චමල් විහාර-වාසී පූජ්‍ය කැප්පෙටියාවේ අරණවිහාරී ස්වාමීන් වහන්සේ කුච්චවේලියෙහි වැඩ වාසය කරනු ලබයි. උන් වහන්සේ සමග සිදු කළ කතා බහේදී ප්‍රකාශ කළ පරිදි සෙම්බුමලේ විහාර භූමියේ ඇති ස්තූපයේ ගඩොළු භාවිතා කොට මෙම ශිව දේවා-ලය ඉදිකොට ඇත. සෑම මසකම පෝය දිනයේ යම් පිරිසක් මෙහි පැමිණ පුද පූජා පවත්වා යන බවත් මෑත කාලයේ දී පූජා භූමියේ පැවති සිරිපතුල් ගලක් දේවාලයේ ඇතුළත තබා එය වටා බදාම තවරා ඊට උඩින් කාන්තා දේව රූපයක් පිහිටුවා ඇත. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාලයට ඒ පිළිබඳව දැනුම් දුන් නමුත් ඔවුන් කිසිවක් නොකළ හෙයින් කුච්චවේලි පොලිසියට පැමිණිලි කළ බවත් පසුව එම පිරිස් පොලිසියට ගෙන්වා කරුණු පැහැදිලි කොට තිබේ. ඒ අනුව ඔවුන් වරද තේරුම් ගෙන සිරිපතුල නැවත පෙර තිබූ පරිදි තැන්පත් කළ බව උන්වහන්සේ ප්‍රකාශ කරනු ලැබීය. එම ස්ථානයේ ඇති මල් ආසනයක් ඔවුන් බදාම ඇනීමට භාවිතා කර ඇත. ඇතැම් විට නොදැනුවත්කමට හෝ හිතාමතා එසේ කරන්නට ඇතැයි යන්න අනුමාන කළ හැකිය.

මෙම භූමියේ ඇති සුවිශේෂි පුරාවිද්‍යා සාධකයක් ලෙස කැටයම් සහිත ආසන ගල පිළිබඳ සඳහන් කළ හැකිය. එසේම කැප්පෙටියාවේ අරණවිහාරී හිමි ප්‍රකාශ කළේ සෙම්බුමලේ ගල් තලාවේ පිටපත් නොකරන ලද පර්වත ලිපි දෙකක් ඇති බවත් එය ආරක්ෂා කිරීමට දැඩි පරිශ්‍රමයක් දරනා බවත් ඒ පිළිබඳව පුරාවිද්‍යා දෙපා-ර්තමේන්තුවට දැනුම් දුන් බවත්ය.

1978 දී ප්‍රථමව මෙම භූමියට වැඩම කළ අතිපූජ්‍ය අහුන්ගල්ලේ සීලවිසුද්ධි හිමි කිනි-හිරියා කන්ද ලෙස මෙම ස්ථානය නම් කොට තිබේ. පසුව බෞද්ධ නටබුන් සහිත භූමියක් ලෙස සෙම්බුමලේ හඳුනාගෙන ආරක්ෂා කරන්නට ක්‍රියා කර ඇත. මෙම විහාරය මෙන්ම කුච්චවේලි ඇතුළු වන-යට බිලිව තිබූ පෞරාණික වටිනාකමින් යුත් ස්ථාන රැසක් හඳුනාගෙන ආරක්ෂා කිරීමට සීලවිසුද්ධි හිමි අතිමහත් පරිශ්‍රයක් දැරූ බව කැප්පෙටියාවේ අරණවිහාරී හිමි ප්‍රකාශ කළේය. එමෙන්ම බොහෝ පෞරා-ණික ස්ථාන ආරක්ෂා කිරීමට ශ්‍රී ලංකා යුද හමුදාව සහ නාවික හමුදාව කරනා සේවය ද මෙහිදී මතක් කිරීම කෘතගුණ සැලකීමකි. මිනිස් වාසයක් නැති මෙවැනි ස්ථාන වලදි භික්ෂූන් වහන්සේලා වෙනුවෙන් සිව් පස-යෙන් උපකාර කරනුයේ ද මෙම පිරිසයි. නැගෙනහිර පළාත් ආණ්ඩුකාර අනුරාධා යහම්පත් විනාශ වෙමින් යන බෞද්ධ උරු-මයන් ආරක්ෂා කර ගැනීමට විශාල සහයක් ලබාදෙන බව ද මෙහි දී විශේෂයෙන්ම සඳ-හන් කළ යුතුය.

අක්කර සියයක් වැනි භූමි ප්‍රදේශයක් පුරා විසිර ඇති පෞරාණික වටිනාකමින් යුතු මෙම පූජා භූමිය රැක ගැනීමේ දැඩි අව-ශ්‍යතාවක් හා යුතුකමක් ලෙස වගකිවයුතු නිලධාරීන්ගේ අවධානයට ලක්වීම කාලී-නය.

නටබුන් වූ කුච්චවේලිය

බන්දුල ජයමාන්න
kreeda@lakehouse.lk

විවෘත පොදු තරගාවලියේ දක්ෂතම වෙඩික්කරු ස්කෝපියන් ක්‍රීඩා සමාජයේ ඉසිර රිටිගහපොළ ක්‍රීඩා අමාත්‍යවරයා අතින් කුසලානය ලබාගත් අවස්ථාව

සමස්ත ශූරතාව දිනාගත් ශ්‍රී ලංකා නාවික හමුදා කණ්ඩායම

නාවිකයෝ ඉලක්කයටම වෙඩි තබති

● මහේෂ් නුවන්

මහනුවර හන්තාන හිල්කන්ට්‍රිස් වෙඩික්කරුවන්ගේ ක්‍රීඩා සමාජය 9 වැනි වරට සංවිධාන කළ 2020 ජාතික වෙඩි තැබීමේ තරගාවලියේ සමස්ත ශූරතාව දිනා ගැනීමට ශ්‍රී ලංකා නාවික හමුදා කණ්ඩායම සමත් විය.මේ තරගාවලියට නාවික, යුද සහ ගුවන් හමුදා කණ්ඩායම් සමගින් පොලිස් සහ සිවිල් ක්‍රීඩා සමාජ 9ක් නියෝජනය කරමින් ක්‍රීඩක ක්‍රීඩිකාවෝ 184 දෙනෙක් සහභාගි වූහ.

හිල්කන්ට්‍රි වෙඩික්කරුවන්ගේ ක්‍රීඩා සංසදය 1999 වසරේ මාතලේ අයි. මිසාන් මොහිදීන් ගේ මූලිකත්වයෙන් ආරම්භ කළ අතර, ඒ වෙනුවෙන් පිරිනැමූ මිසාන් අභියෝගතා ශූරතාව දිනා ගැනීමට ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ එන්.පී. විජේසූරිය සමත් විය. විවෘත පොදු තරගාවලියේ දක්ෂතම වෙඩික්කරු ලෙස ස්කෝපියන් ක්‍රීඩා සමාජයේ ඉසිර රිටිගහපොළ සම්මාන දිනා ගත් අතර, බියැන්වි පොදු තරගාවලියේ සමස්ත ශූරතාව මිගමුව රයිෆල් ක්‍රීඩා සමාජයේ මේනක ලියනගේට හිමි විය. පිස්තොල, රයිෆල් ඇතුළු වෙඩි තැබීමේ අංග කිහිපයක් යටතේ පැවැති තරගාවලියේ ජය සංකේත ප්‍රදානය ක්‍රීඩා හා තරුණ කටයුතු ඇමැති නාමල් රාජපක්ෂ සහ මහාමාර්ග ඇමැති ජොන්ස්ටන් ප්‍රනාන්දුගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි.

අයිපීඑල් කාන්තා තරගාවලියට ශෂි සහ චමරි එක්වෙති

ඉන්දිය ප්‍රීමියර් ලීග් ක්‍රිකට් තරගාවලියට සමගාමීව ප්‍රදර්ශනාත්මක ක්‍රිකට් තරගාවලියක් ලෙස සාජා නුවර පැවැත්වීමට නියමිත කාන්තා විස්සයි20 ක්‍රිකට් තරගාවලියට ශ්‍රී ලංකාවේ හිටපු නායිකා ශෂිකලා සිරිවර්ධන සහ වත්මන් නායිකා චමරි අතපත්තු එක් වී සිටිති. ලබන නොවැම්බර් මස 4 වැනිදා සිට 9 දක්වා පැවැත්වෙන එම තරගාවලිය පැවැත්වෙන්නේ තෙවැනි වරටය. චමරි සහ ශෂිකලා සිරිවර්ධන සමඟ බටහිර ඉන්දීය කොදෙව්, එංගලන්තයෙන් මෙන්ම බංග්ලාදේශයෙන් ක්‍රීඩිකාවන් කිහිපදෙනකු ද මේ තරගාවලියට එක්වීමට නියමිතය.

එක්සත් අරාබි එමීර් රාජ්‍ය කොවිඩ් 19 සෞඛ්‍ය නීති රෙගුලාසිවලට අනුව නිරෝධායනය වීමෙන් පසුව තරගාවලියට ක්‍රීඩා කිරීමේ අවස්ථාව විදෙස් ක්‍රීඩිකාවන්ට ලැබෙන බව තරගාවලියේ සංවිධායක ඉන්දීය ක්‍රිකට් පාලක මණ්ඩලය නිවේදනය කරයි.

කණ්ඩායම් තුනක සහභාගිත්වයෙන් පැවැත්වෙන කාන්තා විස්සයි20 තරගාවලියට සහභාගි වීම සඳහා චමරි අතපත්තු සහ ශෂිකලා සිරිවර්ධන මේ මස අගභාගයේදී සාජා නුවර බලා පිටත්ව යෑමට නියමිතය. තවම හරියට ම යන්න ඕනෑ දින වකවානු දැනුම් දීලා නෑ යැයි අප මේ පිළිබඳ චමරි ගෙන් කළ විමසීමේ දී පැවැසීය.

ගොකරල්ල මහා විද්‍යාලයෙන් සහ ඉබ්බාගමුව මධ්‍ය මහා විද්‍යාලයෙන් අකුරු කළ චමරි එක්දින ක්‍රිකට් තරගයක වැඩිම ලකුණු රැස් කළ ක්‍රීඩිකාවන් අතර සිවුවෙනි ස්ථානයේ පසුවන්නීය. ඒ කාන්තා ක්‍රිකට් ලෝක කුසලානයේ දී ඕස්ට්‍රේලියාවට එරෙහිව (2017 ජුනි 29) පැවති තරගයේදී අගනා පිති හරඹයක යෙදුණු චමරි අතපත්තු නොදැවී ලකුණු 178 ක් රැස් කිරීමට සමත් වූවාය. පන්දු 143 ක් තුළ රැස් කළ එම ලකුණු සංඛ්‍යාවට හතරේ පහර 22 ක් සහ හයේ පහර 06 ක් ඇතුළත් වේ.

මේ තරගයේ දී වාර්තා කිහිපයක් බිඳ දමමින් ශ්‍රී ලංකා කණ්ඩායම නියමිත ඕවර 50 අවසානයේ කඩුලු 09 ක් දැවී ලකුණු 257 ක් රැස් කිරීමට සමත් විය. චමරි අතපත්තුට පසු ශ්‍රී ලංකා කණ්ඩායමේ වැඩිම ලකුණු රැස් කළ ක්‍රීඩිකාව ශෂිකලා සිරිවර්ධනයි. ඇය රැස් කළ ලකුණු සංඛ්‍යාව 24 කි. ඒ අනුව එක් දින ක්‍රිකට් තරගයක වැඩිම ලකුණු රැස් කළ ක්‍රීඩිකාවන් අතර චමරි අතපත්තු සිවුවැනි ස්ථානයට පත් වන අතර ශ්‍රී ලංකා ක්‍රීඩිකාවක් ලකුණු 150 සීමාව පසු කළ පළමු අවස්ථාව ද මෙය වේ.

ලෝකයේ අංක එකේ කාන්තා ක්‍රිකට් කණ්ඩායම ලෙස සැලකෙන ලෝක ශූර ඕස්ට්‍රේලියා කණ්ඩායමට එරෙහිව ක්‍රීඩිකාවක් රැස් කළ වැඩිම ලකුණු සංඛ්‍යාව ද මෙයයි.වැඩිම ලකුණු ලබා ගත් සෙසු ක්‍රීඩිකාවන් වන නවසිලන්තයේ ඇබිලියා කර් අයර්ලන්තයට නොදැවී 232, ඕස්ට්‍රෙලියාවේ බෙලින්ඩා ක්ලාක් ඩෙන්මාර්කයට නොදැවී 229, සහ ඉන්දීයාවේ දීප්ති ෂර්මා අයර්ලන්තයට එරෙහිව 188ක් වශයෙන් එක්දින ඉනිමක වැඩිම ලකුණු රැස් කර තිබෙන පිතිකාරිනියන් තිදෙනායි.මේ හේතුව නිසාම චමරි අතපත්තුගේ ඉනිම ලෝකයේ හොඳම කාන්තා එක් දින ඉනිම ලෙස හැඳින්විය හැකි බව ක්‍රීඩා විචාරකයෝ පවසති. ඊට අමතරව ක්‍රීඩිකාවක්, සිය කණ්ඩායම රැස් කළ මුළු ලකුණු සංඛ්‍යාවෙන් වැඩිම ප්‍රතිශතයට හිමිකම් කීමේ ලෝක වාර්තාව ද චමරි අතපත්තුට හිමි විය. ශ්‍රී ලංකා ක්‍රීඩිකාවක් කාන්තා ලෝක කුසලාන තරගයක රැස් කළ පළමු ශතකය මෙය වන අතර ශතක තුනක් ලබා ගනිමින් ශ්‍රී ලංකා කණ්ඩායමේ ශතක රැස් කළ එකම ක්‍රීඩිකාව ද ඇයයි.

එකී තරගයෙන් අනතුරුව විස්තර විචාරකයන් සමඟ අදහස් පළ කරමින් චමරි අතපත්තු කියා සිටියේ ශ්‍රී ලංකාවේ පැවති පුහුණුවීම්වලදී පිරිමි 17 න් සහ 19 න් පහළ වේග පන්දු යවන්නන්ට මුහුණ දී තිබීම නිසා ඕස්ට්‍රේලියානු කණ්ඩායමේ වේග පන්දු යවන ක්‍රීඩිකාවන්ට මුහුණදීමට තමන්ට පහසු වූ බවය. මේ වාර්තාගත ශතකයට අමතරව 2011 දී අයර්ලන්තයට එරෙහිව ලකුණු 111ක් ද රැස් කිරීමට සමත්ව තිබේ. චමරි සිය විස්සයි20 ශතකය ද රැස්කර ඇත්තේ ඕස්ට්‍රෙලියාවට එරෙහිව පසුගිය වසරේදිය. ඒ ලකුණු 113කි.

චමරි සහ ශෂිකලා අතරින් අත්දැකීම් බහුලම ක්‍රීඩිකාව වන්නේ ශෂිකලා සිරිවර්ධනයි.තිස් පස්වන වියේ පසුවන ශෂි ශ්‍රී ලංකාව වෙනුවෙන් කාන්තා තරගාවලියේදී එක්දින කඩුලු 100 ක් ලබාගත් එකම ක්‍රිකට් ක්‍රීඩිකාවද වන්නීය. එක්දින තරග 118කට ක්‍රීඩා කර ඇති ශෂිකලා ලකුණු 2029ක් රැස්කර ඇති අතර අර්ධ ශතක හතකි. බිඳ දමා ඇති කඩුළු සංඛ්‍යාව 124කි. විස්සයි20 තරග 81කදි ලකුණු 1097ක් රැස් කර ඇති අතර කඩුළු 77ක් බිඳ දමා තිබේ.

2019 ඉන්දීයන් ප්‍රීමියර් ලීග් කාන්තා ක්‍රිකට් තරගාවලියේ ශූරතාව දිනා ගැනීමට චමරි අතපත්තු ඇතුළු සුපර්නොවාස් කණ්ඩායම සමත් විය. ඒ, අවසන් මහ තරගයේදී වෙලෝසිටි කණ්ඩායම කඩුලු 4 කින් පරාජය කරමිනි. ඉන්දීයන් ප්‍රීමියර් ලීග් කාන්තා ක්‍රිකට් තරගාවලියේ මූලික වටයට සහභාගී වූ කණ්ඩායම් ගණන 3 කි. ඒ, සුපර්නොවාස්, ට්‍රයල්බ්ලේසර්ස් සහ වෙලෝසිටි කණ්ඩායම් ය.

තරග රැසක් කල් යයි

කොවිඩ්19 වසංගතයේ පැතිරීමත් සමඟ රට තුළ පවතින වත්මන් තත්ත්වය සැලකිල්ලට ගනිමින් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සංවිධාන කරන අන්තර් සමාජ අවුරුදු 23න් පහළ ක්‍රිකට් තරගාවලියේ අවසන් පූර්ව තරග නැවත දන්වනතුරු කල් දැමූ බව ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය කියයි. බදුරලිය ක්‍රීඩා සමාජය සහ එස්එස්සී ක්‍රීඩා සමාජය පළමු අවසන් පූර්ව තරගට සීසීසී පිටියටත්, ලන්කන් ක්‍රීඩා සමාජය සමගින් කෝල්ට්ස් ක්‍රීඩා සමාජය එන්සීසී පිටියේදි දෙවැනි අවසන් පූර්ව තරගයට එක්වීමට නියමිතව තිබුණි.තරගාවලියේ අවසන් මහ තරගය පැවැත්වීමට නියමිතව තිබෙන්නේ මේ මස 11 වැනිදාය.

පන්දුවාර විස්සයි20 ලංකා ප්‍රීමියර් ලීග් ක්‍රිකට් තරගාවලිය නොවැම්බර් 21 තෙක් කල් දැමීමට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය තීරණය කර තිබේ.නිවේදනයක් නිකුත් කරමින් ශ්‍රී ලංකා ක්‍රිකට් පෙන්වා දෙන්නේ නිරෝධායන අවශ්‍යතා සපුරාලීම සඳහා අවකාශය නිර්මාණය කිරීමට මෙම තීරණය ගත් බවයි.

ලංකා ප්‍රීමියර් ලීග් ක්‍රිකට් තරගාවලිය නොවැම්බර් මස 14වැනිදා ආරම්භ කිරීමට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය තීරණය කර තිබුණි. ඉන්දීය ප්‍රීමියර් ලීග් ක්‍රිකට් තරගාවලිය සඳහා සහභාගි වන ක්‍රීඩකයින්ට ද ලංකා ප්‍රීමියර් ලීග් තරගාවලියට පිවිසීමට අවස්ථාවක් ලබාදීමට මෙම පියවර අරමුණු කර ගත් බව එම ආයතනය නිකුත් කළ නිවේදනයේ වැඩිදුරටත් සඳහන් වේ. මෙම තීරණයත් සමග ඔක්තෝබර් මස 01 වැනි දින පැවැත්වීමට නියමිතව තිබූ ලංකා ප්‍රීමියර් ලීග් ක්‍රීඩක වෙන්දේසි කිරීමේ අවස්ථාව ඔක්තෝබර් 09 වැනිදා පැවැත්වීමට තීරණය කර තිබුණි.

මේ අතර කොවිඩ්19 වසංගතයේ පැතිරීමත් සමගම 46වැනි ජාතික මහා ක්‍රීඩා උලෙළට අදාල සියලු තරගද දින නියමයකින් තොරව කල් දමා ඇති බව ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල්වරයා නිවේදනයක් මඟින් දන්වා සිටියි. මේ අතර ක්‍රීඩා වෛද්‍යායතනයේ අධ්‍යක්ෂ ජනරාල් ලාල් ඒකනායක ප්‍රකාශ කරන්නේ සෞඛ්‍යය නිර්දේශ ලැබෙන තුරු කිසිම තරගාවලියක් පැවැත්විය නොහැකි බවයි. බැඩ්මින්ටන් සම්මේලනයේ නිලවරණය ලබන මාසයේ පැවැත්වීමට නියමිතය.

ජාතික වොලිබෝලයට 13 වැනි වරටත් 'මංචි' අත දෙයි

ශ්‍රී ලංකා වොලිබෝල් සම්මේලනයේ සභාපති ආචාර්ය රංජිත් සියඹලාපිටිය, සිලෝන් බිස්කට්ස් (මන්චී)අධ්‍යක්ෂ ප්‍රධාන විධායක නලීන් කරුණාරත්න අනුග්‍රාහක චෙක්පත හුවමාරු කරගත් අවස්ථාව. මේ අවස්ථාවට (වමේ සිට) ජානක බොතේජු, රොමේෂ් ජයතිලක, නලීන් කරුණාරත්න, රංජිත් සියඹලාපිටිය, ඒ.ඒස් නාලක, තුෂාර පෙරේරා යන අය එක් වූහ.

මංචි ජාතික වොලිබෝල් තරගාවලියේ ආධුනික කාණ්ඩයේ ප්‍රබල වෙනසක් කරමින් එකී කාණ්ඩයේ තරගාවලියට එක්වන ක්‍රීඩක - ක්‍රීඩිකාවන් දිස්ත්‍රික්කය නියෝජනය කිරීම අනිවාර්යය කර තිබේ. මෙතෙක් පැවැති ක්‍රමය අනුව ඕනෑම දිස්ත්‍රික්කයක් නියෝජනය කරමින් ආධුනික කාණ්ඩය සඳහා කණ්ඩායම් ඉදිරිපත් කිරීමට හැකියාව තිබුණි. එකී පැරණි ක්‍රමයේදී ආරක්ෂක අංශ දිවයිනේ විවිධ දිස්ත්‍රික්ක නියෝජනය කරමින් කණ්ඩායම් ඉදිරිපත් කිරීමේදී එකී දිස්ත්‍රික්කවලින් ඉදිරිපත් වන ග්‍රාමීය කණ්ඩායම්වලට අසාධාරණකම් වන බවට ලැබී තිබුණු චෝදනා සැලකිල්ලට ගනිමින් මෙකී නව තීරණයට එළැඹි බව ශ්‍රී ලංකා වොලිබෝල් සම්මේලනයේ ලේකම් ඒ.එස්. නාලක පවසයි.

මේ අනුව ආධුනික කණ්ඩායම්වලට ඇතුළත් වන කණ්ඩායම් සිය අයදුම්පත් යොමු කිරීමේදී ක්‍රීඩක ක්‍රීඩිකාවන් 14 දෙනෙකු නම් කළ යුතු අතර ඉන් නව දෙනෙකුම තරගාවලියට ඉදිරිපත් වන දිස්ත්‍රික්කයේ ලියාපදිංචිය වීම අනිවාර්ය කර තිබේ.

මංචි ජාතික වොලිබෝල් ශූරතාවලිය ආධුනික හා සුපර් ලීග් වශයෙන් කාණ්ඩ දෙකක් යටතේ තරග පැවැත්වෙන අතර, සුපර් ලීග් තරගාවලියට දිවයිනේ ප්‍රබල පිරිමි කණ්ඩායම් අටක් සහ කාන්තා කණ්ඩායම් හයක් තරග කරති. කොවිඩ් වසංගතය නැවත පැතිරීම නිසා සියලු තරග කල්දැමූ බව වොලිබෝල් සංගමයේ ලේකම් නිවේදනය කර තිබේ.

පසුගිය වසරේ පිරිමි සුපර් ලීග් ශූරයන් වූ යුද හමුදා කණ්ඩායම සමඟ වරාය, පොලිසිය, තරුණසේවා, ගුවන්, නාවුක, විදුලිබල මණ්ඩලය, ඕෂන් ලංකා මෙවර තරගාවලියට එක්වෙයි. කාන්තා සුපර් ලීග් ශූරයන් වූ ගුවන් හමුදා කණ්ඩායම සමඟ වරාය, යුද, නාවික, හයිඩ්‍රාමනී, මහඋස්වැව රතනපාල කණ්ඩායම් තරග කිරීමට නියමිතය.

දැක්ම

හොකී ක්‍රීඩාව වළපල්ලට යෑම වළක්වමු

අදක්ෂ, අකාර්යක්ෂම නිලධාරීන් නිසා ලාංකේය ක්‍රීඩාව වළ පල්ලට ගමන් කරන්නේ අද ඊයේ සිට නොව කාලයක සිටය. ලාංකේය භූමියේ ක්‍රීඩා සංගම් - සම්මේලන 60ක් පැවැතියද අදටත් කතාබහ කිරීමට හැකියාව ඇත්තේ ක්‍රීඩාවන් කිහිපයක් ගැන පමණි. මේ අතරින් ජාත්‍යන්තරය ජයගත හැකි ක්‍රීඩාවන් රැසක් පැවැතියද අද ඒවාට අත්වී ඇති ඉරණම කනගාටුදායකය. දක්ෂ ක්‍රීඩක ක්‍රීඩිකාවන් මේ රටේ ඕනෑම ක්‍රීඩාවකින් ජාත්‍යන්තරයට අභියෝග කළ හැකි මට්ටමක සිටිය ද ක්‍රීඩාවට මෙන්ම මොවුන්ට ලැබෙන කුඩම්මාගේ සැලකිලි නිසාම එකී දක්ෂතාවන් උපන්ගෙයිම මියැදුණු අවස්ථා නැතුව නොවේ. තනතුරුවලට කෑදරකමින් ක්‍රීඩාව සහ එහි නිරතවන්නන් අමතක කර දමා නිලධාරීන් තම තමන්ගේ පෞද්ගලික අරමුණු වෙනුවෙන් සටන් කරන පසුබිමක දකුණු ආසියානු සහ ආසියානු මට්ටමේ සටනක් දිය හැකි ක්‍රීඩා අතරින් බොහෝමයක් මේ වන විට වළපල්ලට ගමන් කිරීම පිළිබඳ බලධාරීන්ගේ අවධානය යොමු විය යුතුය. අද වන විට ලාංකේය හොකී ක්‍රීඩාව මේ අතරින් ඉදිරියෙන් ම පසුවෙයි.

ඩන්කන් වයිට්ගෙන් පසු මෙරටට ඔලිම්පික් පදක්කමක් දිනා ගන්නට වසර 52ක කාලයක් ගතවිය. 2000 සිඩ්නිහිදි සුසන්තිකා ජයසිංහ ඔලිම්පික් පදක්කම දිනා ගත්තාට පසුව බොහෝ දෙනා සිතුවේ ඔලිම්පික් පදක්කමක් දිනා ගැනීම කජු කන්නාක් මෙන් සුළු වැඩක් බවයි. නමුත් සුසන්තිකාගේ සිට ගෙවී ගියාවූ දශක දෙකක පමණ කාලය තුළ ඔලිම්පික් උලෙළවල් හතරක් පසු කළද වයිල්ඩ් කාඩ් ක්‍රමයෙන් බැහැරව හරිහැටි ඔලිම්පික් නියෝජනය කිරීමටවත් ලාංකිකයකු බිහි කර ගැනීමට මෙරට ක්‍රීඩාවට නොහැකිවී තිබේ.

ක්‍රිකට් ක්‍රීඩාව හැරුණුවිට තවත් බොහොමයක් ක්‍රීඩාවලින් ජාත්‍යන්තරයට යා හැකි වුවද අද ඒවා බොහොමයක් අමතක කළහොත් මෙරට ක්‍රිකට් ක්‍රීඩාව පමණක් ඉතිරිවී අනෙක් ක්‍රීඩාවන් තව තවත් ප්‍රපාතයටම ඇද වැටුණු නියතය. 1996 ක්‍රිකට් ලෝක කුසලානය දිනා ගැනීමෙන් පසු මෙරට බොහෝ ක්‍රීඩා ඇමතිවරු ද ක්‍රිකට් පමණක්ම කරපින්නා ගෙන ඉදිරියට ගියා මිසක් අනෙක් සියලුම ක්‍රීඩාවන් අමතක කර දැමූහ. පසුගිය මාර්තු 01 දා ලෝක ශ්‍රේණිගත කිරීම් අනුව මෙරට හොකී ක්‍රීඩාව පසුවන්නේ 42 වැනි ස්ථානයේය. අසල්වැසි ඉන්දියාව ලොව සිවුවැනි සහ දකුණු ආසියාවේ ප්‍රථමයා වන විට පාකිස්තානය දකුණු ආසියාවේ දෙවැනියා සහ ලොව 17 වැනි ස්ථානයේ පසුවෙයි. ලොව ශ්‍රේණිගත කිරීම්වල ඉහළ ස්ථානයක් ශ්‍රී ලංකාව හිමිකර ගෙන ඇත්තේ 2007 දීය. ඒ 34 වැනි ස්ථානයයි. ආසියාවේ ප්‍රබලයන් ඉදිරියේ පවා සටන් කර ඉදිරියට පැමිණීමට හැකි හොකී ක්‍රීඩාව පිළිබඳ නාමල් රාජපක්ෂ අමාත්‍යවරයාගේ හෝ අවධානය යොමු වන්නේ නම් මෙරට හොකී ක්‍රීඩාවේ අනාගතය මෙන්ම ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ හෙට දවස සුරක්ෂිත වනු ඇත.

ලාංකේය හොකී ක්‍රීඩාවේ මහගෙදර මාතලේ වුවද අද වන විට මාතලේ හොකී ක්‍රීඩාව අතීත මතක සටහන් බවට පත්ව තිබීම ගැන බලධාරීන් අවධානය යොමු කළ යුතුය. කිලෝමීටර් හැට පන්දහසක් වන මෙරට භූමිය තුළ අද කටක් ඇර කතා කිරීමට ඉතිරිව ඇත්තේ තුරග තරග පිටියේ ඇති හොකී ක්‍රීඩාංගණය පමණි. ක්‍රීඩාවක් දියුණු වන්නට, ඉදිරියට යන්නට නම් යටිතල පහසුකම් අත්‍යවශ්‍ය බව අමුතුවෙන් පැහැදිලි කර දිය යුතු නොවේ. හොකී ක්‍රීඩාංගණයක තණතීරුව දිගින් මීටර් 91.4ක් සහ පළලින් මීටර් 55කි. මෙවැනි තණතීරුවක්වත් සකසා ගැනීමට මෙරට හොකී පාලකයන්ට බැරි නම් ක්‍රීඩාව තවදුරටත් අයාලේ යාම වැළැක්විය නොහැකිය. ක්‍රිකට් ක්‍රීඩාවට සෑම යටිතල පහසුකමක් සියයට සියයක් නැතත් වැඩි ප්‍රමාණයක් පවතින විට, හොකී වැනි ක්‍රීඩාවට අවම පහසුකම් ටිකවත් තිබිය යුතුය. මෙරට හොකී ක්‍රීඩාවට ප්‍රධාන වශයෙන්ම පැවැතියේ තුරග තරග පිටියේ හොකී ක්‍රීඩාංගණය සහ මාතලේ නන්දිමිත්‍ර ඒකනායක හොකී ක්‍රීඩාංගණය පමණි. කොළඹ සහ මාතලේ කේන්ද්‍රගතව ලාංකේය හොකී ක්‍රීඩාව සුබදිසාවකට ගමන් කරනු ඇතැයි බොහෝ දෙනා බලාපොරොත්තු වුවද අද වන විට එකී බලාපොරොත්තු ලත් තැනම ලොප් වී තිබේ. ලංකාවේ දිස්ත්‍රික්ක මට්ටමින් කෙසේ වෙතත් පළාත් මට්ටමින්වත් මෙරට හොකී ක්‍රීඩාව ඉදිරියට නොගිය අතර, අද එය කොළඹ හොකී ක්‍රීඩාංගණයට පමණක් සීමා වී තිබේ. සාමාන්‍යයෙන් හොකී ක්‍රීඩාංගණයක් වසර පහකට වරක්වත් නිසි පරිදි නඩත්තු කළ යුතු නමුත් නන්දිමිත්‍ර ඒකනායක ක්‍රීඩාංගණය වසර 15ක් පමණ නඩත්තුවකින් තොරව භාවිත කිරීම නිසා අද වන විට සම්පූර්ණයෙන්ම විනාශ වී තිබේ.

ලණු පැඳුරුවල ක්‍රීඩා කර ක්‍රිකට් ක්‍රීඩාවට පිවිසිය හැකි නමුදු ජාත්‍යන්තර කරළියේ ඉදිරියට යාමට නොහැකිය. එමෙන් හරක් තණ බුදින ක්‍රීඩාංගණවල හොකී ක්‍රීඩා කර ජාතික මට්ටමේ ක්‍රීඩකයකු වීමට තියා පාසල් මට්ටමේ දක්ෂයකුවත් වීමට නොහැකි බව අමුතුවෙන් පැහැදිලි කළ යුතු නොවේ.

දීපානි

මතකය

ආලින්දයේ
මේසය මත
දම්පැහැ වීදුරු මල් වාස් එක
ඊයේ රෑ එයා අතින් බිඳුන
අතපසු වීමක් වෙන්නත් ඇති
ගාඩිනිය මල් සුවඳ නම්
තාමත් සාලෙ පුරා ඇවිදිනව
අද පෝය දවසක් වුණත්
විටින් විට
සඳ වැහෙනව
වලාකුළු ඉතින්
එක තැන ඉන් නැනෙ
පෝයට පස්සෙ
වහින්නෙ නම් කලාතුරකින්

වජිර කුමාරසිංහ

අපේ කප්රුක

බඳ බදා සිටි පැටව්
එක එකා දන් දිදී
අප බොජුන සරු කළ
වහලටත් වියන් බැඳි
ඒ විසල් කොස් ගස

කොස්කොළ ඔටුණු ලා
එ තුරුමුල රජවුණ
අයියගේ රජ සබේ
මහ ඇමතියෙකු වුණෙමි
මා එදා ගෙමිදුලේ

එදා රඟ පෑ රජ කතා
නැරඹුවා අප මවුපියෝ
පුර වැසියො සේ අගු පිලේ
තුටුවෙමින් අභිමානයෙන්

සරසවි කිරුළ දිනු
මගේ අයියා
සැබවින්ම රජෙකි අද
සේනාව පිරිවැරූ

මෙවලමින් සන්නද්ධ
සෙබළ යුවළක් සමඟ
සැපත් වී ඇත අයියා
පැරණි රඟ මඬලට

දැව දඬු කපන්නට
සිදාදියෙ ඉදිවන
අලුත් මාළිගාවට

කැටුව යමි අම්මා
නාන දොළ අසලට
බිඳින හඬ නැසෙන්න
අප වැඩූ කප්රුක

පද්මසිරි හේරත්

කවි සිතක මහිමය

රුහුණු රට ගැමි ගෙදර සුවඳැල් බත රසයි
වන අරණෙ විහඟ කැළ ගැයූ ගී මිහිරිමයි
ගැමි කමේ - බොදු දමේ අරුත් කිව්වේ ඔනුයි
සියල් රසවත් හැඟුම් කවියාට අගේමයි

ඇත වන වදුලුවල රුව ගුණය පෙන්වමින්
"හෙල් මැලි පෙති අතරේ සිළිලාරෙ" හඬ අසා
අපත් අඬ ගසාගෙන සොබාදම් රස සෙවූ
ගැමි සුවඳ විහිද වූ රසවතා ඔබ තමයි

"වැලිතල අතරෙ" නේරංනා ගඟ ගලනා
"මහබෝවන්නම්" රඟ දෙන හඬ ඇසුනා
"බුද්ධ දිවාකර" බුදු සිරිතේ රුව ගුණ හැඟෙනා
භක්ති රසය මුසු ඔබේ ගී හද රැවුනා

"රුචිරාණනී" අමතමින් "දෛවයෝගයේ"
ප්‍රේමයේ සොඳුරුතම අරුත මියැසියට නගා
ගීත නාටක "මනෝහාරී" ගුවන් තරගේ පාවෙලා
තුරුණු සිත් සැනසුවා කවි හදක රස මවා

"ගොළු දැරිය" ජීවිතය කියාදුන් මහපොතකි
"වගතුග" තීරුවේ පාඩමකි පාලක දනට
පන්හිඳක් අකාලේ වියැකිලා ගියේ මුත්
නැගු හඬේ ප්‍රතිරාව සදාවට අගේමය

(ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ ගුණ සමරුව නිමිත්තෙනි)

හන්දසිරි හෙට්ටිආරච්චි

බස්රියේ ගායකයා

රිදවමින් ගිටාරය මන්ද ස්වරය මතින
ඔහු ගැයූ පෙම් ගීය පෙම්වතුන් අසල හිඳ
ජෝති - ඇන්ජලින් ගැයූ යුග ගීය පරිදිමය
මියුරු සර එම ගීය මැවිලා පෙනේ මට

'දුක හාදු දෙන රැයේ' කපුගේ සදිසිමය
කෙලෙස මම අදහම්ද කපු මියැදුණු වගක
කපුගේ යළි අවුත් පෙනේ මට ඔහු තුළින
සුපිරි ගායකයෙක්ය මහ මගෙහි සැරි සරණ

අසන්නන්ගේ ගීත ගයයි නැත විඩාවක්
ඉංග්‍රීසි ගායනා ඇසේ සුමිහිරි හඬින්
හින්දි ගී ගයන විට ඇතේ පෙම්බර බවක්
විසිල් හඬ සමඟ එයි මන බඳින ගීතයක්

ගිටාරය කර හොවා අත පායි මඟී කැළට
අත පුරා ලැබෙයි මිල මුදල් තුටු පඬුරු ලෙස
බස් රියෙන් බස් රියට යනෙන මහ නුවර මැද
ගීතයෙන් ඔහු රකී මැණියන පියාණන

උදේනි සරත්චන්ද්‍ර

විදෙස් කවිය

රතු ගමන් මල්ල..

ආතතිය දරන්නට බැරි ලෙසින් තැති — ගැණුනු
ළපටියන් හඬන හඬ කන් පුරා රැව් — නැඟුණු
දිවා කල පටන් ගෙන රැයේ ඉම තෙක් — ඇදුණු
ඉතා දිග වෙහෙසකර ගුවන් ගමනකි — ගෙවුණු

පොළෝ බට අහස් නැව සෙලවෙමින් — නැවතුණි
හිස් අහර බඳුන් මත් වතුර බිම — ඉහිරුණි
උඩින් පා තබා යානයෙන් බැස — ගත්තෙමි
ගමන් මළු කරකැවෙන පටිය වෙත දිව — යමි

පටිය රවුමට දිවේ ගමන් මලු — කරකැවෙත
නොඉවසුම් මඟියෝය නෙත් හෙළාගෙන — එදෙස
ගමන් මලු අතර මැද තිබූ ලෙසටම — තිබෙන
සමහරක් තිබේ එහි තැලුණ පොඩි වුණ — ඉරුණ

කළු පාට පටිය මත කිහිප වටයක් — රැඳුන
රතු පුංචි සූටකේසයක් මා නෙත — ගැටෙන
කිසි ලෙසක හිමි කමක් නොමැති බව දැන — දැනම
බලා ඉන්නෙමි එදෙස මෝඩ දෙනෙතක — මහිම...!

රතු ගමන් මල්ල මම දනිමි එය ඇ — සතුය
වසර සතකින් මා හට ඇයව හමු වී — නැතිය
කරකැවෙන යකඩ පටියෙන් නැගෙන — චරචරය
සතුටු මතකයෙ සීනු සිතෙහි හඬවනු — වැනිය

රතු ගමන් මල්ල හිමිකරු මහළු — මඟියෙකි
කරකැවෙන මල්ල ඔහු වෙතට ඔහු — ඇදගති
මගෙ ගමන් මළු ඇවිත් නෙත් අසල — නැවතුණි
ඔහු සේම ඇදගතිමි යන්න පෙර — සැණෙකිනි

වික්‍රම් සෙත් (Vikram Seth) අසූව දශකයේ සිට අද දක්වාම ඉංග්‍රීසි බසින් සාහිත්‍යකරණයේ යෙදෙන ඉන්දීය කවියෙකි, නවකතාකරුවෙකි. පද්ම ශ්‍රී සම්මාන, සාහිත්‍ය ඇකඩමි සම්මාන කිහිපයකට හිමිකම් කියන ඔහුගේ **Around and Around** කවියේ සිංහලානුවාදය යි.

කුමුදිනී වේලාරත්න

හඳවත් සනහාලමු

දනක් දෙන්නට බණ අහන්නට සසරෙ පුරුදුම — අවැසිමයි
පිනක් ඇති හිත නිබඳවම නිති ගුණ දහම්වල — සැරසරයි
මලක් පහනක් පුදන පින්වත් පිරිස දෙව්ලොව පිය — නගයි
මොලොක් කළ හැකි කළු ගලක් වුව දැමුණු මිනිසුන් හද — නිවයි

සැලෙන බෝපත් බෙදෙන සිසිලස ලෝදනා සුවපත් — කරයි
ගලන ගංගා බෙදන දිය බිඳු පවස ඇති සත — සනසවයි
නෙළන මල්වල සුවඳ බුදුහිමි පා පියුම් යුග — විහිදුවයි
හෙළන බැල්මෙහි කරුණාව මෙත් මුදිතා උපෙකා ගුණ — වවයි

පියතිස්ස වික්‍රමසිංහ

දෙවියන්ට පොල් පෙනී

අරක් ගෙන සිටින මේ ගසට පින් සිදු — වෙන්න
කලක් මෙතුවක් සිටිමි නැත දැවූ දුක් — ගින්න
පෙළක් කෙම්මුර දිනට පැමිණ පිහිටක් — ගන්න
නිමක් නැති කන්නලව් කරති හද උණු — වෙන්න..

ලබා පුද සත්කාර පඬුරු පලතුරු — රැගෙන
කළෙමි ලොකු සේවයක් නරයිනට දුක් — විඳින
සමහරෙක් අද ඇවිත් වෛරයෙන් පෙළ — ගැසුණ
හිසට මහබරක් දෙති පොල් ගසා පළි — ගන්න..

හමස් වලු කාලයයි ගහේ පලදාව — නැත
ඇති එකත් ගිනි ගණන් අතමිටද හිඟව — ඇත
මෙහෙව් කල දැන දැනත් මගේ මේ විමන — වෙත
ගසන පොල් ගොඩ වෙලා දැවෙනවා මගේ — හිත

ඇල්බට්.ඇම්. ලියනගේ

සොඳුර නුඹටයි මේ කවි මාලය

හස පිළ වන් රැව් මන මත් කරවන
සැලෙන කියඹු රොද මඳහස නංවන
පියකර පහස මම සුරලොව රැගෙන
සුරඹ නුඹයි මහද බඹසර බිඳින....

රන් ළහිරු කුමර ඇවිදින්
මුව තඹර සිනා පුබුදන
මෘදු පවන් මුවම සිඹිමින්
පිය තෙපල සුබැසි කොඳුරන|....

නිබඳ සෙනේ උල්පත හද නොසිඳාන
ම'බඳ වටා එති එති කෝළම් පාන
බලඳ නුඹේ රූසිරු කවිකම් කරන
පබැඳ එවන් කවි නුඹෙ ගෙල පලඳාන....

චතුර පැතුම් සඳරුවන් වික්‍රමගේ

සිත්තරාණෙනි

ගතින් වියපත් සිතින් යව්වන
සිත්තරාණෙනි ඔබේ තෙලි තුඩ
එදා වගේමයි අදත් බලවත්
මවන සිත්තම් නිවයි සිතකය

දුහුල් සළුපට ඉවතලා ඇඳි
ළඳක සියුමැලි ගතේ රුසිරිය
අවදි කෙරුවා ලයේ සෙනෙහස
නිසල කරවාමනක් සලෙළුන්

මුනිඳු ගුණ කඳ දෙතිස් ලක්ෂණ
එකළු කරවා මැවූ බුදුරුව
මගේ සිත මෝහනය කරවා
සසල සිතුවිලි නිසල කෙරුවා

ජගත් රූපසිංහ

කුරුළු පැන

තනි පංගලමේ ආපු
පුංචිම පුංචි කුරුල්ලෙක්
එබී මගෙ කුටියට
අසයි ඇයි නුඹ
තනියම

නයනසේන වන්නිනායක

හමුවෙමු දවසක්

දවසක සවසක යළි අප හමු වී
ඔබ මා ආ ගිය ඒ මඟ තොටවල
අත්පටලා නොව ගැවි නොගැවී
යන්නට ඇත්නම් මේ හිතුමත්තේ

ගෙවුණු කාලයේ මං මාවත් දිග
ආ ගිය තොරතුරු කතා කරන්නට
හැකිව ගියෝතින් සිනහ නගන්නට
ඔහුට ඇයට අප හමුවූ තැන් ගැන

යළි අරඹන්නට හැකිය කතාවක්
හිනැහී හඬලා යන්න වතාවක්

දිස්නා ධනංජනී

මුහුණු පොතෙන් කවියක්

මා දැන් තුසිතයෙහි ය

දිනක් ඔබ අහස ට
අත දිගුකර තුසිත ය
මේ යැයි පෙන්වද්දී මා,
තදින් පොළොව මත
දෙපා පිහිටුවා
බොරළු කැට පහස
විඳ ගතිමි

තව දිනක්
තාරකා ප්‍රහර්ෂයෙන්
උද්දාමයට පත් අවන්හලක දී,
රැඟුමකට අත පානවිට
ඊට නතු වෙමින්, ඔබ
ගෙලවට වෙළී රඟන, තර
ටක..ටකස් ටක ...ටකස්
උස් පාවහන් පොළව මත
ගැටී ගැටී එහි රිද්මය,
වෙළඹක වේශයෙන්
මා ගෙන ගියේ
නගර කෙලවරෙක ඇති
පැල්පත් වාසී පහන්
නිවී ගිය වීදියක
සුසුම් හඬ දිශාවටයි
ඉදින් දැන් අසා ගනු මැන

සබඳ නුඹ ට තුසිතය දිශාවකි
බලන් මතින් පිරි දෑස් හැර,
මා දැන් තුසිතයෙහි
ඇවිද යමි, මනරම් ය එය

දමයන්ති ගල්පායගේ

ඔබේ කවි නිර්මාණ පහත ලිපිනයට එවන්න
සිළුමිණ, කවි පිටුව,
ලේක්හවුස්, කොළඹ 10.
edmediaunit@gmail.com

ඉඩෝරය ඉවරයි

ඉඩෝරෙන් ඉරි තැළුණු මහ පොළොව — වසාගෙන
නැවුම් පස් ගොඩ දමයි තණපඳුරු — බදාගෙන
අතීතයේ වියපත්ව රැය ගෙනේ — උදැසන
උදාවේ කොවුල් කූජන ඇසේ — හඹාඑන

දැල්වෙලා වසන්තය පහන්වැට — නොනිමෙන්න
දිගන්තය රසකැවේ හදවතින් — හිනැහෙන්න
අතීතය අනාගතයට නොයේ — නවතින්න
අවසන්ය නිදහසේ කැදැල්ලට — ඉගිලෙන්න

ගෙදොරකඩ අඹගසේ තිබුණු දෝෂය — බිඳී
මලින් මල රොන් රැගෙන ඇත මීවද — බැඳී
මල් සුවඳ පැණි සුවඳ දිනපතා ගෙන — දිදී
ගත සිසිල් කරන්නට මඳ පවන පොර — බදී

සුදුපරවියන් රැන ඉගිලිලාගෙට — උඩින්
සවන් සනහා ගයත් මියුරු ගී වෙණ — හඬින්
ගලා එන ළහිරු කිරණට එක්ව කඳු — බොඩින්
විකසිතය, අරවින්ද සරසවිය එහි — වඩින්

මහට හීනටි වනෙත් කුරුළු තුඩ පීදි — ලා
යලට තල කුරක්කන් අස්වැන්න — නැවතිලා
වී බිස්ස අටුව සිරිකතට නිවහන — වෙලා
පිළිසඳරයේ යෙදෙමු කැදැල්ලට — ඉගිලිලා

ගරාගොඩ ජයරත්න ජයකොඩි

නිතර සිළුමිණ පුවත්පතට කවි ලියූ ප්‍රකට කවියකු වූ ගරාගොඩ ජයරත්න ජයකොඩි කවියා මීට වසරකට පෙර අභාවප්‍රාප්ත වූයේය. ඔහු විසින් ලියන ලද අවසන් කවි පෙළ 'ඉඩෝරය ඉවරයි කවි පෙළ' කවියාගේ බිරිඳ විසින් අප පුවත්පතට යොමුකරන ලදි.

සතියේ කවි පෙළ

කෘතිය - සෘතු අග ශේෂ පත්
කර්තෘ - උපෙකලා අතුකෝරළ
මිල- රු: 250/= පිටු 68
සන්ථව ප්‍රකාශනයකි

"සෘතු අග ශේෂ පත්" උපේකලා අතුකෝරළගේ තුන්වැනි කාව්‍ය සංග්‍රහයයි. ඇගේ පළමු කාව්‍ය සංග්‍රහය වන්නේ 2012 කළ "පරතරය" කාව්‍ය සංග්‍රහයයි. දෙවන කාව්‍ය සංග්‍රහය වන්නේ 2015 දී එළි දක්වන ලද "සංක්‍රාන්තියක සැණකෙළි" කාව්‍ය සංග්‍රහයයි.

සෘතු අග ශේෂ පත් කාව්‍ය සංග්‍රහයේ ඇය ලියන්නේ ඇයට දැනුන දේය. ඇය විදින අත්විදින අත්විදි දේය. නිවීම එකම මාතෘකාව වුවද එක් එක්කෙනා එය අර්ථ දක්වන විදිය වෙනස්ය. පරිච්ඡේද ගණනාවකින් නිවීම ගැන කෙනෙකු අර්ථ දක්වන විටෙ කිවිඳ එය ජේලි හතරකින් ගෙන හැර දක්වයි. ඒ ඇය නිවීම දකින ආකාරය යැයි සිතේ. නමුදු මේ කෙටි වදන් තුළ ඇ කියූ මෙන්ම අපට සිතන්නට පොළඹවන බොහෝ දිග දුර අදහස් ඇත.

"හන්තාන සිඹ වැටි මහවැලිය වඩාගත්
දිගු පවන් නැටූ සෘතු අග සේශ පත්
සුළි මවා මඟ කැළඹූ දිය මතම වී තිරස්
සීරුවට පාව විත් ඉවුරු තුරු යට නිවෙත්"

ජීවිතයට ඕනෑතරම් මිනිසුන් හමුවේ. අප ඒ හැම කෙනෙකුටම සිතෙන් බැඳෙන්නේ නැත. ඇතැමුන් කුමක් හෝ හේතුවක් නිසා සිත ගනී. ඒ සිත ගත් අය අතරිනුත් ජීවිතය සමඟ එක්ව ගමන් කරන්නේ ඉන් වඩාත්ම සිත් ගත් කෙනාය. මෙතෙක් ආ ගමනේදි අතරමඟ අතහැරුණු, අතහැර දැමූ සිතින් පමණක් බැඳි සිටිය වුන් අද කොහෙදැයි ආපසු හැරි බැලීමේදි සිතේ. එක්කෝ ජීවිතය වියපත් වීය. නැත්නම් තේරුම් ගැනීම්, තේරුම් ගැනීමට අසීරු වීම් හෝ වෙනත් කුමක් හෝ හේතුවක් නිසා සියල්ලෝ අතහැරි ඇත. ජීවිතය කොටට වී ඇත. නමුදු කොටට වූවා යැයි කියන්නේ අපහාසයක් නොවේ. අත්දැකිම් වලින් පරිපූර්ණ වුවා වන්නට බැරි නැත. මන්ද කොටට වන තරමට යම් ඵලයක් කාලයක් තියෙන්නේය. එය යළිත් දිය පොහොර දමා පෝෂණය කරන්නේ නම් දළුලා වැඩෙන්නේය. කිවිඳිය මේ කියන්නට තැත් දරන්නේද එවන් කතාවකි. යම් යම් දේ , ඉවත ලිය හැකි දේ ඉවත විසි කළ විට ගෙවුණ ජීවිතයේ ගන්නට දෙයක් ඇත. ඇගේ මාතෘකාව "බිජු".

.උපෙකලා අතුකෝරළ

දෙදෙනෙකු අතර පෙමක් වුව පලදරන්නේ දෙදෙනාගේ අදහස් යෝජනා, තේරුම් ගැනීම් ගැලපුණ විටය. නමුදු දෙදෙනාගෙන් දෙදෙනාටම ඵලක් නොවූ විට එය ද බිඳි යන්නේය. මේ කවියේ අන්තිමට කිවිඳිය ජීවිතයේ අතර මඟ හමු වී අතහැරිය, මඟහැරිය මඟහැරුණ පිරිමින ගැන ලියන්නේ උපහාසයෙන් මෙනි.

එක සැනින් හද පළා
බිජුව දෝතට ගනිමි
කොටට වූ ජීවිතේ
කටට විසිකර දමමි..
පෙහෙළි නිම්නය අරා
එ'ඇට විසිකර හරිමි
මුල් සිදී ගල්ව ගිය
කඳුළු ඉස බිම තෙමමි..
පස පළා දෙපෙතිලන
ජීවයට පණ පොවමි
මතක පරඬලාපත්
කිරි මුල්හි පස් කරමි...
කලක් පන පොවා ගත්
පන්නරය ඉහළා ගමි
සරතැසින් සැලෙන්නට
ළඳැල්ලට ඉඩ නොදෙමි...
තනිව මා පෙම්බැන්ද
මානවකයන් අඹමි
පඹයන්ට අන්දවා
නියර මිටි තැන අනිමි...

අපට එක් එක් සිහින ඇත. එක් එක් කෙනා මෙන් වන්නට සිහින ඇත. කෙනෙකුට මෙසේ ද සිතිය හැකිය. "මට ඔනි දෙමලිච්චියක් වෙන්න". ඒ කිවිඳියගේ කවියේ මාතෘකාවයි. "කුරුල්ලෙක් වගේ ඇත අහසේ පියඹලා යන්නට ඇත්නම්" ජීවිතයේ යම් දිනෙක මට ද සිතී ඇත. එය ඔබට ද සිතී ඇතුවාට සැකක් නැත. නමුදු කිවිඳිය කියන්නේ නිතර දෙවෙලේ තොරතෝංචියක් නැතිව කියවන කුරුලු ලොවේ පුංචි කුරුල්ලෙකු වෙන්නට ඇත්නම් ඇයට පුංචි පුංචි තක්කඩිකම් කරන්නට ඇති හැකියාවයි. ඒවා මිනිසුන් පෙළන , උනුන් පීඩාවට පත් කරන්නක් නොවේ. මේ සමාජ වැසියන් හැසිරෙන, කටයුතු කරන ආකාර ගැන ඇතැම් අවස්ථාවල අපට ප්‍රශ්න ඇත. නමුත් ඒ පිළිබඳ ප්‍රශ්න කිරීමේ ඔවුන් හා පැටලෙමින් ඒ ප්‍රශ්නයේම ගිලි සිටීමේ ඒවාට විසඳුම් හෙවීමේ ක්‍රමයක් ද අපට නැත. නමුදු ඒ කිසිවකට එරෙහිව නොගිය ද දෙමලිච්චියක් වන්නට පුළුවන් නම් හිතේ ඇති පීඩාව පිටකර හරින්නද පුළුවන. එය කෙනෙකුට රිදවීමක් දඬුවම් දීමක් නොවේ. ඒ කෙසේ ද යත්

"මට ඔන දෙමලිච්චියක් වෙන්න
හිතේ ඇති දේ මහ හඬින් පවසන්න
පුහු මානයේ මාල කඩා විසුරාලන්න
කෙටි උසින් ළඟ ළඟ පියඹන්න
සද්ද බද්දේ නැතුව දුෂ්ටයන් හිසමතට
චුරුස් ගා වර්චස් හෙළා හැංගෙන්න
හීන් සැරයේ චොර මුණු දැක ගන්න
කට මැත නොදොඩාම නික්මෙන්න
මට ඔන දෙමලිච්චියක් වෙන්න...."

හැම ගැහැනියකම විවාහ වන්නේ නැත. විවාහ වුණ දඇතැම් විවාහයන් රදා පවතින්නේ ද නැත සියල්ල සම්පූර්ණ තරුණියකට හිමියෙකු නොලැබුණ විට ගමේ ගොඩේ කතාවක ඇත්තේ සසරේ පතාගෙන නොපැමිණි නිසා ඒසේ තනිකඩ වී ඇති බවය. පතා ආගෙන කෙනෙක් නොමැතියෙන් තනිකඩව සිටින්නට එකම හේතුව එයමද? ඇය සමාජයෙන් ප්‍රශ්න කරන්නේ යැයි සිතේ.

"සමහර යශෝදාවන්" ඇය එසේ ලියයි
"සමහර
යසෝදාවන් වෙත්
පතාගෙන නොආවෙත්
තනි ගමන්....."

ගැහැනිය බොළදය, සුරතල්ය, සියුමැලිය, කාරුණිකය, මේ ආදි වූ තවත් බොහෝ වචන කියමින් ඇය ගැන වර්ණනා කළ හැකිය. නමුදු එදා සමාජයේ පමණක් නොව අද සමාජයේ ද රාමුවෙන් පිට පැන සමාජය දෙස බලන ලේඛනයේ යෙදෙන්නියෝ අපට හමුවේ. "අතු අග ශේෂ පත්" කියවාගෙන යද්දි උපේකාද එවැනි රාමු බිඳගෙන යන, සාම්ප්‍රදායික සිතුම් පැතුම් ඇති ගැහැනිය ඉක්ම වූ කිවිඳියකැයි සිතේ.

ලෝකය පුරා චිත්‍රපට සමාගම්වල කොටස් මිල බිමටම වැටිලා!

ටියුෂන් පන්තියෙන් වැහුණු සිනමා ශාලා

ටියුෂන් පන්ති කටි කළ තරුණ තරුණියන් චිත්‍රපට නරඹන්නට ශාලාවලට ඇතුළු වූ යුගය කණපිට හරවමින් සිනමා ශාලාවේම ටියුෂන් පන්ති පැවැත්වීමේ තත්වයක් හෙට අනිද්දාම ඇති වීමට යන බව දැන ගන්නට ලැබී තිබේ. වෙනසකට ඇත්තේ ශාලාවේ පන්ති පටන් ගනු ලබන්නේ ඒවා චිත්‍රපට ප්‍රදර්ශනයෙන් සදහටම සමුගැනීමත් සමඟ වීමය. දැනටමත් ගම්පහ නගරයේ සහ අගනුවර පිහිටි දීර්ඝ කාලීන ඉතිහාසයකට හිමිකම් කියනු ලබන සිනමා ශාලා දෙකක් මේ ආකාරයට ටියුෂන් පන්ති සඳහා කුලියට දීමට තීරණය කර ඇති බව දැන ගන්නට ලැබී තිබේ.

රට අභ්‍යන්තරයෙන් හිටිවනම මතු වූ දෙවන කොරෝනා රැල්ලත් සමග ජනතාව කඩ සාප්පු හිස් කරන්නට පටන් ගෙන ඇති

> **සමස්ත අර්බුදය හේතුකොටගෙන ශ්‍රී ලංකාව තුළ සිනමා කර්මාන්තයට සිදුවූ පාඩුව කොතෙක්දැයි කිසිවෙකු නිශ්චිතව ගණන් බලා නැත. ජාතික චිත්‍රපට සංස්ථාව තුළින්ද එවැනි නිශ්චිත ගණන් හිලව්වක් ලබා ගත නොහැකිව ඇත්තේ පසුගිය කොරෝනා කාලය තුළ මෙවැනි ගණන් බැලීම් උදෙසා කටයුතු කිරීමට නිශ්චිත සේවක පිරිසක් නොසිටි බැවිනි.**

04. අයදුම්කරුවන් තම මිල ගණන් ඉදිරිපත් කිරීමේදී වැට් බදු සඳහා ලියාපදිංචි අංකය සඳහන් කර තිබීම අනිවාර්ය වේ. වැට් බදු සඳහා ලියාපදිංචි නොවූ සැපයුම්කරුවන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජෙනරාල් වෙත ලබාගත් වැට් බදු ලියාපදිංචියෙන් නිදහස් බවට සත්‍යාථ කරන සහතිකයක් අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතුය. තවද, ඉහත අවශ්‍යතාවයන් සපුරා නොමැති මිල ගණන් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

05. අයදුම්කරුවන් විසින් මිල ගණන් ඉදිරිපත් කිරීමේදී ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"ශ්‍රී ලංකා නාවික හමුදාවට 2021වර්ෂය සඳහා වෛද්‍ය විෂයයන් සැපයීම සඳහා කොන්ත්‍රාත් මිල ගණන් ඉදිරිපත් කිරීම"** (විෂයය කාණ්ඩය) එස්එල්එන්/සීඑම්එස්/...../ආර්සී/2021 ටෙන්ඩර් පත් විවෘත කරන දිනය, වේලාව සඳහන් කර පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවීමට හෝ පහත ලිපිනයේ තබා ඇති ටෙන්ඩර් බහාළුම් පෙට්ටියේ තැම්පත් කිරීමට කටයුතු කළ යුතුය.

    සභාපති,
    දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
    ශ්‍රී ලංකා නාවික හමුදාව,
    නාවික හමුදා මූලස්ථානය,
    තැ.පෙ. 593, කොළඹ 01.

06. මිල ගණන් භාරගන්නා අවසාන දිනය හා වේලාව පසුවූ වහාම ලද අයදුම්පත් විවෘත කරනු ලැබේ. අයදුම්කරු හෝ ඔහුගේ බලයලත් නියෝජිතයකු හට මිල ගණන් විවෘත කරන අවස්ථාවට සහභාගි විය හැකිය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරන අතර, විවෘත කිරීමකින් තොරව ආපසු භාරදෙනු ලැබේ.

07. තිසි පරිදි සම්පූර්ණ නොකරන ලද මිල ගණන් පත්‍රිකා හා ලිඛිත සාක්ෂි අවශ්‍ය පරිදි ඉදිරිපත් නොකරන ලද, තිසි පරිදි සහතික නොකරන ලද ටෙන්ඩර් පත්‍රිකා ද ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඕනෑම මිල ගණන් පතක් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය සභාපති දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව සතුවේ.

08. තෝරාගනු ලබන අයදුම්කරුවන් වෙත ගිවිසුම් අත්සන් කිරීම සඳහා ලියාපදිංචි තැපැලෙන් දැනුම් දෙනු ලැබේ.

09. ටෙන්ඩර් අයදුම්පත් කිසිදු ගෙවීමකින් තොරව අධ්‍යක්ෂ ජෙනරාල් සැපයුම් හා සේවා, නාවිකා හමුද මූලස්ථානය, කොළඹ 01 යන ස්ථානයේ පරීක්ෂා කර බැලිය හැක.

10. වැඩි විස්තර සඳහා මාණ්ඩලික නිලධාරී (වෛද්‍ය සැපයුම්) දු.ක. 011-7195541 / 0117195543, නාවික හමුද මූලස්ථානය, කොළඹ 01 වෙතින් ලබාගත හැක.

11. මෙම ඒකක කොන්ත්‍රාත් මිල ගණන් කැඳවීම සම්බන්ධ විස්තර නාවික හමුද වෙබ් අඩවිය www.navy.lk මගින්ද ලබාගත හැක.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
ශ්‍රී ලංකා නාවික හමුදාව, කොළඹ 01.

Sabaragamuwa University of Sri Lanka

INVITATION FOR BIDS (IFB)

ACCELERATING HIGHER EDUCATION EXPANSION AND DEVELOPMENT (AHEAD) PROJECT

Bid for renting a building as a Project Office for the Faculty of Geomatics

The Chairman, University Procurement Committee (DPC) on behalf of the AHEAD Project, Sabaragamuwa University of Sri Lanka, invites sealed bids from eligible and qualified bidders for renting a project office under the following categories.

Tender Name & Number	*Item*
AHEAD/SUSL/FOG/2020/01	**A Project Office**

REQUIREMENTS:

- An office area which is located in Bandarawela Municipal area
- Accommodation facilities for 10 persons
- Parking area for at least 2 vehicles
- Three phase electricity
- Furnished premises would be an added qualification

1. Bidding will be conducted through National Competitive Bidding (NCB) procedure.
2. Interested eligible and qualified bidders may obtain further information from Deputy Director/Procurement, OTS Office, AHEAD Project, Sabaragamuwa University of Sri Lanka and inspect the Bidding Documents at the OTS Office, Sabaragamuwa University of Sri Lanka, Belihuloya, from **12th October 2020** until **26th October 2020 from 9.00 a.m. to 3.00 p.m. during working days.**
3. A complete set of Bidding Documents in English language may be purchased by interested bidders on submission of a written application to the address below (mentioned in 5th paragaph) **from 12th October 2020** until **26th October 2020 from 9.00 a.m. to 3.00 p.m. during working days** upon payment of a non-refundable fee of **Rs. 3,500/-** by cash to the Shroff of the Sabaragamuwa University of Sri Lanka.
4. Completed bids should be forwarded in two copies as the original and the duplicate. The original and the duplicate should be enclosed separately and marked as the 'original' and 'duplicate' respectively in sealed envelopes. Then both envelopes are re-enclosed in one sealed envelope marked and indicate the bid number on the top left-hand corner of the envelope.
5. Bids must be delivered or sent under registered post addressed to the **Chairman, University Procurement Committee, OTS Office (AHEAD Project), Sabaragamuwa University of Sri Lanka, Belihuloya, 70140** to reach at or before **2.00 p.m. on 27th October 2020.** Late bids will be rejected. Bids will be opened in the presence of the bidder or his/her representative who chooses to attend in person immediately after closing of bids on **27th October 2020.**
6. The decision of the University Procurement Committee shall be final and University reserves the right to reject any tender without giving any reasons. The University may at its discretion, increase or decrease the quantity to be purchased.
7. Further information could be obtained from the Deputy Director/Procurement OTS Office, (AHEAD Project), Sabaragamuwa University of Sri Lanka. Telephone No. 045-2280005.

Chairman,
Procurement Committee,
Sabaragamuwa University of Sri Lanka,
Belihuloya 70140.

දැන්වීමයි

වැවිලි අමාත්‍යාංශය

ශ්‍රී ලංකා තේ මණ්ඩලය

1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල නීතිය
1984 ශ්‍රී ලංකා තේ මණ්ඩල (තේ ගබඩා කිරීමේ) නියෝග
2021 වර්ෂය සඳහා තේ ගබඩා කිරීම සඳහා යොදාගන්නා වූ ගබඩා

ලියාපදිංචි කිරීම / ලියාපදිංචිය අලුත් කිරීම

1984 දෙසැම්බර් මස 05 දිනැති හා අංක 326/17 දරන ආණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද 1984 වර්ෂයේ ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ (තේ ගබඩා කිරීම්) නියෝගවලට අනුව සහ අංක 418/11 හා 1986 සැප්තැම්බර් මස 10 දිනැති ආණ්ඩුවේ අතිවිශේෂ ගැසට් පත්‍රයෙන් සංශෝධනය කරන ලද සහ අංක 1280/8 හා 2003 මාර්තු මස 20 දින ආණ්ඩුවේ අතිවිශේෂ ගැසට් පත්‍රයෙන් තවදුරටත් සංශෝධනය කරන ලද එම නියෝග අනුව එක වරකට කිලෝ ග්‍රෑම් 1000 ක් හෝ ඊට වැඩි තේ ප්‍රමාණයක් ගබඩා කරනු ලබන සියලුම ගබඩා, ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ලියාපදිංචි කළයුතු අතර, එම ලියාපදිංචිය සෑම වර්ෂයකම දෙසැම්බර් 31 දින හෝ ඊට පෙර අලුත් කළ යුතු වේ.

02. මෙම නියෝග යටතේ ලියාපදිංචිය සඳහා වූ ඉල්ලුම්පත්‍ර සහ ඒ සම්බන්ධ වැඩිමනත් විස්තර ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ, තේ අපනයන ශාඛාවේ නියෝජ්‍ය තේ කොමසාරිස් වෙතින් (දු.අ. 0112-504090) හෝ ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ නිල වෙබ් අඩවිය වන www.srilankateaboard.lk මගින් ලබාගත හැක.

03. මේ අනුව, නියමිත ආකෘතිපත්‍ර සම්පූර්ණ කිරීමෙන් පිළියෙල කරගත් 2021 වර්ෂය සඳහා වූ ඉල්ලුම්පත්‍ර, 2020 නොවැම්බර් 30 වැනි දින හෝ ඊට පෙර නියෝජ්‍ය තේ කොමසාරිස් (අපනයන) ශ්‍රී ලංකා තේ මණ්ඩලය, තේ අපනයන ශාඛාව, 574, ගාලු පාර, කොළඹ - 03 යන ලිපිනයට ලැබෙන සේ එවිය යුතුය.

04. මෙම නියෝගවල 1957 අංක 51 දරන තේ පාලන පනත යටතේ තේ නිෂ්පාදනය කිරීම සඳහා ලියාපදිංචි කර තිබෙන කර්මාන්තශාලා හැර තැරැව්කරුවන්, නිෂ්පාදකයින්, සැකසුම්කරුවන්, ප්‍රවාහකයින්, ප්‍රේරකකරුවන්, අලෙවිකරුවන් හෝ ගැනුම්කරුවන් විසින් තේ ගබඩා කිරීමේ කාර්යය සඳහා යොදගන්නා වූ ඕනෑම ගොඩනැගිල්ලක් "ගබඩාවක්" යනුවෙන් අර්ථ නිරූපණය කෙරේ.

05. මෙම නියෝගවලට ඇතුළත් යම් ප්‍රතිපාදනයක් උල්ලංඝනය කරනු ලබන හෝ ඒ අනුව ක්‍රියා කිරීමට අපොහොසත් වන හෝ ශ්‍රී ලංකා තේ මණ්ඩලයට අසත්‍ය තොරතුරු හෝ වාර්තා සපයනු ලබන්නා වූ හෝ ඕනෑම පුද්ගලයෙකු මෙම නියෝගවලට අනුව දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කරනු ලබන්නේය.

06. නව ගබඩාවක් ලියාපදිංචි කිරීමේ ගාස්තුව රු. 25,000/- කි. (8% ක අගය එකතු කළ බද්ද සහිතව සම්පූර්ණ ගාස්තුව රු. 27,000/- කි) සෑම ලියාපදිංචි කිරීමක්ම එම වර්ෂයේ දෙසැම්බර් 31 වැනිද හෝ ඊට පෙර වාර්ෂිකව අලුත් කළ යුතුය. ලියාපදිංචිය අලුත් කිරීමේ ගාස්තුව රු. 10,000/- කි. (8% ක අගය එකතු කළ බද්ද සහිතව සම්පූර්ණ ගාස්තුව රු. 10,800/- කි)

07. ලියාපදිංචි කිරීමේ ගාස්තුව හෝ ලියාපදිංචිය අලුත් කිරීමේ ගාස්තුව මුදලින් හෝ චෙක්පත් මගින් සිදුකළ හැක. සෑම චෙක්පතක්ම "ශ්‍රී ලංකා තේ මණ්ඩලය" නමින් නිකුත් කළ යුතුවේ.

සභාපති,
ශ්‍රී ලංකා තේ මණ්ඩලය,
අංක 574, ගාලු පාර, කොළඹ 03.

කුරුණෑගල ව්‍යාපාරික ස්ථානයක් වහාම විකිණීමට ඇත

පර්චස් 46.8 විශාලත්වයෙන් යුත්, වර්තමානයේ ගබඩාවක් ලෙස පවත්වාගෙන යන, වෙළඳ ගොඩනැගිල්ලකි.

ලිපිනය: අංක 107, උතුරු වටරවුම් පාර, (උඩවල්පොල පාර) කුරුණෑගල.
අමතන්න : 0117640451
0768894519

CargillsBank
BANKING ON THE HUMAN SPIRIT
කාර්ගිල්ස් බැන්ක් ලිමිටඩ්

SUNDAY OBSERVER තරුණී

මංගල යෝජනා

දශක ගණනාවක විශ්වසනීය සේවාව...

පුවත්පත් කිහිපයක දැරිය හැකි මිලකට

SUNDAY OBSERVER
(වචන 15ක් සඳහා) රු. 560/-
- වැඩි වන වචනයක් සඳහා රු. 23/-

(වචන 15ක් සඳහා) රු. 560/-
- වැඩි වන වචනයක් සඳහා රු. 23/-

- ඔබ්සර්වර් පුවත්පතේ පළකරන මංගල යෝජනා දැන්වීම සිළුමිණ පුවත්පතේ පළකරීම සඳහා අමතර රු. 200ක් පමණි.

- සිළුමිණ පුවත්පතේ පළකරන මංගල යෝජනා දැන්වීම තරුණී පුවත්පතේ පළකරීම සඳහා අමතර රු. 300ක් පමණි.

චාමර - 0777 270 067 / අනුෂා - 0777 278 948

දැන්වීමයි

වැවිලි අමාත්‍යාංශය

ශ්‍රී ලංකා තේ මණ්ඩලය

1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල නීතිය
1986 ශ්‍රී ලංකා තේ මණ්ඩල (තේ ඇසුරුම්කරුවන් ලියාපදිංචි කිරීමේ) නියෝග
2021 වර්ෂය සඳහා

තේ ඇසුරුම්කරුවන් ලියාපදිංචි කිරීම / ලියාපදිංචිය අලුත් කිරීම

අංක 386/13 සහ 1986 ජනවාරි මස 28 දිනම දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ඉහත සඳහන් නියෝග ප්‍රකාර, ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ලියාපදිංචි වීමෙන් තොරව, කිසිම පුද්ගලයකු හෝ ආයතනයක් විසින් නිමි තේ ඇසිරීමේ ව්‍යාපාරයෙහි නිරත නොවිය යුතුය.

02. මේ අනුව, අපනයනය සඳහා විවිධ වර්ගයේ අසුරනවල තේ ඇසිරීමේ නිරත වූ සියලුම පුද්ගලයින් කොළඹ - 03, ගාලු පාර, අංක 574 හි පිහිටි තේ මණ්ඩලයේ තේ අපනයන ශාඛාවේ නියෝජ්‍ය තේ කොමසාරිස් වෙතින් (දු. අං. 2504090) ලබාගත හැකි නියමිත ආකෘති පත්‍ර මගින් 2021 වර්ෂය සඳහා ලියාපදිංචිවීමට / ලියාපදිංචිය අලුත් කිරීමට 2020 නොවැම්බර් 30 වෙනි දින හෝ ඊට පෙර ඉල්ලුම් කළ යුතුය. තවද, අදළ ඉල්ලුම්පත්‍ර ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ නිල වෙබ් අඩවියෙන් ද ලබාගත හැකිය. (www.srilankateaboard.lk)

03. නව ඇසුරුම්කරුවන් ලියාපදිංචි කිරීමේ ගාස්තුව රු. 25,000/- කි. (8% අගය එකතු කළ බද්ද සහිතව සම්පූර්ණ ගාස්තුව රු. 27,000/- කි) සෑම ලියාපදිංචි කිරීමක්ම එම වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනිද හෝ ඊට පෙර වාර්ෂිකව අලුත් කළ යුතුය. ලියාපදිංචිය අලුත් කිරීමේ ගාස්තුව රු. 10,000/- කි. (8% අගය එකතු කළ බද්ද සහිතව සම්පූර්ණ ගාස්තුව රු. 10,800/- කි.)

04. මෙම නියෝගවල අන්තර්ගතය මගින් වෙනත් දෙයක් අදහස් නොකරන්නේ නම්, "**තේ ඇසුරුම්කරුවෙකු**" යනුවෙන් අදහස් කෙරෙන්නේ පොලිතින් බෑග්, කඩදාසි පෙට්ටි, තුනි ලෝහ භාජන, පැකට්, ලී පෙට්ටි, ටින්, පිඟන්, මැටි බරණි, බටපොතු පැකට් හෝ වෙනත් ආකාරයක සිල්ලර අලෙවි ඇසුරුම් භාවිත කරමින් කිලෝ ග්‍රෑම් දහයකට නොවැඩි පරිභෝජන හෝ සැපයුම් පැකට්වල තේ අසුරන පුද්ගලයකු හෝ පුද්ගලයින් කණ්ඩායමකි.

05. මෙම නියෝගවලට ඇතුළත් යම් ප්‍රතිපාදනයක් උල්ලංඝනය කරනු ලබන හෝ ඒ අනුව ක්‍රියා කිරීමට අපොහොසත් වන හෝ ශ්‍රී ලංකා තේ මණ්ඩලයට අසත්‍ය තොරතුරු හෝ වාර්තා සපයනු ලබන්නා වූ හෝ ඕනෑම පුද්ගලයෙකු මෙම නියෝගවලට අනුව දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කරනු ලබන්නේය.

06. ලියාපදිංචි කිරීමේ ගාස්තුව හෝ ලියාපදිංචිය අලුත් කිරීමේ ගාස්තුව මුදලින් හෝ චෙක්පත් මගින් ගෙවීම් කළ හැක. සියලුම චෙක්පත් "**ශ්‍රී ලංකා තේ මණ්ඩලය**" නමින් නිකුත් කළ යුතුවේ.

සභාපති,
ශ්‍රී ලංකා තේ මණ්ඩලය,
අංක 574, ගාලු පාර, කොළඹ 03.
2020.10.11

ඔබ සොයන වාහනය තෝරාගන්න බලන්න
සිළුමිණ වාහන පිටු

1950 සිට දිනපතා සහ සතිපතා පත්‍රවල පළවූ හා පළනොව ඡායාරූපවල දළ සේයාපට පුස්තකාලයේ තැන්පත් කර ඇත. ඔබටත් ඡායාරූප ලබාගැනීමට අවශ්‍ය නම් පුවත්පතේ නම, දිනය සහ ඡායාරූපයේ විස්තර සඳහන් කොට ලියා හෝ පැමිණ විමසන්න.

පුස්තකාලයාධිපති
දුරකථන
(011) 2 242 9491

LAKE HOUSE

දැන්වීමයි

වැවිලි අමාත්‍යාංශය

ශ්‍රී ලංකා තේ මණ්ඩලය

තේ කොමසාරිස් අංශය

1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල නීතිය හා 1986 ශ්‍රී ලංකා තේ මණ්ඩල (ඇසුරුම්කරුවන් ලියාපදිංචි කිරීමේ) නියෝග යටතේ 2021 වර්ෂය සඳහා

දේශීය පරිභෝජනය සඳහා තේ ඇසුරුම්කරුවන් ලියාපදිංචි කිරීම

දේශීය පරිභෝජනය සඳහා වෙළඳපොළ වෙත ඉදිරිපත් කර ඇති තේවල ප්‍රමිතිය වඩාත් සුරක්ෂිත කිරීම සඳහා දේශීයව තේ වෙළඳාමේ යෙදෙන සියලුම ඇසුරුම්කරුවන් 2021 වර්ෂය සඳහා ලියාපදිංචි කිරීමට ශ්‍රී ලංකා තේ මණ්ඩලය කටයුතු යොදා ඇත.

ඒ අනුව 1986 ජනවාරි මස 28 දිනැති අංක 386/13 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද ඉහත සඳහන් නියෝග ප්‍රකාරව සියලුම දේශීය තේ ඇසුරුම්කරුවන් ශ්‍රී ලංකා තේ මණ්ඩලය යටතේ ලියාපදිංචි විය යුතු බව මෙයින් දැනුම් දෙමි. දේශීය තේ ඇසුරුම්කරුවන් ලියාපදිංචි කිරීම ප්‍රධාන කාණ්ඩ 03 ක් යටතේ වර්ගීකරණය කර ඇති අතර, ඒ සඳහා ලියාපදිංචි කිරීමේ ගාස්තු පහත සඳහන් කර ඇත.

මාසික විකුණුම් ධාරිතාවය කි.ග්‍රෑ.	ලියාපදිංචි ගාස්තු	8% VAT ඇතුළුව
2500 දක්වා	රු. 5,000.00	රු. 5,400.00
2501 සිට 5000 දක්වා	රු. 10,000.00	රු. 10,800.00
5001 ට වැඩි	රු. 25,000.00	රු. 27,000.00

මෙම ලියාපදිංචිය සඳහා අවශ්‍ය ඉල්ලුම්පත්‍ර පහත සඳහන් ප්‍රාදේශීය කාර්යාලවලින් හෝ ප්‍රධාන කාර්යාලයෙන් ලබාගත හැකි අතර, ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ නිල වෙබ් අඩවියෙන්ද (www.srilankateaboard.lk) ලබාගත හැක.

අංකය	ප්‍රාදේශීය කාර්යාලවල ලිපිනයන්	පරිපාලන දිස්ත්‍රික්ක සහ බැංකු ගිණුම් විස්තර
01.	සහකාර තේ කොමසාරිස්, ශ්‍රී ලංකා තේ මණ්ඩලය, තේ කොමසාරිස් අංශය, 140, අඹගමුව පාර, ගම්පොල. දුරකථන අංකය - 081-2352279	මහනුවර, මාතලේ, කුරුණෑගල, කෑගල්ල, ගම්පොල - ලංකා බැංකු ශාඛාව ගිණුම් අංකය - 0002499151
02.	සහකාර තේ කොමසාරිස්, ශ්‍රී ලංකා තේ මණ්ඩලය, තේ කොමසාරිස් අංශය, අංක 34, ගංගාරාම හරස් පාර, මාගාල්ල, ගාල්ල. දුරකථන අංකය - 091-2232052	ගාල්ල ගාල්ල - ලංකා බැංකු ශාඛාව ගිණුම් අංකය - 0001585875
03.	සහකාර තේ කොමසාරිස්, ශ්‍රී ලංකා තේ මණ්ඩලය, තේ කොමසාරිස් අංශය, 61/1, නව නගරය, රත්නපුර. දුරකථන අංකය - 045-2222136	රත්නපුර රත්නපුර - ලංකා බැංකු ශාඛාව ගිණුම් අංකය - 0001015630
04.	සහකාර තේ කොමසාරිස්, ශ්‍රී ලංකා තේ මණ්ඩලය, තේ කොමසාරිස් අංශය, අංක 23, අලුත් මාවත, උයන්වත්ත, මාතර. දුරකථන අංකය - 041-2222636	මාතර හා හම්බන්තොට මාතර - ලංකා බැංකු ශාඛාව ගිණුම් අංකය - 0001659159
05.	සහකාර තේ කොමසාරිස්, ශ්‍රී ලංකා තේ මණ්ඩලය, තේ කොමසාරිස් අංශය, විශාඛා මාවත, නව බදුල්ල පාර, බණ්ඩාරවෙල. දුරකථන අංකය - 057-2222812	බදුල්ල හා මොනරාගල බණ්ඩාරවෙල - ලංකා බැංකු ශාඛාව ගිණුම් අංකය - 0002067259
06.	සහකාර තේ කොමසාරිස්, ශ්‍රී ලංකා තේ මණ්ඩලය, තේ කොමසාරිස් අංශය, වතුරාන පාර, බදුරලිය. දුරකථන අංකය - 034-2247444	ගාල්ල, කළුතර - (මතුගම/ඇල්පිටිය ප්‍රා. ලේ.) මතුගම - ලංකා බැංකු ශාඛාව ගිණුම් අංකය - 0005121673
07.	සහකාර තේ කොමසාරිස්, ශ්‍රී ලංකා තේ මණ්ඩලය, තේ කොමසාරිස් අංශය, අංක 10, කැලේගාල, නානුඔය පාර, නුවරඑළිය. දුරකථන අංකය - 052-2234695	නුවරඑළිය, හඟුරන්කෙත, අඹගමුව, කොත්මලේ, නෝර්වුඩ්, වලපනේ, හැටන් ලංකා බැංකු ශාඛාව - නුවරඑළිය ගිණුම් අංකය - 84323339
08.	නියෝජ්‍ය තේ කොමසාරිස් (අපනයන), ශ්‍රී ලංකා තේ මණ්ඩලය, තේ කොමසාරිස් අංශය, අංක 574, ගාලු පාර, කොළඹ - 03. දුරකථන අංකය - 011-2504090	කොළඹ සහ අනෙකුත් දිස්ත්‍රික්ක සඳහා ප්‍රධාන කාර්යාලය වෙත චෙක්පත් හෝ මුදල් මගින් ගෙවීම් සිදුකළ හැක.

ලියාපදිංචි ගාස්තුව මුදලින් හෝ චෙක්පත් මගින් ගෙවිය හැක. සියලුම චෙක්පත් "**ශ්‍රී ලංකා තේ මණ්ඩලය**" නමින් ලියා රේඛනය කර ඉදිරිපත් කළ යුතුය. ලියාපදිංචිය සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර නියමිත ගාස්තුව ද සමග තම බල ප්‍රදේශයට අයත් ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ප්‍රාදේශීය කාර්යාලයට හෝ කොළඹ ප්‍රධාන කාර්යාලයට භාර දිය හැක.

සභාපති,
ශ්‍රී ලංකා තේ මණ්ඩලය, අංක 574, ගාලු පාර, කොළඹ - 03. 2020-10-11

ඔබ වෙත තිළිණ කළ
සුනිල් කොස්තාගේ නවතම නිර්මාණය

අහන්න කෙනෙක් නෑ.....

CAN YOU HEAR ME

සඳුදා සිට බ්‍රහස්පතින්දා දක්වා
රාත්‍රී 9.00 ට...

රූපවාහිනී
ரூபவாஹினி
RŪPAVĀHINĪ

වසරේ සම්මානනීය
ටෙලි නාට්‍ය නාලිකාවෙන්
ඔබ හමුවට !

ව්‍යාපෘති කාර්යාලවල හිරවුණු 'මෙගා බිල්'

● තාරක වික්‍රමසේකර

මහ නගර හා බස්නාහිර පළාත් සංවර්ධන අමාත්‍යාංශය හෙවත් 'මෙගා පොලිස්' අමාත්‍යාංශය විසින් නගර සංවර්ධනය පිණිස විශේෂ ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මක කරන ලදී. එයින් 10ක් බස්නාහිර සංවර්ධනය පිණිසම වෙන් කෙරිණි. ඒ අනුව බස්නාහිර පළාත කේන්ද්‍ර කර ගනිමින් පහත ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම පිණිස සැලසුම් කරන ලදී.

1 ප්‍රවාහනය, බලශක්තිය සහ ජලය
2. නිවාස සැපයීම හා පරිපාලන ගොඩනැගිලි ප්‍රතිස්ථානගත කිරීම
3. පාරිසරික කළමනාකරණය සහ අපද්‍රව්‍ය කළමනාකරණය
4.ගුවන් හා නාවික වෙළඳ කේන්ද්‍රයක් බිහි කිරීම
5. මධ්‍යම ව්‍යාපාරික නගරය. (උස් ගොඩනැගිලි වලට සීමා වුණු)
6. කර්මාන්ත හා සංචාරක පුරවරයන් (මීරිගම, හොරණ, මීගමුව සහ අලුත්ගම)
7. විද්‍යා හා තාක්ෂණික නගරය
8 "පරිසර හිතකාමී ජීවනය" (Eco Habitat) සහ වැවිලි නගරය
9. "ස්මාට් ජාතියක්" - ස්මාට් නගර සංවර්ධන ව්‍යාපෘතිය
10. "ශාන්තභාවය" ආධ්‍යාත්මික සංවර්ධනයට මග සැලසීම

මේ සැලසුම් බැලූ බැල්මට රටක් ලෙස ඉදිරියට යාමට හැකි වටිනා කාර්යක්ෂම සැලසුම් බව පැහැදිලි වේ. එසේම මීට අමතරව මේ ක්‍රියාදාමයන්ට විශේෂිත ව්‍යාපෘතිද ඇතුළත් විය. ඒ අතර මීරිගම නගරයෙන් වර්ග කිලෝමීටර් 200ක ප්‍රදේශයක් කර්මාන්ත පුරයක් ලෙස සංවර්ධනය කිරීම, කටුනායක නගරය ගුවන් නගරයක් බවට පරිවර්තනය කිරීම, විද්‍යාව, ජෛව තාක්ෂණය හා නැනෝ තාක්ෂණය පිළිබඳ පර්යේෂණ කටයුතු සඳහා ප්‍රදේශ වෙන් කිරීම, කොළඹ වරායේ සිට ජා ඇළ දක්වා සැපයුම්කරණය සඳහා විශේෂයෙන් අක්කර 1000ක තීරයක් නිර්මාණය කිරීම, අවිස්සාවේල්ල ප්‍රදේශයේ ජනපද කලාපයක් බිහි කිරීම, කළුතර දිස්ත්‍රික්කයට අයත් වන සිංහරාජ වනාන්තර කොටස ආරක්ෂා කර ගැනීමේ අරමුණෙන් වනාන්තර නගරයක් බිහි කිරීම යන සංකල්ප විය.

මේ කරුණු කෙරෙහිද බැලූ බැල්මටම පෙනී යන්නේ දැවැන්ත සංවර්ධන ක්‍රියාදාමයක ඇරඹුමක් බවයි මේ ලෙසින් අතිවිශාල සංවර්ධන සැලැසුමක් ඔස්සේ ජනගත කළ මහ නගර හා බස්නාහිර පළාත් සංවර්ධන අමාත්‍යාංශයට ඒ කාර්යයන් උදෙසා රන් සම්මානයක්ද හිමි විය. ඒ නිවැරදි මූල්‍ය පාලනය සහ කාර්යක්ෂම කාර්ය සාධනය සඳහා වූ රන් සම්මානයයි.

පාර්ලිමේන්තුවේ පොදු ගිණුම් කාරක සභාව මගින් අමාත්‍යාංශ 48 ක් අතරින් නිවැරදි මූල්‍ය පාලනය හා කාර්යක්ෂම කාර්ය සාධනය සඳහා අමාත්‍යාංශ 3 ක් තෝරා සම්මාන පිරිනැමූ අතර ඒ අනුව එහි ප්‍රථම ස්ථානය වූ රන් සම්මානය දිනා ගැනීමට මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය සමත් විය.

එසේ නිවැරැදි මූල්‍ය පාලනය උදෙසා රන් සම්මානයක් හිමි වුවද අමාත්‍යාංශය හරහා ක්‍රියාත්මක කළ ඇතැම් ව්‍යාපෘති කාර්යාල කිසිදු හේතුවක් නොමැතිව වසර ගණනාවක් තිස්සේම සුදු අලියකු බවට පත්ව තිබේ.

2018 සහ 2019 යන වසර දෙකක් තිස්සේම රුපියල් කෝටි 25ක් මේ ව්‍යාපෘති කාර්යාල හරහා විනාශ කර දමා තිබේ.

පසුගිය 2019 වසරේදී පමණක් ව්‍යාපෘති සම්බන්ධීකරණ ඒකකයක් පවත්වාගෙන යාම සඳහා රුපියල් කෝටි 6කට ආසන්න මුදලක් රජයෙන් ලබාදී තිබේ. ව්‍යාපෘති කාර්යාල ලෙසින් පමණක් පවත්වාගෙන යමින් හුදෙක් රැකියා ලබා දීම සඳහා පමණක් මේ කාර්යාල පවත්වා ගෙන ගොස් ඇති බව මේ වන විට අනාවරණය වී තිබේ.

ඒ අනුව බස්නාහිර කලාපීය මහනගර සැලසුම් ව්‍යාපෘතිය, විද්‍යා හා තාක්ෂණ නගර ව්‍යාපෘතිය, සමුද්‍රීය නගර ව්‍යාපෘතිය, ගුවන් නගර හා පරිපාලන නගර ව්‍යාපෘතිය යන ව්‍යාපෘති වලින් පසුගිය වසර 2 තුළ කිසිඳු කාර්යක් ඉටු නොකර එම කාර්ය මණ්ඩලයට පමණක් මුදල් වැය කර ඇතැයි දැනගන්නට ඇත.

මේ පිළිබඳව කළ විමර්ශනයකදී බස්නාහිර කලාපීය හා මහනගර සැලසුම් ව්‍යාපෘතිය මුදල් විනාශයක් බවට අනාවරණය වී ඇති හෙයින් එය වහාම වසා දැමීමට දැනටමත් රජය විසින් තීරණය කර ඇත. එම ව්‍යාපෘති කාර්යාලයට 2018 වසරේදී රුපියල් ලක්ෂ 102 ක්ද 2019 වසරේදී රුපියල් ලක්ෂ 190 ක්ද වැය කර ඇති බව පැවසේ.

විද්‍යා හා තාක්ෂණ නගර ව්‍යාපෘති කාර්යාලය සඳහා 2018 වසරේදී ලක්ෂ 401 ක්ද 2019 වසරේදී ලක්ෂ 482 ක්ද වියදම් කර ඇත.

සමුද්‍රීය නගර ව්‍යාපෘතිය සඳහා 2017 - 2018 වසරවලදී රුපියල් ලක්ෂ 472ක් වැය කර ඇත. ගුවන් නගර හා පරිපාලන නගර ව්‍යාපෘතිය සඳහා 2018 දී රුපියල් ලක්ෂ 807 ක්ද 2019 දී රුපියල් ලක්ෂ 290 ක්ද වැය කර ඇති බවට මේ වන විට අනාවරණය වී තිබේ.

රන් සම්මාන දිනූ අමාත්‍යාංශයට ඉතා කෙටි කලකදී වූයේ කුමක්ද යන්න අපි විමසා බලමු. 2019 පෙබරවාරි 28 වැනිදා අයවැය කාරක සභා විවාදය යටතේ පාර්ලිමේන්තුවේ විවාද කළ මහ නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශ වැය ශීර්ෂය පාර්ලිමේන්තුවේදී පරාජයට පත්විය. ඒ වැඩි ඡන්ද 18කිනි.

මහ නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය වන 162 හා 311 වැය ශීර්ෂ දෙක පරාජයට පත් වූ අතර ඒ අනුව එම අමාත්‍යාංශයේ සියලු වැය ශීර්ෂ පරාජයට පත් විය. එම පාලනයේ අයවැය විවාදයේදී අමාත්‍යාංශ වැය ශීර්ෂ පරාජයට පත්වූ පළමු අවස්ථාව එය වේ.

ඒ වන විටත් අමාත්‍යාංශයේ ඇතැම් කාර්යයන්ගේ දුර්වලතා ලෙස අක්‍රමවත් භූමි සංවර්ධනය, පොදු ගමනාගමන සේවා වල අකාර්යක්ෂමතාව, මාර්ග රථ වාහනවලින් පිරී පැවතීම, පුහුණු ශ්‍රමිකයන් හිඟ වීම, වැසි කාලයට ජල ගැලීම් ඇති වීම, පරිසර දූෂණය වැනි කරුණු හඳුනාගෙන තිබුණි. ඒ සඳහා පැහැදිලි විද්‍යාත්මක විසඳුම් ලබා දී නොතිබුණි.

මීට අමතරව කොළඹට ඇතුළුවන මාර්ග පහක බස් ප්‍රමුඛතා මංතීරු වෙන් කිරීමට මෙගා පොලිස් අමාත්‍යාංශය රුපියල් මිලියන 235ක් වියදම් කර ඇති බවට වාර්තා විය. කොළඹ වාහන තදබදය නැවැත්වීම එහි අරමුණ වූ අතර ඒ අනුව ප්‍රධාන මාර්ග පහක බස් මංතීරු හඳුන්වා දීමේ ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 346ක ගිවිසුමකට එළැඹ ඇත.

කිලෝමීටර් 36ක් සඳහා මිලියන 235ක් වැයකිරීම නිසා කිලෝමීටරයකට රුපියල් මිලියන හයකට වඩා වැය කර ඇතැයි හෙළි ව තිබේ. බස් මංතීරුවල තීන්ත ආලේපනය, නාමපුවරු සවිකිරීම හා ප්‍රචාරණය වෙනුවෙන් මෙම මුදල් වැය වී තිබේ.

මෙගා පොලිස් අමාත්‍යාංශය විසින් සිදු කළ සමීක්ෂණයකින් කොළඹ දිස්ත්‍රික්කය හඳුනාගෙන ඇත්තේ විවිධාකාර අංශයන්හි රැකියාවන්හි නිරත කඩිසර බහු ආගමික, බහු වාර්ගික ජනයා මිලියන භාගයක් වාසය කරන මහා නගරයක් ලෙසිනි. අමාත්‍යාංශයට අනුව පසුගිය වසර ගණනාවකදී බස්නාහිර පළාතේ සිදු වුණු වේගවත් වර්ධනය ලංකාවේ සංවර්ධනයේ ලක්ෂණයක් බව පෙන්වා ඇත.

මෙතරම් මුදලක් වැය කළද බස් ප්‍රමුඛතා මංතීරු නීතිය නිසි පරිදි ක්‍රියාත්මක නොවීය. රථවාහන තදබදයට නිසි විසඳුමක් ලබාදී නොතිබීමත් නිසා මහජන මුදල් අපතේ යැවීමක් සිදුකර ඇතැයි අමාත්‍යාංශ නිලධාරීන් විසින්ම පෙන්වා දී තිබුණි.

2017 දී ඇරඹී මෙම ව්‍යාපෘතිය මගින් ආවරණය කිරීමට නියමිත මුළු කිලෝමීටර් ගණන 36කි. 2018 වසර අවසන් වෙද්දී කිලෝමීටර් 21ක් ආවරණය කර තිබූ අතර ඒ සඳහා වැය කර තිබූ මුදල රුපියල් මිලියන 104කි. 2017 වසරේ දෙසැම්බර් 31 වැනි දා වන විට තවත් මිලියන 131 ගෙවීමට නියමිතව තිබී ඇති අතර 2018 වසරේදී මුළු වියදම රුපියල් මිලියන 235ක් වෙන් කර ඇත.

කිලෝමීටර් 36ක ප්‍රමුඛතා මංතීරු වෙන්කිරීමේදී ගාලු පාරේ කිලෝමීටර් 16ක්, පාර්ලිමේන්තු පාරේ කිලෝමීටර් 10ක්, තර්ස්ටන් පාරේ සිට රීඩ් මාවත දක්වා කිලෝමීටර් 4ක්, කොම්පඤ්ඤවීදිය මාර්ගයේ කිලෝමීටර් 4ක්, කොටුව සිට පිටකොටුව දක්වා කිලෝමීටර් දෙකක් වශයෙන් වෙන්කර ඇත. එහෙත් මංතීරුව අතරමං වීමක් පමණක් බවත් කිසිදු ආකාරයක විධිමත් විද්‍යාත්මක ක්‍රමවේදයකින් මේ කිසිවක් සිදු කර නොමැති බවත් අනාවරණය වී තිබේ. අදද එහි දිගුවක් අපට දක්නට ඇත.

මෙගා පොලිස් අමාත්‍යාංශය විසින් සිදු කළ සමීක්ෂණයකින් කොළඹ දිස්ත්‍රික්කය හඳුනාගෙන ඇත්තේ විවිධාකාර අංශයන්හි රැකියාවන්හි නිරත කඩිසර බහු ආගමික, බහු වාර්ගික ජනයා මිලියන භාගයක් වාසය කරන මහා නගරයක් ලෙසිනි. අමාත්‍යාංශයට අනුව පසුගිය වසර ගණනාවකදී බස්නාහිර පළාතේ සිදු වුණු වේගවත් වර්ධනය ලංකාවේ සංවර්ධනයේ ලක්ෂණයක් බව පෙන්වා ඇත.

කෙසේ වුවත් මේ සංවර්ධනය කටයුතු නිසා ඇති වූ ගැටලු ගැනද එහි සඳහන් වේ. නාගරික හා පරිසර ගැටලු ගණනාවක් මෙන්ම දිගු රථ වාහන පෝලිම්, කුණු කඳු සහ දරිද්‍රතාවයෙන් පෙළෙන පිරිස සැලකිය යුතු ප්‍රමාණයකින් වැඩිවීම වැනි ගැටලු ඇති බවද හඳුනාගෙන තිබේ. මෙගා පොලිස් ව්‍යාපෘතිය මගින් මේ සඳහා විසඳුම් ලබා දීමට ඉහත ව්‍යාපෘති ක්‍රියාත්මක කළද එයින් ගැටලු සඳහා විසඳුම් ලබා දීමට හැකියාව ලැබී නැත.

මීට අමතරව කොරියානු තාක්ෂණික නගර ව්‍යාපෘතියක් හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය මුල් කරගෙන හෝමාගම, කඩුවෙල,මාළඹේ, පාදුක්ක ප්‍රදේශවල ස්ථාපිත කිරීමට කටයුතු කළ අතර ඒ හරහා රැකියා 150,000ක් ලබා දීමට කටයුතු කරන බව දැනුම් දෙන ලදී. එහෙත් ඒ හරහා අතිවිශාල පරිසර දූෂණයක් සිදු කෙරෙන බවට එකල විවිධ චෝදනා එල්ල විය. පරිසරය හා මානව සම්පත් පර්යේෂණ භාණ්ඩ ලෙස යොදා ගන්නා බවට චෝදනා එල්ල විණි.

මේ ලෙසින් සොයා විමසා බැලූ විට අපට පෙනී යන්නේ මෙගා පොලිස් හරහා මෙගා බිල් දමා ඇති බවකි. එමෙන්ම එහි ව්‍යාපෘති කාර්යාල වසා දැමීමට රජය විසින් මේ වන විට තීරණය කර ඇත්තේ මෙවන් සුදු අලින්ගේ අකාර්යක්ෂමතාව නිසාය.

මහා භාණ්ඩාගාර ලේකම්වරයාද පසුගිය සතියේ නිවේදනයක් නිකුත් කරමින් කියා සිටියේ ව්‍යාපෘති කාර්යාල අලුතින් ඉඳි නොකළ යුතු බවයි. ඒ මෙවන් සුදු අලින් නිසාය. ව්‍යාපෘති කාර්යාලයක අවශ්‍යතාව වන්නේ අදාළ ව්‍යාපෘතිය වඩාත් කාර්යක්ෂමව මෙන්ම ආරක්ෂිතව අඩු පිරිවැයකින් සිදු කිරීම වුවද මෙහිදී සිදුව ඇත්තේ අදාළ ව්‍යාපෘති කාර්යාලය නඩත්තු කිරීමට සිදුවීමය. ඒ හරහා ජාතික ධනය කෝටි ගණනින් විනාශ වී ඇති අතර ග්‍රාමීය රෝහල් 15කට අධික සංඛ්‍යාවක් එම ව්‍යාපෘති කාර්යාලවලට වැය කළ මුදලින් ස්ථාපිත කරන්නට හැකියාව තිබුණි. එසේ වුවත් මෙවන් අකටයුතුකම් කෙරෙහි නීතිය භාවිත කළ හැකි ඉඩකඩ අවම වීම රටේ අවාසනාවකි.

මල් කැකුළු තලන දූෂකයන්ට වැඩ වරදී

● ලලිත් චාමින්ද (ගාල්ල)

අපි ඇයට සිරියලතා යැයි කියමු. එවකට සිරියලතාගේ වයස අවුරුදු 08කි. සිරියලතා පදිංචිව සිටියේ ගිං ගඟ පහළ නිමිනයේ පිහිටි සුන්දර ගම්මානයක ය. ඒ සුන්දර ගම්මානයේ කටුමැටි ගැසූ කුඩා නිවෙසක සිරියලතා තම මව කුඩා නැඟණිය සමග පදිංචිව සිටියාය. සිරියලතා ගේ මව තම දරු දෙදෙනා ගේ දිවි රැක ගැනීම සඳහා දැඩි අරගලයක නිරතව සිටි අතර ඇයගේ ජීවිකාව වූයේ වතුවල තේ දලු කැඩීම ය. ඔවුන් විසූ කුඩා නිවෙස පහළින් ගලා යන ගිං ගඟ කොමලියේ සුන්දරත්වය ඒ පවුල තුළ දක්නට නොවූයේ ඔවුහු ගත කළ කටුක දිවිපෙවෙත නිසා ය. සිරියලතා පදිංචිව සිටි ගම්මානයේ ම පදිංචි වී සිටි සරත් කුමාර රැකියාව වශයෙන් ගිංගඟේ වැලිගොඩ දැමීමේ නිරත ව සිටි අයෙකි. ඔහු සිරියලතාගේ නිවෙසට නිතර ආගිය අතර ඔවුන් සමඟ ඉතා සමීප ව ඇසුරු කළේය. ඒ නිසා ම සිරියලතා මෙන්ම එවකට අතදරුවකු වූ ඇයගේ නැඟණිය සරත් මාමාගේ සුරතලයටත් ආදරයටත් ලක් විය.

දිනය 2006 අප්‍රේල් මස 08 වැනිදාය. එදින සුපුරුදු පරිදි සරත් සිරියලතා ගේ නිවසට පැමිණියේ මදුවිතෙන් හොඳ හැටි සප්පායම් වී ගෙන ය. තම දැරියන් දෙදෙනා සරත් සමඟ නිවසේ තනිකර සිරියලතාගේ මව නිවෙසට මඳක් දුරින් තිබූ වෙළෙඳ සැල වෙත ගියේ කෑමට යමක් ගෙන ඒමට ය. සරත් ගැන සිරියලතා ගේ මවට කිසිදු අවිශ්වාසයක් හෝ සැකයක් නොතිබුණද සිදුව තිබුණේ ඇය කිසිසේත් නොසිතූ දෙයකි. යක්ෂයාගේ හෝරාව එළැඹී ඒ මොහොතේ බිමත්ව සිටි සරත් නැමති පාපතරයා අට හැවිරිදි වියේ පසුවූ කුඩා දැරිවිය දූෂණය කර තිබුණි. තෙලිකඩ පොලිසිය මගින් ඔහුට එරෙහි ව අධිකරණයේ නඩු පැවරූ අතර එම නඩුව වසර 14ක් තිස්සේ දකුණු පළාත්බද ගාල්ල මහාධිකරණයේ විභාග වූයේ සැකකරුට නීතියෙන් රිංගා යෑමට ඉඩ නොතබා ය.

වසර 20ක බරපතළ වැඩ සහිත සිර දඬුවමක්

දීර්ඝ නඩු විභාගයකින් පසු ඉකුත් 25 වැනි දින දකුණු පළාත්බද ගාල්ල මහාධිකරණ විනිසුරු සුජීව නිස්සංක මහතා මේ සම්බන්ධ නඩු තීන්දුව ලබා දුන්නේය. ඒ, අවුරුදු 16 ට අඩු බාලවයස්කාර දැරියක් දූෂණය කිරීම සම්බන්ධයෙන් විත්තිකරුට වසර 20ක බරපතළ වැඩ සහිත සිර දඬුවමක් හා රුපියල් 25000ක දඩ මුදලක්ද විත්දිත තැනැත්තියට රුපියල් පන්ලක්ෂයක වන්දියක් ද ගෙවන ලෙස නියෝග කරමිනි. දඩ මුදල නොගෙවන්නේ නම් මාස 12ක සිර දඬුවමක්ද වන්දිය නොගෙවන්නේ නම් තවත් තවත් මාස 24ක සිර දඬුවමක්ද දඩ මුදල් හා වන්දි මුදල් නොගෙවන්නේ නම් පනවන ලද සිර දඬුවම වෙන් වෙන් වශයෙන් ගෙවී යා යුතු බවද විනිසුරුවරයා නියෝග කළේය. එසේ දඬුවම් නියම වූයේ උඩගෙඩියලාගේ සරත් කුමාර නැමැති විත්තිකරුටය. ඒ ඔහු විසින් 2006 වසරේ අප්‍රේල් 08 වැනිදා ගිණිමැල්ලගහ දොඩන්ගොඩ අඹගහදුවවත්තේ දී බිමිත්ව පැමිණ 8 හැවිරිදි දැරිවියක දූෂණය කිරීමට වරදකරු වීම නිසාය.

ඔක්තෝබර මස 01 වැනිදා තවත් ලෝක ළමා දිනයක් සමරනු ලැබිණ. මෙරට ළමා අපචාර දිනෙන් දින වැඩිවෙමින් පවතින අතර පසුගියදා අක්මීමන බටදූව ප්‍රදේශයේ වෙළෙඳසැල් හිමියකු විසින් කුඩා දරුවන් ගණනාවක් අපයෝජනය කිරීමේ සිද්ධියක්ද වාර්තා විය. එකී වෙළෙඳ සැල් හිමියාටද නීතියේ රැහැනින් පලා යෑමට නොහැකි වූයේ ගාල්ල කොට්ඨාස හා ළමා කාන්තා කාර්යාංශයේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක වරුණි බෝගහවත්ත විසින් ඒ පිළිබඳ දීර්ඝ විමර්ශනයක් කොට සැකකරු අත්අඩංගුවට ගැනීම නිසා ය. මේ වනවිට එම සැකකරු රක්ෂිත බන්ධනාගාරගත කොට ඇත.

ළමා අපචාර වැළැක්වීම හා එවැනි අපචාරවලට ගොදුරු වූ ළමුන් ආරක්ෂා කිරීම යන මූලික අරමුණු ඇතිව පිහිටුවා ඇති ජාතික ළමා රක්ෂක අධිකාරියට පසුගිය වර්ෂ 08 කාලය තුළ මහජන පැමිණිලි 79,259ක් ලැබී තිබේ. ඉන් පැමිණිලි 42,073ක් විසඳීමට කටයුතු කර නොතිබූ බව ශ්‍රී ලංකාවේ ළමා අපාචාර සම්බන්ධයෙන් ජාතික විගණන කාර්යාලය මගින් කරනු ලැබූ විශේෂ විගණනයකදී අනාවරණය වී ඇත.

2020 වර්ෂයේ ජූලි මස 11 වැනි දින නිකුත් කොට ඇති මෙකී විගණන වාර්තාවට අනුව ළමා අපචාර සම්බන්ධයෙන් 2011 වසරේ සිට 2019 සැප්තැම්බර් 30 වැනිදා දක්වා ලැබී තිබූ බවද සඳහන් වේ. විභාග කොට අවසන් කරනු ලැබූ පැමිණිලි සංඛ්‍යාව 37, 186ක් වූ අතර පැමිණිලි විභාග කිරීමේ ප්‍රතිශතය සියයට 53ක් බවද එම වාර්තාව මගින් වැඩිදුරටත් අනාවරණය කොට ඇත.

එමෙන්ම 2011 සිට 2018 වර්ෂය දක්වා දිවයිනේ දිස්ත්‍රික්ක 25න් ලැබී තිබූ ළමා අපචාර සම්බන්ධ පැමිණිලි අතුරින් වැඩිම පැමිණිලි සංඛ්‍යාවක් ලැබී ඇත්තේ කොළඹ, ගම්පහ, කුරුණෑගල සහ ගාල්ල යන දිස්ත්‍රික්කවලින් බවද විගණන වාර්තාවේ සඳහන් වේ.

විශේෂඥ අධිකරණ වෛද්‍ය නිලධාරී රෝහාන් රුවන්පුර

ළමා ආරක්ෂක අධිකාරියේ සභාපති මහාචාර්ය මුදිත විදානපතිරණ

ප්‍රධාන පොලිස් පරීක්ෂිකා වරුණි බෝගහවත්ත

ළමා රක්ෂණ අධිකාරියට ලැබී තිබූ පැමිණිලි සංඛ්‍යාවෙන් සියයට 35කට වඩා වැඩි සංඛ්‍යාවක් මෙම දිස්ත්‍රික්ක 04ට අදාළව ලැබී තිබුණද ඒ පිළිබඳ වැඩි අවධානයක් යොමුකර එම පැමිණිලි විමර්ශනය කිරීමට අදාළ කඩිනම් පියවර ගෙන නොතිබූ බවද එම විගණන වාර්තාවේ සඳහන් වේ.

විඩියෝ සාක්ෂි පටිගත කිරීමේ කාර්යය ක්‍රියාත්මකයි

එමෙන් ම පසුගිය වර්ෂ 10 තුළ නීතිපති වෙත ඉදිරිපත් කරනු ලැබූ පැමිණිලි සංඛ්‍යාවෙන් සියයට 55කට නඩු පවරා නොතිබූ බව නිරීක්ෂණය වූ බවද විගණන වාර්තාවේ දැක්වේ. ඒ අනුව ළමා අපචාරවලට ගොදුරු වූ ළමුන් සම්බන්ධ වූ මෙම නීතිමය ක්‍රියාවලිය ළමයා වැඩිහිටියකු බවට පත්වීමට ප්‍රථම අවසන් කිරීම සඳහා වූ ක්‍රමවේදයක් සැකසීමට අධිකාරිය විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබූ බවද අනාවරණය වී ඇත.

ළමා අපයෝජනවලට ගොදුරු වන විත්දිත ළමුන් හා අදාළ නඩු කටයුතුවල සාක්ෂිකරුවන් බවට පත්වන ළමුන්ගේ ආරක්ෂාව තහවුරු කරමින් ඔවුන් ද්විතික විත්දිත භාවයට පත්වීම අවම කිරීම ප්‍රධාන වශයෙන් අරමුණු කරගනිමින් විඩියෝ සාක්ෂි පටිගත කිරීමේ කාර්යය ක්‍රියාත්මක වේ. විත්දිත හා සාක්ෂිකරුවන් බවට පත්වන ළමුන්ගේ සාක්ෂි විශේෂ මැදිරියක් තුළදි පටිගත කොට එම සාක්ෂි අධිකරණය සඳහා ඉදිරිපත් කොට නඩු සඳහා අවශ්‍ය සහාය ලබාදේ. මෙසේ සාක්ෂි ලබා ගැනීමට 2001 වර්ෂයේදී ළමා රක්ෂක අධිකාරිය තුළ හා කරාපිටිය අධිකරණ වෛද්‍ය පීඨය තුළ ස්ථාන 02ක් පිහිටුවා තිබුණි. කෙසේවුවද විඩියෝ සාක්ෂි ලබාගැනීමට ඇතිකර තිබුණේ එක් විඩියෝ සාක්ෂි සහායක තනතුරක් පමණි.

2019 වර්ෂයේ පැමිණිලි 8558ක්

පසුගිය යහපාලන ආණ්ඩු කාලයේ 2017 වර්ෂයේ සිට 2019 මාර්තු දක්වා විඩියෝ සාක්ෂි සඳහා 461ක් ඉල්ලීම් ලැබී තිබූ අතර ඉන් පටිගත කර තිබුණේ 331ක් පමණි. එමෙන්ම අධිකාරියට ලැබෙන පැමිණිලි වාර්තාකරණයේදී අදාළ දිස්ත්‍රික්කය, ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය ආදී තොරතුරු පහසුවෙන් හඳුනා ගැනීමට හැකිවන පරිදි වාර්තාකර නොගැනීම නිසා පැමිණිලිවල ප්‍රගතිය පහසුවෙන් සමාලෝචනය කිරීමට නොහැකිව තිබූ බවද විගණන වාර්තාවේ සඳහන් වේ.

කෙසේවුවද වත්මන් රජය බලයට පත්වීමෙන් පසු ළමා රක්ෂක අධිකාරිය කාර්යක්ෂම තත්ත්වයට පත්කොට ඇති අතර ජාතික ළමාරක්ෂක අධිකාරියේ වත්මන් සභාපති මහාචාර්ය මුදිත විදානපතිරණ අධිකාරියේ විවිධ අංශ සඳහා කමිටු පත්කොට එය කාර්යක්ෂම කිරීමට කටයුතු කරමින් සිටී. ළමා ආරක්ෂක අධිකාරියේ සභාපති මහාචාර්ය මුදිත විදානපතිරණ ඒ පිළිබඳ මෙසේ පැවසුවේය.

"පසුගිය වර්ෂ 09 කාලයේ වූ සිද්ධීන් ගැන තමයි විගණන වාර්තාවෙන් පෙන්වා දී තියෙන්නේ. ඒ විගණන වාර්තාවට අපි උත්තර ලියලා තියෙන්නේ. ළමා රක්ෂක අධිකාරියේ සභාපති ධුරය මා භාරගන්නා විට අපේ ආයතනයේ ස්ථාන තුනක වහපු නැති ළමා අපචාර සම්බන්ධ ලිපිගොනු 18000ක් තිබුණා. ඉන් 14000ක් පරීක්ෂණ අවසන් කරලා තියෙන්නේ. ඉතිරි 4000 වහන්න බැහැ. මා සභාපතිධුරයට පත්වූවාට පසු කමිටු පත් කරලා ඒවා නිරාකරණය කිරීමට කටයුතු කළා. 2019 වර්ෂයේ 8558ක් පැමිණිලි ලැබී තිබුණා. මේ වර්ෂයේ අගොස්තු මාසය වෙනකම් ලැබිලා තියෙන්නේ පැමිණිලි 4471යි. ඉකුත් වසරට වඩා ළමා අපචාර ලැබෙන පැමිණිලි සංඛ්‍යාත්මක ව අඩුයි. නමුත් ක්‍රෑරත්වය වැඩි වී තිබෙනවා."

ළමා අපචාර සම්බන්ධයෙන් අපි ගාල්ල කරාපිටිය ශික්ෂණ රෝහලේ අධිකරණ වෛද්‍ය අංශයේ ප්‍රධානි විශේෂඥ අධිකරණ වෛද්‍ය නිලධාරි රෝහාන් රුවන්පුර ගෙන් ද විමසීමක් කළෙමු.

අපචාරයට ලක්වූ ඇතැම් ළමුන් ඇත්ත කියන්නේ නැහැ

"අධිකරණ වෛද්‍යවරුන් වශයෙන් අපි ළමා අපචාර සිද්ධිවලදී ස්වාධීන විමර්ශකයන් ලෙස තමයි කටයුතු කරන්නේ. නමුත් අපේ රටේ සිදුවන ළමා අපචාරවලින් සියයට 50කට ආසන්න සංඛ්‍යාවක් නීති බලධාරීන්ට වාර්තා වන්නේ නැහැ. ලෝකයේ වෙනත් රටවල් තත්ත්වය මේක තමයි. පවුලේ අය ළඟම හිතවතුන් හා ඥාතීන් අතින් තමයි වැඩි වශයෙන් ළමුන් අපචාරවලට ගොදුරු වන්නේ. අපචාරකරු ළමයා දන්නා අයෙක් වුවත් අපචාරයට ලක්වූ ඇතැම් ළමුන් ඇත්ත කියන්නේ නැහැ. තොරතුරු වසන් කරනවා. අපේ සංස්කෘතියත් එක්ක අපචාරයට ගොදුරුවන ළමුන්ගේ මවුපියන් මේ ගැන කියන්නේ නැහැ. ඒ වගේම අපේ සංස්කෘතියත් එක්ක අපචාරවලට ලක්වූ දරුවන් සමාජයෙන් කොන් කරනවා. ඒක වැරදි දෙයක්. මොන නීති දැම්මත් වයස අවුරුදු 12, 14 කියන්නේ ජීවවිද්‍යාත්මක අනුව දරුවන්ට ලිංගික ආශාවන් ඇතිවන වයස. මේ නිසා ලිංගික අධ්‍යාපනය ගැන දරුවන් දැනුවත් කළ යුතුයි. ජීව විද්‍යාත්මක ඇත්ත දරුවන්ට කියා දිය යුතුයි" යනුවෙන් ඔහු අවධාරණය කළේය.

ගාල්ල කොට්ඨාස හා ළමා කාන්තා කාර්යංශයේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක වරුණි බෝගහවත්ත මෙසේ සඳහන් කළාය

."ළමා අපචාරකරුවන්ට දැඩි දඬුවම් ලබා දිය යුතුයි. ඒ ගැන ජනතාව දැනුවත් විය යුතුයි. මේ සඳහා මාධ්‍යයට විශාල බලපෑමක් කරන්න පුළුවන්. ළමා අපචාරවලට සම්බන්ධ පුද්ගලයන්ට ලැබෙන දඬුවම් ගැන ජනතාව දැනුවත් කළ යුතුයි. වයස අවුරුදු 18ට අඩු දැරිවියන් හෝටල්වලට රැගෙන යන්න බැහැ. එහෙම වුණොත් හෝටල් හිමියාට විරුද්ධව නඩු පවරන්න පුළුවන්".

මනස සුව කරන්න මෙහෙයුම් රැසක්

● ඉනෝකා සමරවික්‍රම

ජාතික මානසික සෞඛ්‍ය විද්‍යායතනය කලක් හැඳින්වූයේ අංගොඩ උන්මත්තකාගාරය ලෙසිනි. ඉනුත් කලකට පසු අංගොඩ මානසික රෝහල ලෙස හැඳින්වූ අතර 2008 ඔක්තෝබර් 08 වැනිදා සිට ජාතික මානසික සෞඛ්‍ය විද්‍යායතනය නම් කරන ලදි. රෝහලේ නම කීම පවා උසුළු විසිළු වලට ලක්කරන්නන් සිටින සමාජයක මේ බිමේ සිටින මිනිසුන්ගේ කතා බොහෝ අනුවේදනීය ය. සංවේදීය. මනස වෙනස් වූ , මනස විකල් වූ මිනිසුන්ට අවශ්‍ය සන්සුන් හිත සුවපත් කරන පරිසරයකි. ජගත් මානසික සෞඛ්‍ය දිනය ඔක්තෝබර් 10 දාට යෙදී තිබිණි.

චිත්‍ර අඳින නේවාසිකයන්

එබිම නිසකලංකය. විසල් ගහ කොළ පිරුණ මලින් හැඩවුණ ගෙළයන මනස සුවපත් කරන්නාක් බඳුය. මෙතැනට ගෙළයන කීමෙහි වරදක් නැත. මන්දයත් මේ බිමේ වෙසෙන්න වුන්ට එතැන තම නිවහන මෙනි. දවසකින් දෙකකින් සතියකින් මාසයකින් වසරකින් පමණක් නොව ඇතැම් විට අවුරුදු ගණනාවකින් තම නිවෙසට නොගිය, තමන්ගේ කියා කිසිවෙක් හමුනොවන ඔවුන්ට මෙතැන සිය නිවෙස ය. ඇතැමෙක් සිය ජීවිත කාලයෙන් අඩකටත් වඩා ගෙවා දමා ඇත්තෙහි මෙහිය.

මේ මොහොතේ , සිදුවන්නේ කුමක්දැයි කියාවත් අවබෝධයක් නැති මේ මිනිසුන් සැබැවින්ම සමාජයෙන් කොන්කළ යුතු ද? එය එසේ වුවද 1912 අවුරුද්දේදී රෝහල සඳහා මුල්ගල් තැබුණ අතර රෝහල ආරම්භ වී ඇත්තේ 1926 වසරේදීය. ඇඳන් දාහකින් යුතුව ආරම්භ කරන ලද රෝහලට වෙනත් රෝහල් වල සිටි රෝගීන්ද රැගෙනවිත් ඇත.

මානසික සෞඛ්‍ය විද්‍යායතනයේ අධ්‍යක්ෂිකා ධම්මිකා විජේසිංහ

විශේෂඥ මනෝවෛද්‍ය පුෂ්පා රණසිංහ

මානසික රෝහල සඳහා රෝගීන් බාර ගැනීම ක්‍රම කිහිපයකට සිදු වේ. ඉන් එක් ක්‍රමයක් වන්නේ රෝගියාට සිය කැමැත්තෙන්ම පැමිණ රෝහලට ඇතුළත් විය හැකිය. එසේත් නැත්නම් රෝගියාගේ ඥාතියකුට භාරකාරයකුට පැමිණ රෝගියා බාර දිය හැකිය. යමෙක් මානසික රෝගී තත්ත්වයකින් පෙළෙන්නේ නම් ඔහුගේ රෝගී තත්ත්වය ගැන පරික්ෂා කර බලා දික්ත්‍රික් උසාවියක් හරහා රෝගියා රෝහල වෙත එවීමට පුළුවන. එමෙන්ම මහෙස්ත්‍රාත් උසාවි හරහා ද රෝගීන් රෝහල වෙත එවනු ලබන අතර, බන්ධනාගාර මඟින්ද මානසික තත්ත්වය වෙනස් වූ රෝගීන් එවනු ලැබේ. කෙසේ වුවත් මින් වසර දහයකට පමණ පෙර අංගොඩ මානසික සෞඛ්‍ය විද්‍යායතනයේ රෝගීන් 3000 ක් පමණ සිටි අතර අද වන විට එම රෝගීන් සංඛ්‍යාව 700 පමණ වේ.

දහනව වසරක් තිස්සේ මෙම රෝහලේ සේවය කරන ජ්‍යෙෂ්ඨ විශේෂඥ මනෝ වෛද්‍ය පුෂ්පා රණසිංහ රෝහල හා නේවාසිකව ප්‍රතිකාර ලබන රෝගීන් පිළිබඳ පවසන්නේ මෙවන් අදහසක්.

“ වසර ගණනකට පෙර රෝගීන් සංඛ්‍යාව අඩු කර ගැනීම සඳහා අප විවිධ ක්‍රියා මාර්ග ගත්තා. මානසික ආබාධයන්ට ලක් වූ රෝගීන්ට විවිධ ප්‍රතිකාර ක්‍රම ලබාදෙනවා. වසර ගණනක් තිස්සේ මෙහි ප්‍රතාකාර ලබාන සුව වූ රෝගීන් සිටියා නමුත් ඔවුන්ගේ බාරකාරයෝ නෑ. ඔවුන්ව ගෙන යන්න හෝ අපට ඔවුන්ව බාර දෙන්න කෙනෙක් නැහැ. පුනරුත්තාපනය කළ සමාජ ගතකිරීමට පුළුවන් මට්ටමේ අයව ඒ අයගේ නිවෙස් වලට බාර දුන්නා. “

මිනිසුන් පුදුමාකාරය. අනුන්ගේ දේපල වලට තණ්හා වූ විට ඔවුහු අහවලාට පිස්සු යැයි කියා මානසික රෝහලට ගෙනැත් ඇරලති. ඔවුහු රෝහලට බාරකාරයාගේ ලිපිනය ලෙසින් දෙන්නේ ව්‍යාජ දුරකථන අංක සහ ලිපියන ය.

“අපේ රෝහලේ දිවා රාත්‍රී ප්‍රතිකාර මධ්‍යස්ථානය පැය විසිහතරම විවෘතයි. ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත හිංසනය වැළැක්වීමේ ඒකකය තිබෙනවා. මෙහිදී කරන්නේ අපි ඔවුන් සමඟ කතා කරනවා. ඇතැම් අවස්ථාවල දෙදෙනා සමඟ වෙන් වෙන්ව කතා කරනවා. ඔවුන්ට ගැටලු විසදා ගැනීමට අවස්ථාව ලබා දෙනවා. අපේ හොට් ලයින් එක තමයි 1926. මෙය පැය විසිහතරම ක්‍රියාත්මකයි. ඒ සඳහා පුහුණු වෛද්‍යවරු හෙදියෝ ඉන්නවා. ස්ථාවර දුරකතනයකින් හෝ මොබිටෙල් දුරකතනයකින් ඇමතූ විට ගාස්තු රහිතයි. මෙය ආරම්භ කළ දින සිට අපට ඇමතුම් 38,000 ක් ඇවිත් තියෙනවා. මේ වසරේ කොරෝනා ඇදිරි නීතිය සමයේ ලැබුණ ඇමතුම් ගණන වැඩියි. මේ මාස 3 ට ඇමතුම් පහළොස් දහසක් ලැබී තියෙනවා. සියදිවි නසා ගැනීමට සූදානම් වීම් 220 කට අපට මැදිහත් වන්නට පුළුවන්කම ලැබුණා. 2010 වසරේ අපේ රටේ සියදිවි නසා ගැනීම් 3,135යි. 2018 වසරේ සියදිවි නසා ගැනිම් 3281. මේ තිබෙන කොවිඩ් වයිරස තත්ත්වයත් සමඟ මේ තත්ත්වය ඉදිරියේදී තවත් වැඩි වීමට පුළුවන් කියලා අප සිතනවා. ඒ වගේම රෝහලට එන්නට බැරි කලබලකාරි මානසික නිවෙසට ගිහින් අදාළ එන්නත ලබා දෙනවා. ඊට අමතරව මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වුවන්ට මෙහිදි ප්‍රතිකාර ලබා දෙනවා.

මේ හැරුණ විට මානසික ප්‍රථමාධාර කණ්ඩායමක් අපට ඉන්නවා. ඒ කණ්ඩායම මීතොටමුල්ල කුණු කන්ද නාය ගිය අවස්ථාවේ, ගංවතුර පැවැති අවස්ථාවේ , කොච්චිකඩේ බෝම්බ පිපුරුම සිද්ධියෙන් මානසික ආබාධයට ලක් වූ අයට ප්‍රතිකාර කරන්න යුහුසුළුව ඉදිරිපත් වුණා. මීට අමතරව සුමිත්‍රයෝ වැනි සංවිධාන සමඟ මෙන්ම නීති ආධාර කොමිසම, මානව හිමිකම් කොමිෂම සමගත් සම්බන්ධව කටයුතු කරනවා. විශේෂඥ වෛද්‍ය පුෂ්පා රණසිංහ පැවසුවාය.

මේ වසරේ ලෝක මානසික සෞඛ්‍ය දිනයේ තේමාව තමයි “මනා ආයෝජනයක් තුළින් සැමට මානසික සුවය ළඟාකර ගැනීමට පිවිසුමක ලබා ගමු යන්න.

රෝහල් වෛද්‍ය අධ්‍යක්ෂ වෛද්‍ය ධම්මිකා විජේසිංහ පවසන්නේ මෙවැනි අදහසකි. “ආරම්භයට වඩා අද වන විට මේ රෝහල රෝගීන් වෙනුවෙන් කටයුතු කරන ආකාරය වෙනස්. අපේ රෝහලට ප්‍රතිකාර ගන්නට එන්නේ කන බොන විදිහ දත් මැදීම මුහුණ සේදීම පවා අමතක වූ කොටසක්. මේ අයට රෝගයට ප්‍රතිකාර කරන අතර සාමාන්‍ය දෛනික ජීවිත ගතකිරීමට හුරු කරන අතරේ ඔවුන්ට ස්වයං රැකියාවක් කිරීමට අවශ්‍ය පුහුණුවත් ලබා දෙනවා.,”

(ඡායාරූප - නිශාංක ද සිල්වා)

මානසික ගැටලු විසඳා ගැනීමට කෙටි පණිවිඩ සේවාවක්

මානසික සෞඛ්‍ය යනු ජීවිතයේ වැදගත් වන අංශයක් වන අතර, එකී වැදගත්කම හේතුකොට ගෙන එයාර්ටෙල් ලංකා සමාගම, අංගොඩ ජාතික මානසික සෞඛ්‍ය විද්‍යායතනය (NIMH) සමඟ එක්ව සංවේදී හා මානසික පීඩාවන්ට මුහුණ දෙන පුද්ගලයින් ධෛර්යවත් කිරීම සඳහාම 1926 නම්න්, කෙටි පණිවිඩ උපකාරක සේවාවක් හඳුන්වා දෙන ලදී.

ඉංග්‍රීසි, සිංහල හා දමිළ යන භාෂා ත්‍රිත්වයෙන්ම සේවය ලබා ගත හැකි වෘත්තීයමය මනෝ උපදේශකවරුන් වෙත පරිශීලකයන් සම්බන්ධ කරමින් ඔක්තෝම්බර් 10 වනදාට යෙදී තිබෙන 2020 ලෝක මානසික සෞඛ්‍ය දිනය සැමරීමට සමගාමීව මෙම කෙටි පණිවිඩ සේවාව මුළු දිවයින පුරා ක්‍රියාත්මක වනු ඇත.එයාර්ටෙල් නිර්මාණය කරන ලද 1926 කෙටි පණිවිඩ සේවාවෙන් බලාපොරොත්තු වන්නේ, විශේෂයෙන්ම තරුණ ප්‍රජාව ඉතා අවදානම් කාලයක් අත්විඳින විට හා නොදන්නා පරිසරයක් තුළ ආරක්ෂිතව ඔවුන්ගේ මානසික සෞඛ්‍ය ගැටලු අවම කරගැනීමට අවශ්‍ය නිවැරැදි මගපෙන්වීම සඳහා වෘත්තීය මනෝ උපදේශකයින් වෙත යොමු වීමට ඔවුන්ව දිරිමත් කිරීමයි.

(ඉනෝකා පෙරේරා බණ්ඩාර විසිනි)

සාරි

රෙදි වර්ණ ගන්වන ආකාරය

රෙදි වියන ආකාරය

කන්ද උඩරටින් පිබිදෙන පේෂකර්මාන්තය

● අසේල කුරුළුවංශ

මෙරට පේෂ කර්මාන්තයේ ඉතිහාසය කුවේණි යුගය දක්වා ඈතට දිවෙයි. කපු නූලෙන් විවිධ රටා මතු කරමින් හැඩ ගැන්වෙන සාරියක සුන්දරත්වය කියාපාන්නේ දේශීය නිර්මාණකරුවන්ගේ සාඩම්බරත්වයයි. මේ වනවිට මෙරට පේෂ කර්මාන්තය එහි පාරම්පරික ලක්ෂණ ආරක්ෂා කර ගනිමින් නව මානයක් ඔස්සේ ගමන් ආරම්භ කර තිබේ. ඒ, වත්මන් රජය බලයට පැමිණීමෙන් පසු පාරම්පරික කර්මාන්ත නඟා සිටුවීම සඳහා ගත් පියවර සමඟිනි.

අත්යන්ත්‍ර හා බලවේග යන්ත්‍ර භාවිතයෙන් නිෂ්පාදනය කරනු ලබන රෙදි පිළි ලංකාව පුරා නිෂ්පාදනය වුවත් මධ්‍යම පළාත එහිදී සුවිශේෂී වන්නේය. ඒ වැඩිම කාර්මිකයන් පිරිසක් එම වෘත්තියේ නිරතව සිටින්නේ මධ්‍යම පළාතේ වන නිසාය. මධ්‍යම පළාත් පුරා විසිරී පැතිරී පවත්නා මධ්‍යස්ථාන 136ක සේවය කරන 950ක් පමණ වන කාර්මිකයන්ගේ දැතින් පසුගිය වසරේ නිෂ්පාදනය වී තිබෙන රෙදි ප්‍රමාණය මීටර 190000 කි.

මධ්‍යම පළාතේ පේෂකර්ම දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන මෙම මධ්‍යස්ථානවලින් සාරි, සරම්, කෝට්, ඇඳ ඇතිරිලි, අත්පිස්නා, කොට්ට උර, තිර රෙදි, අත් බෑග්, සෙරප්පු, ටයි ඇතුළු නිර්මාණ 20 ක් පමණ වෙළෙඳපොළට හඳුන්වා දී තිබේ. සාරි අතරින් පෙතම්පිලි සාරිය මධ්‍යම පළාතට සුවිශේෂී එකකි. ඒ, එම නිර්මාණයේ තිඹිර ගෙය මධ්‍යම පළාත වන නිසාය. දේශීය දේට වඩා විදේශීය දේ අගය කරන්නට පුරුදු පුහුණු වූ ජාතියක් ලෙස අප කොතරම් හොඳ පේෂකර්ම නිෂ්පාදන තිබුණත් අඳින්නට පලඳින්නට පුරුදු වී සිටින්නේ විදේශවලින් ආනයනය කරන දේය. මේ නිසා මෙම වටිනා කර්මාන්ත පිළිබඳ පසුගිය දශකය පුරාවට යොමු වූයේ අඩු අවධානයකි.

අත්කම් රෙද්දෙන් නිමවූ ඇඳි පුටුවක්

නූල් සකසන ආකාරය

ජනපති ගෝඨාභය රාජපක්ෂ මහතා අමාත්‍යාංශවල විෂය පථ වෙන් කිරීමේදී පාරම්පරික ශිල්ප ක්‍රම ආරක්ෂා කරගැනීම පිළිබඳ විශේෂ අවධානයක් යොමුකර ඒ වෙනුවෙන් වෙන ම අමාත්‍යාංශ ස්ථාපිත කිරීමත් සමඟ පේෂකර්ම නිර්මාණ සම්බන්ධයෙන් පෙරට වඩා වැඩි අවධානයක් ඇතිව තිබේ.

මධ්‍යම පළාත් පේෂකර්ම දෙපාර්තුමේන්තුවේ පළාත් අධ්‍යක්ෂිකා දීපිකා කවිසේකර ඒ පිළිබඳ දැක් වූයේ මෙවැනි අදහසකි.

“පේෂකර්ම කියන්නේ පාරම්පරික කර්මාන්තයක්. අදටත් මහනුවර දිස්ත්‍රික්කයේ තලගුණේ ගම්මානයේ මේ කර්මාන්තයේ පාරම්පරික උරුමකරුවන් ජීවත් වෙනවා. මධ්‍යම පළාත් පේෂකර්ම දෙපාර්තුමේන්තුව විදිහට අපි පහසුකම් සපයා දී මේ කර්මාන්තයේ නිරතව මාසික ආදායමක් ලබා ගන්න ග්‍රාමීය කාන්තාවන්ට අවස්ථාව ලබාදී තිබෙනවා. රෙදි වගේම නිමි ඇඳුම් නිර්මාණය කරනවා. මේ ක්ෂේත්‍රයේ බහුලව කාන්තාවන් නිරතව සිටියත් පිරිමි කිහිප දෙනකු නිර්මාණකරණයේ යෙදී සිටිනවා. වයස අවුරුදු විස්සේ පමණ සිට දෑත් දෙපා ශක්තිමත්ව තිබෙන තුරු කාන්තාවන් මේ කර්මාන්තයේ නිරතව සිටිනවා. ඒ වගේම විශේෂ අවශ්‍යතා ඇති විශාල පිරිසක් අප සමඟ වැඩ කරනවා. ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් තිබෙන මධ්‍යස්ථානවලට ගොස් උපදේශිකාවන්ට අවශ්‍ය පුහුණුව ලබා දෙනවා.”

පසුගිය වසරේ මධ්‍යම පළාතේ පේෂකර්ම රැකියාවල නිරත වූ ග්‍රාමීව වාසය කරන කාර්මිකාවන්ට ගෙවා තිබෙන මුදල රුපියල් ලක්ෂ 353 කි.කවිසේකර මහත්මිය පවසන පරිදි සාමාන්‍යයෙන් මෙම ක්ෂේත්‍රයේ නිරතව රුපියල් 20000.00 පමණ මුදලක් මාසිකව උපයා ගැනීමට කාන්තාවන්ට හැකිව තිබේ. දෙනෙත් අඳ අය හැරෙන්නට විශේෂ අවශ්‍යතා ඇති අය නිවෙස් වලට බරක් නොවී තමන්ගේම දැතින් කීයක් හෝ උපයා ගැනීමට යොමු වීම මෙන්ම ඒ සඳහා ඔවුන්ට මඟ පෙන්වා උනන්දු කරවීම අගය කළ යුතුය.පළාත තුළ ඩයි මධ්‍යස්ථාන ගණනාවක් ක්‍රියාත්මකය. සුදුපැහැති නූල්වලට වර්ණ කවන්නේ ඩයි මධ්‍යස්ථානවලදීය.

මධ්‍යම පළාත් පේෂකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂිකා දීපිකා කවිසේකර පළාතේ පේෂකර්ම නිෂ්පාදන ක්ෂේත්‍රයේ අනාගත ඉලක්ක ජයගැනීම සඳහා වන ගමන් මඟ සම්බන්ධයෙන් මෙසේ පැවසුවාය.

“මේ වන විට තරුණ කොටස් මේ කර්මාන්තය වෙත නැඹුරු වෙමින් සිටිනවා. ඉදිරියේදී රාජ්‍ය සේවකයන්ට සතියකට වතාවක් බතික් හෝ අත්යන්ත්‍රවලින් නිර්මාණය වූ සාරි අඳින්න චක්‍ර ලේඛනයක් නිකුත් වේවි. මේ කර්මාන්තය පුබුදුවාලීමට ඒ අකාර වැඩපිළිවෙළක් අවශ්‍යයි. අත්යන්ත්‍රයෙන් නිමකළ සාරියක මිල ටිකක් ඉහළයි. සාමාන්‍ය සාරියක් වියා නිම කරනවාට කාර්මිකාවකට අපි අවම රුපියල් 1100.00ක් පමණ දෙනවා. නූල් මිලට ගැනීමට,ඩයි කිරීමට තවත් මුදලක් වැය වෙනවා. මේ සියල්ල එකතු වුණාම ටිකක් ඉහළ මිලක් මේ සාරියකට නියම කරන්න වෙනවා. අපි නූල් මිලට ගන්නේ ව්‍යාපාරිකයන් ගෙන්. රජය මැදිහත් වෙලා පළාත් නවයේ ම පේෂකර්ම දෙපාර්තුමේන්තුවලට අවශ්‍ය නූල් ප්‍රමාණය එකම ස්ථානයකින් නිකුත් කරන ආකාරයේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කළොත් අපිට අඩු මිලට මේ නූල් ගන්න පුළුවන් වෙනවා. එහෙම වුණොත් අපිට සාරියකට වැය වන මුදල අඩු කර ගන්න හැකියාව ලැබේවි. පළාත් නවයේ පේෂකර්ම නිෂ්පාදන සහ පෞද්ගලික අංශයේ නිෂ්පාදකයන් එකතු වුණොත් අපිට රටට ම අවශ්‍ය රෙදි දිය හැකියි.

අනිත් පැත්තෙන් මේ අත්යන්ත්‍ර රෙදි නිර්මාණ කරන අයට N.V.Q සහතිකය ලබා ගැනීම සඳහා වැඩපිළිවෙළක් දියත් විය යුතුයි. අපේ අලෙවි මධ්‍යස්ථානය තිබෙන්නේ නගරයෙන් පිට නිසා නගරයේ ජනතාව ගැවසෙන ස්ථානයක පේෂකර්ම අලෙවි ස්ථානයක් විවෘත කිරීමේ අවශ්‍යතාව තිබෙනවා. සංචාරක මඟ පෙන්වන්නන්ට කොමිස් ලබාදීමේ ක්‍රමවේදයක් අපි ක්‍රියාත්මක කරන්නේ නැහැ. ඒ නිසා විදේශිකයන් අපේ මධ්‍යස්ථාවලට රැගෙන එන්න ඔවුන් උනන්දු වන්නේ නැහැ. මධ්‍යස්ථානවල ක්‍රෙඩිට් කාඩ් පහසුකම් නොමැති වීමත් අලෙවිය අඩු වීමට හේතුවක්. මේවා ගැන අපි දැන් අවධානය යොමු කරමින් සිටිනවා. රජය ගත් තීරණත් සමඟ දැන් අපේ පේෂකර්ම නිෂ්පාදනවලට ඇති ඉල්ලුම ඉහළ යමින් තිබෙනවා. මේ කර්මාන්තයේ නිරතව සිටින අයගේ හෙට දවස යහපත් වන බව ස්ථිරයි.“

මධ්‍යම පළාත් කර්මාන්ත අමාත්‍යාංශ ලේකම් මධුපානි පියසේනද මේ සම්බන්ධයෙන් අදහස් දැක්වූවාය.

”මධ්‍යම පළාත පුරා විසිරී සිටින සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත කරුවන් දේශීය ආර්ථිකයට විශාල දායත්වයක් ලබා දෙනවා. කොවිඩ් වසංගත තත්ත්වයත් සමඟ ඔවුන්ගේ වෙළෙඳපොළ බිඳ වැටුණා. ඔවුන්ට යළිත් මතුව එන්න අපි මධ්‍යම පළාත් ආණ්ඩුකාර නීතීඥ ලලිත් යූ ගමගේ මහතාගේ උපදෙස් මත වෙළෙඳ ප්‍රදර්ශනයක් (INNEX 2020) මහනුවර කැන්ඩි සිටි සෙන්ටර් හිදී පැවැත් වූවා. අත් යන්ත්‍ර රෙදි, බතික්, සම් ආශ්‍රිත නිෂ්පාදන ඇතුළු ක්ෂේත්‍ර ගණනාවක නිරතව සිටින පාරම්පරික කර්මාන්ත කරුවන් මේ ප්‍රදර්ශනයට තමන්ගේ නිර්මාණ එකතු කළා. දේශීය කර්මාන්ත කරුවන්ට නව වෙළෙඳපොළ අවස්ථා නිර්මාණය කරදීම අපේ මූලික අරමුණයි.”

ඡායාරූප-රුවන් මිගම්මන

කැනොවින් හොටේල්ස් ඇන්ඩ් ස්පාස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය වෙත සැපයුම්කරුවන් ලෙස ලියාපදිංචි වීම සඳහා ආරාධනයයි.

(ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ පරිපාලිත ආයතනයකි)

යොමු අංකය : CNW/SUP/2021

පහත ලැයිස්තුවේ සඳහන් භාණ්ඩ/ උපකරණ/ සේවා සැපයීම සඳහා හැකියාව සහිත අපේක්ෂිත සැපයුම්කරුවන් (වෙළඳුන්/ බෙදාහරින්නන්/ නිෂ්පාදකයන්/ ආනයනකරුවන්) වෙතින්, මෙම ආයතනය වෙත, 2021 වර්ෂය සඳහා ලියාපදිංචි වීම සඳහා කැනොවින් ආයතනය ආරාධනා කරයි. අපගේ ප්‍රධාන කාර්යාලය, අංක 46/46, 03 වන මහල, ග්‍රීන් ලංකා ටවර්ස්, නවම් මාවත, කොළඹ 02 පිහිටා ඇති අතර, සේවා ස්ථානය වැලිපැන්න දක්ෂිණ අධිවේගී මාර්ගයේ පිහිටා ඇත.

සටහන :

රුපියල් මිලියන එකකට අඩු පහත සඳහන් භාණ්ඩ හා සේවා සඳහා ලියාපදිංචි විය හැක.

භාණ්ඩ :

1. කාර්යාල ලිපිද්‍රව්‍ය
2. පරිගණක උපාංග හා ජාලකරණ අයිතම.
3. කාර්යාල උපකරණ
4. ප්‍රින්ටර්, ටෝනර් හා කාට්‍රිජ්
5. එයාර් ෆ්‍රෙෂ්නර් හා දියර සබන් තොග කෑන්
6. ටොයිලට් පේපර් රෝල් හා පේපර් ටවල්
7. කසළ මලු/ කසළ බඳුන්/ කසළ කූඩ
8. නාන කාමර ද්‍රව්‍ය පවිත්‍රකරණය සඳහා පවිත්‍රකාරක/ රසායන ද්‍රව්‍ය.
9. ජල පොම්ප/ ප්‍රෙෂර් පොම්ප/ දියේ ගිල්වන පොම්ප/ පාලන පැනල හා පාලන ඒකක.
10. පොහොර.
11. කුලිං ටවර් රසායන ද්‍රව්‍ය.
12. ගෘහ භාණ්ඩ (ලී / වානේ)
13. හාඩ්වෙයාර් ද්‍රව්‍ය
14. ආරක්ෂක උපකරණ
15. විදුලි හා අවශ්‍ය උපකරණ (සපයා ස්ථාපිත කිරීම)
16. ටයර් හා ටියුබ්
17. ඉලෙක්ට්‍රොනික අයිතම හා පැනල
18. LED බල්බ්/ ටියුබ් ලයිට්/ ෆ්ලෑෂ් ලයිට්/ හෝල්ඩර් හා අනෙකුත් ආලෝකකරන ද්‍රව්‍ය
19. පානීය ජල බෝතල් හා ජල ඩිස්පෙන්සර්
20. විදුලි ජෙනරේටර් කට්ටල හා අමතර කොටස්
21. නාන කාමර වැද්දුම් - කොමොඩ් සිස්ටර්න්, ෆ්ලෂිං ඒකක, වොෂ් බේසින්, ස්කොටිං බඳුන්, ටැප් ආදිය, බිඩේස්ප්‍රේ, සීට් කවර, පේපර් රෝල් රඳවන, ටැප් ආදිය.
22. බිත්තියෙහි රඳවන එක්සෝස්ට් පංකා හා වෙන්ටිලේෂන් පංකා
23. සිවිලිං 'ඒ' ශ්‍රේණිය 1/2X1/2 පැස්සූ මෙෂ් දැල්
24. තණකොළ කපන යන්ත්‍ර
25. සූර්ය බල උපකරණ
26. සංඥ පුවරු
27. ගෙබිම් පාපිසි/ ගෙබිම් කලාල
28. ප්‍රවර්ධන අයිතම/, ත්‍යාග භාණ්ඩ (කූඩ, බයිසිකල්, ටිෂර්ට්, කෑන්තොප්පි ආදිය)
29. CCTV කැමරා හා වෙනත් අදාළ මෙවලම්
30. විදුරු, විදුරු දෙරවල්, පැනල හා ගෙබිම් සරතේරු
31. ගිනි ආරක්ෂණ උපකරණ
32. පොලි කාබනේට් ෂීට් (විවර සහිත, දෘඪ)
33. අකුණු සන්නායක
34. වෛද්‍ය සැපයුම් (මුහුණු ආවරණ, අත් අත්වැසුම්, හිස් ආවරණ, අත් සනීපාරක්ෂක දියර)
35. කිරිපිටි, සීනි, තේ කොළ
36. කට්ලරි (හැදි /ගැරුප්පු/ පිහි) සහ ඉවුම් පිහුම් උපකරණ
37. පිඟන් භාණ්ඩ (පිගන්, කෝප්ප, පීරිසි, තේ පෝච්චි)

සේවා :

01. වැසිකිළි කාමර සඳහා ප්‍රවේශ ටිකට්පත් පද්ධතියක්
02. ආරක්ෂක සේවා
03. පහසුකම් කළමනාකරණ සේවා
04. මිනිස්බල සැපයුම් සේවා
05. ජැනිටෝරියල් සේවා
06. ආර්කේඩ් ප්‍රදේශවල, LP ගෑස් පද්ධති තඩත්තුව, LP ගෑස් බට, රෙගියුලේටර්, ෆිල්ටර් ඒකක සපයා, ස්ථාපිත කොට සකස් කිරීම.
07. සුළු අලුත්වැඩියාවන් - ගෙබිම හා බිත්ති - සඳහා සේවා සපයන්නන්
08. පානීය ජල බවුසර් සැපයීම
09. ගලි බවුසර් සැපයීම
10. ප්‍රෙෂර් පොම්ප අලුත්වැඩියාව හා තඩත්තුව
11. CCTV කැමරා පද්ධති ස්ථාපිත කිරීම හා තඩත්තුව
12. ඇලුමිනියම් හා විදුරු වැඩ සපයා ස්ථාපිත කිරීම.
13. පලිබෝධ නාශක පද්ධති හා තඩත්තුව
14. සංඥ පුවරු ඇතුළත්ව සියලු ආකාරයේ මුද්‍රණ වැඩ.
15. සෘජු අකුණු හා උද්ගලන ආරක්ෂණ පද්ධතියක් සපයා, ස්ථාපිත කොට තඩත්තු කිරීම.
16. ස්ථානය තෝරා ගැඹුරු නළ ලිඳක් ඉදිකිරීම.
17. අපජල පවිත්‍රකරණ යන්ත්‍රාගාර ඉදිකොට තඩත්තුකිරීම.
18. සෝපාන (Elevators) සපයා, ස්ථාපිත කොට, තඩත්තු කිරීම
19. තිත්ත ආලේපනය ද ඇතුළත් සිවිල් වැඩ හා ඉදි කිරීම්
20. බිඳුම් පද්ධති ස්ථාපිත කිරීම.
21. ගොඩනැගිලිවල විදුරු පිරිසිදු කිරීම හා මකුළුදැල් ඉවත් කිරීම.
22. වායු සමීකරණ තඩත්තුව හා සේවා කිරීම.
23. ගිනි එන්ජින් හා උපකරණ තඩත්තුව හා සේවා කිරීම/ ගිනි උපකරණ පරීක්ෂාව හා සේවා කිරීම.
24. ජෙනරේටර් තඩත්තුව හා සේවා කිරීම.
25. සාප්පු සඳහා ක්ලැඩිං ස්ථාපනය.
26. විවිධ ප්‍රමාණයේ විශාල දැන්වීම් පුවරු, බිල්බෝඩ්
27. පින්තූර රාමු කිරීම.
28. දැවමය වැඩ හා ඇලුමිනියම් වැද්දුම්.
29. මේසන් වැඩ
30. ජනතළ කාර්මික වැඩ
31. භූමි අලංකරණ කටයුතු
32. කසල ඉවත් කිරීම (ආහාර කසල/ ප්ලාස්ටික්/ කඩදාසි)

ආපසු ගෙවනු නොලබන ගාස්තු රුපියල් 2,500/- අලුත්ගම මහජන බැංකු ආයතනික ශාඛාවේ ගිණුම් අංක 084100150019552 වෙත ගෙවා ලබාගත් තැන්පතුපත ඉදිරිපත් කිරීමෙන්, 2020 ඔක්තෝබර් 12 දින සිට 2020 නොවැම්බර් 06 දින දක්වා, සඳුද සිට සිකුරාද දක්වා පෙරවරු 9.00 හා පස්වරු 3.00 අතර කාලය තුළ පහත සඳහන් ලිපිනයෙන් ලියාපදිංචි ආකෘති පත්‍ර ලබාගත හැක.

යථා පරිදි සම්පූර්ණ කළ ආකෘති පත්‍ර, 2020 නොවැම්බර් 27 දින පස්වරු 3.00 ට හෝ ඊට පෙර අපගේ ප්‍රධාන කාර්යාලය වෙත ලැබීමට සැලැස්විය යුතුය. වැඩිදුර විස්තර සඳහා කරුණාකර ප්‍රසම්පාදන අංශය අමතන්න. දුරකථනය : 011-7711171.

අවශ්‍යතාවයන් අනුව සැපයුම්කරුවකු/ සැපයුම්කරුවන් තෝරා තැනීමේ අවස්ථාව සමාගම සතුවේ. තවද, යම් සැපයුම්කරුවකු/ සැපයුම්කරුවන් තෝරා ගැනීමේ තීර්ණයක සම්බන්ධයෙන් සතුටුදායක ලෙසට කටයුතු නොකරයි නම්, අදාළ සැපයුම්කරුගේ / සැපයුම්කරුවන්ගේ නාමයන් අදාළ ලියාපදිංචි ලේඛනයෙන් ඉවත් කිරීමේ තනි තීරණයක් ගැනීමේ අයිතිය කළමනාකාරීත්වය සතුවේ.

තවද, අවශ්‍ය අවස්ථාවන්හිදී, ලියාපදිංචි ලේඛනයෙන් පරිබාහිරව භාණ්ඩ හෝ සේවා ලබා ගැනීමේ අයිතිය සමාගම සතුවේ.

කැනොවින් හොටේල්ස් ඇන්ඩ් ස්පාස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
අංක 46/46, 03 වන මහල,
ග්‍රීන් ලංකා ටවර්ස්, නවම් මාවත, කොළඹ 02.

ලංසු කැඳවීම

මහ රෝහල ත්‍රිකුණාමලය

ත්‍රිකුණාමලය මහ රෝහලේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් මෙහි පහත සඳහන් විදුලි කාර්මික හා අලුත්වැඩියාවන් කිරීම සඳහා සුදුසුකම් ලත් ලංසුකරුවන්ගෙන් ලංසු කැඳවනු ලැබේ.

Contract No	Items	Tenderable Amount Excluding VAT (Mn)	Rcquired Grade (Specialty field)	Contract Period	Required Bid Security		Bid Validity Period
					Bid Security Amount (Rs.)	Validity Period	
DGH/ TCO/PLN/ EW/2020	Improvement of the Existing Electrical Installation System at District General Hospital, Trincomalee.	6.23	EM-4 (Electrical & Mechanical)	60 Calendar Days	90,000.00	15.02. 2021	18.01. 2021

01. ප්‍රසම්පාදන ක්‍රියාවලිය - ජාතික තරගකාරී ලංසු කැඳවීම (NCB)
02. ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) ලියාපදිංචිය යාවත් කරන ලද වාර්තා පොත ලංසු අයදුම්පත් ලබා ගැනීම සඳහා ලංසුකරුවන් විසින් ඉදිරිපත් කළ යුතුය.
03. වැඩ විෂය සඳහා ලිඛිත ඉල්ලීමක් ද සහිතව ආපසු ගෙවනු නොලබන ලංසු අයදුම්පත්‍ර ශාස්තු රු. 2,000.00 ක් ගෙවා ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කිරීමෙන් පසු 2020.10.12 දින සිට 2020.11.01 දින දක්වා පෙ.ව. 9.00 සිට ප.ව. 2.30 දක්වා කාලය තුළ සතියේ වැඩ කරන දිනවල ලංසු ලියවිලි ලබාගත හැකිය.
04. සතියේ වැඩ කරන දිනවල සාමාන්‍ය රාජකාරී වේලාව තුළ දී ලංසු ලියවිලි සැලසුම් ඒකකයේදී නොමිලේ පරීක්ෂා කර බැලිය හැකිය.
05. මහ බැංකුවේ අනුමැතිය ලත් වාණිජ බැංකුවකින් 2020.11.02 දින සිට දින 105 වලංගු වන ආපසු නොගෙවන ලබන ලංසු ඇපකරයක් ලංසු ලිපිලේඛනවලට ඇමිණිය යුතුය.
06. සියලුම ලංසු ලියවිලි ඉංග්‍රීසි භාෂාවෙන් සම්පූර්ණ කළ යුතුය.
07. පෙර ලංසු රැස්වීම 2020.10.26 වන දින පෙ.ව. 10.30 ට පැවැත්වේ.
08. ලියකියවිලි පිටපත් 02 ක් මුල් පිටපත හා දෙවන පිටපත යනුවෙන් සඳහන් කර වෙන වෙනම කවරවල බහා එම කවර දෙක තනි කවරයක බහා ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට 2020.11.02 දින පෙ.ව. 10.30 ට පෙර භාරදිය යුතුය. ලංසු භාරගැනීම අවසන් වූ පසු ලංසු අයදුම්පත් විවෘත කරන අතර, ලංසුකරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයකුට ඊට සහභාගි විය හැකිය.
09. ත්‍රිකුණාමලය මහ රෝහලෙහි ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසන් තීරණය වේ.
10. ප්‍රමාද වී ලැබෙන ලංසු භාර නොගැනේ.
11. මේ සම්බන්ධ වැඩිදුර විස්තර අවශ්‍ය නම් රෝහලේ සැලසුම් අංශයේ 026-2222261/62 දුරකථන අංක අමතා ලබාගත හැක.

සභාපති,
ප්‍රසම්පාදන කමිටුව,
මහ රෝහල, ත්‍රිකුණාමලය.

BE BETTER INFORMED!



News you can trust now free on your mobile phone.

Dinamina Daily News Thinakaran

VISIT
apps.lakehouse.lk

DOWNLOAD TODAY!

AVAILABLE AT

LAKE HOUSE

බලංගොඩ ප්ලාන්ටේෂන්ස් පීඑල්සී භාවිත කරන ලද තේ කර්මාන්තශාලා යන්ත්‍රෝපකරණ විකිණීමට

බලංගොඩ ප්ලාන්ටේෂන්ස් පීඑල්සී විසින් පහත සඳහන් පාවිච්චි කරන ලද කර්මාන්තශාලා යන්ත්‍රෝපකරණ, බදුල්ල සහ බලංගොඩ ප්‍රදේශයන්හි පහත දක්වා ඇති ස්ථානවලින් පරීක්ෂා කර බැලීමෙන් පසු සුදුසුකම්ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

වතුයායේ නම	ඒකක ගණන	යන්ත්‍රසූත්‍ර වර්ගය
රාස්සගල	01 01	Roller, CCC - 47" Roller, WALKERS - 46.5"
යූරි	01	Roller, WALKERS - 45"
තෙල්බැද්ද	02	Roller, CCC - 44"
පෙතියාගල	01	Roller, WALKERS - 35"
ස්ප්‍රිං වැලි	02 01	T & I - CTC Line with Continuous Fermenting Unit McCloy - Drier

ටෙන්ඩර් ලේඛනය නිකුත් කිරීම: 2020 ඔක්තෝබර් 12 වන දින පෙ.ව. 9.30 සිට 2020 ඔක්තෝබර් 27 වන දින ප.ව. 2.30 දක්වා රත්නපුර, පාම් ගාර්ඩ්න්හි පිහිටි බලංගොඩ වැවිලි ප්‍රධාන කාර්යාලයෙන්, කාර්යාල වේලාවන් තුළ රු. 500/= ක මුදලක් ගෙවා, ආපසු ගෙවන රු. 2,500/= ක තැන්පතුවක් තැබීමෙන් ලබාගත හැක.

ටෙන්ඩර් ඉදිරිපත් කිරීම: පරිපූර්ණ මුද්‍රා තැබූ ටෙන්ඩර් ලියකියවිලි 2020 ඔක්තෝබර් 27 වන දින ප.ව. 2.30 ට හෝ ඊට පෙර ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට එවිය යුතුය. නැතහොත් මෙම කාර්යාලයට පැමිණ එහි තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ හැක.

ටෙන්ඩර් අවසන් දිනය සහ වේලාව: ටෙන්ඩර් භාරගැනීම 2020 ඔක්තෝබර් 27 වන දින පස්වරු 2.30 ට අවසාන වනු ඇත.

මේ පිළිබඳ වැඩි විස්තර 0772663911 / 045-5622532 දුරකථන අංක ඇමතීමෙන් ලබාගත හැක.

සාමාන්‍යාධිකාරී - මූල්‍ය හා පරිපාලන,
බලංගොඩ ප්ලාන්ටේෂන්ස් පීඑල්සී,
තැ.පෙ. 06, පාම් ගාර්ඩ්න්,
රත්නපුර.

වෂී 2020ක් වූ ඔක්තෝබර් මස 11 වැනි ඉරිදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.